රමණී මුලත්සිංහල



kathapothak.blogspot.com

# නිලුපුලී

kathapothak.blogspot.com

# 11 සඳුදා

**ඔර්ලෝසුවේ** වැදුණු වේලාව දොළහමාරද එකද නැතහොත් එකහමාරදැයි කීමට තේජානිට හැකියාවක් නොවිණ. ඔර්ලෝසුව තිබුණේ කාමරයෙන් ඔබ්බට වූ කුඩා කොරිඩෝවේ වුවද එහි තිබුණු කාමර සියල්ලටම එහි හඬ ඇසෙන බව ඇය දැන සිටියාය... ඒ හඬ එලෙස ඇසෙන්නේ කාමර වල දොරවල්වල උඩින් කුඩා කවුළු තිබෙන නිසා බවද ඒ ලෙසම ඇය දැන සිටියාය... කිසියම් කෙනෙක් කොරිඩෝවේ ඇවිදින්නාක් වැනිය...

මදුරු දැලින් වටවී සිටි ඇය මඳක් හිස ඔසවා බැලුවේ ආරතීවත් පැමිණෙන්නේදැයි සිතමිනි... එහෙත්... නැත... දොර බෝලය කරකැවුණේද නැත... ආරතීගේ යහනේ මදුරු දැල උඩට දැමූ ලෙසම තිබෙන බව ඇයට ලා විදුලි පහන් එළියෙන් පෙණින... බොහෝ විට ඔවුන් කාමරයේ විදුලි රාත්‍රී විදුලි පහන දල්වන්නේ නැත... මැද තිබෙන විදුලි පහන කවදාටත් මුළු රැය පුරාම දල්වෙන්නේය... එහි එළිය සෑම දොරකම උඩ තිබෙන වීදුරු පනේලයෙන් පරාවර්තනය වී එන්නේය... ඇය යළිත් දෑස් පියාගන්නට සිතුවාය... අද ආරතී මිතුරා හා නතර වෙන්නට ඇත...

තරමක පොද වැස්සක්ද ඇදහැලෙන බව ඇයට ඇසිණ... එහෙයින්ම ඇයට සිතුණේ තවත් ගුලිවී නිදාගන්නා ආශාවක්ම පමණි...

කොරිඩෝවේ යන ශබ්ද ගැන ඇයගේ සිතේ බියක් නැත...

බොහෝ විට රෑයේ වැඩ නිමවී එන සමහරුද මේ මොහොතේ කොරිඩෝවේ යද්දී බොහෝ සෙමින් පා තැබුවද ඉදහිට එය ඇසෙන බව ඇය දැන් දැන සිටියාය... ඇය ඒවාට බිය වූයේ පළමු සතියේම පමණි...

ආරතී සංජය හා මිතුරුවූ පසු මේ, මෙම කාමරයෙන් පිටව ගිය කීවෙනි දිනයදැයි ඇයට මතක නැත... අවකාශයක් ලබාගන්නා සෑම අවස්ථාවකම ඇයට සංජයගේ ඇරයුම ලැබිණ... සංජය ඇයට උමතුවෙන් මෙන් ආදරය කරන බව තේජානි දැන සිටියාය... එහෙත් ඇයට කෙදිනකවත් සංජය හා එක නිවසක නම් එකතුවන්නට නොහැකි බවද ඒලෙසම ඇය මෙන්ම මිතුරියද දැන සිටින්නට ඇත.

තමන්ගේ ජීවන රටාව අනුව එවැන්නක් සිතීමේ ඉඩකඩ බොහෝ සීමිතය... යළිත් ඇයගේ දෑස නිදිබරින් බරවිය... නිදි දෙව්දුව තමාට යළිත් අත වනන බව ඇයට දැණින. පොද වැස්සේ හඬ ඇයගේ නින්දට මහඟු රුකුලක් ලබා දෙමින් තිබිණ...

ඇයගේ දෑස් යළිත් පියවුණේ එම පොද වැස්සේ හඬින් ඇය යළිත් නිදි දෙව්දුවගේ ආශිර්වාදය ලබද්දීය. එහෙත් එය තරමක අඩ නින්දකට පමණක් සීමාවූ බවක් පෙණින.

සිතාගත නොහැකිය... තවත් විනාඩි කිහිපයකට පසු ඇයට කුඩා ශබ්දයක් ඇසිණ... යළිත් ඇයගේ දෑස් මදක් විවර විණ... ආරතී මදුරු දැලට එහා සිට ඇය දෙස බලා සිටිනු ඇය දුටුවාය.

ඇයගේ සිනහව ආරතීට දක්නට හැකි වෙතැයි සිතිය හැකි වූවද, ආරතීගේ මුහුණ විදුලි පහන් එළිය දෙසට පිටුපා තිබුණෙන් ඇයගේ මුහුණ නම් තේජානි දුටුවේ නැත.

"දැන්ද ඔයා ආවෙ...?" තේජානි ඇසුවේ එක්තරා අන්දමකින් කුතුහලයකිනි. එතෙක් මෙතෙක් සංජය හමුවීමට ගිය මිතුරිය මෙලෙස මෙවන් මැදියම් රෑයේ මොහොතක කෙදිනකවත් නො ආ හෙයිනි. මිතුරියගේ කොණ්ඩය තෙත් බරිත වී ඇති බව නම් ඇයට නිදි බරවූ දෑස අතරින්ම පෙණින... ඇඳුමද තරමක් සිරුරටම ඇලුණාක් මෙන් වී තිබිණ... ඇය තරමක් තෙමෙන්නට ඇත... සංජය ඇයව මේ මොහොතේ ඇරලුවා ගැන තේජානිට පුදුමයක් දැණුනද, ඇය එය කියන්නට නොසිතුවාය... එහෙත් ඇයට උණුවතුර බෝතලයේ වතුර



ඇති බව මතක් විය... ඉදහිට රෑයක තේ කෝප්පයක් බොන්නට සිතද්දී නැතහොත් ශාන්තා ගේ කාමරයටම යා යුතුය... එය කරදරයකි... එහෙයින්ම කාමර වල සිටින සියල්ලෝම මෙන් කාමරයකට උණුවතුර බෝතලයක් හා තේ කෝප්පයක් හෝ කෝපි කෝප්පයක් සාදා ගත හැකි ආම්පන්න තබාගෙන සිටියහ...

ආරතී බොහෝ විට මෙලෙස මදක් පමාවී ආවිට තේ කෝප්පයකින් සප්පායම් වෙන බව තේජානි දන්නීය... එහෙත් ඇය තේජානි හඳුනාගත් වසරයකට මදක් වැඩි කාලයකටම මෙතෙක් රෑ බෝවී නම් පැමිණියේම නැත...

සමහරවිට හෙට දිනයේ සියල්ලන්ටම පුහුණුවීම සඳහා ආ යුතු නිසා ඇය එන්නට ඇත... නැතහොත් සංජයට හදිසි විදේශ ගමනක් යෙදී... ඇය නේවාසිකාගාරයෙන් බස්සවා ගෙන ගියාද විය හැකිය... තේජානි නිදිමත මතින්ම සිතුවාය... ඇසිය යුත්තේ මිතුරියගෙන් ඒ ගැන හෙටය... මේ මොහොතේ නම් ඇයට අවශ්‍ය වූයේ හොඳින් නිදා ගැනීමය...

"රතී ඔයා තෙමුණද...? අන්න ෆ්ලාස්ක් එකේ වතුර නං ඇති..." නිදිමත තිබුණද ඇයට මතක් විය.

"සංජු පව්..." ආරතී කියුවාය.

තේජානි ට සිතුණේ ඇය කී දේ මිතුරියට ඇසෙන්නට නැති බවය.

"තෙමුණනං ඉක්මණට ඇඳුං මාරුකරගන්න... මට නං නැගිට්ටින්න බෑ..." කියූ තේජානි තවත් හොඳින් පොරවණය සිරුරට දමා ගත්තාය... සැබැවින්ම මෙවන් වැස්සකදී හොඳින් නිදා ගැනිමට හැකිය... තේජානි කොහොමටත් නින්දට කැමැති තැනැත්තියකි... ඇයට තරමක... නැත තද සීතලක් කාමරය වටා දැවටෙන්නාක් මෙන් දැණින... සමහරවිට වැස්ස තද කරන්නට ඇත...

"සංජු පව්..." ආරතී කීවේ දෙවන වරට බව සිතෙද්දී තේජානිට සිනහවක් නැගිණ. සමහරවිට සංජය ඇයට නවතින්නට කියන්නට ඇත... ඇය පුහුණුවීම වලට යායුතු නිසා එන්නට ඇත... ආවායින් පසු ඇයට පෙම්වතා ගැන දුකක් සිතෙන්නට ඇත... දෙවනුව ඇයට මිතුරිය කීදේ තරමක් අමතක වූවාක් මෙන් විය.

"මොකක්ද රතී...?" ඇයට ඇසුණේ නිදිමතිනි. මේ මොහොතේ පව් පින් ගැන සිතන්නට තරම් ඇයට නම් හැකියාවක් නොමැති බව සිතමිනි.

"සංජු පව්..." ආරතී යළිත් කීවාය.

"නිදාගනින් රතියො... මට හෙට උදෙන්ම ඇහැරෙන්නත් ඕන..." තේජානි කිව්වේ එවර නම් නිදිමතින් බරවුණද තරමක සිනහවකින්ද යුතුවය... මිතුරිය බොහෝ විට සංජය හා ගිය දිනයකදී ඔහු ගැන බොහෝ විස්තර කියන්නීය... තේජානි එක් කණකින් අසා ඒවා අනික් කණින් පිටකළද, ඉදහිට යමක් ඇයගේ සිතේ තැන්පත් විද තිබෙන බව ඇයට සමහර විටක සිතිණ.

ආරතී කිසිවක්ම නොකියා යළි හැරුණාය.

ඇය තවමත් සිටින්නේ ඇය අද උදයේ යද්දී ඇඳගෙන ගිය ඇඳුමින්ම බව තේජානිට සිතුණද, මේ මහ රැයේ තමාට සංජය ගැන කියන්නට සැරසෙන මිතුරිය ගැන ඇයගේ සිතේ දැණුනු අනුකම්පාව නිසාම...

"ඉක්මණට ඔයාත් නිදාගන්න එන්න රතී... හෙට ඔයාත් යන්න එපැයි ප්‍රැක්ටිසින් වලට..." නාන කාමරය දෙසට යන මිතුරියට කීවාය... සැබැවින්ම ඇයගේ දෑස් යළිත් නිදිමතින් පියවෙමින් තිබිණ. නාන කාමරයට යන්නට ගිය ආරතී යළි පැමිණ ඇයගේ යහනේ වාඩිවූවාය... තේජානි ඒ සියල්ලම දුටුවේ මදුරු දැල් අතරින් බොඳ වෙමිනි... යළිත් වැස්සේ හඬ නැගිණ... මේ සීතල... ඇය පසෙක තිබූ කොට්ටයද ගෙන තුරුල් කරගත්තාය...

"උඹ ඔහොමමද නිදාගන්න යන්නෙ...?" තේජානි ඇසුවේ ඇයගේ ඇඳුමෙ දිස්නය තරමක් දුටු හෙයිනි... උදයේ ඇඳගෙන ගිය ඇඳුමෙ කර වටා වූ දිලිසෙන පටිය අර කුඩා විදුලි පහන් එළියට හොඳින් දිලිසිණ... "සීතලයි රතී... උඹ සීතලෙන්ම මැරේවි... ඉක්මණට ඇඳුං මාරු කරගනිං... මට නං නැගිටින්න බෑ... තේ එකක් බැරි නං උණු වතුර ටිකක් හරි බීපං... හැබැයි ලයිට් එක නං දාන්න එපා... මගේ නිදිමත යයි..."

"මං යන්නං... සංජුට කියන්න... සංජු පව්... එයා දන්නෙ නෑ..." ආරතී යළිත් හැරී කියමින්ම නැගිට ගත්තාය... කියන්නට අවශ්‍ය කුමක්දැයි තේජානිට වැටහුණේ නැත.



ආරතී මත්පැන් බොන්නියක්ද නොවේ... එහෙත් ඇය කිසියම් කැළඹිල්ලකින් සිටිනවා වැනිය තේජානිට සිතුණද.... ඇයට ඒවා ගැන සිතන්නට හෝ එවැන්නක යාදින්නක් ඇසීමට මේ මොහොතේ නම් සිතුණේම නැත... ඒවා ඇසීමට හෙට දවසේ කාලයක්ම වෙන් කර ගත හැකිය... ඇයගේ නෙත් සැබැවින්ම නිදි බරින් පියවෙමින් තිබිණ... ආරතී දූත් කාමරයේ සිටින හෙයින් ඇයට සෑහෙන සැනසිල්ලක්ද දැණින... දූන් ඉතින් ඇරෙන වැහෙන දොරවල් ගැන ඇයගේ සවණට නොදැනෙන බව ඇය දන්නා හෙයිනි.

මිතුරිය කියවන දේවල් අසා සිටින්නට තරම් හැකියාවක්ද තේජානිට නොවිණ. ඇයට අවශ්‍ය වූයේ තවත් වරක් හොඳින් නිදා ගැනීමටය... හෙට මේ වූ විකාරය කුමක්දැයි මිතුරියගෙන් අසා ගත යුතුය... සියල්ලටමත් වඩා ඇය මෙලෙස මේ වෙලාවේ පැමිණියේ කිමදැයි ඇසිය යුතුය...

"ගුඩ් නයිට්...ද මිඩ් නයිට්ද මන්දා රතී..." ඇයට කියූ තේජානි එවර දෑස් පියාගත්තේ ආරතී නාන කාමරය දෙසට යනු දෙසවනට වැකෙද්දීය... පහේලයෙන් ආ විදුලි පහන් එළියෙන් ඇයගේ දෑසට ආරතී හසුවූයේ බොඳවූ කිසියම් රුවක් ලෙසිනි.

# 12 අඟහරුවාදා

**තේජානි** පසුදා උදය අවදිවූයේ නවයත් පසුවෙද්දීය... ඇයට පුදුමයක් දැණුනේ ආරතී තමා අවදි නොකිරීම ගැනය... බොහෝ විට තේජානි උදයේ අවදි වීමේ කම්මැලියක වූව ද ආරතී එලෙස නොවුණු තරුණියක වී සිටියාය... ආරතී එම නේවාසිකාගාරයේ සියල්ලටම පෙර සැමදාමත් අවදි වූ තැනැත්තියකි... ආරතී සැමදාමත් උදයම නැගිට ව්‍යායාම අභ්‍යාස කිරීමට එම කාමරයට යන්නීය... ඇයගේ සිරුර මනා ලාලිත්‍යයකින් තබා ගැනීමට ඇය සැමදාමත් උත්සුක වූවාය... එම කාමරයට යන්නට ඇලිමැලි කමක් දක්වූ මිතුරියටද බොහෝ අවලාද කීවාය...

තේජානි එයට කැමැත්තක් නොදැක්වූයේ ඇයට හිමිදිරියේ අවදිවීම අකැමැතිම කාර්යයක් හෙයිනි... ආරතීගේ මෙන් සිහින් උස සිරුරක් නොවූවද, ව්‍යායාම අඩුවෙන්ම ගත්තේ වූවද තේජානිද සිරුර පුෂ්ටිමත් වූ එහෙත් හොඳ ලාලිත්‍යයකින් හෙබි උසට සරිලන මහතකින් යුත් නෙතට ප්‍රිය ලලනාවක වූවාය... තමාගේ නිදාගැනීමට ආරතී සැමදාමත් බණින්නීය... එහෙයින් ඊ බෝවී පැමිණි මිතුරිය තමාට පාඩමක් උගන්වන්නට සිතා අද තනියම පුහුණුවීම් වලට යන්නට ඇත... කොහොමටත් තේජානි නම් ආරතීට වඩා නින්ද ගැන සිතන්නියක වූවාය...

අද නම් එක අතකින් තේජානිට දුකක්ද සිතිණ... මිතුරියට පැය දෙකකවත් හරි හමන් නින්දක් ලැබිණිදැයි සිතන්නට නොහැකි වූ හෙයිනි...



එහෙයින්ම ඇය වෙනත් කිසිවක් සිතන්නට නොසිතාම යහනින් පැන්නේ මදුරු දැල එක්කොට ගැටයක් දමා ආරතී ගේ යහන දෙස බැලුවාය... ඇය එය ඊයේ දහවලදී තිබුණා වැනිවම හොඳින් සකසා තිබිණ... සියල්ලම කර ඇය පහලට යන්නට ඇත...

කෙසේ වූවත් තේජානි සිතුවේ පහලට ගොස් හොඳ දෙහි කැපිල්ලක් දෙන්නටය... ඒ තමා අවදි නොකිරීම ගැනය... පුහුණුවීම් වලට යන්නට තිබෙන්නේ දහයටය... දැන් ඉතින් කන්නට හෝ ලැබෙන්නේ නැත.

ඇය නාන කාමරය තුළට ගියේ එවර පුදුමයෙන් බැලුවාය... ආරතී අද ඇයගේ තුවාය දමන තැන තුවාය දමා නැත... නාන කාමරයට යන ආරතී බොහෝ විට තෙත තුවාය දමන්නේ ඇතුළතම කොටසකය... දෙදෙනාට දෙපැත්තට එවැනි තැන් දෙකක් සාදා ඇත... ඇයගේ තුවාය නම් එලෙසම එතනම තිබිණ... තේජානි තුවාය රට තුවා රඳවනයේ නොතබන නමුත් ආරතී එලෙස නැත... ඇය හවස් වෙද්දී එය තුවා රඳවනය මත දමන්නීය...

එය මත තුවාය තිබුණා ඇයට මතකයක නැත... එය එසේනම් ඇය කුඩා සඳළු තලයේ වැනුවාවත්ද...? ඒවා දැන් බලන්නට වෙලාවක් නැත... ඇය හැකි ඉක්මණින්ම සිරුර දොවා ගත්තාය... ආරතී ඇත්තේ දැන් පුහුණු වීම් ශාලාවේ වන්නට පිළිවන... සමහරවිට ඇය රාත්‍රියේ තමා අවදි කල නිසා තමාට අවදි නොකර පහලට යන්නට ඇත...

නවත් මොහොතකින් ඇය ඇයගේ පුහුණුවීම් ඇඳුම ඇඟලා ගත්තී පහලට දිව ගියේ තේ කෝප්පයක් සාදවා ගැනීමට සිතමිනි.

"මොකද අද ජානි මිස් පරක්කු වෙලා..?" ශාන්තා ඇසුවේ උණු වතුර බෝතලයෙන් තේජානිගේ කෝප්පයට තේ වක් කරමිනි.

"කොහේද මේ රතී මාව නැගිට්ටුවෙ නෑ නේ..." තේජානි නොරිස්සුමෙන් මෙන් කියමින් තේ කෝප්පය අතට ගත්තාය.

ශාන්තා ඇය දෙස බැලුවේ පුදුමයෙනි.

"රතී මිස් ආවද...?"

"ඔව්... ඊ ආවෙ... වෙලාව නං මතක නෑ ශාන්තා... ආවා... මටත් ඉස්සෙල්ලා නැගිටලා ගිහිල්ලා නේ..."

"මෙහෙට ආවෙ නෑ..." ශාන්තා කීවේ පොල්කටු හැන්දක්ද කෙළින් තබාගෙන දෑස්ද විසල් කරගනිමිනි.

එවර පුදුමයෙන් ශාන්තා දෙස බැලුවේ තේජානිය. ඇයගේ නලල රැලි විණ... ඒ නම් මිතුරියගේ සිරිතක් නොවේ... ඇයට උදයේ තේ කෝප්පය නැතහොත් දවසම සිරුරට පණ නැතැයි නෝක්කඩු කියන්නියකි...

"ආවේ නෑ...?" තේජානි ඇසුවේ තවත් මොහොතකට පසුය...

"නෑ මිස්... අනික් අය ආවා ඔක්කෝමලා..."

"හරි පුදුමයක් නේ... ඊයේ රෑ ආවා නේ රතී මිස්... කොහේ ගියාද තේක වත් නොබී..."

"අර මහත්තයා ආවද දන්නෙ නෑ..."

තේජානිට එවර එය විය හැකියැයි සිතිණ... සමහරවිට ඇයගේ ජංගම දුරකථනයට ඔහු පණිවිඩයක් දුන්නේ නම්... තමා හොඳින් නිදාගෙන සිටි හෙයින්, ඊයේ රෑයේදී තමා ඇය නිසා අවදිවූ බව මතක් වූ නිසා හෝ නැත්නම් ඇයට හදිසි නිසා හෝ ඇය යන්නට ඇත... සංජු පව්... ඇය කීවේ සමහරවිට ඔවුන් දෙදෙනා අතර කිසියම් ගැටුමක් නිසා වූ නොරිස්සුමක් දැඩිවී ඇය කඩාගෙන බිඳගෙන ආවා වුවද, පසුව ඒ ගැන කල්පනා කළා හෙයින් විය හැකිය... සමහරවිට ඒ නිසාම ඇය අද උදයේම මෙන් ඔහුට කථා කර ඔහු සමුවීමට යන්නට ඇත...

ඇය සිතාගත්තේ නිදි යහන මතට වූ පසු බොහෝ දේවල් කල්පනා වෙද්දී, තමුන් කරන හරි දේ පමණක් නොව වැරදි දේ වුවද සිතට එකඟව සිතන්නට හැකි බව සිතෙද්දීය... අරෝව සමරයකට පත්වූ පසු ඇය තමාට සමහරවිට දුරකථනයෙන් පණිවිඩයක් දෙනු ඇත...

සංජු පව්... ඇය කීවේ ඇයි...? සංජුට කියන්න... ඇය එලෙස තමාට කීවේ ඇයි...?

නැතහොත් තේජානිට දුන් වෙනත් සිතිවිල්ලක් නැගිණ... සමහරවිට මෙය දෙදෙනා අතර අරෝවක් නොවෙන්නටත් පිළිවන...

සංජයගේ තිබෙන වැඩ සම්භාරය අනුව මෙලෙස ඇය



වෙනුවෙන් කාලය වෙන් කිරීමද පුදුම සහගතය... ඇයට නම් සිතී තිබුණේ වරක් දෙවරක් නොවේ... ඊයේ සංජු පව්... ආරති කියන්නට ඇත්තේද සමහරවිට ඔහුට කිසියම් භාරදූර කාර්යයක් නිම කරන්නට ඊයේ දිනයේ දී සිදුවූ හෙයින් විය යුතුය...

ඇය හා ගත කරන්නට පැමිණි කාලය එලෙස නැති වෙද්දී ආරතීගේ සිතටද ඔහු ගැන එලෙස වේදනාවක් ඒම නවතා ලන්නට නොහැකිය... ඊයේ වැඩය අද උදය වෙද්දී නිම වූ නිසා මිතුරියට යළිත් කථා කොට රැගෙන ගියා විය යුතුය...

ඉදහිට එලෙස යද්දී උණු වතුර බෝතලයෙන් වතුර ගෙන තේ කෝප්පයක් සාදා ගැනීමේ සිරිතක්ද ඔවුන් අතර තිබිණ... සමහරවිට ඇය එලෙස තේ කෝප්පයක් සාදා ගෙන බොන්නට ඇත...

කෙසේ වුවත් ඇය පුහුණුවීම සඳහා නම් අද හවස වත් ආ යුතුය... තේජානි සිතුවාය... නැතහොත් ඇයගේ මෙම ස්ථානය සඳහටම නැතිවී යා හැකිය.

දෙවනුව තේජානිගේ සිතට ආවේ සංජය ඇයට මෙයට වඩා හොඳ රැකියාවක් ලබා දෙනු ඇතැයි යන සිතිවිල්ලය. ඇයගේ සිතට දුකක් එක් විය... තමාට එලෙස උදව්වක් දෙන්නට හෝ කවරෙක්වත් නැත.

"මිස් දුන් කනවද...?" ඇයගේ සියලුම සිතිවිලි වලට තිත තබා ශාන්තා ඇසුවාය.

"නෑ ශාන්තා... මං කොයිකටත් හෝල් එකට ගිහිල්ලා බලන්නං... අනික් අයත් ගිහිල්ලා නං... තව ටිකකින් එහෙට යන් වෙලාව නේ... එතකොට ගේන කෑමක් ගන්න බැරියැයි..."

"අද මිස් එලාම් එක තිබ්බෙ නැද්ද...?"

තේජානිට තරමක වෙනසක් දැණින... ඇය ඔර්ලෝසුවේ වෙලාව සටහන් කළා ඇයට මතකය... එය නොවැදුණේ ඇයි... සමහරවිට විදුලි කෝෂයේ බලය නැතිවෙන්නට ඇත.

"බැටරි බැහැලා ඇති ශාන්තා... වෙලාව නං තිබ්බා..." කියමින්ම තේ කෝප්පය පසෙකින් තැබුවාය... ඇය ඒවා සේදීමට අවශ්‍ය නැත... අමතර වෙලාවක නම් ඒවා කරකියා ගන්නාට මෙලෙස වෙලාවකදී

ශාන්තා ඒවා නොකර හරින්නේ නැත...

"ඒ වැස්ස නේ... මටත් හොඳටම නින්ද යන්න ඇති..." තේජානි කීවේ කෝප්පය සෝදා එය තබන තැන තැන්පත් කළ ශාන්තාටය.

"වැස්ස...?" ශාන්තා පුදුමයෙන් මෙන් ඇසුවාය.

"ඔව්... තරමක වැස්සක් වගේ ඇහුණා..."

"නෑ මිස්... යංතං පොදක් වගේ ගියා මිසක් හයියෙන් වැස්සෙ නෑ... මං නැගිටලා අර බට පැලැල්ල දැම්මා... ඉන්පස්සේ නිදාගත්තෙ... ඒත් එච්චරම වැහැලා තිබුණෙ නෑ..."

තේජානිගේ සිතට පුදුමයක් නැගිණ... තමාට එතරම් තදින් වැස්සක් නැගුණා දැණුනේ ඇයි...? සමහරවිට ශාන්තාට නොදැණුනාට තරමක් තදින් වහින්නට ඇත... ආරතීගේ ඇඳුම් සිරුරටම වෙලී තිබුණ අන්දම මතකයට එද්දී...

"රති මිසුත් තෙමීගෙන නේ ආවෙ..." ඇයට එය මතක් වෙද්දී කියවිණ.

"එහෙමට තෙමෙන්න නං වැස්සක් තිබ්බෙ නෑ මිස්..." ශාන්තා කීවේ තරමක් සිනහසෙමිනි. තේජානිට කොහොමටත් තදින් නින්ද යන තැනැත්තියකි... තරමක පොද වැස්ස හොඳ වැස්සක් බවට දැනෙන්නට ඇත්තේ නින්දේ තරමටය.

"පුදුමයිනේ..." තේජානි කීවේ ඇයටමය.

"මිස් ඒ වෙලාවෙ ඇහැරිලාද හිටියේ...?" එවර ශාන්තා ඇසුවාය.

"ටිකක් ඇහැරුණා... රති මිස් ආවේ ඒ වෙලාවෙ නේ... මං හොඳට පොරවගෙන නිදාගෙන ඉන්දෙද්දි..."

ශාන්තා සිනැහුණාය... එක කාමරයේ සිටියා වුවද බොහෝ විට අනෙකා එද්දී නිදාගන්නා තැනැත්තිය නම් අවදි වන්නේම නැත... ඔවුන් එක සේ වෙහෙසවන ළඳුන් රැසකි... ඒ වෙහෙස පමණක් නොව ඔවුන්ගේ ජීවිතයේ ඇති කිසියම් නිස්සාරත්වයක් නිසාදෝ ඔවුන් සියල්ලෝම එම නේවාසිකාගාරවල සියලු සැප සම්පත් මැද වුවද ජීවත් වූයේ තරමක කණස්සල්ලකින් බව ඇයට නම් හොඳින්ම වැටහී තිබිණ...



එක්තරා අන්දමකින් නම් ඇය වුවද ජීවිතයේ සමහර දෑ කෙරෙහි කලකිරීමකින් පසුවූ තැනැත්තියක හෙයිනි.

ශාන්තාට සිතුණා සේම එහි කානටත් පොදු දහම එම නේවාසිකාගාරයේ සිටින තේජානිටද බලපා තිබිණ.

★★★

ජීවිතයේ එක් කඩයිමක් වන අපොස උසස්පෙළ විභාගයට සූදානම් වෙද්දී පියා අසනීපයෙන් වැටුණා ඇයට අමතක නැත... කෙසේ වුවත් ඇය ඇයගේ විභාගය කරගත්තේ බොහෝ මුදල් අග හිඟකම් මැදය. විභාගය ඉහළින් සමත්වුවද, විශ්ව විද්‍යාලයයට ඇතුළුම් පත් ගෙන ආදාට පසුදා පියා හා මව පමණක් නොව ගමේ කිහිප දෙනෙක්ද මරු වසඟයට ගියේ වන්දනා ගමනක ගිය වෑන් රථය පෙරළීමෙනි...

ඒ අනතුරින් තනිවූයේ ඇය පමණක් නොවේ... ඇයගේ පියාගේ සොහොයුරාගේ දියණියක්ද තනි වූවාය... ඇයට එවකට වයස හතකි... එකම පවුලේ සොහොයුරන් තිදෙනෙක් මෙන්ම ඔවුන්ගේ බිරින්දෑවරුන්ද දරුවන් දෙදෙනෙක්ද ගමේ තවත් පවුල් දෙකක එලෙසම කිහිප දෙනෙක්ද ඒ මාරාන්තික රිය අනතුරින් මිය ගොස් තිබුණහ.

ඇයට අද මෙන් එදින මතකය...

ඇය තනිවූයේ ජීවත් වීමෙ කිසිවක්ම ගැන සිතාගත නොහැකිව සිටියදීය... ඇයට මවක නොවීම මවක් මෙන් වන්නට සිදුවිය...

පළමු අවුරුද්දේ දානය දෙනතෙක් ඇයට මෙන්ම නැඟණියටද පියාගේ රැකියා ස්ථානයෙන් ලද තරමක මුදලක් තිබිණ... විශ්ව විද්‍යාල සිහිනය ඇයට අතැර දමන්නට සිදුවිය... ඇය ඉන්පසු රැකියා සෙව්වාය... ඇයත් නැගණියත් දෙදෙනම සිටියේ ඒ අනතුරින් මිය නොගිය පුංචි අම්මා සමගිනි... අවුරුද්දේ දානයෙන් පසු පුංචි අම්මාට යළිත් විවාහයක් කරගන්නට ඇයගේ පාර්ශ්වයෙන් බල කළහ... අවුරුදු තිස් පහක ළඳක් එලෙස තනිකරලීමට පුංචි අම්මාගේ කවුරුවත් කැමැත්තක් නොදක්වන්නට ඇත...

පුංචි අම්මා විවාහ පත් වූ පසු ඇය ඇයගේ සැමියාගේ ගමට

යන බව දන්වා තිබුණ හෙයින් තේජානිට හා රසිකාට දූන් යන්නට තැනක් නැති විය... සොහොයුරන් දෙදෙනාගේම ගෙවල් වෙන්දේසි වූයේ ඒවාට ගෙවා ගැන්මට හැකියාවක් නොතිබුණ නිසාය...

පුංචි අම්මාගේ නිවස විකුණන්නට ඇයගේ අය තීරණය කරගත්තෙන් තේජානිට සිදුවූයේ අතරමං වීමටය... දූන් ඇයට ඇයගේ කියා ඉතිරිවී සිටියේ නැගණිය පමණකි... දෙතුන් දෙනෙක් ඒ දෙදෙන පිළිබඳව බොහෝ සානුකම්පිතව බැලුවද, බොහෝ දෙනා බැලුවේ ඇයගෙන් පර වැඩ ගන්නටය... නැගණියට උගන්වා කිසියම් තැනකට ගෙන ආ යුතුය... ඇය සිතාගත්තේ නැතහොත් කුඩා ඇයද අතරමං වෙන බව දන්නා හෙයිනි.

නැගණිය ඇයගේ නැන්දාගේ නිවසට වරක් ගෙන ගිය නමුදු ඇයට එහි තේජානි වැනිව ආදරයෙන් සලකන්නට කිසිදු නැනැත්තෙක් හෝ නැනැත්තියක නොවූ හෙයින් කුඩා ඇය තේජානි ගේ සිරුරේ එතෙමින් ඇයව ගෙන යන්නට යැයි හඬන්නට ගන්නෙන් මවපියන්ද නැතිවුණු කුඩා ඇයගේ සිත තැලීමට ඇය අකැමැති වූ හෙයින්ම නැගණියද තේජානි වෙතම තබා ගැනීමට පසුව සිදුවිය...

නිවස වෙන්දේසි කර ඇයට ලැබුණු මුදල්ද සෙමින් සෙමින් වියදම් වී යමින් තිබිණ...

ඇය දහිරිය දමා රැකියාවක් සෙව්වාය...

ගී ගායනයට හා නර්තනයට අවශ්‍ය කණ්ඩායමක් සැදීමට තරුණියන් ඉල්ලා පුවත් පතක දූන්වීමක් ඇය දුටුවේ ඒ අතරය... ඇය එයට ඉල්ලුම් පතක් දූමුවාය... ඇයට ගී ගායනයේ මනා හැකියාවක් හා රංගනයේද දක්ෂකම් තිබුණ හෙයිනි... ඇය ඉන්දියානු විභාග තුනක්ද නිම කර තිබිණ...

ඇය බලාපොරොත්තු වූයේ විශ්ව විද්‍යාලයට ඇතුල්වූ පසුව අනික් විභාගය නිම කරගැනීමටය... ඒ බලාපොරොත්තු දූන් සියල්ලම පියා හා මව සමගම පොළවට වැළලී පස්වී යමින් තිබිණ.

පුවත් පතේ දූන්වීම ඇයගේ සිතට ගෙන ආවේ තරමක සතුටකි...

දූන් ඇය හා නැගණිය සිටියේ ඇයගේ මිතුරියකගේ නිවසක කාමරයකය... එයට ඇය මුදලක් ගෙවූවද, තවත් මාස හය හතකින්



පසු එවැන්නක් හෝ කර ගන්නට තරම් ඇයට මුදලක් නොලැබෙන බව ඇය දූන සිටියාය... ඇයට අවශ්‍ය වූයේ හැකි පමණ ඉක්මණින් රැකියාවක් සොයා ගැනීමය...

නොදූනුවත්වම ඇය ආවේ කිසියම් තරු පහේ හෝටලයක ගී ගයන්නියන් හා නළඟනුන් තෝරා ගන්නා සම්මුඛ පරීක්ෂණයකට බව ඇය දූනගත්තේ එයට ඉදිරිපත් වූ පසුය... ඇයගේ රුවද එහිදී බොහෝ සේ ඇයගේ ලකුණු මට්ටම ඉහළකට ගෙන දමා තිබිණ.

ආත්මගරුත්වය තබාගෙන රැකියාවක් දෙන්නට තරම් කවරෙක් හෝ නිර්ලෝභී පුද්ගලයෙක් ඇයට එතෙක්ම සමුවී තිබුණේ නැත. බොහෝ අය ව්‍යාංගාර්ථයෙන් ඇයගේ ගැහැනුකම මුදලට ගන්නට තැතනූහ. එවන් වේලාවන්හිදී ඇයට ඇයගේ ගැහැනුකම ගැනද කෝපයක් නැගී තිබිණ... මවකට ගරු කරන බොහෝ දෙනා මවකගේ හැකියාව ඇති ගැහැනුකම මුදලට මැනීම ඇයගේ සිතේ දනවා තිබුණේ වේදනාවකි... කෙසේ වූවද ඇය බොහෝ දේවල්වලින් ගැලවුණේ මවගේ හා පියාගේ පමණක් නොව අර නැගණියගේ මව්පිය දෙදෙනාගේ ආශිර්වාදයද ඇයට ලැබුණ නිසාම විය යුතුය...

ඒ සියල්ලම ගැන සිතද්දී ගැහැනුකම වක්‍රමාර්ගයෙන් ඉල්ලමින් රැකියා දෙන්නට තැතනූ බොහෝ දෙනා අතර මෙම පරීක්ෂණයේදී කෙලින්ම ඒ ගැන සාකච්ඡාවක් දියත් කළේ ඒ මොහොතේම තෝරා ගත් කිහිප දෙනා සමගය...

එහිදී ඉදිරිපත් වූ කොන්දේසි තිබිණ.

ඔවුන් සියල්ලෝම එහි නේවාසික විය යුතුය... විවාහ පත් වීමේදී රැකියාවෙන් අස්විය යුතුය... කැමැති නම් පමණක් ඔවුන්ට සම්බාහන ආයතනයේද වැඩ කළ හැකිය... එම වැටුප වෙනමය... අමතර සේවාවන් සඳහා ඔවුන්ට යම් යම් අය තිළිණ කරන මුදල් ඉහළට අවශ්‍ය නැත... ඒවා ඔවුන්ට තබා ගත හැකිය... එලෙස අකැමැත්තේ නම් ගායිකාවක හෝ රංගනියක ලෙස පමණක් සේවයේ යෙදිය හැකිය... ලෝකයාගේ ඔවුන් ගැන හැඳින්වීම කෙලෙසක වූවද ඔවුන් අකැමැත්තේ කිසිදු පිරිමි ඇසුරකට එක් නොකරන බව අවධාරණය කෙරුණු අතර, නේවාසිකාවන්ට පූර්ණ ආරක්ෂාවද සහතික කරන බව කියැවිණ...

එම සාකච්ඡාවට සහභාගිවී එයට කැමැත්ත දෙන්නට පළමු

ඔවුන්ට නේවාසිකාගාර පෙන්වා දීමටද ඔවුන් උත්සුක වූහ...

ආරතී ඒ වෙනවිටද එහි ගායිකාවක ලෙස කටයුතු කළාය... ඇය නම් උපතින්ම රූමතියක බව ඇය දකිද්දීම තේජානිට සිතිණ... ඇය තේජානිට වඩා වසරකින් වැඩිමහල් විය.

★★★

ඒ වෙද්දී ඇය එහි පා තබා තිබුණේ දෙවන අවුරුද්දටය... දුටු පළමු දැකුමෙන්ම ඒ දෙදෙනා අතර හිතවත්කමක් ඇති වූවා වැනිය... ආරතී එහි සියල්ල ගැන දැනුවත්ව සිටියාය... ඇය එහි පැමිණ තිබුණේ අපොස උසස්පෙළ දෙවන වසරේය... මව නැතිවෙද්දී ඇයද සාමාන්‍ය පෙළ ඉගෙන ගනිමින් සිටියක වූවාය. උසස්පෙළ මගක් යද්දී පියා නවත් විවාහයකට කැමැත්ත දී තිබුණේය.

කුඩම්මා ඇවිත් සිටියේ දරුවෙක්ද සමගිනි. දරුවා යැයි හැඳින්වීමක් කළද දරුවා ආරතීටද වඩා වසර කිහිපයකින් වැඩිමල් සොහොයුරෙක් විය... සොහොයුරා ඇයට අනිසි බලපෑම් කරන්නට වන්නේය... කර කියා ගන්නට දෙයක් නැතිවෙද්දී ඇය ගෙදරින් පැන්නාය...

ඒ කිසියම් මහළු කාන්තාවක් බලා ගැනීමට තරුණ ළඳක් අවශ්‍යය යන දැන්වීමක් අනුවය. වැරැද්දක් වුවද, තමාගේම නිවසේදී කිසියම් කරදරයකට බඳුන් වෙනවාට වඩා වෙනත් නිවසක මෙහෙකාරියක ලෙස හෝ සේවයේ යෙදීමට ඇය ඒ වෙද්දී තීරණයක්ද ගෙන සිටි හෙයිනි... කෙසේ වුවද, එම නිවසේ සිටියේ මැදිවියේ යුවළකි. ඔවුන්ට අවශ්‍ය වූයේ මහළු මවගේ තනිය මැකීමට හැකි තරුණියකි... අනික් සියල්ලම සඳහා වෙනත් සේවිකාවක සිටියාය... සේවිකාවන් සිටියද මවට පත්තරයක් කියවීමට බයිබලය කියවීමට ඔවුන්ට නොහැකිය... ඔවුහු කිතු බැතිමතුන් වූහ. එහෙත් ආරතීගේ දහම නසන්නට ඔවුන් නොසිතූහ... ඇයට පන්සල් යෑමට තහනමක් ඔවුන්ගෙන් නොතිබිණ... ඇයව පන්සල් රැගෙන යන්නටද ඔවුන් පොරොන්දු වූහ. ඇය එලෙසම ඔවුන් සමග පල්ලියටද ගියාය...

ඔවුන්ගේ පොරොන්දුව ඔවුන් ඒ ලෙසම ඉටු කළහ.



එහිදී එලෙස ඔවුන්ගේ සැලකිල්ල ඇයට ලැබෙන්නට වූයේ, ඇයගේ විනීත ගුණ ගරුක භාවයද බලපා තිබුණු නිසාද වන්නට හැකිය... බොහෝ තරුණියන්ට යන එන මං නැතිවන්නේ නිවසක සේවාවට ගිය පසු කරන නොපණත් කම් නිසා බව නම් කවුරුත් දැන සිටි හෙයිනි... පිටරට මෙහෙයකට ගියද තමා ගුණ ගරුක අන්දමින් ඒ සේවාව කරගෙන ඉන්නට පෙළැඹෙන්නේ නම් කරදරයක් වෙන්නේම නැත... ආරතී එවන් තරුණියක නොවන්නට ඇත...

එහෙයින්ම ඇයට එහිදී කිසිදු කරදරයක් සිදුවූයේද නැත... ඇය එහි සිටියේ සැබැවින්ම ඔවුන්ගේ දියණියකම ලෙසිනි... එහෙත් ඇය ඇයගේ තත්ත්වය හොඳින්ම වටහාගෙන සිටියාය... ඇය ඔවුන්ගේ ආශිර්වාදය මැද ඇයගේ සමහරක් ආශාවන් සපුරා ගත්තාය... එයින් එක් ආශාවක් වූයේ හොඳින් සංගීතය ඉගෙන ගැනීමය... විභාගයක් කරන්නටම නොව ඇය ඒවා කළේ සිතේ ආශාවටය...

සංගීතය පමණක් නොව ඇය තරමක් දුර නැටුම් කලාවද හැදෑරුවාය...

ඒ සම්බන්ධ බොහෝ දේවලදී ඇයගේ රූමත් කම හා දක්ෂකම නිසා බොහෝ දැට ඇයට ඇරයුම් ලැබුණද ඇයට පිළිසරණක් වූ නිවැසියන්ගේ සිත් බිඳවීමට අකැමැති නිසා ඇය පළමුව නම් කිසිවකටත් සහභාගී වූයේ නැත...

එක් අතකින් එලෙස වූයේ යම් හෙයකින් තම පියා හෝ අර සොහොයුරා ඇයව දැක ඇයට නිවසට එන්නටයැයි කීවහොත් යන බියද ඇයගේ තිබුණ බැවිනි... එවකට ඇය සිටියේ දහහත් වැනි වියේය... එහෙයින්ම ඇය බොහෝ ප්‍රවේශම් වූවාය... කෙසේ වූවත් ඇයට දහඅට සම්පූර්ණවූයේද එම නිවසේදීය...

ආරතී එහි සිටියේ අවුරුදු දෙකකි. ඉන්පසු එම මහළු මව නැතිවෙද්දී ඇය නිකමට මෙන් පුවත් පත් දැන්වීමේ තිබූ මෙම සම්මුඛ පරීක්ෂණය ගැන දැනගත්තී එයට ඉදිරිපත් වුණාය... ඇයගේ රූව සියල්ලටම වඩා එහිදී බලපා තිබිණ... මැදිවියේ සිටි ඇයගේ භාරකරුවන් ඇයට එයට ඉඩ දුන්නේ ඇයට දැන් ලෝකයට තනියම පිය තගන්නට ඉඩ දිය යුතුය යන අදහසිනි. ඇය වැරැදි දෙයක් කරන තරුණියක නොවන බව ඔවුහු දැන සිටියහ... ඉදහිට දිනෙක ඇය ඒ යුවළ බලන්නට යන බවද ආරතී ඒ විස්තරය තරමක් දුර තේජානිට පවසද්දී කීවාය...

පියා ගැන ඇය සෙව්වේම නැත... ඇය ඇය හඳුන්වාගත්තේ අනාථවූ තැනැත්තියක විලසිනි. ඇය ඒවා තේජානිට කිවේද පසුව එක් කාමරයක නේවාසිකයන් ලෙස වසන්නට ගත් පසුය... ඇය පළමුව තේජානිටද කීවේ ඇයගේ දෙමාපියන් ගැන මතකයක් නැති බවය... ඒ ඇයගේ සිතේ තිබෙන කිසියම් බියක් නිසා බවද තේජානි දැන ගත්තේ පසුවය...

කෙසේ වුවත් තේජානි ඕනෑම රහසක් රකින්නට හැකි හොඳ මිතුරියක් ලෙස වටහාගත් පසු ආරතී ඇයගේ තොරතුරු සියල්ලම තේජානිට කියන්නටද තීරණය කරගන්නට ඇත...

සෑම අවුරුද්දකම මෙන් එම සේවාව අළුත් වෙන බව ඇය කිවේ එහිදීය... මෙම ස්ථානයේ එම සේවාව කළ හැකි වන්නේ අවුරුදු විසි අටක් හෝ විසි නවයක් වෙන තුරු පමණක් බැවිනි... උපරිම වයස වන්නේ තිහය. එහෙත් එහිදී ඔවුන්ට ලැබෙන්නේ සුපිරි වැටුපක් නොවුණද තවත් කාලයක් හොඳින් ජීවත්වීමට තරම් එය සෑහෙන්නක් බවද ඇය කියුවාය...

එම නේවාසිකාගාරයේ සිටියේ ගායිකාවන් හා රංගනියන් පමණක් වුවද, මෙම තත්ත්වයෙන් පිට මුදලක් ලබන්නට කැමති තරුණියන්ට හා තරුණයන්ට වෙන්වූ වෙනම නේවාසිකාගාරයක්ද තිබිණ...

මෙම නේවාසිකාගාරයේ ඇතුළට පිරිමින් රැගෙන ඒම තහනම්ය... කවුරු කෙසේ කිවද අයිති කරුවන්වත් එම ස්ථානයට නොපැමිණෙන බව ආරතී කියුවාය. එය බලාගන්නට ආවේද කාන්තාවකි...

සොහොයුරෙක් හෝ මිතුරෙක් හෝ සමග පිටතට යෑමට ඔවුන්ට තහනමක් නොවිණ. එහෙත් යන්නා ගැන විස්තරයක් සටහන් කළ යුතුය... ඔවුන් වුවද නේවාසිකාගාරයටම ආවේ නැත... මුරකාර කුටිය අසළම එලෙස පැමිණෙන අමුත්තන්ට වෙනම කුටියක් තනා තිබිණ.

මේ සියල්ලමද ඇය දැනගත්තේ ආරතී ගෙනි... ඇය තේජානි එන්නේ නම් ඇයගේ කාමරය ඇය හා බෙදා හදා ගන්නටද කැමැති වූවාය...

★★★

නොදනුවත්ව පැමිණියද එයින් දැනුවත්වූ ඇය එය රැකියාවක් සේ සලකමින් එයට බැඳෙන්නට සිතාගත්තේ නම් එදාමය.

එහෙත් අක්කා හෝටලයක ගී ගයන්නියක බව නැගණියට කීමට ඇයට නොසිතිණ... ඇයට එම පැණය නිරාකරණය කරන්නටද පිහිටට ආවේ ආරතීය... ඇය කීවේ අර යුවළගෙන් අසා නැගණියව එහි නවත්වන ලෙසය... ඔවුන් ගේ පිහිටෙන් තරමක් දුරක පිහිටි ජනප්‍රිය නොවූවත් හොඳ පාසලකට නැගණිය ඇතුළත් කර ගැනීමටද ඇයට හැකිවිය...

සියල්ල යහපත් අන්දමින් කෙළවර විය...

ඇය හෝටලයේ සේවයට බැඳුණාය... දැන් අවුරුද්දකට වඩා ගෙවී ඇත... එදා මෙදාතුර මිතුරිය කීවාක් මෙන්ම ඇයට කරදරයක්ද වූයේ නැත... නැගණියට ඇය කීවේ කිසියම් රංගායතනයක සේවය කරන බව වුවද, නිවසේ දෙදෙනාට නම් මුසාවක් නොකියන්නට ඇය සිතුවාය... ඔවුන් බොහෝ යහපත් පුද්ගලයන් බව තේජානි දැනගත්තේද ආරතීගෙනි... ඔවුන්ද එලෙසම එය කී හෙයිනි. ආරතී ගැන දන්නා හෙයින්ම තේජානිද යහපත් යුවතියකැයි සැලකීමට එම දෙමහල්ලෝ පෙළැඹී සිටියහ... ඒ දෙදෙනාටම තරුණයින් ගැන විසයක් නැති බව ඔවුන් වටහාගෙන සිටි හෙයිනි..

කෙසේ වූවත් එම වසරේ තරමක් දුරට එය වෙනස්වූයේ ඒ අතරතුර හෝටලයට යන්නට එන්නට ගත් සංජය පලන්සූරියගේ සිත ආරතී වෙත කාන්දමක් මෙන් ඇදේද්දීය.

සංජය ආරතීට කැමැති බව... නැත ආදරයක් කරන බව මුලින්ම දැනගත්තේද තේජානිය.

ඔහු ඇයට පළමුවර කථා කරද්දී ආරතී තරමක් පසුබෑ බව දැනගත්තේද තේජානිය...

ඔවුන් දෙදෙනාගේ පෙම් සබඳතාවය ගැන මුලින්ම දැනගත්තේ ද තේජානිය...

එහෙත් ආරතීට සංජය හා විවාහ පත් වීමට නම් නොහැකි වන බව ඇය පමණක් නොව ආරතීද දැන සිටියාය...

සංජය පලන්සූරිය යනු බොහෝ ප්‍රසිද්ධ පුද්ගලයෙක්ගේ පුතෙක් බැවිනි... ඔවුන්ගේ තරාතිරම අනුව ආරතී වැනි තැනැත්තියකට පුතාගේ බිරිඳ වීමට ඉඩ දෙතැයි සිතන්නට නොහැකිය... පියාගෙන් පසු සංජය එම තනතුරටම ඔබින ලෙස දුන් දුන් සියල්ලටම දායක විය යුතුය... ඔහු පැමිණියේ පිටරට ඉගෙනීම නිමවා එහි අවුරුදු පහක උසස් මට්ටමක රැකියාවක්ද නිම කළ පසුය... ඔහු ආරතීට වඩා අවුරුදු දොළහකටත් වඩා වැඩිමහල් විය... සංජය දේශපාලනයට යොමු කිරීමට පියාගේ අදහසක් තිබිණ...

එය ආරතීද දැන සිටියාය.

එහෙයින්ම සංජයට තමා වැනි තරුණියක බිරිඳ කරගන්නට නොලැබෙන බවද ඇය දැන සිටියාය... කෙසේ වුවත් ඇයගේ සිතටද සංජය අමතක කිරීම අපහසු වෙමින් තිබිණ...

සංජයට නිවසින් විවාහ යෝජනාවක් ගෙනැවිත් තිබෙන බව ඇය දැනගත්තේ පසුගිය සතියේය... ආරතී සිටියේ තරමක වේදනාවකිනි... ඒ ගැන කථා කරගන්නට යැයි ඇයට සංජය හමුවීමටද අවශ්‍යතාවයක් තිබිණ...

ඊයේ ඇය යන්නට ඇත්තේ සමහරවිට ඒ ගැන කථා කරගන්නට සිතමින්ද විය හැකිය... මුදලක් ගත යුතු නිසා ඇය පළමුවම යන බව කීවේ බැංකුවටය...

ඇයගේ පැරණි බැංකු පොතට දැමූ කිසියම් චෙක්පතක මුදලක් එයට බැරව් තිබෙන්නේදැයි දැනගැනීමටද ඇයට අවශ්‍ය නිසා ඇය ඒ බැංකු පොතෙන්ම මුදල් ගන්නා බව කියා අනික් බැංකුවේ කාඩ් පතද ලාච්චුවේ තබා යන බවද තේජානිට කීවාය... ඔවුන් දෙදෙනාගේ කාඩ්පත් අංක දෙදෙනාට දෙදෙනා දැන සිටියහ... මුදල් පිළිබඳ කිසි දිනෙක ඔවුන් අතර වංචාවක් සිදුවූයේද නැත...

සංජය මුණ ගැසීමටද යායුතු බව ඇය කීවේ බැංකුවේ සිට දුරකථන පණිවිඩයක් දෙමිනි... චෙක් පතේ මුදල එයට වැටී ඇත... එම පණිවිඩයද ආරතී තේජානිට කීවාය... එහෙයින් වෙනත් වැඩ ඇයට ඒ මොහොතේ තිබුණේම නැත... එදින ඇයට නිවාඩුය...



එහෙයින්ම ඇය අද දිනය සංජය හා ගත කරන බව මිතුරියට දැනුම් දුන්නේ සැබැවින්ම නම් තමාද මිතුරිය නැතිව බියපත් වෙන බව ඇය හොඳින්ම දැන සිටි හෙයින්ද විය යුතුය...

සංජය ඇයට එන්නට වාහනය එතනට එවන බව ඇය කීවේ තේජානි යන්නේ කෙසේදැයි අසද්දීය... වෙනදා නම් ඇය යන්නී දන්නා හඳුනන ත්‍රිරෝද රියකින් නැතහොත් කැබ් රථයකිනි. එසේත් නැතහොත් සංජයගේ රථය මෙහි එන්නේය... බොහෝ විට ඔහු ඇවිත්ම ඇය රැගෙන යන්නේය... ඉදහිට දිනෙක ආරතී එලෙසද සංජය හමුවීමට යන බව දන්නා හෙයින් තේජානි ඒ ගමන ගැන සැකයක් නම් ඇති කරගත්තේම නැත... එනිසාම මිතුරිය හවස් වෙද්දී කාමරයට නාවේ සංජය මුණ ගැසෙන්නට ගිය නිසා බව නම් තේජානි දැන සිටියාය... එහෙත් ඇයට පුදුමයක් වූයේ ඇයගේ මෙම ආගමනයය.

එදා මෙදා තුර කිසිදාක මෙලෙස ඇය රැයක පැමිණියේ නැත... සියල්ලටමත් වඩා ඇය රැයේ පැමිණ දැන් උදයේ යළිත් ගොස් ඇත...

එයටත් වඩා ආරතී එලෙස තමාට නොකියා කවදාවත් යන්නේ නැත... යන්නේ නම් කුඩා සටහනක් ලියා තබා යන බවද ඇය දන්නීය... අද එවැන්නක්ද ලියා නැත... පුහුණුවීම් ශාලාවට යද්දීද ඇයගේ සිතේ තිබුණේ මේ ආරතීගේ ආගමනය හා විගමනය ගැනය.

★★★

"මොකද ජානි පරක්කු වෙලා... ඔයා පැයක් විතර පරක්කුයි අද... මේ දැන් තේ ගේන වෙලාව..." එතන සිටි පුහුණුකාරිය මෙතාලි මිස් කීවේ තේජානි බොහෝ සැකයෙන් මෙන් දොර විවර කර හිස දමනු දකිද්දීමය. නොමනාප හඬකින් මෙන් කියූවද ඇය කවදාවත් මෙහි සිටින තරුණියන් සමග නොමනාප වන්නේ නැති බව පමණක් නොව කෝප වන්නේද නැති බව සියල්ලෝම දැන සිටියහ...

"නින්ද ගියා මිස්..." කියාගෙනම තේජානි ඇතුළට ආවාය... ඩ්‍රම්ස් වාදක මයන්ත කැස්සක් ගත්තේය...

තේජානි ඔහු දෙස බැලුවේ නොපහන් බැල්මකිනි.

"පොදරිමක් ගියා නේ මිස්... මටත් නින්ද ගියා..." ඔහු කීවේ ඇයගේ බැල්ම මගහරවමිනි... විහිළු තහළු කළද මයන්ත බොහෝ විට ඇයට උදව් උපකාර කළේය..

තේජානි දෑස් විසල් කර මයන්ත දෙස බැලුවාය... ශාන්තා කීදේ නිවැරදිය... තමාට දැණුනු තරමේ වැස්සක් තිබී නැත.

"ඒක නිසා වෙන්න ඇති අද මේ මයන්ත ටිකක් වැරැද්දුවෙ..." කියාගෙන සමුදි ආවාය.

"ආ... ඒ ඔයා වැරැද්දුව නිසා මං ඒක හරිගස්සන්න ගියා..." මයන්ත ඇඟ බේරාගන්නට බැලුවේය...

"මෙකගෙ බොරු ජානි... ඊයේ මෙ අළුත් සිංදුවක් ප්‍රැක්ටිස් කරන්න කියලා කිව්වා... දවසෙම හිටියේ නෑළු... දූන්..."

"මොකක්ද අළුත් සිංදුව...?" තේජානි ඇසුවේ එවර මයන්ත දෙස බලමිනි. ඇයට ආරතී ගැන තරමක් අමතක විය.

"බලන්න අහගන්න පුළුවන් අර කැසට් එකේ ඇති..." ඇයට කියූ මයන්ත සමුදි දෙස බැලුවේය... "බොරු කියනවත් වෙලා පොළොව පැලෙන බොරු කියන්න එපා... මට එහෙම ප්‍රැක්ටිස් කරන්න පුළුවන්ද සිංදුව තෝරගන්නත් ඉස්සෙල්ලා..."

"දූන් සිංදුව තෝරගෙන නැද්ද...?"

"තෝරගත්තා... දැන් ඉතින් ප්‍රැක්ටිස් කරන්න පුළුවන්..."

"ඔයාට තමයි කියන්න වෙන්නේ... ඒක ඉංග්‍රිසි සින්දුවක් නේ..." සමුදි කීවේ තේජානිටය...

"බලමු..." කී තේජානි නැගිට්ටාය.

ඇය ගියේ ගී තැටි තබා තිබෙන මේසය දෙසටය...

"මෙන්න ජානි... මේක අහන්න..." මෙනාලි කීවේ පසෙක තැබූ සැන්ඩ්විච් පෙත්තක් සපන අතරම තේජානිට කැසට්යක් දිගු කරමිනි.

"මේකද අද මං ප්‍රැක්ටිස් කරන්න ඕන..." තේජානි ඇසුවාය.

"ඔව්... ඔතන ඔත්ත වර්ඩ්ස් ටිකත් ඇති... අද බැරි උනත් කමක් නෑ... ඉස්සෙල්ලා අහලා ඉන්නකෝ..."



තේජානිද සැන්ඩ්විච් පෙත්තක් අතට ගනිමින් කැසට් පටිය කැසට්යට ඇතුල් කළාය...

ඇය එය අසන්නට වූයේ එම සින්දුවේ පද රචනයද ඉදිරියෙන් තබා ගනිමිනි... එහෙත් දැන් එයට සවන් දෙන අතරතුරද ඇයට සිහිපත් වූයේ ආරතීගේ මෙම පුදුම රාත්‍රී ගමනය... ආරතීගේ පෙම් පුවත ගැනය...

තේජානිට සිංහල ගීත පමණක් නොව හින්දි දෙමළ හා ඉංග්‍රීසි ගීතද හොඳින් ගැයීමට හැකියාවක් තිබිණ... කිහිප වරක් අසද්දී ඇයට වෙනත් භාෂාවක හෝ ගීතයක් ඒ අයුරින්ම ගැයීමේ හැකියාව තිබිණ... ඇයට එම පරීක්ෂණයේදී වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා තේරීමට හේතු වූයේද එම හැකියාවය... වරක් ඇය ජපන් ගීතයක්ද එලෙසම වර නගා ගැයුවාය..., කොරියන් ගීතයක් ගැයුවාය... ඒ හැකියාව මෙතෙක්ම එම ගායන වාදන වෘන්දයේ කිසිවෙකුටත් නොතිබිණ.

ආරතීගේ රූමත් කම හා නැටුම මෙන්ම ඇයගේ ගීත ගායනයද බැලීමට හා ඇසීමටද එයට ඇදී එන්නෝ බොහෝ වූහ... ඒ දෙදෙනාටම විශේෂ සැලකිලි තිබුණේද එහෙයිනි. අන් අය ඒවා ගැන ඊර්ෂ්‍යාවක් කරන්නටද නොගියහ...

එක් අතකින් බලද්දී ආරතී ඇයගේ රූමත් බව විදහා දැක්වූවද තේජානි බොහෝ විට ඇයගේ සාමාන්‍ය ස්වරූපය සැමදාම මෙන් වෙනස් කළාය... ඇය ගී ගයනු අසද්දී මෙන්ම දකිද්දී බොහෝ අයට සිතුණේ බටහිර සංගීතයට වඩාත් බර හිපි තරුණියක් වැන්නක් සිංහල ගී ගයන බවය... ඒ ඇයගේ වෙස් වලා ගැනීමද හේතුවෙනි... එහෙත් ආරතී ඇයගේ සාමාන්‍ය ස්වරූපයෙන්ම ගීත කීවාය... පළමුවරම ආරතී දකිද්දී ඇයට සංජය වහ වැටුණේද ඇය එලෙස දිනක් රංගනයට දායක වෙද්දීය...

අන් කිසිවෙක් ගැන එලෙස නොසිතූ ආරතී සංජය ඇය වෙත එද්දී නම් සැලුණාය...

'අපිට ජීවිතයක් නෑ නේ ජානි... ඇත්තටම ඔයාට නං තාත්තිවත් ඉන්නවා... ඒත් මට...' දිනක් ඇය කීවේ සංජය හා ඇයගේ ජීවිතය ගැන තරමක් කථා කළ තේජානිටය... එයත් සැබෑවකි... ඇය වෙනත් යමක් එදා කියන්නට නොගියාය... නැළිපිළි හැඳ පෝරුවකට නැග මංගල අෂ්ඨක මැද විවාහයක් කරගන්නට නම් ඒ පෙළන්තියේ කිසි

තැනැත්තියකට හැකියාවක් නැති බව සියල්ලෝම දන සිටියහ... තාමත් කන්‍යාවියක් ලෙස සිටියද... මෙලෙස රැකියාවක් කරන තරුණියන් ගැන තිබෙන නොපහන් බව ඔවුන් දෙස බලන ඔවුන් ගැන අසන සියල්ලන්ගේම සිත් තුළ තිබෙන බව නම් තේජානිද දන සිටියාය... එහෙත් ආරතී තේජානි පමණක් නොව සැබැවින්ම ඒ නේවාසිකාගාරයේ සිටි හය හත් දෙනාම එලෙස අයාලේ යන්නට නම් කිසි දිනෙක සිතුවේම නැත...

සම්බාහන ආයතනයේ මෙන්ම එහි සේවිකාවන් ලෙස සේවයේ යෙදෙන අන් අය නම් වෙනම නේවාසිකාගාරයක සිටි අතර එය තිබුණේ හෝටලයේම පැත්තකය...

තේජානි සිටි නේවාසිකාගාරය මෙන්ම පුහුණුවීම් ශාලාවන්ද තිබුණේ හෝටලයට යාබදව තිබූ වෙනත් ඉඩමකය... එයට යාබදවම මෙන් පිරිමි ළමුන් සඳහාද නේවාසිකාගාරයක් තිබිණ... ඔවුන් ජීවත් වූයේ එක් පවුලක සොහොයුරු සොහොයුරන් මෙනි... සියල්ලෝම කුමන හෝ හේතුවක් නිසා ඉගෙනීම කඩා කප්පල් කරගත්තවුන් හෝ නැත්නම් නිවෙස් වලින් පැන ආ එවුන් වූහ... අසනීපයකදීද ඔවුනොවුන්ගේ උදව් ඔවුනොවුනට ලැබිණ... එහෙත් පෙම්වතුන් සිටියේ දෙදෙනෙක්ට පමණි...

පිරිමි ළමුන් දෙදෙනෙකුට පෙම්වතියන් යැයි කියාගන්නා දෙතුන් දෙනෙක් සිටියද, අනෙක් තිදෙනාටම එලෙස පෙම්වතියන් යැයි කිව හැකි යෙහෙළියන් නොවූහ... එක්කෙනෙක් නම් ඉගෙන ගන්නා යුවතියක් හා පැනේ මිතුරුකමක් ගෙන ගිය අතර කෙසේ හෝ ඇය හා යහළුවන බවටද ඔට්ටු අල්ලමින් සිටියේය... ඔවුන්ට නම් තරුණියනට වඩා තරමක නිදහසක් තිබිණ...

එහෙත් එහි එක් නීතියක් තිබිණ... රැකියා අවස්ථාවේදී හෝ පුහුණුවීම් අවස්ථාවල් වලදී ඔවුන්ට මත්පැන් සපුරා තහනම් විය... එක හොඳක් තිබිණ... හෝටල් සේවාව කෙරුවද කවුරුත් දන්නා අයුරින් මත්පැන් හා සංගීතය එකට යන්නේ යැයි කියමින් මත්පැන් ගන්නට තරම් වූ කිසිවෙක් ඒ නේවාසිකාර දෙකේම නොසිටියහ... පිරිමි ළමුන් දෙදෙනෙක් නම් මත්පැන් ගත්තේ නමුදු... හෝටලයේ නොව සේවාවේ නීතිය කඩා බිඳ දමන්නට ඔවුන් කිසි දිනක පෙළැඹී නොසිටියහ...





අළුතින්ම ආ පෙම්පුවත වූයේ ආරතීගේ හා සංජයගේ පෙම් පුවතය... එහෙත් අනෙක් දෙදෙනාට මෙන් නොව ඒ පෙම් පුවත දුර දිග ගෙන යන්නට තරම් හැකියාවක් ආරතීට නැති බව කවුරුත් දන සිටියහ...

ඇයට අවවාදයක් දෙන්නට වුවද කිසිවෙක් සමත් නොවූහ... එහි සිටි අයගේ එකම අරමුණ වූයේ ඉන්නා ටික කාලයට හෝ, ජීවිතයේ මඳ දිනකට හෝ, සතුටින් සිටීම බව දන සිටි නිසාය...

තරුණියන්ගෙන් දෙදෙනෙක්ටම මුදල් හදල් යැවීමට දෙමාපියන් හා සොහොයුරු සොහොයුරන් සිටියහ... ආරතීට එලෙස බරක්ද නොවිණ... ඇය බොහෝ විට අන් අයට උදව් පදව් කළේද එහෙයිනි... ආරතීට සංජය විවාහ කරගන්නට ලැබෙන්නේ නම් යෙහෙකැයි තේජානි නම් බොහෝ විට සිතුවා පමණක් නොව එය පැතුවාය... ආරතී ඇයට පමණක් නොව සියල්ලන්ටම හොඳ යෙහෙළියක වී සිටි හෙයිනි...

කෙලෙසක පැතුවද ඒ පැතුම් ඉටු නොවන වෙලාවන්ද තිබෙන බව තේජානි දත් හොඳින්ම දන සිටියාය... ඇයගේ ඉරණමද මෙතනට ලියැවී තිබුණා විය හැකිය... ඇයටද ඉදිරි ජීවිතයක් නැත... ඇයගේ එකම අරමුණ වූයේ නැඟණියව හොඳ තැනකට ගෙන ඒමටය... ඇය විශ්ව විද්‍යාලයයට ගිය දිනයක තමා මෙයින් අස්විය යුතුය ඇය සිතාගෙන සිටියාය... ආරතී එයට නම් එපැයි නොකීවාය...

ඇයගේ අනන්‍යතාවය සඟවාගෙන ගීත ගයන මෙන් ආරතී කීවේද, පරිගණකයක් රැගෙන ඒවා ගැන ඉගෙන ගන්නා මෙන්ද ඇය තේජානි උනන්දු කළේ එහෙයිනි...

'ඔයාට පුළුවන් ඔයා ගැන දන නොගන්න විදියට ටිකක් වෙස් පෙරළි කරගෙන සින්දු කියන්න... විග් එකක් කාරිය දාලා... රසල්ට පුළුවන් හොඳට එහෙම වැඩ... මාත් ඉස්සර තං එහෙම කළා... පස්සේ ඉතින් මං ඒවා අතැරියා...'

'ඉතින් ඇයි මටත් පුළුවන් නේ...?' තේජානි ඒ මොහොතේදී කීවේ වෙස් වලා ගැනීමෙන් ඇතිවන යහපත් තිබේදැයි යන්න සිතෙන අතරමය...

'නෑ ජානි... ඇත්තටම ඔයාට නංගියෙක් ඉන්නවනේ... එයා

වාසිටියට හරි ගිය දවසක... ඔය ලොකු ලොකු එව්වොත් මෙහේ එනවා... වැරදිලාවත් ඔයාගේ ෆොටෝ එකක්වත් ගියොත්... එතකොට නරක් වෙන්නේ කෙල්ල... එයා හිතන්න ගන්නේ වෙනම විදියකට...'

නැතැයි තේජානිට කිව නොහැකි විය... ඒ ගැන දැනුම දීම ගැන ඇය මිතුරියට ස්තුතිවන්තද වූවාය... ඒ නිසාම ඇය ගීත ගායනයේදී අර තරම් විකාර රූපී ඇඳුම අඳින්නට සිතුවාය... මෙතෙක්ම ඇයගේ රුව ගැන කිසිවෙකුටත් එලෙස දකිද්දී නම් දැනුමක් තිබුණේම නැත... ඒ තරම් ජීවිතය ගැන දැනුවත්ව සිටි ආරතී සංජය සමගම මිතුරුවූයේ කිමදැයි තේජානි වරක් ඇසුවේ සැබැවින්ම ඇයට සංජය හා සමග ඉදිරි ජීවිතයක් ගත කරන්නට නොලැබෙන බව සියල්ලෝම දැන සිටිය බැවිනි... අන් අයට ඒ ගැන පැණයක් නගන්නට හැකියාවක් නොතිබුණද, මිතුරියගෙන් එය අසන්නට තේජානිට හැකියාවක් තිබිණ.

'සංජු ගොඩක් හොඳ කෙනෙක් ජානි... එයා මට ඇත්තම කිව්වා... ඒත් එයා හිතාගෙන ඉන්නවා ටිකක් කල් ඇරලා හිමින් සීරුවෙ මාත් එක්කම රට යන්න... ඒක හරියයිද නොයයිද කියලා නං කියන්න බෑ... එයාගේ තාත්තාගේ හිතේ තියෙන්නෙ ඉතින් වෙනින් දෙයක් නේ...' ඇය කීවේ සංජය හා මිතුරුවී මාස දෙකකට පමණ පසු තේජානිගේ පැණයට පිළිතුරු සපයමිනි... ඒ සංජය දේශපාලනයට ගැව්ම බව ඇයට සිතිණ... 'පුළුවන් උනොත් මං ඔයාවත් ගෙන්න ගන්න බලන්නං... යන්න ලැබුණොත්...' ආරතී එදා කීවේ තරමක් දුක්මුසු ස්වරයකිනි.

'මාව එක්ක නොගියත් කමක් නෑ රතී... ඔයා පුළුවන් නං සංජය හරි මැරි කරන්න...'

'ඒවා හීන වගේ ජානි... ඒත් ඉතින් මෙච්චර කලක්ම වැනි වැනි හිටිය මට මේවගේ හීනයක් හරි දකින්න ලැබුණ එක වාසනාවක් නේ...' එදා ඇය කීවේ තේජානිගේ සිනාවක්ද නංවමිනි...

ඔවුන් බොහෝ විට නිදහසේ කථා බහ කරන්නේ දිනයේ නිවාඩුවක් පැමිණි දිනකය... සතියේ දින හතරක් ඔවුන් දෙදෙනාටම ගායන හා රංගනයේ යෙදෙන්නට නියම වී තිබුණහ... අනික් දින තුන පුහුණුවීම ය... එම පුහුණුවීම් දිනයක පැයක් දෙකක් ප්‍රමාද වූවා කියා තහංචියක් දමන්නට කිසිදු කෙනෙක් නොවීණ.

ඉඳහිට වෙනත් යෙහෙළියක හා එක්වූවද, තේජානි පැමිණි



පසු ආරතී බොහෝ විට ගී ගායනයට හා රංගනයට එක්වූයේ ඇය සමගය... ආරතීට තේජානිට වඩා ඉංග්‍රිසි භාෂාවේ දැනුමක් තිබුණද, කථා බහ බොහෝ හුරුබුහුටි වූවද, ඉංග්‍රිසි ගී ගායනයේදී නම් තේජානිට දෙවැනි වූවාය... තේජානිට එලෙස ගී ගැයීමට නම් තිබුණේ සහජ හැකියාවකි.

ආරතී ඉංග්‍රිසි ඔප් නංවා ගත්තේ අර නිවසේදී බව ඇය කීවේ තේජානිගේ නංගීගේ ප්‍රශ්නය ඉදිරියට එද්දීය.

'නංගි එහේ ඉන්දවමු තේජානි...' එකල ඇය තේජානිට කථා කළේ තේජානි යනුවෙනි... එය පසුව ජානි වූයේ කවදාදැයි කාටවත් මතක නැත... කෙසේ වුවත් එයට නම් තේජානි අකැමැත්තක් දක්වූයේම නැත... ඒ සියලු දෙනාම බොහෝ විට හැඳින්වූයේ වෙනත් නම වලින් හෙයිනි... ඔවුන්ගේ සැබෑ නම් දැන සිටියද ඒවා භාවිතා නොකිරීමට කවුරුත් සිතා සිටියා වැනිය... නම් දෙකේ කොටසක් භාවිතා කළේ නම් තේජානි හා ආරතීම පමණකි. 'මටත් මෙච්චර ඉන්ග්ලිෂ් පුළුවන් උනේ ඒ නිසා... අද ඉන්ග්ලිෂ් නැතුව බෑ කිසි දෙයක් කරන්න... අනික ඒ අන්කල්ට හොඳට කම්පියුටර් එහෙමත් පුළුවන්... ඉතින් නංගිට ඒක හොඳයි... හැම දෙයක්ම එයා කියලා දෙයි නංගිට... ඒ දෙන්නට දරුවෝ නැති නිසා ඉතින් නංගිට නං ගොඩක්ම කැමැති වෙයි... අපි වගේ නෙවෙයි නේ... නංගි පොඩි නේ...'

ආරතී එදා කීදේ කෙතරම් සත්‍යයක්දැයි තේජානි වටහාගත්තේ නැගණියගේ පාසල් වාර්තා පොත දකිද්දීය... ඇය ඒ පන්තිවලදී ගන්නා ලකුණු ගණන මෙන් දෙගුණයක් නංගී ඉංග්‍රිසි භාෂාවටද ලබා තිබුණාය...

බොහෝ විට ඇය එහි සිටි ඒ දෙදෙනාගේ නැන්දණිය සමග කථා කළේද ඉංග්‍රිසියෙනි... එතරමට හුරුබුහුටි අන්දමින් ඉංග්‍රිසිය යෙදවීමට තේජානි නම් දැන සිටියේ නැත.

දැන් තමා ගෙන යන ජීවිතයේ සැහැල්ලුවට ප්‍රධානම හේතුව ආරතී බව තේජානි සිතුවේ සැබැවින්ම මිතුරිය කෙරෙහි තැගුණු දැඩි සෙනෙහසකින්ද යුතුවය...

එතෙක් මෙතෙක් ඇය සංජය හා සමග ගියද තමාට නොකියා එක් දිනක්වත් රූයේ පිටව ගොස් නැත... දින දෙක තුනක්ම එලෙස ගියද ඇය ඒවා තමාට කී බව තේජානිට මතකය... සියල්ලටමත් වඩා සංජය හා ගිය ආරතී එලෙස රැයක ආවාද මතකයක නැත...

කෙසේ වූවත් ඊයේ රෑයේ කිසියම හදිසියක් සිදුවන්නට ඇත... තේජානිට සිතිණ... ආරතීගේ දුරකථනයට කථා කළයුතුය ඇය සිතුවෙ දූන් ඇය අසමින් සිටි ගීතය නිම වෙද්දීමය... මෙතෙක් එය අමතක වූවා ගැන ඇයට දැණුනේ තරමක ඇය සමගම කෝපයකි.

ඇය දෙවන වරද ගීතය අසන්නට එය දැමුවාය...

තේජානි යනු මොන තරම් ප්‍රශ්න තිබුණද, ඇයගේ සේවාව හොඳින් කරන්නට හැකියාවක් තිබුණු යුවතියකද වී සිටියාය.

මයන්ත ඇය ළඟටම එනු ඇය දුක්කේ නැත... එපමණටම ඇය ගීතය හා ආරතී අතර දෝලනය වෙමින් කල් යැවුවාය.

★★★

"උඹ සින්දුව අහනවද...? නැත්තං ගීත බලනවද...?" මයන්ත ඇසුවේ තේජානි එයින් තිගැස්සෙද්දීමය... තේජානි වටපිට බැලුවාය... සියල්ලෝම දූන් කෑමෙන් බීමෙන් සප්පායම වෙති... සියලුම ශබ්ද නැවතී ඇත... ඇත්තේ මෙ ගීතයේ හඬම පමණකි... අන් අය ඔවුනොවුන්ගෙ කථා බස්වල යෙදී සිටියහ.

"මොකද ජානි...? ඔයා පුදුම විදියට බය උනේ...?" අසමින් මයන්ත පුටුවක් ඇදගෙන ඇය ඉදිරියේ වාඩිවුණේ අතේ තිබුණු කඩදාසි පිගානද එතන මේසය මත තබමිනි... ඔහු එහි සැන්ච්විච් පෙති කිහිපයක් හා කට්ලට් කිහිපයක් දමාගෙන සිටියේය.

"කන්න... ඔයාටත් එක්ක ගෙනාවෙ..." ඇය ඒ දෙස බලා ඔහුගේ මුහුණ දෙස යළි බලද්දී ඔහු කීවේය... ඇය කථාවක් නැතිවම තවත් කට්ලටයක් ගත්තාය...

"මොකද හලෝ මේ විදියට බය වෙන්නේ...? ඔයා අද ඇදේ මොන පැත්තෙන්ද නැගිට්ටෙ...?" මයන්ත ඇසුවේ අද තේජානි ගේ කිසිම කාර්යක්ෂමතාවයක් නැත්තේ කිමදැයි සිතමිනි. වෙනදා ඇය මෙයට වඩා උද්යෝගිමත්ය... බොහෝ අයට වඩා සැහැල්ලුවෙන් ඇය මෙහි ජීවිතය ගෙනයන බව ඔහු දන්නේය... ඇය තරමක් සසලවී සිටියේ ආරතීගේ පෙම්පුවත ගමුවේ පමණක් බව නම් ඔහු දන සිටියේය... ඒ මිතුරියට සංජය නැමැත්තා හා කෙදිනකවත් විවාහ පත්



වන්නට නොහැකි බව ඇය දැනගත් දිනයේ සිටය... සංජය යනු කවුදැයි සොයා ගත්තේ තමාය... එහෙත් තමා මෙන්ම ඇයත් එයට එරෙහි වන්නට නම් සිතුවේම නැත... එය ගැන සාකච්ඡා කළා පමණකි...

"නෑ මයන්ත... ඇත්තටම මං කල්පනා කළේ රතී ඊයේ රෑ ඇවිල්ලා මටත් නොකියා උදේම ගියේ කොහේද කියලා..."

මයන්තගේ දෑස් හැකිළිණ... ඔහු නළලද හකුළාගෙන ඇය දෙස හොඳින්ම එවර බැලුවේය...

"රතී ආවා...?" ඔහු ඇසුවේ තරමක පුදුමයකිනි.

"ඔව් ඇයි...?"

"රතී ඊයේ උදේ ගිය ගමන්මද...?" මයන්ත ඇසුවේය.

තේජානි එවර සියල්ලම අමතක කොට මයන්ත දෙස බැලුවේ තරමක සෝපහාස සිනහවකින්ද යුතුවය.

"හොඳට ඇහැ ගහගෙන ඉන්නෙ නේද...?"

"ඇහැ ගහගෙන නෙවෙයි හලෝ... මං බැල්කනියෙ හිටියේ වාඩිවෙලා තේ බිබී... මං දැක්කා රතියා එළියට එනවා..."

"මාත් ගියානෙ..."

"උඹ ගියා...?" මයන්ත ඇස් උඩ තියාගත්තේය... එවර යළි පියවි වුණේය... "බොරු කියන්න එපා... උඹ ගියේ නෑ රතී විතරයි ගියේ... මං ඒ වෙලාවෙම අරූ කෑගැහුව නිසා ඇතුළට ගියා... හැබැයි මං දැක්කෙ නෑ දිවාරථය..."

මයන්ත සංජයගේ සුවිසල් මොටෝරියට දමා ගෙන ඇත්තේ ඒ නාමයය. සැබැවින්ම එය කෝටියක පමණ වටිනා කමකින් යුත් වාහනයක් බව තේජානි දැනගත්තේද මයන්තගෙනි.

"බැන්ක් එකටත් ගිහින් යන්න ඕන කියලා කිව්වෙ... එයා බැන්ක් එකට ගියාම එතනට එන්න ඇති ඔයාගේ දිවාරථය..." තේජානි උපහාසයෙන් සිනහසී කියමින් එවර තවත් කට්ලටයක් ගත්තාය. යළි මයන්ත දෙස බැලුවාය... "එයා මෙහෙන් යන්න ඇත්තේ පීනා එක්ක..."

පීනා යනු හෝටලයේ කුඩා වෑනයේ රියැදුරුව නේවාසිකාගාරයේ සිටි තරුණියන් විහිළුවට දමාගෙන තිබෙන නමය...

ඇය එද්දිද සියල්ලෝම ඔහුට කථා කරමින් සිටියේ ඒ නම්නි... ඔහුගේ නම නම් තරමක් මතක තබා ගන්නට අපහසු නමක් බව ඇයට කීවේ ආරතීය... ඔහු පිනා කියනවාට අකැමැත්තක් දැක්වූයේද නැත... ඇයට මතක් වූයේ ඉදහිට ඔහු හා කරන කථා බහය... ඔහුගේ කථා බහද හත් පණේ කිරිහාමිගේ මැනිය... ඇයගේ සිනහව එවර ආවේ එය මතක්වෙද්දීය... ඇය එලෙසම තවත් කට්ලට් එකට අත යැව්වාය.

"උඹ ඔක්කෝම කට්ලට් ගන්න එපා... මං මේ මටත් එක්කම ගෙනාවෙ..."

"මටත් එක්කනේ..." තේජානි ඇසුවේ එවර නම් සියලුම බර සිහිවිලි පහවී ගිය ස්වරයකිනි. මයන්ත ඒ ස්වරයට කැමැතිය.

"ඔව් නැත්නං... මගේ හොඳ අක්කලාට මං සලකන්න එපැයි..." ඔහු කීවේය... උඹ බං බොලං කීවාට මයන්ත සැබැවින්ම තේජානිටත් වඩා මාස ගණනකින් බාලය.

"හො...ඳ...අ...අ...අ මල්ලී..." තේජානි කීවේ තවත් සැන්ඩ්වියක් ගන්නා අතරය.

"මෙහෙම කැවොත් මට ඉතුරුවෙන එකක් නෑ..." කියූ මයන්ත එවර පිඟාන තේජානිගේ අතේ මානයෙන් ඉවත් කළේය... තේජානි සිනහසී යළිත් ගීතය දැම්මාය... එය සෙමින් වාදනය වන්නට විය... ඇය හඬ තරමක් වැඩි කළාය... යළි මයන්ත දෙස බැලුවාය... මයන්ත කුමක් හෝ කියන්නට යන බව වැටහෙද්දීය.

"ඔයා ගියාද රතිත් එක්ක ඊයේ...?" ඔහු ඇසුවේ තරමක් බැරෑරුම් ස්වරයකිනි. ඉදහිට තේජානිට වෙන වැඩක් නැත්තෙ නම බැංකුවට යද්දී මිතුරියන් දෙදෙනම ගියද, බොහෝ දිනවල සිදුවූයේ ආරතී තනිවම බැංකුවට ගොස් තේජානිට සමගම මුදල් රැගෙන ඒමය... තේජානි නැගණියගේ ප්‍රශ්නය නිසා එළියේ පහළියේ ගැවසීමට මදක් පසුබහින හෙයිනි...

"නෑ නෑ... ඒත් මාත් ගියා... මං කිව්වේ..."

"මං ඔයාව නං දැක්කේ නෑ... ඔයා එහෙනං යන්න ඇත්තේ දෙකයි තුනයි අතරෙ..."

"ඔයා කොහොමද දන්නෙ...?"

"දැක්කනේ...? ඔයා ගිහිල්ලා තියෙනවා..."



"ගියා තමයි... මං ඇත්තටම නංගිව බලන්න ගියා... රතී බැංකුවට යන නිසා සල්ලි ගන්න පුළුවන් කියලා එයා අතේ තිබුණ සල්ලි වලින් මට දීලා ගියේ... එයා ගන්නං කිව්වා මට පස්සේ දෙන්න කියලා... ඇත්තටම ඉතින් මටත් ලේසි නේ... මට දැන් කොහොමටත් මේ සතියේ මෙහෙත් හම්බ වෙනවනේ... ඒ සල්ලි ඒකෙන් දෙන්න පුළුවන්..." ඇය කීවාය... බොහෝ විට ඇය වැටුපින් කොටසක් මාසය මැද අතට ගන්නීය... අනික්වා කෙළින්ම යන්නේ ඇයගේ බැංකු පොතටය... ඒවා සියල්ලම ඒ ලෙස කරන්නට ඇයට ඔවදන් දුන්නී නම් ආරතීය... ඔවුන්ට ඔවුන් වෙනුවෙන් නම් මුදල් හදල් වියදම් වන්නේම නැත...

කළ එකම වියදම ගාන්තාට කීයක් හෝ දීම පමණකි... ඇයටද හෝටලයේ සේවාවෙන් එන වැටුප තිබුණද, නේවාසිකාගාරයේ සිටින තරුණියන්ද කුඩා ගණනක් දීම පුරුද්දක් කරගෙන තිබිණ... ආහාර පානද ඔවුන්ට හෝටලය ගණනේ ලැබෙන්නේය... ඔවුන් වියදම් කළේ තේ වලට හා ඔවුන්ට අමතර ආහාරයක් ගන්නට සිතුණු විටක ගාන්තාට කියා එය සාදවා ගන්නට පමණකි... ඉදහිට එකිනෙකා ගණනේ එලෙස අමතර ආහාරයක් සාදවා ගන්නට අකැමැති කෙනෙක් නොවිණ...

එහෙයින් ඔවුන්ගේ වියදම් නම් රැකියාව සම්බන්ධයෙන් අවම විය... ආරතී බොහෝ විට තේජානිට සොහොයුරියක මෙන් ඔවදන් දෙමින් ඇයගේ වියදම් ගැනද ඇය දැනුවත් කළාය... සෑම මාසයකම මෙන් ඇයගේ වැටුපින් බොතේජු යුවළට කෑමක් බීමක් මෙන්ම නැගණියටද ඇඳුමක් පැළඳුමක් පොතක් පතක් අරන් දුන්නාය... ඇය බොහෝ හොඳ මිතුරියකි... ඇයට සුසුමක් හෙලුණේ ආරතීගේ ඒම හොඳ ගතිගුණ ගැන සිහිවෙද්දීය...

මයන්ත මොහොතකට නිහඬ විය... මිතුරිය සුසුමක් පාකළේ කිමදැයි ඔහු අසන්නට නොසිතුවේය... බොහෝ විට ඇයට පමණක් නොව තමාට වුවද සුසුම් හෙලෙන බැවිනි... තමා තරුණයෙකි... මෙම රැකියාවේ සිටින තරුණියන් විහිළුවෙන් තහළුවෙන් ගත කළද, සුසුමක් නොහෙලා සතුටින් ඉන්නට තරම් තත්ත්වයක් කිසි කෙනෙකුටත් නැති බව ඔහු දැන සිටියේය...

එහෙත් සුසුම් ලමින් සිටින්නට තරම් කිසිවෙක් නොසිතූ බවද ඔහු එලෙසම දත්තේය... ආරතීට පමණක් නොව තේජානිටද ඒ

නියමය එලෙසම ක්‍රියාත්මක වී තිබිණ... දෙවනුව ඇයගේ මුහුණ ඔපවත් වීමෙන්ම ඔහුට එය වැටහිණ...

"ආවේ නං පහට විතර... ආවා දැක්කෙත් නැද්ද...?" ඇය එවර විහිළු ස්වරයෙන් ඇසුවාය...

"මොකටද බොරු කියන්නේ ආව වෙලාව නං දැක්කේ නෑ..." ඔහු කීවේය... "ඒත් ඉතින් ඕන කමක් තිබුණා නං මට හොයාගන්න තිබුණා..."

"කොහොමද මන්දා මෙ ගොල්ල මෙච්චර දේවල් හොයාගන්නේ... එතකොට ඔයා බැල්කනියෙ හිටියේ නැත්තං ඒ වෙලාවෙ... කොහොමද දන්නෙ මං ගියා කියලා..."

"දන්නෙද...? අපි දන්නෙ නැතුව මෙකේ දූවිල්ලකටවත් එළියට යන්න බෑ..."

"උඹලා වැරදිලාවත් කැමරාස් වත් හයි කරලද...?"

"අනේ නෑ නෑ... ඔය ලොකු ලොක්කන්ගේ ජරා වැඩ කරනවද අපි... මී ඇස් දෙකෙන්මයි බලාගෙන ඉන්නෙ..."

"ඔව් ඔව්... මී ඇස් වලින් තමයි බලලා වගේ බලාගෙන ඉන්න ඇත්තෙ..." කියූ තේජානි එවර යළි පද රචනය දෙස බැලුවාය... ඉන්පසු මයන්ත දෙස බැලුවාය... "හොඳ... අ...අ... මල්ලි නේ... එහෙනං මටත් එක්ක තේ එකකුත් ගේන්න..."

"මං දැනගත්තා මගෙත් දූන් ඉතින් සැහෙන වැඩක් පලක් කරගන්න ඉන්න විත්තිය... අර හොඳ එක රබර් උන හැටි දැක්කම..." කියාගෙනම මයන්ත නැගිට්ටේය...

තේජානි ඇස් පියාගෙන තරමක් ගීතය ගැයුවේ ඔහු යළිත් එද්දිය.

"කොහොමද සින්දුව...?" අසමින්ම මයන්ත ඇයගේ තේ කෝප්පය මේසය මතින් තැබුවේය.

"ලස්සණයි... මං මේක අහලා නෑ මෙයිට ඉස්සෙල්ලා..."

"මට අහු උනේ... මං හිතුවා ඔයාගේ වොයිස් එකට අල්ලලා යයි කියලා... මිස් කිව්වා ඒකට චාන්ස් එකක් උනත් ලස්සණට ඩිවෙලොප් කරන්න පුළුවන් කියලා..." කියාගෙන ගිය මයන්ත වටපිට බලා යළි තේජානි වෙත ඇස් යොමු කළේය...



ඔහු මෙලෙස බලන්නේ කුමක් හෝ ඕපාදූපයක් නැතහොත් රස රහසක් කියන්නට බව දැන සිටි තේජානි ඔහු දෙස බොහෝ ඕනෑකමින් බැලුවේ ඇයගේ තේ කෝප්පය අතට ගෙන තොල ගාන අතරමය.

"මොකද මයන්ත...?" ඇය ඇසුවේ සැබැවින්ම ඔහුගේ පෙනුමින් තරමක් වික්ෂිප්තද වෙමිනි. කුමක් හෝ ඇත... ඇයට සිතිණ.

"මේ මේක මට ඇත්තම කියන්න... රති ඊයේ රෑ ආවේ කීයටද...?"

ඊයේ ඇයගේ ආ වෙලාව මයන්තට කුමකටද...? තේජානිට එවර සිතිණ... ජීවිතය මිතුරියගේය... ඒවා කිව යුත්තේ සැබැවින්ම අවශ්‍යතාවයක් තිබේ නම් පමණකි.

"ඔයාට මොකටද...? ඔයා මොකද එයා පස්සෙන් ඉන්න යැයි..."

"මට මොකටද කියලා අහන්නේ හේතුවක් නිසා..." මයන්ත කීවේය.

"හේතුව කියන්න... එතකොට මං කියන්නං..."

"නෑ... ජානි... මේක බරපතලයි... මට පොඩ්ඩක් ආවයි කියන වෙලාව කියනවද...? තාම රති දූන් මෙතනටත් ඇවිල්ලා නැති නිසා..."

"එයා උදෙන්ම යන්න ඇති..."

"ඔයාටවත් නොකියා...?" ඔහු තරමක සැකයකින් මෙන් පැණයක් නැගුවේය... තේජානි මඳක් තිගැස්සුණාය... එය ඇයටත් සැකයක් බව නම් නොකියාම නොහැකිය. ඇය සංජය හා සමග කොහේ හෝ යන්නට සිතුවාද...? නැතහොත් සංජයගේ මෙම විවාහය නිසා ඇයගේ සිතට දැණුනු කම්පනය නිසා කොහේ හෝ... ඇයගේ සිරුරම සිහිතල විය.

"මයන්ත..." ඇයට කියැවිණ. එහි සැහෙන්නට කැළඹිල්ලක් තිබිණ...

"මේක අහන්න ජානි... ඔයාට නොකියා රති කොහේවත් යන්නේ නෑ කියලා මං දන්නවා... අඩු ගාණේ සෙල් එකටවත් මෙසේජ් එකක් නොදී යයිද...?"

"මං සෙල් එක නං බැලුවෙ නෑ..."

"කෝ සෙල් එක...?"

"කාමරේ..." තේජානි කීවාය... ඇයගේ දුරකථනය කවදත් මෙලෙස පුහුණුවීම් වලට රැගෙන එන්නේ නැත... ඒවාට දුරකථන පණිවිඩ දෙන්නට තරම් කවරෙක්වත් ඇයට නම් නැත... අද නම් එය නොගෙනාවා වැරදියැයි ඇයට සිතුණේ මයන්ත එය අසද්දීය... දැන් ආරතී එයට ඇමතුමක් දුන්නද ඇයට දැනගන්නට හැකියාවක් නැති හෙයිනි... දෙවන වර ඇය සිත සාදා ගත්තාය... තමාගේ දුරකථනයට ගෙන එය විසන්ධි වී ඇත්නම් බොහෝ විට ඇය මයන්තට ගන්නට හෝ උත්සාහ කරන බව සිතමිනි... නැගණියද මයන්තගේ දුරකථන අංකය මෙන්ම ආරතීගේ දුරකථන අංකයද දන්නීය...

"ගිහින් බලන්න..." මයන්ත කීවේ එවර තරමක දූඩි හඬකිනි.

"ඔයා පිස්සු කියවන්නේ... මට ආයෙ තට්ටු තුනක් නගින්න... අනික මගේ එකට ආන්ස්වර් නොකළම රතියා ඔයාට හරි දෙයි නේ..." එයත් ඇත්තකි... මයන්තට සිතිණ... ඔහු ඔහුගේ සිතිවිලි නවතාගෙන තේජානි ඉන්පසුව කියන්න ඇසුවේය... "ඊයේ රෑ තමයි රතී ආවේ... ආව ගමන්ම මොකක්ද දන්නවද කිව්වේ... සංජු පව් කිව්වා... එයාට කියන්න කිව්වා... මට නිදිමතේ හරියටම මතකත් නෑ... තවත් මොනවා මොනවා හරි මට කිව්වා... ඒකිට මොකක් හරි අප්සෙට් එකක් වෙලාද දන්නෙත් නෑ... දැන් අද උදේම ගිහිල්ලා..."

"රතී ඔයාත් එක්ක කථා කළා...?" මයන්ත ඇසුවේ පුදුමයෙනි.

"ඔව්..."

"ඔයා හොඳට බැලුවද රතීමද ඒ ආවෙ කියලා..."

"මොකක්ද මයන්ත මේ සී අයි ඩී එකෙන් වගේ ප්‍රශ්න කරන්නේ... ඒ රතීම තමයි... එයා මගේ ඇඳ ළඟටම ඇවිල්ලා නේ කථා කළේ..."

මයන්ත පුදුමයෙන් තේජානි දෙස බලාගෙන සිටියේය.

"මොකද ඒපාර... ඔයාට අද මොකක්ද වෙලා තියෙන්නේ මයන්ත...?"

"කීයටද එතකොට රතී ඔයාට ඔය පණිවිඩේ කියන්න ආවෙ... එයා කාමරේ හිටියද ඔයා නිදාගන්න යනකොට...?"

"මේක මේ..."



"විහිළුවක් නෑ ජානි... මට වෙලාව කියන්න... ඒ වෙලාවේ වැස්සකුත් තිබුණා නේ..."

"තිබුණා... රතී තෙමිලත් හිටියා හොඳටම..."

"තෙමිලා හිටියා... හොඳටම තෙමෙන්න තරන් නං වැස්සක් තිබුණේ නෑ ජානි... තරමක පොදරිමක් තිබුණේ... පැය භාගයක් තියෙන්න ඇති ඒකත්..."

තේජානි දෑස් විසල් කරගෙන මයන්ත දෙස බලාගෙන සිටියාය... ආරතී තෙමී තිබුණේ නම...

"නෑ මයන්ත... ඇඳුං ඇඟටම ඇලිලා තිබුණේ... මං දැක්ක හැටියට... එයා හිටියේ හොඳටම තෙමිලා නේ..." ඇය කීවාය... ඇයගේ කොණ්ඩයද තෙමී තිබුණ බව... නැත එය නම් සිතාගත නොහැකිය... එහෙත් ඇඳුම නම් ඇයට හොඳටම මෙන් මතකය... එය ඇය උදයේ ඇඳගෙන ගිය ඇඳුමමය...

"හරි තෙමිලා කියලා කියනවනං... ඒකත් හරි කියමුකෝ... එතකොට එහෙනං රතී එන්නෙ ඇත්තේ පාර දිගේම පයින් නේ..." ඔහු කීවේ සැබැවින්ම තරමක පොද වැස්සකින් වුවද තරමක් දුර පයින්ම ගියේ නම් එලෙස හොඳටම තෙමුණාක් මෙන් දකින්නට පිළිවන් බව සිතමිනි. එහෙත් එවන් පොදයක කිසිවෙක්ම සෙමින් සෙමින් එන්නට නම් නොසිතන බව ඔහු එලෙසම සිතමින්ද සිටියේය...

★★★

පාර යැයි මයන්ත හඳුන්වන්නේ ගේට්ටුව අසල සිට නේවාසිකාගාරයට එන්නට සාදා තිබෙන කොන්ක්‍රීට් ඇතුරූ මාවත බව තේජානි දන්නීය... ඒ දෙපස මල් වවා තිබේ... තරමක ඉඩමක් නිසා එම පාර දිගේ එද්දී යද්දී පිරිමි ළමුන්ගේ නේවාසිකාගාරයේ ඉහළ මාලයට එය පෙනෙන බව ඇය දන්නීය...

ගේට්ටුව ළඟ සිට නේවාසිකාගාරයට ඇය සාමාන්‍ය වේගයකින් ගියද යන්නට විනාඩි තුනක් හතරක් පමණ යන්නේය... හෝටලයට බොහෝ විට ගනු ලබනුයේ එම මල් පාත්ති වල මල්ය... විශේෂ අවස්ථාවලදී පමණක් ඒවා ඇණවුම් කර ගෙන්වා ගනු

ලබන්නේය. ඉතින් මේ මල්පාත්ති ඇති පාර දිගේ එන යන කවරෙක් වුවත් පිරිමි නේවාසිකාගාරයට පෙනෙනවා පමණක් නොව දන්නා හඳුනන්නෙක් හඳුනා ගත හැකි තරම් එය අසල්වම මෙන්ද පිහිටියේය... එය රාත්‍රියක යැයි වෙනසක් වන්නේද නැත...

ගේට්ටුව හා නේවාසිකාගාරය අතරතුර විදුලි පහන් කණු දෙකක්ම ඇත... ඒවායේ විදුලි එළිය රැයේ හොඳින්ම පාරට වැටී තිබෙන්නේය... එයටත් වඩා නේවාසිකාගාරයට ඇතුල්වෙන තැනම තිබෙන පෝටිකෝවේ හොඳ විදුලි එළියකින් යුත් විදුලි පහනක් දැල්වෙන්නේය... එන කවුරුත් පෝටිකෝවෙන් ආ යුතුය... ඒ එලෙස කර තිබෙන්නේ බොහෝ විට නේවාසිකාගාරයේ බොහෝ අය රෑ බෝවී එන බැවිනි... හෝටලයේ වාහනය පෝටිකෝවටම ගෙනාවද වෙනත් වාහන එලෙස ගෙන එන්නට ඉඩක් නැත... ඉඩක් නැතිවාම නොව... එයට අවසරයක් ලැබෙන්නේ නැත... ඒවා නැවැත්විය යුත්තේ මුරකාර කුටිය අසලය... එහෙයින්ම දිව්‍ය රථයෙන් ආවද මිතුරිය වුවද බැසිය යුත්තේ ඒ කුටිය අසලිනි...

"ඔව්... නැතුව නං ඉතින් මෙතනට දිව්‍ය රථයට ඒ වෙලාවේ එන්න දෙන එකක් නං නෑ කීයටවත්.." තේජානි කීවේ කට කොණකට සිනහවක් නගා ගනිමිනි.

"වෙලාව කියපං බං... මට මේ හිතාගන්න බැරුව ඉන්නවා..." මයන්ත එවර කීවේය.

"දන්නේ නෑ මයන්ත..." එවර නං තේජානි කීවේ මයන්තට මෙම වෙලාව බොහෝසේ අවශ්‍යව තිබෙන බව සිතෙද්දීය... මේ තරුණයින් ටික වෙනත් හෝ මගඩියක් කර ඇය තෙමුවා වන්නටද පිළිවන. එවර ඇයගේ සිතට නැගිණ... වැරදිලාවත් මේ කොල්ලන් මුරකරු නාවන්නට සිතා බාල්දියක් වත් උඩින් සවිකර තිබුණේදැයි ඇයට එවර සිතිණ... වරක් දෙකක් එවැන්නක් වූ හෙයිනි... කාටවත්ම සිතාගත නොහැකි වූවද බාල්දියේ ලණුව තිබුණේ පිරිමි නේවාසිකාගාරයේ තැනක බව ඇයට හා ආරතීට පමණක් කීවේ මයන්තය...

ඔවුන් කළේ මුරකරුවා එම දොරින් එළියට එද්දී දහවල් එලෙස එල්ලූ බාල්දියේ එම ලණුව ඇදීම පමණකි... මුරකරුවා දහ අතට දෙස් දෙවොල් තබද්දී සැඟවී සිටි දෙදෙනෙක් ලණුව ලිහාගෙන



ගොස් තිබුණ බව දැන සිටියේද මිතුරියන් දෙදෙනා පමණකි... ඒ කුමන අරෝවකටදැයි ඇයට දැන් නම් මතක නැත... දැන් ඒ මුරකරුවාත් සේවයේ නැත.

සමහරවිට ආරතී එවැන්නකට අසුවුණා විය හැකිය... දැන් ඇයට සිතෙද්දී ඇය සෝපහාස සිනහවකින් මුව සරසා ගෙන මයන්ත දෙස බැලුවාය.

"කාටද මේ සැරේ බාල්දිය මැනුවෙ..."

"බාල්දිය...?"

"ඔව්... ඕගොල්ලො රෑ කාව හරි බකට් කරන්න ඉඳලා ඒකට රතී අහුවෙනා කියලවත්ද බලන්න ඕන...?"

"නෑ ජානි නෑ... පිස්සුද... දැන් කාට බකට් කරන්නද...? වෙන වැඩකට... මං මේ වෙන දෙයක් නිසා අහන්නේ... එහෙම නං..මං රතීගෙන් අහන්න ඕන ඒක ගැන..." ඔහු එවර කීවේය.

"එහෙනං උඹලා ගිහිල්ලා හොර පොල් කඩන්න..."

"නෑ නෑ... අපි ගිය වැඩේ කියන්නං... මට වෙලාව කියන්න හොඳ...අ...අ... අක්කා වගේ..."

"ඒක නං දන්නේ නෑ මයන්ත... හැබැයි රතියා එන්න ඉස්සෙල්ලා එකක් වැදුණා... එතකොට මං කල්පනා කළා දොළහමාරද එකද එකහමාරද කියලා... ඒකට මිනිත්තු දහයකට විතර පස්සේ තමයි රතියා දොර ඇරගෙන ආවෙ... මං හිටියේ ඇත්තටම අඩ නින්දෙ... ඒකයි රතියා කිව්ව කිසි දෙයක් අහගන්න බැරි උනේ... ඇහුවා... මොළේට ආවෙ නෑ..."

"එක වැදුණා... ඒ කියන්නෙ ඔයා කියන්නා වගේ දොළහමාර එක එකහමාර... විනාඩි දහයකට පස්සේ නේ... හරි... ඒ කියන්නේ දොළහයි දෙකයි අතරෙ වගේ..." මයන්ත කීවේ තරමක් කල්පනා කරන ස්වරයකිනි.

"ඔව්... ඉතින් ඔයා මොකද මේ මේකට මෙච්චර හොයන්නේ බලන්නේ... ඕගොල්ල වැරදිලාවත් මොකක් හරි හොර වැඩක් කරාද...?"

"කියන්න එපා ජානි... ඔව්... වැඩකට හිටියා තමයි... ඒත් එක දෙයක් කියන්න තියෙනවා... ඒ වෙලාවේ කවුරුවත් ඔය පාරෙ නං ආවෙ නෑ..."

එවර පුදුමයෙන් බැලුවේ තේජානිය... "ආවෙ නෑ...?" ඒ ලෙසින්ම ඇසුවාය... මයන්ත මේ ඇයව බිය වද්දන්නට හෝ වෙතත් හේතුවක් නිසා කුමක් හෝ කියා තමා රවටන්නට සූදානම වෙනු වැනිය.

"නෑ... ඒ වෙලාවෙ කාටවත් එතනින් යන්න විදියක් තිබුණෙම නෑ..." මයන්ත කීවේ ස්ථිර කටහඬකිනි.

"අර පැත්තේ පොඩි ගේට් එකෙන්..."

"නෑ... ඒකත් වෙන්න බෑ... අපේ උඩ වහලෙ අර ස්ටෝරු කාමරේට හොඳට පේනවා මුළු වත්තම... අනික... ඔගොල්ලන්ගේ පාරවල් ටික..."

තේජානි එවර නම් බැලුවේ තරමක අමනාප දැසකිනි.

"ඔගොල්ල පිස්සු නටන්න ගිහිල්ලා දවසක මොකක් හරි ලොකු සංගෙදියක් කරගන්නවා..."

"මොන පිස්සුද...? අපි ගියේ පැපරාසි වැඩකට උදව්වෙන්න..."

"මොකක්ද මේ පැපරාසි වැඩේ...?" එවර නම් තේජානිට මිනිස් කුතුහලයක් දැණින... එයින් උපන්නේ මේ පැපරාසි වැඩේ කුමක්දැයි දැනගැනීමේ චේතනාවය... මිතුරිය එම පාරේ නොගියේ කිමදැයි යන පැණය තරමකට යටපත් විය.

"හොටෙල් එකේ කාමරයක් ගැන ඇහැ ගහගෙන හිටියා අපේ මැන් කෙනෙක්... ඌට ගේට් එක පේන්නෙ නෑ... අපි උඩ ඉඳලා ගේට්ටුව දිහා බලාගෙන හිටියා... ඉන් පස්සෙ දුන්නා මෙසේජ් එක... වාහන එන එන ගාණට මෙසේජ්ස් දෙන්න උනා... ඒ උනාට ඒක ප්‍රශ්නයක් නෑ..."

"කාගෙද කාමරේ...?"

"ඒවා ඕන නැති ප්‍රශ්න... අපි ඒක නිසා එතන නැක් ගැහිලා හිටියා අටේ ඉඳන්ම ඊ තුන වෙනකං... ගිහාපු එක ආවේ තුනට..."

"තුනට...?"

"ඔව් තුනට... වැදගත් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් නේ... ඔක්කොම මහජන කටයුතු ඉවරවෙලා බිරිඳට මොකක් හරි මුසාවාදයක් දොඩලා මෙතනට එනකොට... ඉතින්..."



"අර අපේ මැන් බ්ලැක්මේල් කරන එකෙක්ද...?"

"අපෝ... ඕ...ඕ... නෑ... අපේ නෑ හලෝ ඒ වගේ එව්වොන්ට එකතු වෙලා සල්ලි ගරන සිරිතක්... ඒත් අපි උදව් කරනවා... එයා රිපෝටර් කෙනෙක්... එයාට ආව ඔත්තුවකට තමයි මැන් මේක කලේ... එයා තනියම ඔවගේ ඒවා කරලා පුරුදුයි... ඒත් මෙදා අමාරු උනේ... ඒ එනවයි කිව්ව කාමර පේළියට ඉස්සරහ ගේට් එකෙන් ඇතුල් වෙන වාහනේ බලන්න බැරි උන කම..."

"වෙලාවක ඔගොල්ලොත් මොකක් හරි එකකට මාට්ටු වෙනවා ඔය විකාරවලට සපෝට් කරන්න දීලා..."

"විකාර...? නෑ ජානි... මේවා එළියට දාන ඒවා නෙවෙයි... ඒත් එක කට්ටියක් මේවා එකතු කරනවා... ප්‍රශ්න ආවොත් ඒවායින් ගන්න පුළුවන් ප්‍රයෝජන ගොඩක් නිසා... මාත් දෙක තුනකට සම්බන්ධ උනා... අපිට ඉතින් ජානි ඇත්තටම උලේ හිටියත් එකයි පිලේ හිටියත් එකයි කට්ටියක් නේ... වැරදි වැඩක් කෙරෙනවා නං හොයාලා බලන එකෙකුට හරි සපෝට් කරන්න ඕන නැද්ද හොඳයි..."

"හොඳයි හොඳයි... ඒත් එහෙනං මේ කරන්නෙත් වැරදි වැඩක් නේ..."

"නැහැ... ඔයාම හොඳට හිතුවොත් ජානි... අද ඔයා මෙතනට ඇවිල්ලා අවුරුද්දයි... ඇත්තටම මොකක් හරි වැරැද්දක් උනාද නෑ... ඔයාගෙ තත්ත්වෙ තියාගෙන ඉන්න පුළුවන්... උඩින් කරදරයක් නෑ... වෙන හොටෙල්ස් වල මෙයිට වඩා දේවල් වෙනවා... අපි ඔගොල්ල වාසනාවන්තයි... ඒත් අර වගේ උන් දිගට හරහට එන්න ගත්තොත්... එයිට වඩා සිටුවේෂන් එක වෙනස් වෙන්න ඉඩ තියෙනවා... උන් පුරුදු වෙලා ඉන්නේ බලෙන් හරි තමන් කැමති දේවල් ලබාගන්න... මේවා මෙහෙම කරලා තිබුණම... ගොඩක් අහිංසක එව්වො බේරගන්නැකි..."

මයන්ත කියන්නේ කුමක්දැයි වැටහෙද්දී තේජානි තරමක් තිගැස්සුණාය... මයන්ත පොඩි වුවද බොහෝ දේවල් ගැන දන්නා බව ඇය දැන සිටියාය... ඔහු බොහෝ දේවල් කීවේ ආරතී හා ඇය සමගිනි... "කොහොම උනත් කමක් නෑ මයන්ත... ඔයා ප්‍රවේසං වෙන්න... නැත්තං ඉතින් දන්නවනේ... ආයෙ අර අහලා තියෙනවා නේද...? ගහෙන් වැටුනු මිනිහට විනරණත් ගොනත් ඇන්නෙ..."

"මේ පාර එහෙම නෑ අක්කෙ... මං දූන් පදං වෙලා තියෙන්නේ... තාත්තාත් මට කිව්වේ පුළුවන් තරං පරිස්සං වෙයං කියලා..."

"මං කියන්න හිතුවෙත් ඒක... ඔයා ඒ මනුස්සයා ගැනත් ටිකක් හිතන්න ඕන..."

මයන්ත අනාථ දරුවෙකි... ඔහු සාදා ගත් දෙමාපියන්ගෙන් දූන් මව නැත... ඔවුන් සිටියේ කොළඹට නුදුරු වත්තකය... පියාට ත්‍රිරෝද රථයක්ද ඇත... බොහෝ විට මෙම නේවාසිකාගාරයේ අය ගමන් බිමන් යන්නේ එයිනි... තේජානි නැගණිය බලන්නට බොහෝ විට යන්නේ එම රථයෙනි... නැතහොත් එම පියාගේ වෙනත් මිතුරෙක්ගේ රථයකිනි... ඒ දෙකම නැතහොත් බොහෝ විට ඇය ගමන නවතා දමන්නේය... මයන්තගේ පියාගේ දුරකථන අංකයට කථා කරද්දී ඔහු පැමිණෙන්නේය. ඊයේ නම් තේජානි නැගණිය බලන්නට ගියේ අනික් රියැදුරාගේ රථයෙනි. ඒවා මයන්තට පෙනෙන්නට ක්‍රමයක් නැත...

"තාත්තා මාව හදලා තියෙන්නේ ඔන දේකට ඔට්ටුවෙන්න ජානි අක්කේ... ඒ... ඒ..." ඇද පැද කී මයන්ත ඇය දෙස තරමක් කුතුහලයෙන් බැලුවේය... "ඊයේ ඔයා ගියේ කොහොමද එතකොට... තාත්තා හිටියේ නෑ නේ ඊයේ... තාත්තා ඊයේ දිග හයර් එකක් යනවා කියලා කිව්වා..."

"මං ගියේ රන්සිරි අන්කල්ට එන්න කියලා... ඔයා හරි... අන්කල් හයර් එකක මං කථා කරනකොට..." තේජානි කීවාය. ඇය අන්කල් කියා කථා කළේ මයන්තගේ පියාටය. ඔහු කාගේත් අන්කල්ය... බොහෝ විට මෙහි තරුණියන්ට කුමක් හෝ අවශ්‍ය වුවහොත් ගෙන්වා ගන්නේද මයන්තගේ පියාට කියාය... නෑදෑයින් නැති බොහෝ අයට ඔහු නෑදෑයෙක් සේ විය.

"මට සැකයක් තියෙන තැනක් තියෙනවා ජානි... රතී උදේ ගියා මං දැක්කා... ඔයාත් ඒ පාරේ ගියා... මං ඔයා ගියා දැක්කෙ නැති උනාට ඔයා ආවා කියලා මට වසා කිව්වා..." එවර මයන්ත කීවේය.

"ඔගොල්ලො ඊයේ උදේ ඉඳන්ම එතන තැක් ගැහුණද...?"

"නෑ නෑ... උදේ ඉඳන් හිටියේ නෑ... උදේ ඔය උඩට නැගලා හිටියනං හැමෝටම අහුවෙනවනේ... අපි නිකං බැල්කනියට වෙලා හිටියා..."



"ඊයේ ඔගොල්ලො ප්‍රැක්ටිස් කළේ නැද්ද...?"

"නෑ... මං සින්දු තේරුවා... එතනට වෙලා... ඇත්තටම නං මං සීඩීස් තොගයක් ගෙනාවා... ඒවා අහ අහා හිටියේ... මට මිස් කිව්වා වෙන සින්දු ටිකක් හොයා ගමු කියලා... මං දවල් එතනට වෙලා කළේ ඒක... හවස වසන්තට අර මැන් ගෙ පණිවිඩේ ආවෙ... අද අර ලීඩර් එනවා... දාමු කියලා කවර් අප් පැපරාසි වැඩක්... වසන්ත මටත් කථා කරා..."

තේජානි මුව දෙපැත්ත නැවෙව්වාය... ඇයගේ මෙම හැසිරීම් වලට මයන්තගේ බොහෝ කැමැත්තක් තිබිණ... එවැනි හැසිරීම් වෙනත් කාගෙන්වත් ඔහු දැක තිබුණේම නැත.

"අනේ මන්දා මයන්ත පරිස්සමින් කරන දෙයක්..."

"අපි හොඳ පරිස්සමින් තමයි කරන්නේ ජානි... අනික ඒවා අපි මීඩියාස්වලට දෙන්නෙත් නෑ... මෙක කවුරුවත් දන්නේ නෑ... පිට අයගෙන් දන්නෙ ඇත්තටම ඔය දෙන්නා විතරයි... අපේ පැපරාසි සංගමේ අයත් දන්නවා ඔය දෙන්නා පල්හෑලි කියවන්නේ නෑ කියලා කවුරුවත් එක්ක..."

"දැන් එතකොට අපේ පැපරාසි සංගමේ කිව්වේ... ඔයාත් බැඳුණද ඒකට...?" තේජානි ඇසුවේ තරමක බියකිනි... එය නම් බොහෝ අනතුරුදායක වැඩක් බව ඇය හොඳින්ම දැන සිටි හෙයිනි.

"නෑ නෑ අපෝ නෑ... මං ඉතින් ඒවට ටිකක් සපෝට් එක දෙනවා විතර නේ... ඒත් ඒවා ගැනත් එහෙම දැන ගෙන ඉන්න එක කාටත් හොඳයි..."

"රතී සංජය එක්ක කිව්වොත් තමයි වැඩේ..." තේජානි විහිළු ස්වරයකින් කීවාය.

"රතියා එහෙම කෙනෙක් වෙන්න බෑ ජානි... ඒකි එක වචනෙ කෙල්ලෙක්... මං ඒක හොඳටම දන්නවනේ..."

තේජානි එවර හිස් තේ කෝප්පය මේසය මතින් තැබුවාය.

"මං මේ දැන අතේම කල්පනා කෙරුවෙ... ඊයේ රෑ රතී කොහොමද අපිට නොපෙනෙන්න ආවෙ...?" මයන්ත ඇසුවේ තරමක කුතුහලයකිනි. "ෂුවර් එකටම උඹ හීනයක් දකින්න ඇත්තේ..."

"මොන හීනයක්ද...? රතී මගේ ඇඳ ළඟටම ඇවිල්ලා නෙට් එකෙනුත් එබිලා බලලා නේ කිව්වේ සංජු පව් කියලා... තෙත් බරියත් වෙලත් තිබුණා හොඳටම..."

මයන්ත හිස සැලුවේය.

"ඒත් වෙන්න බෑ ජානි... ඒ වෙලාවේ වැස්සකුත් තිබුණා... ඒකත් ඇත්ත... ඒත් ඒක මේ ගොඩක් තෙමෙන්න තරං වැස්සක් නෙවෙයි... පොදරිමක්... අපි බලාගෙන හිටිය නිසා මං කියන්නේ... රතී ඒයේ ආවෙ නෑ... රතී නෙවෙයි ඒ පාරේ ඒ වෙලාවෙ කවුරුවත් ගියේම නෑ තුන වෙනකං..."

"සමහරවිට පොද නිසා එයා හූවගෙන ආවාද දන්නෙ නෑ නේ... ඔයා ටිකක් වෙලා ගරි ඇතුළට ගිය වෙලාවක..." තේජානි කීවාය... ඇයට දූන් තරමක් සැකයක්ද දනෙමින් තිබිණ... සැබැවින්ම තමා ඒ දුටුවේ සිහිනයක්ද...? ඇයට සිතාගත නොහැකිය... ඒ තරමින්ම ඇය ආරතී සැබෑ අන්දමින්ම දුටු හෙයිනි. සිහිනයක් නම් තරමකට හෝ... අනික දෙවරක් තුන්වරක්ම ඇයගේ දෑස් පියවී ගියද ඒ දෙතුන්වරම දෑස් නිදිමතේ ඇහැරෙද්දී මිතුරිය තමා දෙස බලා සිටි බව ඇයට මතකය...

"නෑ... නෑ හලෝ... මොන මං නියා වසාවත් ඇතුළට ගියේ නෑ... අපි දෙන්නම එතන මුරට හිටියේ... අනික හලෝ ඒ පොදරිමට රචචර තෙමෙන්නේ නෑ හූවගෙනම ආවා නං... හිමින් ආවත් ඔය කියන තරං තෙමිලා ඉන්න විදියක් නෑ..."

"ඔගොල්ලා එතකොට ගියේ නැද්ද... ටොයිලට් එකට වත්..."

"ගියා... මං ඉන්දෙද්දි අරූ ගියා... අරූ ඉන්දෙද්දි මං ගියා... එතන පෝස්ට් එක මිස් කරේම නෑ අපි දෙන්නා..."

"නිකමට හරි ඇහැ පියැළනානං..."

"කොහේ ඇහැ පියන්නද...? අපි දෙන්නා ඒ පැත්තට වෙන්න හොඳ ෆිල්ම් එකකුත් බල බල හිටියෙ..."

"ෆිල්ම් එකක්...?"

"ඔව්... නැත්තං... එහෙම නිදි මරන්න පුළුවනැයි... හැබැයි වොචර් කාරයා නං දෙසැරයක් තුන් සැරයක් කුඩෙත් අරගෙන එහෙ මෙහේ ගියා... ඌ ඉතින් පොදරිම නියා වතුර විදුරුවක් අතේ තිබුණත් කුඩේ ඉහළ ගන්න එකෙක් නේ..."



"බොරු කියනවත් වෙලා මයන්ත ඔහොම බොරු කියන්න එපා... ඔගොල්ලො කොහේද ඔය ඔතන ටීවී හයි කරගන්නේ..." ඇය සිනහසෙමින්ම කීවේ මුරකරු ගැන කියූ කථාව ඇත්තක්ම හෙයිනි... ඒ මුරකරුට තරමක පීනසයක් තිබෙන බව කවුරුත් දන සිටියහ...

"කවුද හලෝ ටීවී එකේ ෆිල්ම් බැලුවේ... අපි පොඩි ලැප් එකක් උඩට ගෙනිච්චා... ඒක අර ජනේලේ පැත්තට තියාගෙන අපි ෆිල්ම් එකක් බැලුවෙ..."

"ෆිල්ම් බලනකොට පෙනෙයි අර පැත්තක යන එව්වො... ඔගොල්ල මේ..."

"නෑ නෑ ජානි... කියන්න එපා... අර මැත් ඒ පැත්තෙන් අපිට ටෙලිෆෝන් කැමරාවකින් එව්වා ඊමේල් කරලා ෂොට්ස් වගයක්... ඒවා බැලුවෙ..."

තේජානි දෑස් උඩ තබා හොඳ හුස්මක් ගෙන මයන්ත දෙස බැලුවේ කට තද කර පියාගෙන දෙපැත්තට කර ගනිමිනි. එවූ ෂොට්ස් මොනවාදැයි ඇයට තරමකට වැටහිණ. නොවෙන්නටත් පිළිවන... වෙන්නටත් පිළිවන...

"දැක්කනේ... කොහෙත්ම බෑ එතනින් කාටවත් යන්න අපිට නොපෙනී... අපි ඒ පැත්තටත් පොඩි සර්ච් පාරක් දාගෙන හිටියේ..."

"එතකොට එහෙනං... ඒ රතී... මං දැක්කේ හීනයක්ද...?" තේජානිට ඇසිණ...

"හීනයක් වෙන්න ඇති... කෝ රතියා ආව නං ප්‍රැක්ටිස් වලට එන්න එපැයි... අද අනික එයා කොහොමටත් එන්න ඕන දවසක්..."

"ඒක තමයි... ෂා... මට කෝල් කරාද දන්නෙත් නෑ... මං සෙල් එක එහෙමම කාමරේ තියලා ආවෙ... ඇත්තටම මට ඒක මතක් උනේ නෑ... මං නැගිටින කොට පරක්කු වෙලා නිසා..."

"උඹට පරක්කු උනා...?"

"ඔව් මයන්ත මෙනදා ඇත්තටම රතී නේ මාව ඇහැරවන්නේ... ඔයා දන්නවනේ මං ටිකක් නිදා ගන්න කැමැති කෙනෙක් විත්තිය..."

මයන්තගේ සිනහවක් නැගුණද යළිත් එය යටපත් විය.

"අනික රතියා එතනින් ගියා මං දැක්කෙ නෑ කියමු... අරූගේ දිව්‍යරතේ අපිට පේන්නම ඕන නේ... අපි වාහන වලට නේ ඇහැ

ගහගෙන හිටියෙ... එතනට දිව්‍යරතයක් තියා ආටෝ එකක් වත් ආවෙ නෑ ඒ වෙලාවෙ... ඔගොල්ලන්ගේ ගේට් එක අපිට හොඳට පේන්න තිබුණ නේ..."

"අනේ මන්දා මයන්ත... ඇත්තටම මගේ හිතේ රති මාත් එක්ක කථා කරේ ඇත්තටම වගේ කියලා..."

"මොනවද කිව්වේ...?"

"දෙසැරයක් තුන්සැරයක්ම සංජු පව් කියලා කිව්වා..."

මයන්තට සිනහවක් ආවේය.

"ඇත්ත නේ... මෙකි බෙල්ලෙ එල්ල ගත්තයින් පස්සෙ උංට පව් තමයි..." තේජානිගේ සිනහවක් පුබුදුවා මයන්ත සිනහසෙමින් කීවේය... "ඒක හිතුව නං ඒකිත්... ඒක හරි... හොඳ කෙල්ල... ඇත්තම කියලා තියෙන්නේ හීනෙන් උනත්..."

"ඒක කියන්න ඕන අපි නේ... එයා කියන එකක් නෑ..." තේජානි කීවාය.

"ඔයාගේ හිතේ තියෙන දෙයක් එයා කියන්න වගේ හීනෙන පෙනුනද දන්නේ නෑ නේ..." මයන්ත කීවේය. කුඩා වුවද මයන්ත බොහෝ පොත් පත් කියවන තැනැත්තෙක් බව තේජානි දන සිටියාය... ඔහු බොහෝ ආශාවෙන් කියෙව්වේද මනෝ විද්‍යාව සම්බන්ධ පත පොතය... ආරතී හා මයන්ත අතර තම් ඒ සම්බන්ධයෙන් බොහෝ එකමුතුවක් ඇත...

"වෙන මොනවද කිව්වේ...? අපිට එතකොට බලාගන්නැකි උඹේ හිතේ තියෙන දේවලුත්..." මයන්ත යළිත් කිව්වේය.

තමාගේ සිතේ එවැන්නක් නැති බව තේජානි මයන්තට වඩා හොඳින් දන සිටියද, දන් ආරතී එලෙස සැබැවින්ම මෙන් සිහිනයෙන් දර්ශනය වූයේ කිමදැයි සිතන්නට ගත්තාය... සංජය ඇයට කිසියම් විපතක් කළා වත්ද...? එසේනම් සංජු පව් කිව්වේ ඇයි... ඇයට විපතක් වූ නිසා සංජයට වෙන කරදරය ගැන ද...? සිතාගත නොහැකි ය... ඇය ඒ සිහිනය නොහොත් දර්ශනය මෙන්ම එහිදී මිතුරිය කළ කී සියල්ලම මතක් කරන්නට ගත්තාය...

"හරිද ළමයි..." ෂෙනාලි කෑ ගැසුවේ ඒ අතරය...

"වෙක් ද ප්ලේසස්... විල් යූ..." ඇය කීවේ මයන්තට හා අනික් තිදෙනාටය...



"කථා කරනවා ජානි... මේක ඉවරවෙලා බලන්න සෙල් එකෙත්... මොනව හරි මෙසේජ් එකක්වත් එවලා ඇති නේ එහෙනං... මට නං ආවෙ නෑ මොකක්වත්..."

"ජානි... කෝ රති...?" එවර ඇසුවේ ෂෙනාලිය.

ඊයේ ආවා... කියන්නට දන් තේජානිට නොහැකිය.

"ඇවිල්ලා නෑ මිස් ෂෙනාලි..." ඇය කීවේ එහෙයිනි.

"අද එන්න ඕන නේද... රති මෙහෙම කවදාවත් නැවිත් ඉඳලා නෑ... කොහේද ගියේ...?" ඇය ඇසුවේ ඇයගෙන්ම මෙන් නමුදු තේජානිගේ මුහුණ දෙසම බලාගෙනය.

"ගියේ නං ඊයේ උදේ මිස්... බැංකුවට ගියේ... එහෙමම යාළුවෙක් හම්බවෙන්න යනවා කිව්වා... අද උදේ තමයි එනවා කිව්වේ... ඒත් තාම එන්න නැතුව ඇති..."

"ඕකේ ඕකේ... හරි අප්... එහෙනං අද ඔයා ලයින් එකට ගන්න රුක්මීව... රුක්මී... අද එහෙනං ඔයයි ජානියි... ජානි ඉන්ග්ලිෂ් නම්බර් එක... යූ හැව් ටු ඩූ දි සින්හලීස් වන්... ඕකේ..." ඇය ඇසුවේ රුක්මී දෙස බලමිනි.

රුක්මී හිස සැලුවාය...

"ඔයා තාම හොඳට බලාගත්තේ නෑ නේ... අද ඕක කරන්න බෑ කියලා හිතෙනවනං... ජානි අපි වෙන එකක් කරමු..." එවර ඇය තේජානි දෙස බලා පැවසුවාය.

"එහෙනං වෙන එකක් කරමුද මිස්... මං මේක පස්සේ ප්‍රැක්ටිස් කරලා එන්නං... දවසෙන්ම කරන්න අමාරුයි..." තේජානි කීවේ දන් මේ මිතුරියගේ ආගමනය නොහොත් සිහිනය ගැන කල්පනාවක් තබාගෙන නොදන්නා සින්දුව පමණක් නොව දන්නා සින්දුවක්ද ගයා ගන්නට හැකිවේදැයි යන සිතිවිල්ලම මැදය... එහෙත් ඇය ඒ ගැන එලෙස කාටවත් දැනුම් දෙන්නට නොසිතුවාය... එයින් වැරැද්දක් වන්නේ ආරතීටය... එලෙස ගිය තැනැත්තියක පසුව ඔවුන් වෙනත් අන්දමේ සේවාවකට බඳවා ගත් බව සියල්ලන්ම දන සිටි බැවිනි... එදා ඒ යුවතිය කළ වැරැද්ද නිසා, ඇයට ඇය අකැමැත්තෙන්ම වුවද එම නේවාසිකාගාරයෙන්ද ඉවත් වීමට සිදුවිය... ඇය තවමත් එහි රැකියාව කළද ඒ ගායිකාවක හෝ රංගන ශිල්පිනියක ලෙස නොවේ...

තේජානිට මිතුරිය ඒ තත්ත්වයට පත් කරන්නට අවශ්‍ය වූයේද නැත... ඇයට වෙනත් යමක් සිතමින් ඉන්නට ෂෙනාලි ඉඩ දුන්නේද නැත...

"හෙටයි අනිද්දයි ඔයා නෙවෙයි... ඔයාට ෂෝ එකක් දෙන්න වෙනවා... ඉන්පස්සෙ දවස් දෙකේම... එදාට ඔයාවයි රතීවයි දෙන්නා කොහොම හරි දාන්න කියලා මැඩම් කිව්වා..." ෂෙනාලි කීවේ ඇයගේ ඒ සිහිවිලි විසුරුවාලමිනි.

"රතී අද එයි මිස්.. එන්න ඕන... සමහරවිට එයාට අද උදේ එන්න හිටියට එහෙන් එන්න බැරි උනාද දන්නේ නෑ වැස්ස නිසා..." ඇය මෙහෙට පොදුරිමක් උනාට ඇය ගිය පෙදෙසට වැස්සක් නම්... ඇය සිතුවේ එලෙසය...

"කොහේද යනවා කිව්වෙ...?" ෂෙනාලි අසන්නට ඇත්තේ නම් නිකමට බව තේජානි දන්නීය... ඔවුන්ගේ පුද්ගලික ගමන් බිමන් ගැන සොයන්නට ඔවුන් සිතන්නේ එයින් ඔවුන්ගේ සේවාවට කිසියම් හානියක් වේ නම් පමණකි... මෙලෙස පුහුණුවීම වලට නොඒම නම් එක්තරා අන්දමකින් හානියකි... තේජානි පිළිතුර දෙන්නට සිතුවේ මිතුරිය බේරාගන්නටද සිතමිනි... සංජය හා ගියා කියද්දී නම් මිතුරියට කුමක් වත් කියන්නට කවුරුත් නොසිතන බව ඇය දන්නීය...

"අවිස්සාවේල්ලෙ වගේ කියලා තමයි මිස් කිව්වේ... ඒත් ඉතින් කියන්න බෑ..." ඇය කීවේ එහෙයිනි... සංජයගේ විවේක ගන්නා නිවස තිබෙන්නේ අවිස්සාවේල්ලේ බව මෙහි ප්‍රකට කරුණක් වී තිබිණ...

"අද එයි නේ... එහෙනං හෙට ඉදන් වත් ප්‍රැක්ටිස් කරමු... ඔයාට එහෙනං එදාට සින්ග් කරන්න මේ ඉන්ග්ලිෂ් නම්බර් එක බලාගන්න... මේකයි... අර අතන තියලා තියෙන අනික් නම්බර්ස් තුනයි... රතීට ඒ එක්කම තියෙන සින්හලීස් සෝන්ග්ස් ටික ගමු..."

තේජානි හිස සැලුවාය...

ඇය ඉන්පසු ඇයගේ ස්ථානයට ගියාය... ඇය අතට මයික් එක ලැබිණ... ඇය පරණ ගීතයකටම පණපෙව්වාය...

පුහුණුවීම අතර මැද වෙනත් කිසිවක් ගැන සිතන්නට අවකාශයක් නොවතුණු ඇයට ආරතීගේ ඒයේ දුටු රුව, නැතහොත්



ස්වරූපය අමතක කළ නොහැකිව තිබිණ... සිහිනයක් එතරම් තාත්වික ලෙස දකින්නේ කෙසේද...? ඇයට සිතාගත නොහැකිවූ එකම කරුණ වූයේ එයය... සිහින යනු සැබැවින්ම දැකීමේදී එකම තලයක මෙන් පෙනෙනාකාරයේ දර්ශන සමූහයක් බව ඇය සිතාගෙන සිටියාය... එහෙත් ආරතීගේ රුවේ ගැඹුරක් තිබිණ... ඇය යහන මත වාඩිවී සිටියේද ගැඹුර හා දුර නෙතට පෙන්වමිනි...

එය සිතමින් ගයන්නට යද්දී වරක් දෙකක් ඇයට ගීතයද වැරදිණ... එහෙත් මයන්ත හා අනික් අය ඒවා වසාගෙන ගීතයට සහය දුන්හ... බොහෝ විට එලෙස වරද්දද්දී වාදන වෘන්දය ඔවුන්ගේ ගීතය නොවරදින්නට නොව... දර්ශනය පළුදු නොවන අන්දමින් ගීතයට වාදනය සපයන්නට සමත් වී සිටියහ... හෝටලයේ දී අවශ්‍ය වන්නේ නිවැරදි භාවයට වඩා නෙත් පිනවීමය...

වෙන දිනයක නම් ඇයට වචනයක් තබා අකුරක්වත් වැරදෙන්නේද නැත... ඇතිය වූවද නැසෙන්නේ නැත... තේජානිගේ තිබුණු දක්ෂකම වූයේ එයය... එහෙත් අද... මයන්ත නම් එයට හේතුව දන් සිතාගෙන සිටියේය... ඔහු එය වසන්තට කියන්නට සිතුවේ පසුවය... ඇයට වැරදෙද්දී වසන්ත ඕගනයේ යතුරු පුවරුවේ අත යවා වයමින්ම මයන්ත දෙස දැඩි බැල්මක් හෙළූ බැවිනි... මයන්ත දෙපසට හිස සලා එය ගණනකට නොගන්නට සංඥාවක් දුන්නේය...

ආහාර ගන්නට නවත්වද්දී දෙකටද ළං වී තිබිණ... ආහාර ගෙන ඉන්පසු සියල්ලෝම විවේකයක් ගත යුතුය... හයහමාර වෙද්දී ඔවුන්ට රෑ කෑම ගත යුතුය... හෝටලයේ ඔවුන්ට සේවාව එන්නේ නවය පසුවූ පසුය... අතර මැද ඔවුන්ට කුමක් හෝ කුඩා දෙයක් කන්නට බොන්නට හැකිය... එකොළහ පමණ වෙන තෙක් එහි ගී ගැයිය යුතුය... ඉන්පසු ඔවුන්ට නේවාසිකාගාරයට එන්නට වරම් ලැබේ...

රාත්‍රී එකොළහෙන් පසු ඔවුන්ගේ සේවාව එහි අවශ්‍ය නැත... ඉන්පසු ඒවායේ යන්නේ වෙනත් කැබරේ රංගන බව සියල්ලෝම දනිති... නේවාසිකාගාරය දොළහ වෙද්දී වසන්නේය... ඉදහිට දිනයක කවරෙක් හෝ පිටත ගියහොත් නම් දොළහට පසු එන වෙලාවල්ද නැත්තේ නොවේ... එහෙත් බොහෝ විට කථා කරගත්තාක් මෙන් ඔවුන් කිසි දිනෙක දොළහ පසුවී ආවේ නැත...

ඊයේ ආරතී එලෙස ආවා ගැන තේජානිගේ සිතේ පුදුමයක් නැගී තිබුණේද එහෙයිනි...

මයන්ත කීවාක් මෙන් සමහරවිට මෙ නම් ඇය දුටු සිහිනයකැයි ඇයට සිතිණ... සමහරවිට ඇය නොදන්නවාට, එවැනි ත්‍රිමාණ රූප සිහිනද තිබෙන්නට හැකිය... මෙ එවැන්නක් ඇය දුටු පළමු වතාව නිසා ඇයට එය නුහුරු බවක් ගෙන දෙමින් තිබෙනවා වැනිය...

එහෙත් එතෙක් මෙතෙක් ඇය දුටු ස්වභාවිකම සිහිනය එය බව නම් ඇය සිතමින් සිටියාය... කෙසේ වුවත් දූන් උදයේ එන්නට නොහැකි වූ නිසා ආරතී ඇයගේ දුරකථනයට නම් පණිවිඩයක් දිය යුතුමය...

★★★

ඇයට දුරකථන දෙකක් තිබිණ... සියල්ලන්ටම එය පොදු න්‍යායයක් විය... එක් දුරකථනයක් එතනින් ලබා දෙද්දී බොහෝ අය පුද්ගලිකව තවත් දුරකථනයක් පාවිච්චි කළහ... ආරතීට මෙන්ම තේජානිටද එය පොදු විය... එහෙත් අන් අය මෙන් නොව ඒ දෙවැන්න ඇය ගත්තේ නැගණියට කථා කිරීමෙ පහසුවටය...

පෞද්ගලික දුරකථනයක් සේ එය ගත් හෙයින් ඇය එම අංකය දුන්නෙ නැගණියටත් ආරතීටත් මයන්තටත් ඔහුගෙ පියාටත් පමණි... එහෙත් එයට කථා කළේ නම් බොහෝ විට නැගණියම පමණකි...

මයන්ත වුවද එයින් කථා කළේ නැත... කථා කරන්නට තරම් අවස්ථාවක් ආවේද නැත... ඔහු අංක ඔහුගේ දුරකථනයේ තබාගෙන සිටියේද නැත... ඔහුට එම අංක කටපාඩමින් කිව හැකි වූ නිසා ඔහුගේ ජංගම දුරකථනයේ ආරතී හෝ තේජානිගේ එම පුද්ගලික දුරකථන අංක සටහන් කරගත්තේම නැත... ඔවුන් තිදෙනම එම පුද්ගලික දුරකථන ගත්තේ එකම දිනයේ අන්තිම අංකය පමණක් වෙනස් කරවමිනි. මයන්තගේ පියා වුවද කථා කළේ අනික් අංකයටය.

මයන්තගේ අංකයට පසු අංක නිසා මයන්තගේ පියාටද ඒවා මතකයේම තබාගෙන සිටීමට අවශ්‍ය නොවිය... එයට හේතුවක්ද තිබිණ. ඔහු තේජානිගේ මෙන්ම ආරතීගේ ප්‍රශ්නද හොඳින් දැන සිටියේය...



එහෙයින් මයන්තගේ පියා පමණක් නොව මයන්තද, මිතුරන්ගේ අතින් අතටද යන දුරකථනයට එම අංක දෙක දමා ඔවුන් දෙදෙන අපහසුතාවයට පත් කරන්නට නම් කිසි දිනෙක නොසිතුවේය...

මයන්ත නම් එලෙස කළේ දන්නා කාලයකදී අනාථ ඔහුට ආදරයෙන් සැලකුවේ හදාගත් දෙමාපියන් දෙදෙනාත් මෙම තරුණියන් දෙදෙනාත් පමණක්ම හෙයිනි.

"රතී කෝල් කරලා තිබුණොත් මට කියන්න..." මයන්ත කීවේ පුහුණුව අවසානයේ යන්නට සැරසෙද්දීමය.

"ඒ මොකටද...?" තේජානි ඇසුවාය.

"නිකං... ඊයේ රෑ අර තරං පැපරාසි ඇස් මැද්දෙන් පැනගෙන ආවේ කොහොමද කියලා අහන්න..."

"සිහිනයක් වගේ හීනයක් නං..."

"ඇත්තටම හීනයක් නෙමෙයි නං...?" මයන්ත අසද්දී එහි තිබුණේ විහිළු ස්වරයක් වුවද එයින් තේජානිගේ මුළු සිරුරම ලොමු දැහැ ගැන්වී තිබිණ... ඇයට එලෙස සිතන්නට දූන් අවශ්‍ය නොවුණේ සැබැවින්ම එලෙස වූයේ නම් කිසියම් විපතක හඬක් ගැහැනු ඉවට දැනී තිබුණ හෙයිනි. දෙවනුව ඇයට සිනහවක් නැගිණ...

නැත... කෙදිනකවත් ආරතීට විපතක් කරන්නට නම් සංජය සමත් නොවන බව සිතෙද්දීය... සංජය අනික් සැම තැනැත්තෙකුටම වඩා වෙනස් බව ඇය දැන සිටියාය... ඔහු එහිද සමහර තරුණියන් හා ආ ගිය බවද ආරතීට පවසා තිබිණ.... ඒ ආරතී පැමිණෙන්නට ප්‍රථමය... මෙවර ඔහු ඇවිත් තිබුණේ වසර තුනකටත් පමණ පසුය...

ආරතී හා තමා එදා ගී ගයද්දීම සංජයගේ කාඩ්පතක් එතනට ආවේ කිසියම් චෙක්පතක්ද සමගිනි... ආරතී එවක් පත යැවුවාය... එයින් කියැවෙන්නේ ඇය ගී ගයන්නියක මිස වෙනත් සේවාවන් සපයන්නියක නොවන බවය... එහෙත් ඔහු පසුබට වී තිබුණේ නැත...

දින ගණනාවකට පසු ඔහු ආරතීගේ දුරකථනයට කථා කළේය... තරමක් අදි මදි කළද ආරතී ඔහු හා ඉන්පසු කථා කරන්නට නම් ගත්තාය... එය දුරදිග යද්දී සංජය වෙනත් කිසිදු තරුණියක ගැන නොසිතූ බව ඔවුන් දැනගත්තේ එහි සේවය කළ සේවකයෙකුගෙනි...

කෙසේ වුවත් පසුව පසුව ඔවුන් අතර විවාහයක් ගැනද කථාවූ බව දැනගත් දා තේජානි තරම් ආරතීවත් සතුටුවෙන්නට නැති

බව මයන්තට නම සිහි තිබිණ... ආරතී ඒ සියල්ල ඉදිරියේම හෙයිනි.

එහෙත් ඔවුන් අතර තිබුණු ප්‍රතිපත්තීන් නිසා සංජයට ආරතීම මිස අනික් අය හා සුහදව ඇසුරු කිරීමේ මාර්ගය නම ඇහිරීම ගොස් තිබුණේය.

ඉදින් එලෙස ආරතී ගැන සිතමින් සිටින සංජය ඇයට විපතක් කරනැයි සිතන්නට නම තේජානි පැකිළුණාය... සංජය වෙනත් විවාහයක් කරගත හොත් ආරතී ඔහුට කරදරයක් නොකරන බවටද ආරතී පසුව පොරොන්දුවක් දුන් බව ඇය කියා සිටිය හෙයිනි... එහෙත් එලෙස වෙනත් ගැහැනියක විවාහ කරගන්නට නම ඔහු නොසිතන බවට ඔහු කීවේ ඇයට ලිපියකිනි...

'මෙක ඔයාට ඕන වෙලාවක නඩුවක් ගන්න පුළුවන් වෙයි... ඒක නිසා පරිස්සං කරගන්න... දූන් ඔයා දන්නවා මං ඔයා කවදාවත් අතාරින්නේ නැති වින්තිය...' එහි එක වාක්‍යයක් විය...

ඒ සංජය නම කිසි දිනෙක ආරතීට විපතක් කරන්නට නොසිතන බව ඇය පමණක් නොව මයන්තද සහතිකයෙන්ම දන්නා බව තේජානිද දැන සිටියාය...

එහෙත් ඒවා ගැන සිතන්නට නොහැකිය... සංජයගේ ලිපියක් තිබියදී වුවද ඔහුට වෙනත් තරුණියක විවාහයක් කරගන්නට පිළිවන... ඔවුන් ලෝකයේ අස්සක් මුල්ලක් නැර ගොස් පදම් වී සිටින තැනැත්තන් බැවිනි... ඔවුන්ට ඕනෑ දෙයකට අත දිග හැර මුදල් වියදම් කරන්නටද හැකියාවක් ඇත... ඒ හැකියාව යොදවා එවන් ලිපියක් පුස්සක් කරන්නට වුවද ඔවුන්ට පිළිවන... ආරතී යනු ඔවුන්ගේ වදනින් නෝබොඩි කෙනෙකි... වැදගැම්මකට නැති රැකියාවක් කරන එකියකි...

නොකෙරුවද එයට සළෙළුන් පිනවන යන නාමද එක්වෙන බව ඇයට සිතුණේ වේදනාවෙනි.

"හීනයක් වෙන්න ඇති මයන්ත... නැත්තං ඉතින් ආරතී මට කියලා යන්න එපැයි... උදේ යනකොට... මට ඒක ඇත්තටම වගේ හිතුණට ඒක හීනයක් වෙන්න ඇති..." ඇය සියලුම සිහිවිලි නවතාගනිමින් යළිත් මයන්තට කීවාය.

"වෙන්න ඇති නේ... මේ අනික් වා මොනවද කිව්වේ... අරූට පව් කිව්වා... වෙන...? අපි ගැනත් පව් කිව්වද නැත්තං පින් කිව්වද...?"

"මට මතක හැටියට... සංජුට කියන්න කියලා කිව්වා..."

"මොකක්...? කියන්න කියලා... උඹ තිකං සංජය ගැන හිතක්වත් තියාගෙන ඉන්නවද...?"

"මොකක්ද ඒ හරුපෙ...?"

"මොකක් වත් නෙවෙයි... ඒක කියන්න කිව්වද දන්නෙ නෑ නේ... ඇත්තටම උඹෙ යටි හිත නං ඒ වැඩ කරේ ඒ වෙලාවෙ... උඹ හිතාගෙන ඉන්නවනෙ රතියා උඹට පර්මිෂන් දෙයි කියලා..."

"පිස්සු කියවන්න එපා මයන්ත..." එවර නම් තේජානිට කෝපයක්ද නැගිණ... "මට සංජය ගැන කවදාවත් එහෙම දෙයක් හිතිලා නෑ... විහිළුවටවත් කියන්න එපා... රතී වගේ යාළුවෙක්ට මං එහෙම කරන්නෙත් නෑ... එහෙම හිතක් තිබුණත්..."

"අන්න ඒ අන්තිම අල්නයන්න ගැන තමයි මං කියන්න යන්නෙ... තිබුණත් උඹ කියන්නෙ නෑ... ඒ කියන්නේ ජානියො... හිතේ කොණක තියෙනවා කියන එක..."

"ඔයාට නං පිස්සු මයන්ත..."

"එච්චරද කිව්වේ...?" මයන්ත ඇසුවේ නොකීවත් තේජානිගේ සිතේ සමහරවිට සංජය ගැන කුමක් හෝ කැමැත්තක් තිබෙන බව සිතමිනි... සංජය රූමත්ය කඩවසම්ය... ඒ දෙකම තරුණියන්ගේ සිත් අලවන අද්දන කරුණු කාරණාය...

සංජය වහ වැටුණේ ආරතීගේ රූමත් කමට විය හැකිය.

ආරතීගේ රූමත්කමට වඩා තේජානිගේ බුද්ධිමත් කම මයන්තට නම් සිතට අල්ලා තිබුණේය... ආරතී එක අන්දමක රූමතියකි... තේජානි වෙනත් අන්දමක රූමතියකි... එහෙත් එවැන්නක් පවසන්නට තරම් ඔහුගේ සිතේ කැමැත්තක් නොතිබුණේ තේජානිද ඔහුට වඩා වැඩිමල් තැනැත්තියක හෙයිනි. ඔහු පැතුවේ තේජානි වැනි යුවතියකි. බුද්ධිමත් රූමත්... ඔහු වඩාත් කැමැති වුණේ තේජානි කෝපයට පත් කිරීමටය... ඇය කෝප ගනිද්දී ඇයගේ හැසිරීම බොහෝ නෙතට පියකරුය...

"තවත් මොනවද කිව්වා..."

"ඔයා ආදරේ නං ඒකට මං ඉඩ..."

"මේ මයන්ත... මාත් එක්ක ඉතින් ඔයාට තරහාවෙන්න ඕන වෙලා මේ නං..."

"නෑ නෑ හොඳ...අ...අ... අක්ක නේ... මතක් කරලා කියන්නකෝ ඉතිරි ටික..." මයන්ත ඇය සන්සුන් කළේය.

"එයා දන්නේ නෑ කිව්වා..." තේජානිට මතක් විය...

"උඹේ හිතිවිලි තමයි විග්‍රහ වෙලා තියෙන්නේ..."

"බණ කියන්න එපා මයන්ත... මං සංජය ගැන කවදාවත් හිතලා නෑ..."

"ඒ කවදාවත් උඹු හිතින් හිතලා නැතුව ඇති... යටි හිතින් හිතලා තියෙනවා..."

තේජානි තරමක් ගැස්සුණාය... එය නම් සත්‍යයකි. සංජය වැන්නෙක් මිතුරු කරගන්නට තරම් ඇය පින් කර නැත...

තේජානි සැබැවින්ම සන්සුන්ව දූන් ආරතී කියූ දේවල් සිතන්නට පටන් ගත්තාය... මයන්තද ඇය දෙස බලාගෙන සිටියේය... ඇය සංජයට අකැමැතිවා නොවේ... ඔහුට සුසුමක් හෙළිණ... කවුරු වුවත් කැමැත්තේ හොඳ ජීවන රටාවක් ඇති පොහොසත් පිරිමියෙකුටය... ඔහු සුසුම හිතේම පෑ කළේය.

"ඉස්සෙල්ලාම කිව්වේ මං යන්නං කියලා..."

"මං යන්නං..." මයන්ත එයම ප්‍රතිරාවය කළේය...

තේජානිට කවරෙක් හෝ එය මතක් කෙරුවාක් වැනි හැඟීමක් දැණින...

"මං යන්නං... එයාට කියන්න... සංජු පව්... එයා දන්නෙ නෑ..." ඇය එවර කියාගෙන ගියාය...

"මොකක් මොකක්..." මයන්ත ඇසුවේ කුතුහලයෙන් හා ඉක්මණ් කථාවකිනි. "හීනෙත් උනත් මෙහෙම පිස්සු කෙළින කථාවල් කියනවද...?" එවර ඔහු තේජානිගේ සිනහව නැංවූයේය.

"කිව්වේ ඒවා තමයි... දූන් මට හිතෙන්නේ ඒවා හාර හාර අවුස්සලා අහන ඔයාට පිස්සු කියලා..."

"අපෝ නෑ... මට පේන්නේ අරකී හදන්නේ අපි හැමෝටම පිස්සු වට්ටවන්න වගේ..." මයන්ත එවර කීවේය... "අනික ඕක හැබැහින් කිව්වා නං ප්‍රශ්නයක් නෑ නේ... මෙතන මේ හීනෙත් කියවන කොට... මොකද නැද්ද...?" ඔහු ඇසුවේ ළඟින්ම ගිය සමුදි ගෙනි... සමුදින්



රුක්මින් මාරින් එතනින්ම ඔවුන් පියමං කරමින් සිටියේ දූන් රංගනයෙන් දහදිය දමූ මුහුණු වතුරෙන් සෝදාගෙන එය පිසලමින් කුමක්දෝ කථාවක් කරමිනි... මයන්තගේ පැණයෙන් ඔවුන්ගේ කථාව නතරවිය...

"තියෙනවා තියෙනවා... ඔයාට නෑ කියලත් අපි දන්නවා..." සමුදි කීවේ සියල්ලන්ගේම සිනහව නංවමිනි...

"මට නෑ කිව්වේ උඹලා හොයලා බලලද...?" ඔහු තරමක් හඬින් ඇසුවේ එය කියමින්ම ඔවුන් පියවර දෙක තුනක්ම ඉදිරියට ගිය හෙයිනි.

"ඔව්... ඔව්... ආව දවසේ ඉඳන්ම අපි දන්නවා මොළයක් නෑ කියලා..." එය නම් කීවේ ආපසු හැරී බැලූ රුක්මිය...

තේජානිගේ සිනහවට මුව මදිවිය.

"ඇත්ද අහගත්තා..." ඇය තරවටු ලෙසකින් මයන්ත ඇසුවාය.

"ඇත්ත වෙන්න ඇති ජානියො... ඔයාත් එක්ක මෙතනට වෙලා මෙහෙම කථා කර කර ඉන්නකොට අනික් එව්වොත් දැනගනිව් මට කොහෙත්ම මොළයක් නෑ කියලා..." ඔහු කීවේ ඇයගේ සිනහව තවත් නංවමිනි...

ඇයගේ මුහුණේ තිබුණු තරමක බැරෑරුම් බව පහව යද්දි මයන්තට සතුටක් දැණින...

ඇය එවර බැලුවේ ඒ දෙසට එන ෂෙනාලි දෙසය... ඇයගේ දෑස් අනුව පිටුපස හැරී බැලූ මයන්ත ෂෙනාලි හා සිනහසුණේය.

"මිස්... අපි ටිකක් වෙනස් විදියෙ දෙයක් කරමුද...?" ඔහු ඇසුවේය.

"වෙනස්...?" අසමින් ෂෙනාලි එතනම නතර වුණාය.

"ඔව්... මගේ පොඩි අයිඩියා දෙක තුනක් තියෙනවා... මිස්ට නිවාඩු වෙලාවක් කියන්න පුළුවන්ද...?"

"අනික් වීක් එකේ පුළුවන් මයන්ත... බලමු එහෙනං..." මයන්තට කී ඇය තේජානි දෙස හැරුණාය... "ජානි නාම ගියේ නැත්තේ... නැද්ද ටිකක් හරි රෙස්ට් කරන්නේ... දූන් කාලා බීලා රෙස්ට් කරලා..." කී ඇය පියවර දෙක තුනක් ඉදිරියට තැබුවාය... ඉන්පසු යළි හැරී බැලුවාය. "ජානි පොඩ්ඩක් රතීට කථා කරලා බලන්න... එයාට අසනීපයක්ද දන්නෙත් නැතේ..."

තේජානි හිස සැලුවාය... එයත් සැබෑවකි... සමහරවිට එලෙස වද්දී සිතේ තිබෙන තැනැත්තාට ඇයගේ රුව මේ අයුරින් සිහිනයෙන් දිස් වෙන්නට පිළිවන...

"මං එහෙනං යන්නං මයන්ත..." කියාගෙන තේජානි පියවරක් තැබූවාය...

"මේ... අරයට කිව්වත් වගේ කෝල් කරලා බලන්න... මේ වෙලාවෙ අරූටත් පුළුවන් නං වර්ඩ් එකක් දාගන්නැකි..."

මයන්තට හොඳ පහරක් දුන් තේජානි ෂෙනාලි යන දෙසට දුව ගියාය...

ෂෙනාලි හා එක්වෙමින් පසුපස බැලූ තේජානි දුටුවේ උරහිස අතගාමින් ඇය දෙස බලමින්ම අනෙක් දෙසට පියවර තැබූ මයන්තය... ඇය මයන්තට නියවා ෂෙනාලි දෙස බැලුවාය...

"රතී වෙනදා මෙහෙම නැවිත් ඉන්නේ නෑ නේද...?" ෂෙනාලි ඇසුවේ තරමක කුතුහලයකින් මෙනි.

"නෑ මිස්... ඇත්තටම මටත් ප්‍රශ්නයක්... මට කෝල් කරාද දන්නෙත් නෑ... උදේ පරක්කු උන නිසා මං දුවගෙන ආවා... මට සෙල් එක බලන්නත් මතක නැති උනා..."

"රතීට එන්නම කියන්න ඕන එයාගේ අයිටම ප්‍රැක්ටිස් කරන්න තෙවෙයි... ඔයාව උදෙන් ඇහැරවගන්න..." තේජානිගේ මුවට සිනහවක් දෙමින් කියූ ෂෙනාලි ඇයගේ කාමරය දෙසට හැරුණාය... ඇය සිටියේ නේවාසිකාගාරයේ පහළ කාමරයකය...

තේජානි හැකි ඉක්මණින්ම තරප්පු පෙළ නැග්ගේ ආරතී දුන් නම් අඩුවශයෙන් ඇයට දුරකථනයට පණිවිඩයක් හෝ එවා තිබිය යුතුය සිතමිනි. ෂෙනාලි කීවාක් මෙන් සමහරවිට ඇයට කිසියම් අසනීපයක් වැළඳී තිබේනම්... එසේ වෙද්දී හිතවතුනට දුනෙන බව ඇය පොතකින් කියවා ඇත... එම පොත ඇයට එදා කියවන්නට නම් ගෙනැවිත් දුන්නේ මයන්ත විසිනි... එය ගෙනැත් දුන්නේද කිසියම් දවසක නැගණිය අසනීප වී ඇය නැගණියව සිහිනයෙන් දුටු දිනකය... එය ගැන විග්‍රහයක් කර පොත කියවන්නයැයි බලකළේ ආරතීය... තමාට ගෙනා පොත වුවද ආරතී එය රැගෙන එදා බොහෝ ආශාවෙන් කියවා යළිත් ඇයට දුන්නද ඇය නම් එම පොත එදාද කියෙව්වේ



උඩින් පල්ලෙනි... එවැනි පොත් ඇයට කියවන්නට තරම් ආශාවක් තිබුණේම නැත... ආරතී එහෙත් ලැබෙන සෑම පොතක්ම කියෙව්වාය...

කෙසේ වුවත් එහි සමහර කරුණු ඇයගේ සිතේ ගොමුව් තිබිණ... මයන්තගෙන් එම පොත යළිත් රැගෙන කියවිය යුතුය... ඇය සිතුවේ කාමරයට ඇතුල්වෙමිනි...

ආරතී ආවේ නම් ඇය තරමක් මේ මොහොතේ නිදා ගන්නා බව දැන සිටි හෙයින් ඇය මිතුරිය දකින අදහසින් කාමරයට ඇතුල්වූවද නැත... එම අදහසට එලෙසම තිත තබාගන්නට ඇයට සිදුවිය...

★ ★ ★

මිතුරිය කාමරයට පැමිණ නැති බව ඇය සිතුවේ තවමත් තුවා රඳවනයේ ආරතී දමා ගිය තුවාය මෙන්ම ඇය එදා ඇඳි රාත්‍රී ගවුමද එලෙසම තිබෙන බැවිනි... කලබලය නිසා තමා තුවාය දකින්නට නැත... ඇය සිතාගත්තාය... කලබලේට කොරොස් කටෙත් අත දමන්නට බෑ... පැරණි ප්‍රස්ථා පිරුළක්ද ඇත...

ඊයේ ඇය ඇවිත් නැත... තමා දකින්නට ඇත්තේ සිහිනයක් බව යළිත් තේජානි සිතාගත්තාය...

ඉන්පසුව ඇයට අවශ්‍ය වුණේ මිතුරියගෙන් පණිවිඩයක් තිබේදැයි බැලීමටය... එහෙයින් සියල්ලටම පළමු ඇය කළේ ඇයගේ දුරකථනය පණගන්වා ගැනීමය... එය මෙතෙක්ම ක්‍රියා විරහිත වී තිබුණේ ඇයගේ උදෑසන අවදිවීමේ ප්‍රමාදය හේතුවෙන් පුහුණුවීමට දිව යන්නට සිදුවූ බැවිනි...

එය හෝටලයෙන් දුන් දුරකථනයය... බොහෝ වීට කවුරු වුවද පණිවිඩයක් දෙන්නේ එයටය... ආරතී නම් අනිකටත් දෙන බව ඇය දන්නීය... හෝටලයෙන් දුන් දුරකථනයේ තිබුණේ ෂෙනාලිගෙන් හා මාරිගෙන් ආ දුරකථන පණිවිඩ ගැන ඇඟවීමක් කළ කෙටි පණිවිඩයක් පමණී. ඒ තමාට උදෑසන පුහුණුවට ඒමට යැයි කියන්නට බව ඇය දැන සිටියාය...

ඇය ඉන්පසු ඇයගේ පුද්ගලික දුරකථනය ගත්තාය... සමහරවිට මිතුරිය මෙයට පණිවිඩයක් දෙන්නට ඇත... එය ක්‍රියාත්මක වෙද්දීම එහි පණිවිඩ දෙකක් ම තිබෙන බව ඇය දුටුවාය.

හැකි ඉක්මණින්ම එම පණිවිඩ ගොනුව විවර කළද... ඒ දෙකම එවා ඇත්තේ නැඟණිය බව ඇය දුටුවාය... ඇය පාසල් නිමවී පැමිණි විගසින්ම මෙන් දුරකථනයට කථා කර ඇති බව ඇයට වැටහුණේ වේලාව අනුවය... හදිසියක් නම් නොවෙන බව ඇය දන්නීය... එහෙත් ඇයට කිසියම් අවශ්‍යතාවයක් ඇතිවා විය හැකිය...

මිතුරියගේ දුරකථනයට කථා කරන්නට පෙර ඇය නැඟණියගේ අවශ්‍යතාවය කුමක්දැයි අසන්නට සිතුවාය...

"නංගො... මොකද කථා කළේ...?" ඇය ඇසුවේ සමහරවිට නැඟණිය මේ මොහොතේ කථා කරන්නේ පාසලේ කුමක් හෝ විය හැකිය යන්න සිතමිනි... කුමක් හෝ විෂයයකින් ඇයගේ ලකුණු මට්ටමක් ලැබුණ හොත් අක්කාට දැන්වීම නැඟණියගේ සිරිතය...

"අපේ ස්පෝට්ස් මීට් එකට මාත් ඉන්නවා..." නැඟණිය කීවේ මහත් ආඩම්බර හඬකිනි... තේජානි සිතට ආ සුසුම එලෙසම පා කර හැරියාය... තමාද එවැනි ලෙසින්ම තම මවට බොහෝ දේවල් කළ කී බව ඇයට අමතක නැත... ඒවාට පියාද එකතු විය... එහෙත් මේ කුඩා දැරියට මවත් පියාත් දෙදෙනම නැත... ඇයගේ දෑසට කඳුළක්ද නැගිණ.

"ඔයා මොනවද කරන්නේ නංගො...?" ඇය ඇසුවේ ඒ කඳුළ එලෙසම පිසදා ගනිමිනි. තමා කඳුළු සැලිය යුත්තේ දැන් නැඟණිය ගැන නොවේ... ඇයගේ ඉදිරිය සුරක්ෂිත කර ගැනීමට හැකි සියලුම පියවරවල්වල් දැන් තමා ගෙන අවසානය...

ඉදිරියට ජීවිතයක් නැත්තේ ඇයටය... මෙවැනි නැනක සේවයකින් පසු...

ඇය සුසුමක් හෙලුවාය... ආරතීගේ ආදරයට වුවද වැට කඩොළු බැඳෙනු ඇත... සංජය හරි තීරණයකට එළඹුණහොත් මිතුරියගේ ජීවිතය අවම වශයෙන් සැනසිල්ලෙන් හෝ ගත කරන්නට පිළිවන් වනු ඇත.

"අක්කි... මොකද කථාවක් නැත්තෙ...? මං ඉන්න එපාද...?" කුඩා රසිකාගේ හඬ එවර තේජානිට කඳුළ මැදින්ම සිනහවක්ද නැංවූයේය... තමා එපා කියන කිසිවක්ම ඇය කරන්නේ නැත... ඇයගේ හඬින් ඇයගේ සිහිවිලි සිතාගත් තේජානි සැබැවින්ම දුක්වුණාය... ඇයට අහිමි වූ ජීවිතය බාප්පාගේ දියණියට හෝ ලබා දිය හැක්කේ නම්...



"කවුද දැන් එපා කිව්වෙ පැටියො...?"

"ඇයි අක්කි කථා කළේ නැත්තේ එහෙනං..."

"කථා නොකරේද...? ඔයා මොනවටද ඉන්නේ කියලා මට කිව්වේ නෑ නේ..."

"ආ... මං රිලේ එකකට ඉන්නවා... බෑන්ඩ් එකට ඉන්නවා..."

"ෂා මගේ නංගා දැන් ගොඩක් හොඳයි නේ..." තේජානි කීවේ ඇයගේ මව හා පියාගේ මරණයෙන් පසුව පළමු පළමු යද්දී ඇය පාසලේ එවැන්නකට සහභාගි වෙන්නට අකැමැත්තක් දැක්වූ බැවිනි... සමහරවිට ඒ කුඩා ඇයට අනික් අයගේ ප්‍රතිචාර දරා ගැනීමට අපහසු වූ නිසාද වන්නට ඇත... ඒ අතින් නම් මේ බොතේජු යුවළ බොහෝ හොඳ යුවළකි.

"ඔව්... ආන්ටිත් කිව්වා... ආන්ටියි අන්කල්ලුයි එන්නයිත් කිව්වා ඒක බලන්න..."

"එහෙනං මොනවද ඔයාට ඕනේ ඒවාට..."

"ආන්ටි කිව්වා අරන් දෙන්නං කියලා... අක්කිට කරදර කරන්න එපා කිව්වා..."

තේජානිගේ සිනහව නැංවිණ... ඇය නැඟණිය වෙනුවෙන් මුදලක් දුන්නද, එයට වඩා බොහෝ දේ බොතේජු යුවළ රසිකා වෙනුවෙන් කරන බව ඇයට නොරහසක් විය...

ඇය දැන් සිටින්නී ඒ නිවසේ හුරතලා වෙමිනි... තමාට ජීවිතයක් නැතිවුවද ඔවුන් දෙදෙන රසිකා බලාගන්නා බවට... පුංචි අම්මලාට වඩා හොඳින් බලා ගන්නා බවට... තේජානි සිතුවේ සිතේ සැනසිල්ලෙනි...

කෙසේ වුවද රසිකා දැන් සිටින පාසලට ආ ගැනීමෙන් ඇයගේ ඉගෙනීම පියවරෙන් පියවර ඉදිරියට යන බව තේජානිට සිතෙද්දී ඇයට ඇයගේ ජීවිතය ගැන අමතක කළ හැකි බව සිතාගත්තීය... තමාට මව්පියන් නැතිවීමෙන් වූ පාඩුව දරාගත නොහැකිය... උපතුපත් ජාතිවත් එවන් විපතක් නොවන්න යැයි පතන්නට ඇය සිතුවේ රසිකාට දරුවෙක්ට මෙන් සලකා ඇයව ඉහළට ගන්නට සිතමිනි.

"ආ ඒකට කමක් නෑ පැටියො... මං ආයේ එහෙනං ආයේ

හෙට අනිද්දම එන්නං... දැන් කවදද ඔයා ස්පෝට්මීට් එකට ඉන්නවා කියලා දැනගත්තෙ... මං ඊයේ ආව වෙලාවෙ ඔයා කිව්වේ නෑ නේ..."

"මට මතක නැති උනානේ අක්කී..."

"ඒක අමතක කරාට නං කමක් නෑ... පාඩං අමතක කරන්න එපා හොඳද පැටියෝ..."

"පාඩං පොත් ටික පෙන්නන්න ගිහිල්ලා තේන්නං... අක්කිට මෙවා කියන්න මතක නැතිවෙලා ගියේ..." රසිකා එවර කීවේ මුක්කං හඬකිනි.

"හරි හරි... මගේ නංගියා හරි හපනි නේ... එහෙනං පැටියෝ... මං එන්නං සෙනසුරාදා උදේ විතර හොඳද...? ආන්ටිට කියන්න..."

"එදාටත් අපිට ප්‍රැක්ටිස් තිව්වා..."

"එතකොට පැටියා යන්නේ කොහොමද...?"

"අන්කල් කිව්වා එක්ක යන්නං කියලා..."

"පරිස්සමින් නංගා... තෙරුවන් සරණයි..." සෙමින් කී ඇය දුරකථනය විසන්ධි කළාය. සෙනසුරාදා උදයේ නංගිගේ ක්‍රීඩා උත්සවයේ පුහුණුවීම් බලන්නට යායුතු බව තේජානි සිතුවේ ඒ විසන්ධි කරන අතරමය... එහෙත් ඉදහිට එලෙස යන්නට සිතුවද යන්නට නොලැබෙන අවස්ථාද ඇත... ක්‍රීඩා උත්සවය බලන්නට නම් යායුතුමය...

දැන් ඉතින් ආරතීට ගත යුතුය... ඇය මෙතෙක් වෙලා දුරකථනය ක්‍රියාවිරහිත කරගෙන සිටිනවා යැයි සිතිය නොහැකිය.

එවර ඇය ආරතීගේ දුරකථන අංකය ගත්තාය...

තවත් මොහොතකින් එය සම්බන්ධවෙනු ඇයට ඇසිණ... එහෙත් එයින් ඒ දෙසින් කියවුණේ කිසිදු ප්‍රතිචාරයක් නැති බවකි... ඇය කුමක් හෝ කථාවක... නැත... එය වීමට නොහැකිය... මයන්ත සමග කථා කරනවා වෙන්නටත් හැකිය... එහෙත් තමාගේ දුරකථනයට එයින් මේ මොහොතේ නම් පණිවිඩයක් නොපැමිණි බව ඇය දන්නීය... කෙසේ වුවත් තමා නංගී සමග කථා කරද්දී සමහරවිට මෙය විසන්ධිවී ඇති බව දුටු මිතුරිය මයන්තට ගත්තාද විය හැකිය... දුරකථන සංඥා පද්ධතිවල ප්‍රශ්නයක් නම් තමාට එම පණිවිඩය එන්නේ ද නැත...



අනික් දුරකථනය නම් හඬ දුන්නේම නැත... එය ක්‍රියාවිරහිත කොට ඇති බව කියැවිණ... එය මෙම හෝටලයෙන් දුන් දුරකථනයය.

දෙවෙනි වර තෙවෙනි වරදැයි කිහිප වරක්ම ඇය පුද්ගලික දුරකථනයට කථා කළද එයින් නැගුණේ ප්‍රතිචාරයක් නැත යන්න පමණකි... ඉන්පසු එය එදෙසින් නවතා දමුවා වැනි ලෙසින් හඬක් නැගිණ... සමහරවිට ඇය සිටින දෙසට සංඥා නැති නිසා විය හැකිය තේජානිට සිතිණ. කෙසේ වුවත් දැන් ඇය ගැන අසන්නට කෙනෙක් නැත... තමාගේ දුරකථනයෙන් පණිවිඩයක් ආ බව දැනගත් විට ඇය කොහොත් හෝ තමාට කථා කරන්නට පිළිවන... ඇය ඒ ගැන අමතක කර දමා එවර මඳක් විවේකයක් ගන්නට සිතුවාය...

මිතුරිය තම පෙම්වතා සමග සිටියදී තේජානි ඇයට කථා කිරීමට කවදත් කැමැත්තක් දැක්වූයේ නැත. එහෙත් ආරතී නම් මෙලෙස තේජානි සමගින් කථා නොකර සිටියේ ද නැත... ඇයට පුදුමයක් වූයේ හෝටලයෙන් දුන් දුරකථනය විසන්ධි කළද, පුද්ගලික දුරකථනය විසන්ධි වීම ගැනය... කිසියම් පණිවිඩයක් තිබේ නම් තමා හෝ මයන්ත එයට කථාකරන බව දැන සිටින හෙයින් ඇය බොහෝ විට එය ක්‍රියා විරහිත කරන්නේ නම් නැත.

සමහරවිට ඇය මෙවර සංජය සමගින් යන්නට ඇත්තේ අවිස්සාවේල්ලේ ඔහුගේ පුද්ගලික නිවාසයට නොව වෙනත් කොහේ හෝ විය යුතුය... ඇය සිතුවාය...

සංජය ආරතී හා ගත කිරීමටම අවිස්සාවේල්ලේ ගංගාවක් අද්දර නිවසක් මිළට ගෙන ඇති බව දිනක් කියද්දී එයට තේජානි සිනහසුණද, ඉන්පසු ඔවුන් දෙදෙන හමුවූයේම එම නිවසේදී බව නම් ඇය දැන සිටියාය...

විරුද්ධ ලිංගිකයෙකු සමගින් නිවසකට ගොස් රැයක් ගත කිරීම අවිවාහක තරුණියකට අකැප නමුදු, තමන්ගේ ස්ථානයේ සිටින බොහෝ දෙනාට තමන්ගේ ජීවිතයේ එක්තරා පැත්තක් පුරවාලන්නට හැකිවෙන්නේ එලෙස බව නම් තේජානි දැන සිටියාය... මිතුරියට එලෙස හෝ පෙම්වතෙක් ලැබීම ගැන ඇයගේ සිත තුළ එක් පැත්තක සතුටක් තිබුණද, අද මයන්ත කීවාක් මෙන් යටි සිතේ කුමක් හෝ වේදනාවක්ද තිබෙන බව ඇය වටහාගෙන සිටියාය...

එහෙත් ඒ මිතුරිය කෙරෙහි නැඟුණු ඊර්ෂ්‍යාවක් හෝ සංජය

කෙරෙහි තමාගේ සිතේ කැදරකමක සේයාවක් හෝ නිසා නොවන බවද එලෙසම තේජානි සිතුවාය...

සංජය වන් පෙම්වතෙක් ලැබේනම් සතුටු විය හැකිය... එහෙත් එවන් පෙම්වතෙක් ලබාගෙන වුවද දිවිය ගෙන යා හැක්කේ අතියම බිරිඳක වශයෙනි. තේජානි එයට අකැමැත්තක් දැක්වූයේ ඇයගේ නැගණියට එය පහරක් වන බව දන්නා හෙයිනි... ඇය අනෙක් නැදැයින් ගැන සිතන්නට ගියේ නැත...

ඒ ලෙසින් බලද්දී ආරතීට කවරෙක් වත් නැත... ඇයගේ පියා ඇය නිවසින් පැන ගිය පසු ඇය මළ බව කියා දානයක්ද දුන් බව ආරතී පසුව දැනගෙන තිබුණ හෙයිනි... දැන් ඒ සිදුවීම සිදුවී වසර පහකටත් වැඩිය...

ආරතීගේ පියා ගැන සොයා බලන්නට යැයි මයන්ත උනන්දු කළේ තේජානි බැවිනි... එය දැනගත්තේ නම් අවුරුද්දකට පමණ පෙරය... ඒ තමා මෙයට සේවයට ආ අළුතමය... එදා මෙදා තුර ඇය නැදැයින් ගැන කථා කළේම නැත...

ඇය නැදැයින් ලෙස සැලකුවේ තේජානිට හා මයන්තටත් බොනේජු යුවළටත් පමණකි.

දින දෙකක් නිසා සමහර විට ඇයගේ දුරකථනයේ විදුලිකෝෂ බලය හීනවන්නට ඇත... එවර තේජානිට සිතිණ... එසේනම් ඇය එය බලය කවද්දී තමාගේ අංකය දුටුවිට එයට කථා කරනු ඇත... තේජානිට එවර සිතුණු හෙයින් ඇය නිදහසේ තරමක් විවේකයක් ගන්නට සිතුවාය... අද විවේකය එලෙස නොගතහොත් ඇයගේ ගීතය ගායනය හොඳින් කරගන්නට හැකි නොවනු ඇත... වඩාත් වැදගත් වන්නේ සේවාව හරි අන්දමින් සැපයීමය...

ඇය සියල්ලම පසෙක දමා එවර නිදහස් ඇඳුමක් ඇගලාගෙන යහනට ගියාය...

ඇය වෙනදා මෙන්ම රාත්‍රී කෑම සඳහා හයට පමණ අවදි වෙද්දීද ආරතීගෙන් දුරකථන පණිවිඩයක් ලැබී තිබුණේ නැත...

සේවාව සඳහා යද්දී දුරකථන තවතා දමන්නට ඔවුන් සියල්ලෝම පෙළැඹී සිටියහ... ඒවා හෝටලයට ගෙන ගියද, පණ ගන්වන්නේ ඉඳහිට විවේකයකදී පමණකි... හදිසියක්ම නම්... ඇයට



හදිසියක් වන්නේ නම් නැගණියට අසනීපයක් වීමම පමණකි. බොනේජු යුවළ ඇයගේ නේවාසිකාගාරයේ මුරකුටියේ අංකයට පණිවිඩයක් දෙනු ඇත... මුරකුටියේ අංකය ඔවුන් දන්නේ ආරතී එහි අංකය ඔවුන්ට දී තිබෙන බැවිනි... මෙතෙක්ම නම් එලෙස කිසි දිනෙක පණිවිඩයක් ආවේම නැත... එලෙස ඇයට පණිවිඩය එන බව දන්නා නිසාම තේජානි කිසි දිනෙක ඇයගේ දුරකථනය නම් රැගෙන ගියේම නැත... එහෙත් අද ඇය ඇයගේ පුද්ගලික දුරකථනය රැගෙන ගියාය... අතරමැද කුඩා විවේකයේදී හෝ මිතුරියගෙන් පණිවිඩයක් ලැබේදැයි බලන්නට සිතමිනි. මෙතෙක්ම වෙලාවක් ආරතී ඇයගේ දුරකථනය පණ නොගන්වා නොසිටින බව ඇයට සිතුණු හෙයිනි.

එහෙත් ඇයගේ සේවාව නිමවී කාමරයට එනතුරුම පමණක් නොව නිදි ඇඳුම් ඇගලා යහනට යන තෙක්ම ඇයට පණිවිඩයක් නම් නොතිබිණ...

සේවාවෙන් පසු එන තදබල මහන්සිය නිසාම ඇය ඇයට සාදා දී තිබුණු තේ කෝප්පය බී වෙනදා මෙන්ම උණුවතුර බෝතලයක්ද රැගෙන පැමිණ යහනට වැටුණාය... ඒ වෙද්දී දොළහටත් ළං වී තිබිණ...

★★★

කෙසේ වුවත් ඇයට නින්ද යන්නට ඇත්තේ පැයක් පමණ විය හැකිය... ඇයට එක වැදෙනු ඇසිණ... එදා මෙන්ම ඒ දොළහමාරද එකද එකහමාරදැයි ඇයට සිතාගත නොහැකි විය... ඉන්නේ අවදියෙන්දැයි සිහිනෙන්දැයි සිතන්නට නොහැකි වුවද, කවරෙක් හෝ කථා කරනවාක් වැනි හඬක් ඇයට ඇසිණ... ඇයගේ ගතම හිරිගඩු පිපුණද, ඇයට අවදි වන්නට නම් හැකියාවක් තිබුණේ නැත... එහෙත් ඇයගේ දෙනෙත් විවර විණ... ඇය හොඳින්ම ඇය ඉදිරියේ තිබූ සියල්ලම දුටුවාය... කුඩා විදුලි පහන් එළියද එලෙසම තිබිණ...

කටහඬක් එන්නේ නාන කාමරයෙන්ද...

ආරතී පැමිණ තිබේදැයි ඇයට සිතිණ... එහෙත් ඇය ආ බවක් නොදැණුනේ ඇයි...? ඇය ආවේ නම් තමාට නින්ද ගොස් තිබියද අද නම් අවදි කරවා ආ බව දැනුම් දෙනු ඇත...

මෙත් ඒයේ මෙන්ම හීනයක්ද...?

දෙවන වර මුළු අවකාශයම කළුවර විණ...

ලයිට් ගියා... ඇයට සිතිණ...

යළි කටහඬ නැගිණ.

සංජු පව්....

ආරතී...

මිතුරිය පැමිණියද දුන් මෙ කළුවර... නැත... ඇය මෙලෙස කළුවර වෙද්දී සංජු පව් කියමින් නොයිට අවම වශයෙන් ඔවුන් ගෙනැවිත් තිබුණු වියළි විදුලි කෝෂයෙන් බලය ලබන කුඩා පහන දල්වනු ඇත... එලෙස නොවූයේ...

යළි විදුලි එළිය දැල්විණ...

"රතී..." ඇය කියන්නට තැතනුවා පමණකි... ඇයගේ හඬ පිට නොවන බව පමණක් ඇයට සිතිණ... නාන කාමරයෙන් තවමත් කුඩා ශබ්දයක් නැගෙන බව ඇයට සිතිණ... ඇයගේ දෙපතුල්වලින් පටන් ගත් සීතල හිස දක්වාම ආවේය... ඇය කථා කරන්නට උත්සාහ කළාය... නැත... කථා කරගත නොහැකිය.

ඇයගේ නෙත් පියවිණ...

මෙය සිහිනයක් බව ඇයට සිතිණ... ඇයට තවත් විනාඩි කිහිපයක් පැයක්... කීමට නොහැකිය... නින්ද ගියා වැනිය... යළිත් ඇයගේ නෙත් විවර විය... මුළු නිවසම කළුවරය... අර හඬ තවමත් ඇත... මේ නම් සිහිනයක්ම විය යුතුය... ඇය සිතුවාය... එසේනම් දැස් විවර වී තිබෙන්නේ ඇයි... එය සිහිනයක්යැයි ඇයට සිතාගන්නටද නොහැකි විය...

දෙවනුව යළිත් කළුවර විය... සියල්ල නිශ්චල විය... ඇය අත පය සොලවන්නට උත්සාහයක් ගත්තාය... වටපිටාව සීතල බව ඇයට සිතිණ... අත පය සොලවන්නට හෝ කථාවක් නගාගන්නට හෝ නොහැකිය...

ඇය එවර වත්තක් මෙවායි සිතා දැස් පියා ගත්තාය... එහෙත් එලෙස ඉන්නටද නොහැකිය... කෙදිනකවත් නොදැනුන බියකින් ඇයගේ සිතම පිරී තිබුණ හෙයිනි... එහෙයින් යළිත් දැස් හැරියාය...

කථා කරන්නට හෝ උත්සාහ කළාය... නැත... නොහැකිය... ඇයට සිතුණේ දුරකථනය ගෙන මයන්තට කථා කරන්නටය... ඇය යහන අසලම තිබෙන දුරකථනය ගන්නට සිතමින් අත එසෙවුවාය... එසෙවුණ අතක් නැත... ඇයට අත ඔසවන්නටද නොහැකිය...

සංජු පව්...

මේ කථා කරන්නේ කවුද...?

ඇයගේ සියොළඟ යළිත් හිරි වැටිණ... බියෙන්ම දැස් විසල් වූවාදැයි ඇයට නොතේරිණ...

සංජු පව්... එයාට කියන්න... එයා දන්නේ නෑ...

මෙය නම් සිහිනයක් බව තේජානිට සිතිණ... මේ ඒයේ දින ඇය දුටු සිහිනයම විය යුතුය... අද මිතුරියගේ හඬ පමණක් සිහිනයෙන් ඇසෙනු වැනිය...

යළිත් කළුවර විය... තේජානි එවර දැස් වසා ගත්තේ යළිත් නොහරින්නට සිතාගනිමිනි... ඇයගේ බිය ඇයගේ මුව ගොළු කළාක් මෙන්ම අත පයද පණ නැති කර ඇත...

කෙසේ වූවද ඇයට දැස් පියා ගෙන ඉන්නට හැකියාවක්ද තිබුණේ නැත... නැතහොත් ඇයට කුඩා කාලයකට තවත් වරක් නින්ද ගියා වැනිය... නිදි අයුරින්ම ඉන්නට සිතුවද...

නැත... ඇයගේ දැස් යළිත් විවර විණ... තවත් මොහොතකින් විදුලි පහන් එළිය පැමිණ තිබෙන බව ඇයගේ නෙතට පෙණිත... එවර නම් ඔර්ලෝසුවේ දෙකක් වදිනු ඇයට ඇසිණ... ඉන්පසු ඉතා සිහින් හඬකින් මෙන් ඇයට ඇසුණේ ඈත කොහේ හෝ ශබ්දයකි... පන්සලක පිරිතක් වැනිය...

ඇය ඉතිපිසෝ ගාථාව කියන්නට ගත්තීය... කටහඬ නාවේ වුවද එය සිතින් කියැවෙන බව ඇයට තේරිණ...

නොතේරුණේ එය සිහිනයෙන්ද නැත්නම් පැබැඳින්මදැයි යන්න පමණකි.

තවත් මොහොතකින් ඇයගේ නෙත් පියවිණ...

ඇය කරා නින්ද ආ බව ඇය දැනගත්තේ ඉන්පසුදා උදයේ කවුරු හෝ දොරට තට්ටු කරද්දීය.

# 13 බදාදා

ඇය දැස් හැරියේ එම තට්ටුවෙන් වූ බියෙන්ද යුතුවය... හිරු එළිය කාමරය පුරා තිබෙන බව වැටහෙද්දී දැන් හිරු උදාවී ඇති බව සිතෙද්දී ඇයගේ සිතේ බිය පහවිය... එහෙත් තට්ටු කරන්නා නම් දිගටම එහි සිටින බව ඇයට සිතිණ... ආරතී විය නොහැකිය... ඇය අතේ යතුරක් ඇත... ඇය නැති දිනට තේජානි කෙසේවත් යතුරු ලන්නේද නැත... එහෙයින් ඇය තට්ටු නොකර කෙලින්ම කාමරයට එන බව තේජානි දැන සිටියාය...

මේ ශාන්තා විය හැකිය...

"කවුද...?" තේජානි ඇසුවේ ශාන්තා නම් මෙලෙස හෝ දොර විවර කළ හැකි බව සිතමිනි.

"ශාන්තා... මං ශාන්තා..." එළියෙන් ඇසිණ...

ඇය නිවැරදිය.

"ඉන්න ශාන්තා..." කියමින්ම යහනින් බැසි ඇය මදුරු දැල උඩට කර ගැටයක් දමා ඉන්පසු කාමරය හරහා ගොස් දොර තරමක් විවර කළාය.

"මොකද... ශාන්තා...?"

"මිස් තේ බොන්න නාව නිසා මං ආවේ... මොකද උනේ...?" අසමින්ම ශාන්තා බන්දේසියත් රැගෙන ඇතුළට ආවාය.

"මට නින්ද ගියා ශාන්තෝ..." තේජානි කීවේ වේලාව බලමිනි... දහයත් පසුවී ඇත.

"අනික් අය ගියා... මට මයන්ත සර් කිව්වේ ඇවිල්ලා බලන්න කියලා... ඊයේ මිස් ජානි ඔළුව කැක්කුමයි කිය කිය ආවේ කියලා..."

"ඔව් ශාන්තා... ටිකක් සනීප මදියි වගේ..." කියූ ඇය නාන කාමරයට ගියාය... ඇය එද්දී ශාන්තා බන්දේසිය මේසය මත තබා එහි තිබුණ පොතක් පෙරළමින් සිටියාය. තේජානි එන පියවර හඬට ඇය හැරී බැලුවාය.

"මේක මිස්ගෙ පොතක්ද...?"

ඇය පොත දෙස බැලුවාය... එය ආරතී කියවන්නට ගෙන ආ පොතකි... ආරතී බොහෝ විට පොත් මිළටම ගෙන එන්නීය... ඒවා ඇය තියාගන්නේද නැත... නේවාසිකාගාරයේ පහළ සාලයේ එම පොත් දමූ කබඩයක්ද ඇත... බොහෝ අය නිදහස් වෙලාවලදී ඒවා කියවනවා පමණක් නොව ඉඳහිට එයට පොත්ද එකතු කරන්නාහ... තේජානි නම් වැඩිය පොත් කියවන්නියක නොවූවාය... ඉඳහිට පොතක් කියෙව්වද ඇය බොහෝ විට බැලුවේ රූපවාහිනී චිත්‍රපටිය.

"ඕක රතී මිස් ගෙ..."

"මිස්ගෙන් අහලා මටත් මේක ගෙනියලා කියවන්න ඕන..."

"මිස්ගෙන් අහන්න තියා රතී මිස් නැති එකෙන් මටත් පාඩුයි... මට උදේට නැගිට්ටවන්න කෙනෙක් නෑ... ඊයේ ඔක්කෝටම හපන් හිතාගන්න බැරි මහන්සියක් වගේ ආවා... පෙනඩෝල් එකක් ගන්න වත් හිතුණෙ නෑ... ආව ගමන්ම වැටුණා ඇඳට..."

"ෂෙනාලි මිසුත් කිව්වා මිස්ව එහෙනං නැගිට්ටවන්න එපා කියලා..."

"ඔයා ඕක ගෙනිහිල්ලා කියවන්න ශාන්තා... මං ඇහුවොත් රතී මිස්ට කියන්නං ඔයා කියවන්න ගත්තා කියලා..." කියමින්ම ඇය තේ කෝප්පය ගෙන මදක් තොල ගෑවාය... ශාන්තාගේ තේ කෝප්පය රසය... බොහෝ විට රැයේ වුවද එම තේ කෝප්පයක් ලැබෙන්නේ නම් කවුරුත් කැමැතිය... ඇය තේ කෝප්පයෙන් තවත් උගුරු දෙක තුනක් බීවාය... එය තවමත් රස්නයෙන් මෙන් තිබෙන්නේ ශාන්තා තමාට වෙනමම යළිත් තේ වක්කළ හෙයිනැයි ඇයට සිතිණ... ශාන්තා පව්... ඇයගේ සිතට දැනින...

සංජු පව්.... ආරතීගේ හඬ...

තේජානිට ඊයේ රෑයේ විදුලි එළිය නැති වූණා මතක් වූයේ එවිටය.

"ඊයේ රෑ ලයිට් ගියාද ශාන්තා...?" ඇය ඇසුවේ පොත පෙරළමින් සිටි ශාන්තාගෙනි.

"නෑ... දන්න තරමින් නෑ..."

"දෙසැරයක් තුන්සැරයක්ම ලයිට් ගියා වගේ මට දැණුනා..."

"කොයි වෙලාවෙද...?" ශාන්තා ඇසුවාය...

"වෙලාව නං හරියට කියන්න බෑ..."

"හවස මිස් ලා යනකංම නං ලයිට් ගියේ නෑ නේ... අනික් එක මෙහෙට ලයිට් කපනවා කියලා තිබුණෙත් නැහැනේ..."

"නෑ... නෑ... රෑ... එකට දෙකට විතර... අපි ආවයින් පස්සේ..."

"නෑ මිස්... එහෙම විදියක් නෑ... ලයිට් ගියා වෙන්න බෑ... සමාධි මිස්ගෙ කම්පියුටර් එක දාලා මිස් නිදාගෙනලා තියෙන්නේ... උදේ මමයි ඒක ඕෆ් කළේ... ලයිට් ගියානං ඒක ආයෙ එන්නේ නෑ නේ... ඒකේ අර පහළ එස්පියූ එකද මොකක්ද එක නැතුවනේ දැන් තියෙන්නේ... එහෙම උනාම ඒක ඕෆ් වෙලාම යනවළු නේ... නේද...?"

එයත් සැබෑවකි... සමාධි බොහෝ විට පරිගණකයේ නොයෙකුත් සින්දු බලන්නීය... ශාන්තාගේ කාමරය ඇත්තේ ඇයගේ කාමරය අසලමය... ශාන්තාද එහෙයින් බොහෝ විට ඇයත් සමග එකතුව ගීත පමණක් නොව සිනමා පටද බලන බව කවුරුත් දනිති. පසුගිය දිනෙක ඇයගේ පරිගණකයේ විදුලි කෝෂය කුමක් හෝ වී එය සදන්නට දුන්නද පරිගණකය එලෙසම සිනමා පට බැලීමට ඇය පාවිච්චි කරන බවද තේජානි දැන සිටියාය. පරිගණකය කුමක් හෝ වී ඇතැයි කියමින් සමාධිගේ පණිවිඩය රැගෙන සමුදි ආවේද එදා ඇය වෙතටය. ඒ මොහොතේදී නම් ආරතීද සිටියාය... ඇයගේ පරිගණකයේ වැරැද්ද කුමක්දැයි සොයන්නට තේජානි ගියේද ආරතී සමගිනි...

වැරැද්ද වී තිබුණේ විදුලිබල කෝෂයේය... එය සදන්නට දෙන්නැයි කීවේ නම් මයන්තය... අළුත් එකක් නොගෙන එය සාදා ගත හැකි බව කියමින් එය ගෙන ගියේද ඔහුමය.

කියන්නාක් මෙන් එසේනම් පරිගණකය ක්‍රියාවිරහිතවී තිබිය යුතුය...



"එස්පියූ නෙවෙයි ශාන්තා... යූපීඑස් එක..." සිතට ආ සිනිවිල්ලට පෙර ඇය ශාන්තාට වචනය කියා දෙන්නට සිතුවාය.

"මිස් දැක්කේ කොහොමද ලයිට් ගියා කියලා..."

"නෑ ශාන්තා... මං හිතන්නේ මං හීනයක් දකින්න ඇත්තේ..." තේජානි කියූවාය... කියූවායින් පසු එය සිහිනයක්මදැයි ඇයට යළිත් සැකයක් නැගිණ... ඒ හිරිගඩු පිපීම හා සිහිතල සිහිනයෙන් ඇයට දැනෙන්නේ කෙලෙසද...? තමාට කථා කරගත හැකි නොවූයේ කෙසේද...? අත පය සොලවා ගන්නට නොහැකි වූයේ කෙසේද...? ඇය නින්ද ගියා ගැන සතුටු වූයේ මේ මොහොතේය... නින්ද ගියාද නැතහොත් නින්දේ දුටු සිහිනයක්ද...? ඇයට කල්පනා කරද්දී හිස නැක්කුමක්ද නැගෙනු වැනිය.

"අනික මිස් කොහොමටත් මට මහින්ද අයියා ජෙනරේටර් එක දානවනං නැගිට්ටෙනවා... ඒක දානවා ඇහුණෙමත් නෑ..."

"එච්චර වෙලා නං තියෙන්න බෑ..." තේජානි තරමක් කල්පනා කාරී ලෙස කියූවාය... "ගියත් යන්න ඇත්තේ විනාඩි දහයක් විතර වගේ... දෙසැරයක්ම වගේ..."

"නෑ මිස්... එහෙම නං කොහොමටත් අර කම්පියුටර් එක අද උදෙත් වැඩ කරන්නේ නෑ... ඒක තිවෙන්නම එපැයි... සමාධි මිස් මට බැන්නා ඒක බැලුවෙ නෑ කියලා... මං මොනව කරන්නද...? මං හිතුවෙ මිස් ඒක නිවලා කියලා යන්න ඇත්තේ... මොනිටර් එක විතරළු නිව්වෙ..."

තේජානිට සිනහවක් නැගිණ.

බී නිම කළ තේ කෝප්පය ඇය බන්දේසියෙන් තැබූවාය... ශාන්තා ගියේ ආරතීගේ පොතත් රැගෙනය...

ඇය යහන මතින් වාඩිවූවාය...

තමා ඒ දකින්නට ඇත්තේ එසේනම් සිහිනයකි.

සියල්ලටමත් වඩා අර හඬ...

එය සිහිනයකැයි සිතන්නට හැක්කේද ඒ හඬ නිසාමය... හඬම මිසක හඬ අයිති පණ තිබෙන රුව ඇය ඉදිරියට තවමත් නොආ බැවිනි.

අද දින විවේකයෙන් සිටිය යුතුයැයි ඇයට සිතුණේ ඇයට සැබැවින්ම තරමක විඩාවක්ද දැනෙමින් තිබුණ බැවිනි... ඊයේ දුටු සිහිනයෙන් සිරුරම පණ නැතිවී ගිය ගානය...

ෂෙනාලිට දුරකථන පණිවිඩයක් දුන් ඇය විවේකයක් ඉල්ලා සිටියාය... ඊයේ රැයේදීද තේජානි තරමක් අසනීපයෙන් මෙන් සිටි බව දැක තිබුණු නිසා ෂෙනාලිගෙන් ඇයට විවේකයකට අවසරයක් ලැබිණ... අද හා හෙට දෙදින තේජානිට හවස සේවාව නැත... ඇය කළ යුතු වූයේ පුහුණුවීම් පමණය... එහෙයින්ම ෂෙනාලි වැඩිමනත් තේජානිට පුහුණුවීමක් පවරන්නට නොසිතුවාය. ඇය ඒ මොහොතේදීද කථා කරේ ආරතීගේ නොපැමිණීම ගැනය... තවත් දිනයක් බලා ඇය ආරතී ගැන ඉහළට දන්වන බව කියද්දී තේජානිට වෙනත් යමක් කියන්නට හැකියාවක් නොවිණ...

ආරතී හෙට උදයේද පුහුණුවීම් වලට නාවේ නම්, හෙට දිනයේදී තේජානිටත් රුක්මිටත් දෙදෙන වෙනත් ගීත දෙකක් පුහුණුවීම් අරඹන්නට සිදුවන බවද ඇය දැනුම දුන්නාය... නැතහොත් ඉන්පසු දෙදිනට අවශ්‍ය අන්දමින් විශේෂාංගය ඉදිරිපත් කරන්නට නොලැබෙනු ඇත. ඒ දෙදිනේ මෙම හෝටලයට අනුබද්ධිත විදේශීය හෝටලවල ප්‍රධානීන් කිහිප දෙනෙක් පැමිණෙන බව ඔවුන්ට දන්වා තිබිණ... ඔවුන් වෙනුවෙන් වෙනමම රූකඩ සංදර්ශනයක්ද පවත්වන බව කියූ ෂෙනාලි එයට අමතරව මෙලෙස ආරතීගේ හා තේජානිගේ ගීත කිහිපයක් හා රංගනයන්ද ඉදිරිපත් කරන්නට අවශ්‍ය බව පැවසුවාය... කිහිපයක් හා රංගනයන්ද ඉදිරිපත් කළ යුතුය... එයට ආරතී නැති කෙසේ වූවත් විශේෂාංගය ඉදිරිපත් කළ යුතුය... එයට ආරතී නැති බව දැනගතිද්දී, ඇය ගැන කොහොමටත් ඉහළට දැනුම් දෙන්නටම වෙන බව ෂෙනාලි කීවිට, එයට තේජානිට කියන්නට දෙයක් නොතිබිණ... ඇය පිතෙන් බැන්නේ මිතුරියටය.

"රතී එයි මිස්... එයාට සනීප නැති වෙලාද දන්නෙ නෑ යාළුවගේ ගෙදරදී..." තේජානි අවසන් වරටද මිතුරිය බේරා ගන්නට සිතමින් කීවාය... ආරතී ආ පසු මේවා විසඳාගත හැකිය... ඕනෑකමින්ම මග හැරියේයැයි දැනගතහොත්... නැතහොත් ඇය පෙම්වතා සමග සිටිනා බව දැන ගතහොත් ඒවා සේවාවට ප්‍රශ්නයක් විය හැකැයි තේජානිට සිතෙමින්ද තිබුණ හෙයිනි. කෙසේ වූවත් එයද ප්‍රශ්නයක් වනු ඇත... ආරතී මින් පිටවෙන්නේ ඇයගේ පෙම්වතා හමුවීමට යාමටම බව සියල්ලෝම දැන සිටි හෙයිනි... බොරුවක් නම් කිව නොහැකිය... එක්



හොඳක් වන්නේ ඇයගේ පෙම්වතා හෝටලයේ අයිති කරුවනට වුවද කිසියම් බලපෑමක් කළ හැකි තැනැත්තෙක් වීමය...

ආරතී බොතේජු යුවළගේ නිවසේ වත්දැයි යන සැකය එවර ඇයට නැඟිණ... එහෙත් නැඟණිය එලෙස නොකීවාය... එසේ නම් ජංගම දුරකථනයේ බලය හීනවූවද ඒ නිවසේ දුරකථනයෙන් නම් ඇයට කථාකරන බව තේජානි හොඳින්ම දැන සිටියාය...

සැකයක් තබා ගත නොහැකිය... නැඟණිය මේ මොහොත් නැත... ඇයගේ ක්‍රීඩා උළෙල ගැන ඇසීමේ මුවාවෙන් ඇය බොතේජු නිවසට ගත්තාය.

"ආ තේජානි... මොකද... රසිකා කිව්වද පණිවිඩේ..?" බෝතේජු මහත්මිය අසද්දී... ආරතී එහි නැති බව තේජානිට සිතුණද ඇය එය අසන්නට සිතුවාය... සැක තියාගත නොහැකිය ඇය දෙවනවරටත් සිතුවාය...

"ඒකත් එකක් ආන්ටී... සෙනසුරාදා ආන්ටී එක්ක යනවද නංගාව...?"

"ඔව් ළමයෝ... ඔයා බයවෙන්න එපා... අරයයි මායි දෙන්නම එයාව එක්ක යන්නං කියලා කිව්වා... ඇඳුං වලටත් සල්ලි දුන්නා..."

"කියක් ගියාද ආන්ටී...?"

"එච්චර නෑ තේජානි... හත්සිය ගාණක් වගේ තමයි ගියේ... ඒක ඉතින් අත්කල් කිව්වා එයා ගානෙ දෙන්නං කියලා... අනික ඔය ළමයා කරදර වෙලා එදාට එන්න එපා... ස්පෝර්ට් මීට් එක තියෙන්නේ එන මාසේ දවසක... මට මතක හැටියට දහය හරි දොළහ හරි... පස්සේ අහලා කියන්නං..." කියද්දී තේජානිට සතුටක් දැණුනේ සැබැවින්ම එසේ නම් ඇයටද ඒ දින ගැන කියා නිවාඩුවක් දමා ගත හැකි බව සිතුණු හෙයිනි... මෙලෙස විශේෂ අවස්ථාවක් එද්දී ඇය නිවාඩු ගන්නට තරමක් අදිමදි කළේ එවන් දිනවලදී සියල්ලන්ටම වැඩි මනත් මුදලක් වැටුපට එක්වෙන බව දැන සිටි හෙයිනි... ඒ මුදල මාසයක මුදලකට සරිලන බව ඇය දන්නාය... එලෙස ලැබෙන මුදලක් නැති කරගැනීමට කවුරුත් අකැමැති වූහ... ආරතීට එය දන්වන්නට තිබුණේ නම්...

"රතී ආවද ආන්ටී... එන්න ඕන කිය කිය හිටියා... අද උදේ

බැන්ක් ගියා..." ඇය කීවේ ආරතී බැංකුවට ගියේ පෙරේදා බවත් ඇය මෙතෙක් නා බවත් මෙම තැනැත්තියට කිව නොහැකි බව සිතමිනි...

"අනේ නෑ තේජානි... මං හිතාගෙනම හිටියා ආරතීටයි ඔයාටයි දෙන්නට එන්න කියන්න නිවාඩු දවසක... කෙල්ලව දක්කෙත් නෑ ගොඩ දවසකින්..."

තේජානිට වෙනත් කථාවක් කරන්නට තරම් දැන් ශක්තියක් නොවිණ... ඇය එහි ගොස් නැත... සමහරවිට ගමේ... පියා ළඟට...

ඇය බොතේජු මහත්මිය හා තවත් මොහොතක් කථා කර දුරකථනය විසන්ධි කළාය...

එය නම් වෙන්නට නොහැකිය...

එසේනම් ඇය තවමත් ඇත්තේ සංජයගේ නිවසේ විය හැකිය...

කෙසේ වුවත් දැන් කෙසේ හෝ ආරතීට කථා කරන්නට මගක් සොයා ගත යුතුය... ඇයට සිතුණේ සංජයට කථා කරන්නටය... එහෙත් ඔහුගේ දුරකථන අංකයත් කිසිවක්ම ඇය නොදන්නාය... ඔහුට දුරකථන අංක දෙක තුනක්ම තිබිණ... එහෙත් ඒ සියල්ලම දන්නේ ආරතී පමණකි... මෙතෙක්ම ආරතී පිට ගියද නිරතුරුම තේජානිට කථා කරනා සෙයින් ඇයට සංජය නැමැත්තාගේ දුරකථන අංකයක අවශ්‍යතාවයක්ද නොතිබිණ... දැන්...

එලෙස දුරකථන අංකයක් ඉල්ලා නොගත්තා ගැන ඇයට ඇතිවූයේ පසුතැවිල්ලකි.

කාමරය තරමක් අස් පස් කර දැමූ ඇය සිතුවේ ආරතීගේ කබඩය විවර කර සංජයගේ දුරකථන අංකය තිබේදැයි සොයන්නටය.

ගමේ දුරකථන අංකයක් නැතිවුවද ලිපිනය නම් ආරතී මයන්තට දී තිබිණ... ඒ තේජානි ගම ගැන සොයන්නට යැයි ඇයට කරදර කරද්දීය... ඇයගේ දානය ගැන ආරංචිය ඒ මොහොතේදී ගෙන ආ මයන්ත, ඒ පියා ගැන සෑහෙන්නට කළකිරී සිටියේය... එදා ඔහු පියා මුණ ගැසී නොතිබිණ... ඔහු ආරතී ගැන විමසා තිබුණේ වටපිටාවෙනි... එහෙත් ඔහු ළඟ ඒ ලිපිනය තිබෙන බව දන්නා හෙයින් ඇය කල්පනා කළේ සංජයගේ ලිපිනයක් හෝ අංකයක් සොයා ගන්නා මගක් ගැනය.

ඇය යළිත් ආරතීගේ දුරකථනයට ගත්තාය.... නැත... එය දැන්



ක්‍රියාවිරහිතවී ඇත... එයින් නිකුත්වූයේ එය ක්‍රියාවිරහිත වී ඇති බව කියන තැටිගත කළ කටහඬ පටියේ දැනුම් දීමය. එය ඕනෑකමින් නවත්වා දමුවා නම් වෙන්නට නොහැකිය...

ඉන්පසු ඇය අනිකටද ගත්තාය... නැත... එයින්ද කියැවුණේ එය විසන්ධි කර ඇති බවය... ඇය දන්නා සියලුම කුණුහර්ප සිතමින් ආරතීට සිතෙන් බැන්නාය...

දැන් ඇයට සංජයට කථා කරන්නටම සිදුවෙන බව ඇය සිතුවේ සිතේ කෝපයක් මෙන්ම තරමක පසුබෑමකින්ද යුතුවය... මේය මයන්තට කිව යුතුද නැද්දැයි සිතා ගැනීමටද ඇය මොහොතක් කල් ගත කළාය...

තවත් මොහොතකින් පසු ඇය සිතුවේ එය ගැන පසුව මයන්තට දැනුම් දීමටය... වැරදිලාවත් වෙනත් ප්‍රශ්නයක් නම්... ඇයට මිතුරියගේ හොඳ නම රැක ගැනීමට අවශ්‍යය...

ආරතීගේ කබඩයේ යතුර බොහෝ විට ඇය තබන්නේ කණ්ණාඩි මේසයේ ඇයගේ පැත්තේ ලාච්චුවේය... එම කණ්ණාඩි මේස... කණ්ණාඩි තුනකින්ම යුත් විසල් මේසය... ඒවායේ දෙපැත්තේ තිබෙන ලාච්චු දෙක ඔවුන් දෙදෙනා වෙන් කරගෙන තිබිණ... කිසි දිනෙක ඔවුනොවුන්ගේ ලාච්චුවල තිබෙන දේ ගැනීමට ඔවුන් පෙළැඹී නොසිටියහ... බොහෝ විට ඔවුන්ගේ අල්මාරිවල යතුරු දමන්නේද ඒ එක ලාච්චුවකය...

එයින් යතුර රැගෙන අල්මාරිය විවර කිරීම අද නම් වැරැද්දක් නොවන බව තේජානිට සිතිණ... නැතහොත් ඇයගේ සේවාව අවසන් වෙද්දී තමාට හොඳ මිතුරියක නැතිවෙනු ඇත... ඇයට සංජය හා විවාහ පත්වීමට නොලැබෙන බව දන්නා හෙයින්ම ආරතී නම් කිසි දිනෙක මෙම සේවාවෙන් ඇයගේ වයස සපිරෙන තෙක්ම අස්වෙන්නට නම් සිතා නොසිටිය බව තේජානි දැන සිටියාය...

එහෙත් සංජය ඇය විවාහ කරගෙන රටකට හෝ යන්නේ නම් තේජානි කැමැත්තෙන් සිටියාය... ආරතී හොඳ තරුණියක බව ඇය දැන සිටි හෙයිනි...

හොඳකම හෝ ගුණ යහපත් කම නොව මෙතැන්හිදී එන්නේ ඇයගේ සේවා ස්ථානයේ නුසුදුසු කම බව දන්නා හෙයින්ම තේජානිට

සිතුණේ සංජයට කථා කර හෝ මිතුරියව එවන්නට කීමය... රැකියාව නැතිවන බව ඔහුටද දන්විය යුතුය... එය ආරතීට කියන්නට නොහැකි බව ඇය දන සිටියාය... ඔහු ඇය විවාහ කරගන්නට සිතන්නේ නම්... එසේනම් ඔහු එය දන් මේ මොහොතේ එයද කිව යුතුමය... ඇයව විවාහ කරගන්නා බවට ලිපියක් දී තිබෙන බව දන් ඔහුට අමතක වී තිබෙන්නටද හැකිය...

අල්මාරිය විවර කරද්දීම ඇයට ආවේ ආරතීගේ අල්මාරියේ තිබෙන සුවඳය... ඇයට එම සුවඳ තිබෙන කුඩා මල් දමූ බඳුනක් දී තිබුණේ සංජයය... උඩ තට්ටුවම මෙන් තිබුණේ සංජයගෙන් ලැබුණු තිළිණ විය හැකිය... ඔවුන්ට වෙනම ඇඳුම් රඳවා තබන්නට කාමරයක් තිබිණ... මෙම අල්මාරිවල දමූවේ ඔවුන්ගේ පුද්ගලික දෑ පමණකි...

වෙනත් දේවල් ගැන නොසිතා ඇය ආරතීගේ අල්මාරියේ මැද තිබුණු කුඩා ලාච්චු දෙකින් එකක් විවර කළාය...

තේජානිගේ දෑස් ඉහළට ගියේ එහි තිබුණු ආරතීගේ ජංගම දුරකථනය දකිද්දීය... ඇය එය නවතා තබා මෙහි දමා යන්නට ඇත... ඇය ගෙන ගොස් ඇත්තේ පුද්ගලික දුරකථනය පමණකි... එසේනම් ඇය සිතා සිටින්නට ඇත්තේ එදාම ආපසු ඒමට විය හැකිය... දන් තේජානිට උතුර දකුණද මාරු විය... එහි නම් සංජයගේ අංකයක් තිබෙන්නට නොහැකිය... ඒම දුරකථනවලට පුද්ගලිකත්වයක් නැත... ඇයගේ නමින් නිකුත් කෙරුණද සමහරවිට වෙනත් අයෙකුට අවශ්‍ය වුවහොත් ඒවා ඒ තැනැත්තාට හෝ තැනැත්තියට දිය යුතු හෙයිනි... එහෙයින් පුද්ගලිකත්වයට බර දුරකථන අංක එහි සටහන් කරගන්නට කිසිවෙක්ම පෙළැඹී සිටියේ නැත... ඔවුන් දෙදෙන පමණක් නොව අනික් සියල්ලන්ටද පුද්ගලික දුරකථන තබාගෙන සිටියේ එහෙයිනි.

දන් තේජානිට කල්පනා වූයේ ඇය එදාම එන්නට ගියේ නම් නාවේ කිමද යන්නය... එයත් සැබෑවකි... ඇය එදා ගියේ බැංකුවට යන බව කියමිනි... සංජය එන බවක් දන්වූයේ එතනට ගියායින්ද පසුවය... ඇඳුම් පැළඳුම් නම් ඒ ගෙදර තිබෙන බව තේජානි දන සිටියාය... නිවාසය තිබෙන්නේ අවිස්සාවේල්ලේ බව දන සිටියද.... එය හරියටම කොහිදැයි නම් ඇයට අමතකය... ආරතී එම පාර හා අංකය ඇයට කීවාද මතකය...

ඇය දුරකථනය එලෙසම තබා ලාච්චුව වසා එවර පසෙක තිබුණු කුඩා පොත දිග හැරියාය...



එහිද සියල්ල ඇය ලියා තිබුණේ සංකේත මගිනි... ඒවා ගැන දනගන්නට ෂර්ලොක් හෝම්ස් නැමැත්තා හමුවීමට යා යුතුය...

පොත අතට ගත් ඇය එම ලාච්චුව වසා දමූවාය...

ඉන්පසු ඇය අනික් ලාච්චුවද විවර කළාය...

ඒ ලාච්චුවේ ඇයගේ ලියකියවිලි කිහිපයක් තිබිණ... මුදල් මෙන්ම කුඩා පෙට්ටියක්ද විය... පෙට්ටිය විනිවිද දැකිය හැකිය... එහි දමා තිබුණේ යතුරු කිහිපයක් බව ඇයට සිතිණ... ලියකියවිලි බලද්දී ඒවා නම් බැංකු කිහිපයක ලියකියවිලි හා ඇයගේ උප්පැන්නය ආදී දේ බව ඇය දුටුවාය... ඒවා කියවන්නට අවශ්‍ය නැත... ඒ දමා තිබෙන තවරයේ දුරකථන අංක නොදමන බව ඇයට සිතුණු හෙයින් ඇය එම ලාච්චුවද වැසුවාය...

තේජානිට සංජයගේ යැයි කිව හැකි දුරකථන අංකයක් ලැබුණේ පහළ තිබූ ආරතී ඉඳහිට ගෙන යන කුඩා පරණ අත්බෑගයේ එක් කොටසක තිබී සමුවූ කාඩ්පතකිනි... දන් ඇයට වෙනත් කුඩා අත් පසුම්බියක් ඇත... එහි බැංකු කාඩ්පතක්ද තිබිණ... කෙසේ හෝ එම අංකය ලියා ඇත්තේ කලබලයකින් බවද ඇයට සිතිණ...එය කවරෙක් හෝ ලියා දුන් අංකයක් බව ඇයට සිතිණ... සමහරවිට මේ නම් සංජයගේ අංකය විය හැකිය... ඔහු පළමුදාත් ඇයට ඔහුගේ දුරකථන අංකය යෙදූ කාඩ්පතක් එවූ බව මතකයට එද්දීය...

කොයිකටත් එයට කථා කළ යුතුය... ඇය සිතුවාය... ආරතීගේ දුරකථන අංකයෙන් කථා කළ යුතුදැයි නැද්දැයි සිතාගැනීමටද ඇයට ටිකක් වේලාවක් ගත විය...

දෙවන වර ඇය සිතිවිල්ල නවතා ගත්තාය... ආරතීගේ දුරකථනය පණ ගැන්වීම නොහොබිනා වැඩකි...

එම අංකය ඇයගේ දුරකථනයට ගත් ඇය කාඩ්පත අත්බෑගයට නොව කුඩා පොතට දමා එය මේසයෙන් තබා අල්මාරිය වැසුවාය... ආරතීට තමා එය විවර කළ බව ඇය හා කථා කළ පසු කිව හැකිය... නැතහොත් මෙලෙස සංජයගේ අංකය තමාට ලැබුණේ කෙසේදැයි ඇය බිය වෙනු ඇත.

ඉන්පසු ඇය කලේ එම අංකයට කථා කිරීමට එය පණගැන්වීමය... එදෙසින් ගීතයක් වාදනය වෙමින් තිබිණ...

දුරකථනය හඬ ගැන්වෙද්දී දූත් ඇය සිතුවේ තමා නැනැත්තාගේ දුරකථනය හඬ ගැන්වෙද්දී... සංජය නම් තමා කවුරුදැයි හඳුනා දෙන්නේ කෙලෙසද යන්නෙනි... තේජානි යැයි නම නොකීවද තමා ගැන දන්නා බව ඇය දන්නීය... තමාගේ සිටින්නේ ආරතී හා එකම කාමරයේ බව ඔහුට කිව හැකිය... තමාගේ නම ආරතී සංජයට පවසා තිබුණේදැයි ඇය කවදාවත් ඇසුවේම නැත... එහෙත් ඔහු තමා ගැන දන්නා බව නම් ඇය මිතුරිය කී කරුණු වලින් වටහාගෙන සිටියාය... ඇය තමාගේ නම පවසා තිබෙන්නටද පිළිවන...

පළමු අවස්ථාවේ දෙවරක්ම ගීතය වාදනය වූවද, තෙවරක්ම ඇය එය පණගැන්වූවද ගීතය වාදනය වූවා මිසක කවරෙක්වත් එදෙසින් කථා කළේ නම් නැත...

ඇයගේ නොඉවසිල්ල දැඩි වූවද වෙනත් කරන්නට යමක් නැති හෙයින් ඇය ඇයගේ දුරකථනය පසෙකට දමා එවර යහනින් වාඩි වූණාය...

ඇයගේ හිස යළි කැක්කුමක් නැග එන්නට විය... මේ හිස කැක්කුම... ආරතීගේ මේ ප්‍රශ්නය ඇයට සෑහෙන්නට බලපා තිබෙන බව තේජානිට සිතිණ... ආරතීට මෙයින් යන්නට සිදුවුවහොත් ඇය වැනි මිතුරියක නම් නොලැබෙන බව සිතෙද්දී ඇයගේ හිස පමණක් නොව මුළු ගතම තලා දමුවාක් වැනි හැඟීමකින් ඇය පෙළෙමින් සිටියාය... මෙම ජීවිතයේදී සිතේ වේදනාව සඟවා ගෙන විහිළුවෙන් තහළුවෙන් කාලය ගෙවා ගත හැකි මිතුරියක කාමරය බෙදා හදා ගැන්මට නොලැබීම නම්...

මව හා පියා නැතිවෙද්දීද ඇයට ඇතිවී තිබුණේ මේ හැඟීමය...

ඇය එවර පෙනඩෝල් පෙති දෙකක් ගත්තී යහනේ දිග ඇදුණාය... අර අංකය අයිති තැනැත්තා එයට කිසියම් දුරකථන පණිවිඩයක් ආ බව දැනගත් විට මෙම අංකයට කථා කරනු ඇත...

ඇයට එවර නම් පැයක් හෝ පැය තුන්කාලක් පමණ වේලාවක් නින්දක් යන්නට ඇත...

ඇය අවදිවූයේ ඇයගේ පුද්ගලික දුරකථනයේ සීනු ශබ්දයෙනි...

රසිකා... ඇයට මතක් වූයේ නංගීය... ඒ මොහොතේ නම් ආරතී එයට කථා කරනැයි ඇයට සිතුණේ නැත...

දුන්නක් මෙන් ගැස්සී අවදිවූ ඇය යහනින් බිමට පැන මේසය මත තිබූ දුරකථනය ගත්තාය...



දෙවන වර ඇයගේ දෑස් විසල් විය... කිසි දිනෙක නොදන්නා අංකයකි... ඇය බැලුවේ ඇයගේ අතික් දුරකථනයෙන් ඇය කථා කළ අංකයය... ඒ අතර එය විසන්ධි විය...

නැත... ඒ අංකයද නොවේ... එසේනම්... එයට ගමදෝයි නොගමදෝයි සිතද්දී එය යළිත් නද දෙමින් තිබිණ...

සමහරවිට ආරතීගේ දුරකථනය කොහේ හෝ නැතිවී ඇය වෙනත් අංකයක් ගෙන කථා කරනවා විය හැකිය... ඇයට සිතිණ.

වෙනත් කිසිවක්ම නොසිතා ඇය එය පණ ගන්වා සවණට තැබුවාය.

★★★

"හලෝ..." ඇය කීවේ තරමක් හඬ පහත් කරමිනි... ඉඳහිට මෙම දුරකථනයට නොයෙකුත් පුද්ගලයින් කථා කරන්නේය... බසයේදී හමුවූ තරුණයෙක්... නැතහොත් නවතම විලාසිතාව ...මං ආමි එකේ... නැතහොත් පොලිසියේ කීමය...

ඔවුන් දෙදෙනාම එවිට කරන්නේ මයන්තට එම අංක දීමය... මයන්ත කරන්නේ ඒවා ආරක්ෂක සේවාවේ ලොක්කෙකුට දීමය... ඔවුන්ට එවැනි දේ නම් කළ හැකිය... මෙම නේවාසිකාගාරයේ තරුණියන් කිසිවෙක්ම එවැනි දුරකථන පණිවිඩ වලට පිළිතුරු දෙන්නට නම් යන්නේම නැත... ඔවුන්ද ඒවා මැඩමට හෝ මෙනාලි මිස්ට පවසන්නාහ...

කරන සේවාව අනුව එවැනි භෘංග රාජයන් ඇසුරු කිරීමෙන් හානියක් විනා වෙනත් යමක් නොවන බව සෑමොම මෙන් දැනුවත්ව සිටි හෙයිනි... එවැනි ලෙස කථා කරමින් ඔවුන්ගෙන් විස්තර රැගෙන පුවත් පත් වලට හෝ මාධ්‍යයට මෙම සේවාවේ කරුණු ගියහොත් යන සැකයක් සියල්ලන්ගේම සිත්වල තිබුණු හෙයින් ඔවුන් එලෙස කතා කරන්නටද බොහෝ විට පසුබාමින් සිටියහ...

"තේජානී..." එදෙසින් ඇසුණේ ගැඹුරු කටහඬකි...

ඇය වෙව්ලවාය... තමාගේ අංකය... පුද්ගලික අංකය... මේ මයන්ත නම් නොවන බව ඇයට විශ්වාසය... ඇයට එක්වරම මතකයට ආවේ මයන්තගේ පියාගේ ත්‍රීරෝද රථය තුමක් හෝ අනතුරක් විද

යන්නය... ඔහුගේ දුරකථනයේ නම ඇයගේ එම අංකය නමක් නැතිව හෝ සමහරවිට තිබෙන්නට පිළිවන... ඇය එයට කථා කරන බැවිනි... එසේනම... ඔහුට කිසියම් අනතුරක් වූයේ නම එහි කථා කරන්නාගේ අංකයක් ලෙස තම අංකය සටහන් වී තිබුණේ නම්, එම අංකයට කවරෙක් හෝ කථා කරන්නට සිතුවේ නම එය සාධාරණය.

කටහඬ කිසියම් බලකලයක් හිමි අයෙකුගේ බව ඇයට වැටහිණ. සමහරවිට පොලිසියෙන්.. ඇයගේ මුළු ගතම සිහිතල විය... මේ ආරතී මෙතෙක්ම නාවා ගැන කණස්සල්ලෙන් සිටියදී....

"ස්පීකිං..." ඉංග්‍රීසිය එතරම් නොහැකි වුවද ඇයට කියැවිණ...

"මං සංජය..."

ඇයගේ දෙපතුලින් පටන් ගත් සිහිතල හිසට ගියාද නැතහොත් හිසෙන් පටන් ගත් සිහිතල දෙපතුළට දුණුනාදැයි කිව නොහැකිය...

තමා කථා කළේ ඔහුට බව සැබෑවකි... එහෙත් තමාගේ අංකය දකිද්දී කථා කළ යුත්තේ ආරතීය... ඇය කථා නොකළේ ඇයි...? ඇයට අනතුරක් වීද...?

"මං...මං..." ගැවා විනා තේජානිට වෙනත් යමක් කියන්නට නොහැකි විය... ආරතී පැය ගණන් මේ තැනැත්තා හා කථා කරන්නේ කෙසේදැයි ඇයට සිතිණ... මේ කටහඬ ඇසෙද්දී වෙව්ලීම හැරෙන්නට වෙනත් යමක් කරන්නට තමාට නම් නොහැකි වනු ඇත...

"ඔයා මට කථා කරලා තිබුණා... මොකද ආරුට...? එයාගේ සෙල් දෙකම වැඩ කරන්නේ නෑ..." ඔහු එදෙසින් කියද්දී ඇයගේ සිරුරම ගැහෙන්නට විය...

"ආරු...?" ඇයට ඇසිණ... සංජය ආරතීට ඇමතුවේ ආරු නමින් බව ඇයට ආරතී කියා තිබුණද මේ මොහොතේ ඇයට එයද අමතක විය.

"ආරතී.. එයාට සනීප නැති වෙලාද...?" එදෙසින් යළිත් ඇසිණ... තේජානි නම් මිතුරිය බොහෝ සේ කැළඹෙන තැනැත්තියක බව ආරතී කියා තිබුණ හෙයින්ම නොව මිතුරියෝ ආරතීට කථා කරන්නේ රතී යන නමින් බව දැන සිටි සංජය එවර සම්පූර්ණ නමම කිව්වේය... එම සේවාවේදී පෙම්වතියට යෙදෙන නමින් කතා කරන්නට ඔහු කවදත් අකැමැති විය.

"සනීප නැති වෙලා..?" ඇයටද ඇසුණේ පැණයක් විලසිනි...



ඇය එය පැණයක් සේ නැගුවද එහා දෙසින් සිටින්නාට එය පැණයක් නොව වදනක් වූ බව ඇයට සිතුණේ නැත.

"මොකක්ද අසනීපෙ... උණද නැත්තං...?" එහා දෙසින් සිටි සංජයගේ හිස එවර යකාගේ කම්මල වී තිබිණ... ඔහුගේ සිතට ආ සිතිවිල්ල තේජානිට දැණුනේ නැත... ඔහුට ආරතී මවක් වන්නට යන්නේදැයි එවර සිතිවිල්ලක් නැගිණ. සැබැවින්ම ඇය ඔහුගේ පෙම්වතිය නොවේ... විවාහ පත් නොවූවද ඇය ඔහුගේ බිරිඳ ලෙස සලකන්නට ඔහුට පිළිවන් කම ලැබුණේ ඇය හා මුණ ගැසී කථා බස් කළ පළමු මාසයේමය... ඔහු නිවසක් ගත්තේද එහෙයිනි... එහෙත් අන් අයගේ සැකයෙන් බේරෙනු පිණිසත් ඔවුන් දෙදෙනාට කිසියම් ලෙසකින් එක්වන්නට හැකි වන්නට වෙලාව ගනු පිණිසත් ඔහු එවන් පියවරක් ගත්තේය... තේජානිද යම් තරමකට එය දැන සිටින බව ඔහු දන්නේය... ආරතී මෙතෙක්ම මෙහි සේවාවේ සිටි බව දැන සිටියේ නම් ඔහු හා ඇයම පමණකි... කෙසේ වුවත් ඔහුගේ සිතැගි ඔහු සියල්ලම ආරතීට වුවද පවසන්නට නොගියේය... ඔහු ආරතීට ආදරයක් හිමෙන සත්‍යයකි. එහෙත් එම ආදරය ඔහුගේ ජීවිතයට තරමක බරක් එක්කර තිබෙන බව නම් ඔහු දන්නේය... එහි පළමුම දේ වන්නේ ආරතීගේ මිතුරියන් හා ඔහුට පැහීමට නොහැකි කමය.

"රතීට... රතීට උනේ මොකක්ද...?" තේජානිට ඇසිණ...

සංජයට කිසිවක් වැටහිණ... ඇය තමාගෙන් ආරතී ගැන අසන බව ඔහුට වැටහිණ... තේජානිගේ සිතිවිලි නොදත්තද, ඇය කරන්නේ ප්‍රශ්න කිරීමක් නොව තමා කියන දේම වර නැගීමක් බව ඔහුට සිතිණ... ඔහුගේ සිත හිනිගත්තේ එවර ඔහුගේ පවුල ගැන සිතමිනි... ඔවුන් ආරතීට කුමක් හෝ මුසාවක් කියා ඇයව කොහේ හෝ පිටත් කරාවත්ද...?

එහෙත් එක්වරම එය තේජානි සමග පවසන්නට ඔහු බිය විය... සමහරවිට තමාගේ විවාහය ගැන දැනගත් හෙයින් ආරතී තරමකට සැලුණු නිසා...

"මිස් තේජානි..." ඔහු එවර කීවේ සැබැවින්ම දන් කළයුතු පළමු දේ වන්නේ මේ තේජානි නැමැත්තියව සන්සුන් කර ගැනීම බව සිතමිනි... ඇය බොහෝ බියපත්ව ඇති බව ඔහුගේ සිතට වැටහුණේය... ආරතී සමහරවිට බොහේපු නම් අයගේ නිවසට ගියා වෙන්නටද පිළිවන...

ඔවුන්ගෙන් ඒවා විමසන්නට ඔහුට නුපුළුවන... ඒවා කල හැක්කේ මේ තරුණිය හරහාය...

ඔහු තමාගේ නම කියෙව්වේ බොහෝ දන්නා හඳුනන්නෙකු පරිද්දෙනි... ඔහු මෙන්ම එදෙසින් අසා සිටි තේජානිද සැබැවින්ම බොහෝ තැන්පත් වූණාය. තමා කලබලවූයේ බොරුවටය...

"රතී ආවේ කොයි වෙලාවෙද මිස්ට සංජය...?" ඇය ඇසුවාය... මිතුරිය සමහරවිට අද උදයේ එන්නට ඇත... ඇයට අසනීපය අමතක විය. ඇය සංජයට ගරු නාමයක් දෙන්නට සිතුවේ සැබැවින්ම ඔහු වැන්නෙක්ට සම තත්ත්වයේ ලා සලකන්නට ආරතීට හැකි වූවද තමාට නොහැකි බව සිතමිනි.

"ආවේ කියන්නේ...?" සංජය ඇසුවේය. ඇයගේ එම ඇමතුමට ඔහුගේ කැමැත්තක් නැගිණ. ආරතීගේ මිතුරියන් පිළිබඳව ඔහුගේ සිතේ තිබෙන කහට සෙමින් වියැකී යමින් තිබිණ.

"රතී මිස්ට සංජය හම්බ වෙන්න ආවනේ...?"

මේ කෙල්ලට පිස්සුදැයි එවර සිතුණේ සංජයටය... ඇය තමාගේ කිසිඳු පැණයකට පිළිතුරක් නොදී පැණ නගන්නීය...

"මිස් තේජානි... මාත් අහන්නේ ඒකම තමයි... ආරුගේ ෆෝන්ස් දෙකම ඕෆ්... මං මේ දවස්වල හිටියේ නෑ... මං ගිය සතියෙම හිටියේ අම්පාරේ... ආරු දන්නවා ඒක... මං කිව්වා කොළඹ ආව ගමන් කථා කරන්නං කියලා... කෝල් කරාට ගත්තේ නෑ... මං ඔයාට මේ ගත්තේ ඒක නිසා... මං දන්නවා එයාගේ නම්බර් එකට පිටිපස්සේ නම්බර් එක ඔයාගේ කියලා..." සංජය එක දිගට කියවාගෙන ගිය කථාව තේරුම් ගන්නටද තේජානිට තරමක් වෙලා ගතවිය... එවර නම් ඇයගේ සිරුරම පණ නැතිවී යමින් තිබිණ...

එසේනම් ආරතීට වූයේ කිමෙක්ද...? ඇය සංජය හමුවෙන්නට යන බව දනුම් දුන්නේ...? ඇයට කිසිවක්ම සිතාගත නොහැකි විය... සංජය කරන්නේ රඟපෑමක්ද...?

ඔහුට විවාහයට නියමිතව තිබෙන තරුණිය ගැන කවුරුත් දනිති... ඒ උසස් රාජතාන්ත්‍රිකයකුගේ දියණියකි. ඇයව විවාහ කරගන්නට පෙර මොහු මිතුරියට කුමක් හෝ...

වැරදිලාවත් ඔහුට ඇයට එවූ අර ලිපිය ගන්නට හෝ අවශ්‍යතාවයක් ආවේද...? ඒ ලිපිය...



ඇයට සංජය හා කථා කරන්නටද බිය සිතුණු තරම්... එහෙත් දිරි වඩාගත් ඇය යළිත් කථා කරන්නට සිතුවාය...

ආරතී එසේනම් මොහු විසින් කොහේ හෝ සැඟවූවා වන්නටද පිළිවන... විවාහයකින් අර තරුණිය බන්දා තබා... ඔහුට ආරතී අනියම් ලෙසකින් තබා ගන්නටද හැකියාවක් ඇත... බොහෝ මීපැණි පොරොන්දු දුන් සමහරු පසුව ඒවා තිප්පිලි කසාය බවට පරිවර්තනය කරගන්නා බව ඇයට අත්දැකීමක් නැතත් සමහරුගෙන් දැන සිටියාය... මේත් එවැන්නෙක් විය හැකිය... මෙතෙක්ම සියල්ලන්ම දකින්නට ඇත්තේ ආරතීගේ සිරුරේ දවටුණු මීපැණි තලිය පමණක් නම්...

ඇය තරමක් කල්පනා කරද්දී ඒ දෙසින් යළිත් කටහඬ නැගිණ.

"මිස් තේජානි... ආරුට සනීප නැද්ද...?"

මොහු මේ අසන්නේ ඇත්තටමදැයි නැද්දැයි සිතා ගන්නට ආරතීට නොහැකිය...

"රතී එදා බැංකුවට ගියා..."

සංජයට කෝපයක්ද නැගුණේය... මේ කෙල්ල මොනවා කියන්නේද...? එදා ගිය ගමනක් ගැන ඇය කියන්නේ මොනවාද...? බැංකුවට ගිය ගමනක් ගැන තමාට අවශ්‍ය නැත... ඔහුට ඇති තරම් වැඩ කටයුතු ඇත... ආරතීට නම් ඒවා ගැන හොඳ වැටහීමක් ඇත... ඒත් දැන් මේ තරුණිය... තමාට කිව යුතු දෙය නොකියා තමාගේ කාලයද කා දමන්නීය...

"කවදද...?" ඒත් ඔහු ඇසුවේය.

එවර නම් තේජානිගේ කෝපය නැගිණ... මොහු කියන්නේම බොරුය... අම්පාරේ සිටියා කීවාට එදා ආරතී අම්පාරට ගෙන්නා ගන්නට ඔහුට හැකියාවක් තිබුණේ යැයි තමා සිතතැයි ඔහු සිතුවේ නම් ඔහුට වැරදී ඇත...

"මිස්ට සංජය මේ... එයා දැන් දවස් දෙකක් වෙනවා බැංකුවට ගිහිල්ලා මට කෝල් කරලා කිව්වා මිස්ට සංජයට එයා හම්බවෙන්න ඕනකමක් තියෙන නිසා එතනින්ම යනවා කියලා... කොහේ යනවද කියලා මං අහන්න ගියේ නෑ... මිස්ට සංජයගේ වෙහිකල් එක එනනට එනවා කියලත් කිව්වා... ඉන්පස්සෙන්දා මෙහේ එනවා කියලත් කිව්වා... ඒත් තාම රතී මෙහෙට ආවෙ නෑ... මිස්ට සංජය එයාත් එක්ක අම්පාරෙ ගියා කියලා නං මං දැනං හිටියේ නෑ..." එවර ඇය වික්කඩ කැඩුවාසේ

කියාගෙන ගියාය... කෝප ගත් විට මොහු වැන්නන් හා කථා කිරීම පහසු බව ඇයට සිතුණේ ඒවා කියවා නිම වෙද්දීය....

"ආරු මාත් එක්ක ආවෙ නෑ..." සංජය කීවේ මේ කෙල්ලට කුමක් හෝ ලෙඩක් හැදී ඇත්දැයි යන දෙගිඩියාවෙනි... එක් අතකින් බලද්දී එම නේවාසිකාගාරයේ සිටින්නේ ජීවිතේ බොහෝ කම්කටොළුවලට මැදිවූ තරුණියන්ය... ඔවුන්ට යමක් කමක් සිහි කල්පනාවෙන් කරන්නටද හැකි වෙතැයි සිතන්නටද නොහැකිය... ආරතී ඒ අතින් තරමක් ඉදිරියෙන් සිටින්නියකි... එතරම් උගත් කමක් නැති වුණද, ඇය සමාජයේ හොඳින් හැසිරෙන්නට දන්නියකි... කථා බහ කරන්නට... ඇයට හොඳින් ඉංග්‍රීසි භාෂාව වුවද හැසිරවිය හැකිය...

ඔහු කල්පනා කළේ ඔහුගේ පරාසයෙන් මෙවැනි කෙල්ලක ගැන සිතුවාට... අනික් කෙල්ලන් ආරතී වැනි තත්ත්වයක් තබාගෙන නොසිටින ළඳුන් බවය... එහෙත් තේජානි නම් තැනැත්තිය කෙරෙහි එයට වඩා ඔහුගේ ගරුත්වයක් තිබිණ. ඒ ඇය දූන හඳුනාගෙන නොවේ... ආරතී මිතුරිය ගැන තරමක් දුරට කියවා තිබුණ බැවිනි... එහෙත් එලෙස වුවද ඔහු සිතුවේ ඇය ඔහුගේ තත්ත්වයට ගැලපෙන මිතුරියක නොවන බවය...

ඒ සියල්ලටමත් වඩා දවස් දෙකකට පෙර බැංකුවට ගියේ නම්... ඒ වෙද්දී ඔහු සිටියේ අම්පාරේය... ඔහු කොළඹට ආවේම නැත... ආරතී හා කථා කළා නම් මතකය... ඒ එදින උදයේය... එදා ඇය බැංකු කථාවක් කීවා නම් මතකය... එහෙත් ඔහු අම්පාරේ බව ඒ මොහොතේ ඇයට කියන්නට නොහැකි විය... ඇය කථා කළේ බැංකුවට ඇතුල්වෙන අතරමය... බැංකුවේ ඇයගේ කිසියම් වැඩක් නිම කරගෙන, පිටතට පැමිණ ඔහුට ගන්නා බව කීවද ඇය කථා කළේ නැත... ඔහු ඇයගේ දුරකථනයට කථා කළ නමුත් ඒ මොහොතේ කුමක් හෝ සිදුවී තිබිණ... ඇය කථා කළද ඒවා එතරම් පැහැදිලි වූයේ නැත...

ඇය කී අවසන් වචනය වූයේ ...මං එන්නං සංජු... එයය. ඒ ඔහු තවත් දින දෙකකින් අවිස්සාවේල්ලේ එන බව දැනුම් දුන් නිසා බව ඔහු ඒ මොහොතේදී සිතාගත්තේය... එන්නේ කොහේටද නැතහොත් කවදාදැයි අසන්නට ඔහුට නොහැකි වූ හෙයිනි... සාමාන්‍යයෙන් ඇය එලෙස එන්නේ අවිස්සාවේල්ලටය... එන්නේ නම් තමා බොහෝ විට තමාගේ රථයක් ඇයට යවන්නේය... නැතහොත් ඇය එන්නී තමා ඇයට හඳුන්වා දුන් කැබ් රථයකිනි... එන්නේ කොහේටදැයි අසාගන්නට



සිදුවූයේ නම් මේ කරදරයක් වන්නේ නැත... එහෙත් එය අසාගත නොහැකි වූයේද, ඇයගේ දුරකථනයේ ශබ්දය කුමක් හෝ වාහනයක ශබ්දයෙන් ඒ මොහොතේදී යටපත් වූ බැවිනි...

ඇය එදෙසින් එලෙස කියා දුරකථනය විසන්ධි කළා ඔහුට මතකය... ඔහුටද ඒ මොහොතේදී ඔහුගේ දුරකථනය විසන්ධි කිරීමට සිදුවූයේ ඔහුගේ රාජකාර්යයට අයත් වැඩ මුළුව ආරම්භ කිරීමට සිදුවෙද්දීමය... තමා අම්පාරේ බව ඇයට කීවා නම් ඔහුට මතක් කර ගත නොහැකිය... නැත... එය කියන්නට ලැබුණේ නැත... ඔහු කීවේ අවිස්සාවේල්ලට පැමිණෙන බවය... දිනය කියන්නට නොලැබිණ... ඉන්පසුදා ඔහු අම්පාරෙන් ආවේ අවිස්සාවේල්ලේ යන්නටද සිතාගෙනය... ආරතී ඒ වෙද්දී එහි ආ යුතුය... එහෙත් ඒ නිවසට ඇය නොආ බව කීවේ එහි සේවිකාවය...

එහෙත් ඇය ගැන විපරම් කරමින් සිටින්නට තරම් ඔහුට වේලාවක් ආවේම නැත... ඔහු යළිත් කොළඹට ආවේය... හෝටලයට ගොස් ඇයව මුණ ගැසීමට දූත් ඔහු කැමැත්තක් දැක්වූයේම නැත... ඒ ඔහුගේ විවාහාපේක්ෂිත තරුණියගේ කවරෙක් හෝ දුටුවහොත් යන සැකයද සිතේ බලපැවැත්වූ බැවිනි... ඔහුට රටින් නික්මෙන්නට පෙර මේ කිසිවකට කරගහන්නට උවමනාවක් නොතිබිණ... එම තරුණියගේ කවරෙක් හෝ දැක එය තමාගේ දෙමාපියන්ගේ සවණට තැබුවහොත්... වන්නේ කුමක්දැයි කීමට අටුවා ටීකා අවශ්‍ය නැත...

ඔහුට අවශ්‍ය වූයේ මේ සියල්ලම හොර රහසේ නිම කර ගැනීමටය... ඔහු ආරතීට වුවද ඔහුගේ සිතැගි එක එල්ලේ පවසන්නේ නැත...

ඔහුට එවර මාතරට යන්නට සිදුවූ බව ආරතීට දන්වන්නට ඔහුට අවශ්‍ය විය... තමා නැතිව ඇය අවිස්සාවේල්ලට ඒම ගැන ඔහුගේ අකැමැත්තක්ද තිබුණ බැවිනි... එහෙයින්ම ඔහු අද උදයේ කිහිප වරක්ම ඇයට කථා කරන්නට උත්සාහ කළේය... එහෙත් නැත... ඇයගේ දුරකථනය විසන්ධි වී තිබිණ... ඔහුගේ දුරකථනයකට වෙනත් අංකයකින් පණිවිඩයක් ඇවිත් තිබිණ... ඒ ආරතී නොවන බව නම් ඔහුට සිතිණ... එහෙත් එය තේජානිගේ විය යුතුය ඔහු සිතාගත්තේ ඔහු ආරතීගේ දුරකථන අංකය හා ඇයගේත්, අනික් මල්ලී තියන මයන්ත නැමැත්තාගේත් දුරකථන අංක එක ළඟ අංක බව දන්නා හෙයිනි.

ඔහු බිය නැතිව තේජානි නැමැත්තියට ගත්තේද එහෙයිනි... එහෙත් තේජානිගේ සිතේ තමා ගැන තිබෙන්නේ කුමන අදහසක්දැයි ඔහු දන්නේ නැත... තමා හා ආරතී අතර විවාහයක් නොවිය හැකි බව නම් ඇය ආරතී සමග කියා තිබිණ... ආරතී එය කීවේ තමා ගැන ඇති සැකයක් නිසා හෝ ඇයට තමා හා විවාහ පත් වෙන්නට අවශ්‍යතාවයක් තිබෙනම නිසා හෝ නොව... නිකමට මෙනි.

ආරතී වුවද එය දන සිටියාය... ඇය එදා ඒවා කීවේ සැබැවින්ම ඇයගේ සිතේ සිතිවිල්ලද ඔහුට කියමිනි.

ආරතී අවශ්‍ය තමන්ටය... එය සැබැවින්ම ආරතී වුවද දන සිටියේ නැත... ඔහු ඒවා කියන්නට ගියේද නැත... එහෙත් ආරතී හා විවාහයකට තමන්ගේ දෙමාපියන් කෙදිනකවත් කැමැත්තක් නොදෙන බව නම් ඔහු හොඳින්ම දන සිටියේය... ආරතීගේ රැකියාව කුමක් වුවද ඇය සොඳුරු තරුණියකි... ඇයගේ රූමත්කම විශ්ව රූ රැජිණ තරඟයකට ගිය කෙල්ලකගේ වත් ඔහු දක තිබුණේ නැත.

රූමත්කම දෙමාපියන්ගේ අංක එකට වැටෙන්නේ නැත... ඔහුට ආරතී අහිමි වී යමින් තිබුණේ එහෙයිනි... ආරතී හා දෙමාපියන් අතර තරඟයෙන් නම් ආරතී පළමු තැනට ආවද, දෙමාපියන්ගේ හා ඔහුගේ වත්කම අතරින් ඔහුගේ වත්කම තිබුණේ දෙමාපියන්ගේ අතේය... ආරතී හා විවාහ පත් වෙද්දී ඔහුට කිසිවක්ම ලැබෙන්නේ නැත...

ඔහු දෙමාපියන්ගේ කැමැත්තට හිස නමන්නට සිතුවේය. එය ආරතීට කියන්නට ඔහු සිතමින් සිටියේ මේ ගමනින් පසුවය...

එහෙත් ආරතීට තමා නිසා දරුවෙක් පිළිසිඳගෙන ඇත්තේ නම්... එය වෙනත් කථාවකි... තමාගේම දරුවා අවජාතකයෙකු කරන්නේ කෙසේද...? ඔවුන් හැකි තරම් ප්‍රවේශම් වූ බව සැබැවි... එහෙත් දන්... එලෙස වී ඇය කොහේ හෝ ගියාවත්ද...? ඔහුගේ හිස ගිනිගනිමින් තිබුණේ එහෙයිනි.

මං එන්නං සංජු... ඇය කීවේ එය කියන්නටද විය හැකිය...

"මිස්ට සංජය... රතී ගියේ එදා බැංකුවට... මට කෝල් කරලා කිව්වා මිස්ට සංජය හම්බවෙන්න යනවා කියලා... ඉතින් දැන් මිස්ට සංජය කියනවනං රතී ආවේ නෑ කියලා... මං විශ්වාස කරන්න ඕන කවුරු කිව්ව එකද...? රතී කිව්ව එකද...? නැත්තං දැන් මේ මිස්ට සංජය කියන බොරුවද...?" ඔහුගේ සිතිවිලි විසුරුවා එදෙසින් ඇසිණ...



සංජයට යකා නැග්ගේය... මේ කෙල්ල තමා කවරෙක්දැයි නාඳුනන හැඩය.

"මිස් තේජානි... බොරුවක් කියන්න ඕන වෙලාවට මං බොරුවක් කියන්න පසු බහින්නේ නෑ... ඒත් ඒ බොරුවෙ කොණක ඉන්නේ ආරතී නං... මං ඒක ගැන ටිකක් හිතලා බලනවා... ඒ මොකද ආරතී කියන්නේ මගේ... හොඳ යාළුවෙක්..." කියූ ඔහු එය විසන්ධි කළේය... ඔහුට බියක් දැණුනේ වැරදිලාවත් මෙම තරුණිය එය වෙනත් කෙනෙකුටත් ඇසෙන්නට කථා කරන්නේ නම්... සමහරවිට එම විවාහපේක්ෂිත තරුණියගේ කාට හෝ ඇසෙන්නටම...

සියල්ලටමත් වඩා ආරතී ගැන වුවද මේ මොහොතේදී ඔහුගේ සිතේ සැකයක් නැගිණ... ඇය තමාට ආදරය කරන්නීය... ඉදින් ඒ ආදරය නිසාම ඇයට තමා නැතිවේතැයි යන සැකයකින් පෙළෙණහොත් ඇයට වුවද එවැන්නක් කරන්නට තරම් ශක්තියක් සිතට නැගෙන්නටද හැකිය...

මුදල් වලට මෙවැනි සේවාවක යෙදෙන තැනැත්තියක යොදා ගැනීමට කාගටත් පිළිවන. තේජානි වුවද මුදලට ගිජු තරුණියක විය හැකිය...

ඔහු එක්වරම දුරකථන පණිවිඩය විසන්ධි කරන්නට සිතුවේ එලෙස සිතේද්දීමය... මෙය ගැන පසුව සොයා ගත යුතුය... ආරතී ඔහුට කථා නොකළා ගැනද දැන් ඔහුගේ සිතට සැකයක් නැගිණ...

තේජානිගේ සිතට නැගුණු සැකය පරිද්දෙන්ම සැකයක් දැන් ඔහුගේ සිතේද නැගී තිබිණ...

එහෙත් එය නොදන්නා නිසාම තේජානිගේ සිත හඬා වැටිණ. මිතුරිය ගැන අසා දැන ගත හැක්කේ මේ තැනැත්තාගෙන්ම පමණි... එහෙත් ඔහු මෙලෙස කරන්නේ කිමද...? ඇයට මිතුරිය ගැන වේදනාවක් දැණින... ඔහු කී අයුරින් ඔහු කිසි දිනෙක බොරුවක් කීමට පසු බසින්නේ නැත... කොණක ආරතී සිටින්නේ නම් එය වෙනස් යැයි කීවද... එයද බොරුවක් නොවන්නේ යැයි ඇයට කිව හැක්කේ කෙසේද...? අනික ඔහු ඒ කියවූ අයුරින් ඔහු ඇයට සලකන්නේ හොඳ යෙහෙළියක යන හැඟීමෙන් පමණකි. ඒ පරාසයේ බොහෝ අයට පෙම්වතුන් පෙම්වතියන් නැත... සියල්ලෝම හොඳ යහළු යෙහෙළියෝය... වැරද්ද වී ඇත්තේ එම යහළු යෙහෙළියන් සමඟ ඔවුන් යනන මතද

යහළුකම පැවැත්වීමය... ඒවා ආරතී නොදැන සිටියායැයි කියන්නටද නොහැකිය... තමාට වඩා ඇය ඒවා ගැන දැන සිටියාය.

සංජයගේ සිතේද ආරතී ගැන ඇත්තේ එවැනි ලෙන්ගතු කමක් නම්... ඇයගේ සිතට දැන් දැඩි පීඩනයක්ද දැනිනි...

ඇය දුරකථනය පසෙකට දමා එවර යහනේ වාඩිවුණාය... මෙය මයන්තට කිව යුතුදැයි නැද්දැයි ඇය දැන් සිතුවාය... ආරතී ගියේ කොහිද...? ඇයට සිතුණේ ඇය පියා බලන්නට ගියා වත්දැයි යන සිතිවිල්ලය... සැබැවින්ම නම් තමන්ට කරදරයක් වෙද්දී තමන්ගේ සහෘදයන් සමහරවිට මතකයට එනු වැළැක්විය නොහැකිය...

ආරතීට වඩා ඇයට දැන් ඒ ගැන සහතික කළ කිව හැකිය... ඇයට ඇයගේ කියා සහෘදයන් කිසිවෙක්ම එදා ඒ දෙදෙවෝපගත ගමනේදී ඉතිරි වූයේ නැත... ඉතිරිවූ එකම නෑයා වූයේ මේ කුඩා නැගණිය පමණකි... ඇයගේ යැයි කිව හැකි සියල්ලෝම ඇය හැර ගියහ... තවත් නෑදෑයින් නැතුවා නොවේ... එහෙත් තමාට දැඩිව බැඳුණු සියල්ලෝම...

ආරතීගේ දැන් සිටින්නේ පියාය... ඇය පියා දකින්නට ගියේ නම්... ඇය ගැන සොයා ගත හැක්කේ මයන්තට පමණි... මයන්ත මේ මොහොතේදී පුහුණුවීම වල යෙදී සිටින බව ඇයට මතක් විය... දැන් ඇයගේ හිස කැක්කුම දැඩිවී තිබිණ... ඇය යළි යහනේ දිග ඇදුණාය... පෙනඩෝල් පෙති පළමුව ගත් හෙයින් යළිත් වරක් ගත නොහැකිය... මෙම හිස කැක්කුම මෙලෙසම තිබුණහොත් වෛද්‍යවරිය ගෙන්වා ගත යුතුය, ඇය සිතුවේ බෙහෙවින්ම දැන් සසල වී ගිය සිතකිනි...

ඇය සියලුම සිතිවිලි පසෙකට දමා නිදාගන්නට සිතුවාය... පෙනඩෝල් ගන්නට නොහැකි හෙයින් එවර ඇය ගත්තේ පිරිටන් පෙත්තකි... පිරිටන් පෙනඩෝල් පමණක් නොව ඩිස්ප්‍රින් සමහන් වින්ටෙජිනෝ, ඒවාද ඔවුන්ගේ ප්‍රථමාධාර පෙට්ටිවල නිරතුරුම තිබිණ...

බොහෝ විට පිරිටන් පෙත්තකින් ඇයට නින්දක් ලැබිණ... ආරතීට නම් එය හරිගියේ නැත... කෙසේ වුවත් තේජානිට නම් එය ක්‍රියාත්මක වූයේ ඇයගේ දෑස නිදිමතින් පියවමිනි.

ඇයට එලෙසම තරමක් වෙලාවක් නින්ද යන්නට ඇත...

දොරට කවරෙක් හෝ අත තියනු දැණුනෙන් ඇය දෑස් විවර කළාය...



★★★

ඇය දුටුවේ ආරතී කාමරයේ දොර විවර කරගෙන එන අන්දමය... ඇයගේ නිදිමත තරමකට පහවෙන්නට ඇත... ඇයට වුවමනා වූයේ මිතුරියට හොඳ දෙහි කැපිල්ලක් කපන්නටය...

"මොකද මේ... ඇයි ඔයා මට නොකියා ගියේ...?" එනිසාම ආරතීට කිසිවක්ම කියන්නට නොදී ඇය යහනින් නොනැගිටම කඩාගෙන පැන්නාය.

ආරති කිසිවක්ම නොකියා ඇය දෙස බලාගෙන සිටියාය... ඇයට ආරතීගේ දෑස් දකිද්දී බියක්ද දැණිනි... සංජයගේ මෙම කල්ක්‍රියාවන් නිසා ඇයගේ සිතේ කිසියම්... තේජානි වෙව්ලුවාය... මෙලෙස බලන්නේ ඇයගේ මනසේ කිසියම් වෙනස් වීමක් සිදුවූ නිසා වත්ද...?

"සංජු පව්..." ආරතී කීවාය.

තේජානිට එවර බිය අභිබවා කෝපයක් නැගිණ.

"සංජු නෙවෙයි පව්... මං... මං මේ දහ අතේ කෝල් කර කර ඔයාව හොයනවා... යන තැනක ගියාට කමක් නෑ... සෙල් එක ඕන් කරගෙන ඉන්න ඕන... නැත්තං... කොහෙන් හරි මට කෝල් එකක් දීලා ඔයා යන තැන කියලා යන්න ඕන..."

"සංජු පව්..."

මිතුරියට කිව හැක්කේ මෙයම පමණක්ද...? ඇයගේ කෝපය ඇය නවතා ගත්තේ ආයාසයෙනි... මිතුරියට... මේ දින දෙකකට පසු පැමිණි මිතුරියට එක්වරම බණින්නට හොඳ නැති බව තේජානිට සිතුණේ හොඳ වෙලාවට විය හැකිය.

"මං ඔයාත් එක්ක කථා කරන්න යන්නෙ නෑ... ගිහිල්ලා හොඳට නාගනිං... එතකොට ටිකක් මොළේ පිරිසිදු වෙයි..." කියූ තේජානි සංජය කියෙවූ දෙය මිතුරියට කියන්නට සිතුවාය... එහෙත් එයට පෙර ආරතී ගියේ නාන කාමරය දෙසටය... ඇය යන්නේද කිසියම් අපහසු තාවයකින් මෙන් බව තේජානිට සිතිණ... සංජය තමාට බොරුවක් කියා ඇයට අතවරයක් වත් කළා වත්ද...? ඔහු විවාහ

වෙන්නට යන බව දැනගනිද්දී ආරතී ඔහු හා එක්වීම ප්‍රතික්ෂේප කලේ නම් ඔහු ඇයට අතවරයක් හෝ කර ඔහුගේ සිතැඟි සපුරා ගත්තේ නම්:.. එය ඇසිය යුත්තේ මිතුරිය එළියට ආ පසුය... එහෙත් ඇය මෙලෙස අපහසුතාවයකින් අර පාර දිගේ ආවේ කෙලෙසද...? ඇය එය අසන්නට සිතුවේද මිතුරිය එළියට ආ පසුය... සමහරවිට සංජයට කර කියා ගත හැකි දෙයක් නොවී අර තරුණිය විවාහ කරගන්නට සිදුවී ඇති නිසා මිතුරිය මෙලෙස කියවනවාද විය හැකිය...

සියල්ලම අසාගත යුත්තේ ඇයගේ විඩාව දුරු කරලූ පසුය.. මිතුරියට තේ කෝප්පයක් වත් සාදා දිය යුතුය... ඇය යහනින් නැගිටින්නට සිතුවාය... යහනින් නැගිටින්නට අප්‍රාණිකත්වයක් දැණුනේ පිරිටත් ගත් නිසා හෙයින් බව ඇයට සිතිණ... එහෙත් ඒ ගැන නොසිතා ඇය මිතුරියට සලකන්නට සිතුවාය...

තවත් මොහොතකින් වතුර වැටෙන ශබ්දය ඇසිණ... තේජානි නැගිට්ටාය... ඇයට සිතේ සැනසිල්ලක් දැණුනේ දැන්ය... දෙවන වර ඇයගේ දෑස් උඩට නැගිණ... මිතුරිය නාන කාමරයට ගොස් ඇත්තේ තුවාය එලෙසම තුවා රඳවනයේ තබාය... ඇයට සිනාවක් නැගිණ... එය එලෙසම' වියැකීද ගියේය... මිතුරිය කුමක් හෝ වේදනාවකින් පෙළෙනවා විය හැකිය... සංජයගේ විවාහය සමහරවිට ස්ථිර කරගත් බව ඇය දැනගත්තා වත්ද...? එය ගැනත් ඇසිය යුතුය... මිතුරිය කිවේ නිවෙස්වලින් යෝජිත තරුණියක බලන්නට සංජය ගිය බව පමණකි...

ඇය වැරදිලාවත් ඇයගේ ජීවිතයට හානියක් කරගන්නට යන්නේදැයි තේජානිට බියක් දැණිනා... එය නම් වැළැක්විය යුතුය... මුහුදේ සිටින්නේ එකම මාළුවෙක් පමණක් නොවේ... සංජය වැන්නෙක් නම් යළි ඇයට හමු නොවන්නට පිළිවන... එහෙත් ඔහු ඇය ගැන සිතන්නේ වෙනත්ම ආකාරයකින් නම්... එය මිතුරියට කිව හැක්කේ කෙසේද...? ඇය මේ මොහොතේ සිටින්නේ කල්පනා කිරීමට තරම් සුදුසු තත්වයකදැයි තේජානිට සිතිය නොහැකිය... තමාගේ අදහස්ද ඇයට පැවසියම යුතුය...

එහෙත් සංජයගේ තමා හා කළ කථාව ගැන සිතෙද්දී සංජය සත්‍යය පවසන්නේත් සත්‍ය ලෙසම සිතන්නේත් මොන පැත්තක් ගැනදැයි කිසිවෙකුටත් සිතන නොහැකිය... මිතුරියගේ මෙම පීඩාව මග හැරුණු පසු ඒවා ගැන කථා කළ යුතුය... සමහරවිට පිටතින් නොපෙන්නුවාට සංජයගේ අහිමිවීමක් ගැන සිතෙද්දී මිතුරියගේ සිතේ



තිබෙන වේදනාව ගැන තේජානිට හොඳ අවබෝධයක් තිබිණ... මිතුරිය තුවාය දමා නාන්නට යන්නට ඇත්තේද එහෙයින්ම විය යුතුය...

"උඹ ඔය දැන් නාන්න ගත්තෙ තුවායක්වත් ගත්තෙ නැතුවද...?" මහ හඬින් ඇසූ තේජානි... තුවායද රැගෙන නාන කාමරයේ දොර ළඟට ගියාය... ඉන්පසු දොරට තඩි බෑවාය... දොර හැරිණ... එය ඇතුළතින් අගුල දමා නැත... තේජානිගේ දෑස් උඩ ඉන්දවිණ... මිතුරිය බිම වාඩිවී සිටියේ උක්කුටියෙනි... ඇය ඇඳුම් පිටින්ම නෑවා වැනිය... ඇයගේ අතින් තුවාය අත හැරිණ.

"මොකද රතී...? ඇයි ඔයාට සනීප නැද්ද...?" අසමින්ම ඇය ළංවෙද්දී ආරතීගේ හිස බිමට බරවෙමින් තිබිණ... තේජානිගේ සිතට බියක් දැණිනා... ඇය කුමක් හෝ බීවා වත්ද...?

ඇයට මිතුරිය අල්ලන්නට පෙර කාට හෝ කථා කරන්නට අවශ්‍ය විය... ඇයව නැගිටුවා ගැනීමට තමාට පමණක් නුපුළුවන් බව ඇයට සිතිණ... සියල්ලටම වඩා බිය... ඇයගේ සිතේ වැඩිමනත්ම තිබුණේ බිය විය යුතුය...

දොරින් එළියට පනිද්දී ඇය ඉදිරියට ආවේ මයන්තය... පිරිමි ළමුන්ට මේ නේවාසිකාගාරය අකැප බව ඇයට මතක් වූවද... මේ මොහොතේ කෙසේ හෝ මයන්ත පැමිණීම ගැන නම් ඇයට සතුටක් දැණිනා... සමහරවිට ඔහු ආරතී ආවා දුටු හෙයින් දුව එන්නට ඇත... හදිසියකදී මුරකරුවන් එම පුහුණුවීම් වල යෙදෙන වාදකයින් හට එන්නට දෙන බව ඇය දැන සිටියාය... මෙතෙක්ම එවන් අවස්ථාවක් ආවේ එකම වරකදී පමණකි...

මයන්ත පුහුණුවීම් නවතා එන්නට ඇත්තේ එලෙසය... ඇයට ඒ තත්පරයේදී බොහෝ දේවල් සිතුණු බව ඇයටම දැණිනා...

"අනේ ඔයා ආව එක කොච්චර එකක්ද මයන්ත... රතී ආවා... දැන් ඇඳුං පිටින්ම අන්න බිම වැටිලා බාත්රූම් එකේ... මට උස්සන්න බෑ කියලා හිතුණ නිසා කාට හරි කථාකරන්න හිතාගෙන ආවෙ..." ඇය තත්පර දෙක තුනකින්ම කියවාගෙන ගියාය...

"පිස්සු... රතී ආවෙ නෑ... මං මේ ආවෙ ඔයාට සනීප නෑ කියලා කිව්ව නිසා..."

"රතී ආවා..." ඇය තරමක් හඬින් මෙන් කීවාය... "දැන් ඉතින් මේ පිස්සු නටන්න එපා... මට සනීප නෑ කියලා කිව්වේ කවුද...?"

කෝපයෙන් මෙන් ඇසූ තේජානි ඒවර දොර හොඳින්ම විවර කලාය, "එන්න එන්න විහිළු නැතුව..." කියාගෙන ඇය මයන්තගේ අතින් ඇදගෙන මෙන් නානකාමරය දෙසට දිව්වාය... මයන්තද ඇය පසුපසින්ම ඇදී ආවේය...

මයන්තට පෙර නාන කාමරයේ දොරින් බැලූ තේජානි විලාපයක් නැඟුවාය...

නාන කාමරය හිස්ය... ආරතී නැත...

බිම රතුපාටක් තිබිණ... ඒ ලේ විය යුතු බව තේජානිට වැටහිණ...

සංජු පව්...

එය ලියා තිබුණේ ලෙයිනි...

ඇයගේ විලාපයට හේතුවූයේ කිමෙක්දැයි බැලීමට මයන්තද එබෙද්දී ඇය විලාප නගමින් එළියට පනිමින්ම රතීට කෑගැසුවාය...

"රතී... රතී..." ඇය සඳළුතලයට දිව්වාය... ආරතී නැත... ඇය යළිත් නාන කාමරයට දිව්වාය... "රතී..." ඇය යළිත් කෑගැසුවාය... වතුර මල එක්වරම ඇරුණේ කෙසේදැයි ඇයට සිතාගත නොහැකිය... ඇයගේ සියොළඟම සිහිතලව් තිබිණ... ඇය තෙමෙමින් සිටියාය...

ඇය සිහි එළවා ගත්තේ කවරෙක් හෝ ඇයගේ කම්මුලට ගැසූ පහරකිනි... ඇය එලෙසම යහන මත වාඩිවූවද කම්මුලට දැණුනු පහරේ වේදනාවද පරයා ඇයට මතක් වූයේ ආරතී වැටී සිටි අන්දමය...

ඇයව වතුරින් නැහැවූණේ කෙසේදැයි සිතන්නට ඒ මොහොතේදී තේජානිට නොහැකිය... ඇයට මතකයට ආවේ නාන කාමරයේදී ඇයද වතුරින් නැහැවුණු බවය...

කිහිප දෙනෙක්ම ඇය වටා සිටිනු ඇය දුටුවාය... මයන්ත හෝ ආරතී නැත...

ඇයගේ ඇඳුම් සම්පූර්ණයෙන්ම තෙමී තිබිණ... ඒ නම් නානකාමරයේ වතුර මලින් වැටුණු වතුරින් විය යුතුය... එය සිහිනයක් නොවේ... තමා තෙත් බරිව් ඇත... එහෙත් ඇය සිටියේ නාන කාමරයේ නම් නොවේ... ඇය සිටියේ යහන මතය.

"මොකද ජානී...?" ඇසුවේ කවුදැයි ඇසීමට වත් ඇයට සිහියක් නොමැති විය... ආරතී නාන කාමරයේ බිම වැටී සිටි අන්දම... ඇයගේ



සිත සැලෙන්නට වූයේ තමාට බොහෝ වේලාවක් සිහි නැතිව තිබෙන්නට ඇතැයි සිතමිනි...

ආරතී රෝහලටවත් ගෙන ගියේද...? ඇයට සිතාගත නොහැකිය... තමාට මිතුරිය සොයා ගන්නට නොහැකි වූවද මොවුන් සොයාගන්නට ඇත...

දෙවනුව ඇයගේ දෙනෙත ගියේ තුවා රඳවනය වෙතය... තමා එයින් ඇයගේ තුවාය ගෙන නාන කාමරයට ගියා ඇයට මතකය... ඇය එළියට පැන්නේ එම තුවාය එතනම බිම දමමිනි... දැන් එහි තුවාය ඇත. උදයේ තිබුණු පිළිවෙළටම ඇත. එය කවරෙක් හෝ යළිත් දමන්නට ඇත... ඒ මොහොතේදී ඇයට සිතිණ... මිතුරිය...?

"කෝ රතී...? එයා ගෙනිච්චද...?"

"මොන රතීද ජානි...? රතී හිටියේ නෑ... එයා ඇවිල්ලත් නෑ..." කීවේ සිරිනිය...

"මයන්ත මයන්ත... එයත් දැක්කා... අනේ රතී බාත් රූම් එකේ වැටිලා නේ හිටියේ... මට තෙවෙයි... අසනීප රතීට... එයාගේ... එයාගේ..." කියූ තේජානි යහනින් නැඟිට වතුර පෙරමින්ම නාන කාමරයට ගියාය.

යෙහෙළියෝ මුහුණට මුහුණ බලාගත්හ...

දෙතුන් දෙනෙක් එලෙස සිටියදී දෙන්නෙක් ඇය පසුපසින්ම නාන කාමරයට පැමිණියේ සැබැවින්ම දැන් තේජානි කිසියම් මානසික ඇද වැටීමකට බඳුන්ව් සිටියේදැයි සිත්වලට නැඟුණු හැඟීමකින්ද යුතුවය... ඔවුන්ට ඇයව තනි කිරීමට බිය සිතුණු අතර... තේජානිට නාන කාමරයේ දොර විවර කිරීමටද බිය සිතිණ... සමුදි එක්වරම නාන කාමරයේ දොර විවර කළාය... එය හිස්ය... එය හොඳින් වේලී තිබිණ... ලේ තබා වතුර වත් එහි නොතිබිණ... නාන කාමරය ඇය පාවිච්චි කලේ සංජයට කථා කරන්නටත් පෙරය... තමා නැහැවූණේ මේ දැන් නොවේද...? තවමත් තමාගේ ඇඳුම්වල වතුර ඇත...

ඇය පුදුමයෙන් අනික් දෙදෙන දෙස බැලුවාය.

"රතී..."

"රතී ආවේ නෑ ජානී..."

"රතී ආවා... සමුදි... මං එක්ක කථාත් කරා නේ...?" ඇය කීවාය.

මිතුරියෝ මුහුණින් මුහුණ බලා ගත්හ... තේජානිට සිතුණේ මිතුරියන් ඇයව නොදක්කා විය හැකි බවකි... සමහරවිට තමා ගැන සිතන්නට පෙර මයන්ත ඇයව රෝහලට ගෙන ගියා වත්ද...? තමාට සිහි නැති වුණා පමණක් වන්නට ඇත. මිතුරියන් එන්නට ඇත්තේ පසුවය.

"මයන්ත...? මයන්තත් දූන් ආව නේ...?" ඇය ඇසුවේ එවර බොහෝ කලබලයෙනි...

එවරද මිතුරියන් මුහුණින් මුහුණ බලාගත්හ... පිරිමින්ට මෙම නේවාසිකාගාරයට එන්නට තහනම් බව තේජානි නොදන්නේ යැයි කිසිවෙකුටත් සිතන්නට නොහැකිය... සියල්ලටමත් වඩා මයන්ත මේ මොහොතේ සිටින්නේ පුහුණුවීම වලය... එහෙත් මේ ඒවා කිව යුතු වෙලාවක් නොවන බව සියල්ලටන්ටම වැටහිණ... තේජානි සිටින්නේ තදබල සිත් කැළඹිල්ලකිනි.

"ඒත් නෑ... මයන්ත තාම ප්‍රැක්ටිස් කරනවා... අපි මේ ටිකත් රෙස්ට් කරන්න ආවෙ... අපිට ඇහුණා ඔයා කෑගහනවා..." සිරිනි කීවේ එහෙයිනි.

තේජානි පුදුමයෙන් මිතුරියන්ගේ මුහුණු දෙස බැලුවාය... දූන් ශාන්තාද සිටින බව ඇයට වැටහිණ... ඇය සෙමින් පැමිණ යළිත් යහන මත වාඩිවුණාය... යහනද තෙත් වී තිබිණ... ඇයට දැඩි පිපාසයක් දැණින... ඇය පසෙක තිබූ වතුර ජෝගුව දෙස බැලුවාය... එය හිස්ය... එහි තිබුණු වතුර ඉවර වුණේ කොයි මොහොතේද...? ඇය නැහැවී ඇත්තේ එහි තිබුණු වතුරින් බව වටහාගන්නට තරම් තේජානිට ඒ මොහොතේ හැකියාවක් නොතිබිණ... ඇය දූන් මිතුරියන් දෙස අසරණව බැලුවාය...

"වතුර ටිකක්..." ඇය වතුර ජෝගුව දෙස බලද්දී කවරෙක්දෝ දුව ගොස් වතුර වීදුරුවක් ගෙන ආවාය...

ඇය වතුර වීදුරුවම එක් හුස්මට මෙන් ඉවර කලාය... ඇයගේ සිතට දැණුනු දැවිල්ල නැවතීමට එම වතුර වීදුරුවට නොහැකි බව ඇයට නම් සිහි තිබිණ... මේ මිතුරියන් රතී නොදුටුවේ ඇයි...? ඇයගේ සිතට දැණුනු එකම පැණය එය විය.

"මං... මං... මං දැක්කා රතී... රතී මෙතේ ආවා..." ඇය තරමක් ගොත ලමින් මෙන් එහෙත් ස්ථිර ස්වරයකින් කීවාය... තවත් මිතුරියක්



ඇය ළඟින්ම වාඩිවූවාය... නොකීවද ආරතීගේ මේ දින කිහිපයේ නොපැමිණීම තේජානිගේ සිතේ සැහෙන පසුතැවිල්ලක් එක් කර ඇති බව සියල්ලන්ටම සිතුණේද දූන්ය... තමනුත් මේ මිතුරිය ගැන නොසෙව්වා වැරදිය... තේජානි පමණක්ම සිතින් විඳවන්නට ඇත... එහෙත් ආරතීගේ පුද්ගලික ජීවිතය දෙස බලන කළ... ඇය මිතුරුවී සිටිනුයේද...

සියල්ලෝම බිය වූයේ ඒ තැනැත්තාට විරුද්ධව යෑමටය...

"රතී ආවෙ නෑ ජානි... අපි විතරයි ආවෙ... අපි මේ ප්‍රැක්ටිස් ඉවර වුණා විතරයි... කාලා බීලා උඩට ආවා විතරයි අපි දෙන්නා... එනකොට ඔයාගෙ කෑගැහිල්ල ඇහුණෙ..."

"කෑගැහුවෙ රතී කිය කිය..." සිරිනි යළිත් කීවාය...

"ඇත්තටම අපි දුවගෙන ආවෙ... රතී ඇවිල්ලා මොකක් හරි අසනීපයක් වෙලා කියලා..."

"ඇවිල්ලා බලනකොට රතියෙක් නෑ... ඔයා කෑගහනවා මහ හයියෙන් ඇඳේ වාඩිවෙලා..."

"වාඩිවෙලා...?"

"ඔව් වාඩිවෙලා තමයි..."

"මට නං කිසි දෙයක් මතක නෑ සමුදී..." තේජානි කෙඳිරුවාය... ඇයගේ මුළු සිතේම තිබුණේ ආරතීගේ අතුරුදන්වීමත්... ලේ ගොඩක් මැද ලියූ සංජු පව් යන්නත්ය... ඇය කියන දෙයම දූන් ලියා පෙන්වන්නටද පටන් ගත්තා වැනිය... ඇය ගියේ කොහිද...? ඇය තමාට දෙන්නේ නම් එසේ මෙසේ මානසික වදයක් නොවේ...

සියල්ලටමත් වඩා අර සංජය... ඔහු හා කථා කළ පසු ඇයගේ සිතේ දූන් ඇත්තේ පීඩාවක් පමණක් නොවේ... කේන්තියකි. තමාටත් වඩා ඔහු ඇය ගැන සෙවිය යුතුය...

"මං නං හොඳටම බය උනා..." ශාන්තා කීවාය... "මං හිතන්නේ මිස් මොකක් හරි හීනයක් දකින්න ඇති..."

"ඇස් පියාගෙන කෑ ගහනකොට මං දැනගත්තා... මට නං මොකක්ද කරන්නෙ කියලාවත් හිතාවටක් ආවේ නෑ... මට මතක් උනේ වතුර ටිකක් ගහන්න... බයටම ජෝගුවම හැළුවා ඔළුවට...

ගැහුවේ මාරි... ඔයාගේ කම්මුලට මොකක් හරි ක්‍රීම එකක්වත් ගාන්න වෙයි..." එක දිගටම කියාගෙන ගියේ සමුදිය.

තේජානි සමුදිගේ නෙත් දෙසම බලාගෙන ඇය කියන්න තේරුම් ගන්නට සිතුවාය... ඇයට කම්මුලට ගැසූ පහර තබා තවමත් ඇය සිටින්නී තෙත ඇඳුම පිටින්ම බවවත් වැටහුණේම නැත.

ඇයට ඒ කිසිවක්ම අවශ්‍ය වුයේද නැත... ඇයට අවශ්‍ය වූයේ මෙ ඇය සැබෑවක් වැනි සිහිනයක් දුටුවේ කිමදූයි සිතීමටය...

"අනේ සොරි ජානි... මං දැනං හිටියා එහෙම බය වෙච්ච කෙනෙක්ට එහෙම ගැහුවම හරි යනවා කියලා... වතුර දැම්මෙ නං සමුදි..." කීවේ මාරිය...

"ඇත්තටම රතී ආවෙ නැද්ද...?" එවර බොහෝ සන්සුන් අයුරින් තේජානි ඇසුවාය. එය සිහිනයක් විය හැකි බව... එදා රැයේ වැනිම සිහිනයක් බව ඇයට දැන් සිතිණ... මෙ සැබෑවක් වන් සිහින දකින්නට ගතහොත්... ආරතීගේ කිසිම තොරතුරක් නැතිවීම නිසා තමාගේ සිත දැන් පටලැවී තිබෙනවා වැනිය...

"නෑ ජානි... අපි ටික විතරයි ආවේ... මං ඇවිල්ලා බලලාත් ගියේ... ඔයාට ඊයේත් සනීප නැති උනා කියලා ඇත්තටම මයන්තයි කිව්වේ ඔයාව පොඩ්ඩක් බලන්න කියලා... සිරිනියි මායි දෙන්නම ඇවිල්ලා බැලුවා... එතකොට ඔයා හොඳට නිදි... ඉන් පස්සේ තමයි මේ ඔක්කොම... සමුදියි මාරියි එනකොට තමයි ඔයා බෙරිහන් දෙනවා ඇහිලා තියෙන්නේ... ඒ දෙන්නා කැගහගෙන ආවා ඔයාට වඩා..." එවර බොහෝ නිසන්සලේ කියූ රැක්මි සිනහසුණේ ආරතීගේ යහන මත වාඩිවෙමිනි.

"අනේ මන්දා රැක්මි... මට හිතෙන්නෙම රතී ආවා කියලා... ආවා විතරක් නං කමක් නෑ... නාන්නත් ගියා... ඉන් පස්සේ එයා නැති වෙලා..."

"ඔයා දකින්න ඇත්තේ හීනයක් ජානි... කවුරුවත් ආවෙ නෑ කියලා වොචර් අන්කල් කිව්වා..."

"ඔයා ඇහුවෙ ඇයි...?"

"මගේ යාළුවෙක් එතනට පාර්සලයක් දෙනවා කිව්වා... මං ගියා ඒක ඇවිල්ලාද කියලා බලන්න... රතී ආව නං මට කියනවනේ



ඒ වෙලාවෙ... යාළුවා ඇවිල්ලත් නෑ... රතී ආවද කියලා මං අහන්න ගියෙත් නෑ... ඒත් ඉතින් මෙ දවස්වල එයා ආවෙ නැති නිසා අන්කල් කියන්න තිබුණා ආවා නං..."

එයත් සැබෑවකි... මුරකරුට නොපෙනෙන්නට ආරතීට එන්නට නොහැකිය... එසේනම් අදත් ඇය දැක ඇත්තේ සිහිනයකි.

"ඔයා මෙකේ තනියම නිදාගන්න එපා... දැන් ඔයාගේ හිත එහෙ මෙහෙ වෙලා තියෙන වෙලාවෙ හුළඟක් පැන්නත් බය වෙයි... අපි දෙන්නගෙ කාමරේට එන්න..." එවර කීවේ මාරිය...

"අනේ මන්දා මේ රතී කියලා යන්න එපාද යන දිල්ලියක... මෙයා මෙච්චර මේ බයේ නැහෙද්දි නැත්තං අඩු ගාණේ කියන්න වත් එපාද කෝල් එකක් වත් දාලා..."

"වෙනදා මට කථා කරනවනේ සමුදි... එයාගේ සෙල් එකත් වැඩ කරන්නෙත් නෑ..." තේජානි එවර කීවේ වෙනත් යමක් කියාගත නොහැකි කමිනි... ඇය සංජය හා කථා කළ බව නම් මේ මිතුරියන්ට කියන්නට නුපුළුවන...

"හෙට කොහොමටත් කියමු අපි පොඩ්ඩක් හොයලා බලන්න කියලා... බැංකුවට ගියේ ගොඩක් සල්ලි ගන්නද...?" මාරි ඇසුවාය. "එහෙම නං ඉතින් ටිකක් හොයලා බලමු දැන් නං නේද රැක්මි...?" ඇය ඇසුවේ රැක්මිගෙනි.

"එහෙමටම ගන්නේ නෑ රතී නං..." තේජානි කියාගත්තාය... බොහෝ විට ආරතී මුදල් ගන්නේ සංජය හා කොහේ හෝ යන විටදී පමණකි... නැතහොත් බොතේජු යුවල බලන්නට යන ගමනකදීය... ඇය එතරම් මුදල් වියදම් කරන්නියකද නොවේ... සංජයට ඇයගේ මුදලක් අවශ්‍ය නැත...

එක් වරක් මයන්තගේ පියාට නම් ඇය සෑහෙන මුදලක් දී තිබිණ... මයන්ත ඒවා ඇයට තවමත් ගෙවන බව නම් තේජානි දන සිටියාය... ඇය කවදත් කාටත් උදව් පදව් කරන්නියකි.

"කොහොම උනත් කමක් නෑ... ඔයා පුළුවන් නං පහළට ගිහිල්ලා තේ ටිකක් බොන්න... මේ කේ තනියම ඉන්නත් එපා..."

"නෑ මං මෙහෙන්ම ඉන්නං..." තේජානි කීවාය... ඇයට ගෙවා ගත නොහැකි වනු ඇත්තේ රාත්‍රිය බව දැන් ඇයට සිතිණ... එසේ

වූයේ නම් ඇය සිතුවේ ශාන්තාගේ කාමරයට යන්නටය... එහිද ඇඳන් දෙකක් දමා තිබුණද එය වෙනත් කවරෙක් හෝ පාවිච්චි කළේම නැත... ශාන්තා කවදත් නිදාගත්තේ තනිවමය... ඒ ඇයට අවදි වීමේ වේලාවක් නොතිබුණ හෙයිනි.

"රට එහෙම නං මිස් එන්න මගේ කාමරේට... අද රතී මිස් නාවොත්..." ශාන්තා කීවාය... අනික් කාමර සියල්ලේම දෙදෙනා බැගින් සිටිති... රුක්මිගේ කාමරයේ අනික් යහන හිස් වුවද එය මත නැති යමක් නැත... ඇය ඇයගේ අඩුම කුඩුම පමණක් නොව සමහරවිට පත පොත ඇඳුම් පැළඳුම් පවා ඒ මත පටවන්නීය... එහෙයින් එය අස්පස් කිරීම නම් තරමක බැරෑරුම් කටයුත්තකි... තේජානිට ඇය කථා කළහොත් ඒ යහන අස්කරන්නට වන්නේ නම් ශාන්තාටමය... එය අස් කරනවාට වඩා තේජානි මිස්ට තමාගේ කාමරයේ හිස් යහනට එන්නැයි කීම පහසුය...

ශාන්තා එය කියද්දී නම් රුක්මිගේ කාමරයේ ඇඳ මතක්වූ තේජානිද හිස සැලුවාය... තමාට යහනක් අස්පස් කරගන්නට තබා සිතන්නටවත් පණක් කඳක් දැන් නැති ගාණය...

"එහෙනං ශාන්තා අනේ ජානි මිස්ට තේ එකක් ගෙනැත් දෙන්න..."

"නෑ මං එන්නං පහළට..." කියාගෙන ගිය තේජානි නැගිට ගත්තාය... ඇයගේ මුළු සියොලඟම වතුරෙන් තැහැවී තිබිණ... දැන් ඇයට ඇඳුමද වෙනස් කළ යුතුය... සියල්ලටම වඩා යහනද තෙමී ඇත... කොහොමටත් ඇයට අද නිදන්නට වෙන්නේ පහළ ශාන්තා සමගය...

දින දෙක තුනක් නැගණිය හා ගත කරන්නට ලැබෙන්නේ නම් ඇයට සිතිණ... එහෙත් එයටද දැන් හැකියාවක් නැත... හෙට නොව... අනිද්දාටත් ඉං අනිද්දාටත් ඇය අනිවාර්යයෙන්ම හවස ගීතයට දායක විය යුතුය... දැන් ආරතී නැති හෙයින් රුක්මී ගනු ඇත...

සමහරවිට ආරතීට මින්පසු මෙම නේවාසිකාගාරය තහනම් වේදැයි ඇය දන්නේ නැත... ඇයගේ සිතට දැණුනේ දුක මිශ්‍රිත පසුතැවිල්ලකි.

නාන කාමරයට ගිය ඇය එහි දොරගුළු ලෑවේද නැත... රතී හැබැහින් මෙන් වැටී සිටින අයුරු මතක්වෙද්දී ඇයගේ සියොළඟම යළිත් ලොමු දැහැගැන්විණ... ඇයට සිදුවූයේ කුමක්ද...? සංජයත් ඇය ගිය තැන ගැන නොදන්නේ නම්... අවිස්සාවේල්ලේ නිවසේ ඇය සිටින්නේ නම් සංජය වැන්නෙක් තමාට කථා කරනු ඇතැයි සිතිය නොහැකිය...

ඇය පහළට ගියේ මිතුරියන් සියලු දෙනාම එක්වී තේ බොන අයුරු දුටුවාය... ඇයද එතනට ගියාය... බොහෝ අය නිසන්සලේ තේ කෝප්පයක් බොන්නේ මේ මොහොතේ පමණි... ඉන්පසු අද ඇයට නැති වුවද, අන් කිහිප දෙනෙක්ටම හෝටලයේ සේවාවට යා යුතුය...

තේජානි එනු දුටු මිතුරියන්ට සැනසුමක් දැණිනි... ආරතී ගැන ඇය ඉදිරියේ කථා නොකරන්නට සියල්ලෝම කථා කරගත්තේ මින් මොහොතකට පෙරය... තේජානි දැන් ආරතී නිසා සැහෙන පීඩනයකට බඳුන්වී සිටින බව ඔවුන්ට වැටහී තිබුණ හෙයිනි.

අන් අය මෙන් නොව ආරතී කිසි කෙනෙක් හා වැඩි කථා බහක් නැතිව මෙන් දිවි ගෙවූ තරුණියකි... ඒ ඇයගේ අහංකාර කම නිසා නොවන බව නම් සියල්ලෝම දැන සිටියහ... එහෙත් තේජානි එයට වඩා වෙනස් තැනැත්තියක වූවාය... ඇය හා ආරතී අතර තිබුණේ මිතුරු දමක්ම නොවේ සොයුරු පෙමකි... එහෙත් ආරතී මෙන් නොව තේජානි සියල්ලන් හා විහිළු තහළුවෙන් කාලය ගත කළාය... ආරතී ගැන වුවද ඔවුන් දැන ගත්තේ තේජානි ගෙනි... ආරතී ගෙන් ඇයගේ නැගණියටද සැහෙන පිටුවහලක් ලැබෙන බව ඔවුන් දැන සිටියහ... ඒ නැගණියට ආරතීද අක්කා කෙනෙක් වී සිටියාය... එහෙයින්ම තේජානිට අන් අයට වඩා දුකක් දැනෙන බව නම් නොසිතාම නොහැකිය...

මයන්තද මේ දෙදෙනාටම එක්වී සිටිය තැනැත්තෙකි... ඔහුද අද ආරතී නාවා ගැන විශ්මයක් පළ කළේය... ආරතී මෙලෙස කිසි දිනෙක දිනකට වඩා පිට නවතින්නට නොසිතන බව ඔහු දැන සිටි හෙයිනි... ඇය කොහේ ගියද තේජානිට හෝ ඔහුට කෙලෙසක හෝ පණිවිඩයක් දෙන බව ඔහු අද පුහුණුවීම් වලදී දන්වා තිබිණ...

ආරතී ගැන අදත් බලා, සෙවිය යුතු බව ඔහු කීවේය... දැන් මේ තේජානි මෙතරම් බියවූ සිහිනය... එයට මයන්තත් ගැටී සිටිනු වැනිය... මයන්තට මෙය කියන්නට කවරෙක්වත් නොසිතුවේ ඔහු තවමත් පුහුණුවීම් වල යෙදී සිටින බව දන්නා හෙයිනි... පුහුණුවීම් අතරතුර පුද්ගලික කථා බස්වලට ඉඩ දෙන්නේම නැත...

කෙසේ වුවත් සියල්ලන්ගේම සිත් තුළ ඇතිවී තිබුණේ කිසියම් විපතක පෙර නිමිත්තක සඳහනක් බව කියන්නට කිසි කෙනෙක් උනන්දුවක් දැක්වූයේ නැත... ඔවුන් එය ඔවුනොවුන්ගේ සිත් තුළම සඟවා ගෙන සිටියහ.

තේජානිගේ සිත තරමක් සන්සුන්ව තිබුණද, ආරතී ගැන නොව දූන් මේ සැබෑවක්සේම ඇය දකින සිහිනයන් සිතින් මකා ගන්නට නොහැකි නිසාම කණස්සලු වෙමින් සිටියාය... ආරතී ගැන මෙලෙස වද විඳිමින් ඉන්නවාට වඩා ඇයගේ සිත තුළ ඇති සැකය මෙම සේවාවේ අයිතිකරුවන්ට දන්වා කුමක් හෝ පිළිසරණක් පැතීම හොඳ බව ඇය සිතුවේ තේ කෝප්පය තොල ගාද්දීමය... මිතුරියන්ගේ කිම කරන්දර වලට පිළිතුරු දුන්නද ඇයගේ සිතේ තිබුණේම මෙය ඉහළට දැන්වීම කරන්නේ කෙසේද යන පැණයය... එහිදී මිතුරිය අන්තිමට මුණ ගැසෙන්නට යන්නට සිතාගෙන සිටියේ සංජය නැමැත්තා බවද ඇයට කියන්නට සිදුවන බව ඇය හොඳින්ම දූන සිටියාය... එය ඇයට ඉදිරියේ කරදරයක් වේදෝ යන සැකයද ඇයගේ සිතේ පැළපදියම් වී තිබිණ... ඇයට වෙනත් රැකියාවක් සොයා ගැනීමට තරම් සිත් විය...

එහෙත් ඇයගේ සුදුසුකම් අනුව කළ හැකි රැකියාවක් නැත... ඇයගේ පරිගණක හැසිරවීම සාමාන්‍ය තත්ත්වයක තිබුණද රැකියාවක් සඳහා සහතිකයක් හෝ ඉදිරිපත් කළ හැකි අවස්ථාවක ඇය තවමත් සිටියේම නැත...

නැගණියගේ ඉගෙනීම කටයුතු සඳහාද විය හියදම් දැරිය යුතුය...

පළමුවරට ඇයගේ නෙතට ඇයගේ ජීවිතයේ නිස්සාරත්වය දැනී කඳුළක් නැග තිබිණ... මෙම රැකියාවෙන් ලබාගන්නා මුදලකින්ම මිසක නැගණියට උගන්වන්නට තරම් කිසිදු රැකියාවකට ඇය නුපුහුණු බව සිතෙද්දීය...

ඇයට නුපුහුණු තත්ත්වයෙන් හෝ රැකියාවකට යා යුතු වන්නේ නම් ඒ නිවසක මෙහෙකාර කමකටය... නැතහොත් ඇඟළුම ක්ෂේත්‍රයේය... ඒ කිසිදු තැනක මෙවන් ආරක්ෂාවක් මෙන්ම මෙවන් මුදලක්ද නොලැබෙන බව ඇය හොඳින්ම දූන සිටියාය...

ඇය යළිත් කාමරයට ආවේ කිසිදු තීරණයක් නොමැතිවමය...

වත්තක් වේවායි සිතමින් ඇය යළි ආරතීගේ දුරකථනයට ගත්තාය... නැත... එය ක්‍රියාවිරහිතව තිබිණ...



සංජයට යළිත් කථා කළයුතුද නැද්දැයි සිතා ගැනීමට ඇයට නොහැකි විය... ඇය තරමක් කල්පනා කළාය...

දෙවනුව ඇය සිතුවේ මෙය ගැන මයන්තට කියා පිළිසරණක් පැතීමටය... ඇය මයන්තගේ දුරකථන අංක එබුවාය... එය විසන්ධි කර තිබිණ...

මේ මොහොතේද මයන්ත එසේනම් ඇත්තේ පුහුණුවීමේය...

ඇය දකින්නට ඇත්තේ සිහිනයකි... එයින් ඇය ස්ථිර නිගමනයකට එළැඹුණාය.

යහනට පැමිණියද ඇයට එහි නිදාගන්නට හැකියාවක් නම් තිබුණේම නැත... එය තරමක් තෙම් තිබුණ බැවිනි... එහෙයින් ඇය කළේ පොතක්ද රැගෙන පහළ විසිත්ත කාමරයට පැමිණීමය...

★ ★ ★

දෙතුන් දෙනෙක් එහි තිබුණ රූපවාහිනිය ඉදිරියේ වාඩිවී එහි යන චිත්‍රපටියක් දෙස බලාගෙන සිටියහ... එය කාටූන් වර්ගයේ සිනමාවකි... මඳක් ඒ දෙස බලා සිටි තේජානි පොත දිග හැර ගනිමින් එවර පොත කියවන්නට වූවාය...

වෙනදා රූපවාහිනී සිනමාවකට වඩාත් කැමැත්තක් දක්වන තේජානි කවදාවත් නැති ලෙසකින් පොතක් දිගහැර ගනිද්දී මිතුරියන් උනුන් දෙස බැලුවද කිසිවක්ම කියන්නට නොසිතුවෝය... ඇය සමහරවිට පොත කියනවාට වඩා සිතනවා විය හැකිය ඔවුන්ට සිතුණු හෙයිනි.

අඩ පැයක් පමණ රූපවාහිනියට යොමුවී තිබුණු මිතුරියන්ගේ නෙත් යොමුවුණේ එවර පොත කියවීම පසෙක තබා එතනම නින්දට ගොස් සිටින තේජානි දෙසටය...

"ඔහොමම නිදාගනිද්දෙන්..." එය දුටු රුක්මී කීවාය... "ජානිට මේ දවස්වල තනියම නිසා නින්ද යන්නෙ නැතිවත් ඇති... පව්... රතී නැති එක නිසා එයා බයවෙලා තියෙන්නේ..."

"ඇත්තටම රතී මොකද...?"

"අරයත් එක්ක ගියාම... දන්නෙ නැද්ද... මං එහෙම එකෙක් එක්ක ගියානං... රතී වගේ වත් එන එකක් නෑ... ෆෝන් එකේ වත් එක්කම ඉන්නවා..." මාරි කීවේ එවර සියල්ලන්ගේ ම සිනහවත් පුබුදුවමිනි.

ඉන්පසු මිතුරියන් අතර නොයෙකුත් දෑ කථා වුණද, තේජානි නම් ඇහැරුණේම නැත... ඇය අවදිවූයේ තවත් පැයකට පමණ පසුය...

සිහිනයන්ගෙන් තොරවූ නින්දක් හෙයින්දෝ තේජානිට අවදිවෙද්දී සනීපයක් දැනිණ...

රුක්මි හා සමුදි සමග ශාන්තාද පසෙක වාඩිවී රූපවාහිනියේ එවර චිත්‍රපටියක් දමාගෙන බලමින් සිටියද අන් අය සිටියේ නැත...

"මිස් නැගිට්ටද...?" පළමුවම ඇය දෑස් හරිනු දකිද්දී ඇසුවේ ශාන්තාය... "මිස්ට දැන් තේ එකක් බොනවද...? නැත්තං කනවද...? අද මිස් දවාලෙත් කෑ වේ නෑ නේ..."

තමා දවාලටත් නොකෑ බව තේජානිට මතක් වූයේ දැන්ය... ඇය උදය ආහාරය ගත් පසු කෙළින්ම පැමිණ ආරතීගේ අල්මාරිය බැලුවා ඇයට මතකය... ඉන්පසු නිදාගත්තාය... සමහරවිට තමා සිහිනයක් දකින්නට ඇත්තේ පුහුණුවීම අවසාන වනවිට පමණ වෙලාවකදීය... එවිට දෙක වන්නට ඇත... ඒ මොහොතේදී ඇය තේ කෝප්පයක් බීවා මිස කිසිත් ආහාරයට ගත්තේද නැත...

"අද මං යන්නෙ නැහැනේ ශාන්තා... ගේන්න දැන් තේ කෝප්පයක්..."

"අනේ මිස් එහෙනං ඔක ටිකක් නවත්තන්න... මං ගිහිල්ලා අර මිස්ලටත් කෑම තියලා එන්නං ටක් ගාලා..." කියාගෙන ශාන්තා නැගිට්ටාය...

රුක්මි සිනමාව නිසල රුවකට ගෙනාවාය...

එය බලාගෙන සිටි තේජානි පසෙක බිත්ති ඔර්ලෝසුවේ වේලාව බැලුවාය... හයට කිට්ටුය... ඒ කියන්නේ අදත් ආරතීගේ ආගමනයක් නැති බවය... අනික් මිතුරියන්ට මෙන්ම ඇයටද දැන් ආරතීගේ නම කියන්නටද බියක් දැණුනු තරම්... සිහිනය මතක්වෙද්දී යළිත් ඇයගේ හිස කැක්කුමක් නැගිණ... සංජු පව්... ලේවලින් ලියා තිබූ වැකිය සිහිවෙද්දී ඇයගේ ගතම පණ නැති විය...



"මොකද ජානි...?" මිතුරියගේ වෙනස්වීම දකිද්දී රුක්මි ඇසුවාය... ඇය සිටියේ හොඳින් මිතුරිය දෙස බලමිනි...

"නෑ රුක්මි... ඇත්තටම මට තාමත් හිතාගන්න බෑ රතිට වෙලා තියෙන්නේ මොකක්ද කියලා...?"

රුක්මි සමුදි දෙස බැලුවේ තරමක් කණස්සල්ලකිනි... තේජානිට ආරතීගේ මතකය හැර වෙනත් යමක් මතකයට ගන්නට අපහසු සෙයකි...

"අරයට කථා කරා නං හරි..." සමුදි කීවේ ඉන්පසු යළි තේජානි දෙස බලමිනි...

"මං ළඟ නම්බර් එකක් නෑ..." එවර තේජානි කීවා නොවේ... කෙඳිරුවාය... ඇයට තමා ඒ අරයා හා කථා කළ බව කියන්නටද බියක් දැනීන... ඒවාත් මොවුන් සිහිනයක් බව පැවසුවහොත්... එයත් සිහිනයකැයි ඇයට සිතුණු තරම්... ඒ ආරතී අර තරම් ආදරය කළ... ඇයට ඒ තරම්ම ආදරය කරනවායැයි කියූ සංජය වන්නට නොහැකිය...

ආදරයක් ගැන කථා කරන්නට තරම් වත් ඔහුට හැකියාවක් තිබේදැයි ඇය සිතුවේ ඔහුගේ කටහඬේ ගාම්භීර කම ගැන මතක් වෙද්දීය... එය සිහිනයක් නම් මේ සියල්ලටම වඩා තමාට සතුටු විය හැකි බව තේජානි සිතුවාය...

"ඔයා ඉල්ලගෙන නැද්ද...?" රුක්මි ඇසුවාය.

ඇය හිස දෙපසට සැලුවාය... නැත... ඇය ඉල්ලාගෙන නැත... ඇය එය සොයාගත්තා පමණකි... එහෙත් එයද සිහිනයක් සේ සලකා බැහැර කරන්නට හැක්කේ නම්... කෙතරම් සිතට සැනසිල්ලක් දනේදැයි ඇයට මේ මිතුරියනට කිව නොහැකිය... ඔහුද ආරතී ගැන නොදන්නේ නම්... දැන් ඇය ඔහු කීවේ සත්‍යයක් නම්... යැයි සිතමින් සිටියාය... එය සත්‍යයක් නම් මිතුරියට වූ යේ කිමෙක්ද...?

"මොකක්ද බැලුවෙ...?" ඇය එවර මිතුරියන්ගෙන් ඇසුවේ මේ සියල්ලෙන්ම මිදී කුමක් හෝ කරන්නට ඇත්නම් යෙහෙකැයි යන හැඟිමෙන් යුතුවය...

"අපි බැලුවේ මේ හින්දි ෆිල්ම් එකක් ජානි... ටිකක් පරණ එකක්... ලව් ඉන් ටෝකියෝ කියලා... ලස්සණයි... සබ්ටයිටල්ස් තියෙනවා..." මිතුරිය කීවේ තේජානි බොහෝ විට එවන් චිත්‍රපටි

බැලීමේ රුචියක් තිබෙන්නියක හෙයිනි... එහෙත් මේ මොහොතේදී නම් තේජානිට එවැන්නක් බලන්නට හෝ සිතේ ආශාවක් නැගුණේම නැත...

එහෙයින් තේ කෝප්පයක් හෝ බොන්නට යන්නට සිතමින් ඇය වාඩිවී සිටි තැනින් නැගිට්ටාය... ඇයගේ උකුළ උඩ තිබුණු පොත බිම වැටිණ... ඇය පොත අහුලාගෙන මිතුරියන් දෙස යළි බැලුවේ සබකෝලී බවකිනි.

"හොඳටම මට නින්ද ගිහිල්ලා..." ඇය කීවේ ඒ සබකෝලී බවින් යුතු ස්වරයෙනි... මිතුරියන් දෙදෙනාටද සිනහවක් පහළ විය...

තේ කෝප්පය බිමේ අදහස මඳකට නවතා ඇය එවර මිතුරියන් සිටි සැටිය දෙසට ගියාය...

"අපි දැක්කා... ඒත් ඉතින් අපි ඔයාව නැගිට්ටවන්න හිතුවේ නෑ..." රුක්මි කීවේ ඇය ළඟින්ම වාඩිවූ තේජානිටය... තේජානි බොහෝ අසරණ ලීලාවකින් රුක්මි දෙස බැලුවාය... මෙතෙක්ම ඇය ඇයගේ සිහිවිලි නම් බෙදා හදාගත්තේ ආරතී සමගිනි... දූන් ඇයට ඇයගේ සිහිවිලි බෙදා හදාගන්නට කෙනෙක් ඇත්තේම නැත... මෙම මිතුරියන් නරකවා නොවේ... එහෙත් එහි වෙනසක් ඇත...

ආරතී මෙවන් රැකියාවක යෙදුණද හොඳ දෙමාපියන් දෙදෙනෙකුගේ දියණියකි... ඇය ඉගෙනගෙන ඇත... ආටෝපයන්ගෙන් තොරය... බොහෝ දේවල් ගැන සිතන්නේ මධ්‍යස්ථ අන්දමිනි... කිසිවෙක්ම හා කෝප ගන්නේද නැත... ඕපාදූප ලෙස අන් අයගේ වැරදි වෙනත් අය හා පවසන්නේද නැත... මෙම ක්ෂේත්‍රයේ අයගේ නැති බොහෝ ගතිගුණ ඇයට තිබිණ... ඇය ඇසුරු කරද්දී තමාට අමතක කළ නොහැක්කේද ඒවා බව දූන් තේජානි සිතමින් සිටියාය... සංජය වුවද ඇයගේ රූමත්කම නිසා ඇයව ළං කර ගත් නමුත් පසුව පසුව ඇය හා එක්වෙන්නට සිතන්නට ඇත්තේද එම ගතිගුණ නිසාම විය හැකිය...

"මට මේ දවස්වල නින්ද යන්නෙ නෑ රුක්මි ඇත්තටම... හරිම වැඩක් මේ රතී ගැන මගේ හිතේ තියෙන්නේ... වෙනදා එයා මෙහෙම කථා නොකර ඉන්නෙ නෑ නේ..."

"ඒක නං ඇත්ත... මයන්තත් කිව්වා... අසනීපයක් උනත් පණිවිඩයක් දෙන්න පුළුවන් නේ..."





"මට පුදුම බයක් දැනෙන්නේ... මොනවද මේ මං දකින හීන... හැබෑහින්ම වගේ නේ... ඒකත් මට බයයි... ඇත්තටම රතීට..." තේජානිට වෙනත් කිසිවක්ම කියාගත නොහැකි විය... ඇයගේ නෙත්වල කඳුළු පිරිණ...

රුක්මි තේජානිගේ උරහිසින් අල්වා ඇය ළඟට කර ගත්තාය.

"අඬන්න එපා ජානි... අපි තව දවසක් දෙකක් බලමු... අරයගේ ගෙදරට වෙලා ඉන්නවද දන්නෙ නෑ නේ මොකක් හරි හේතුවක් නිසා..."

ඇයට ඒ මොහොතේදී වුවද සංජය මිතුරිය ගැන සිදු කරුණු මේ මිතුරිය හා කියන්නට සිතුණේ නැත... ඔහු ඇයට බොරුවක් කළ බව දැනගතහොත් රුක්මි සමුදි මෙන් නොව... සංජයට ඇස් ගැසූ වෙනත් දෙතුන් දෙනෙක්ම මිතුරියට සිනහසෙන්නට බලා සිටින බව ඇයට නොරහසක් විය...

සියල්ලටමත් වඩා ඇයට දූන් බියක් දැනී තිබුණේ එයද ඇය දුටු සිහිනයක් දෝයි යන හැඟීමෙනි... ඒනිසාම එවැන්නක් මයන්තට වුවද කියන්නට ඇය පැකිළෙමින් සිටියාය...

අන් අයගෙන් මෙන් නොව... මං ඔයාට කථා කරාදැයි... ඔහුගෙන් අසන්නට ඇයට හැකියාවක් නැති හෙයිනි...

...ඔයා තේජානිට කථා කරාද... සැහැල්ලුවෙන් සංජය නැමැත්තාගෙන් අසන්නට මයන්තට වුවද හැකියාවක් ඇතැයි සිතනු නොහැකිය...

"රතී බබෙක් නෙවෙයි නේ ජානි... එයා හොඳට ඇති ඉන්න තැනක... මොකක් හරි නිසා තමයි ඔයාටත් කථා කරන්නෙ නැත්තෙ නං..." කීවේ සමුදිය...

මේ සියල්ලම විශ්වාස කරනවා විනා කුමක් විශ්වාස කරන්නදැයි තේජානිට දූන් සිතීමේ හැකියාවක් නැත... ඇයට සිහිනයක් විශ්වාස කරන්නටද නොහැකිය... සංජය විශ්වාසයට ගන්නටද නොහැකිය... මයන්ත වුවද... ඇය ඔහු ආවා දුටුවේද සැබෑහින්ම මෙනි... ඒත්... ඒත් ඔහු ඇවිත් නැත...

මේ සියල්ලම දිගු සිහිනයක් යැයි ඇයට සිතෙමින් තිබිණ... මේලෙස දිගින් දිගට වන්නට ගියහොත් තමාට මනෝ වෛද්‍යවරිය

මුණ ගැසෙන්නට යන්නට සිදුවන බව ඇය සිතුවාය... බොහෝ රහසිගත අයුරින් මෙම සේවාවට අදාල වෛද්‍යවරුන් සමූහයක්ද සිටින බව ඇය දැන සිටියාය... මෙතෙක්ම මේ ළඟ සිටි සාමාන්‍ය වෛද්‍යවරිය වෙත මිස වෙනත් අය වෙත යන්නට නම් ආරතීට හෝ ඇයට මෙන්ම මෙම නේවාසිකාගාරයේ බොහෝ දෙනෙකුට නම් සිදුවූයේම නැත...

ශාන්තා පැමිණියේ තේ කෝප්ප තුනක් සමග කුමක් හෝ කැවිල්ලක්ද තබාගෙනය...

"ඇයි මිස්...?" ඇය රුක්මිගෙන් ඇසුවේ තේජානිගේ දෑස්වල ඇති කඳුළු ගැන විය යුතුය...

"මොකුත් නෑ ශාන්තා... රතී මිස් ගැන කියලා..." සමුදි කීවාය...

"අර මිස්ලා විතරයි නේ යන්නෙ.. මං මිස්ලා දෙන්නටත් තේ ගෙනාවා.. මිස්ලාට ප්‍රැක්ටිස් කරලා ඇවිල්ලා කන්න පුළුවන්නේ..."

කඳුළු පිසලාගත් තේජානි ශාන්තා පසෙක තැබූ බන්දේසියෙන් පුහුල් දෝසි කැබැල්ලක් ගත්තාය...

"කවුද ශාන්තා පුහුල් දෝසි ගෙනාවෙ...?" අසමින්ම රුක්මිද එයින් කැබැල්ලක් ගත්තාය...

"මං ගෙන්න ගත්තා මිස්... හරස් පාරට කිට්ටු වෙන්න අළුත් කඩයක් දාලා.. එතන මේවා රසයි කියලා වොචර් අයියා කිව්වෙ... මං ඉතින් ගෙන්න ගත්තා..."

"උඹ වොචර් අයියාට නං කිට්ටු වෙනවා වැඩියි..." විහිළුවක් කරමින් සමුදිද බන්දේසියට අත යැව්වාය...

"දැන් ප්‍රැක්ටිස් කරනවද...?" තේජානි ඇසුවේ සමුදි දෙස බලමිනි... "මයන්තලා යන්න ඕන නේද අරකට...?"

"අපිට එන්නේ වන් මැන් ෂෝ එ.. එයාට අද පුළුවන් කිව්වළු හතේ ඉඳන් නමේ වෙනකතුයි.. හෙට උදෙයි එන්න... එතකොට හෙටයි අනිද්දා හවසයි මයන්තලාට නිවාඩු... ඒ ගොල්ල අපිට සපෝට් කරයි..."

"මං සින්දුව බලාගත්තෙත් නෑ..."

"පරණ එකක් වත් කියමු කියලා මිස් කිව්වා... මිස්ලටත් පුදුමයි මේ වැඩේ..."

"ඒ ගොල්ලොත් බය ඇති අරයට කථාකරන්න..."

"රතී මොකටද මන්දා ඔච්චර නම්බර් වන් එකෙක් හොයා ගත්තේ...?" එවර සමුදි ශාන්තාගේ මුවට ද සිනහවක් නැංවූවාය...

තේජානිගේ මුවට සිනහවක් නැගුණද එය බොහෝ දුකින් මෙන් වියැකී යද්දී අනික් තිදෙනගේ සිනහවන්ද ඒ අනුවම මෙන් වියැකී යන්නට විය...

"අපි කවුරුත් කැමැතියි නේ නම්බර් වන් කෙනෙක් එනවනං... එන්නැති එක නේ වැඩේ..." රුක්මි කීවාය...

"එන්නැති එකමයි හොඳ..." එවර කේන්තියෙන් මෙන් කීවේ තේජානිය... ඇයට සත්‍යය තත්ත්වය නම් කීමට නොහැකිය... "දැන් ඔච්චර අපි නැගෙනවා රතී හොය හොය... එයාට බැරිද හොයලා බලන්න... ලේසියෙන්ම පුළුවන් නේ...?"

"ජානි... සමහරවිට මැන් ළඟ වෙන්න ඇති රතියා ඉන්නෙ... ඉතින් මැන් ට ඕන නෑ නේ එයා ගැන හොයවන්න..."

"නැත්තං ඉතින් රතී මැන්ට කෝල් කරනවා ඇති ඉන්න තැනක ඉඳගෙන... එයාට තේරෙන්නෙ නෑ නේ එතකොට මෙහේ ගිනි පත්තු වෙලා බව..."

ඒ දෙකම වැරදි බව කියන්නට නම් තේජානි නොසිතුවාය... එහෙත් එක් දෙයක් ඇයටද සිතිණ... සංජය තමාට බොරුවක් කළාද යන්නය... ආරතී ඔහු ළඟ සිටියදී ඔහු මෙලෙස දුරකථනයෙන් කථා කර රඟපෑමක් කළේ නම් ඒ ඇයව ඔහු ළඟම රන්දා ගැනීමේ චේතනාවෙන් විය යුතුය ඇයට සිතෙද්දීය... එය එලෙස වන්නේ නම් ඔහු හා අනෙක් අය කෙලෙසක සිතුවද තමා තරම් සතුටුවෙන තැනැත්තියක නැති බව ඇයට මේ මොහොතේදී කිව හැකි නොවිය...

ඇයට අවශ්‍ය වූයේ නම්බර් වන් කෙනෙක් සොයා ගැනීම නොව නැඟණියට හොඳින් උගන්වා ගැනීමය... එයද ඇයට අනික් අයට කියන්නට තරම් අවශ්‍යතාවයක් තිබුණේ නැත...

කෙසේ වූවත් දිනක් දෙකක් ආරතී නාවායැයි කියා තමා බිය වෙන්නට අවශ්‍ය නැත... කිච්චාක් මෙන් ආරතී යනු ළදැරියක නොවේ...

"තව ටිකකින් යන්නත් එපැයි..." කියමින් එවර සමුදි තේ කෝප්පය ගත්තාය...

"අපි එහෙනං මෙකේ ඉතුරු ටික... හෙට බලමු ශාන්තා... දැන් ටිකක් නිදහසේ ඇඳ පැළඳ ගෙන යනකොට වැඩ හරි..." කියාගෙනම රුක්මි නැගිට ගත්තාය...

"ඔයාත් එන්න ජානි..." ඇය කීවේ තේ කෝප්පය සෙමින් තොල ගාන තේජානි දෙස බලමිනි...

"මං පහළ ඔයාගේ කාමරේ මගේ ඇඳුං ටික තියලා යන්නං..." තේජානි කීවේ සැබැවින්ම ඇයට කාමරයට ඇතුල් වෙන්නට නොව එහි නිදාගැන්මට බියක් දැණුනු හෙයිනි... අද නම් කෙසේවත් නිදාගත නොහැකිය... වෙනදා නම් ඇය ආරතීගේ යහනේ වුවද නිදාගන්නට නොපැකිලෙන්නීය... දැන් මෙ සංජු පව් කිය කියා තමාට වද දෙන ආරතිය තමා යහනින් පෙරළා දමා සංජු පව් කියා සිනැහෙන්නට ගතහොත්... සංජු නොව... ඇයට කියන්නට සිදුවනු ඇත්තේ ආරතීට පව් යනුවෙනි. එසේ වූයේ නම් තමා අතට අසුවන යමකින් ආරතීට දමා ගසන බව ඇයටම සහතික කරගත් හෙයිනි.

"ඒක හොඳයි... නැත්තං අපිටත් නිදාගන්න නැතිවෙයි මෙයා මර හඬ දිදී රති මිස්ට කෑගහන කොට... නැද්ද ශාන්තා...?" රුක්මි ඇසුවේ සංයුක්ත නැටිය අතට ගනිමිනි.

"මටත් නිදාගන්න නැතිවෙයිද මිස්...?" ශාන්තා ඇසුවේ සිනහසෙමිනි.

තේජානිගේ දෑස් විසල් විය... සැබැවින්ම තමා ශාන්තාගේ නින්ද නැසුවහොත්...

තමා නොවේ... ආරතී... ඇයට ඒ සිහිනය පහළදීත් පෙනුනහොත්...

"අම්මෝ...ඕ...ඕ... මෙ බලන්න ජානි මිස්ට විහිළුවක්වත් තේරෙන්නේ නැති වෙලානේ..." ශාන්තා කීවේ සැබැවින්ම තේජානිට සිතුණු සිතුම ඇය සිතාගත් හෙයිනි. "මං විහිළුවක් කරේ මිස්... කාමරේ නිදාගන්න එන්න... ඒක කෝකටත් හොඳයි... කැගැහුවත් මං ළඟ නේ.. නැත්තං ඉතින් තට්ටු දෙකක් නගිනකොට අපේ හොඳ පණ යයි..."

"ශාන්තා දන්නවද...? මේකට ලිෆ්ට් එකක් දාන්න යනවළු..."

"කවුද කිව්වෙ...?" එවර නම් තේජානි ඇසුවේ පුදුමයෙන් යුතුවය...



"ආරංචියක් විතරයි... අර ඔයා දැකලා තියෙනවද... එක දිගටම වැඩ කරන ලිෆ්ට් වගයක්... ඒක කතුරු ඔංචිල්ලාව වගේ කැරකැවෙන්නෙ... එනකොටම නගින්න ඕනළු..."

"ඔයා කියන්නේ රනින් ස්ටෙයා වේ එකක්ද...?" ඇසුවේ රුක්මිය...

"නෑ නෑ... ඒ වගේ එකක් තියෙනවළු... විදුලි බල මංඩලේ කොළඹ... මට කිව්වේ වසා... එයාගේ කවුද යාළුවෙක් ඉන්න අවසක ගිහිල්ලා... මට ඇවිල්ලා විස්තර කරා... මං හිතන්නේ ඒ වගේ එකක්..."

"වෙලාවක ගිහිල්ලා බලමු..." තේජානි එවර කීවේ සැබැවින් ආරතී ගැනද අමතක වෙද්දීය... "කොයිකටත් එතකොට අපිට ටිකක් ප්‍රැක්ටිස් එකක් තියෙයි නේ... නේද...?" ඇය ඇසුවේ ඇයගේ වෙනදා සැහැල්ලු ස්වරයෙනි...

මිතුරියෝ සැහැල්ලුවෙන් සිනැහෙමින්ම හිස් සැලුවේ තේජානිගේ බැරෑරුම් බව පහව් ගොස් ඇති බව සිතෙද්දීය...

"එකක් තියෙනවා ඒකේ දෙන්නටයි එ යන්න පුළුවන්..."

"එහෙනං අපි දෙන්නා යං රුක්මි... සමුදිට වෙන කවුරු හරි හොයාගන්න පුළුවන් නේ..."

"වසාට කියමු... එයා නේ විස්තරේ දන්නේ... ඒ දෙන්නා නැගලා ගියයින් පස්සේ අපි දෙන්නට ගියෑකි..." රුක්මි කීවාය...

"ශාන්තා... ශාන්තාට මොකක්ද වෙන්නේ එතකොට..."

"මිස්ලා ඒකේ ගිහිල්ලා පුරුදු වෙලා මෙකේ හයි කරායින් පස්සේ මට උගන්නන්නකෝ... එතකොට මට මිස්ලා කාගෙ හරි එක්ක යන්න එන්න බැරියැයි උඩට පහළට..." තරප්පු පෙළ දෙසට ගිය මිතුරියන්ගේ සිනහවක් නංවා කියූ ශාන්තා බන්දේසිය එක්තැන් කරගෙන එය අතින් රැගෙන මුළුතැන් ගෙය දෙසට යන්නට හැරුණාය...

'මොකද උනේ ජානියො... මං ආවා කියලත් කිව්වළු... උඹට පිස්සුද...' මයන්තගේ පණිවිඩයක් ඇවිත් තිබුණේ තේජානිගේ දුරකථනයටය... දැන් ඔහු යන්නට පිටත් වෙන වෙලාව විය හැකිය... දුරකථනය උඩ දමා ගිය හෙයින් ඔහුගේ දුරකථන නාදයට තමාගෙන් පිළිතුරක් නැතිවූ හෙයින් කෙටි පණිවිඩයක් එව්වා විය හැකිය...

ඇය කිසිවක්ම නොසිතා මයන්තට ගත්තාය.

"හලෝ... මොකද ජානි...?" මයන්තගේ කටහඬ ආවේය... ඔහුගේ ස්වරයේ විහිළුවක් තිබිණ... තමා දුටු සිහිනය කියූ පසු ඒ විහිළුව ඔහුගෙන් පලවා හැරෙන බව ඇය දැන ගෙන සිටියාය... සිහින යනු කිසියම් අයුරකින් සැබෑවෙන යම් දෙයක් විය හැකි බව ඔහු ආරතීට හා ඇයට කීවේ එවන් පොතක් ගෙනැවිත් කියවමින් සිටි දිනයකය... දවසේත්ම දිය යුතුය කියමින් ඔහු එය පුහුණුවීම් ශාලාවටද ගෙන ආවේය... ආරතී එය පසුව ගෙන්වා ගත් බව නම් ඇයට මතකය...

ඒ පොත පහළ තිබෙන්නට පිළිවන...

එයද රැගෙන කියවිය යුතුය... තේජානි සිතුවේ දුරකථනයට කථා කරන අතරමය...

"මයන්ත... මං ආයේ රතී දැක්කනේ..." ඇය පටන් ගත්තාය... ඇයගේ සිහිනය ඇසෙද්දී මයන්තගේද ලොමු දැහැගැන්වී තිබිණ...

ආරතී කොහේ හෝ සඟවා ගෙනද... එයට සංජය සම්බන්ධ නැති නිසා ඇය සංජු පව් කියන්නේද...? නැතහොත් සම්බන්ධව සිටින නිසා සංජු පව් කියන්නේද...? ඔහුටද තේජානිට සිතුණු සිතිවිල්ලම සිතුණේය... සම්බන්ධ වූවද නොවූවද සංජයට ආරතීගේ ප්‍රශ්නයකින් දැත සෝදා ගැනීමට නුපුළුවන... එහෙත් සංජය මෙයට සැක කරන බව කියන්නේ කවුද...? තේජානි එලෙස කියතැයි සිතන්නට මයන්ත මැළිවිය... කිව යුතුද නැත... ආරතී යමක් කරගත්තේ නම් කරගත්තේ ඇයගේ සම්පූර්ණ සහයෝගයද ඇතිවය... එහෙත් තේජානි... ඇය නැඟණිය ගැන සිතිය යුතුය...

තමාට නොසරිලන තරුණියක පසෙකට කරන අන්දම සංජය නොදන්නේ යැයි සිතිය නොහැකිය... රූමත් කඩවසම් තරුණියන්ගේ සිහින කුමාරයෙක් මෙන් වූවාට ඔහුගේ වැඩ කිඩද මයන්තගේ මිතුරා ළඟ තිබෙන බව ඔහු දන්නේය... එහෙත් ආරතී එලෙස යන්නේ නම් ඒවා ඇයට වූවද නොපෙන්වන්නට මයන්ත සිතට ගෙන සිටියේය...

ඔහුට ඔහුගේ පියාගේ හෝ වට පිට අයගේ ගෙවල් දොරවල් නැති කරලීමට අවශ්‍යතාවයක් නොවිණ... ඔවුන් සිටියේ සැබැවින්ම අනාවසර වත්තකය... මෙතෙක්ම ඒවායේ සිටින්නවුන් කරදයකින් තොරව සිටින්නේ උඩ සිටින දෙවිවරුන්ගේ නොව, සංජය වැනි මිනිසුන්ගේ තරමක දේවත්වයක් එයට එක්වී තිබුණ බැවිනි... එය නැති කරගන්නට තමාගේ එක් වදනක් හෝ පිටවූයේ නම්...



මයන්තගේ කම්පනය මයන්ත නවතා ගත්තේය... කළ යුතු දෙය වන්නේ තේජානි දකින මේ සිහිනයන්ගෙන් ඇයව මුදවා ගැනීමය...

මෙම සිහින වල කුමක් හෝ තිබෙන බව ඔහුට සිතිණ... ඔහු මිථ්‍යා විශ්වාස අතර සැරිසරන්නෙක් නොවේ... එහෙත් බොහෝ අය ගිනවතුන්ට එලෙස කියන බව ඔහු දන්නේය...

එහි එක්තරා බියකරු දෙයක් ඇත... ඔහුට තේජානිට පවසන්නට නොහැකිම දෙයද වූයේ එයය... එලෙස සිහිනයෙන් පෙනෙන්නට නම් ඔහු හෝ ඇය මෙලොවින් වෙන්වී සිටිය යුතුය...

හෙට දිනයේ ආරතී නාවහොත් ආරක්ෂකයින්ට එය පවසන්නට ඔහු තීරණයක් ගත්තේය... සිහිනයක් නිසා එලෙස කළේයැයි කිව යුතු නැත... ආරතී මෙතෙක් දවස් නොආ නිසා...

අවසන් වරට හමුවුණේ කවුදැයි අසද්දී...

එවර මයන්තගේ සිත තරමක් පසුබැවේය... එය කිව යුත්තේ තේජානිය...

ඔහු සිතුවේ එවර පුද්ගලිකව එය ගැන ඔහුගේ මිතුරු ආරක්ෂකයාට කීමටය... ඔහු කවරෙක්වත් කරදරයේ නොදමා ආරතී ගැන සොයවනු ඇත...

එයට පළමු ආරතීගේ නිවසට කෙනෙක් යවා ඇය එන්නේදැයි දැන ගත යුතුය...

ඔහු යන අතරේම පියාට ගත්තේය...

පියා ඉන්පසු දිනයේ එහි යන බව දැනුම් දුන්නේය... එහි ගොස් එතනෙක් කිසිවක් කරන්නට නොහැකිය... ඔහු දුරකථනය විසන්ධි කර ඔහුගේ සේවාව ගැන සිතන්නට වන්නේය...

රාත්‍රියේ පුහුණුවීම් නිමවී ආ තේජානි ශාන්තාගේ කාමරයේ නිදාගත්තාය... ඇයට නිදි පෙත්තක් දුන්නේ රුක්මිගෙන් මෙය ගැන දැනගත් වෛද්‍යවරියය... නිදි පෙත්තේ පිහිටෙන් තේජානිට හොඳ නින්දක් ලැබිණ...

ඒ ගැන ඇයටත් වඩා සතුටු වූයේ ශෙනාලිය... විශේෂයක් නොමැතිව මෙවන් කටයුත්තක යෙදීමට කිසිවෙකුටත් නොහැකි බව දන්නා හෙයිනි...

kathapothak.blogspot.com

# 14 බ්‍රහස්පතින්දා

**ඉන්පසු** දිනයම මෙන් ඔවුන්ට පුහුණුවීම තිබිණ...

එහෙයින්ම තේජානිට මිතුරියගේ සිතිවිල්ලෙන් ඉවත්ව එය හොඳින් පුහුණුවිය යුතු විය... දැන් ආරතී නොමැතිව විශේෂාංග කිහිපයක් ඉදිරිපත් කරන්නට සිදුවී තිබෙන බැවිනි...

ආරතී සිකුරාදා උදයේ ආවහොත් පුහුණුවීමකින් තොරව හෝ ඇයව වේදිකාවට ගන්නැයි ෂෙනාලි කියා සිටියාය... ඇයගේ රූමත් කම හා ගායනය නිසා පුහුණුවීමක් නැතිව වුවද ඇයගේ දර්ශනයෙන් වුවද නරඹන්නන් කුල්මත් වන බැවිනි...

කෙසේ වුවත් මයන්ත එදා හවස් වෙද්දී තීරණයක් ගත්තේය... ආරතී ගමට ගියේදැයි සෙවීමටය... නැතහොත් ආරතී නොමැතිව තේජානිද මහසින් වැටෙන බව ඔහුට සිතුණ හෙයිනි... ඇය සිහිනයෙන් ආරතී දකිද්දී...

එහෙයින්ම ඉන්පසුදා මයන්තගේ පියා ආරතීගේ ගමට යන බව මයන්ත දැන්වූයෙන් තේජානිගේ සිත තරමකට සැහැල්ලුවිය... තරමකට නොවේ... බොහෝ සැහැල්ලු විය... ඇය එහේ සිටින්නේ නම්... යන සැකය තේජානිගේ සිත පෙළූ හෙයිනි...

ඕනෑම කෙනෙකුට සිත සනසා ගත හැක්කේ තමාගේ සමීපතයන් අතර පමණක්ම බව ඇයගේ සිතටද සිතෙද්දීය...

එහෙයින්ම තේජානි පසුගිය දින කිහිපයේදීට වඩා හොඳින් පුහුණුවීම වල යෙදුණාය...

# 15 සිකුරාදා

**හවස** දැනගත හැකියැයි සිතා සිටියද..., නැත... පියාගෙන් මයන්තට හෝ දුරකථන පණිවිඩයක් ආවේ නැත...

ඔවුන් එදා ආරතී නොමැතිව ඔවුන්ගේ විශේෂාංග ඉදිරිපත් කළහ... විදේශික මිතුරන්ද පැමිණ සිටි හෙයින් ඔවුන් බොහෝ විනැකමින් ඒ සියල්ල ඉදිරිපත් කළහ...

මැඩම්ගේ සිත සතුටු කිරීමෙන් බොහෝ දේ ලබාගත හැකිය... ආරතී නැති අඩුව බොහෝ අයට දැණුනද..., කිසිවක්ම දැන් කරන්නට හැකියාවක් තිබුණේ නැත...

එහෙත් ඒ අඩුව ආරතීගෙන් විශේෂාංගයක් ඉල්වා සිටි මැඩම්ට වැටහිණ...

ආරතී හා තේජානි එක්වූ කළ බොහෝ අය එම රංගනයට හා ගීතවලට කැමැත්තෙන් කැගසනු ඇය අසා තිබිණ... අද තේජානිට හරි හමන් සහකාරියක හෝ සහකරුවෙකු ලැබී තිබුණේ නැත...

ඇය මේ පිළිබඳව විමසන්නට සිතුවේ ආරතී නැමැත්තියට අසනීපයක්දැයි දැනගන්නටද සිතමිනි... එසේනම් ඇයට විශේෂ වෛද්‍ය සේවාවක් හෝ දිය යුතුය... ඇය සිතාගත්තීය...

එහෙයින්ම ඇය ඒ පිළිබඳව ෂෙනාලි හා කිසියම් සාකච්ඡාවක් දියත් කළ අතර, සිදුවූ සියල්ල මයන්තට ඒ මොහොතේම වාර්තාවක් සේ ලැබිණ...

පියා ආවේද එදා රැයේය... පියාගේ දුරකථනයට කුමක් හෝ සිදුවී ඇත... ඔහු ඒ දෙසට යන ගමනට කිසියම් දෙදෙනෙකුගේ කුලී ගමනක්ද එක්වී තිබිණ...

ඒවා කියන්නට සිතමින් දුරකථනය පණගන්වද්දී එයට කුමක් හෝ වී ඇති බව පියාට දැණින... අතරමගින් කථා කරන්නට සිතුවද, මෙයට කුලී ගමනක්ද සම්බන්ධ වූ නිසා එලෙස කරන්නට හැකියාවක් ඔහුට ලැබී තිබුණේ නැත...

සවස ආ විගසින්ම මයන්තට ගත් නමුත් ඒ මොහොතේ මයන්තද සිටියේ හෝටලයයේය... ඔහුගේ දුරකථනය ඔහු නවත්වා දමා තිබිණ...

මයන්ත පියා එයට කථා කළ බව දුටුවේ රැයේ නේවාසිකාගාරයට ආ පසුය... ඒ වෙද්දී දොළහද පසුවී තිබිණ...

ඒ රෑ මැදියමේ පියාගේ නින්ද කඩන්නට නොසිතූ මයන්ත උදයේම මෙන් පියාට ගත්තේය... ඒ මොහොතේදීම ආරක්ෂක සේවාවට ආරතී ගැන විස්තරය මැඩම දෙමින් තිබෙන බව ඔහු දැන සිටියේ නැත...

"එහේ ගිහිල්ලා නෑ පුතා මේ ළමයා..." පියා කියද්දී මයන්තට සැබැවින්ම මරු කටට ළං වුණාක් වැනි හැඟීමක් දැණින...

"තාත්තාට හොඳටම විශ්වාසද...?"

"ඔව්... මං ඉන්න තැන දන්නවා කිව්වම ඒ තාත්තාට දැණුනු සන්තෝසෙට මට හිතුණා මේ ළමයා ඉන්න තැනකින් එක්කං ගිහිල්ලා පෙන්නන්න තරං..." පියා කීවේය. "දානෙ දීලා තියෙන්නෙත් ඒ මනුස්සයා දැනගෙන නෙවෙයි... පස්සෙ ඒ මනුස්සයා දැනගෙන තියෙන්නේ දානයක් දීලා තියෙන්නේ එයාගේ දුවට බව..." පියා තවත් වාර්තාවක් එක් කළේය...

මයන්ත සුසුම සිතටම තබා ගත්තේය... තමාට තිබුණේ එදා ගොස් එම පියා සමුවීමටය... වටපිටාවෙන් කරුණු අසන්නට ගිය තමා තරම් මෝඩයෙක් නැති බව ඔහුට සිතුණේ දැන්ය...

දැන් ඒ සියල්ල සිදුවී හමාරය... ඔහුට ආරතීගේ පියා ගැනද දැන් දුකක් දැණින... මේ මොහොතේ ඇය අතුරුදන්වී සිටින්නේ යැයි



සිතුවහොත් ඒ පියාගේ සිතට එන හැඟීම ගැන ඔහුට සිතන්නට හොඳින්ම හැකියාවක් තිබිණ...

දරුවෙක්ට ඇති ආදරයේ හැඟීම වඩාත් දැනෙන්නේ දරුවෙක් වෙන්වූ පසුවය...

කොයි තාත්තාටත් ඒ හැඟීම දැනෙනු ඇත... මයන්ත සුසුම දිගේම පා කළේය... මේ තමාගේ ම පියා නොවුණාට හැදූ වැඩූ නිසාම තමා ගැන මෙම පියා සොයන්නේ බොහෝ උවමනාවෙන් බව දන්නා හෙයිනි...

"මෙක දැන් ජානි අක්කට කියන්නෙ කොහොමද කියලා මං කල්පනා කළේ... එයා හිතාගෙනම හිටියේ මෙයා එහේ ඇති කියලා..." මයන්ත කීවේ බොහෝ කණස්සල්ලෙනි...

"නෑ පුතා... ඒ දුව කොහේ හරි ඇති... මොකක් හරි පොඩි අසනීපයක් උනත් ඉතින් ඇත්තටම රෙස්ට් කරනවා ඇරෙන්න අනික් අය එක්ක කථා කර කර ඉන්න එකක් නෑ නේ..."

කෙසේ වුවද මයන්ත එය තේජානිට කියන්නට තීරණය කරගත්තේය... ඒ කාන්තාවන්ය... කාන්තාවන්ට පොදු වූ ප්‍රශ්නද ඇත... ඒවා දන්නේ තේජානිය...

# 16 සෙනසුරාදා

**ඉන්පසුදා** තේජානි අවදිවෙද්දීම තිබුණේ මයන්තගේ පණිවිඩයය... එහි තිබුණේ පුහුණුවීම් වලට හැකි ඉක්මණින්ම එන ලෙසිනි... මයන්තට පුහුණුවීම් වලට පෙර ඇයව හමුවීමට අවශ්‍ය බව දැණුනු හෙයින් ඇය හැකි ඉක්මණින්ම ඇඳුමක් ලා ගත්තී පුහුණුවීම් ශාලාවට දිවවේ උදයේ තේ කෝප්පයද මතක නැති කරමිනි... වන් මැන් ෂෝ හෙවත් නිලන් අද පුහුණුවීමට නැති හෙයින් ඒ වෙනුවට එන්නේ මයන්ත බව ඇය දන්නීය... ෂෙනාලි මිස්ගෙන් හොඳවායින් දෙක තුනක්ද අසාගන්නට තමාට හැකිවෙතැයි ඇය බියෙන්ද සිටියාය...

මැඩම් ගේ විදේශික මිතුරන් හමුවේ හෝටලයේ නර්තන ගායන කණ්ඩායම හැල්ලුවට ලක්කිරීමට ඇයට නුපුළුවන... ආරතීගේ ප්‍රශ්නය සිතේ කරකැවුණද ඇය ඇයගේ සේවාව හරියාකාරයෙන්ම නිම කළ බව නම් ඇයට සහතිකය...

එහෙත් මේ උදයේ අවදි වීමට නොහැකිවීම... ඇයට එවර කෝපයක් සිතුණේ ආරතී සමගය... ඇය මේ වටිනා කියන දින ටිකේ අසනීපයෙන් හෝ මෙහේ සිටියේ නම්... ඇය දැන් සිතාගෙන සිටියේ සමහරවිට ආරතීගේ කුසේ දරුවෙක් පිළිසිඳ ගෙන ඇති නිසා ඇය සංජයගේ නිවසට වී සිටින බවය... නැතහොත් සංජයගේ මේ විවාහයේ වේදනාව නිසා ඔහුවද හොරා ගමේ ගියා විය හැකි බවය... දරුවෙක් පිළිසිඳ ගෙන ඇත්නම් ගමේ නොයන බව ඇය දැන සිටියාය... ඇය ගමේ දූයි දැන් මයන්ත දන්නවා ඇත...



ඇය යද්දී සිටියේ මයන්ත පමණක්ම නොවේ... පුහුණුවීමක්ද තිබුණේ නැත... ෂෙනාලි නැතුවා විය හැකිය... ඇය සිටින්නේ නම් මේ මොහොතේදී පුහුණුවීම් කරන්නීය... සිටි බොහෝ දෙනෙක් කුමක් හෝ වැදගත් කථාවක් කරමින් සිටිනු දකිද්දී ඇයට බියක්ද දැණින... ඇය එද්දී ඇයගේ පියවර හඬට සියල්ලෝම හැරී බැලූ නමුදු හැකි ඉක්මණින්ම කථාව කරන්නා දෙස බැලූ බවද ඇය දුටුවාය... ඒ මයන්ත නොවේ... වසන්ත දෙසය...

ඇය එතනට යද්දීම වසන්ත මෙන්ම මයන්තද ඇය දෙස බැලුවේය... මයන්තගේ මුහුණ දකිද්දී තේජානිට දැන් බියක් දැණින... ආරතී...

"අන්කල් ඇවිල්ලද මයන්ත...?" ඇය කිසිවක්ම කිසිවෙක්ගෙන් නොඅසා මයන්තගෙන් ඇසුවාය...

ඔහු හිස සැලුවේය... ඔව්... එයින් කියැවිණ...

"ඉතින්..." ඇය ඇසුවේ ඇයට එහි විස්තර ගැන අසා ගැනීමට සිතමින් වුවද... ඇය කිසිවක් අසන්නටම පෙර...

"රතී එහෙන් නැහැළු ජානි..." එය කීවේ නම් සමුදි විය යුතුය...

"නැහැළු...?" ඇසූ තේජානිගේ දෙකකුල් පණ නැතිවෙන්නට තරම් විය... දැන් ආයෙත් ඇසිය යුත්තේ අර උගුඩුවාගෙනි... මෙවර නම් ඔහුට හොඳවයින් කුණුහර්පයක්ද කියා එය විමසිය යුතු බව ඇය සිතාගත්තීය... ඔවුන්ගේ බලතලවලට හිස් නමද්දී ඔවුන් සඳන්නේ අනික් මිනිසුන් පට පණුවන් ගණනට දමා ගන්නටය...

"වාඩිවෙන්න ජානි..." කියමින්ම රුක්මි පුටුවක් ළං කළාය... මිතුරිය සිහිසුන් වෙතැයි ඇයට බියක් දැණුනා වැන්න.

"කොයි වෙලාවෙද කිව්වේ...?" තේජානි ඇසුවේ පුටුවත අල්ලා ගනිමිනි...

"ඊයේ රෑ... ඒ වෙලාවෙ කියන්න විදියක් තිබුණෙ නෑ ජානි... මං ඒකයි මෙසේජ් එකක් එව්වෙ..." මයන්ත කීවේය.

"ඉතින් එතකොට... දැන් මොකක්ද කරන්නේ...?" ඇයට ඇසිණ...

"කරන්න කිසිම දෙයක් නෑ..." කීවේ වසන්තය...

"ඇයි... ඒ මොකද...? අපිට කියන්න බැරිද...?"

"කාටද...?"

"අඩු ගාණේ අපි කියමුද මේ අපේ සිකියුරිටියට හරි..."

"කියලා ඉවරයි ජානි..." වසන්ත කීවේය...

"කියලා ඉවරයි කියන්නේ...?" තේජානි ඇසුවාය...

"ඒයේ මැඩමට නෝට් උනානේ... රතී නෑ කියලා... විස්තර අහලා මිස්ගෙන්... අද මිස් ආවෙ නැත්තේ මෙහේ සිකියුරිටි එකේ පොඩි ඩිස්කෂන් එකක් එ..."

"ඩිස්කෂන් එකක් කිව්වේ...?"

"ආරතී ගැන විස්තර..."

තේජානි ඇස් විසල් කරගත්තාය... ආරතී ගැන විස්තර හොඳින්ම දන්නේ තමාය...

"ඇයි මට කථා නොකරේ...?" ඇය ඇසුවේ බොහෝ කේන්තියකිනි...

සියල්ලෝම මුහුණට මුහුණ බලාගත්තාට ඇත... ඔවුන් සිතුවේම තේජානි එයට එක්වන්නට බියෙන් සිටිතැයි යන සිතිවිල්ලකිනි... එලෙස එතන කිසියම් සාකච්ඡාවක් දියත් වෙන බවවත් ඇයට නොකීවේ නම් හොඳයැයි රුක්මි සිතමින් සිටියේ වසන්තගේ මුවින් එය පිටවෙද්දීය...

"ඔයා... ඔයාට බයක් නැද්ද ජානි...?" ඇසුවේ සිරිනිය.

"මොනවට බය වෙන්නද...? මං කියන්න යන්නේ ඇත්ත..." ඇය කීවේ ස්ථිර ස්වරයකිනි... ඇය සිතුවේම සංජය ගැන එම මොහොතකදී දුනුම් දෙන්නටය...

"මේ මට දනගන්න දෙයක් තියෙනවා... මොකක්ද මේ ඩිස්කෂන් කියන්නේ...? ඉන්ක්වයරි එකක් නෙවෙයිද තියන්නෙ... රතී නැති උනාට...?" එලෙස ඇසුවේ වානියාය...

එවර සියල්ලෝම ඇය දෙස බැලූහ...

"කවුද ඔයාට කිව්වේ ඩිස්කෂන් එකක් කියලා..."

"එතන හිටිය සිකියුරිටි බෝයි... ජයා..."



"ඒකත් ඇත්ත..." කීවේ සමුදිය... "මේක මොකක් හරි විභාගයක් වගේ දෙයක් නෙවෙයි ද...? නිකං සාකච්ඡාවක්ද කරන්න යන්නෙ මෙහේ ඉන්න එම්ප්ලෝයි කෙනෙක් නැති උනාම...?"

"මං හිතන්නේ එක සැරේම ඉන්ක්වයරි එකකට යන එකක් නෑ... බයයි නේ අහවලා එක්ක..."

සියල්ලන්ගෙන්ම පිටවෙන්නට ඇත්තේ සුසුමක් විය හැකිය... එහෙත් තේජානිට සුසුමක් නැගුණේ නැත... ඇයට සුසුමක් හෙලන්නට අවශ්‍ය නැත... ඇය සිතමින් සිටියේ මේ සංජය නැමැත්තා ගැන ඉහළට දැනුම් දෙනුයේ කෙසේද යන්නෙනි... මෙලෙස විභාගයක්... නැතහොත් සාකච්ඡාවක් හෝ තබන්නේ නම්... ඇයගේ මුවට නැගුණේ තැබැවීන්ම සිනහවකි...

"මොකට බයවෙනවද...? අපි හැමෝම දන්නවනේ රතී යාළුවෙලා හිටියේ එයා එක්ක කියලා..."

"ඒකට යාළුකම කියලා දාන්න පුළුවන්ද ජානි... අපි වගේ කෙනෙක්ට..."

"පුළුවන්... නැත්තං කොහොමද දාන්න කියන්නේ... අනියම්..."

"එහෙම තමයි යන්නෙ..."

"නෑ... එහෙම නොයන්න මට කියන්න පුළුවන්..." ඇය කීවේ අර ලිපිය සොයා ගත යුතුය දැන් සිතමිනි... ඇයගේ කාමරය බලන්නට පෙර එය සොයා ගත යුතුය... එය ඔවුන් ගතහොත් සංජය ඇය හා මිතුරුව සිටියායැයි කියන්නටත් තමාට හැකියාවක් නොඑන්නට පිළිවන... එහෙත් එවර ඇයගේ සිතට වෙනත් අදහසක් පැමිණ තිබිණ...

තමා එය මෙහිදී කිවහොත්... සංජයගෙන් කප්පමක් ඉල්ලා එය ගැන කියන්නට වුවද කෙනෙක් මෙහි සිටින්නට හැකිය... ඇය ඒ ලිපිය ගැන නොකියාම එය සොයන්නට සිතුවාය... එසේනම් දැන් ඇයට මෙහි පුහුණුවීම කරමින් සිටින්නට වෙලාවක් නැත...

"මං කාලා වත් නෙවෙයි දුවගෙන ආවෙ... කොහේද මේ ඩිස්කෂන් එක තියෙන්නේ...?" ඇය ඇසුවේ වසන්ත දෙස බලමිනි.

"ඔයා යන්නද හදන්නේ...? එහේ... යන්න එපා දැන් නං..."

"කවුද කථා කරන්නේ නැතුව එහෙම යන්නෙ...?" වසන්තගෙන් ඇසූ ඇය ඉන්පසු බැලුවේ මයන්ත දෙසය...

නෑ නේද...?" ඇය

"එහෙනං දූන්ම මිස් ෂෙනාලි එන එකක්

"එහෙනං දූන්ම මිස් ෂෙනාලි එන එකක් නෑ නේද...?" ඇය එලෙස ඇසුවේ මයන්තගෙනි... මයන්ත හිස සැලුවේය...

"එන්න විදියක් නෑ ඒ... අපිට ප්‍රැක්ටිස් පාරක් දාන්න කිව්වා..."

"එහෙනං රුක්මි ඔයා ටිකක් ප්‍රැක්ටිස් කරන්න... මං කන්නෙත් නැතුව දුවගෙන ආවෙ... රෙදි ටිකත් එහෙමම ඇඳ උඩ... ඒවා අයින් කරලා එන්නං..." කියාගෙන ගිය තේජානි රුක්මි දෙස බැලුවාය.

"යන්න එපා ජානි... සමහරවිට ඔයාටත් දූන් කථා කරයි... අපි මෙක ඉවරවෙලා ඔයාට එන්න කියන්න යන්න හිටියේ..."

"නෑ නෑ... මං කන්න ගියා කියන්න... එතකොට කාලා ඉවරවෙලානේ එන්න වෙන්නේ..." ඇය කීවේ වෙනත් යමක් නොකියමිනි... කෙසේ හෝ මේ ලිපිය සොයා ගත යුතුය... එය තිබෙන්නේ අල්මාරියේ ඇති රහස් ලාච්චුවේ විය යුතුය... රහස් කීවාට එහි තිබෙන හැම අල්මාරියකම එලෙස ලාච්චුවක් තිබෙන බව කවුරුත් දූන සිටියහ... රති බොහෝ විට වැදගත් ලිපි තැබුවේ එහිය... වැදගත් යැයි කිව හැකි ලිපි ලෙස ඔවුන්ට තිබුණේ බැංකු ලිපිය... එහෙත් රතිට සංජයගෙන් ලැබුණු ලිපි කිහිපයක්ද එහි තිබෙන්නට හැකිය... නැතහොත්... වෙනත් තැනක තැබුවේ නම්... නැත එය විය නොහැකිය... කෙසේ වූවත් පළමුවෙන්ම එම ලාච්චුව බැලිය යුතුය...

එපා කියන්නටත් පළමු ඇය පුහුණුවීම් ශාලාවෙන් පිටවුණාය...

අනික් අයට වුවද පුහුණුවීමක් කරන්නට තරම් සිතක් තිබුණේම නැත... ඔවුන් ඇය දුවද්දී යළිත් එකිනෙකා හා කථා කරගන්නට වූහ...

ඇය කෙළින්ම දුව ගියේ මුළුතැන් ගෙයටය...

"ශාන්තා මං රෙදි ටික අස්කරලා එනකං තේකක් හදලා තියන්න... මොනවද කන්න තියෙන්නේ..." අසමින්ම මේසය මත බැලුවාය... එහි සැන්ඩ්විච් කිහිපයක් දැමූ පිඟානක් තිබිණ...

"මිස් දිව්වෙ මොකටද...?"

"මට පරක්කු වෙලා කියලා හිතලා දුවගෙනම ගියේ... තාම ප්‍රැක්ටිස් පටන් අරගෙන නෑ..." වෙන යමක් කියන්නට ඇය නොසිතුවාය... "මෙවා මේ අපිට කන්න හදපුවා වෙන්න ඇති නේද...?" අසද්දීම ශාන්තා හිස සැලුවෙන් ඇය කුඩා පිඟානක් අතට ගෙන,



සැන්ඩ්විච් කිහිපයක් එයට දමාගත්තී ශාන්තා වෙනත් යමක් කියන්නට පෙර එයද රැගෙන මුළුතැන් ගෙයින් පිටවුණාය...

කාමරයට වැදුණු ඇයට දැණුනේ සැනසිල්ලකි... ඇය දොරගුළු ලෑවාය... දූන් එය විවර කරගත හැක්කේ ආවහොත් ආරතීට පමණකි... අනික් අය අත ඇති යතුර ගෙන එන්නේ පැයක් හමාරක් ගිය පසුය... එය තිබෙන්නේ මැඩම් ළඟය... එය ගෙනෙන තුරු ඇයට කාලයක් තිබේ...

ඇය හැකි ඉක්මණින්ම ආරතීගේ අල්මාරිය විවර කරගත්තාය... ඉදිරියේ ලාච්චුව තරමක් තද වූ හෙයින් ඇදගන්නට තරමක් වේලා ගත විය... එහෙත්... එය ගත් පසු එයට ගත් මහන්සිය අපතේ නොගිය බව ඇයට සිතිණ... එහි ලිපි දෙක තුනක්ම තිබිණ... බැංකු ලිපි නම් ඇත්තේ අනික් ලාච්චුවේ තිබුණු ලිපි ගොනු කවරයේ විය හැකිය... තේජානි සිතාගත්තීය...

එහි කිසියම් ආභරණ පෙට්ටියක්ද තිබිණ... එය සංජය දූන් ආභරණ පෙට්ටියක් බව ඇය දූන සිටියාය... එහි වටිනාකම ගැන ආරතීද දූන සිටියේ නැත... වටිනා බව නම් දෙදෙනාටම එය දුටු පළමුවරම සිතිණ... රත්රන් ආභරණ කට්ටලයකි...

ලිපි දෙක තුන ගත් ඇය පළමුවම ඒවා බැලුවාය... ඒ සියල්ලම කියවමින් ඉන්නට නොහැකිය... ඒවා සංජය එවූ ලිපි බව ඇයට සිතිණ... දෙවනුව ඇය ආභරණ පෙට්ටියට අත යැව්වාය... ඇයගේ අදහස වෙනස් විය... මෙහි ඇඟිලි සත් ගත හොත්... ඇය එය විවර කිරීමේ අදහස අත් හැර දමා ලේන්සුවක් ගෙන සියල්ල පිසුවාය... ඇඟිලි සත් මකන්නට එය එක් ක්‍රමයක් බව ආරතී කීවේ කුමක් හෝ රහස් පරීක්ෂක කථාවක් ඇයට කියූ දිනකය... එම කථාව එදා ඇයගේ සිත තදින්ම ඇද ගත්තෙන් එය නම් ඇය ආරතීගෙන් පසුව ඉල්ලාගෙන කියෙව්වාය... එය ඇයට මතකයේ තිබුණේද එහෙයිනි... උඩ ලාච්චුවද පිසදා එය ඇය අල්මාරියට ඇතුල් කළේ රෙදි කැබැල්ලකින් අල්ලාගෙනය...

සියල්ල නිම කරන අතර ඇය සැන්ඩ්විච් පිඟානද සෙමින් හිස් කළාය... සිරුරට පණ නැති කමින් ගීතයක් ඉදිරිපත් කරද්දී වේදිකාවේ ඇද වැටෙන්නට නම් පිළිවන් කමක් ඇත්තේම නැත... එලෙස වෙනවාට ඇයගේ කැමැත්තක්ද නැත...

ලිපි තබාගන්නේ කොහේදැයි ඇයට සිතන්නට නොහැකිය... මේ කාමරයම මිස වෙනත් එය තැබිය යුත්තේ වෙනත් තැනකය... මේ කාමරයම මිස වෙනත් කාමර නම් සොයන්නට නොයන බව ඇය දන්නීය... එහෙත් ශාන්තාගේ කාමරයේ මෙය තබන්නට නොහැකිය...

හරිම ලිපිය සොයා ගැනීමට මෙම ලිපි තුනම කියවිය යුතුය... මේ එයට මොහොත නොවේ... එහෙයින් මේ තුනම මේ මොහොතේදී සැඟවිය යුතුය... ආරතීගේ මෙම අතුරුදන්වීමට හේතුව සොයා ගැනීමට දැන් ආරක්ෂකයින් මේ කාමරය දෙවනත් කරන බව ඇය දන්නීය... එලෙස නොවන්නටද පිළිවන... එහෙත් මිතුරියට කිසියම් සාක්ෂියක් ඉතුරු කරගත යුතුය...

මේ අතුරුදන්වීම කර ඇත්තේ සංජය නම් මේ සාකච්ඡාවේ යෙදුණු අයට ඔහුගෙන් මෙම ලිපි ගැන විස්තරය ගොස් ඒවා ඔහුට ලබාදෙන්නටයැයි කියා තිබෙන්නටද පිළිවන... ඔහුට ඒ බලතල තිබේ... ඔහුගේ බලවන්ත කමට ධනවන්තකමට නොනමන ගිසක් තිබේදැයි ඇයට සිතාගත නොහැකිය... එවැන්නෝ ඉන්නටද පිළිවන... එහෙත් ඔවුන් වුවද බිය නිසා කිසිවක්ම නොකියන බව ඇය සිතුවාය...

ඇය පසෙක තිබුණු කඩදාසි අත් පිස්නාවක් ගත්තී එය නවා ලිපි තුන එය ඇතුළට නොපෙනෙන සේ දැමුවාය... ඉන්පසු එයට උඩින් ඉතිරිවූ සැන්ඩ්විච් පෙත්තක් තැබුවාය... පපුතුරේ ගසා ගත හොත් එය සොයවන්නට පිළිවන... ඇය බොහෝ නිසන්සලේ දොරද විවර කරගෙන එළියට ආවාය... ඉන්පසු තරප්පු පෙළ බැස්සාය...

රුක්මිත් සමුදිත් දෙදෙන එනු ඇය දුටුවේ ඒ අතරය...

"මොකද සමුදී...? මට එන්න කිව්වද...?" ඇය ඇසුවේ එලෙසම සිටිමිනි...

"නෑ නෑ... මයන්ත කිව්වා පොඩ්ඩක් ඔයාව බලන්න කියලා..." සමුදි කීවේ තේජානි අද කිසිදු බියක් නැතිව සිටින බව වටහා ගනිමිනි... ආරතී ගැන සොයන්නට සියල්ලෝම උනන්දු වීම දැන් මෙහි රහස විය හැකිය...

"යං මං එන්නං එතනට..." ඇය කීවේ තවත් සැන්ඩ්විච් පෙත්තක් දෙකක් දමාගෙන මෙය මයන්තට දී එම ලිපි කොහේට හෝ කරන්නට කීමය... ඔවුන්ට ඒවා තබා ගත හැකි බොහෝ තැන් තිබේ... "මං තව සැන්ඩ්විච් පෙත්තක් දෙකක් අරන් එන්න ඕන... මට බඩගිනියි හොඳටම..."



තේජානිගේ ස්වරය සාමාන්‍ය නිසා සමුදි හා රුක්මි දෙදෙනම සැනසිල්ලට පත්වූහ...

"එහෙනං ජානි අපි තව ටිකකින් එන්නං..." කියාගෙන ඔවුන් දෙදෙන ඔවුන්ගේ කාමර දෙසට ගියහ... ඇය ගියේ මුළුතැන් ගෙය දෙසටය... කඩදාසි පිස්නය වැසෙන්නට ඇය සැන්ඩ්විච් පෙති දමාගත්තාය... තවත් කඩදාසි පිස්නයක්ද ගත්තාය.

ඇය පුහුණුවීම් ශාලාවට යද්දී මයන්ත සිටියේ ඔහුගේ වාදක භාණ්ඩය ශ්‍රුතියට සදමිනි... ඇය සෙමින් එතනට ගියාය... අනිත් සියල්ලෝම දැන් තේ බොමින් සිටියේ එළියේ දමා තිබුණු බංකුවල වාඩිවී ගෙනය... මයන්ත ඉන්නටම ඇත්තේ තමා එනතුරු බව තේජානිට සිතිණ... ඇය පිඟානත් ඔසවාගෙනම එතනට ගියාය...

"මයන්ත පහළ සර්වියට් එකත් එක්ක ලියුං තුනක් ඇති... කොහේ හරි හංගන්න..." සෙමින් කියමින්ම ඇය ඒ පිඟාන එතනින් තැබුවාය...

"මොනවද ලියුං...?"

"කෑ නොගහා ඒවා ටික කොහේ හරි තැනක තියෙනවද...? ඒවා රතියගෙ... මං පස්සෙ කියන්නං කතන්දරේ..." මයන්ත අත් අය එන්නට පෙර සර්වියට් එකෙන් ලිපි තුන රැගෙන ඔහුගේ ඉදිරි කලිසම් සාක්කුවේ ලාගත්තේය... එය කුඩා ලිපි තුනකි... ඒවා පෙම් ලිපි නම් විය නොහැකි බව ඔහුට සිතිණ... සමහරවිට ලිපි මෙන් ඇය සිතුවාට ඒවා බිල් පත් වන්නටද පිළිවන... එහෙත් මේ මොහොතේ ඒවා කියා ඇයගේ සිත රිදවන්නට ඔහුට අවශ්‍යතාවයක් නොවිණ...

"මොනවද ජානි ඒ...?" මයන්ත ඇසුවේ සැන්ඩ්විච් පෙත්තක්ද ගන්නා අතරය...

"ඒ අරයාගේ ලියුං වගයක්... ඒවා ගන්නද දන්නෙ නෑ තේ ඩිස්කෙත් එක..." ඇය කීවේ සිනහසෙන්නට යත්න දරමිනි...

දැන් ආරතී නැතිවී හයවෙනි දවසය... මයන්තගෙන්ද දැන් තම සිනහව පලා ගොස් තිබිණි...

"කාටවත් කියන්න එපා මයන්ත... කොහේ හරි ඔයාගේ කාමරේ නැතුව... වෙන තැනක තියන්න... සමහරවිට ඔයාගේ කාමරෙත් බලයි... හරි විදියට මොකක් හරි උනොත්..."

"එහෙම කරයි රතියා..." ඔහු නවතාගත්තේය... ආරති මෙලොවින් තුරන්වී යැයි කියන්නේ කෙලෙසකද...? ඔහු කියන්නට ගොස් නවතාගත්තේ කිමෙක්දැයි තේජානිට වටහා ගැනීමට අසීරු නොවීය...

"රතී කියන්නේම අරූ පව් කියලා නේ... මං පෙන්නනවා පව් පින්... මට කතා කරොත් ඔය ඩිස්කෂන් එකට..." තේජානි කීවේ කෝපයෙනි...

"පොඩ්ඩක් ඉවසන්න ජානියෝ... තාම මොකක් වත් හරි හැටියකට දැනගන්න නෑ නේ... අරයගේ ගෙදරද දන්නෙ නෑ නේ මෙකී... මොකක් හරි අසනීපයක් හරි වෙලා නං..."

"එක වෙලාවකට මටත් හිතුණා මයන්ත... සමහරවිට බබෙක් වත් හම්බවෙන්න ඇවිල්ලා.. මෙහෙට එන්න එපා කියලා හරි මොකක් හරි නං... සංජයත් සමහරවිට ඒක හංගන්න වගේ හිතුව නං..."

"හංගන්න වගේ..."

"ඔව් ඉතින්... දරුවා නොලැබෙන්න මොකක් හරි කරා නං..."

"එක දවසෙන් එන්න පුළුවන් නේ..."

"ඔයා කොහොමද දන්නෙ...?"

"මං පොත් පත් කියවන එකෙක් නේ අක්කෙ... උඹ නොකියෙව්වට..." එවර මයන්ත කීවේ ඇයගේ මුහුණට තරමක සිනහවක් නංවමිනි.

තේජානිට පළමුදා සිහිනය මතක් විය... ඇය එදා ගමන් කළේ අපහසුවෙනි... ඒ එසේනම් එවැන්නක්ද...? එවැන්නක් හෝ වේවා කථා කරන්නට නොහැකි වූයේ ඇයි...? එවැනි ශල්‍යකර්මයක් කළා කියා කථා කිරීමේ නොහැකියාවක් එන්නේ නැත...

එහෙත් එවැන්නක් වැරදී...

ඇයගේ හිත සිහිතල විය... සංජු පව් කීවේ ඒ නිසාද...? ආරතී එලෙස නැතිවේයැයි ඇයට සිතීමට අපහසුය... එලෙස වූයේ නම්



ඇය ඒ දරුවා කෙසේ හෝ හදාවඩා ගන්නා බව ඇය සිතුවාය... ඇය දරුවනට ආදරේ ඇති තරුණියකි.

ඔවුන්ට පුහුණුවීම වල යෙදෙන්නට හැකි වූයේ පැයක් හෝ පැය දෙකක් පමණකි... තේජානිට විසිත්ත කාමරයට එන්නට යැයි කීවේ ශාන්තා පැමිණය.

"කවුද ශාන්තා ඇවිත් ඉන්නේ...?" අසාගෙනම සමුදි නැගිට්ටාය.

"පොලිසියෙනුත් ඇවිල්ලා..."

"පොලිසියෙන්...?" කිහිප දෙනෙක්ගේම මුවින් පිටවිය...

"ඔව්... රතී මිස් ගැන හොයන්න වෙන්න ඇති..."

"රතී මෙහේ හංගලා ඉන්නවා කියලා හිතාගෙනද දන්නේ නෑ ඇවිත් තියෙන්නේ..." කෝපයෙන් මෙන් කියාගත් තේජානි නැගිට ගත්තාය...

"ජානි අක්කෙ... කේන්තියෙ කථා කරන්න එපා..." පොලිසියෙන් ආවේ නම් ඒ සංජයගේ කීමට විය හැකි බව තේජානිට පෙර මයන්තට සිතී තිබිණ... නැතහොත් පළමුවෙන්ම විමසන්නේ හෝටලයේ ආරක්ෂක අංශයේ නිලදරුවෙක් පැමිණිය...

කෙසේ වූවත් දැන් මෙය සුවිශේෂී සිදුවීමක් වී ඇත...

★★★

තේජානි විසිත්ත කාමරයට පා තැබුවේ තරමක තිගැස්මකින් යුතුව වුවද ෂෙනාලි දකිද්දී ඇයගේ බිය මෙන්ම තිගැස්මද යම් තරමකට පහවිය.

"එන්න මිස් තේජානි..." බොහෝ ගරුසරුව කථා කළේ එහි නියෝජ්‍ය ආරක්ෂක නිලදරුවාය... සමුදි හා රුක්මිද දැන් පහළට බැස තරප්පු පෙළ අග සිටගෙන සිටින බව දකිද්දී තේජානිගේ සිත බොහෝ සන්සුන් විය...

"මෙයා තමයි සර් ආරතීගේ රූම් මේට්..." ඔහු එවර කීවේ ඔහුගේ උසස් නිලදරුවාට හා අනික් තැනැත්තාටත් පොදුවේ විය හැකිය...

පොලිසියෙන් කීවාට පොලිසියේ කවරෙක්වත් සිටියේ නැත... මේ දෙදෙනාම මෙහි ආරක්ෂක අංශයේ බව තේජානිට වැටහිණ... ආරක්ෂක නිලදාරිනියකද සිටියාය... ඇය නම් තේජානි දකිද්දී සිනහසුණාය... ශාන්තා හෝටලයේ ප්‍රධාන නිලදරුවා පොලිසියේ යයි සිතන්නට ඇත... හෝටලයේ නිරතුරු දකින ආරක්ෂක නිලදරුවන් අඳින්නේ සුදු පාට නිල ඇඳුමකි... එහි උසස් තැනැත්තා අඳින්නේ කාකි පාටට හුරු තරමක් ගුරු පැහැති ඇඳුමකි... සමහරවිට ශාන්තා එම නිලදරුවා මෙතෙක්ම නොදැක්කා වෙන්නටද පිළිවන... මෙවන් සිදුවීමක් නම් මෙතෙක්ම සිදුනොවූ හෙයිනි...

පළමු වර ගිය තරුණිය ආවේ සති දෙකකට පසුය... ඇය සතියක් නොඑන බව ඉහළට දන්වා තිබුණද කිසියම් හේතුවක් නිසා ඇයව සොයන්නට ආරක්ෂකයින් එද්දීද ඇය ඇවිත් සිටියේ නැත...

කෙසේ හෝ ඇය නම්, ඇයගේ තත්ත්වය නැති කරගත්තේ ඇය විසින්ම බව සියල්ලෝම පැවසුවේ, ඇය කිසියම් අයුරකින් එහි ආරක්ෂක නිලදරුවෙකු හා එකටෙක කියා ගත් හෙයින් බව බොහෝ අය දැන සිටියහ...

මෙය වෙනස්ය..., මෙහිදී ආරතී නැත... නැතිවූ තැනැත්තිය නැත... එදා නැතිවූ තැනැත්තියගෙන්ම ප්‍රශ්න නගා තිබිණ...

තවත් තැනැත්තෙක් සිටියද ඔහුගේ නිල ඇඳුමක් නොවිණ.. ඇය වඩාත් බැලුවේ ඔහු දෙසය... ඒ සංජයගේ කවරෙක් හෝ වන්දැයි යන සැකයෙනි.. සමහරවිට නොකීවාට ඔහුත් ආරතී ගැන සොයන්නට උත්සාහයක් නොදරන්නේ යැයි කිව නොහැක්කේ කෙසේද...?

"අපි මෙයාට කියන්නේ ජානි කියලා..." ෂෙනාලි කීවෙන් සියල්ලන්ගේම සිනහවක් නැගිණ..

"හොදයි මිස් ජානි.. අපිත් එහෙම කියමු... ඊයේ ඔයාගේ සින්දුව නං හරිම ලස්සණයි.." පළමුවම කීවේ උසස් නිල දරුවාය...

"රනී හිටියනං ඒත් එහෙමයි සර්... සමහරවිට එයිට වඩා මට ගැම්මක් ගන්න තිබුණා..." තේජානි කීවාය...

සියල්ලෝම මුහුණින් මුහුණ බලාගත්හ... ෂෙනාලිගේ වතට අඟදිය බිඳුවක් එක්වූ තරම්... තේජානි බොහෝ තැන්පත් සේ සිටියාට මෙවැනි කටකාරියක බව ඇය මෙතෙක්ම දැන සිටියේ නැත... ඇය



මෙතෙක්ම දක ඇති, දැන සිටි තේජානි යනු, ගීතය හොඳින් ගයන රංගනයට දායක වන කීකරු, ගුණ යහපත්... ඒ මේ පරාසයේ අයගේ නැති ගති ගුණය... එහෙත් බියසුළු... නැත... දැන් ඒ වචනය ඉවත් කරගත හැකිය...

"හිතාගන්න බෑ මෙයාද කියලා ඊයේ සින්දු කිව්වෙ..." අනිකා කීවෙන් ඇය සන්සුන් වුණාය...

"වෙස් වලාගෙන එනකොට හිතන්න බෑ නේ..."

"ඉතින් මිස් ජානි... පොඩ්ඩක් වාඩිවෙන්න... අපි ටිකක් කථා කරමු.. මිස් ආරතී ගැන දැනගන්න අපිට ඕන... ඔයාට කියලා යන්න ඇති නේ එයා ගිය තැන..."

තේජානි වාඩිවුණාය... ඇය සංජය ගැන කියන්නට යන්නේදැයි දුන් සමුදීට මෙන්ම රැක්මීටද සිතිණ... ඔවුන් දෙදෙන බියපත්වූ තරමට තේජානි බියපත් වූයේ නැත... ඇයට අවශ්‍ය වූයේ ඇයගේ මිතුරිය මෙලෙස සඟවා ගෙන සිටින සංජයට විරුද්ධ වීමටය... ඇය මවක් වන්නට යන්නී වුවද, ඇයව විවාහ පත් කරගැනීමට නොහැකි වුවද ඔහු විසින් කළ යුත්තේ මෙලෙස ඇයට නිගා වන පරිදි ඇයව සඟවා තබාගෙන බොරු කියමින් අන් අයට සුදනෙක් වීම නොවේ...

"කියලා ගියාද ජානි...?" එසේ ඇසුවේ ෂෙනාලිය... තේජානි එවර බැලුවේ සාමාන්‍ය සිවිල් ඇඳුමකින් සැරසී සිටි තැනැත්තා දෙසය.. තමා මෙවා මෙලෙස පිට අයට කිව නොහැකිය.

"මිස් ජානි... අපි ගැන දන්නවනේ... ඒ මිස්ට ජයරත්න මැඩම්ගෙන් ඇවිල්ලා ඉන්නෙ... මැඩම් මේක ගැන විශේෂයෙන් හොයලා බලන්න කිව්වා... මිස් ආරතීට මොකක් හරි කරදරයක් නං... බලන්න කියලා... ඒ මොකද මිස් ආරතී අපේ හොඳ සින්ගර් කෙනෙක් නිසා..." ආරක්ෂක නිලදරුවා ඇයට කිව්වේ ඇයගේ එම බැල්මෙන්ම ඇය ආවාට ගියාට කිසිවක්ම කියන්නට සිතන තාලයේ තැනැත්තියක නොවන බව සිතමිනි... සැබැවින්ම බුද්ධිමත් යුවතියක බව ඔහු මේ මොහොතේදී ඇය ගැන නිගමනයක් ගනිමින් සිටියේය.. එයම ජයරත්න මැණියන්ද තීරණය කරගත්තේය...

ආරක්ෂක නිලදරුවා වුවද ඇයව මෙලෙස දක තිබුණේ නැත.. වසරකට පෙර ඇය මෙහි එද්දීත් ඔහු සේවයේ නිරතව සිටියේය...

සම්මුඛ පරීක්ෂණයට ආ යුවතියන් පිළිගන්නට සිටියේ ඔහුත් තවත් ආරක්ෂක නිලදාරිනියකුත්ය... මෙවර තවමත් එවන් පරීක්ෂණයක් කළේ නැත...

ඇය ඇයගේ රූමත්කම පවා සඟවා ගෙන ඇති බව ඔහුට සිතුණේය... මෙතෙක්ම ඔහු ඇය මෙලෙස සාමාන්‍ය ලෙස දුටු සිතුණේය... සම්මුඛ පරීක්ෂණයට පැමිණි යුවතිය මෙතරම් රූමත්ව තිබුණේම නැත... සම්මුඛ පරීක්ෂණයට පැමිණි යුවතිය මෙතරම් රූමත්ව නොසිටි බව ඔහු සිතුවේය... බොහෝ විට සැබැවින්ම මෙහි එන බොහෝ සාමාන්‍ය පෙනුමැති තරුණියන් පසුව පසුව බොහෝ රූමත් යුවතියන් වෙන බව ඔහු දැන සිටියේය...

"මිස් ආරතී වගේ ම මිස් ජානිත් හොඳ සින්ගර් කෙනෙක් කියලා අපි දන්නවා..." කීවේ අනික් නැනැත්තෙකි...

තේජානිගේ සිහින් සිනහවක් මතුවිය... ඒ ඇයට ප්‍රශංසාවක් හිමිවූ නිසා නොවේ... මැඩම් මේ ගැන පුද්ගලිකව සලකා තිබෙන බව සිතෙද්දිය... මැඩම් එලෙස කළේ නම් ඇයද ආරතී ගැන හොඳින් දන්නා බව ඇයට සිතිණ... සමහරවිට සංජයගේ ප්‍රශ්නය නිසා මැඩම් බියවූවාද විය හැකිය... කෙසේ වුවත් තේජානි නම් ඇයගේ සිහිවිලි හෝ කියන්නට යන කිසිවක්ම වෙනස් කරන්නට නොසිතුවාය.

"මිස් ආරතී මෙහෙම මීට ඉස්සෙල්ලාත් ගිහින් තියෙනවද...?" පළමු පැණය ඇයට යොමුවිය...

ඇය හිස සැලුවාය... තමා කියන සියල්ලම තැටි ගත වෙන බව ඇයට ඒ අතරතුර සිතිණ... ඒ දෙස බැලූ ඇය යළිත් පැණය යොමු කළ තැනැත්තා දෙස බැලුවාය.

"ඔව්..." ඇය කීවාය...

ජයරත්න නැමැත්තාට දැන් ඇයගේ බුද්ධිමත් කම දෙවන වරටත් වැටහිණ... ඇය එය තැටි ගත කරන බව දුටු නිසා මුවින්ම කියූ බව සිතෙද්දීය... මේ තරුණියගේ බියක්ද නැත...

"දවස් ගණන්...?"

"සමහර වෙලාවකට... ඒත් මට කියලා ගියේ..." ඇය කීවාය... ඇය මයන්තගේ නම ඇත් කළාය... වෙන දෙයක් විය යුත්තේ ඇයට පමණකි... මයන්ත ඒවාට ගැවිය යුතු නැත...





"වෙන අයට කියන්නෙ නැද්ද...?"

"මට ඒක අහන්න ඕන කමක් තිබුණෙ නෑ සර්... එයා හැමදාම ගියේ මට කියලා... දවසක් එන්න බැරි උනත් එයා මට කෝල් කරනවා..."

"මේ සැරේ එහෙම කෝල් කරේ නැද්ද...?"

"කළා..."

"කළා නං ඇයි ඉතින් ඒක...?"

"ගිය සඳුදා... මට සල්ලි වගයක් ඕන උනා... ඒක මට දුන්නේ ආරතී..." ඇය එවර මිතුරියගේ මුළු නමම කියන්නට සිතුවාය... "එහෙම දුන්නේ එයා බැංකුවට යනවා... දෙන්නෙක් යන්න ඕන නෑ කියලා... නැත්තං මාත් එයා එක්ක යන්න හිටියේ... එයා බැංකුවට ගියා නවයට විතර......?2

"ඔයා එතකොට ඒ සල්ලි දුන්නේ කොහොමද... ඒවා ණයක්ද නැත්තං...?"

"එයා මට ණයට දුන්නෙ... මට දෙන්න හම්බ උනේ නෑ... පෙරේදා සල්ලි හම්බ උනාම එයාට දෙන්න හිටියෙ..."

"එතකොට... හරි... උදේ බැංකුවට ගියා... නවයට... ඉන්පස්සෙ..."

"දහයට විතර එයා මට කථා කරලා කිව්වා සංජු එයාව ගන්න එනවා කියලා එයත් එක්ක පිට යනවා කියලා..."

"දැන් සංජු කියන්නෙ කවුද...?"

"ආරතීට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියද...?" දෙදෙනෙකුගෙන්ම එකවර ප්‍රශ්න දෙකක් නැඟිණ.

ඇය දෙදෙන දෙසම බැලුවාය...

ෂෙනාලි මෙන්ම සමුදි හා රුක්මිද බියෙන් මෙන් ඇය දෙස බැලූහ... සංජය ගැන නොකියන්නැයි කියන්නට ෂෙනාලිට නොහැකිය... තේජානි ඇය දෙසද නොබැලූ හෙයිනි... දෙවන වර ඇය සිහිවිල්ල නවතා ගත්තාය... තේජානි එය කියන්නේ නම් කියපුවාවේයැයි ඇය ඒ මොහොතේ සිතාගත්තීය... ආරතී මෙතෙක් කලක්ම පිට ගිය කෙනෙක්

ඇය ආවේ ගියේ බෝතේජු නිවසට පමණි... නොවේ... දන්නා තරමින් ඇය ගැන හෝටලයේ ආරක්ෂක බොහෝ විට පිට යන තරුණියන් ගැන හෝටලයේ ආරක්ෂක සේවාවෙන් සොයන බව ඔවුන් වුවද දන්නේ නැත... එලෙස කරන්නේ වැරදීමකින්වත් එවැනි තරුණියක් පිටට ගොස් මෙහි එන පාරිභෝගිකයෙකුට කිසියම් ප්‍රශ්නයක් ඇති කළහොත් යන හැඟීමෙනි...

එලෙස වූයේ එක්වරකි... ඇය එම තත්ත්වයෙන් පහත දැම්මෙ එලෙස අසුව් යැයි කියමින් නොවේ... පිට් ගොස් රැඳී සිටියාය යන චෝදනාව දමමිනි... කෙසේ වුවත් ආරතී එලෙස කෙනෙක් නොවන බව සියල්ලෝම දැන සිටියහ... එහෙත් සංජය මුහුණ ගැහුණායින් පසු ඇයගේ ගමන් බිමන් වැඩි විය...

"කියන්න මිස් තෙජානි... සංජු කියන්නෙ කවුද...?"

"ආරතීගේ බෝයි ෆ්‍රෙන්ඩ්..."

"ඒක දැනගෙන හිටියෙ ඔයා විතරද...?"

"ඒක මං දන්නේ නෑ... අනික් අයත් දන්නවත් ඇති... නැත්තං සැක කරනවා ඇති... ඒත් මං හොඳටම දන්නවා..." ඇය හොඳටම යන්න බර කළාය...

"මිස් ආරතී කියලද...? නැත්තං...?"

"ඔව්... එයා මට කිව්වා... අනික එයා එව්ව ගොඩක් දේවල් ආරතී මට පෙන්නුවා..."

"එතකොට මේ සංජු කියන එක්කෙනා කොහේ කෙනෙක්ද...?"

තේජානි කෙළින්ම ඒ ප්‍රශ්නය නැගූ නිළදරුවා දෙස බැලුවාය...

"එයා කවුරුත් දන්න කෙනෙක්..." ඇය කීවේ කිසිදු පැකිලීමක් නොමැතිවය.

"එහෙමනං එයාගේ නම වෙනින් එකක් වෙන්න ඇති..."

"ඔව්... එයාගේ නම සංජය පලන්සූරිය..." ඇය එවර කීවේ සියල්ලන්ගේම මුහුණු දෙස හොඳින්ම බලා ඇයගේ උසස් ආරක්ෂක නිළදරුවාගේ දෑස් දෙස කෙළින්ම මෙන් බලමිනි...

තේජානි එය කියතැයි නොසිතූ හෙයින් රුක්මි හා සමුදි දෙදෙනම බොහෝ අසරණ ලීලාවකින් බැලුවේ මෙනාලි දෙසය...

මෙනාලිගේ මුහුණෙන් පලවුණේ කමක් නැත යන්න බව සිතෙද්දී ඔවුන් දෙදෙනා තරමක් සැනසිල්ලක් ලැබූහ... එවන් චෝදනාවක් නරද්දී හෝටලයේ වඩාත් වැදගත් පාරිභෝගිකයෙක් නැති වුවහොත් එයින් තේජානිට කිසියම වැරැද්දක් විය හැකිය...

ඔවුන් තරමක සැනසුමකට පත් වූවද එය ඇසූ උසස් නිළදරුවා හා අනික් අය අතර මෙන්ම ජයරත්න නැමැත්තා අතරද කැළඹිලි සහගත වූ බැල්මක් හුවමාරු විය... සංජය ගැන මෙලෙස කියන්නේ...

"සංජය පලන්සූරිය..." තවත් මොහොතකට පසු විශ්වාස තරුණියට නොහැකි ලෙසින් ඇසුවේ ජයරත්න නැමැත්තාය... ඔහුගේ සිතට දැන් පුදුම හැඟීමක් දැණින... මේ තරුණිය මෙය කීවේ නැවිගත යන්නුයටය... සංජය නැමැත්තා මෙවැනි තැනැත්තියක හා සම්බන්ධකමක් පවත්වන්නේ යැයි කිව හැක්කේ කෙසේද...? ඔහු පුද්ගලිකවම සංජය දන්නා නිසා කල්පනා කළේය... සංජයට දැන් තරුණියක යෝජනා වී ඇත... එහෙත් ඇයට ඔහු කැමැත්ත දුන්නාදැයි නොදුන්නාදැයි නම් තවමත් දැනගන්නට ලැබුණේ නැත...

"ඔව්... එයා කථා කරනවා... ඒක නිසා එයත් එක්ක යනවා කියලා මට ආරතී කිව්වේ..."

"වෙනදත් එයා යන්නේ සංජය පලන්සූරිය එක්කමද...?" දැන් එසේ ඇසුවේ ජයරත්නය. තේජානිට එහි වෙනසක් නොවිණි... ඇය ඇයගේ සිතට දැනෙන හැඟීම දුන්නාය.

"ඔව්... එයා යාළු උනේ දැන් මාස පහ හයකට ඉස්සෙල්ලා..."

"මේක බොහොම ලොකු ප්‍රශ්නයක් මිස් ජානි... ඔයා හොඳටම දැනගෙනද මේ චෝදනාව ගේන්නේ...?" හෝටලයේ ආරක්ෂක සේවාවේ උසස් නිළදරුවා ඇසුවේය...

"මොකක්ද චෝදනාව...?" ඇය ඇසුවාය... තවමත් ඇය සංජයට විරුද්ධ චෝදනාවක් ගෙන ආවේ නැත...

ජයරත්න නැමැත්තාට සිනහවක් නැඟිණ... ඇය නිවැරදිය... ඔහු සිතුවේය. සංජය ඇයගේ පෙම්වතා වීම චෝදනාවක් නොවේ...

"දැන් මේ සංජය..., මිස්ට සංජය..." නිළදරුවා පටන් ගත්තේය...

"මං චෝදනාවක් කළේ නෑ සර්... එදා බැංකුවට ගිය ආරතී

මට කථා කරලා කිව්වා එයා සංජු එක්ක යනවා කියලා..." ඔහු තතනමින් සිටියදී තේජානි කීවාය...

ඇත්තක් කියන්නටත් බිම ඉඳගන්නටත් බිය විය යුතු නැති බව ඇය ඉගෙන ගත්තේ කුඩා කලදීමය... එහෙත් බිම ඉඳගනිද්දී වටපිටාව ගැන හොඳින් සොයා බැලිය යුතු බව කීවේ මවය... ඉඳගන්නා තැන සර්පයෙක් සිටීද නැතහොත් මඩද වැලිද... ඇයගේ දෑසට ආ තෙතමනය ඇය එලෙසම වියලා ගත්තාය... මෙහිදී නම් සර්පයන් දස දහසක් සිටියද කිව යුතු දෙය කියන්නට ඇය සිතුවාය... මිතුරිය ගත කලේ බොහෝ සාමකාමී කෙළිලොල් දිවියකි... එයට වැට බැන්ද නැතැත්තා ගැන ඇයගේ සිතේ දැන් තිබෙන්නේ සැබැවින්ම කෝපයකි... කෝපයට බොහෝ දේවල් කළ හැකිය... කෝපයට හරි වැරදි වුවද නොපෙනෙන බව ඇය නොදන්නවා නොවේ... ඇයගේ මේ කෝපය නැග ඇත්තේ මිතුරියට මොන වැරැද්දක් වුවද ඔහු ඇයව සඟවාගෙන නොසිට එවන්නට නොසිතූ හෙයිනි...

"ඒ වෙන සංජු කෙනෙක් වෙන්න බැරිද...?"

"ආරතී එහෙම කෙනෙක් නෙවෙයි... එයා සංජු කිව්වෙ සංජය පලන්සූරියට... එයා තමයි අන්තිමට ආරතී එක්කගෙන ගිය කෙනා..."

"ඔයා දැක්කද...?"

"නෑ... ඒත් වෙනදත් එහෙම යනවනං මට කියලා යනවා... එතකොට කියන්නෙත් එහෙම... සංජු එනවා... එයත් එක්ක ගමනක් ගිහිල්ලා එන්නං කියලා..."

"එතකොට එදා එන කථාවක් කිව්වද...?"

"නෑ... යනවා විතරයි කිව්වේ... එයා කිව්වා සංජු වෙහිකල් එකක් බැංකුව ළඟට එවනවා කියලා... එතනින් එහාට මං ඒක ගැන හොයන්න ගියේ නෑ සර්... ඒ... ඒ දෙන්නගෙ ප්‍රයිවේට් ලයිෆ් එක... මං ආරතී ගැන හිතන්න ගත්තෙ එයා මට කථා නොකරපු නිසා..."

"වෙනදා එහෙම ගියාම කථා කරනවද...?"

"ඔව්... එයා කථා කරනවා... ඒත් මේ පාරේ කථා කරේ නෑ... එදා බැංකුවෙ ඉඳගෙන මට කිව්ව දේ විතරයි... එයා කිව්වේ සංජු එතනට එනවා කිව්වා එයාව ගන්න... එයා ඉන්පස්සෙන්දා එන්නං කියලා..." තේජානි එක දිගටම මෙන් කියාගෙන ගොස් සෙමින් යළි



ඇයගේ දෑත දෙස බලා ගත්තාය... "ඒත් ඉන්පස්සෙන්දා වෙනදා වගේ කිව්ව විදියට එයා ආවේ නෑ..." ඇය තමා වෙත සිහිනයෙන් නම් ආවායැයි කිව නොහැකිය... ඇයගේ දෑසට කඳුලක් නැගිණ... ඇය එය පිසලා ගන්නට දැඩි වෙහෙසක් දරා දෙවරක් තුන්වරක් ඇස්පිල්ලන් ගසා යළි මුහුණ එසෙව්වාය... එහෙත් නෙතේ කඳුළ නාවෙන් දක්නට පිළිවන් විය... ඔවුන් ඔවුනොවුන්ගේ මුහුණු බලාගත්තේ සංජයගේ නම ඇසෙද්දී සැමෙහන්නට කැලඹී ගොස් මුහුණට මුහුණ බලාගත් අයුරිනි.

"මිස් තේජානි මේක බොහොම බරපතලයි... ඇත්තටම සංජය පලන්සූරිය කියන්නේ හොඳට රටම දන්න අඳුනන කෙනෙක්... ඉතින්..." ජයරත්න නැමැත්තා නම් ඇයගේ මුළු නමම හැසිරුවේය...

"මිස්ට ජයරත්න... වරදවලා වටහාගන්න එපා... එයා එහෙම කෙනෙක් වෙන්න ඇති... ඒත් මෙතනත් එයා ආරතී එක්ක යාළුවෙලා හිටියා... ඒ කොයි වගේ යාළුකමක්ද කියලා මං හිතන්නවත් අහන්නවත් ගියේ නෑ... ඒත් ආරතී මට කිව්වා එයා එයාව මැරි කරනවා කියලා තිව්ව කියලා... මං එතකොටත් කිව්වා ඒක වෙන්න බෑ කියලා... මිස්ට සංජය ආරතී නිසාම අවිස්සාවේල්ලේ ගෙයකුත් ගත්තා කියලා කිව්වා..."

"මේක බොහොම බරපතලයි..." ජයරත්න දෙවන වරටත් කීවේය..." මිස් තේජානි මේ වගේ කීමක් කියන්නේ වගකීමකින්ද...?" ඔහු එලෙසම ඇසුවේය.

"වගකීමකින් තමයි මං කිව්වෙ මිස්ට ජයරත්න... මං දැන් ඒ චෝදනාවත් ගේනවා... ඉස්සෙල්ලා මං උත්තරයක් දුන්නා විතරයි... ඒත් දැන් තව සැරයක් හරි... මට ඒ චෝදනාව කරන්න වෙනවා... ආරතී බඳිනවා කියලා එයා බොරු පොරොන්දුවක් දුන්නා වෙන්න පුළුවන්... ඒත් ආරතී මේ වගේ හංගගෙන ඉන්න එක එච්චර හොඳ දෙයක් නෙවෙයි..."

"මිස් තේජානි කියන්නේ මේ ආරතී කියන ළමයා මේ මිස්ට සංජය පලන්සූරිය හංගාගෙන ඉන්නවා කියලාද...?" එවර ඇසුවේ උසස් නිලදරුවාය... ඔහුද එවර ඇයගේ මුළු නමම කීවේය.

"ඒක මං දන්නෙ නෑ... මං උත්තර දුන්නේ මගෙන් ඇහුව ප්‍රශ්නවලට... ඒක හොයාගන්න එක මගේ රාජකාරියක් නෙවෙයි...

පුළුවන් නං මට යාළුවා හොයලා දෙන්න... ඒක ඔගොල්ලන්ගෙ රාජකාරිය..." ඇය කීවේ සියල්ලන්ගේම සිත් සසල කරවමිනි...

ආරක්ෂක නිලදරුවාට මේ තරුණිය හා නැගුණේ සැහෙන කෝපයකි... ඇය ජයරත්න කවරෙක්දැයි දැනගෙනම කථා කරන්නේද නොදැන කථා කරන්නේදැයි සිතිය නොහැකිය... මෙය මේ හෝටලයටම චෝදනාවක් කළ හැකි අවස්ථාවකි...

"මිස් තේජානි... මේ වගේ වෙලාවකදි හිතේ තියෙන වෙන දෙයක් තියෙනවනං..." උසස් නිලදරුවා කියන්නට ගත්තේ සමහරවිට මැයද සංජය ගැන ආශාවකින් සිටියේ නම් යන්න සිතමිනි... එසේ වුවහොත් මෙලෙස චෝදනාවක් කිරීම සාධාරණය... දැන් ඔහුට අවශ්‍ය වූයේ මේ තරුණිය සංජය පලන්සූරියට මෙම චෝදනාව එල්ල කරනුයේ එලෙස යමක් ඇයගේ සිතේ තිබෙන බව පැවසීමට සිතමිනි... හෝටලයට දිගු විය හැකි ඇඟිල්ල ඇය කෙරෙහි දිගු කරවීමට ඔහුට දැන් සිහි තිබිණ...

"වෙන දෙයක්...?" ඇය ඇසුවේ ඔහුගේ සිතිවිල්ල නොවැටහුණ හෙයිනි...

"ඔව් මිස්... සමහරවිට මිස්ට සංජය ගැන මිස්ගෙ..."

තේජානිගේ කෝපය දකිද්දී සැබැවින්ම සියල්ලෝම බියපත් වූහ... ජයරත්න පවා තරමක් පසු බෑ බව වැටහුණේ ඔහුගේ මුහුණ හොඳින්ම පෙනෙන්නට සිටි සමුදිටය...

තේජානි නැගිට්ටාය... ඉන්පසු ගොස් අසුනේ පිටුපසට දෑත් තැබුවාය... ඇයගේ දෑත් ඇඹරුණේ නිලදරුවාට ගසන්නට නොහැකි කමකින් බව දැන සිටියේ ඇය පමණය...

"සර්... මෙච්චර වෙලා මං හොඳින් කිව්වෙ... ආරතීට ඉස්සෙල්ලාම එයාගේ නමත් ලියපු කාඩ් එකකුයි චෙක් එකකුයි එයා එව්වේ... ඒකත් මං හොඳටම දන්නවා... ඒ මොකද ඒක එදා ගෙනාපු කෙනා දුන්නෙ මං අතට... ආරතීට දෙන්න කියලා... ඒක ආරතී එයාටම යැව්වා... මෙහෙ අපි කට්ටියක් ඉන්නවා ඒ වගේ දේවලට එකතු වෙන්නෙ නැති... ඒත් පස්සෙ කොහොම හරි ආරතීගේ ටෙලිෆෝන් නම්බර් එක හොයාගෙන මිස්ට සංජය එයත් එක්ක කථා කරලා තිබුණා... ඉන් පස්සෙ ඉතින් ආරතීටත් එයා ගැන හිතෙන්න ඇති...



මට කියද්දී මං කිව්වා... කළුගල්වල මල් හප්පගන්න එපැයි කියලා... ඒත් පස්සෙ පස්සෙ... සංජය කියන කරන ඒවා දැක්කම මං හිතුවා එයා ආරතී එක්ක හොඳ යාළුකමක් ගෙතියයි කියලා... බඳිනවා කියලත් පොරොන්දු උනා කිව්වා... ආරතී කියන්නේ මේ දකින දකින එක්කෙනා එක්ක යාළුවෙලා යන කෙල්ලෙක් නෙවෙයි..." කියූ ඇය කෙළින්ම උසස් නිලදරුවා දෙස බැලුවාය... "මාත් එහෙම කෙනෙක් නෙවෙයි..." ඇය කීවේ ස්ථිර ස්වරයකිනි. "ජොබ් එකක් නැති නිසා සිත්දු කියලා නම්බ කරගන්නට... ඒ වගේ අපේ ජීවිත ගැන ක්‍රිටිසයිස් කරන්න එපා..."

ජයරත්න උසස් නිලදරුවා දෙස බැලුවේය... නිලදරුවාගේ දෑසේ කෝපයක් දකිද්දී ජයරත්න සිතුවේ මේ තරුණිය බිය නැතිව මේවා කියද්දී මෙලෙස කෝපගෙන මෙය විසඳීමට නොහැකි බවය... ඔහු ආරතීගේ ඡායාරූපයක්ද මේ වෙද්දී දැක තිබුණේය...

ඇය රූමතියකි... සංජයට ඒ රූමත්කම දැනෙන්නට ඇත...

"අපි පොඩ්ඩක් මේක ගැන වෙන විදියකින් කථා කරමු..." ජයරත්න කීවේය... "මට මේක පුද්ගලිකව හොයන්න කිව්වේ අයෝමා... එයිට බෑ අයෝමා කරදරේක දාන්න... මිස් තේජානි අපි ටිකක් කථා කරමු... වාඩිවෙන්න..." ඔහු බොහෝ නැන්පත්ව ඉල්ලීමක් කළේය... සියල්ලන් දෙසම බැලූ තේජානි එවර වෙනත් කිසිවක්ම නොකියා යළි අසුනෙන් ඉදිරිපසට ආවේ ඇය සිටි අයුරින්ම වාඩි වූණාය... අයෝමා යනු මැඩම්ගේ නමය...

සැනසිල්ලක් දැණුනේ මෙනාලිට හා අනික් මිතුරියන් දෙදෙනාටත්ය... තේජානි කෝප ගනිද්දී ඇයගෙන් මොන මොනවා කියවේදැයි දැන් සමුදිට හා රුක්මිට නම් සිතාගත නොහැකිය... මිතුරියගේ අතුරුදහන් වීමෙන් සියල්ලන්ටම වඩා කම්පනයට පත්වී ඇත්තේ ඇයය... ඇය රෑ සිහින දකින අන්දම..., දවාලේ හීන දකිමින් බිය වෙන අන්දම... ඒවා මෙම විභාගයට අවශ්‍ය නැත... එහෙත් ඒ නිසා ආරතීගේ නැතිවීම තේජානිගේ සිතේ අන් සියල්ලටම වඩා තදින් සටහන් වී තිබෙන බව ඔවුන් දැන සිටියහ... එවැන්නක් ගැන ඔවුන් මෙනාලිට වුවද පවසන්නට ගියේ නැත... මේ විභාගයෙන් පසු හෝ ඒවා ගැන කියා තිබීම සුබ යැයි සමුදිට සිතුණේ තේජානි මෙලෙසින් හැල්ලුවකට ලක්වෙන බව දකිද්දී ඒ හැල්ලු කිරීම නමත්

දෙසද යොමු කිරීමට මේ ලොක්කා සූදානම් වුවහොත් යන හැඟීම ඇය පෙළද්දීය... අනික් අය කෙසේ වතුදු මේ උසස් ආරක්ෂක නිලදරුවා නම් කිසිම කමකට නැති බව ඇයට සිතිණ...

"දැන් මිස් තේජානි මේ කියන සංජය පලන්සූරිය කියන්නේ අපි කවුරුත් දන්න එක්කෙනාමද...?" ජයරත්න නැමැත්තා දැන් ප්‍රශ්න නගන්නට ආරම්භ කළේය...

තමාගේ සිතට සැනසුමක් දැණුනේ යැයි සමුදිට සිතිණ... අර නිලදරුවා නම් කමකට නැති එකෙකි... ඔහු තේජානි ගැන සිතුවේ... තමන් ගැන වුවද සිතන්නේ... මෙතෙක්ම මෙම හෝටලයේ සේවය සඳහා ආ සේවිකාවන්ට එවන් චෝදනාවක් කරන්නට තරම්... කිසිදු කෙනෙක් මෙතෙක්ම එලෙස කර නැත... මොහු සිටියහොත්... ඇයට බියක් දැණින... මේ තැනැත්තා ආවේ මීන් මාස දෙකකට පෙර බව ඇයට මතකය... ඔහු සංජය හා ආරතී ගැන නොදන්නේ යැයි කිව නොහැකිය...

"ඔව්... එයා කවුරුත් දන්න එක්කෙනාම තමයි..." ඇයගේ සිතිවිලි විසුරුවා ලමින් තේජානි කියනු ඇයට ඇසිණ...

"කවදද මේ සංජය පලන්සූරියයි මිස් ආරතීයි ඉස්සෙල්ලම මුණ ගැහුණෙ...?"

"මට දිනේ නං හරියටම මතක නෑ මිස්ට ජයරත්න... ඒත් එයා ආවෙ නං හෝටලේ පැෂන් ෂෝ එකකට චීෆ් ගෙස්ට් වෙලා... ඒකේ අපි සින්දු කිව්වා... එයා ආරතී දකින්න ඇත්තේ ඒ වෙලාවෙ... එදාම වගේ එයා ආරතීට කාඩ් එකකුයි චෙක් එකකුයි එවලා තිබුණා..." කියූ ඇය සෙමින් ෂෙනාලි දෙස බැලුවාය... "මිස් දන්නවනේ අපි ඒවා බාර ගන්න කැමැති නෑ කියලා කවදාවත්... ආරතී ඒවා එහෙමම ආපහු ඇරියා..."

"කොයි කාලෙ වගේ...?"

"ඒකත් මට නං මතක නෑ... ආරතීට නං මතක ඇති..." ඇය කීවේ එවර සමුදි හා රුක්මි දෙස බලමිනි... එලෙසම ඇය ජයරත්න නැමැත්තා දෙස බැලුවාය...

ජයරත්නට එක් දෙයක් පසක් විය... ඇය කියන්නේ මුසාවක් නම් නොවන බවය... ඒ සියල්ල ඇය කීවේ ඔහුගේ නෙත් දෙසම බලාගෙනය...



"ඒ ෂෝ එකේ ෆොටෝස් වලින් නං පුළුවන් වෙයි දවස බලාගන්න... ඊට සතියකට පස්සෙ විතර තමයි මිස්ට සංජය ආරතීගේ ෆෝන් එකට කථා කරේ... ඉනුත් මාසෙකට විතර පස්සේ යාළු උනා කියලා මං දැනගත්තේ... දැන් හරියටම බැලුවොත් මාස පහමාරක් විතර..."

"ඒ මාස පහමාර අතරෙ... මිස් ආරතී කී සැරයක් මිස්ට සංජය පලන්සූරිය හම්බවෙන්න ගියාද...?"

"ආරතීගේ ෂෝ එකක් නැති ගොඩක් දවස්වල ඒ දෙන්නා හම්බ උනා... මං දන්න තරමින් නිවාඩු දවස්වල ආරතී එයත් එක්ක එහෙ මෙහෙ ගියා..."

ජයරත්නට යමක් වැටහෙමින් තිබිණ... සංජය රූමත් තරුණියක සමග ගමන් බිමන් යන බව ඔහුට පැවසුවේ සංජයගේ මවය... වෙනදාට දෙතුන් දෙනෙක් සමග රවුම් ගසන සංජය මේ එකම තරුණියක හා එහෙ මෙහේ යෑම ගැන නම් ඇය බොහෝ බියවී සිටියාය... මේ විවාහ යෝජනාව ගෙන ආවේද ඒ නිසා බව ජයරත්න දන්නේය...

ඔහු අයෝමා නැමැත්තිය සමුවීමට ආවේද මේ ගැන සෙවීමටය... එහෙත් ඔහු ඊයේ එද්දී ඒ තරුණිය අතුරුදන් වී ඇති බව අයෝමා කීවාය... ඔහු ආ කාරණය එවර කියන්නට ගියේ නැත... ඔහු එම කථාව ගැන ඇසුවේය... තමා ගැන දන්නා නිසා ඇය තමාට මේ පිළිබඳව සොයන්නට කීවාය... එය හෝටලයේ නමට හානියක් නොවන පරිදි කළ යුතුය... සමහරවිට ඇයද මේ තරුණිය හා සංජය අතර සබඳකමක් තිබෙන බව දන්නවාද විය හැකිය... එලෙස වේදී ඇයට මේ ගැන කිසිවක්ම ස්ථිර තීරණයකට පැමිණිය නොහැකිය... ඇයගේ ගායිකාව මෙන්ම සංජයද විරසක කර ගැනීමට ඇය අකැමැති වන්නට ඇත... එය ගැන ප්‍රසිද්ධියේ කියන්නට ඇය නොසිතුවේ එහෙයින්ම විය යුතුය... දැන් මේ තරුණියගේ කථාවෙන් පෙනී යන්නේ සංජය එම තරුණිය හා සැහෙන සබඳකමක් ගෙන ගිය බවය...

සංජය අවිස්සාවේල්ලේ නිවසක් ගත්තේ කුමකටදැයි කවරෙක්වත් සොයන්නට බලන්නට ගියේ නැත... ඔහු ඒ ගැන කීවේ යන එන අතරමග නිදහසේ නැවතෙන්නට තැනක් ඔහුට අවශ්‍ය නිසා එවැන්නක් ගත් බවය... එය වැරැද්දක්ද නොවේ... සංජය ඒ ලෙසින් බොහෝ තැන්වල තරමක නිවෙස් රැගෙන තිබුණේය... ඔහු

සිටියහ... මාස කීපයක පටන් සංජයගේ බොහෝ ගතිගුණ වෙනස් වෙමින් පවතින බව මව ජයරත්නට කියා තිබිණ... එසේනම් හේතුව විය හැක්කේ මෙ තරුණියම විය හැකිය... ජ්වාට කාන්තාවන් ගෙන යන බවද කවුරුන් දැන අනුව මවගේ සැකයද ස්ථිර කළ මෙ තරුණියම විය හැකිය...

"එදා මොකද උනේ..?" ඔහු ඇසුවේය...

තේජානිට සතුටක් දැණින... මේ තැනැත්තා ඒ සබඳකම ගැන වෙනසක් නොපෙන්වූ හෙයිනි...

"එදා... එදා උදේ මං කිව්වේ... මං සල්ලි ටිකක් ගන්න බැංකුවට යන්න හිටියා... ඒ පාර ආරතී මට කිව්වා... මොකක්ද චෙක් එකක් දැම්මා ඒකෙ සල්ලි පොතට වැටිලාද කියලා බලන්න බැංකුවටම යන හින්දා මට නවතින්න කියලා... එයා අතේ තිබුණ සල්ලි ටික මට දීලා එයා ඒ ගමන්ම සල්ලිත් ගන්නවා කිව්වා... වෙනදත් එහෙම අපි කරනවා... එයාට ඇත්තටම මට වගේ සල්ලි ඔන කරන්නෙ නෑ... ඒත් ඉතින් ඒ වගේ උනොත් ඉඳහිට එක්කෙනෙක් ගිහින් බැංකුවෙන් සල්ලි ගන්න වෙලාවල් තියෙනවා... ගියේ නවේට විතර... මට කෝල් එකක් ආවා... දහයට විතර ඇති... ඇත්තටම මං වෙලාව බැලුවෙ නෑ... එයා කිව්වා... චෙක් එක රිලීස් වෙලා තිබුණා කියලා... බැංකුවෙ වැඩේ නං හරි ඒත්... සංජු එන්න කිව්වා... යනවා කියලා..." එක දිගටම කියාගෙන ගිය තේජානි නැවැත්වූවාය...

"කියන්න..." ජයරත්න ඇය දිරි ගැන්වූයේය... ජයරත්න නැමැත්තා හොඳින් සියල්ල අසා ගන්නා බව ඇයට සිතිණ... ඇය යළි පටන් ගත්තාය.

"මං ඇහුවා කොහොමද එන්න කිව්ව නං යන්නෙ කියලා... ඒ මොකද වෙනදා එයාව ගන්න මිස්ට සංජයම එනවා... නැත්තං කැබ් එකක් එවනවා... නැත්තං මෙහෙ අපි දන්න ත්‍රීවිල් එකක් තියෙනවා ඒකෙන් මිස්ට සංජය එන්න කියන තැනට යනවා... ඒත් එදා කිව්වෙ එයා එතනට ඇවිල්ලා මාව ගන්නවා කිව්වා... හෙට එන්නං කිව්වා... ඒත් අද වෙනකං ආරතී ආවෙ නෑ..." මෙතෙක්ම සිත තුළ තෙරපෙන සියලුම වේදනාව එක්තැන් කරගෙන සිතේ දහිරියෙන් එය කියාගෙන ගිය තේජානි එවර දැත් මුහුණට තබාගෙන හඬන්නට පටන් ගත්තාය...

සියල්ලෝම මුහුණින් මුහුණ බලද්දී ෂෙහාලි පසෙක සිටි



මිතුරියන් දෙදෙනා දෙස බැලුවාය... ඒත් ඇය කඳුළු සැලුවේ ඒ මොහොතේ පමණකි... ඇය මුහුණින් දැත් ඉවතට ගෙන පසෙක තිබූ ටිෂූ කොළයක් ගෙන මුහුණ පිසලා ගත්තී, එවර යළිත් ජයරත්නට මුහුණ දුන්නාය...

මව්පියන්ගේ හදිසි වියොවින් පසු ඇය බොහෝ දේවලට තනිකවම මුහුණ දෙන්නට සූදානම්ව සිටියාය... ඇයට වේදනාවක් මෙන්ම සතුටක් වුවද එක්වරම නවත්වා ගත හැකිය... ආරතීද එවැන්නියකි... ඒ දෙදෙනාගේම විශේශාංග බොහෝ විට සාර්ථක වන්නට ඇත්තේද එහෙයිනි... ඇයගේ එම වෙනස්වීම නොදන්නා කිහිප දෙනාගෙන් එය ගැන විශේෂයක් නොදැක්වූයේ ජයරත්න පමණකි... ඔහු ඇයගේ සිහිවිලි තරමක් දුරට වටහාගනිමින් සිටියේය...

"මං දන්නවා... මෙක මිස්ට සංජයගෙ මොකක් හරි... එයා බඳින්න යනවා කියලා ආරතීට කියලා තිබුණා... ඒත් ඒකට කැමැති නෑ කියලා... ආරතී හිටියේ හරි දුකකින්... ඒත් එයා කිව්වා මිස්ට සංජයලගේ කවුරුවත් එයාට නං කැමැති වෙන එකක් නෑ කියලා..." ඇය ඉන්පසු කීවාය...

"ඇයි මිස් තේජානි හිතන්නේ මේක මිස්ට සංජය කරපු දෙයක් කියලා... මිස් ආරතී වෙන කොහේ හරි ගියා වෙන්න බැරිද...?"

"පුළුවන්... ඒත් එහෙම ගියත් ඒ යන්න ඇත්තේ මිස්ට සංජය එයාට කරපු මේ වැරැද්ද නිසා..."

"සංජය වැරැද්දක් කරලා නෑ..."

"ඇයි නැත්තෙ... ආරතී පාඩුවෙ මෙතන අපිත් එක්ක එකට ජොබ් එක කරගෙන හිටිය කෙල්ලෙක්... එහෙම ළමයෙක් පස්සෙන් පන්නාගෙන ඇවිල්ලා... තැන් තැන් වල ගිහිල්ලා... බඳිනවා කියලා පොරොන්දු වෙලා... ඉන්පස්සේ මේ විදියට එක්කගෙන ගිහිල්ලා..."

"තාම අපි දන්නෙ නෑ නේ එයාමද එක්ක ගියේ කියලා..."

"මිස්ට ජයරත්න සොරි... මට එක දෙයක් තියෙනවා... වෙනදත් එහෙම කියලා එයාම තමයි ආරතීව එක්කගෙන ගිහිල්ලා තිබුණෙ... ඒක මෙදා නොවුණායි කියලා කියන්න මට බෑ... එහෙම වෙනවනං ඒ සීයේට එකක් විතර... සීයට අනූනවයක්ම ගෙනිච්චේ එයා කියලා මට කියතැකි..."

"සියේට එකක සැකයක් තියෙනවනං... මං ඒ සියේට එක ගැන හිතනවා..." ජයරත්න කීවේ තරමක සිනහවක් නංවමිනි.

"කමක් නෑ... ඒ එක නැති කරලා ඒක අනූනමේට එකතු වෙන කං මං බලන් ඉන්නවා..." තේජානි කීවාය...

අනික් සියල්ලෝම බියපත් වුවද, ජයරත්නගේ සිනහව පුළුල් විය... මෙවන් තැනක රැකියාව කරන ළඳුන් අතරද මෙවැනි කටකාරියන් සිටින බව දකින්නට ලැබීම භාග්‍යයකි... කෙසේ වුවත් හොඳ පවුලක ඉපදුණානං...

නැතහොත් මෙවන් රැකියාවක් නොකර වෙනත් රැකියාවකට යොමු වූවා නම් මැය ගැන සිතන්නටද සංජය වැන්නන් එන්නට තිබිණ...

බියපත් වූවන්ගේ හදවත් සිහිල් වූයේ ජයරත්නගේ සිනහව දකිද්දීය...

"ඔන උනොත් අපිට ආරතීගේ කාමරේ බලන්න පුළුවන් නේ...?" එවර ඔහු ඇසුවේ ෂෙනාලිගෙනි...

"පුළුවන් මිස්ටර් ජයරත්න... එයයි මෙයයි තමයි රූම් මේට්ස්ලා..."

"මිස් තේජානිගෙන් ඉඩ ලැබෙයි නේ...?" ඔහු ඇසුවේ තරමක විහිළු ස්වරයකිනි... එහි තිබුණේ අපහාසයක් හෝ උපහාසයක් නොව විහිළුවක්ම බව තේජානිට නම් දැණින... ඇය ඒ ස්වරයට කැමැත්තීය... එවන් පුද්ගලයින් හා කථා බහ කිරීම බොහෝ පහසුය...

ඇය හිස සැලුවාය... එහි දැන් අර ආභරණ පෙට්ටියද තවමත් ඇත... ඇයට වෙනත් යමක් කියන්නට තරම් අවශ්‍යතාවයක් නැති වුවද ඇසුවහොත් ඇය සංජය තමාට කථා කළ බව කියන්නටද සිතා සිටියාය...

සමුදි වෙලාව බැලුවාය... දැන් මේ විවේක ගන්නා කාලයය... අද පුහුණුවීමක් වත් හරියාකාරව කර ගත නොහැකි විය... දැන් ඉතින් පිහිටට ඉන්නේ මයන්තය... හීලත් ඊයේ පුහුණුවීම් කළද...

ඇය වෙලාව බලනු දකිද්දී තේජානිටද සේවය මතක් විය... ඇයද වෙලාව බැලුවාය... ඉන්පසු ෂෙනාලි දෙස බැලුවාය.

"මිස්... මං එහෙනං යන්නද...?"



ෂෙනාලි හිස සැලුවද, ජයරත්න දෙස බැලුවාය... ඇයගේ සිතටද මේ අළුත් ආරක්ෂක නිලධරුවා ගැන කහටක් පැමිණ තිබිණ... ඇයගේ මෙම සේවාවද දැන් අවුරුදු දහයකටත් වඩා දිවෙන්නකි... මෙලෙස මෙම නේවාසිකාගාරයේ සිටි, සිටින කිසිම ගායිකාවකට හෝ රංගනියකට ඇඟිල්ලක් දිගු කරන්නට කවරෙක්වත් නොසිතූ බව ඇය දන්නීය... ඔවුන් සේවාව සපයන්නේම හෝටලයටම පමණක් බව ඇය දන්නීය... වෙනත් සේවාවල සිටින තරුණියන් ඔවුනොවුන්ගේ සේවාවන්ද සපයා ගන්නා බව ඇය දැනුවත්ව සිටියාය...

"මිස්ටර් ජයරත්න මොකද...? මෙයාගෙන් ඉන්ක්වයරි කරලා ඉවරද...?" ෂෙනාලි අසද්දී සමුදි හා රුක්මි තරප්පු පෙළේ පඩි දෙක තුනක් නගිමින් සිටියහ.

"ඔව්... දැනට..." කී ජයරත්න නැගිටී තේජානි දෙස බැලුවේය... "තමත් හැන්කං මිස් තේජානි එක ප්‍රශ්නයක්..."

"අහන්න මිස්ටර් ජයරත්න..." තේජානි කීවාය...

"මිස් තේජානි දැන් ආරතී ගැන හෙව්වේ බැලුවේ නැද්ද දවසක් තරම් උනාම...?"

තේජානි සුසුමක් හෙළුවාය...

"හෙව්වා... දවස් දෙකක් ගිහිල්ලා එයාගේ සෙල් එකෙන්වත් උත්තරයක් නැති කොට...?" එක්වරම සංජය ගෙන් ඇසූ බව ඇයට කියන්නට නම් නොහැකිය...

"කාගෙ කාගෙන්ද...?"

"ඉස්සෙල්ලම මං ඇහුවෙ එයා හිටිය ගෙදරින්... ඊළඟට මං ඇහුවෙ ඇත්තටම නං මිස්ටර් සංජය ගෙන්..." ඇය කීවේ බොහෝ පැහැදිලි අන්දමිනි... රුක්මි හා සමුදි යන දෙදෙනම එක්වරම නැවතුණේද පිටුපස හැරී මිතුරිය දෙස බලන්නටද බිය වූහ...

ෂෙනාලි සියල්ලටමත් වඩා බිය වුණාය...

"සංජයගෙන්... එතකොට මිස් තේජානි ළඟත් සංජයගේ නම්බර් එකක් තියෙනවද...?" ජයරත්න ඇසුවේ සැබැවින්ම සංජය කවරෙක්දැයි ඔහු හොඳින්ම දැන සිටි බැවිනි... සංජය රූමත් යුවතියන් ගැන බොහෝ දැස් අලවන තැනැත්තෙකි... මේ යුවතියද රූමත් ය...

"නැහැ..." තේජානි කීවාය... එවර මිතුරියන් දෙදෙන සැනසිල්ලේ මුහුණට මුහුණ බලාගනම යළි විසිත්ත සාලය දෙසට හැරුණේ ඒ දෙසට දෑස් යොමු කර ගනිමිනි...

"එහෙමනං...?"

"මට ආරතී ගැන දැනගන්න තියෙන්නේ තැන් තුනයි මිස්ට ජයරත්න... ආරතීගේ ගෙදරින්... ආරතී හිටපු ගෙදරින්... ආරතීගේ බෝයි ෆ්‍රෙන්ඩ් ගෙන්... එතනදි එක්කගෙන ගිය කෙනාගෙන්... එක්කගෙන ගියේ සංජය කියලා මං දැනගෙන හිටියේ ආරතී මට කිව්ව නිසා... ආන්ස්වර් එකක් නැති උනාම මං කළේ ආරතීගේ ෆෝන්ස් දෙකටම සංජයගෙ නම්බර් එකක් තියෙනවද කියලා බලන එක..."

"කොහොමද...?"

"අල්මාරියේ යතුර තියෙන තැන මං දන්නවා... මෙ වෙලාවේ අල්මාරියේ යතුර අරගෙන අල්මාරිය ඇරියා... හරි වැරදි හොයන්න මං ගියේ නෑ... යතුර අරගෙන අල්මාරිය ඇරියා... ආරතී එහෙමට ඒකේ හෑන්ඩ් බෑග් එකක පොඩි කාඩ් එකක් තිබුණා... ආරතී එහෙමට අයගේ නම්බර්ස් තියාගන්නේ නෑ... ඒක මිස්ට සංජයගේ වෙන්න ඇති කියලා මට හිතුණා... මං ඒ නම්බර් එකට කථා කළාට ආන්ස්වර් කළේ නෑ... මගේ ෆෝන් එකට ආවා වෙනම කෝල් එකක්... ඒ කථා කරලා තිබුණේ මිස්ට සංජය..." එක දිගට කියාගෙන ගිය ඇය නැවැත්තුවාය... ඇයගේ සිතට සැහෙන පීඩනයක් දැණින... දැන් ඔහු කියූදේත් කිව යුතුය...

"ඒ කියන්නෙ සංජය ළඟ මිස් තේජානිගේ නම්බර් එකත් තිබුණා කියලානෙ..." එවර කීවේ උසස් නිළදරුවාය...

තේජානි ඔහු දෙස බැලුවේ ඔහු දවා හළු කරන්නට තරම් බැල්මකි... ඔහු හදන්නේම තමාට කළු තීන්තක් ගෑමටය...

"සර් දන්නවද දන්නෙ නෑ... අපි හැමෝටම මෙහෙන් දීලා තියෙනවා ෆෝන් එකක්... ඒකේ තමයි අපි හැමෝගේම නම්බර්ස් තියෙන්නේ... ඒත් අපේ ලයිෆ් ස්ටයිල් එකේ හැටියට... ඒක හැමෝම දන්න නම්බර් එකක් නිසා අපි වෙනමත් අරගෙන තියෙනවා ප්‍රයිවේට්ම ෆෝන් නම්බර් එකක්... ආරතීයි මායි මෙගේ ඩ්‍රම්ස් ගහන මල්ලියි අපි තුන්දෙනාම ගත්තේ එකට... එක ළඟ නම්බර්ස්... ඒක මිස්ට සංජය දන්නවා කියලා මට කථා කරපු ඒ පළවෙනි සැරේම මිස්ට සංජය කිව්වා... මගේ නම්බර් එක ආරතීගේ නම්බර් එකට පස්සේ තියෙන



නම්බර් එක බව එයා දන්නවා කියලා..." ඇයගේ විස්තරය බොහෝ පැහැදිලි විස්තරයක් විය... ආරක්ෂක නිළදරුවා තරමක් නොසන්සුන් වෙද්දී ජයරත්න නැමැත්තා බොහෝ සාවධානව සියල්ල අසා සිටියේය...

"එයත් ආරතීට කථා කරන්න බලලා නැති නිසා කිව්වා මට කථා කරන්න හිතුවෙ... ඒත් එයා මට කථා කරලා තිබුණේ මං එයාගේ නම්බර් එකට කෝල් එකක් ගත්ත නිසා කියලාත් කිව්වා... ඒ කියන්නෙ ඒ එයාගේ නම්බර් එකක්..." ඇය කීවේ ජයරත්නටය...

"ඒක මට ගේන්න පුළුවන්ද...? අනික ඔයාගේ ෆෝන් එකෙත් ඇති නේ සංජය කථා කරපු නම්බර් එක..."

"මං දෙකම වෙනම ලියලා තිබ්බා මිස්ට ජයරත්න..."

"නම්බර් එක මිස් තේජානිගේ ෆෝන් එකේ නම එක්ක සේව් කරගත්තෙ නැද්ද...?" එම ගොන් ප්‍රශ්නය ඇසුවේ අර නිළදරුවාය...

...ගොනෝ මේ මෙවගේ වෙලාවකදි එහෙම නොකර ඉන්නවද... තේජානිට සිතට ආ පැණියය... එහෙත් එලෙස ඇසිය නොහැකිය... ඒ තැනැත්තා මෙහි තමාට වඩා උසස් තැනැත්තෙකි...

පැණියට වඩා හොඳින් ඇයගේ සිහිවිලි ක්‍රියාත්මක වී තිබිණ...

"එහෙම නොකර මට බැරි උනා සර්... ආයෙත් ප්‍රශ්නයක් ආවොත් මට කථා කරන්න ඕන නිසා මං ඒ මට කථා කරපු නම්බර් එක ඒකේ විතරක් නෙවෙයි... මෙහෙන් දුන්න එකෙත් සේව් කරගත්තා... නම්බර්ස් දෙකම..." ඇය කීවේ කට කොණකට නගාගත් උපහාස සිනහවකිනි...

නිළදරුවා බලාගන්නට අතක් නැතිව මෙන් ජයරත්න දෙස බැලූ අතර සිතට ආ සිනහව පිට නොකරන්නට සිතමින් ජයරත්න ඉන්පසු පැණය නැගුවේය...

"දැන් මිස් තේජානි මෙතනට ගෙනැල්ලා තියෙනවද ෆෝන් එක...?"

"උඩ ඇති..." කී ඇය මිතුරියන් දෙස බැලුවාය... "සමුදි මගේ මේසේ උඩ ඇති ෆෝන් එක... ඒකයි එතනම ඇති පොතක්... ඒකයි ගේන්න..." ඉන්පසු කීවාය... සමුදි වෙනත් කිසිවක් හෝ නොකියා උඩට ගියාය...

මිතුරිය කීවාක් මෙන් මෙසය උඩ දුරකථනය සමගම තවත් කුඩා පොතක්ද තිබිණ...

තේජානි මෙතරම ආරතී ගැන බියවී ඇත්තේ ඇය සංජය හාද කථා කළ නිසා විය යුතුය... එසේනම් දූන් මිතුරිය කා ලඟවත් නැත... එසේනම්... පොත ගන්නා අතරම සමුදිගේද සියොළගම සිහිතල විය...

ජයරත්න ඒ අතර යළිත් තේජානිට කථා කළේය...

"මිස් තේජානි... එතකොට සංජයගේ ෆෝන් එකට මිස් කථා කරාම එයා කථා කරා කියලා කියන්නේ මිස් ආරතී එතන නෑ කියන එකනේ..."

"ඔව්... එයා ආරතී ගැන දන්නෙ නෑ කියලා තමයි කිව්වේ... "ඔව්... එයා ආරතී ගැන දන්නෙ නෑ කියලා තමයි කිව්වේ..."

"ඔව්... එයා ආරතී ගැන දන්නෙ නෑ කියලා නැති නිසායි... මගේ ෆෝන් එයාත් කෝල් කරන්න බලලා බලලා නැති නිසායි මට කථා කරලා තියෙන්නෙ..." එකෙන් ගිය රින් කට එක නිසායි මට කථා කරලා තියෙන්නෙ...

"එතකොට ඔයාගේ අර චෝදනාවෙන් සංජය නිදහස් නේ..."

ජයරත්න සිනහසී කීවේය... ඒ උපහාසයක් නොවන බව ඇයට සිතිණ... මේ ජයරත්න නැමැත්තා බොහෝ තැන්පත්ව සියල්ල කල්පනා කරන තැනැත්තෙකි...

ඇය සුසුමක් හෙලුවාය...

"මිස්ට ජයරත්න හරි... එහෙම කිව්වම එයා නිදහස්... එයා කිව්වේ ආරතී එයා හම්බවෙන්න ආවෙ නෑ... එයා හිටියේ අම්පාරෙ කියලා... ඒ වෙලාවේ ආරතී කිව්වෙ සංජු හම්බවෙන්න යනවා කියලා... දූන් මිස්ට සංජය කියන්නෙ නෑ කියලා... එතකොට විශ්වාස කරන්න ඕන දෙන්නගෙන් කවුරු කියන බොරුවද කියලා මං මිස්ට සංජයගෙන් ඇහුවා..."

ජයරත්න නැමැත්තාට සිනහවක් ගියේය... ඔහු එය නවතා ගත්තේ සැබැවින්ම මේ තරුණිය බිය නැත්තියක බව සිතමිනි... සංජය කවරෙක්දැයි දූන දූනම එලෙස පැණයක් නැගීමට සිතුවේ නම්... ඇය ගැන වෙනත් කථාවක් අවශ්‍ය වන්නේ නැත.

"සංජය මොනවද කිව්වෙ...?" ජයරත්න ඇසුවේ සැහෙන උනන්දුවකිනි.

"බොරුවක් කියන්න ඕන වෙලාවට එයා බොරුවක් කියන්න



පුළු බහින්නෙ නෑ කියලා කිව්වා... ඒක මට දූණුනා... ඒ කියන්නෙ මිස්ට සංජය ආරතී ගැන දූනගත්තත් අපිට කියන එකක් නෑ... සමහරවිට ආරතී හංගගෙන හිටියත්..."

"ඇයි හිතන්නේ එහෙම හංගගෙන ඉන්නවා කියලා..."

තේජානි වටපිට බැලුවාය... තමාගේ පුද්ගලික සිතිවිලි මෙලෙස සියල්ලෝම ඉදිරියේ වමාරන්නට නොහැකි බව ඇයට සිතිණ.

"කියන්න ජානි... ඔයා හිතන්නේ ඇයි... කමක් නෑ අපි හිටියට..." ඇයගේ සිතිවිලි වටහාගත් මෙනාලි කීවාය... ඇය බිය නැතිව සංජය නැමැත්තාටද කථා කර ඇත... එසේනම් ඇය මෙලෙස එකල මෙකල වන්නේ මිතුරියගේ ගෞරවය ගැන සිතමින් බව ඇයට නම් වැටහිණ...

"මිස්ට සංජයට ප්‍රොපෝසල් එකක් ඇවිල්ලා නිසා ආරතීව වෙනම තියාගන්න හිතාගෙන හරි... නැත්තං එයාට වෙන අසනීපයක් හැදිලා හරි..." ඇය ඒවා කීවේ නම් තරමක් පැකිලෙමිනි...

මෙහිදී ඇයට මිතුරිය ගැන කියද්දී අනියම් වචනය යෙදීමට නොහැකිය... එලෙසම දරුවෙක් කුස පිළිසිඳ ගෙන ඇත්නම්... යන සැකය කියන්නටද නොහැකිය... ඒවා මෙනාලිට නම් වැටහිණ... ඒවා ගැන පුහුණුවීම් ශාලාවේදී විහිළුවෙන් විහිළුවෙන් කථා බස් කළ බැවිනි... එහෙත් ඒවා විහිළු වශයෙන්ම මිස සැබෑවක්යැයි කියන්නට නම් ඔවුන්ට නොහැකිය... ආරතී එලෙස වූවද මෙලෙස කෙසේවත් කථා නොකර සිටිනු ඇතැයි කිසිවෙකුත් සිතන්නට අකැමැති විය...

"මිස්ට සංජය එයා ගැන කිව්වේ හොඳ යාළුවෙක් කියලා... ඊත් එයා හොඳ යාළුවෙක් නං... මේ වෙද්දි ඇත්තටම ආරතී නැතිවෙලා කියලා දන්නවනං එයාම ඉදිරිපත් වෙලා හොයවන්නත් ඕන... එහෙම නේද...?" තේජානි ඇසුවේ එවර ජයරත්නගෙනි... "එහෙම නැති නිසා තමයි තාම මිස්ට සංජයගෙන් කථාවක්වත් නැත්තෙ..." ඇය කීවේ එවර චෝදනාත්මක ස්වරයකිනි. "මිස්ට සංජය ආරතීට පෙන්නලා තියෙන්නේ බොරු කැමැත්තක්..." ඇය ඉන්පසු කෙළින්ම කියා දැමුවාය...

නැතැයි කියන්නට කාහටවත් නොහැකි බව ජයරත්නට සිතිණ...

"මිස් තේජානි කිව්ව අර අනික් තැන් දෙකෙන් අහලා බැලුවද...?"

"ඔව්..." තේජානි කිව්වේ පහළට ආ මිතුරියගෙන් ඇයගේ දුරකථනය හා පොතත් ගන්නා අතරමය... "ආරතී මිසිස් බොතේජුලගෙ ගෙදරත් නෑ... එයාගේ ගෙදර ගිහිල්ලත් නෑ..."

"කවුද එයාගේ ගෙදරට ගියේ...?" එවර නම ඇසුවේ ෂෙනාලිය...

"අපි ඇරියෙ නං මිස් අන්කල්ව..." ඇය පිළිතුර දුන්නේ මෙ ප්‍රශ්න කිරිල්ලට මයන්ත නොගැවෙන්නේ නම හොඳ බව සිතමිනි,

"මයන්තගේ තාත්තා...?" ෂෙනාලි ඇසුවාය.

ඇය හිස සැලුවාය. ෂෙනාලිගේ සුසුමක් පිටවිය...

"කවුද මෙ මයන්ත...?" ජයරත්න ඇසුවේය...

"එයා අපේ ගෲප් එකේ ඩ්‍රමස් ප්ලේයර්... එයාගේ තාත්තාගේ ත්‍රී වීලර් එකක් තියෙනවා... එයා එක්ක තමයි මෙගොල්ල ගොඩක් වෙලාවට යන්නෙ එන්නෙ... එයා නැත්නං තව එක්කෙනෙක් ඉන්නවා... රත්සිරි කියලා... අපි ඒ දෙන්නම ගැන දන්නවා... එහෙමත් නැත්නං හොටෙල් එකේ වාහනයකින්..." එය විස්තර කළේ ෂෙනාලිය...

"එතකොට එදා මිස් ආරතී ගිහිල්ලා තියෙන්නෙ කොහොමද...?"

"එදා එයා බැංකුවට ගියේ නං මෙහේ වාහනයකින්ලු... ආරතීව බැංකුවෙන් බස්සවලා තියෙනවා... ඊට පස්සේ වාහනේ ළඟටම ඇවිල්ලා කිව්වළු යාළුවෙක්ගේ වාහනයක් එනවා කිව්ව නිසා එයාට යන්න කියලා... අපේ එක්කෙනා ඇවිල්ලා..." ඒ පැණයටද පිළිතුර සැපයුවේ ෂෙනාලිය... මෙ තරුණියත් බොහෝ හොඳින් ආරක්ෂා වෙන බව දන්විය යුතුය... ඇයටද මෙ ආරතීගේ නොපැමිණීම බොහෝ සැකයක් දුන් පහළ කරවා තිබිණ... ආරතී වගකීමක් නැති තරුණියක නොවේ... ඇය එතෙක් මෙතෙක් මෙලෙස කිසිවෙකුටත් පණිවිඩයක් නොදී සතියක් නේවාසිකාගාරයෙන් පිටව සිටියේ නැත...

"ඒ කියන්නේ එයා එතන වාහනේ නවත්තාගෙන ඉඳලා තියෙන්නේ ආයේ මෙහේ එන්න බලාගෙන..." ජයරත්න කීවේ තරමක් කල්පනා සහිතවය... සැබැවින්ම මෙම තරුණිය එසේනම් නැතිවී ඇත... ඇය යන්නට ඇත්තේ ඒ යාළුවා සමගය...

යාළුවා සංජය විය හැකිය... එහෙත් ඔහුද දන්නා තරමින්, තේජානි කීවාක් මෙන් ඔහු එදා සිටියේ අම්පාරේය... එය නම් ජයරත්නද



දන සිටියේය... එලෙස සිටිමින් ඔහු මෙහි කුමක් හෝ ඇයව සඟවා ගන්නට කිසියම් ක්‍රියාමාර්ගයක් ගත්තේද...? සංජයට ඇයගෙන් ඉවත් වීමට නොහැකි කරුණක් වත්... ඔහුටද සිතුණේ දරුවෙක් නම යන සිතිවිල්ලය... මැයගේ සැකය සාධාරණය...

"කෝ මිස් තෙජානි අර නම්බර් එක...?" ඔහු ඇසුවේ ඉන්පසු තේජානිගෙනි...

තේජානි පොත විවර කර ඒ මැද තිබුණු අංකය සහිත එම කාඩ්පතම දුන්නාය... ජයරත්න බැලූ බැල්මට තිගැස්සුණේය... ඒ සංජයගේ අත් අකුරින්ම ලියූ ඉලක්කම් කිහිපයක් බව ඔහු දැනගත්තේය... පහළින් අංකයක් ලියා තිබෙන්නේ නම තේජානි නැමැත්තිය විය යුතුය...

ඔහු ඇය දෙස බැලුවේය...

"උඩ එකට මං කෝල් කරාට... ඒකෙන් කථා කළේ නෑ... ඒත් මගේ එකට කෝල් එකක් ආවා පහළින් තියෙන නම්බර් එකෙන්..."

ඇයට දකුණත පා නිහඬවන්නට කියූ ඔහු උඩින් තිබෙන අංකය ගත්තේය... ඇල්පෙනෙත්තියක් බිම වැටුණත් ඇසෙන නිශ්ශබ්දතාවයක් එහි මැවිණ... උඩ තිබෙන මහ ඔර්ලෝසුවේ ටික් හඬ පවා පහළට ඇසිණැයි තේජානිට සිතිණ... ඒ ඇයගේ හදවතද එලෙසම ගැහුණ හෙයිනි... මෙ වෙද්දීත් සංජය මෙම අංක දෙකම ඉවත් කර ඇත්දැයි ඇය දන්නේ නැත... ඇයටද සිතුණේ ජයරත්නට සිතුණු සිතුමය...

ඔහු එවැන්නක් කර ගත නො හැකි පුතෙක් නොවේ...

එදෙසින් කථා කළා වැනිය...

ජයරත්න...

"හලෝ..." කියමින්ම ඉදිරියට ගියේය... ඔහු කථා කළේ කුමක්දැයි කාහටවත් ඇසුණේ නැත... එහෙත් එද්දී ඔහු බැලුවේ තේජානි දෙසය... ඇය දෑස් දල්වා බලාගෙන සිටිනු දකිද්දී ජයරත්නට දුකක් ද දැනින... ඇය මෙතෙක්ම කියා ඇත්තේ සත්‍යයම පමණකි... එහෙත් ඇය නොදන්නා එක කරුණක්ද ඇත... ඒ දෙසින්ද පවසා ඇත්තේ සත්‍යයක්ම බවය... කෙසේ වූවත් ඔහු ඉක්මණ් නොවිණ... එදෙසින් ඒ කථා කළේ සංජය නොවන හෙයිනි... ඒ තැනැත්තාටද නොහැඟෙන්නට සංජය

විසින් ආරති නැමැත්තිය හැඟුවා වන්නටද පිළිවන... නිවසින් ඇයව කරදරයක් වේදැයි සිතමින් හෝ... නැතහොත් ඔහුට ඇයව නිහඬකරවන්නට කිසියම් අවශ්‍යතාවයක් ආ හෙයින් හෝ... ඔහු සිතුවේ සංජය මාතර ගොස් එනවිටම තමා මුහුණ ගැසෙන්නට එන්නට කිමය... අද දූන් ඔවුන් එයින් පිටත් වී ඇත... සංජය එන්නේ ඉදිරි වාහනයේ නිසා වාහනය නැවැත්වූ වෙලාවක සංජයට ජයරත්නගේ පණිවිඩය දෙන බව දුරකථනයට කථා කළ තැනැත්තා කීවේය...

සංජයගේ දුරකථනයට ඔවුන්ට කථා කරන්නට එපායැයි කියා තිබිණ... ඒ මොහොතේදී ඔහු තරමක් බැ(ර)රුම් දුරකථන සංවාදයකට යොමුවී සිටි බැවිනි... ජයරත්න එය පිළිගත්තේය... සංජය එවැන්නෙකි... පුද්ගලික දුරකථන කථා බහ නම් බොහෝ විට ඔහු වාහනයේ යද්දී කථා කරන්නේ කිසියම් නොකරන බව ජයරත්න දන්නේය... කථා කරන්නේ කිසියම් කාර්යයකට අවශ්‍ය දෑ පමණකි...

අනෙක් අතට මේවා සංජය සමග වුවද, දුරකථනයෙන් කථා බස් කරගත හැකි දේවල් නොවේ... එක් අන්දමකින් බැලුවහොත් ඔහු සංජයගේ පියා හා මවද හොඳින් හඳුනන්නේය... ඉතින් සංජය මෙවන් කෙල්ලක හා...

දෙවන වර ඔහුගේ අදහස වෙනස් විය... සැබැවින්ම සංජයට යෝජිත යුවතිය වුවද, මේ යුවතිය තරම් බුද්ධිමත් බවක් නැත... ඇයගේ උගත්කම ඇත... පොහොසත් කම ඇත... ලස්සණ වුවද...

හොඳින් බැලුවහොත් මේ යුවතියද බොහෝ රූමතියකි...

සියලු දෙනාගේම සමාජය හා වත් පොහොසත් කම් නොසලකා එකම හැඩයේ ඇඳුමක් අන්දවා කිසිදු රූප ලාවණ්‍යයකින් තොරවූ මුහුණකින් යුතුව... එකම කාමරයකට දමා කෙනෙක් තෝරා ගන්නට කීවහොත්... සියල්ලෝම මෙම රූමතියන් තෝරා ගන්නා බව සක්සුදක්සේ පැහැදිලිය... රූප ලාවණ්‍යයකින් තොරවද මැය රූමත්ය... තමාගේ වයසටත් මැය රූමත් ලෙසින් පෙනේ නම්...

"කවුද මිස්ට ජයරත්න... ඒ මිස්ට සංජය නේද...?" ඇය ඇසුවාය... සියල්ලෝ මුහුණින් මුහුණ බලාගත්තේ ඇය බිය නැතිව ඔහුට කථා කරද්දීය... තේජානිට ඒ කිසිවක්ම වැටහුණේ නැත.

"සංජය නෙවෙයි..."



"නෙවෙයි...?" ඇය ඇසුවේ පුදුමයෙනි... එසේනම් සංජය තමාට කථා කළේ කෙසේද...? "එහෙනං එතකොට..."

"මේ නම්බර් එක සංජයගේ එක ෆෝන් එකක්... මේක තියෙන්නේ සංජයගේ ප්‍රයිවේට් සෙකට්‍රි කෙනෙක් ළඟ... වැටෙන නම්බර්ස් වලට එක සැරේම ඒ ගොල්ල කථා කරන්නේ නෑ... ඒවා සංජයට කියනවා... එතකොට අවශ්‍ය නං සංජය කථා කරනවා..."

එදා සිදුවන්නට ඇත්තේ එය විය යුතුය... ඇයට සිතිණ...

කෙසේ වූවත් සංජය නැමැත්තා තමාගේ මිතුරිය සඟවාගෙන සිටින බව ඇයට සිතින් ඉවත් කරලීමට අපහසු විය...

ඇයගේ හුසුම බරට දැණුනේ ජයරත්න නැමැත්තාටය... ඔහු ඇයගේ මුහුණ දෙස හොඳින් බැලුවේය... ඇයගේ සිතින් ආරති ගැනත් සංජය ගැනත් අමතක කරලිය නොහැකිවා වැන්නක් එහි ලියැවී තිබිණ... මෙම අතුරුදන් වීම ඇයටද සැහෙන්නට බලපා තිබෙන බව ඔහු සිතුවේය...

"අපි එහෙනං යමු නේද...? මං චෙක් කරවලා බලන්නං ටිකක්..." ඔහු කීවේ ෂෙනාලිටය...

කොහෙන්දැයි අසන්නට තේජානිට බිය සිතිණ... සමහරවිට පොලිසියෙන් වන්නට ඇත... තරාදියේ බර වැඩි පැත්ත වන්නේ සංජයය. ආරතිට කරදරයක් කරන්නට එපායැයි කියන්නටද ඇයට මුව නගා ගත නොහැකි විය...

"මේ ආරතී කියන ළමයා හිටිය රූම් එක බලන්නේ නැද්ද...?" ඇසුවේ උසස් නිළදරුවාය.

"පස්සේ බලමු..."

"එහෙනං අපි ඒකට සීල් තියමු..."

"ඒ මොකටද...?" ඇසුවේ තේජානිය.

"මේ ළමයාගේ ප්‍රශ්න වැඩියි..."

"සීල් තියන්නේ මොකක් හරි මිනීමැරුමක් වගේ දෙයක් වෙලා තියෙනවනං නේ... ආරතී මැරිලා කියලා සර් කියන්නේ කොහොමද...?" ඇය ඇසුවේ කෝපයෙනි.

සැබැවින්ම සේකර නැමැත්තා ගැන දැණුමෙන්

ජයරත්නට සැබැවින්ම සෙල්ලම් බඩු ලෙස සලකන්නට පිළිකුලකි... මෙවැනි තරුණියන් සෙල්ලම් බඩු ලෙස සලකන්නට නොහැකි බව ඔහු සිතුවේය... සැබැවින්ම මොවුන් කරන්නේ රැකියාවකි. මෙතන සියල්ලම ගැන සලකද්දී මෙම ළඳුන් සමාජයෙන් කොන් වී සිටින්නේ රැකියාවේ වැරැද්දෙන් නොව ඒ රැකියාවේ තත්ත්වය බොහෝ අයට නොගැලපෙන නිසා බව ඔහු සිතුවේය...

ඊයේ රාත්‍රියේ ඔහු මෙම තරුණියගේ ගීතයද ඇසුවේය... ඇය ඉංග්‍රීසි ගීතයක් පමණක් සැබැවින් ම ඇය දක්ෂ තරුණියකි... නොව හින්දි ගීතයක්ද ගැයුවාය... රැඟුවාය...

එම ගැයුමක් හෝ රැඟුමක් මාධ්‍ය ජාලයක ගියේ නම්... ඇයට කෙටි පණිවිඩ යවන්නටද ඔනෑතරම් අය සිටින්නට පිළිවන... ඔවුන් මුළු සිරුරම සලිත කරවා මුළු මහත් ජනතාවකට සිරුර පෙන්වමින් ගී ගයද්දී රඟද්දී, මෙම තරුණියන් බඩවියත රැක ගැනීමේ චේතනාවෙන් මුළු සිරුරම වසාගෙන එවැන්නක් රැකියාවකට කරද්දී, එම රැකියාව කරන ළඳුන්ට පමණක් මිනිසුන් ගරහන්නේ කිමදැයි ඔහුට සිතාගන්නට නොහැකි වූයේ සැබැවින්ම ඊයේ දිනයේය...

මෙතෙක්ම ඔහු දැක තිබුණේ අඩ නිරුවත් රැඟුම්ය... වෙනත් සමාජ ශාලාවල්වල වුවද මෙලෙස නීති රීති මැද විනය ගරුක අන්දමින් මෙම රැකියාව කරන්නියන් සොයා ගැන්මට නම් ඔහුට නොහැකි විය... ඇසූ දුටු සියල්ලෙන්ම ඔහු බොහෝ දේ තීරණය කරගෙන සිටියේය... එන්නට පළමු ඔහු ඔත්තු කරුවාගෙන් දැනගත් කරුණු සියයට සියයක්ම සත්‍ය බව ඔහුට සිතුණේය... සංජය එම හෝටලයට කිහිප දිනක්ම ගැයුම් බලන්නටද පැමිණි බව ඔහු එන්නට පළමුම දැන සිටියේය... එහෙත් සංජය මෙහි තරුණියක හා මිතුරුවී සිටින බව නම් ඔහු දැනගත්තේ නැත... ඔහු සිතුවේ සංජය මිතුරුවූ තරුණිය හා මෙයට කිහිප දිනක්ම ආ ගිය බවය... තරුණිය වැඩ කරන්නේ නම් හෝටලයේ බව සංජයගේ මවද දැන සිටියේ නැත...

"ඔන නෑ මිස්ටර් සේකර... මං කියන්නං සීල් තියෙනවද නැද්ද කියලා... අනික පොලිස් කාන්තාවක් නැතුව... අපිට එහෙම කාමර චෙක් කරන්න බෑ..." ඔහු කීවේ එහෙයිනි... මේ තරුණියන්ව අපහසුතාවයට පත්කරවන කිසිවක් කරන්නට ඔහු නොසිතුවේ සැබැවින්ම මෙම තරුණියගේ තිබෙන කිසියම් වැදගත්කමක් ඔහු



සනිටුහන් කරගෙන සිටි බැවිනි... ඔහුට එයට සහතික වන්නට තවත් හැකියාවක් ආවේ මිතුරියන් දෙදෙනා මේ සියල්ල දෙසම බලාගෙන සිටි නමුත් මෙතන විභාගයට වෙනත් අය මෙන් පැන පැන පිළිතුරු දෙන්නට නොපැමිණි හෙයිනි... වෙනත් තැනක වූවා නම්...

ඔහු බොහෝ විට එවන් අවස්ථාවලට මුහුණ දී ඇත... මොවුන් මෙම රැකියාවට ආවාට ඉගෙන ගත් තරුණියන් වන්නටත් ඇත... පසුව ඒවා දැනගත යුතුය... ඔහු සිතුවේ මේ පරාසයේ එවැනි ළඳුන් ගැනද දැනගෙන සිටීම තමාගේ රැකියාවේ වගකීමට අයත් බව වැටහෙද්දීය...

"ඒ කේ තියෙන ඒවා එහෙනං..."

"සර්... මං ඒ කේ තියෙන කිසි දෙයක් වෙනස් කරන්න යන්නෙ නෑ... මං ඊයෙ රෑත් හිටියෙ පහළ ශාන්තාගේ කාමරේ... ඒ මොකද ඇත්තටම මට ආරතී නැතුව ඒ කේ නිදාගන්නත් කම්මැලි නිසා..." ඇය ඇයගේ බිය ගැන සැඟවූවාය... මේ මලමොට්ටලයා එලෙස කීවොත් තමා ආරතී මැරුවායැයි කියන්නටද පිළිවන... ආරතී මරා ඉකින් තමාට සැඟවිය යුත්තේ මෙට්ටය තුළය...

මෝඩයා... ඇය බැන්නේ සිතිනි...

එහෙත් ඒ අතර ෂෙනාලි යමක් සිතුවාය... මේ නිළදරුවා නම් මෙතනට නොගැලපෙන බවය...

"මිස්ටර් සේකර... ඒවා එහෙම තිබුණාවේ... අපි බලමු ඉස්සෙල්ලා මේ ළමයා මොකක් හරි ආපදාවක් වෙලා හොස්පිටල් එකක හරි ඉන්නවද කියලා..." ජයරත්න කීවේ සියල්ලටම පළමු මේ සේකර නැමැත්තා දමනය කරගත යුතුය සිතමිනි... ඔහු සමහරවිට මේ තරුණියට කිසියම් බලපෑමක්... අනිසි බලපෑමක් කරන්නට සිතමින්ම මෙම තත්ත්වය උලුප්පා පෙන්වන්නට යන්නේදැයි එවර ජයරත්නට සැකයක්ද දැනෙමින් තිබිණ...

ඉන්පසු ඔහු බැලුවේ තේජානි දෙසය... ඇයට තමා කී රෝහල් කථාව අළුත් යමක් වූවා වැනිය... ඇය දෑස් අයා බලා සිටියේ තමා දෙස බව වැටහෙද්දී ඔහුට සිනහවක් නැඟිණ... ඇයට තවමත් විසි විය සපිරී නැද්දැයි ඔහුට සිතිණ... ඇය බොහෝ ලාබාලය... ඊයේ රෑයේ ගී ගායනයේදී මුළු මුහුණම මෙන් පාට දමා වෙනස් අන්දමකින්ම දුටු

මෙම තරුණිය... මෙලෙස රූපලාවණ්‍යයකින් තොරව සිටියදී කෙතරම් අයස්කාන්ත රුවක්දැයි තවත් වරක් ඔහුට සිතිණ... හරි හමන් තැනක මෙවන් තරුණියක සිටියේ නම්.. තමාගේ දියණියද මෙවැනිම රුවැත්තියකි.. ඔහුට සේකර ගැන තරමක් පිළිකුලක් නැගුණේ එහෙයිනි.. ඇයට මෙවන් රැකියාවක් කරන්නට සිදුවුවහොත්...

දෛවය යනු බොහෝ විස්මිතය... අද හිඟන්නා හෙට රජ වෙන්නටද පිළිවන... තමාගේම තත්ත්වය දුරු බොහෝ දෙනාට එය අමතක වුවද, තමා ඒ තත්ත්වයට පත්වී නොසිටියද, සිටියේ නම් අමතක වෙන්නේද නැති බව... කරන්නේද නැති බව ඔහු සිතුවේය...

"මිස් තේජානි... අපි ටිකක් යාළුවා ගැන හොයලා බලමු..." ඔහු කීවේ තේජානිටය...

"ඇත්තටම මිස්ට ජයරත්න... අපිට හොස්පිටල්ස් වල බලන්න කියලා නං හිතුණෙම නෑ..." තේජානි ඇයට වැරදුණු තැන කෙළින්ම කීවාය... "එයා එහෙම අසනීපයක් උනත්... මං කල්පනා කළේ ගියේ මිස්ට සංජය එක්ක නං..." ඇය එතනින් නැවැත්තුවාය...

එයත් සැබෑවකි... ඇය ගියේ යම් තැනැත්තෙක් සමගද ඒ තැනැත්තා ගැන දන්නේ නම් රෝහල්වලින් අසන්නට පෙර ඇසිය යුත්තේ ඔහුගෙනි... ඇය එපමණක් නොව නිවසින් මෙන්ම මෙම අතුරුදන් තරුණිය ඇසුරු කරන බොතේජු නිවසින්ද සොයා බලා ඇත... සියල්ලටමත් වඩා සංජය සමග ගියේ නම් ඔහු කෙලෙසක ඇයගේ ඇසුර පැතුවද, ඇයගේ අසනීපය ගැන කාටත් වඩා හොඳින් සොයා බලන බව ජයරත්න දැන සිටියේය...

"මං සංජය එක්ක කථා කරලා බලන්නං..."

"තැන්ක් යූ මිස්ට ජයරත්න... මට මේ දවස් හයේ නින්දක් වත් නෑ රතී ගැන හිතලා..." ඇය කීවේ සැබැවින්ම කඳුළක් දෙනෙතට එද්දීය... "මට එයා අක්කා කෙනෙක් වගේ..."

ජයරත්න එයට කිසිදු පිළිතුරක් නොදුන්නද, ඔහුගේ සිනහව ඇයගේ සිතට යම් සැනසීමක් එකතු කර තිබුණේය... අර ඔලමොට්ටලයාට වඩා මොනු සිතන තැනැත්තෙක් බව ඇයගේ සිතට දැනින.. සිටියේ නම් ඇයගේ පියා වුවද මෙලෙස වන්නට තිබිණ...

මේ අතර ජයරත්නට සිතුණේ වෙනත් වෙලාවක මෙම



තරුණියන්ගේ ජීවිතය ගැන හොඳින් කරුණු අසා ගත යුතුය යන්නය... ඒවා පොතකට එක් රැස් කළහොත්... ඔහු කාර්ය බහුලවූවද පොත් දෙකක්ම ප්‍රසිද්ධියට පත් කර තිබුණේය... විවේකයක් ලැබෙන සෑම මොහොතකම දැන් තවත් පොතක් ලියමින් සිටින්නේය... මෙවැනි ජීවිත කිහිපයක් ගැන දැනගතහොත්...

තමාට නම් නොව නවකථාකරුවෙකුට අගසක් නවකථා ලියන්නට කරුණු කාරණා එක් රැස් වනු ඇත... ඔහු සියලුම මිතුරියන් දෙස බලා හිස සලා අනෙක් දෙසට හැරුණේය...

"එහෙනං ඔගොල්ල ගිහිල්ලා ටිකක් රෙස්ට් කරලා... එන්න ඊයේ ආව වෙලාවටම..." ශෙනාලි යන්නට පළමු මිතුරියන් තිදෙනාට කීවාය... තිදෙනාම හිස් සැලූහ...

★★★

"අපි යං හෝල් එකට... අරුංගෙ බඩ පපුවෙ බිත්තර තම්බ තම්බ ඇත්තේ..." සමුදි කීවේ විසිත්ත සාලයේ සිටි අමුත්තන් සියල්ලෝම එළියට පා තබා නවතා තිබූ වාහන දෙකට නගිද්දීමය...

"ශාන්තාට කියමු කෑම එහෙට ගෙනැල්ලා දෙන්න කියලා..."

"ඒක නං හොඳයි... කාපු බීපුව ඔක්කෝම පිච්චිලා මං හිතන්නෙ..." තේජානි කීවාය.

"මගේ පිච්චුනෙ උඹ සංජය කියන එකාට කථා කරා කිව්ව වෙලාවෙම..."

"ඇත්තමද උඹ කිව්වේ...?"

තේජානි සුසුමක් හෙලුවාය...

"ඔව්... ඒ මිනිහා රතීටත් බොරු කරන එකෙක්ද කොහේ... එයා කිව්වනේ... බොරුවක් කියන්න ඕන වෙලාවට නොකියා ඉන්නෙ නෑ කියලා... රතී ගැන උනත් එච්චරයි කිව්ව විදියට..."

"දැන් ජානි ඔයා ටිකක් පරිස්සං වෙලා ඉන්න... ඔය මිනිහ මහ ගෝනුසු වර්ගයේ එකෙක් මං හිතන්නේ..."

"ගෝනුස්සට බය නැති එකා මොකාද... මං ඒකා..." තේජානි එවර මිතුරියන් සිනහව නැංවූවාය...

ඔවුන් පුහුණුවීම ශාලාවට ගියේ තවත් පැය කාලක් පමණ කාමරවල ගත කළ පසුය...

ශාලාවට යද්දීම පුහුණු වෙමින් සිටි සියල්ලෝම කථා කරගත්තාක් මෙන් පුහුණුව නවතා එක්වරම ඔවුන් දෙසට දිව ආහ...

"මොකද උනේ...? මෙච්චර වෙලා පරක්කු උනේ...?" නොඉවසිල්ලෙන් ඇසුවේ මාරිය...

"දැන් අපිට මරලා දම්මත් බලන්න කියලා ටික වෙලාවකටවත් නාපු එච්චො එනවා... පරක්කු මොකද කියලා අහන්න..." රුක්මි කීවේ නෝක්කාඩු ස්වරයකිනි.

"අපි එහෙම ආව නං හොඳ නෑ නේ රුක්මි... ඒක නිසා මායි ඇත්තටම ඒ පැත්තටවත් යන්න එපා කියලා කිව්වේ..." කීවේ වසන්තය...

"හරි හරි... අපි මොකුත් කියන්නෙ නෑ..."

"කියන්න එපා... කොහොමටත් අපි හැබැයි හොඳට කන් දීගෙන හිටියෙ වෙඩි ශබ්ද වගේ ඒවා එනවද කියලා... එහෙම්නං ඉතින්..."

"එහෙම්නං ඉතින් මොකද දන්නවද කට්ටිය කරන්නෙ... අන්න අර පැත්තේ දොරෙන් පැනලා කොහේ හරි අස්සක මුල්ලක හැංගිලා ඉඳියි... වෙන මොකක්වත් කරන එකක් නෑ..."

"ඔගොල්ල අපි ගැන හිතාගෙන ඉන්නෙ එහෙමද...? හරි නංගී... අපි ඒවත් බලාගන්නං..."

"මොනව බලන්නද...? කොහොමටත් මොන ජූඩෝ කරාටෙ මරාටෙ කුංෆූං කියලා මොන දේ කරත් උඹලා කරන්නෙ කකුල් දෙකට පින් දීලා දුවන එක... මොකක් හරි කරදරේකදි..."

"මේ උඹලා දෙන්නා ගහ මරා ගන්නවනං පැත්තකට වෙලා ඒක කරගනිල්ලා... අපිට විස්තරේ අහගන්න දීලා..." අන්තිමේදී කෑගැසුවේ සිරිනිය...

"මොකක්ද රුක්මි උනේ...? ඇත්තටම... මොනවද ජානිගෙන් ඇහුවෙ...?" ඇය එවර රුක්මිගෙන් ඇසුවේ තේජානි සෙමින්ම මයන්ත වෙතට යනු දකිද්දීය... තේජානි ඇයගේ සියල්ලම දැන් කියන්නේ මයන්තට විය හැකි බව දැන සිටි හෙයින් ඇය ඒ ගැන කහටක් සිතුවේම නැත...



"ඔගොල්ල විශ්වාස කරන එකක් නෑ සිරිනි..." කියන්නට ගත්තේ නම් සමුදිය... "මේ කෙල්ල මැන් එක්කත් කථා කරලා..."

මැන් කවුදැයි සිතාගත් හෙයින් සියල්ලෝම මුහුණට මුහුණ බලාගත්හ...

"මාරයිනේ..."

"අපි විහිළු කරද්දිත් කථාවක් බහක් කරේ නෑ..."

"මොනවද මිනිහා කියලා තියෙන්නේ...?"

"රනිටත් බොරුවක් කියන්න පුළුවන් එකෙක් විදියට තමයි කථා කරලා තියෙන්නෙ... ජානි සෑහෙන කේන්තියෙන් කථා කරේ... අර කවුද මන්දා උගුඩුවෙක් නේ මේ සැරේ මදනායක සර් වෙනුවට ඇවිල්ලා තියෙන්නෙ... එදා අපි එක්ක ගිනා උනේවත් නැති කොට අපි කථා කරා මහකද උගේ ජෙස් තියෙන්නේ සූට් එකේ වෙන්න ඇති කියලා..."

"කවුද සේකර කියන කෙනාද...?" ඇසුවේ වසන්තය... "ඒ මිනිහ ටිකක් මෙන්ටල් පොරක්... අපි ඒක අමතක කරලා දාමු... වැඩිය ආවොත් අපි දන්නවා එයා නවත්ත ගන්න හැටි..."

ඒ කෙසේදැයි අසන්නට ඒ මොහොතේ කිසිවෙකුත් නොසිතූහ... වසන්ත මාධ්‍යවේදීන් කිහිප දෙනෙක් සමග ළඟින්ම ඇසුරු කරන බව සියල්ලෝම දැන සිටි බැවිනි.

සමුදි සිදුවූයේ කුමක්දැයි කියන්නට ගත්තාය...

මයන්ත මේ සියල්ලන්ගෙන්ම වෙන්වී පැත්තකට ගියේ සිදුවූ සියල්ලම තේජානිගෙන් දැනගැනීමට බව දැන සිටි නිසාම කිසිවෙක් මයන්ත ගැනද සැලකීමක් කළේ නැත...

"මොකක්ද ජානි උනේ...?" මයන්ත තමා වෙත ආ තේජානිගෙන් ඇසුවේ තරමක් කැළඹිලි සහගත වය...

මෙතෙක්ම ඔහුට මෙහි බැරෑරුම් කමක් නොසිතිණ... ආරතී ඇයගේ නිවසටද ගොස් නැති බව කියද්දී ඔහුගේ සිතටද තරමක සැකයක් ඇවිත් තිබිණ... ඊයේ වෙනතුරුම ඔහුද සිතා සිටියේ මොහොත්පුවලගේ නිවසේ නැත්නම් ඇය ඇත්තේ සංජයගේ නිවසේ හෝ පියාගේ නිවසේ බවය... දැන්... ඇය සංජයගේ නිවසේ හෝ පියාගේ

නිවසේ නැත්තේ නම්... ඇයට වූයේ කුමක්ද...? ඇයට වෙනත් කවරෙක් හෝ මිතුරෙක් හෝ නෑදෑයෙක් සිටියායැයි කවරෙක්වත් දන්නේත් නැත... ඇය නෑදෑයන් හා මිතුරන් ලෙස සැලකුවේ මෙහි සිටින අය පමණකි. සැම කරදරයකදීම ඉදිරිපත්වී උදව් කරන මෙම සොහොයුරියක් වන් මිතුරිය ගැන සොයන්නට බලන්නට හැකියාවක් නොමැති කමින් දැන් ඔහු තරමක කණස්සල්ලකටද පත්ව සිටියේය...

"කවුද මන්දා ජයරත්න කියලා කෙනෙක් ආවා... මැඩම් අඳුනන... එයා මං හිතන්නේ සංජයවත් හොඳටම දන්නවා... මං කිව්වා ඉතින්..."

"සංජය සැකයි කියලද...?"

"ඒකත්... අනික... මයන්ත මං ඔයාටවත් කිව්වේ නෑ... ඒ යකාත් එක්ක මං කථා කරා... මහ ගෝනුස්සෙක් වගේ මනුස්සයෙක් සංජය කියන එකා..."

"කථා කළා... කවදද...?" මයන්තගේ පුදුමය දකිද්දී සියල්ලටම පළමු ඇයගේ සිනහවක් නැගිණ... තේජානි එලෙස සංජය හා කතාකරනැයි නොසිතූ මයන්තට නම් තේජානි යන යුවතිය කවරෙක්දැයි දැන් සිතාගැනීමටත් නොහැකිව තිබිණ...

ඇය බොහෝ සබකෝලී තරුණියකි... එහෙත් දැන් එම සිතිවිල්ල ඔහුගෙන් ඉවත්වී ගොස් තිබිණ... එක් අතකින් බලද්දී අර වේදිකාවේ බියක් සැකක් නැතිව උඩ පනින දඟලන ගී ගයන මෙවන් කෙල්ලක් මෙවැනි දෙයකදී බියපත් වෙන්නේ නම් එය... ඔහු අමතක කළේය... තේජානිගේ ගැහැනුකම තිබුණාට ඇය එඩිතර තරුණියක බව ඔහු සිතුවේය...

"දැන් දවස් දෙකකට විතර කලින්..."

"උඹ මට කිව්වේ නෑ..." ඔහු කීවේ අමනාපයක් නොවන අමනාප හඬකිනි...

"මං කිව්වේ නැත්තේ කරුණු දෙකක් නිසා... එකක් ඔයා මට විහිළු කරපු නිසා... මගේ හිතේ ඒ මිනිහා ගැන කොහෙත්ම අදහසක් නෑ... අනික රතී ගැන හොයන්න මට වෙන කොහේවත් තැනක් නෑ... මං ඔයාට කියලා ඕක හොයවන්න ගියානං... මට සමහරවිට ඒ වෙලාවේ හැම්ම නොඑන්න තිබුණා... හිතුණා ගත්තා... ඒත් ඒ යකා කථා කරපු



විදියට... මට පුදුම කේන්තියක් තිබුණෙ... ඔයාට මං කියන්න හිතාගෙනම හිටියෙ... ඒත් වෙලාවක් ආවෙත් නෑ... අනික අපිට මේ ජොබ් එක හොඳට කරන්න කියලා මිස් ෂෙනාලි කියද්දි මං ඔයාගේ හිතත් අප්සෙට් කෙරෙව්ව නං ආයෙ... මං රතීගේ ගෙදරට හරි නැත්තං අර අවිස්සාවේල්ලේ ගෙදරට හරි යන්නත් හිතාගෙන හිටියේ..." කී ඇය මයන්ත දෙස යටැසින් බැලුවාය... "තනියම නං නෙවෙයි... ඔයාත් එක්ක..."

"අපෝ මට එන්න බෑ ඔය හෑංග රාජයොන්ගෙ ගෙවල්වල..."

"ඇයි...? හෑංගයෝ හොයන්නෙ අපි වගේ කෙල්ලො මිසක් මුගොල්ල වගේ හුත්ථයො නෙවෙයි... ඔයාට බය නැතුව එන්න පුළුවන්..." කිව් ඇයගේ නෙතට කොරිඩෝවෙන් මතුවුණු ෂෙනාලිගේ රුව පෙණින...

"මිස් එනවා..." ඇය කියද්දීම එකතුවී සිටි අයද ඇය එනු දුටුවා වැනිය...

එහෙත් වෙනදා මෙන් කිසිවෙක්ම ශාලාව තුලට දුවන්නට ගියේ නැත... මේ ආරතීගේ අතුරුදන් වීම බොහෝ ප්‍රශ්නවලට මුල පුරා ඇතැයි සියල්ලන්ගේම සැකයක් පැන නැඟී තිබුණ හෙයිනි...

ෂෙනාලි කෙලින්ම මෙන් ඇවිත් නැවතුණේ සියල්ලෝ වටවී සිටි තැනය.

"මොකද මේ...?"

"අපි විස්තර ඇහුවා මිස්..." කීවේ වසන්තය...

"දැන් ඉතින් මැඩම් ප්‍රශ්නෙ අරගෙන නේ එයා අතට..." ෂෙනාලි කීවේ එවර දැන් එතනට එමින් සිටි තේජානි හා මයන්ත දෙසද හැරී බලමිනි... "ඕගොල්ලො දැන් ටිකක් ප්‍රැක්ටිස් කරන්න... නැත්තං අද දැන් නිලන් එන්නෙත් පරක්කු වෙලා නිසා..." කියමින්ම ඇය එවර බැලුවේ මයන්ත දෙසය... "කොයිකටත් මයන්ත ඕගොල්ලොත් ටිකක් පැත්තකින් ඉන්න... ඒ මොකද නිලන්ගේ අද පර්ෆෝමන්ස් එකක් තියෙන නිසා එයාට මේ ගොල්ල කවර්අප් කරගන්න බැරි උනොත්... ඕගොල්ලො ගන්න මෙයාලගේ ඇයිටම්ස් වලට..."

වසන්ත හා මයන්ත පමණක් නොව එතන සිටි ලලනද හිස සැලුවේය...

"දැන් තුන්පාරක් විතර ප්‍රැක්ටිස් කරමු... මං හිතන්නේ ඒ ඇති වෙයි නේද...? ඔගොල්ලො ටිකක් රෙස්ට් කරන්නත් ඕන නේ..."

"අද නීලන් එන්නේ නැද්ද මිස්...?"

"නෑ... එයා එහෙට කෙලින්ම එයි..."

සියල්ලෝම මෙන් එවර පුහුණුව ආරම්භ කරන්නට පෙළ ගැසුණහ... එහෙත් තේජානිගේ සිතේ නම් තිබුණේම මේ පසුගිය හෝරාව තුළ ඇය මුහුණ දුන් විභාගය වෙතය... කෙසේ වුවත් ඇයට ඇයගේ දක්ෂකම නිසාම ඉදිරිපත් කළ රංගනය හා ගායනය නම් වැරදුණේම නැත...

ඇයගේ සිතේ එම විභාගය ගැන කරකැවෙද්දී අන් අයගේ සිතේ ආරතීගේ අතුරුදන් වීම ගැන නොයෙකුත් සැක සංකා පහළ වෙමින් තිබිණ... සියල්ලන්ගේම සිත තුළ තරමක බියක් වැන්නක් හටගෙන තිබුණ බවද තේජානි නම් දැනගත්තේ නැත... ඇයගේ සිතේ නම් තිබුණේම සංජය ආරතී සැඟවීමට කුමක් හෝ පියවරක් ගෙන ඇති බවය...

නැඟණිය බැලීමටද යායුතුය... බෝතේජු යුවලට ආරතීගේ අතුරුදන්වීම කියනවාදැයි නැද්දැයි ඇය සිතුවේ විවේකයක් ගැනීමට මදක් යහනේ දිග ඇදී සිටියදීය... ඔවුන්ට මෙය කිවහොත්... නැත... ඇය පසුව සිතුවේ ආරතී කෙසේ හෝ සොයා ගන්නායින් පසු මෙයින් ඉවත්වී යාමටය... සමහරවිට ආරතීගේ කුසේ පිළිසිඳගත් දරුවෙක් සිටී නම් දරුවා හදා වඩා ගන්නා අන්දම ගැනද ඇය සිතුවාය... නැඟණිය වුවද එ ලෙසින් තනි වන්නේම නැත... සිහිවිලි වල ඇලී ගැලී සිටි ඇයට එලෙසම දෑස් පියවිණ...

එදින නම් ඇය කිසිදු සිහිනයක් දැක්කේ නැත... ඇයව අවදිකළේ සමුදිය...

"මෙන්න... මෙයා හොඳටම නිදි... යන්න ලැහැස්ති වෙන්නේ නැද්ද...?" සමුදිගේ කණ ළඟම කෑගැසිල්ල ඇසෙද්දී ඇය අවදි වූයේ බොහෝ තිගැස්සෙමිනි...

"මොකද බය උනාද...?" සිනහසී අසමින් රුක්මි යහන පසෙකින් වාඩි වූවාය...

"අපි දන්නවනේ ඔයාගේ නැඟිටිල්ල... රතියා නැති නිසා ඉතින් අපි දෙන්නා දුවගෙන ආවා..."



"කීයද වෙලාව...?" තේජානි ඇසුවේ දෑස සෙමින් පිසදාගනිමිනි... ඇයගේ දෙනෙතින් නිදිමත බේරෙමින් තිබිණ...

"දැන් හයට පහයි... අපි දෙන්නා හතින් මූණින් දාගෙන ආවා... ඔයාවත් නැගිට්ටව ගන්න හිතාගෙන..."

"ශාන්තාවත් ආවේ නෑ නේ..."

"ශාන්තාට මේ ඔයාව නැගිට්ටව නැගිට්ටව ඉන්න වෙලාවක් නෑ... එයා වැඩ... යං යං... අද අට වෙනකොටවත් යන්න වෙයි... නීලන් එනවළු හතට..."

"නීලන්... එනකොට මයන්තලා..."

"අද ඒ ගොල්ලක් වැඩ... නීලන්ගේ එක අයිටම් එකක් තියෙනවළු... ඒකට තමයි එයා එන්නෙ... අපිට ඊයේ එයා එක්ක ප්‍රැක්ටිස් කරපුවා අද කරන්න කිව්වෙ... මයන්තලා අනික්වා කරයි..."

"කිව්වෙ... කිව්වේ කවුද...?"

"මිස් ඇවිත් කියලා ගියා..."

"රතී ගැන නැද්ද...?"

"මේ... අද ඉන්ක්වයරි එක තිබ්බේ... හෙට අහිද්දා බලමු..."

තේජානිගේ සුසුමක් නැඟිණ... ඇයට නම් මේ තරම් සැහැල්ලුවෙන් ඒ ගැන සිතන්නට නුපුළුවන... දැන් දැන් ඇයගේ සිතට තරමක බියක් සමග බරක්ද එක්වෙමින් තිබිණ...

එහෙත්... රැකියාවට යා යුතුය... ඇයගේ යුතුකමක් ඇත... වගකීමක් ඇත... ආරතී විසින් පැහැර හරිනු ලැබූ වගකීම ඇය විසින් තවත් හොඳින් ඉටු කළ යුතුය... මිතුරිය වෙනුවෙන් ඉහළින් කිසිවක් ඉල්ලන්නට වුවද හැකි වන්නේ එවිටය...

ඇය සමුදිට සිනහසී නැගිට ගත්තාය...

"ඔගොල්ල යන්න... මං ටක් ගාලා එන්නං..." ඇය කීවේ මෙයට වඩා ප්‍රමාද වී ආහාර ගතහොත් ඇයට හොඳින් රංගනයක් කළ නොහැකි බව දන්නා හෙයිනි... ආහාර ගත් විගස එවන් රංගන කළ නොහැකිය...

ඇය එදින ඇන්දේ සුදු පාට හා රන් පාට හා රතු පාට සම්මිශ්‍රණයවූ ඇඳුමකි... රසල් ඇයගේ මුහුණ රතුපාට හා සුදු පාට

අන්දමෙම සුදු හා ඇඳුමට සරිලන ඇඳුමට සරිලන එක්වූ පාටකින් ඔප ගැන්වූ අතර ඇඳුමට සරිලන අන්දමෙම සුදු හා රතු පැහැතියට හුරු කණ්ණාඩියක්ද ගෙනැවිත් තිබිණ...

එක් අංගයක් අවසන් විය... තේජානි සාර්ථක ගී ගායනයකත්, අනික් අය රංගනයකත් යෙදුණහ... ඉන්පසු ආවේ යළිත් වරක් නීලන් ගේ වන් මැන් ෂෝ එකකි...

එයින් පසු තේජානි යළිත් වේග රිද්මයේ ඉංග්‍රීසි ගීයක් ගයන්නට ගත් අතර අනික් අය නැටුමෙන් ඇයට සහය දෙමින් සිටියහ...

අයෝමා එනම මැඩම හා සිටි සියල්ලෝම පාහේ තේජානිගේ එම ගීයට හොඳින් කන් යොමු කරමින් සිටියහ...

සංජය එහා දොරින් මතුවී එනු පළමුවම දුටුවේ තේජානිය... ඇයගේ සිතේ කෝපය මෙන්ම වේදනාවද නැග්ගේය... ඇයගේ ගීතය නැවතිණ... ඇයගේ කටහඬ නැතිවෙද්දී නීලන් ඔහුගේ සංගීතයද නතර කළේය... වූයේ කුමක්දැයි ඔහුට නම් සිතාගත නොහැකි විය... සියල්ලෝම සිටි පියෙන් නැවතෙද්දී දූත් මුළු ශාලාවම එක්වරම නිහඬවිය... කථා කරමින් සිනහසෙමින් සිටි බොහෝ අය එක්වරම නිහඬවූයේ මේ රංගනය හා ගීතය නැතිවී ශාලාව නිශ්ශබ්ද වීමේ හේතුව සොයා ගැනීමට නොහැකි කමිනි...

තේජානි දෙස බැලූ සියල්ලෝම දෙවන වර මුහුණින් මුහුණ බලාගත් අතර... තේජානි එක්වරම හින්දි ගීතයක් ආරම්භ කළාය... එය බොහෝ සෙමින් යන ලයාන්විත ගීතයකි...

එය පටන් ගැන්මේදී නම් සංගීතයක් දීමට තරමක් අපහසු බව නීලන්ට සිතුණේය... මෙයට නොගසා ඉන්නටත් නොහැකිය... ගසන්නටත් නොහැකිය... ඔහු සිතාගෙන සිටියේ ඔහු විසින් පෙරදා සාදා දුන් නර්තනය නියම අන්දමින් කෙරේදැයි යන සැකයෙනි... ඊයේ දිනදී මයන්ත හා පිරිස ඔවුන්ට වාදනයෙන් සහයවූ බව ඔහු දන සිටියේය...

......නිර්දයී ප්‍රීතම්......

ඇයගේ හඬ උස් පහත් වෙමින් නැග්ගේය... සියල්ලෝම මෙන් බැලුවේ පුදුමයෙනි... අයෝමා නොව සැබැවින්ම නොඉවසිල්ලෙන් දෑස් යොමු කරමින් දෑගලුවේ ෂෙනාලිය... එය මෙම රංගනයේ කුමක් හෝ බව අනික් අය සිතුවද, එය එලෙස නොවන බව දන්නා හෙයින්



ෂෙනාලි එය පවසා ගන්නට නොව එය නවතා ලන්නට නොහැකි කමින් සැලෙන්නට වූවාය... ඇයට එය වැරැදි අන්දමේ ගීත ගායනයක් වුවද එය ගැන නොදන්නා අන් අයට එය වැරැද්දක් ලෙස පෙණුනේම නැත... ඒ තරමටම ඒ ගීතයේ ගැයුණු කොටස පරිපූර්ණ විය...

එහෙත් එය වැරැද්දක් වූයේ වේග රිද්මයේ ගීතයට නටමින් සිටි සමූහයටය... තේජානිගේ රංගනය මෙන්ම ගායනයද නැවතෙද්දී අන් අයගේද දෑස් ඇයගේ දෙනෙත් යොමුවූ දෙසට යොමුවුණේ, පහළ සිටි අයට නොව වේදිකාව වැනි කොටසේ සිටි අයට ඇයගේ නෙතේ කෝපය හා නොඉවසිල්ල හොඳින්ම දර්ශනය වූ හෙයිනි.

නෙතේ කෝපය දැල්වුණද..., ඇයගේ ගීතය මධුර විය... ලයාන්විත විය...

නිර්දයී ප්‍රීතම්....

මයන්තද සංජය එනු දුටුවේය... ඔහුගේ මුවගට සිහින් සිනහවක් නැග්ගද එය එලෙසම නවතා ගනිමින් ඔහු නීලන් දෙස නොව වසන්ත දෙස බැලුවේය... වසන්ත ඔිගනය ඉදිරියේ බොහෝ අසරණ ලීලාවෙන් බලාගෙන සිටගෙන සිටියේය...

මුළු කොටසේම ඇල්පෙනෙත්තියක් බිම වැටුණද ඇසෙන නිශ්ශබ්දතාවයක් තිබිණ... ඇසුණේ තේජානිගේම හඬම පමණකි... සංජය වේදිකාව දෙසම බලාගෙන පැමිණ මේසයකට වාඩිවූයේ කිසියම් දෙයක් වැරදී ගොස් ඇති බව දැණුනේ එවිටය. ගීත ගායනය නැවති තමාගේ පැමිණීම බොහෝ හොඳින් සනිටුහන් වෙමින් තිබෙන බව ඔහුගේ මනැසට වැටහිණ...

සියල්ලෝම මෙන් එදෙස බැලුවේ තේජානි දෙවන වර ගීතය ගයන්නට වන්නේත් ඒ දෙස බලමින් හෙයිනි... කරන්නට යමක් නොමැති කමින්ම සංජය එලෙසම වාඩිවූ ගමන්ම සිටියේය...

ඇය ගීතය දිගටම ගයන්නේ නම්...

මයන්ත නීලන්ට සෙමින් කුමක්ද කීවේය... එය කිසිවෙකුටත් නෑසුණේ දූත් සැබැවින්ම මේ ඉතා සෙමින් ගැයෙන ලයාන්විත ගීතයක් මෙවන් තැනක ගයන්නට කිසිදු හේතුවක් නැති බව ඒ සියල්ලන්ටම වැටහෙද්දීමය... එහෙත් කිසිත් පවසන්නට හෝ කාහටවත් නොසිතුණේ ඇයගේ කට හඬේ ඇති මධුර බව සිතට කාඳින්ම කා වැදෙද්දීය...

ඇයගේ කටහඬ මුළු ශාලාවම පුරවමින් සංගීතයක් නැතිව වුවද ඇයගේ කටහඬ මුළු ශාලාවම පුරවමින් ගලාගෙන යද්දී එහි ඇති මාධූර්ත්වය දෑසින් නොව උකහා ගත යුත්තේ හදවතින්ම බව වටහාගත්තෝ කිහිප දෙනෙක්ද ඒ තුළ සිටියහ... ඔවුන් පුදුම වූයේ මෙවන් තැනක මෙවැනි යුවතියකගෙන් මෙලෙස ගීතයක් පණ පෙවුණ හේතුවක් සිතාගත නොහැකිවය... මෙවන් තැන් වලදී සියල්ලෝම ගයන්නේ බොහෝ ඝොෂාකාරී වේග රිද්මවල ගීතය...

එහෙත් දූන්...

ගීතයේ රසය තේරුණ නොතේරුණ... ගීතයේ අදහස තේරුණ නොතේරුණ... ගීතය ගැයෙන්නේ කාටද දන්නා නොදන්නා සියල්ලෝම දූන් එයට සවන් දෙමින් සිටියේ ඒ කටහඬ තුළ දැණුනු කිසියම් ළයාන්විත බවක් ඔවුන්ගේ සිතට පවන් සලද්දීය...

නිර්දයී ප්‍රීතම... ප්‍රණය ජගාකේ හෘදය චුරාකේ චුප් හුවේ හෝ තුම්...

දූන් සමුදි සෙමින් මයන්ත දෙස බැලුවාය... ඔහු සෙමින් හිස සැලුවේය...

ඔවුනොවුන් අතර තරමක බැල්මක් දෙකක් හුවමාරු විණ... ජීවිතයේ කිසි දිනෙක නොසිතූ අයුරකින් පුහුණුවකින් තොරව සමූහ රංගනයක්... බොහෝ ළයාන්විත ගීතයකට සමූහ රංගනයක් ඉදිරිපත් කරන්නට සියල්ලන්ටම සිදුවී තිබිණ... පෙරමුණ ගත්තේ සමුදිය... ඇයට නර්තනය හොඳින්ම පිළිවන්කම තිබිණ... ඇය සෙමින් පියවරක් ඉදිරියට තැබුවාය... ගයන්නියට මදක් විරාමයක් දී නර්තනයට අවතීරණ වූවාක් වැනි හැඟීමක් නරඹන්නන්හට දෙන්නට ඇය සමත්වූවාය... සමුදිගේ ඉදිරිපත් වීමෙන් තේජානිට වඩාත් දහිරියක් ලැබුණා වැනි විය...

සමුදි කරන කරන සියලුම නර්තන ලීලාවන් අනෙක් අය පිළිවෙළින් කරන්නට ගත්හ... එහි වූයේ අපූරු සුන්දරත්වයකි... එය තරංගයක් නැගෙන්නා වැනි විය... තේජානි ගීතය දිගටම ගයද්දී ඔවුන් බොහෝ ලාලිත්‍යයෙන් රංගනය ඉදිරිපත් කෙරූහ... ෂෙනාලිට සිතාගැන්මටවත් නොහැකි වී තිබිණ... නිලන් දූන් බිය නැතුව සෙමින් සංගීතය සැපයූවේය... ඔහු ඒ ගීතය හොඳින්ම දූන සිටි හෙයිනි... කෙසේ වුවද එම රංගනය ඉදිරිපත් වූයේ පුහුණුවක් නැතිව නොව හොඳ පුහුණුවකින් මෙන් යැයි සියල්ලෝම සිතමින් සිටියහ...



යේ චන්දා ශීතල් කෙහෙලාතා
ෆිර් කyු මේරේ අන්ග ජලාතා
ප්‍රල්සා කෝමල් බාන් මදන්කා...
ෆූල් බන්කේ තන්මෙ තුම ජාතා
තුම් නිසයුර් කේ විරහා තාප් මේ
ආග් බනී පූනම්...
හෝ... නිර්දයී ප්‍රීතම...

එම ගීතය මොන චිත්‍රපටියකදැයි සිතන්නට වත් ෂෙනාලි නම් නොදන්නාය... එහෙත් එය අපූරුවට ගැයෙන වැයෙන රඟෙන අයුරු දකිද්දී ඇය සිතුවේ ඇය කිසි දිනෙක මෙවන් රංගනයක් ගැන සිතන්නට හෝ නොසිතූ වගය... මයන්ත එදා කීවේ මෙවැන්නක් ගැනදැයි ඇයට සිතුණු තරම්... එහෙත් ඇයට කෝපයක් දැණුනේ එය තමා නොදැනුවත්ව කළ හෙයිනි... දැනුවත් වී සිටියේ නම් කමක් නැත... සියල්ලටමත් වඩා ඇයට බියක් දැණුනේ යම් හෙයකින් එය වැරදී ගියහොත් අයෝමාගෙන් තේජානිට මෙන්ම සියල්ලන්ටම ඇතිවන ප්‍රශ්න ගැනය...

ඒ කොටසෙන් නවත්වන්නට තේජානි සිතුවේ කිමදැයි දූන සිටියේ මයන්ත පමණකි... ඔහු එම ගීතය කුමක්ද කාට ගයන්නක්දැයි සිතාගත් හෙයිනි... දෙවන කොටස නොතේරුණද... ඔහුට පළමු වදන් දෙක සිතා ගන්නට හැකි වී තිබිණ... ඒ වදන් දෙකම ඇය පැවසුවේ ආරනී ගැන සිතමින් බව ඔහු දූන සිටියේය... තේජානි නවත්වන්නට නම් ඔහුට අවශ්‍යතාවයක් නොවිණ... ඇයගේ එම ගීතය පටන් ගැන්මත් සමග විදේශිකයින් සියලු දෙනාම පුදුමයෙන් මෙන් ඇය දෙස බලා සිටි බැවිනි... ඉන්දියාවෙන් පැමිණි තැනැත්තවුන් දෙදෙනාම දෑස් අයා ගෙන ඇය දෙස බලා සිටිනු ද ඔහු දුටුවේය...

ඇය යළිත් පළමු පේළි දෙකින්ම ගීතය අවසන් වෙද්දී එම වදනට සංගීතය නවතා ගත්තේ එහෙයින්ම මයන්ත විසිනි...

නිර්දයී ප්‍රීතම... හො...ඕ...ඕ.... නිර්දයී ප්‍රීතම්...

ඇය එය නවතා තත්පර කිහිපයක්ම එක එල්ලේ සංජය දෙස බලාගෙන සිටියාය... දෙවනුව අන් අයට කිසිසේත්ම සිතාගත නොහැකි පරිදි ඇය පළමු ගයමින් සිටි වේග රිද්මයේ ඉංග්‍රීසි ගීතයට පණ පෙව්වාය...

සිහින් හඬක්වත් නොඇසෙන ලෙසින් ඇය දෙස බලාගෙන

සිටි සියල්ලන්ගේම දෑස් විශ්මයෙන්ම විසල් වූ අතර... ඉන්දිය විදේශිකයෙක් නැගිට ගත්තේ අත්පොළසන් ගැසුවේය... එවර තම සියල්ලෝම වාඩිවී සිටි තැනින් නැගිට අත්පොළසන් නාදයක් දුන්හ... ඔහු අත්පොළසන් දෙමින් අයෝමාටද යමක් කීවේය... අයෝමාද නැගිටගත්තාය...

මයන්තට පුදුමයක් දැණින...

දෙවනුව ඒ පුදුමය පහව්ය... වේග රිද්මයකින් ලයාන්විත ගීතයකට පැමිණ යළිත් වේග රිද්මය එක්වරම ගැනීමේ එම දස්කම නම්...

සියල්ලටමත් වඩා ඒ භාෂා දෙකකි... භාෂා දෙකක් රාග තාල දෙකක්... ඇය නම් කිසිවෙකුටත් සිතා ගත නොහැකි දස්කමකින් පරිපූර්ණ යුවතියක බව ඔහුට සිතුණේ ඇය වැනි යුවතියක් මෙවැනි තැනකට කොටුවෙමින් සිටින්නේ කිමද යන පසුතැවිල්ලද සමගය...

ඔහු බියවෙමින් සිටියේ ඇයට යළිත් වේග රිද්මයේ ගීතය ගයන්නට නොහැකි වුවහොත් යැයි සිතා සිටි හෙයිනි... එහෙත් ඒ සිතිවිල්ල ඒ මොහොතේදී නැතිව යමින් තිබිණ... අත්පොළසන් මැද වුවද ඇය ගීතය නතර නොකළාය... හිස තරමක් නවා ඒ ආචාරය පිළිගත්තා පමණකි...

වේදිකාවේ රංගනය යළිත් වේග රිද්මයට යොමු වුණේය... සියල්ලෝම යළිත් වාඩිවී ඒ රංගනයේ රස විඳින්නට ගත්හ....

දන් යළිත් එට පිටාව මින් මොහොතකට පෙර තිබූ ස්වරූපයම ගත්තේය...

ඇය ගීතය නිම කළේ පුදුම අන්දමේ වේග රිද්මයේ රංගනයක් සමගිනි... ඒ රංගනය අන් සමූහයේම වේගයෙන් දෙගුණයක් වී තිබිණ... මිතුරියෝද මෙම මිතුරියට සහය දුන්නා විනා ඇය වෙනත් අන්දමකින් නටන්නේ ගයන්නේ නැයිදැයි අසන්නට නොගියේ සැබැවින්ම සංජය එනු ඒ සියල්ලෝම දැන සිටි බැවිනි... ඔහු හා මෙම මිතුරියගේ තිබෙන විරසකය දැන් සියල්ලෝම වටහාගෙන සිටියහ...

ඒ රංගනයට එක්වෙන්නට කිසිවෙකුටත් නොහැකි තරම් විය... ඇය ආවේග වී සිටියේදැයි කියන්නටවත් නොහැකි වූ තරම්...

ඇගේ සිතේ කෝපය ඇය රංගනයට හා ගායනයට එක්



කර තිබූ බව දැන සිටියේ ඇයම පමණකි... වූයේ කිමෙක්දැයි අන් අයට නොතේරුණද සංජයට තමාගේ මේ වෙනස්වූ ගීතය හොඳින්ම ඔහුට තිබූ බව වැටහුණේ නම් ඇතැයි ඇයට සිතිණ... ඔහු එහි තේරුම තවරෙක්ගෙන් හෝ අසන බව ඇය සිතුවාය...

ඉන්පසු... ඇයට සංජය දෙස බැලීමට වත් සිත දුන්නේ නම් නැත... ඔහු ගෝනුස්සෙකි... මෙතෙක්ම ඇය සිතා සිටියේ එලෙසය... දැන් ඇයට ඔහු කපටි නරියෙක් බව සිතෙමින් තිබිණ...

ඔහුගේ මුහුණටම එබන්දක් කිව හැකි නම් කෙතෙක් අගනේදැයි ඇය සිතුවාය... කෙසේ වුවත් ඔහුට බනින්නට ඇයට නොසිතුණේ තවමත් ඇයගේ මිතුරියගේ ජීවිතය මේ මිනිසා සුරතේ ගුලි වී තිබෙන බව ඇයට මතකයට එද්දීය... ඔහු එම ගීතයේ තේරුම ආරතීගෙන් දැනගන්නා බව ඇයට සිතෙමින් තිබිණ... ආරතීට හින්දි ගී ගායනය එතරම් නොහැකි වුවද, ඇය හින්දි ගීත හා තේරුම් එකතු කළාය... ඔහු ඒ ගැන දන්නා බව තේජානි දැන සිටියාය...

ගීතය නිමවෙද්දී සිසි දිනෙක නොදුටු දැකුමක් ඒ තුළ තිබිණ... ඉන්දිය විදේශිකයන් දෙදෙනම හොඳින් අත් පොළසන් ගැසූ අතර එක්කෙනෙක් නැගිට ගෙන ඇයට හිස නමා ආචාරයක්ද කළේය... අනෙකා අයෝමාටද කුමක්ද කීවේය... අයෝමා බොහෝ මනැකමකින් සිනහසී තේජානිට හිස සැලුවාය...

ෂෙනාලිගේ හදවතේ නියමාකාරයෙන් හුස්ම වැටෙන්නට ගත්තේ ඒ මොහොතේ දී විය යුතුය... එතෙක්ම ඇයට හුස්ම හෙළීමටවත් අමතක වී තිබුණ තරම්ය...

තරමක් දුරින් වාඩිවී සිටි හෙයින් සංජයට තේජානිගේ නෙතේ කෝපය නම් දක්නට නොහැකි විය... එහෙත් ඔහු සිටියේ ඇයගේ ගීතය නිම වෙන තෙක්ය... ඔහුට මෙතන සිදුවූ කිසිවක්ම වැටහුණේද නැත... සිතන්නට උත්සාහයක් ගත්තේද නැත... සියල්ලටමත් වඩා තේජානි කෙලෙසක සිතුවද, ඒ ගීතය ගැයුණේ ඔහුට බව ඔහුට වැටහුණේද නැත...

ඔහු නිදහසේ වාඩිවී කළේ ගීතයට සවන් යොමු කිරීමට නොව ගීතය ගයන්නිය දෙස බැලීමය... ඒ තේජානි බව ඔහු දැන සිටියේය... කෙසේ වුවත් ගීතයේ වෙනස ඔහුගේ සිතට දැණුනේ පේළි දෙකක් පමණ ගැයෙද්දීය... එය මෙතනට අදාල නොවන තාලයේ

බව ඔහුට සිතිණ... දෙවනුව ඔහු සිතුවේ මේ වෙනත් කිසියම් ආකාරයක පුහුණුවීමක් සහිත ගීතයක් බවය... දැන් බොහෝ දෙනා ශාස්ත්‍රීය ගීත ගායන වාදන අසන්නටද කැමැත්තක් දක්වන හෙයින් එවැන්නක් මෙහිදී යෙදුවා විය හැකිය... ඔහු සිතා ගත්තේය...

ඔහු එදින එතනට ආවේ සැබැවින්ම බොහෝ දේ ගැන තනිවම සිතාගත නොහැකි හෙයිනි...

★★★

ඔහුට ජයරත්න කථා කළ බව ඔහු දැනගත්තේ පැය දෙකකට පමණ පෙරය... ඒ අතරමග කුමක් හෝ තොල ගාගන්නටයැයි වාහන නවත්වද්දීය... මිතුරා පැමිණ එය කියූ විට සංජයම ජයරත්නට ඒ මොහොතේම දුරකථන පණිවිඩයක් ගත්තේය...

"සංජය... කොහේද ඉන්නෙ...?" ජයරත්න පළමුවම ඇසුවේය...

"දැන් මං ඉන්නෙ මග අන්කල්... එන අතරමග..."

"ගෙදර යන්න ඉස්සෙල්ලා පුළුවන් නං මාව හම්බවෙන්න එන්න..."

"මොකක්ද හදිසිය...?"

"හදිසියක් නෑ කියලා මට බොරු කරන්න බෑ සංජය... පුළුවන් නං එන්න... ඉන් පස්සේ පුළුවන් ඔයාට තීරණයක් ගන්න මේක හදිසියක්ද නැද්ද කියලා..." කියූ ජයරත්න දුරකථනය විසන්ධි කළේය...

ඔහුට දැන් සැහෙන ප්‍රශ්නයක් පැණ නැඟී තිබිණ... තරුණියගේ අතුරුදන් වීමේ එක් පැත්තක සිටින්නේ සංජයය... අනික් පැත්තේ ඔහු දන්නා හඳුනන මිතුරියකි... සංජය ඔහුට නැකමක් ඇත්තෙකි... අයෝමා ඔහුට බොහෝ උපකාරී වූ... උපකාර කරන මිතුරියකි... එහෙත් ඒ හෝටල්වල බොහෝ දේවලට ඔහුගේ අත හිත දෙන නිසා නොවේ... කුඩා කළ පටන්ම ඔවුන් දෙදෙන දැන හඳුනාගෙන සිටි මිතුරු මිතුරියන් බැවිනි.

එහෙයින් බොහෝ දේවල්වලදී ඔවුන් දෙදෙන එකිනෙකාට උදව් උපකාර කරගනිමින් සිටියහ... එක්වරක් ඔහු අයෝමා ගැන සිතක්ද තබාගෙන සිටියේය... එහෙත් ඔහු එය ඇයට පවසන්නට පෙර ඇය වෙනත් ව්‍යාපාරිකයෙකු හා යුග දිවිය ඇරඹුවාය...



කෙසේ වූවත් ඔවුන්ගේ මිතුරුකමට එය බාධාවක් කරගන්නට ජයරත්න කවදාවත් නොසිතුවේය... පසු දවසක ඔහුද විවාපත් විය... සංජයගේ නැකම ආවේ ඒ විවාහය හරහාය... ඇය අයෝමාට වඩා හොඳ බිරිඳක් වී සිටින බව ඔහු දැනගත් නමුදු ඒවා ගැන සංසන්දනයක් කරමින් අයෝමා පහත හෙළන්නට ඔහු අකැමැති වූයේය... ඔහු දැන් දෙදරු පියෙකි...

අයෝමාට දරුවන් ලැබුණේ නැත... ඇය වඩ වඩාත් මුදල් සොයන්නට පෙළඹුණේ සමහරවිටක ඒ වේදනාව නිසා විය හැකියැයි ඔහුට පසුව සිතුණේය... කෙසේ වුවත් මේ ඔවුන්ගේ හමුවීම සිදුවුණේද අවුරුදු ගණනාවකට පසුය... ඇය හෝටල් ව්‍යාපාරයේ පරතෙරට යද්දී ඔහු දැන් උසස් නිළදරුවෙක් ලෙස සේවය කරන්නේය...

සංජයගේ මවගේ ඉල්ලීම වූයේ තමාගේ පුතා මෙම හෝටලයට නිරතුරු ඒගෙන යන මෙම තරුණිය ගැන විස්තරයක් වඩාත් හොඳින් දැනගැනීමට ජයරත්න අයෝමාගේ මිතුරෙකු නිසා හැකිවේයැයි යන්නය...

ඔහු දකිද්දී සුහදත්වයෙන් කථා කළ අයෝමාද මේ හදිසියේ අතුරුදන්වූ තරුණියක ගැන ඔහුගෙන් උදව්වක් ඉල්වද්දී එය ගැන නොසලකා ඉන්නට ඔහුට නොහැකිය...

සංජයගේ මවට අවශ්‍ය වූයේ තරුණිය ගැන විස්තරයක් නමුත් අයෝමාට අවශ්‍ය වුණේ එම පුවත ප්‍රසිද්ධියට පත් නොකර මෙම තරුණියගේ අතුරුදන් වීම ගැන සොයා බලන ලෙසය...

එහෙත් අනික් කෙළවර යොමුවන්නේ සංජයට බව නම් ජයරත්න සිහිනයකිනුදු නොසිතුවේය... අයෝමා කීවේ ඇය කිසිවෙක් හා මිතුරුවී නැති බවය... දැන්...

අයෝමාට තැනැත්තා සංජය යැයි කීමට බියක් එන්නට ඇතිවා වැනිය... ඔහු සිතාගත්තේය... සමහරවිට ඇය නොදන්නවාද විය හැකිය... සංජය වැන්නෙක් එවැන්නියක ගැන එතරම් එලවතැයි ඇය නොසිතන්නටද පිළිවන...

සංජයට ඔහුගේ නිවසට එන්නට යැයි ඔහු කීවේ එහෙයිනි... මෙය සැබැවින්ම අයෝමාගේ හෝටලය ගැන පමණක් නොව සංජය ගැන සිතමින්ද තීරණයක් ගත යුතු අවස්ථාවකි...

සංජය සැබැවින්ම ජයරත්නගේ නිවසට ආවේ මෙලෙස සිතමින් නොවේ... ජයරත්න ඔහුගේ පුද්ගලික සහකරුවද යළිත් වරක් දුරකථන පණිවිඩයක් දුන් බව ඔහු දැන් දැන සිටියේය... ඔහු සිතුවේ මේ ඔහුගේ මවගේ කුමක් හෝ අවශ්‍යතාවයකට කථා කරන බවය... ජයරත්නගේ බිරිඳ ඔහුගේ මවගේ පැත්තෙන් නැන්දා කෙනෙකි... නැන්දාට ඔහු නැන්දා යැයි ඇමතුවද, සංජය සැමදාමත් ජයරත්න ඇමතුවේ අන්කල් නාමයෙනි.

"මට සෑහෙන මහන්සියේ හිටියේ... හදිසියක් වගේ කියලා හිතුණ නිසා ගෙදර යන්න ඉස්සෙල්ලම ආවේ..." කියමින්ම සංජය විසල් ස්තෝප්පුවට ගොඩ වුණේ ජයරත්න ස්තෝප්පුවේම අසුනක වාඩිවී හොඳින් බලා සිටි බැවිනි...

"හදිසියක් කියලත් මට කියන්න බෑ... හදිසියක් නෙවෙයි කියලත් කියන්න බෑ..."

"මොකක්ද අන්කල් ඒ කථාව...? අම්මාගෙ පණිවිඩයක් වෙන්න ඇති කියලා මට හිතුණ නිසා ආවෙම... මෙහෙම කියනකොට නං මට හිතාගන්න ටිකක් අමාරුයි..." සංජයගේ කීමට ජයරත්න සිනැහුණේය...

"වාඩිවෙන්න... සංජය මොනවා හරි බොනවද...?"

"පුළුවන් නං... මොනව හරි... දැන් පැය දෙකක් එක දිගට ආවෙ... මට හෙට තවත් වැඩ වගයක් තියෙන නිසා... අතරමග නැවැත්තුවෙත් නෑ මෙහේ එන්න ඕන නිසා..." සංජය කීවේය...

"සරා... මේ සංජය ඇවිල්ලා... මොනවා හරි බොන්න ගෙනැල්ල දෙන්න..." අත තිබූ දුරකථනයෙන් ගෙතුළට කථා කළ ජයරත්න සංජය දෙස බැලුවේය... "කූල් ද...? නැත්තං..."

නැන්දා ඇත්තේ උඩුමහලේ විය හැකිය... සංජය සිතාගත්තේය...

"කූල්... නං වඩා හොඳයි... අර වාහනෙත් ඉන්නවා හතර දෙනෙක්..."

"කූල් මොනව හරි හදලා එවන්න... හතරදෙනෙක්..." දුරකථනයට කියූ ජයරත්න එය වසා සංජය දෙස බැලුවේය... "එක වාහනයකිද ගියේ...?"

"නෑ... දෙකක් ගියා... ඒක දැන් පැයකට විතර ඉස්සෙල්ලා



ආවෙ... මං කිව්වා ගෙදරට මං එනවා කියලා පණිවිඩේ දෙන්න කියලා... මට ඒකෙනුත් කිව්වා අන්කල් ආයෙ කථා කරා කියලා..."

"ඔව් මං කථා කරලා බැලුවා දැන් කොහේද කියලා...?" නිදහසේ කියූ ජයරත්න අසුනේ දිග ඇදුණේය...

"එහෙනං... ඉතින් වාඩිවෙමු... මට පොඩි දෙයක් ගැන සංජයගෙන් පොඩි කරුණු ටිකක් දැනගන්න තියෙනවා..." ජයරත්න යළිත් කීවේය...

"කොයි වගේ දෙයක් ගැනද...?" අසමින්ම සංජය වාඩිගත්තේ සැබැවින්ම ජයරත්නගේ මුහුණේ තිබුණු පෙනුමෙන් සෑහෙන්නට කුතුහලයක් දැණුනු බැවිනි... ඔහුට මදකට විඩාව අමතක විය...

"ආරතී කියන ළමයා ඔයා අඳුනගත්තෙ කොහොමද...?" ජයරත්න කෙළින්ම ඇසුවේ සංජයගේ නෙත් දෙසම බලමිනි... ඔහු වැල්වටාරම් කියමින් කාලය කන්නට නොසිතුවේය.

"ආරතී...?" සංජය පුදුමයෙන් මෙන් ඇසුවේය... ජයරත්නට මෙම නම ගියේ කෙසේද...?

"ඔව්... ආරතී... '....' හෝටලේ සින්ගර් ගර්ල් කෙනෙක්..."

ජයරත්න අසන්නේ සියල්ල ගැනම දැන ගෙන බව සංජයට සිතුණේය... බොරු කියන්නට ඔහුට මේ මොහොතේ සිතුණේ නැත... අනික තමාගේ බොහෝ දේවල් රටුන්ට රහසක් වන්නේද නැත... ඒවා පිට නොකරන්නේ ඔවුන්ගේම හොඳට බව සංජය නම් දැන සිටියේය... එහෙත් ජයරත්න ඒ රටුන් ගනයට දමන්නට නොහැකිය...

ජයරත්නද එලෙසම සංජයගේ මුහුණින් බොහෝ දේ නිරීක්ෂණය කරගත්තේය... සංජයගේ මුහුණට සැකයක් නැතහොත් වෙනත් පෙනුමක් ආවේ නැත... එය ක්ෂණයකට වෙනස්වුණේ කුතුහලයකින් මිස වෙනත් හේතුවක් නිසා නොවන බව ඔහුට සිතිණ... ආරතී ඔහු සඟවා ගෙන සිටින්නේ නම් එයට වඩා වෙනස් පෙනුමක් මෙම මුහුණට නැගෙන්නට තිබිණ...

"අඳුනගත්තේ ඒකට ගිය වෙලාවකම තමයි අන්කල්..." සංජය කීවේ කටකොණකට සිනහවක් නගමිනි.

"කොච්චර කලක්...?"

"මාස පහ හයක්..."

"ඊයේ පෙරේදා මුණ ගැහුණෙ නැද්ද....?"

"ඊයේ පෙරේදා මුණ ගැහුණෙ නැද්ද....?"

"අන්කල්ට මං බොරුවක් කියන්න යන්නේ නෑ අන්කල්... මං

"අන්කල්ට මං බොරුවක් කියන්න යන්නෙ නෑ අන්කල්... මං

හෙට ආරතී හම්බවෙන්න හිතාගෙන ඉන්නෙ..."

ජයරත්න තරමක් සැක සහිත වුණේය...

"එහෙනං ඉතින් ඔයා දන්නවා ඇති නේද දැන් ආරතී ඉන්න

තැන...?"

"ඇයි එයා ඇත්තේ හෝටලේ...? මොකද අන්කල්...?" සංජය

"ඇයි එයා ඇත්තෙ හෝටලේ...? මොකද අන්කල්...?" සංජය ගණනකට නැතිව මෙන් කීවේය... ඔහුට සිතුණේ ජයරත්න ඔහුගෙන් කුමක් හෝ තොරතුරක් ලබාගන්නට උත්සාහ දරන බව සිතමිනි.

"සංජය... මෙක ගණන් නොගෙන ඉන්න එපා... ආරතී කියන ළමයා නෑ..."

"නෑ...? නෑ කියන්නේ..." එවර සංජය ඇසුවේ තරමක් අසුනෙන් ඉදිරියට වෙමිනි...

ජයරත්න මින් මොහොතකට පෙර පසක් කරගත් දෙයක් ස්ථිර කරගත්තේය... සංජය ආරතී ගැන නොදන්නා බවය... එහෙත් දෙවන වර ඔහු අදහස වෙනස් කරගත්තේය... ඔහු තැනැත්තෙකුට රඟපෑමේ හැකියාවක්ද තිබෙන බව ඔහු නොදන්නේ නොවේ... තමා මේ ගැනම අසන්නට සිතන බව ඔහු සිතාගෙනම ආවේ නම්... සමහරවිට දැන් හෝටලයේ දන්නා කවරෙක්ගෙන් හෝ සංජයට තමා එහි ගිය බව මෙන්ම ආරතී ගැන විභාගයක් පැවැත්වූ බව දැනගන්නට ලැබුණේ නම්... එහි සංජයට තොරතුරු සපයන්නෙක් නැතැයි තමාට සිතන නොහැකිය...

"ඒ ළමයා දැන් සතියක් වෙලේ ඇවිල්ලා නැතිළු හෝටලේට..." ජයරත්න කීවේ එහෙයිනි...

"සතියක් වෙලේ...?" කී සංජය මෙහෙකරු සිසිල් බීම සමග බත්දේසියක් ගෙන ආවෙන් යළි තැන්පත් වූවද, ඔහුගේ මුහුණේ වූයේ සැහෙන බැරෑරුම් බවක් බව ජයරත්නට වැටහිණ... මෙහෙකරු පසුපසින්ම මෙන් ජයරත්නගේ බිරිඳද ආවාය...

සංජය නැගිට්ටේය... ඔහුගේ මුහුණේ බැරෑරුම් පෙනුම මදක් පහවුණේය... නැත...



ඔහු එය තමාගේ නැන්දාට පෙන්වන්නට අකැමැති විය.

"වාඩිවෙන්න පුතා... මොකද මේ හදිසියේ මේ පැත්තේ...?"

ජයරත්න බිරිඳට කිසිවක්ම කියා නැති බව සංජයට සිතිණ... ඔහුද එය කියන්නට නොසිතුවේය... ඒවා කෙළින්ම තමාගේ මවගේ සවණට වැටෙන ඔපාදූප බව ඔහු දන්නේය.

"මේ පැත්තෙන් යන නිසා එන්න හිතුවා නැන්දෙ..." ඔහු කීවේ ජයරත්න දෙසද බලමිනි... ජයරත්නගේ හිස සෙලවීම බිරිඳ නොදක්කේය.

"මොකක්ද සරා කර කර හිටියේ...?" ජයරත්න ඇසුවේය.

"මං අර කර්ටන්ස් වගයක් මැහුවා..." ඇය කීවාය... ජයරත්නට සංජය හා කථා කරන්නට යමක් තිබෙන බව ඇයට වැටහිණ... සැමියාගේ එවන් කථාබහ ඇයට නොකියන්නේ නම් ඇය කවදාවත් ඒවා අසන්නට ගියේ නැත... ඔහු කිව යුතු දෙයක් වේ නම් තමාට කියන බව ඇය දන්නීය... එසේනම් ඇය දැන් කරමින් සිටි කාර්යය වෙත යළිත් යා යුතුය...

ඇය ඉන්පසු සංජය දෙස බැලුවාය.

"එහෙනං පුතා මං යන්නං ඒ වැඩේට... ඒක ටිකක් වෙලා යන වැඩක්..."

"නංගියි මල්ලියි...?"

"නංගි ක්ලාසස් ගියා නේ... එයා එන්නේ ඉතින් ටිකක් රෑ වෙලා... ගෲප් ක්ලාස් එකක් යාළුවෙක්ගේ ගෙදරක... මල්ලි මාලිනී නැගිලාගෙ ගෙදර ගියා... හෙට එක්කගෙන එයි..."

සංජය හිස වැනුවද ඔහුගේ සිතේ වූයේ ජයරත්න තමාට පැවසූ දෙයය... ආරතී හෝටලයට තවමත් නොගියේ නම්...

තමා ආරතීගේ අර මිතුරියට අනම් මනම් දෙඩුවද දැන් තමාට සැහෙන ප්‍රශ්න කන්දරාවකට මුහුණ දීමට සිදුවන බව ඔහුට සිතිණ.

"එහෙනං දාස ගිහිල්ලා අර කට්ටියටත් අල්ලපං..." මෙහෙකරුට කියමින්ම නැන්දා ගෙතුළට ගියේ තමාටත් ජයරත්නටත් නිදහසේ කථාකරන්නට අවසර දෙමින් බව ඔහු දැනගත්තේය...

සංජය සිටින්නේ මෙහෙකරු වාහනය දෙසට යන තෙක් බව ජයරත්න නිගමනය කළේය... කියන හෝ අසන යමක් සංජය රහසිගත අයුරින් කියන්නට හෝ අසන්නට යන බව ඔහුට වැටහිණ...

එහෙයින් ඔහුද මෙහෙකරු යළිත් ගෙතුළට යන තෙක්ම සිටියේය...

"අන්කල් කවදද දැනගත්තේ...?" මෙහෙකරු ගෙතුළට ගිය ගමන්ම මෙන් සංජය ඇසුවේය... ඔහු ඒ තොරතුරු දැනගත්තට බොහෝ තොඉවසිල්ලකින් සිටිනා බව වැටහෙද්දී තේජානි නම් යුවතියගේ තීරණය ගැන සැකයක් ජයරත්නගේ සිතට නැගෙන්නට ගත්තේය...

"අද..."

"අද...?"

"ඔව මට ඇත්තටම වැඩේ බාර දුන්නේ අයෝමා... මට කිව්වේ මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා ඇවිල්ලා බලන්න... මෙක පිටට ලීක් කරන්න එපා කියලා..." ජයරත්න පැහැදිලි කළේය...

"එතකොට අන්කල් මට කථා කළේ ඇයි...?"

"නම කියවුණා..."

එසේනම අර කෙල්ල විය හැකිය... ඔහු මුව තරමක් තද කරමින් ඇද කළේය...

ජයරත්නගේ මුහුණට සිනහවක් නැගිණ... මේ බොහෝ දේවල් වලට කෙල්ලෝ කැමැති බව ඔහුට සිතිණ...

"මොකද සංජය...? මට දැන් එක දෙයක් දැනගන්න පුළුවන්ද...? ඇත්තටම ඒ ළමයා එක්ක ඔයාගේ තිබුණ කනෙක්ෂන් එක මොකක්ද...?"

"ආරති කියන්නෙ මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක්..."

"ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක්...?" ජයරත්න ඇසුවේ තරමක සිනහවකින් යුතුවය...

"ඔව... ආරතී විතරක් එක්ක නෙවෙයි නේ මං ආස්සරයක් කරේ... ඒත් එක දෙයක් තිබුණා..."

ජයරත්න එවර අසුනේ ඉදිරිපසට වුණේය.

"ආරතී අනික් අයට වඩා ගොඩක් වෙනස්..." සංජය කීවේය...

"වෙනස් කිව්වේ...?"

"අනික් අය වගේ මගේ සල්ලිවලටවත් මගේ වැඩවලටවත්



කරදරකාරියෙක් උනේ නෑ... අනික් හැමෝම කාගෙ කාගෙ හරි වැඩවලටත් ඉතින් මගෙන් හෙල්ප් එක ඉල්ලගෙන ආවා නේ... ආරති එහෙම නෑ... අනික ඇත්තටම එයා හැම අතින්ම හොඳ කෙල්ලෙක්..."

"හැම අතින්ම...?"

"ඔව්... හැම අතින්ම... මං හිතුවෙ ඇත්තටම ආරති වගේ වයිෆ් කෙනෙක්..."

ජයරත්නට තරමක් බියක් දැණින... සැබැවින්ම දැන් මේ තරුණියට එසේනම් සිදුවී ඇත්තේ කුමක්ද...? ඇය ගැන මෙලෙස කියන්නේ නම් ඔහු ඇය සඟවා ගෙන සිටිනැයි තීරණයක් කෙළින්ම ගත නොහැකිය... කියන්නටද නොහැකිය... එලෙස කියමින් ඔහුට ඇයව සඟවා ගෙන සිටින්නටද පිළිවන... ඔහු තමාගේ බිරිඳ විශ්වාස කළද මේ ඥාති පුතා එක්වරම විශ්වාස කිරීමට අකැමැති විය.

"සංජය දන්නවා ඒකට සංජයගේ අම්මලා කොහෙත්ම කැමැති වෙන්නෙ නැති විත්තිය..."

සංජය හිස සැලුවේය.

"ඒක නිසා තමයි මං ආරතීව බොහොම ප්‍රවේශමෙන් ආස්සරේ කළේ..."

"ප්‍රවේශමෙන්...?"

"ඔව... මං එයාට කියලම තිබුණා මටයි එයාටයි මැරි කරන්න නං අපි දෙන්නගෙ මේ සම්බන්ධෙ... රහසක් වෙන්න ඕන කියලා..."

"ඒක රහසක් වෙන්නේ නෑ නේ පුතා... මේ වගේ මේ හැමෝටම දැනෙන විදියට එයා එහෙ මෙහෙ එක්ක ගෙන ගියාම..."

"මං එහෙ මෙහෙ එක්ක ගෙන ගියේ නෑ අන්කල්... ඉස් ඉස්සෙල්ලා නං හොටෙල්ස් වලට එහෙම ගියා... පස්සේ නං අපි දෙන්නා හම්බඋනේම අවිස්සාවේල්ලේ මං ගත්තු ගෙදරදී විතරයි..."

ජයරත්න තිගැස්සුණේය... තේජානිද මෙවැන්නක් කීවා ඔහුට මතකය... එසේ නම් ඇය කී අන්දමින් තමාට මෙලෙස කිවද මොහු ඇය කොහේ හෝ සැඟවූවා වත්ද...? එවිට ඔහුට නිවසින් ගෙන ආ යෝජනාවට කැමැති වී විවාහ වන්නට පිළිවන... අර තරුණිය වෙනත් අතියම් අයුරකින් තබා ගන්නට පිළිවන...

"එතකොට ගිය සඳුදා... ගිය සඳුදා ආරතී කියන ළමයා එතනින් පිට වෙලා තියෙනවා... ගිහිල්ලා තියෙන්නේ බැංකුවට... ඒත් එතනට ගිහිල්ලා පණිවිඩයක් දීලා තියෙනවා... එයා සංජු එක්ක යනවා කියලා..."

සංජය තරමක් ගැස්සුණේය... තේජානි තමාට කීවේද එසේමය...

"මං එදා හිටියේ අම්පාරෙ නේ...?"

"ඒක තමයි ප්‍රශ්නෙ... ඒත් පුතා... පුතා දිහාට තමයි ඇඟිල්ල දික්වෙලා තියෙන්නේ..."

"මං එයා ගැන දන්නෙ නෑ මේ වෙලාවෙ නං... සඳුදා එයා මට කථා කරා... එනවා කිව්වා... ඒත් කොහේටද කින්ද මන්ද කියලා මට අහන්න වෙලාවක් තිබුණෙ නෑ... මං කිව්වා වැඩ ඉවර උනාම කථා කරන්නං කියලා... මං හිටියෙ අම්පාරේ කියලා මගෙන් කියවුණාද කියලා නං මතක නෑ... ඒක මට කියන්න හම්බ උනේ නෑ මට මතක හැටියට නං..."

"කථා කරාද ඒ ළමයට..."

"නෑ... කෝල් කරා එයාගෙ සෙල් දෙකටම... වැඩ කරේ නෑ... අන්තිමේදි එයාගෙ යාළුවෙක් ඉන්නවා තේජානි කියලා... ඒකි එක්ක මං කතා කරා... ඒකි කරා කෙරුවෙ හරියට මං ආරතීව කිඩ්නැප් කරලා වගෙයි... මං බැණලා තිබ්බා..." සංජය කීවේ තරමක කෝප සහගත ස්වරයකිනි...

ජයරත්න සුසුමක් හෙලුවේය... සැබැවින්ම මේ දෙදෙන කියන්නේ එකම කථාවකි...

ඇය කිව්වේද බැංකුවට ගිය මිතුරිය ඇයට කථා කොට සංජය සමග යන්නේ යැයි කී බවය. මෙලෙස බලද්දී ඇය සංජය සමග ඒ මොහොතේ කථා කර ඇත...

දෙදෙනාගේ කථාවේ වෙනස්වන්නේ එක තැනකි.

තේජානි සිතන්නේ සංජය මිතුරිය හොරෙන් සඟවා ගෙන ඇති බවය...

සංජය කියන්නේ තමා ආරතීව සඟවා ගත් අයුරින් ඇය කථා කරන බවය...



"මෙක හරි බරපතලයි සංජය... කොහොමින් කොහොම හරි මේ කෙල්ල අතුරුදන් වෙලා තියෙනවා... එතකොට ඒකේ වැරැද්ද ඔයාට දාන්න පුළුවන් මේ තේජානිගේ සාක්කිය ආවම... ඒ ළමයා මං ඉස්සරහ බය නැතුව කිව්වෙ හැම දෙයක්ම... ඒක ඒ විදියටම වෙන තැනකත් කියන්න පුළුවන්... ඇත්තටම සංජය... ඔයා මේ ආරතී කියන ළමයා ඉන්න තැන මේ වෙලාවෙ දන්නෙ නැත්තං සෑහෙන ප්‍රශ්නයක් ඒක..."

"තේජානි කියන එකීට බෑ මට ඇඟිල්ලක් දික් කරන්න..."

"බෑ... ඒක හරි මං පිළිගන්නවා... මං ඉස්සරහම කිව්ව දේ... වෙන තැනකත් කිව්වොත් තිකමට හරි... ඔයා සමහරවිට මාට්ටු වෙන්න ඉඩ තියෙනවා... මං ඔයාගේ පැත්තට හිටියට... වෙන තරහකාරයෙක් හිටියොත් මේක බරපතලයි..."

සංජය මඳක් සිතුවේය... මේ ගැන කථා කළ යුත්තේ තේජානි සමගය... ඔවුන් මේ ආරතී සඟවාගෙන මේ තමාගෙන් කප්පමක් ගන්නට කරන වැර වෑයමක්ද විය හැකිය... නැතහොත් තමාගේ යෝජිත විවාහය කඩා කප්පල් කර දැමීමට සිතමින් ආරතී යොදාගත් උප්පරවැට්ටියක්ද විය හැකිය... කෙතෙක් තමා ගැන ආදරයෙන් දෙඩුවද, තමා නැතිවෙද්දී එය ආරතීට දරා ගන්නට නොහැකි වන්නේ නම් ඇයට මෙවන් පියවරක් ගන්නට හැකිය... එම හෝටලයේ නේවාසිකාගාරය ගැන සෙවීමට වරෙන්තුවක් ගත හැකි නම...

කෙසේ වුවත් දැන් නම් මේ තේජානි සමග කථා කළ යුතුය... ඔහු සිතාගත්තේය.... ආරතී ගියේ කොහිදැයි දැන ගැනීමට මෙන්ම... ආරතී ඔවුන් ළඟ සඟවා ගෙන සිටිනම් එය දැන ගැනීමටද ඔහුට අයිතියක් තිබෙන බව ඔහු සිතුවේය...

"කොයිකටත් අන්කල් මං තේජානි එක්ක කථා කරලා බලන්නං... කොහොමටත් එයා ආරතීගේ ළඟම වගේ හිටිය යාළුවනේ..."

"ඒක හොඳයි... ඒත් හිතන්න එපා ඒ කෙල්ලො නිකං මේ මෝඩකමට නටන දඟලන කෙල්ලො කියලා... කියන හැම වචනයක්ම හොඳට හිතලා මතලා කිව්වොත් හොඳයි..."

එවර ජයරත්න තමාට කළේ අවවාදයක්ද තැති නම් තර්ජනයක්දැයි ඔහුට සිතාගත නොහැකි විය... සමහරවිට එය නිකමට කිව්වක්ද විය හැකිය...

"මං කැමතිත් නෑ ඒ කෙල්ලො එක්ක කථා කරන්න... ඒත් දූන් නොකර බෑ නේ... මේ විදියට බැලුවම... නැත්තං මටත් හිතාගන්න බැරි වෙයි මට ඉස්සරහට කරන්න ඕන දේ මොනවද කියලා..."

"සංජය... ඇත්තටම ඒ කෙල්ල එක්ක ආස්සරේ කළේ මොනවගේ දෙයක් හිතාගෙනද...?"

"මට හිතන්න බෑ අන්කල්... ආරතී පුදුම ලස්සණක කෙල්ලෙක්... ඉස්සෙල්ලාම මට හිතුණේ මගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් වෙන්න නං හොඳයි කියලා..."

ජයරත්න සිනැහුණේය... සංජය ගැහැනු සම්බන්ධයෙන් කටයුතු කරද්දී නම් මොළය පාවිච්චි නොකරනවා විය හැකිය...

"හැම ලස්සණ ළමයෙක්ම ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා හැටියට හිතාගන්න බෑ නේ සංජය..."

"ඒක ඇත්ත... ඒත් ආරතීලා ඉන්නේ නං එක්කෙනායි අන්කල්... අන්කල් ආරතී එක්ක කථා බහ කරා නං ඒක තේරුං ගනීවි..." කියාගෙන ගිය සංජය නැගිටවේය... ජයරත්නද ඒ ලෙසම නැගිටවේය... සංජය ළඟ මේ කියන ළමයා නැත...

ඒ ලෙස බලද්දී තේජානි කී අයුරින් අර සියයට එක අනුපාතයට එකතු වන්නේ නැත... එහෙත් අනුපාතයම අනික් පැත්ත ගැසී ඇත... ඔහුට දූන් මේ ආරතී ගැන සොයන්නට තැනක් ඇත්තේම නැත... සමහරවිට ඇය සංජය සමග යනවා කියමින් වෙනත් තැනැත්තෙක් සමග ගියේද...?

"ඇයි අන්කල්...?" ඇසුවේ ජයරත්න දෙස ඒ මොහොතේ බැලූ සංජය තරමක් වික්ෂිප්ත සිතිනි... මාමාට කුමක් හෝ දෙයක් සිහි තිබෙන බව ඔහුට සිතිණ.

"නෑ... එහෙනං මේ ආරතී කියන ළමයා සංජු එක්ක යනවා කියලා වෙනින් එක්කෙනෙක් එක්ක ගියා වත්ද...?"

සංජය සිනැහුණේය... ආරතී එලෙස කෙල්ලෙක් නම් නොවන වග පැවසිය යුතුය... මෙතැන්හිදී ඇය එලෙස ගියා යනු තමාගේ ජීවිතයද කාබාසිනියා කරන්නකි... කෙසේ වෙතත් ආරතීට තමාගෙන් එහා තැනැත්තෙක් සිටියායැයි ඔහුට නම් සිතාගත නොහැකිය... ඇය බොහෝ හොඳ තරුණියකි. ඇයගේ ඒ හොඳ මනසත්නාට නම් ඔහුට නොහැකි බව ඔහු මෙලෙවලෙහිදී සිතුවේය...



"නෑ අන්කල්... ආරතී එහෙම කෙල්ලෙක් නං නෙවෙයි... යාළු උනොත් ඉස්සෙල්ලම මං එක්කම වෙන්න ඇති... එයා ගැන මං ගොඩක් දන්නවා... ඒක නං එහෙම වෙන්න බෑ... ඒ මොකද මං කෙල්ලගෙන් බේරෙන්න උනත් ඒ වගේ බොරුවක් නං කියන්නේ නෑ... ඒ කෙල්ල බොහොම හොඳ කෙල්ලෙක්..." ඔහු කීවේ ස්ථිර ස්වරයකිනි... ඔහු එය කියා ආලින්දයේ පඩිපෙළ ළඟටද ගියේය...

ඉන්පසු ඔහු ජයරත්න දෙස බැලුවේ යමක් මතක්වූ ලීලාවකිනි.

"මොකද...?" ජයරත්න ඇසුවේය...

"මට දෙයක් මතක් උනා අන්කල්..."

"කියන්න..." ජයරත්න කීවේ සැබැවින්ම උනන්දුවකිනි... ආරතී ගැන සෙවීම දූන් තමාට බාරදී ඇත්තේ අයෝමාය...

"මට ආරතී දූන් සති දෙකකට විතර ඉස්සෙල්ලා කිව්වා... එයාගෙ අවුරුද්දක පඩිය ෆික්ස්ඩ් ඩිපොසිට් එකක දැම්මා කියලා... නොමිනී හැටියට දැම්මේ තේජානිගෙ නම කිව්වා... තව බැංකුවටත් දන්වලා තියෙන්නේ එයාගේ ඒවා තේජානිගෙ බාරෙට කියලා... එහෙම නං..." කී ඔහු තොල් පට සපාගත්තේය...

ජයරත්න සැහෙන්නට පුදුම වුණේය... තේජානි නැමැත්තිය ඒවා කීවේ නැත...

"ලොකු ගණනක්ද...?"

"ෆික්ස්ඩ් එක නං ලක්ෂ හතක් හරි අටක් හරි... මං අහන්න ගියේ නෑ... තව දෙකක් දාලා තිබුණාළු ඉන්ෂුවරන්ස් එකකට... ඒක දැම්මේ තේජානිගේ නංගිගෙ නමටලු... මට ඇත්තටම එයාගේ සල්ලිවල දිග පළල අවශ්‍ය නෑ නේ අන්කල්... ඒවා එයාගේ කැමැත්ත... ඒක... නංගිගේ ඒක නං තේජානිත් දන්නවා කිව්වා... ආරතිට වෙන කවුරුවත් නෑ නේ හිටියේ..."

එය වෙනත්ම කථාවකි... එය ඇය කීවේද නැත... අමතක වුණායැයි කියන්නටද නුපුළුවන... එය සැක සහිතය... ඒවා ලබාගන්නට ඇය තේජානි අතුරුදන් කළා වත්ද...? දූන් ජයරත්න දෙපැත්තෙන්ම හිරවූවා වැනිය... ඇය සංජයට ඇඟිල්ලක් දිගු කරද්දී සංජයද ඇයට ඇඟිල්ල දිගු කරනු ඇත...

ප්‍රමය ඇයගෙන්ම ඇසිය යුතුය... යළිත් වරක් ඇය මුණ ගැසෙන්නට යායුතු බව ඔහු සිතාගත්තේය...

"මට එහෙම දෙයක් නං තේජානි කිව්වෙම නෑ... එයා කිව්වේ සංජය ගැන සැකයි කියලා... ආරතී හංගගෙන ඉන්න එපා කියන්න කිව්වා..."

"හංගගෙන ඉන්න එපා කියන්නේ මං ළඟ ඉන්නවනං නේ... මං අද ගිහිල්ලා තේජානි හම්බවෙනවා... මොකද අන්කල් කියන්නේ...?"

"කමක් නෑ... එතකොට ඉන්ෂුවර් සල්ලි ගෙවන්නෙ ආරතීද...?"

"ඒවා විස්තර නං මං ගත්තේ නෑ අන්කල්... විස්තර ගන්න පුළුවන් එයාගෙ බැංකු සේෆ් එකක් නං තියෙනවා... ඒ කේ යතුර ඇති ආරතීගෙ කාමරේ කොහේ හරි... බැංකු සේෆ් නම්බර් එක නං මං ළඟ ඇති... මම ගිහින් එයාට ඒක අරන් දුන්නෙ..."

"ඒවා තේජානි දන්නවා නං දැන් අයින් කරලත් ඇති..." ජයරත්න කීවේ සංජයගේ කීමට සිනහසුණු ඉක්බිතිය...

"මං ගිහින් කොයිකටත් අද තේජානි කියන එකී හම්බවෙන්න එන... ඒ කෙල්ලගෙ කට වැඩියි..."

ජයරත්න සිනැහුණේය... තේජානි බිය නැත... කට වැඩිවා මෙන් පෙනෙන්නේ එහෙයිනි... තනතුරට ආවඩන්නේ නැති නම් කා සමග හෝ කථා කරන්නට බියක් සැකක් දැනෙන්නේ නැත... ඇය තනතුරකට ආවඩන්නියක නොවේ... එහෙත් මේ සංජය කියන අයුරු ඇයට ලක්ෂ හත අටක් හිමි වන්නේ නම්... සමහරවිට ඇයම මේ අතුරුදන්වීම කළා වත්ද...? එසේනම් ආරතී ගැන අදහස අත් හැර ගත යුතුය... ඇයගේ සියල්ල ලැබෙන්නේ ඇය ජීවත්වී නොසිටියොත් පමණි.

"මං යනවා අන්කල්..." ජයරත්න තරමක කල්පනාවක් කල බව වැටහුණද එය නවතා සංජය කීවේය... ආරතී ගියේ කොහේදැයි සොයා ගත හැක්කේ කෙසේද...? මේ තේජානි නැමැත්තියගේ වැඩක්ම නම්... සමහරවිට ඇය ආරතී මැරෙව්වා වන්නටද පිළිවන...

සංජයගේ මුහුණට කැළඹිල්ලක් ආවේ දැන් බව වැටහෙද්දී ජයරත්නද නොසන්සුන් විය... සමහරවිට ඔහුටද තමාට මෙන්ම මෙහි බැරෑරුම් කම වැටහුණේ දැන් විය යුතුය... මෙලෙස බලද්දී ආරතී නැමැත්තියගේ ජීවිතය ගැන සිතාගත නොහැකිය...



වෙනත් කිසිවක්ම නොපවසා සංජය පඩිපෙළ බැස වාහනය දෙසට ගියේය...

සංජයගේ මිට මෙලවුණේ වාහනයට නැග වාඩිවෙද්දීය.

"මොකද සර්...?" සංජයගේ රියැදුරු ඇසුවේ සංජය බොහෝ කැළඹිල්ලකින් මෙන් සිටිනු දකිද්දීය...

"නැහැ ජයන්ත යමු..." සංජය කීවේය... ජයන්ත බොහෝ දේ දන්නේ වුවද පසුපස සිටින තිදෙනා ගැන ඔහුට විශ්වාසයක් ගත නොහැකිය... ආරතී ගැන ඔහු වැඩ කළේ බොහෝ ප්‍රවේශම් සහගතවය.

සංජය කිසිවක්ම නොකියා වාහනයේ රේඩියෝවේ හඬ වැඩි කළේය... සංජයගේ සිත් යමක් කරකැවෙන බව වැටහෙද්දී පසුපස සිටි ආගන්තුකයින් තිදෙනාද කථා කරන්නට වූයේද සෙමිනි.

නිවසට ගිය විගසින්ම මෙන් ඔහු වේලාව බැලුවේය... දැන් නකට කිට්ටුය... අට වෙද්දීවත් හෝටලයට යාමට ඔහු තීරණය කරගත්තේය...

ඔහු දෙවරක්ම මෙන් යළි ආරතීගේ දුරකථනයටද දුන් කථා කළේය... නැත... එහි ප්‍රතිචාරයක් නැත... තේජානිගේ අංකයට හෝ මයන්ත නැමැත්තාගේ හෝ අංකයට කථා නොකර ඔහු සිතුවේ කලින්ම හෝටලයේදී ඒ දෙදෙනා මුණ ගැසීමටය... සමහරවිට මේ නාඩගමේ කොණක් පටක් ඔහුට හමුවෙන්නට පිළිවන...

ඔහුට දැන් සැබැවින්ම කැළඹිල්ලක් දැනෙමින් තිබිණ... ආරතී අතුරුදන් වීමක්... නොව අතුරුදන් කිරීමක් කළේ නම් එය කළේ කවුරුදැයි ඔහුට සිතාගත නොහැකි හෙයිනි... මව ගැන කෙසේ වතුදු ඔහුට පියා ගැන විශ්වාසයක් තැබිය නොහැකිය... යෝජිත නැනැත්තියගේ පැත්තේ අයියලා ගැනද ඔහු හොඳින්ම දැන සිටියේය...

ඒ අතර තේජානි... ඇයට වුවද මයන්ත නැතහොත් වෙනයම් නැනැත්තෙක් හරහා ආරතී නැති කර දැමීමට පිළිවන... එක් පැත්තකින් තමාගේ නාමයට නිගරු කිරීමට... අනික් පැත්තෙන් ඇයට වෙන වාසිය ගැනීමට... ඔහුට එය මතක් වෙද්දී කැළඹිල්ල පරයා බියක්ද නැගෙමින් තිබිණ... ඒ ඔහුට වෙන හානියක් නිසා නොවේ... හානියක් නම් ඒවාට පිළියම් ඇත... එහෙත් ඇය...

ආරතී නැතිවුවහොත්...

ගැහැනියක නැතිවූවායැයි ඔහුට අත පිසදාගත නොහැකිය... නීත්‍යානුකූල බිරිඳක මෙන් පිළිගැන්මට නොහැකි බිරිඳක මෙන්... වුවද ඇය තමාගේ සිත ගත දෙකම පිනවූ, පිරවූ එකම ළඳ බව නම් නොසිතාම නොහැකිය... ඇයවන් ළඳක් නැතිවීම...

දැන් නම් මේ සියල්ල දැන ගැනීමට තේජානි නැමැත්තියද අකැමැත්තෙන් හෝ හමුවිය යුතුය... ඔහු සිතාගත්තේය...

★★★

ඔහු හෝටලයට පය තැබුවේ නවය පසුවී විනාඩි ගණනාවක්ද ගතවූ පසුය... ඒ වෙද්දී ඔවුන්ගේ රංගනයන් ඇරඹී තිබිණ... බොහෝ විට ආරතීගේ ගී ගැයුම එන්නේ අට හා දහය අතර බව සංජය දැන සිටියේය... කවුරුන් කෙසේ කීවද ආරතී තමා හා එක්වෙද්දී සිටියේද කන්‍යාවියක ලෙසය... ඔහුට ඇය අමතක කළ නොහැකි කරුණ වූයේද එයය. මෙතෙක්ම ඔහු හා එලෙස ආ එකද යුවතියකවත් කන්‍යාවියක ලෙස සිටියේ නැත... මෙම හෝටලයේ එම සේවාවේ යෙදෙන තරුණියන්ට ඔවුන් අකැමැත්තේ අනික් සේවාවන් වල නොයොදවන බව ඔහු දැන ගත්තේද එහෙයිනි...

හෝටලයේ ගී ගයන රඟන යුවතියන් වුවද ඔවුන්ගේ පිවිතුරු බව ගැන ආරතීගෙන්ම ඔහු දැනගෙන සිටියේය... එහෙයින්ම ජයරත්න අන්කල් කියූ ලෙස ඔවුන්ට ගරහන්නට නම් නොයෑමට ඔහු තීරණය කරගෙන සිටියේය... එහෙත් මේ තේජානි ගැන ඔහුගේ සිතේ තිබුණේ එතරම්ම පහන් හැඟීමක් නොවේ... ඇය තමාට ගරු නම්බු දී කථා කළාට... කටකාරියක් බව සිතට දැණුනු හෙයිනි... ඔහු කටකාරියන්ට කැමැත්තක් දක්වූයේ නැත... ආරතී ඒ අතින් බොහෝ යටහත් පහත්ය... ඇයට තමා ඇයව පත්කළ එම තත්ත්වයම ඉස්මතුකොටගෙන තමා යටපත් කරගැනීමට තිබිණ... එහෙත් ඇය කෙදිනකවත් එසේ කළේ නැත... දන්නා තරමින් එසේ කරන්නට උත්සාහයක් ගත්තේද නැත.

හෝටලයට ඇතුල්වී රංගනයන් කරන වේදිකාව තිබුණු කොටසට ඇතුල්වෙන තෙක්ම ඔහුගේ සිතේ තිබුණේ දෙගිඩියාවකි... එහෙත් ඔහු දකිද්දීම ඔහුට ආචාර කළ ආරක්ෂක නිලධරුවාගේ සිනහවෙන් ඔහුගේ සිතේ දෙගිඩියාව පහවිය...

ආරතී නැති වීමට තමාගේ නම ගැව් තිබුණේ නම් මෙයට වඩා වෙනස් ප්‍රතිචාරයක් ඔවුන්ගෙන් ලැබෙනු ඇත...



එහෙයින් ඔහු කිසිවක් ගැනම නොසිතා ශාලාවට පා තැබුවේය... මේසයක් කරා යන්නට පෙර ඔහු වේදිකාව දෙස බැලුවේය... දෙදෙනෙක්ම ගී ගයමින් සිටි අතර පාට ගාගෙන නටමින් ගයමින් සිටියේ තේජානි නැමැත්තිය බව ඔහු දැනගත්තේය... අනික් නැනැත්තිය ආරතී නොවූවාය... ඒ තරුණියගේ නම ඔහු දන්නේ නැත... ඇය තේජානිට සහයක් දුන්නා පමණක්ම විය හැකිය... බොහෝ විට ප්‍රධාන ගී ඛණ්ඩ ගැයෙන්නේ ආරතී හා තේජානිගෙනි... අද ඇය තනියම ගී ගයන්නා වැනිය... ඇය ගයමින් සිටියේ ප්‍රසිද්ධ ඉංග්‍රීසි ගීතයකි...

කටකාරියක වුවද ඇය කෙරෙහි පහන් හැඟීමක් නොවූවද ඇයගේ ගායනයට නම් ඔහු එදත් ගරු කළේය... ඇයට ඒ හැකියාව සහජයෙන්ම මෙන් පිහිටා තිබෙන බව නම් නොසිතාම නොහැකිය... ආරතීට වඩා ඇය ඒ අතින් නම් ඉදිරියෙන් සිටියාය... ඇය එතරම් රූමත් නැති බව ඔහු සිතාගත්තේ අනික් අය මෙන් නොව ඇය බොහෝ විට වෙස් වලාගෙන මෙන් ගී ගයන හෙයිනි... ඔහු ඇයගේ ඡායාරූපයක්වත් දක්කේම නැත... ආරතී ඇයත් සමග ගත් ඡායාරූප එකක් ඇති බව කීවත් එය ගෙන එන්නට ආරතී උත්සාහයක් ගත්තේ නැත... එය දකින්නට සංජයට අවශ්‍යතාවයක් ආවේද නැත...

තේජානි ලස්සණයි... ආරතී කීවද එය ඇත්තක් යැයි පිළිගන්නට සංජයට නොහැකි විය... ආරතී බොහෝ රූමත්ය... එහෙත්... තේජානි ගැන නම් එලෙස සිතන්නට ඔහු පෙළඹුණේ නැත...

කෙසේ වූවත් ඔහුට මෙම හෝටලයෙන් නම් ආරතී ඇර වෙනත් තරුණියක ගැන සිතුණේද නැත... ආරතී වන් තරුණියක් නම් මෙතෙක්ම ඔහුට මුහුණ ගැසී තිබුණේද නැත...

වාඩිවූ ඔහු දැන් බැලුවේ වෙනත් ගීතයක් ගැයෙන්නේ කිමද යන වික්ෂිප්ත සිතිනි... මේ කුමක් හෝ රංගනයේ වෙනසක් විය හැකිය...

වේග රිද්මයේ ඉංග්‍රීසි ගීතය නතරවී දැන් වෙනත් ගීතයක් ගැයෙමින් තිබිණ... බොහෝ නිසන්සලේ ගලාගෙන යන... එය හින්දිද නැතහොත් දෙමළද වංගද යන්න වත් ඔහු දැනගත්තේ නැත... එහෙත් ගයන්නිය දෙස නොබලා සිටින්නට නම් ඔහුට නොහැකි වූයේ එක් අතකින් ඔහු පැමිණියේ ඇය සමුවීමටම හෙයිනි... අනික් අතින් බලන

හොත් ඔහුට ගීතය නොතේරුණද, ගායනය තේරුණ අන්දමින් ඇය ඒ ගීතය දක්ෂ අන්දමින් ගයන හෙයිනි. එයටත් වඩා එයට ඉදිරිපත් කළ රංගනයද... ඉතා උසස් තත්ත්වයේ තිබිණ... එහෙත් ඒ ගීතය නම් මෙවැනි තැනකට අනුචිත අයුරක් දකින්නට ලැබිණ...

එක් කොටසකින් පසු යළිත් නිහඬතාවයක් දැණින... ඉන්පසු ඇය යළිත් පැමිණියේ ඔහු ශාලාවට පය තබද්දී ඇසුණු වේග රිද්මයේ ගීතයටය... ඇයගේ රංගනයද ගායනයට දෙවැනි නොවිණ... සැබැවින්ම පසෙකින් රැඟුම් ඉදිරිපත් කළ රංගනියන්ට වඩා ඇයගේ නැටුමද... ඔහු තරමක් සැලෙමින්ද සිටියේය... මෙතෙක්ම ආ ගිය වතාවක හෝ ඔහු ඇයගේ මෙවන් නැටුමක් හා ගීත ගායනයක් ගැන සිත යෙදවූයේ නැත...

ආරතී තමාට කියා ඇත්තේ සත්‍යයකි...

...ජානි කියන්නේ ගොඩක් දක්ෂ කං තියෙන කෙල්ලෙක් සංජු... එක අතකට මං වගේ නෙවෙයි... එයාට හොඳට ඉගෙන ගත්තනං ඉහළටම යන්න තිබුණ කෙල්ලෙක්...

ආරතී ගැන අසන්නට පැමිණි තමා මේ කෙල්ලගේ මෙම ගීතයට හා රංගනයට වහ වැටුණා වත්දැයි සංජයට සිතුණේ ඇයගේ ගායනය හා රංගනය නැවතෙද්දී තව දුරටත් එය තිබුණේ නම් හොඳයැයි සිතිවිල්ලක් පහළවූ බැවිනි...

කෙසේ වුවත් වේග රිද්මය ගත් ගමන්ම මෙන් බොහෝ දෙනෙක් ඇයට අත්පොළසන් දෙමින් නැගිටිද්දී ඔහුද නැගිට්ටේය... ඒ ඇයට ආචාරය කළේ කිමදැයි ඔහුට සිතාගත නොහැකි වුවද, සියල්ලෝම මෙන් නැගිටිද්දී, ඔහුටද නොනැගිට නොහැකි වූ හෙයිනි...

ආරතිට වඩා ඇය වෙනස් තැනැත්තියක බව ඔහුට සිතිණ... ඇය තරමක රාජිණියක වැනිය... හිස නැමූ ඇය ඒ ආචාරය පිළිගත්තේ ඔහු කිසිවෙක්ගෙන් දැන සිටි අයුරු නොවේ... මේ පරාසයේ බොහෝ අයට වඩා ඇයගේ පෙළැන්තිය උසස් විය හැකිය... ආරතී කීවාක් මෙන් මැය හොඳ මාපියන් දෙදෙනෙකුගේ දුවකි... එසේ නම්...

ඔහු ඇය ගැන සිතීම නවතා ගන්නට උත්සාහයක් දැරුවේය... එහෙත් ඔහුගේ සවණේ දෝංකාර දුන්නේම ඇයගේ ගීතයය... ඒ කටහඬ පමණක් නොව සංගීතයක් හෝ නොමැතිව ඇය කළ ඒ ගායනය ගැන නම්... ඉන්පසුව වේග රිද්මයේ රංගනය නම්...



ඇයගේ සිරුර වුවද එම ඇඳුමට හොඳින් ගැළපිණ... ඇය පුර්විමත් යුවතියක විය යුතුය... ආරතී මෙයට වඩා තරමක් උසය... ඇය සිහින්ය... මෙම තරුණියගේ මන බඳිනා ගායන නර්තන විලාශයක් ඇත... ඔහුගේ සවණට මෙන්ම නෙතට අද ඇයගේ ගායනය හා රංගනය දැකුමකළු දසුනක් එක් කර තිබුණේය....

ඔහුට මදකට ආරතී නැති බවද අමතක වූ තරමය...

ඇයගේ නෙතේ ඔහු වෙනුවෙන් දැල්වුණු කෝපය නම් ඔහුට දකින්නට හැකියාවක් තිබුණේම නැත... ඔහු ගායනය හා රංගනය නිම වෙන තෙක් තරමක් සප්පායම් වෙන්නට සිතුවේ... මැය සමුවීමට කවරෙක්ගෙන් හෝ අවසරයක් ගත යුතු බවද සිතමිනි... කාඩ්පතක් යැවුවාට ඔවුන් සමුවීමට නොහැකිය... එහෙත් අද දින සමහරවිට තමාට ඇය හමුවීමේ අවස්ථාවක් සාදා ගත හැකි වනු ඇත... ඔහු එතන සිටින තමා හඳුනන ආරක්ෂක නිලධරුවා සිටීදැයි බලන්නට තීවේ ශාලාවෙන් එළියේ තැනක නතර වී සිටි ජයන්තටය...

ඒ සමගම ඔහු ඔහුට අවැසි දේවල්ද ඇණවුමක් කරන්නට උන්නේය...

ආරතී නැතිවී ඇති බව ඔහු කීවේ ජයන්තට පමණි... එය කවරෙකුටවත් කියන්නට නම් ඔහුගේ සිත ඉඩ දුන්නේ නැත... ජයන්ත මෙවැනි දේවලට තමාට උදව් දෙන්නෙකි... කැල්ලෙන් කෑල්ල කැපුවද ජයන්ත තමාගේ රහස පිට නොදෙන බව සංජය දැන සිටියේය...

එහෙයින් ඔහු මෙහි ආවේ ජයන්ත සමගම පමණකි... ගීතය නිමවෙද්දී ඉදිරියෙන්ම සිටි විදේශිකයෙක් නැගිට ඇයට ආචාරයක් කළ බවද ඔහු දුටුවේය... සමහරවිට මේ විදේශිකයා ඇයට මෙක් දනක් හා කාඩ්පතක් යවන්නටද පිළිවන... ඇය එය පිළිගන්නටද පිළිවන... ඔහුට සිතුණේ එයට පෙර ඇය මුණ ගැසෙන්නටය...

ජයන්ත ආරක්ෂකයා කැඳවාගෙන ආවේ අතික් රංගනයක් වේදිකාවේ ඉදිරිපත් වෙද්දීය... එය ඔහුගේ සිත් ගත්තේ නැත... එය වන් මැන් ෂෝ එකකි... නැටුමට නම් මෙහි කිහිප දෙනෙක් එක්වී සිටි බව ඔහු දුටුවේය... තේජානි එහි නැත... ඇයට ඇඳුම් මාරු කරමින් එන්නට වෙලාවක් නැත...

ඔහු ආරක්ෂකයා දෙස බැලුවේය.

"සර් මාව හම්බවෙන්න ඕන කිව්වෙ...?" ආරක්ෂකයා ඇසුවේ තරමක කුතුහලයකිනි... මෙ සමහරවිට තේජානි නැමැත්තිය සමුවීමට කැමති බව ඔහු දැන සිටියේය... එය කිව යුත්තේ ෂෙනාලි මිස්ටය... කෙසේ වූවත් අද නම් ඇය සමුවීමට මෙ කැනැත්තාට ඉඩ දෙන්නටද පිළිවන...

"ඔව් සුරංග... මට දැන්ම තේජානි කියන කෙල්ල හම්බවෙන්න ක්‍රමයක් හදාගන්න ඕන... හෙට වෙන කං ඉන්න බෑ... මේ දැන්ම..."

"දැන්ම...?"

"ඔව්... මට එයත් එක්ක කථාවක් කරගන්න තියෙනවා... ආවද ආරතී මිස්...?"

"නාම නැහැල්ලු සර්... එහෙට ඇවිල්ලා නෑ... කට්ටිය කථා උනා... අද උදේ මෙහේ පොඩි ඉන්ක්වයරි එකකුත් තිබ්බා... එහෙටත් ගියා..." එය ගැන තමා දන්නා බව කියන්නට සංජය උත්සුක නොවුණේය...

"එහෙට කිව්වේ...?"

"එහේ මෙ කට්ටිය නැවතිලා ඉන්න තැනට..."

සංජය හිස සැලුවේය...

"මං දන්නවා... මගේ නමත් ගිහිල්ලා කියලා මං දන්නවා... මට ඒක නිසා මෙ ආරතීගේ කාමරේ ඉන්න අනික් කෙල්ලවයි හම්බවෙන්න ඕන..." සංජය එවර නම් තරමක විධානයකින් මෙන් කීවේය.

ආරක්ෂක නිලදරුවා ඒ වාග්‍ය සමණය කළ ගාලාවෙන් එළියට ගියේ ඉහින් කණින් දහදිය පෙරාගෙනය... එය ඇසිය යුත්තේ ෂෙනාලි මිස් ගෙනි... ෂෙනාලි මිස් මැඩමට පණිවිඩය දෙනු ඇත... නැතහොත් ඇයම වගකීම පවරාගෙන සංජයට තේජානි නැමැත්තිය මුහුණ ගැසීමට ඉඩ දෙනු ඇත...

සුරංග සිතුවා නිවැරදිය... සංජය පලන්සූරිය තේජානි නැමැත්තිය මුහුණ ගැසෙන්නට කැමැති බව ෂෙනාලි මිස්ට දැන්වූ විගස ඇය තරමක් හිස සලා තේජානි හා මිතුරියන් සිටි කාමරය වෙත ගියාය...

තේජානි සිටියේ මෙම මොහොතට සූදානම් වෙමිනි...



සියල්ලෝම කථා කරමින් සිටියේ මොහොතකට පෙර වේදිකාවේ දුන් රංගනය ගැනය... සිරිනි එය යළිත් පෙන්වමින් සිටියාය... සියල්ලෝම එයට සිනහසෙමින් සිටියහ... රංගනය අති සාර්ථක වූ බව කියමින් අන් අයද රූප ලාවණ්‍යයන් ඉවත් කරමින් සිටියහ... තේජානි එහෙත් එලෙසම සිටියාය...

සමුදි පැමිණ තේජානි ළඟින්ම වාඩිවුණාය. තේජානි සංජයගේ දැකුමෙන් තරමක් සසලව් සිටින බව ඇයට සිතෙමින් තිබිණ...

"ජානි... මෑන් මහ එක විදියක එකෙක්..." ඇය කීවාය. ඇය බියව් සිටියේ සංජයගෙන් දැන් තේජානිට කරදරයක් වේදැයි යන්නය... ආරතීට ඔහුගෙන් කරදරයක් වූයේ නැත... ඒ ඔහු ඇය වෙත ළඟාවූ හෙයිනි... එහෙත් තේජානි... ඇයට මෙ මිතුරියද නැති කරගැනීමට දැන් නොහැකි වාක් මෙන් දැණින... ඔවුන් සියල්ලෝම එකිනෙකා හා වැඩිය කථා බහ නොකළද ඔවුන් සිටියේ සැබැවින්ම එක පවුලක සොහොයුරියන් ගොන්නක් මෙනි...

"රතී ගැන දැනගන්න තියෙන්නේ මෑන්ගෙන්මයි සමුදි..."

"අනේ මන්දා ජානි... පරිස්සමෙන්... ඇත්තටම රතී ගියේ වෙන කවුරුහරි එක්ක නං..."

"එහෙම නං කවදාවත් රතී මට කියන්නේ නෑ සමුදි සංජු එක්ක යනවා කියලා... රතී එහෙම කෙල්ලෙක් නෙවෙයි..." තේජානි කීවේද සංජයගේ සිතේ තිබුණු දෙයම බව දැනගන්නට නම් ඇයට ඒ මොහොතේ දිවැස් තිබුණේද නැත...

"කරන දෙයක් පරිස්සමින්... දැන් ඔයා කථා කරන්නද යන්නේ මෑන් එක්ක..."

"බලමු සමුදි... මට හිතන්න බෑ... මෙහෙන් ඉඩ දෙයිද දන්නෙ නෑ නේ මට කෙලින්ම මෑන් එක්ක කථා කරන්න..." තේජානි කීවේ සැබැවින්ම සංජයට ඉහළට කළ හැකි බලපෑම නවත්වන්නට නම් තමාට නොහැකි බව දන්නා හෙයිනි...

කෙසේ වූවත් ඇයගේ සිතේ තිබුණේ තෘප්තිමත් හැඟීමකි... සමුදිට නොකීවද ඇය සිතමින් සිටියේ සංජය තමා වෙත පැමිණෙන බවය... ඔහුට ආරතී ගැන දැනගැනීමට නම් ආ යුත්තේ තමා වෙතට බව මෙන්ම... ආරතී සඟවා ගෙන සිටින්නේ නම් ඒ ගැන කථා කරද්දී

ඔහු හොඳින්ම දන්නා බව ඇය දැන නවතාගත යුත්තේ තමා බවද, ඔහු හොඳින්ම දන්නා බව ඇය දැන සිටියාය... ඇය සිටියේ ඔහුගෙන් පැමිණෙන පණිවිඩය ගැන සිතමිනි... ඔහු ඇයට සංජය වෙත යා යුතු වූයේ මෙම වෙස්වලාව සමගය... ඔහු කෙරෙහි තිබෙන කිසියම් කහටක් ඇයගේ දෙනෙතින් ඔහු ඉදිරියේම ඔහුට දිස්වෙනු දැකීමට ඇය අකැමැත්තක් දැක්වූයේ ඇයගේ මිතුරියගේ ජීවිතය ගැන සිතෙද්දීය...

තමාගේ සිතේ අකැමැත්ත ආරතිට කරදරයක් වන්නට පිළිවන... ඇයට අවශ්‍ය වූයේ මිතුරියගේ සතුට මිස ඇයව කරදරයකට පත් කිරීම නොවේ...

"ජානි..." ෂෙනාලි කාමරයට ඇතුල්වෙද්දී සිනහසෙමින් තුන් සියල්ලෝම මෙන් නිහඬවූහ... මෙවන් රංගන අංගයකට පසු ඇය මෙලෙස විවේක කාමරයට එන්නේ කුමක් හෝ වැදගත් යමක් කියන්නට බව ඔවුන් දැන සිටි හෙයිනි...

තේජානිට සිතුණු සිතුමම බොහෝ අයට සිතී තිබිණ... ඒ ඇය ආවේ සංජය නැමැත්තාගේ කිසියම් පණිවිඩයකට බවය.

"මිස්..." කියමින්ම තේජානි නැගිට්ටාය... නොසිතුවද ඇයගේ දෙකකුල් තරමක් ගැහෙන බව ඇයට වැටහිණ... සංජය පලන්සූරිය හා දුරකථනයෙන් කථා කළාට මෙලෙස මුහුණට මුහුණ දී කථා කිරීම නම් එතරම් ලෙහෙසි පහසු කරුණක් නොවනු ඇත. දුරකථනයෙන් වුවද ඔහුගේ කටහඬට ඇයගේ සිත තිගැස්සී ගියේ මින් දින දෙක තුනකට පෙර බව අමතක කරන්නටද ඇයට නොහැකි විය... එහෙත් ආරතී ගැන දැනගත යුත්තේ ඔහුගෙනි... ඔහු කෝප ගත්වා හෝ එය දැනගත යුතුය...

ආරතිට බොරුවක් කිරීම අනෙකකි... මිතුරිය සොයනා තමාට බොරු කිරීම තවෙකකි...

"ජානි... මිස්ට සංජය පලන්සූරිය ඇවිත්..."

"මාට හම්බවෙන්න...?"

"ඔව්... ඔයාට අකැමැති නං කමක් නෑ... ඒත් ඉතින්..."

"නෑ මිස්... මං යන්නං... අපිට රතී ගැන දැනගන්න තියෙන එකම තැන එතන විතරයි නේ... මං යන්න ඕන... යන්නම ඕන... රතී වෙනුවෙන්..."



නැතැයි කිව නොහැකිය... සමහර මිතුරියන්ගේ දෙඇස් ඇයගේ එම කථාවෙන් කඳුලින් බරවිය... ඇය ඒ වදන් කීවේ බොහෝ හැඟීම්බර අයුරිනි... තේජානි විශ්වවිද්‍යාලයේදී තමාවෙන් කාලය පා කළද මෙතරම් සංවේදී යුවතියක බව කවුරුවත් දැන සිටියේද නැත... ඇය බියපත් වී අවදිවන්නේ සිහින දකින්නේ සමහරවිට මේ නිසා විය හැකි බවද ඔවුන්ගෙන් දෙතුන් දෙනෙකුට ඒ මොහොතේදී නම් සිතිණ...

"මං කිව්වා මගේ ප්‍රයිවෙට් රූම් එකේ ඔය දෙන්නට කථා කරන්න ලෑස්ති කරවන්න කියලා... ඒක ලේසියි නේ... මං ඉන්නවා මගේ ඔෆිස් රූම් එකේ... ප්‍රශ්නයක් නං ඔයාට මට කථා කරන්න පුළුවන්..."

ප්‍රශ්නයක් විය හැකි ය... එහෙත් ඒ කිසිදු ප්‍රශ්නයකට අනික් සිසුවෙක්ම ගැවෙනවාට නම් තේජානිගේ කැමැත්තක් නොවිණ... සංජය යනු රූමතෙකි. බලවතෙකි. ධනවතෙකි... එලෙසම එම නැතැත්තා ගෝනුස්සෙක් බවද ඇය අමතක කරන්නට සිතුවේද නැත...

හදවතේ බරට සිහිවිලි තිබුණ හෙයින්දෝ ඇයට අනික් මිතුරියන්ට වුවද කියන්නට තරම් හදවතේ තැන්පත් බවක් තිබුණේම නැත...

ඇය කිසිවෙකුගේ මුහුණක් වත් නොබලා සෙමින්ම ෂෙනාලි පසුපසින්ම ගියාය... ඇයට සිතුණේ මයන්න තමා පසෙකින් සිටින්නේ නම් හොඳ බවය... එහෙත් ඔහු කථා කරන්නට සිතුවේ තමන් සමගම පමණක් නම්... ඔහු ඔහුගේ රහස් පිටදෙන්නට අකැමැති බව ඇයට සිතිණ...

ඒ ඔහුගේ පැත්තෙනි... එහෙත් මිතුරියගේ පැත්තෙන් බලද්දී... ඇයටද ආත්ම ගෞරවයක් කියා දෙයක් තිබෙන බව ඔහු සිතා බලා නැත... ඒ අතින් බලද්දී ඔහු මෝඩයෙක්ද බව ඇයට සිතුණේ කාමරයට ඇතුල්වෙද්දීය...

තේජානි නම් යුවතිය කාමරයට ඇතුල්වෙද්දී ගණනකට නොගෙන ඉන්නට සිතූ නමුදු සංජයට එය පහසු වූයේ නැත... ඇයට වඩා ෂෙනාලි බියෙන් ඇතුළට පා තැබූ බව ඔහුට සිතෙද්දීය...

කෙතරම් පා සැලුණද හදවත ගැහුණද, තේජානි කාමරය තුළට ගියේ ආරතීගේ අතුරුදන්වීමේ වේදනාවෙන් සිත මිදදල් වෙද්දීමය... ඇය අතුරුදන් කර ඇත්තේ මේ රූමතාය... බලවතාය...

ඒ රූමත්කම බලවත් කම හෝ පෝසත් පෝසතාය... ඇයට ඔහුගේ ඒ රූමත්කම බලවත් කම හෝ පෝසත් කම අවශ්‍ය නොවිණ... ඇය දන්නා තරමින් ඇය ගියේ ආරතීගේ පෙම්වතා මුණ ගැසීමටය... නැත... ආරතී අතුරුදන් කළ පුද්ගලයා මුණ ගැසීමටය...

එහෙයින්ම ඇය කාමරයට ඇතුල්වුණේ රාජිණියකගේ පියවරකිනි...

ඇයගේ ස්වරූපය නිසාම මොහොතට නොනැගිටි සංජය ඇය ඇතුල්වෙද්දීම නැගිට්ටේය... ඔහු මුවගට සිනහවක් නගා ගන්නට ඇතුල්වෙද්දීම ඔහු දෙස බැලුවේ ඇයගේ තැත් දුරුවද... නැත... ඇය ඇතුල්වෙද්දීම ඔහු දෙස බැලුවේ ඇයගේ සුදු පැහැති රාමුවකින් යුතු කණ්ණාඩි යුගල මැදිනි... එම දෙනෙත් දීප්තිමත් විය... එහි තිබුණේ ක්‍රෝධයම පමණක් බව වැටහෙද්දී සංජය සැහෙන්නට නොසන්සුන් විය... එහෙත් ඒ දෙනෙත හරියාකාරම වටහාගැනීමට නම් එම කණ්ණාඩියෙන් බලා ගැනීමට නොහැකි විය... ඇයගේ දෙනෙතින් තමා දෙස එක් එල්ලේම බැලූ බව ඔහු දුටුවේ එයට පහන් එළිය වැදී කිසියම් ආකාරයකින් ඇයගේ දෑස් එම කාචයෙන් පිටට එක්වරම දසුනක් දුන් හෙයිනි... ඇය එම තැනිත් ඉවත්වෙද්දී යළිත් ඇයගේ දෑස් කාච යුගලයෙන් වැසුණෙන් එම දෑස් වල පසුව දිස්වුණු ක්‍රෝධයේ තරම නම් සිතාගන්නට ඔහුට නොහැකි විය... ඒවා තේජානිට දැණුනේ නැත... කෙතෙක් ශෝපය ගැහුණද සිත ගැහුණද සංජය නැමැත්තා මෙලෙසින් මුහුණ ගැසෙද්දී ඇයගේ සිතට නැගුණේ තමාගේ මිතුරියගේ අතුරුදන් වීමට එකම හේතුව මේ තැනැත්තා බව ය... ඇයගේ කෝපය නිසා ඇයගේ පසුබෑම දන් යටපත් වී තිබිණ...

★★★

"මිස්ට සංජය මේ තමයි ජානි..."

"මං නැටුමකට නං නෙමෙයි එන්න කිව්වේ..." කෙතරම් ඇයගේ එම් ආගමනයෙන් සිත් කලබලවී සිටියද සංජයට පිළිතුරක් දීමට හැකියාවක් තිබිණ...

ඒ ඇය ඇයගේ නැටුම් ඇඳුමින්ම පැමිණි නිසා බව මොහොතට වටහාගත නොහැකි වුවද තේජානිට වැටහිණ... මේ මිනිසා... සියල්ලටම පළමු ඔහු අමනය කරගත යුතුය... මොහු නාගයෙකි...



නිකමම නාගයෙක් නොවේ... දෙපත් නාගයෙකි... දැන් ඇයට සිහිණ...ගොනුස්සා හෝ නරියා ඔහුගේ මෙම ස්වරූපයට ඔබින්නේ නැත... ඔහුගේ කටහඬට ඇයගේ සිතේ තිබුණ බිය ඒ කථාව නිසා ඇතිවූ කහට නිසාම තුරන් විය... ඒ කටහඬින් කියවෙන්නේ තමාට අසා සිටින්නට අපහසු තරමේ උපහාස හා අපහාසය...

"මං සින්ගර් කෙනෙක් මිස්ට සංජය..." ඇය කීවේ ඔහුට තබා මොහොතටවත් සිතන්නට තත්පරයක්වත් ගතවෙනු නොදීය... "ඒක නිසා මොනා ඇඳුමකින් ආවත් නැටුමක් නං බලන්න බැරිවෙයි..."

සංජයට පමණක් නොව මොහොතටද උඩ යට මාරුවිය... ඇය තවදුන් තේජානි ගැන සැලකුවේ බොහෝ හැන්පත් සබකෝලි තරුණියක ලෙසිනි... එහෙත් අද දවසේම ඇය මේ ප්‍රශ්නයේදී අන් සියල්ලන්ටම වඩා ඉදිරියෙන් සිටිමින් කරට කර සියල්ලන් සමගම නගා එහා කළාය. මෙවැන්නෙක් ඉදිරියේ මෙලෙස උත්තරයක් දීමට තරම්... ඇය සිතින් ගැහුණේ තේජානි ගැන බියෙනි.

සංජයට එයට දෙන්නට පිළිතුරක් හෝ අසන්නට පැණයක්වත් සිතාගන්නට නොහැකි විය...

ඔහුට ජයරත්නගේ කීම මතක් විය...

...ඒත් හිතන්න එපා ඒ කෙල්ලො නිකං මේ මෝඩකමට නටන දඟලන කෙල්ලො කියලා... කියන හැම වචනයක්ම හොඳට හිතලා මතලා කිව්වොත් හොඳයි....

සැබැවින්ම ඔහු කල්පනා කරගත්තේ මින් පසු ඇය සමග කරන කථාවක් තරමක් ප්‍රවේශමින් කළ යුතු බවය... ඇයට කැත්තට පොල්ලසේ උත්තරයක් දිය හැකිවාක් මෙන්ම ඇයගේ එක් වදනකින් තමාගේ ඉදිරි ජීවිතයම මේ ලෙස විනාශ කරන්නටද හැකිය... කෙසේ වුවත් ඇයගේ එම පිළිතුර ගැන දෙවන වර සිතද්දී ඔහුට සිනහවක් නැගිණ... එක් අතකින් ඇය ආරතීට වඩා බිය සැක නැති තරුණියක බව වැටහෙද්දීය... තමා හා එක යහන බෙදා හදාගත් ආරතී වුවද මෙලෙස තමා හා එකටෙක කියාගෙන නැත... ඇය ඇයගේ සිතිවිලි සිතට හංගාගෙන මෙන් ජීවත් වන්නියකි... එහෙත් මැය...

ඔහුට තේජානි හා ආරතීගේ අතුරුදන්වීම ගැන නොව පිළිසඳරක යෙදීමට සිත්වූ තරම්... තමා හා එකටෙක කියාගන්නටත් මිතුරෙක්වත් නැත... මිතුරන් වුවද ඔහුට සලකනුයේ...

ඔහුට ඔහු ගැන නොසිතා සලකන්නේ එකම මිතුරෙක් පමණකි... ඔහුට එක්වරම සිත්වූයේ මේ ප්‍රශ්නය ගැන විසඳුමක් ගැනීමට ඒ මිතුරා සමුවීමට යාමටය... එහෙත් එයට පළමු මෙය ගැන මේ තරුණිය හා තරමක් කථා කළ යුතුය... ආරතී සොයා ගැන්මට ඔහුද දුන් වෙර දැරිය යුතුය...

සංජයට දුන් පිළිතුර ඇසෙද්දී ෂෙනාලි තිගැස්සී ගියද ඔහු ඉදිරියේ තේජානිට කරවටුවක් දමන්නටවත් නොහැකි හෙයින් ඇයගේ සිතට තරමක කෝපයක්ද නැගුණේ මෙයින් තේජානිට වන හානිය ගැන ඇයගේ සිතට දැණුනු හෙයිනි... ආරතී මෙන්ම මැයද හෝටලයට නැතිවූවහොත්... ඇයට සිතුණේ එලෙසය... එහෙත් එම කෝපය මුහුණින් පළකිරීමට නම් ඇය නොසිතුවාය... එක් සතියක් ඇතුළත හෝටලයේ දක්ෂ ගී ගයන්නියන් දෙදෙනෙක් නැති වීම නොව මෙතැන්හිදී එවැන්නියක මෙලෙස මේ තත්ත්වයට සාදා ගැනීමට අවුරුද්දක් වත් ගත වෙන බව ඇය දන්නීය... මිතුරියගේ නැතිවීමෙත් පීඩා විඳින තේජානි ගැන ඇය වඩාත් සැලකිලිමත් විය යුතුය... සංජයට වූ මදි පාඩුවකට ඇය සිතුවේ ඇය විසින් හෝ සමාව අයැදිය යුතුය යන සිතිවිල්ලකි...

දෙවන වර ඇය දුටුවේ සංජයගේ මුහුණේ සිනහවකි. එයින් ඇය සැහෙන සැනසිල්ලක් ලැබුවෙන් තේජානි හා නැගුණු කෝපය පහව් යමින් තිබිණ...

"කමක් නෑ... මං ආවෙත් නැටුමක් බලන්න හරි සින්දුවක් අහන්න හරි නෙවෙයි... මට විරුද්ධ චෝදනා ටික දැනගන්න..." කියූ සංජය ෂෙනාලි දෙස බැලුවේය. "අපි දෙන්නට ප්‍රයිවෙට් කථා කරන්න දෙන්න පුළුවන්නේද...?" ඔහු ඇසුවේ සැබැවින්ම සිතාගත නොහැකි ආචාර ශීලී බවකිනි... එයට යටින් ඔහු කෝපයෙන් ගොරවන බව නම් තේජානිට දැණින... ඒ ආචාරශීලී තත්ත්වය ඇයගේ සිතට නම් ඇල්ලුවේම නැත... මෙවන් පුද්ගලයන්ගේ ආචාරශීලීත්වය ඇත්තේ මුහුණේ පමණකි... සිතේ ඒවා නැත... එහෙත් ෂෙනාලි මෙහිදී නොමැති නම් ඇය වඩාත් කැමැත්තක් දක්වූවාය... ඇයට මොහුට කියා ගත යුතු දෙයක් ඇත්නම් කියාගත හැක්කේ එවිටය... ෂෙනාලි මොහුට නොව මොහුගේ තනතුරට බියය...

ෂෙනාලි තේජානි දෙස බලද්දී තේජානි එයට හිස සැලුවාය...



ඇය ෂෙනාලි දෙස බලද්දී සංජයට යළිත් ඇයගේ තරමකට පියවි දෙනෙතක් එම කාවයෙන් ඔබ්බේ දිස්විය... යළිත් එයට විදුලි පහන් එළිය ආවේය... ඇයගේ දෑස වැසිණ...

සැබැවින්ම නම් තමා මේ කථා කරන්නට යන්නේ පිළිමයක් සමගදැයි සංජයට සිතුණේ පියවි දෑසට හසුවන්නට ඇය හා කථා කරන්නට නොහැකි කමෙනි... ඇයගේ රූමත් බවක් නැතැයි ඔහු සිතුවේය... මේ වෙස්වලාව නැතිව ඇය ඔහු වෙත ආවේ නම්...

අද තමා දකිද්දී තමා ආවේ ඇය සමුවීමටම බව ඇය නොදන්නී යයි කිවහොත් එය මුසාවක් බව ඔහු සිතුවේය... එසේනම් සියල්ලටම පළමු ඇය ඇයගේ මේ වෙස ඉවත් කළ යුතුය... එහෙත් ඇය තමා ඉදිරියට ආවේම වෙස් පෙරළියද වෙනස් නොකරය... ඇයගේ මුහුණේ පෙනුම ගැන නම් ඔහුට කොහෙත්ම සිතන්නට නොහැකි විය... මුළු මුහුණේම දිස්වූයේ පිඳි රත් හා සුදු රතු පැහැ ගත් කුඩුවලින් ක්‍රමවත්ව ඇඳි තිබුණු කිසියම් මල් කිනිත්තකි...

ඇයගේ රූමත්කම නැති නිසා ඇය මෙලෙස මුහුණ සඟවා ගන්නවා විය හැකිය... එහෙත් ඇයගේ කටහඬ... එය නම් මෙලෙස ඇසෙද්දීද බොහෝ ගීතවත් බව ඔහුට ඒ කලබලයේදීද සිතුණේය... එහෙයින්ම ඇය හා කථා කරන්නට ඔහුගේ සිතේ දැන් කැමැත්තක් හැග එමින් තිබිණ... ඔහු බොහෝ විට කටහඬ ගැන වඩාත් සිතුවේය... ආරතිට වුවද තිබුණේ මිහිරි කටහඬකි... සවණ අසල ගොරහැඩි හඬකින් කැගැසෙනු ඇසෙන්නට පමණක් නොව පමණට වඩා ලතාවද ඔහු නොරිස්සුවේය... ආරතීගේ තිබෙන්නේ කිසියම් ලතාවකි... එහෙත් ඇයගේ එපමණ ලතාවක් නැත... කැත්තට පොල්ල මෙන් කියන්නේ මෙවැනි ළඳුන් ගැන විය හැකිය...

"එහෙනං ජානි... මට ඉවරවෙලා කථා කරන්න..." ෂෙනාලි කීවේ සමහරවිට ප්‍රශ්නයක් එද්දී ඇයට කථා කරන්නටයැයි කියන ආකාරයද ඇයට මතකයට නංවමිනි. තේජානි හිස සැලුවාය...

සංජය තරමක පුදුමයකටද පත්විය... ඇයගේ බියක් නැති බව සිතෙද්දීය... ඇය සමහරවිට තමාට මෙලෙස ඇඹිල්ල දිගු කළේ ආරතීගේ අතුරුදන්වීමට හේතුව ඇය නිසාවත්දැයි යන සැකය දැන් ඔහුට යළිත් නැගිණ... ඇය කිසිවකටත් බියවෙන හාලයේ තරුණියක නම් විය නොහැකි බව ඔහු සිතුවේය.

ෂෙනාලි එතනින් ගියේ සංජයටද හිස සලමිනි... එහි පමණටත් වඩා ආචාරශීලි තත්ත්වයක් තිබිණ... සංජයට සිනහවක් නැගුණේ යටි සිතටය... ඔහු එය පිට නොදුන්නේය... මේ තරුණියන්ට යන එන මං නැති හෙයින් සමහරවිට... එයත් විය නොහැකිය... එසේනම් ඇය මෙයටත් වඩා බිය විය යුතුය... තේජානි නැමැත්තියගේ නම කොහොම ඇත්තේ බියක් නොවන බව දැන් ඔහුට සිතිණ... එහි ඇත්තේ කෝපයක් විය හැකිය...

ෂෙනාලි එළියට යන දෙස බලා සිටි ඔහු මෙන්ම තේජානිද ඇය පිටවන්නාහාම එකිනෙකා දෙස බැලූහ...

මල්ලව පොරයකට පෙර ප්‍රතිමල්ලවයන් දෙස බලාගන්නා හැඟීමක් දෙදෙනාගේම තිබුණා වැනිය... පළමුව කථා කළයුත්තේ තමා බව නම් සංජය සිතුවේය...

"වාඩිවෙන්න ඉස්සෙල්ලම..." ඔහු අසුනක් පෙන්වමින් කීවේ එහෙයිනි...

ඔහුගේ ඒ නිහතමානී බව තේජානිගේ කෝපය හංවා තිබිණ... ආරතී සඟවාගෙන සිටිනවා මදිවාට ඔහු මෙතැන සියල්ලෝමේ නටවන්නට ලැහැස්ති වෙන අන්දමකි... ඇයට සිතුණු හෙයිනි... ඇය ඔහුට කිසිවක්ම නොපවසා වාඩි ගත්තාය... එහෙත් ඒ ඔහු පෙන්වූ අසුනේ නොවේ... ඇය වාඩිවුණේ විදුලි පහන් එළිය තරමක් නොවැටෙන අසුනකිනි...

එය රවුම මේසයේ පැත්තකට වෙන්නට තිබුණු අසුනකි... ඔහුට දැන් වාඩිවෙන්නට සිදුවුණේ එම මේසයේ විදුලි පහනට කෙළිනි... ඔහු වාඩි වන්නේ නම් වාඩි විය යුත්තේ ඇයට ඉදිරියෙනි... ඒ ඇයට කෙළින්ම ඇති අසුනය...

එලෙස වාඩිවෙද්දී ඔහුගේ මුහුණේ සියලු ඉරියව් හොඳින් පෙනෙනු ඇත... මේ තරුණිය නම්... ඔහුට සිතුණේ එක්වරම එය වැටහෙද්දීය... ඇයගේ මුහුණේ කිසිදු ඉරියව්වක් මෙලෙස තමාට දැකගන්නට හැකි වන්නේ නැත... එක අතකින් බැලුවහොත් ඇය විදුලි එළියටම වාඩි වුණද ඇයගේ දෙනෙතේ හැඟීම මෙලෙස දකින්නට ලැබෙන්නේද නැත...

ඔහු සිතුවේ කෙලෙසක වුවද තේජානි එම අසුන තෝරාගත්තේ මෙම සංජය නැමැත්තාට හරි කෙළින් මුහුණ දීමට ඇයගේ ඇති



බලවත් අකැමැත්ත නිසා බව ඔහුට දැනගන්නට හැකියාවක් තිබුණේම නැත... තේජානිට ඔහුගේ කථාව දෙසවනේ රැව් දෙන්නා වැනිය... ඇය වෙනත් යමක් ගැන සිතන්නට ගියේම නැත...

කෙසේ වුවත් එයට යමක් කියන්නට හෝ ඇයට වෙනත් තැනකින් වාඩිවෙන්නට යැයි කියන්නට ඔහුට නොහැකිය. ඔහු එලෙසම වාඩිවුණේ ඇයගේ මුහුණ හොඳින්ම බලමිනි...

"දැන් අපි කථා කරමු... මිස් තේජානි... මං එක සැරේම ප්‍රශ්නෙට එන්න කැමැතියි... ඇයි හිතුවෙ මං ආරුව හංගගෙන ඉන්නවා කියලා..."

"ආරතී යාළුවෙලා හිටියේ මිස්ට සංජය එක්ක විතරයි..." තේජානි එක්වරම කියා දැමුවාය... ඇය ඇයගේ මිතුරියගේ මුළු නමම පාවිච්චි කරන්නට සිතුවේ දැන් මොහු තමාටද මුළු නමින්ම කථා කරන බැවිනි... එහෙත් ඇයගේ සිත තරමකට සැලුණේ ඔහු ආරතීට දැන් කෙටි නම යෙදුවෙනි... ඇය අතුරුදන්වූවායැයි ඔහුගේ මුහුණේ එතරම් පසුතැවිල්ලක් හෝ කැළඹිල්ලක්ද නැත... ඔහුට ආරතී එතරම් වස්තුවක් නොවන්නට පිළිවන... ඇයගේ සිතට දැඩි දුකක් දැණින...

"මං එක්ක විතරයි... ඒක හරි... ඒත් මං ආරුව දැක්කේ නෑ සතියකින් විතර..."

තේජානි කෙළින්ම ඔහුගේ මුහුණ දෙස බැලූ බව ඔහුට නම් තේරුම් ගත නොහැකි විය...

"ඒත් සඳුදා එයා ගියේ මිස්ට සංජය එක්ක... එයා මිස්ට සංජයට කථා කරන්නෙ සංජු කියලනේ... එයා කිව්වේ සංජු වෙහිකල් එක එවනවා කිව්වා... මං යනවා කියන එක විතරයි..."

"නැහැ මිස් තේජානි... එදා මට වෙහිකල් එක එවනවා තියා... මං හිටියෙත් මෙහේ නෙවෙයි... එයා කියන්න ඇත්තේ වෙන නමක්..."

"මිස්ට සංජය... මේ බොරු කියන්න එපා... සංජු කියන නම වෙන නමක් විදියට ඇහුණා කියලා මගේ කණේ අමාරුවක් තියෙනවා කියලා මිස්ට සංජය කියන්න යනවනං ඒක බොරු... ඇත්ත කියන්න... ආරතීට වැරදිලාවත් බබෙක්වත් හම්බවෙන්න ඇවිල්ලා..."

"බබෙක්...?" සංජයට ඇසුණේ සැබැවින්ම තනිකර භීතියකිනි... එය නම් විය හැකිය... දරුවෙක් කුස පිළිසිඳ ගත්තේ නම් ඇයට මෙම හෝටලයේ රැකියාවට ඒමද අපහසුය... ඒ දරුවාගේ පියා තමාද විය හැකිය... නැත... විය යුතුය...

"ඔව්... එහෙම නිසා එයා හංගාගෙන ඉන්නවනං මට කියන්න... එයාට කරදරයක් නොවෙන්න... මං දරුවා මගේ කියලා හරි හදන්නං... මට ඕන මගේ යාළුවා විතරයි..."

දූන් සංජය අන්තයටම පුදුම වුණේය... මෙ නම්... සැබැවින්ම මෙය පුදුමයකි... මෙ ලෙස බලද්දී මැයද ආරතී ගැන දන්නවා යැයි කිව නොහැකිය...

"යාළුවා මං ළඟ නෑ මිස් තේජානි... මං අවිස්සාවෙල්ලටත් ගිහිල්ලා ආවෙ... එහේ ගියෙත් මං එයාට එන්න කිව්වා කැබ් එක අරගෙන... එයා ඇවිල්ලා ඇති කියලා හිතාගෙන... මට කිව්වා එදා එයා එනවා කියලා..."

"කවදද...?" තේජානි දැඩි උනන්දුවකින් ඇසුවාය... සංජය හා තමා අතර තරමක ලිහිල් බවක් ඇති වෙනු ඇය දුටුවා වැනිය...

"මිස් තේජානි විශ්වාස කරයිද මන්දා... මටත් කිව්වේ සඳුදා..." ඔහු කීවේය...

"සඳුදා...?"

"ඔව්... මං එයාට එන්න කිව්වා බදාදා උදේ තරම... එන්නං සංජු කිව්වා කෝල් එක කට් උනා... ඉන්පස්සෙ මං බදාදා උදේ ආවාම එයා ඇවිල්ලා නෑ... ඉන්පස්සේ තමයි මං මිස් තේජානිගේ කෝල් එක එහෙමත් දැක්කෙ... එයාගෙ සෙල් එකෙන් ආන්සර් ආවෙම නෑ..." සංජය කීවේය...

එම ස්වරය නම් බොරුවක් විය නොහැකි බව තේජානිට සිතිණ... එහෙත් මෙවන් අයට බොරුවක් ඇත්තක් සේ පෙනෙන්නටත් ඇත්තක් බොරුවක් සේ පෙනෙන්නටත් වැඩ කළ හැකි බව ඇයට ඒ ලෙසම වැටහිණ.

"වෙනදා කොහේ ගියත් ආරතී මට කථා කරනවා... මිස්ට සංජය එක්ක ගියත් අවිස්සාවේල්ලේ ඉඳලුත් මට කථා කරලා තියෙනවා... ඒත් දැන්... ප්ලීස් මිස්ට සංජය... ආරතී හැංගුව නං මට ඒක කියන්න... මං කාටවත් කියන්නෙ නෑ... මට ඕන එයා ඉන්නවද කියලා දැනගන්න විතරයි..." ඇය එවර කීවාය... ඇයගේ කටහඬෙන් ඇයගේ සිත ගැන දැණුනු සංජයටද ඇයට සිතුණු සිතුමම සිතුණේය... දෙවන වර එයද වෙනස් විය... මෙවැනි තරුණියන්ටද රඟපෑමද උපතින්ම උරුම වී තිබෙන බවය...



දෙදෙනාට දෙදෙනාම දෙදෙනා ගැන සැකයෙන් හා බියෙන් කථා කරන නිසාම මෙහි ප්‍රශ්නය උග්‍රවී තිබෙන බව දෙදෙනාටම නොවැටහිණ.

"මිස් තේජානි කියන දේ මටත් තේරෙන්නෙ නෑ... මිස් තේජානි නොදන්නවට... එයා මටත් කථා කරනවා කොහේ ගියත්... සඳුදා බැංකුවට යන්න ඉස්සෙල්ලා මට පණිවිඩේ දුන්නා... ඒත් මට ඒක ක්ලියර් විස්තරේ අහගන්න බැරි උනා... මං හිටිය තැනට සිග්නල් ක්ලියර් උනේ නෑ... මං හිටියෙ අම්පාරෙ කියලා එයාට තේරුණෙත් නැතුව ඇති... අවිස්සාවේල්ලට එන්න කිව්වම එන්නං සංජු කිව්වා... බදාදා කියලා කිව්වද නැද්ද කියලා මට ඇත්තටම මතකයක් නෑ... ඒ වෙලාවේ මගේ ඔළුවෙ වැඩ ගොඩක් එක්ක මං එතන හිටියෙ..."

"ඔය කියන ඒවා ඔක්කොම දැන් ඇත්තද...?" තේජානිට ඇසිණ... සංජය තරමක් නිගැස්සී ඇය දෙස බැලුවේය... ඒ දෙනෙතට කෝපයක් එක්වූ බව ඇය දුටුවද ඇය බියවුණේ නැත...

"මොකක්ද ඒ ප්‍රශ්නෙ...?" සංජයට ඇසිණ.

"මිස්ට සංජය එදා කිව්වනේ... ආරතී කොණක හිටියත් මොරුවක් කියන්න ඕන නං කියනවා කියලා... මට එතකොට මේක විශ්වාස කරන්නද කියන්නෙ...?"

"මිස් තේජානි... මේක ඔයා විශ්වාස කළත් නොකළත් මං කියන්නෙ ඇත්ත කියලා මං දන්නවා... ආරූ කියන්නෙ මට විශේෂයි... ඒකත් ඔයා දැනගත්තනං හොඳයි... අත පිහදාගත්තු රෙදි කෑල්ලක් වගේ එයාව පැත්තකට දාන්න නං මං කොහෙත්ම හිතාගෙන නෑ..."

"එහෙනං මිස්ට සංජය මේ වෙන එක්කෙනෙක් මැරි කරන්න යනවා කියලා කියන්නෙ බොරුද...? ආරතී ඒකෙන් කොච්චර අප්සෙට් ගිහිල්ලා හිටියද...? ඒවා දන්නවද මිස්ට සංජය...?"

සංජය තරමක් කැළඹිල්ලකට පත්වුණේය... තමා නැනැත්තියක බලන්නට ගියා යැයි ඇය පසුතැවිල්ලකට පත්වූ බව ඔහු නම් දැන සිටියේම නැත... ආරතී එය නොපෙන්වන්නට සිතුවේ සමහරවිට...

"මං දන්න තරමින් නං ආරූ එච්චර ඒ ගැන හිතුවෙ නෑ..." සංජය කීවේ ඔහුගේ සිතේ තිබුණු සියල්ල නවතා ගනිමිනි.

"මිස්ට සංජයලාට මේ අපි වගේ කෙල්ලො කියන්නෙ සෙල්ලම්

බඩු වගෙයි කියලා මං දන්නවා මිස්ට සංජය... ඒත් අපිත් ජීවත්වෙන්න ආසයි කියන එකක් හිතට ගන්න... හැඟිලා නෙවෙයි... ලෝකෙට ජේන්න... ආරතී මේ විදියට හංගාගෙන ඉන්න එකෙන් එයාට වෙන හොඳකුත් නෑ මිස්ට සංජයට වෙන හොඳකුත් නෑ... මෙතනට වෙන හොඳකුත් නෑ..."

"මොකක්ද ඒ කථාව...?" සංජයට ඇසුණේ තරමක් පැටලිලි සහගත කථාව ගැන සිතාගැන්මට නොහැකිවුණ නිසාමය...

"හොඳ පවුල් ජීවිතයකට යන්න... හොඳ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හොයා ගන්න... මෙතන ඉන්න කාගෙත් හීනයක් මිස්ට සංජය... ආරතී උනත් ඒ හීනෙ හිටියා..." කියද්දීම ඇයට මතක් වුණේ ආරතී ගැන ඇය දුටු සිහිනයය... සංජු පව්... ඇය කී අයුරුය... ඇයගේ සියොලඟම හිරිගඩු නැංවිණ... මේ නම්... ඇයගේ කථාවට තරමක හිතක්ද ඒක්විය... එහෙත් සංජය ඉවසිල්ලේ අසාගෙන සිටින්නට සිතුවේය... ඇය කියන සියල්ලම එලෙසම අසා ගත යුතුය... ඇයටත් එසේනම් එවැනි අදහසක් තිබෙන්නට හැකිය... ඒ අදහස නිසාම... එහෙත් වෙනත් යමක් සිතන්නට ඔහුට නොහැකි විය... ඇය තරමක් සුසුමක් හෙළා යළිත් කථාව පටන්ගත් හෙයිනි.

"ආරතී මිස්ට සංජය එක්ක යාළු උනේ ඒ නිසාම නෙවෙයි... ඒත්... එයා මිස්ට සංජයට බොහොම ආදරේකින් හිටියේ... මං දන්න තරමින් ආරතීට... මිස්ට සංජය නොදන්නවට... තව මිස්ට සංජයට වඩා ගොඩක් ඉහළ අයගෙන් වගෙත් ඒ වගේ කාඩ් ඇවිල්ලා තියෙනවා..."

සංජය තිගැස්සුණේය... එසේ නම් වැරදිලාවත් තමා හා ඇය මිතුරුවූ නිසා ඇයට කිසියම් අතවරයක් කරන්නට ඔවුන් සැරසුණේද...? නැතහොත්...

"මිස් තේජානි... අපි ටිකක් මේක ගැන සුහදව කථා කරමුද...?" ඔහු ඇසුවේ තරමක් ඉදිරියට වී මේසයටද බරවෙමිනි...

"බොරුවත් එක්ක මගේ සුහදත්වයක් නෑ මිස්ට සංජය..." ඇය ගහෙන් ගෙඩි එන්නාසේ කියා දමුවාය...

ඔහුට එවර කෝපයක් සිතට නැගුණේ නැත... ඇය බියට පත් වන්නියක් නොවේ... ඇය සිහින ලෝකයක ජීවත්වන්නියක්ද නොවන බව වැටහෙද්දීය...



තමාගේ රුවත් ධනවත්කමත් බලවත් කමත් හමුවේ බොහෝ තරුණියෝ සැලෙන බව ඔහු දන්නේය... ඇය වෙනස් ළඳකි...

"මිස් තේජානි නොදන්නවට... බොරුවට මාත් කැමැති නෑ... ඒත් අපිට සමහර වෙලාවල්වලදී..." ඔහු අන්තිම වදන් බර කළේය... "සමහර වෙලාවල්වලදී බොරු කියන්නම වෙනවා... මිනිස්සු කියන්නේ හරි පුදුම ජාතියක්... අපි ඇත්තක් කියනකොට විශ්වාස නොකරන එව්වො... රවුං කරලා බොරුවක් කිව්වොත් නං ඒක පුදුම විදියට විශ්වාස කරනවා... ඉතින් අපි කරන්න යනදේ උනත් රවුං කරලා තමයි කියන්නෙ..."

"ඒ කියන්නේ දන් මිස්ට සංජය ආරතී ගැන රවුං කරලා කියන්න යන එකත් මං විශ්වාස කරන්න ඕන කියලද...?"

සංජයට සිනහවක් නැගුණේය... ඔහුට මතක් වුණේ ජයන්තගේ කථාවය...

...ඒත් හිතන්න එපා ඒ කෙල්ලො නිකං මේ මෝඩකමට නටන දඟලන කෙල්ලො කියලා... කියන හැම වචනයක්ම හොඳට හිතලා මතලා කිව්වොත් හොඳයි...

"මිස් තේජානි... මං ආරු ගැන බොරුවක් කියන්නෙ නෑ මෙහෙදි... ආරු තාම මට කථා කරෙත් නෑ... මෙතන එහෙනං වෙන මොකක් හරි... එහෙනං එයා වෙන කොහේ හරි..."

"වෙන කොහේ යන්නද...? යන්න තියෙන්නේ දෙතැනයි... මිසිස් බොතේජුලගේ ගෙදර... එයාගේ ගෙදර... ඒ තැන් දෙකේම නෑ..."

"සමහරවිට බොරු කිව්වද දන්නෙ නෑ නේ... ගෙදර මිනිස්සු..."

"එහෙනං මිස්ට සංජයම ගිහිල්ලා හොයන්න... අපි වගේ පොඩි එව්වොන්ට බොරු කියන බොහොම අය මිස්ට සංජයලට ගරු කරලා ඇත්ත කියන්න ඉඩ තියෙනවා..." ඇයගේ කෝපය ඉදිරියේ සංජය තරමක පසුබෑමකට ලක් වූවද ඇය කියන්න සත්‍යයක් හෙයින් ඉවසන්නටද සිතුවේය...

"මං කොහොමටත් චෙක් කරනවා දන් මින් පස්සේ... අදත් මට ආරු තාම කථා කළේ නෑ..." ඔහු කීවේ එහෙත් ඒ කෝපය මතිනි...

"ඔව්... මිස්ට සංජයම කියන්න... සමහරවිට මිස්ට සංජයගේ ඔය ප්‍රොපෝසල් එකේ කට්ටිය මේ කෙල්ලට කරදරයක් කළාද කියලා මටත් හිතෙන නිසා..." ඇය තරමක් නැවැත්තුවාය... ඇයට එය කියාගන්නට අවශ්‍ය වූයේම මොහුටය... සැබැවින්ම දූන් ඇය සිතමින් සිටියේ මොහු කියන්නේ ඇත්තක්ම නම් යන්නෙනි... ඔහුද ආරතී සිටින තැනක් නොදන්නේ නම්... ඇයගේ සියොළඟම වෙව්ලමින්ද තිබිණ... එසේනම් ආරතී සොයා ගැනීමට උදව්වක් ගත හැක්කේම මොහුගෙන්ම පමණකි... අනික් කිසිවෙක් ඒ දෙසින් එන කරදරයක් ගැන දන්නේම නැත.

"මං හිතන්නේ නෑ..." සංජයට කියැවිණ... ඔහු තවමත් ඒ දෙසට වචනයක් දී නැත... එහෙයින් ආරතී ගැන වදනක් හෝ එදෙසින් ඇසුවේද නැත... අවම වශයෙන් ඔහුගේ මව හෝ පියාද ඇසුවේ නැත... යමක් කරන්නට පෙර ඔවුන් තමාගෙන් ඒ ගැන අසන බව ඔහු දැන සිටියේය...

"මිස්ට සංජය හිතන දේවල්ම වෙනවා කියලා මිස්ට සංජයට තියෙන සහතිකේ මොකක්ද...? මෙතැන තියෙන්නේ... තත්වය මිස්ට සංජය... මිස්ට සංජයගේ පොසිෂන් එක... මිස්ට සංජයට ආරතී වගේ කෙනෙක් ගැලපෙන්නේ නෑ කියනකොට... මේ වගේ අපි වගේ... කිසි කෙනෙක් නැති කෙනෙක් නැති කරලා දාන්න කාටත් පුළුවන්... ඒත්... මතක තියාගන්න එක හොඳයි... කිසි දවසක මගේ හිතින් නං ඒක නැතිවෙන එකක් නෑ..."

"ඔයා මොනවා කරන්නද...?" එවර නම් සංජය ඇසුවේ කෝපයෙනි... මේ තරුණිය සමග කිසිවක්ම සුහදව කථා කරගත නොහැකිය.

"මොනව කරන්නද...? කරන්න දේවල් නං හිතෙනවා මිස්ට සංජය... ඒත් ඒ කිසි දෙයකට ඉස්සෙල්ලා මං හිතාගෙන ඉන්නෙ ආරතීට කියන්න මිස්ට සංජයගෙන් අයින් වෙන්න කියලා..."

සංජයගේ කෝපය එවර නම් හිණිපෙත්තටම නැග්ගේය...

"තමුසෙ හිතාගෙන ඉන්නෙ මහ රැජිණ කියලද...? ආරතී මගේ ළඟ හිටියත් මං දූන් තමුසෙට කියන්නෙ නෑ... ඒ කෙල්ල අයිති මට..." ඔහු නැගිටිමින් රවුම් මේසයට ගසමින්ම කීවේය...

තේජානිද නැගිට්ටාය... සංජයට පළමුවරට තරමක බියක් දැණින... ඇය සැබැවින්ම නැගිට ඔහුට මුහුණ දුන්නේ රාජිණියක



මෙනි... ඔහුට ඒ තත්වයේ බොහෝ අය ගැන දැනුමක් තිබිණ... එහෙත් ඔහු ඉදිරියේ මෙලෙස නැගිටි බොහෝ අයට වඩා මැයගේ තේජාන්විත ගතියක් තිබිණ...

ඔවුන් එලෙස නැගිටින්නට ඇත්තේ ඔහුගේ ප්‍රසිද්ධිය හා වෙනත් කරුණු කාරණා ඔවුන්ගේ සිත ගත දෙකම වෙලාගෙන සිටින නිසාවිනි... මේ සාමාන්‍ය තත්වයෙන්ද පහළ වැටුණු කාන්තා ජීවිතයකි... ඉදින්... මෙවැන්නියක් මෙලෙස කිසිවක්ම ගැන නොසිතා රාජිණියක ලෙස ඔහු ඉදිරියේ නැගිටිද්දී...

ඔහුගේ කෝපය සෙමින් පහව යද්දී ඇයගේ කෝපය නම් දූන් නැගෙමින් තිබිණ... එහෙත් ඒ කෝපය දකින්නට තරම් සංජයට හැකියාවක් නොවිණ... ඔහුගේ දෙනෙතින් නම් දූන් කෝපය පළා යමින් තිබිණ... මේ කෙල්ල හමුවේ තමා දමනය වන බව ඔහුට සිතෙද්දීය. එහෙත් ඔහුගේ කථාවට ඇයගේ පිළිතුරද ඒ ලෙසම ලැබිණ...

"නැහැ... ඒ කෙල්ල අයිති මෙතනට... මිස්ට සංජයලට මෙතන කෙල්ලො අයිති වෙන්න විදියක් නෑ... ඒ මොකද කිව්වොත් මිස්ට සංජයලා මෙතන කෙල්ලො ගැන හිතාගෙන ඉන්නේ නිකං බෝනික්කියො ගාණට නිසා... බෝනික්කෙක් නැති උනාම තවත් එකක් ගන්න එක මිස්ට සංජයලට බොහොම ලේසියි... ඒත් මට... මට ආරතී ගැන එහෙම හිතෙන්නේ නෑ... එයා මගේ අක්කා වගේ... මෙතනදී මං කථා කරන්නෙ මගේ සහෝදරියෙක් කියලා හිතාගෙන... මිස්ට සංජය කථා කරන්නෙ මිස්ට සංජයගේ සෙල්ලම් බඩුවක් කියලා හිතාගෙන..." ඇය සංජයට වදනක්වත් කියන්නට නොදී එක දිගටම කියාගෙන ගියාය...

සංජය සිතාගෙන සිටි තවත් දෙයක් එතනදී ඇද වැටෙමින් තිබිණ... ඇය කථා කරන්නේ සැබැවින්ම ඇය සොහොයුරියක සේ සිතාගෙන නම්... කෙසේ වුවත් ආරතී දූන් තමා ළඟ නැති හෙයින් ඇය ගැන සෙවීම තමාගේත් යුතුකම බව ඔහුට සිතුණේය... තේජානි නැමැත්තිය කෙසේ තමාට චෝදනා ගෙන ආවද... ආරතී ගැන දැනුමක් තවමත් තමාට නැති බව ඔහුගේ සිත දන්නා හෙයිනි.

ඔහු යළි වාඩිවුණේය...

"වාඩිවෙන්න මිස් තේජානී..." ඔහු එවර කීවේ බොහෝ හැන්පත් අයුරිනි...

මොහොතක් සිතුවද, ඇය යළි වාඩිවුණාය... මොන තරම් දේවල් පැවසුවද, දැන් ඇයට මිතුරිය ගැන දැනගත හැක්කේ මොහුගෙන්ම පමණකි. සැබැවින්ම ඔහු කියන්නේ සත්‍යයක් නම්.... ඔහුද ආරතී ගිය තැනක් ගැන නොදන්නේ නම්... මෙහිදී සියල්ලටමත් වඩා ඇය සෙවීමේ හැකියාව ඇත්තේද ඔහුටම පමණකි.

සංජයද සිතමින් සිටියේය... ඔහුටද ආරතී ගැන වෙනත් විස්තරයක් අසා ගත හැක්කේ මැයගෙන් පමණකි... ආරතීට වෙනත් නෑදෑයෙක් හෝ මිතුරන් නැත... සිටියත් දැන් ඔවුන් සිටින්නේ ඇයගෙන් ඈත්වය...

"මට එක දෙයක් කියන්න... මිස් තේජානි කොහොම කිව්වත් මටත් දැන් ප්‍රශ්නයක් මේක... මට කියනවද ආරුට ආව අනිත් කාඩ් වල අයගෙ නම් ගම..."

තේජානි සැලුණාය... සංජු පවා... ආරතී කියනවා මෙන් ඇයට ඇසිණ... එසේනම් මෙය සංජයගේ පිටින් යන්නට වෙනත් කවරෙක් හෝ කළ කිසියම් දෑයක්ද...?

"මට දැන් නං මතක නෑ මිස්ට සංජය..." ඇය කීවේ එහෙයින්ම බොහෝ සේ සැලුණු කටහඬකිනි... මෙතෙක්ම තමා ඒ ගැන නොසිතුවේ ඇයි...? සංජය වැන්නන් බොහෝ අයට වඩා ඉදිරියෙන් සිටින්නේ බොහෝ දේවල් ගැන තැන්පත්ව සිතන මතන හෙයින් බව ඇයට පළමුවරට වැටහිණ... මෙතෙක්ම ඔහු ඇය සිතූ විලස නැ, කෝපයක් ගත්තේද නැත... ඔහු ආරතීට ඇමතුවේ කෙටි නමින්ම පමණකි... එසේනම් ඔහුගේ සිතේ ආරතී ගැන තවමත් තිබෙනවා වන්නටද පිළිවන...

"ඒ කාඩ් තියෙනවද කොහේ හරි...?" සංජය ඇසුවේ ඇයගේ කටහඬෙන්ම ඇයගේ සිහිවිලි ගැන තරමක් දුරට මැනගත් හෙයිනි... ඇය තමාට සත්‍යයම කියන බව නම් ඔහුට නොරහසක් විය...

"නෑ.. ඒවා ආයෙ අපි යවනවා මිස් ශෙහාලිලට..."

"එතකොට ඒවා කොහේද තියෙන්නේ...? මං ඒක දැනගන්න ඕන මිස් ශෙහාලිගෙන්ද...?"

"ඔව්... ඒවා සිකියුරිටි එකේ තියෙන්න පුළුවන්... මං එකක් දෙකක් ලියා ගත්තා... ඒවා ලියාගන්න කොට තමයි රතී කිව්වේ... ඒවා ලියන්න දෙයක් නෑ... ඒවා තියාගන්නවා කියලා..."



"ආරුට ඔයා දන්න තරමින් ඒවා කීයක් විතර ආවද...?"

"ඇත්තටම නං දහයක් විතර ඇවිල්ලා තියෙනවා... ඒ මං ආවයින් පස්සෙ... ඉස්සෙල්ලාත් එන්න ඇති..."

"දහයක්...?" සංජය පුදුමයෙන් ඇසුවේය... සමහරවිට විස්සක් තිහක් වන්නටත් පිළිවන... ඇය කෙදිනකවත් තමාට එවැන්නක් ගැන කියා නැත... තමා දිනා ඇත්තේ එසේනම්... ඇය කොහේදැයි දැන් සොයා ගත යුතුය... සමහරවිට මේ ඔවුන්ගෙන් කෙනෙක් ගේ කුමක් හෝ... ඔහුගේ ගතම එවර නම් සිහිතල විය... එවැන්නෙක් ළඟට යද්දී ආරතී නම් අනහරින ජාතියේ කෙල්ලක නොවන බව සිතෙද්දීය... ඇය ළාමක ගේ පෙනුමට එවැන්නක් වෙද්දී...

ඔහු නැගිටියේය... ඔහුට එක් තැනක රැඳී සිටීමටත් නොහැකිවාක් මෙන් දැනිණ... තමා ආරතී බිල්ලට දුන්නාවත්ද...? තමාගේ මෙම විවාහය ගැන විස්තර කීමෙන් වූ එකම සෙත වූයේ ඇය වෙනත් තැනැත්තෙකුට ළං කරවීමද.... ඇය මෙහෙණවරකට යන්නට හෝ වෙනත් රැකියාවකට යන්නට තරම් සිතන ලදකැයි ඔහුට සිතුණේම නැත... ඇය අනියම් ලෙසින් හෝ තමා වෙත එන්නට කැමැත්ත පළ කළාය... ඇය ඒ තරමටම ඔහුට ආදරය කළ බව දැන සිටියදී.... එය දැනගත් කවරෙක් හෝ...

තේජානි කාමරය තුළ නොඉවසිල්ලෙන් දෙතුන් වරක් එහෙ මෙහෙ ගිය සංජය දෙස බැලුවේ පුදුමයෙනි... ඇයටම දැන් අර සිදේට අනුනවය ගැන සිතාගත නොහැකිය... මොහු ආරතී ගිය තැනක් ගැන නොදන්නවාම වෙන්නටත් පිළිවන... එසේනම්... එසේනම්... ඇයගේ සිතට දැණුනේ වේදනාවකි...

"මිස්ට සංජය..." ඇය එවර කතා කළේ සැබැවින්ම බිඳුණු හඬකිනි... මොහුත් නොදන්නේ නම්... මොහු මෙලෙස කැළඹිලි සහගත වූවා ඇයට දැණුනාමය... ඔහු ඇය දෙස බැලුවේය...

"ඇත්තටම මට කියන්න..." ඇයගේ හඬ එවර නම් බිඳී ගොස් තිබිණ... "එදා රතී ආවෙ නැද්ද මිස්ට සංජය හම්බවෙන්න..."

"නැහැ..." ඔහු දුන්නේ තනි පිළිතුරකි...

යළිත් තේජානිගේ සැකය ඇවිස්සිණ... එදා එසේනම් මොහු සිටියේ කොළඹද...? ඇසිය හැක්කේ කෙසේද...? එකම පැණය දෙතුන් වර අසන්නට ඇයට නම් සිතී තිබුණේම නැත...

"නැහැ...?" ඇය පැණයක් නගාගත්තේ ඇයටම මෙන් එහෙයිනි... ඇයගේ සිත දැන් වේගයෙන් ගමන් කළේ ආරතී දන්නා හඳුනන අය ගැන සොයා ගන්නේ කෙසේද යන්න ගැනය...

"මං කිව්වේ මිස් තේජානි... මං හිටියේ අම්පාරේ... මට ආරුව සඳුදා ඒ වෙලාවේ එහෙට ගෙන්න ගන්න ඕන කමක් තිබුණෙම නෑ... මං එයාට එන්න කිව්වේ බදාදා... මං නැතුව ආරු අවිස්සාවෙල්ලේ යයි කියලා මට හිතන්න බෑ..."

තේජානිට ඉන් එහා කිසිවක් අසන්නට නොහැකි වාක් මෙන් දැනින... මිතුරිය ගැන සිතෙන් අත් හැර ගන්නට තමාට සිදුවන බව සිතෙද්දිය... සංජයද නොදන්නේ නම්...

ඇයගේ නෙතට දැන් කඳුලක් එක්විය... ඇය එය නවත්තාගන්නට දඟිරිය දමුවාය... එහෙත් එය නොහැකි විය... කණ්ණාඩිය පසෙකට ගු ඇය එවර දෝතින්ම මුහුණ වසා ගත්තී නැවී ඇයගේම උකුලේ මුහුණ හොවාගෙන හඬන්නට පටන් ගත්තාය...

සංජය සැබැවින්ම එවර කලබලයට පත්විය... මෙතෙක්ම ඔහු සිටියේ ඇය ගැන සැකයකිනි... එහෙත් ඒ සැකය මස්සේ ඇයට ඇඟිල්ලක් දිගු කරන්නට මෙලෙස නොහැකි බව ඔහු සිතුවේය... ඇය මේ කරන්නේ රඟපෑමක්දැයි ඔහුට සිතාගන්නටද නොහැකි වූයේ දැන් ඇය තමන් කිහිප දෙනෙක් ගැනම කී හෙයිනි... ඇයට ඔවුන් ගැන තමා හා නොකියාම තමාට ඇඟිල්ලක් දිගුකර මිතුරිය අතුරුදන් කළ බවට චෝදනාවක් ගෙන එන්නට පිළිවන් කම තිබිණ...

"මිස් තේජානි..." ඔහු කථා කළේ බොහෝ තරවටුවක හඬිනි... ඇය හිස එසෙව්වේ නැත...

"මං ආරු සොයන එක ගැන අතට ගන්නවා... බයවෙන්න එපා... ආරු හම්බවෙයි..." ඔහු කීවේ එවර දොරින් පිටත් වුණේය...

තවත් මොහොතකින් කවරෙක්දෝ එහි එන බව ඇයට දැණින...

"ජානි..." ඒ සමුදිගේ හඬය...

"මොකද උනේ...?" ඇසුවේ රුක්මිගේ හඬිනි.

"එයා... එයා... එයත් දන්නෙ නෑ කිව්වා..." තේජානි හඬා වැටුණාය... රතු කුඩු සුදු කුඩු රත්රන් කුඩු සියල්ලම සේදී වැගිරෙන්නට විය...



"අපි යමු ජානි... පස්සේ බලමු... දැන් ඉතින් මැන් හොයවයිනෙ එයාගේ ගර්ල් නං ඒ..."

එය නම් ඇයටද සිතිණ...

මෙනාලි දුව ආවේ මිතුරියන් ගොන්න මැදටය...

"ජානි... මං පොඩ්ඩක් සංජය එක්ක මැඩම් හම්බවෙන්න යනවා... දැන් මීගොල්ල යන්න හවුස් එකට... මං එන්නං තව ටිකකින්..."

තව ටිකකින් අනික් දිනයක් උදාවෙනු ඇත...

මේ ආරතී නැතිව ගතවෙමින් යන හයවන රැයය...

★ ★ ★

තේජානි යහනට වැටුණේ ද හැඩිමෙන්ම හෙම්බත් වුණු හෙයිනි... සංජයට ඇඟිල්ල දිගු කරගැනීමට නොහැකිවූ ඇයට නම් සිදුවූයේ දැන් මිතුරිය ගැන සියලුම ආශාව අත් හරින්නටය... ඇයට සිතුණේම මේ සංජයගේ විවාහපේක්ෂිත පැත්තෙන් වූ විත්තැඟියක් බව තමණකි... සංජය කෙසේ කීවද අන් අයට වඩා එම පැත්ත ගැන ඇයට සැකයක් තබා ගත හැකිය... අර දහයම් කාඩ් එවා ඇත්තේ මීට බොහෝ කලකට පෙරය... දැන් ඔවුන්ද ආරතී යනු සංජය සතු වස්තුවක්සේ සලකන්නේ නම්... ඔවුන්ට ඇයව මෙලෙස සඟවා ගෙන යාමට ඔවුන් ගෙන් කවරෙක් හෝ උදව් දුන්නේ නම් ඒ උදව්ව දුන්නේ සංජයගේ පැත්තෙනුත් කුමක් හෝ සහයෝගයක්ද ඇතිව බව ඇයට සිතිණ.

මිතුරියන් පමණක් නොව දැන් මයන්ත මෙන්ම අනික් සියල්ලෝද මෙයින් වික්ෂිප්තව සිටියහ...

ඔවුන් සිතූ කිසිදු දෙයක් තාමත් සිදුවූයේ නැත...

ඔවුන්ගේ මිතුරිය තවමත් ඔවුන්ට ලැබුණේද නැත...

මෙනාලි එද්දී මධ්‍යම රාත්‍රියද පසුවී තිබිණ... ඒ වෙද්දී තේජානිට නින්ද ගොස් තිබුණේ නිදි බෙහෙත් පෙති දෙකකම පිහිටෙනි... වෛද්‍යවරිය ඇයගේ සංතාපය නැවැත්විය හැකි එකම මඟ ලෙස සමුදිට කීවේ ඇයට එම බෙහෙත් පෙති දෙන ලෙසය... නැතහොත් ඇය අසනීප වෙනු ඇත...

එහෙයින්ම ෂෙනාලි තේජානි අවදි නොකර යළිත් යන්නට ගියාය... ඇයටද මේ කිසිවක්ම දරා ගත හැකි නොවුණේ අද සංජය හා කථා කිරීමෙන් පසුවය... තේජානි චෝදනා කළාක් මෙන් සංජය මෙම තරුණිය හා මිතුරුව සිටියද, එදින ඇය ඔහු සමුවීමට නොආ බව ඔහු සහතික කර කීවේය... ඔහු එදා ඇයට කීවාක් මෙන්ම සිටියේ අම්පාරේය... එයට සාක්ෂි ඔහුට ඔනෑතරම් තිබිණ... ඒ සාක්ෂි ගැන සිතද්දී ෂෙනාලිට කිසිම ලෙසකින් ඔහු මෙම ආරතීගේ අතුරුදන්වීමට සම්බන්ධයැයි සිතිය නොහැකි විය... ඔහු ආරතී සඟවා ගෙන නැති බව පමණක් නොව ඔහුද ආරතීගේ මෙම අතුරුදන් වීමෙන් සෑහෙන්නට කැළඹී තිබෙන බව ඇයගේ සිතට දැනිනි...

ආරතී ගියේ වෙනත් කවරෙක් හෝ සමගදැයි අයෝමා සැකයෙන් එවර අසද්දී, ඇය එලෙස යන තරුණියක නොවිය යුතු බව කීවේද සංජයය... මෙහි කුමක් හෝ රහසක් ඇත... තමාගෙන් ගත යුතු කිසියම් පළියක් ඇයගෙන් ගන්නට කවරෙක් හෝ සූදානම් වීමක්... නැතහොත් තමාට නින්දාවක් ගෙනෙන කිසියම් තොරතුරක් ඇය ගරහා මාධ්‍යයට හසුකර දීමක්... එවැන්නක් නම් විය හැකිය... ඔහු කීවේය...

ෂෙනාලි නේවාසිකාගාරයට ආවේ සංජය පිටත්වූ පසු අයෝමා හා තවත් විනාඩි කිහිපයක් මේ ගැන තරමක් විස්තරයක්ද කථා කිරීමෙන්ද අනතුරුවය... තේජානි හොඳින් බලාගන්නට යැයි අයෝමා ෂෙනාලිට පැවසුවේ..., සංජය කීවාක් මෙන් ඔහුට ගරහන්නට දඟලන කිසියම් පිරිසක් සිටින්නේ නම..., ඔවුන් මින් පසු හැරෙන්නේ තේජානි දෙසට බව ඇයට සිතුණු හෙයිනි... ආරතීට පසු තේජානි... ඇයට පසු...

අයෝමා කීවේ මින් පෙර සිටි දූන් විශ්‍රාම ගිය ආරක්ෂක නිලදරුවාට යළිත් වරක් එම නේවාසිකාගාර දෙකටම ආරක්ෂාව සැපයීමට කෙසේ හෝ බාර දීමට කටයුතු කරන ලෙසය... හෝටලයේ ආරක්ෂාව මෙලෙසම සේකර බාරයේම තබා ගත හැකිය... සේකරට හෝටලයටත් නේවාසිකාගාරවලටත් එකලෙස ආරක්ෂාව සැපයීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නම් නොහැකි බව ඇය අවධාරණයෙන්ම කීවාය.

සේකර නොව එය බාරගත්තේ හෝටලයේ සම අධ්‍යක්ෂක වරයෙක් ලෙස කටයුතු කරන වෙනත් තැනැත්තෙකි...



ඒවා සියල්ලම ෂෙනාලි පැවසුවේ මෙතෙක්ම නිදි වරමින් කථා කරමින් හුන් අනික් තරුණියන් පිරිසටය... ඒ මොහොතේදී නම් මයන්ති හා වසන්තත් ඒ ගොඩට එකතුවී සිටියහ... ආරක්ෂකයා වුවද එයට නම් කුමක් වත් කියන්නට නොගියේ මෙම තරුණියන් නොයය හා ඔහුටත් පමණක් මේ සියල්ලට දායක වීමට නොහැකි බව ඔහුටම ප්‍රශ්න තිබුණ හෙයිනි...

මයන්තට හා 'වසන්තට පහළ විසිත්ත කාමරයට යාබද කාමරයේ නිදාගන්නටද ෂෙනාලි කීවේ එහෙයිනි... විශේෂයෙන්ම තේජානිව ආරක්ෂා කළ යුතුය... ඇය ඔටහා දූන්නිය... මේ ආරතීගේ අතුරුදන් වීම කුමක් නිසා කුමක් අරභයා කෙරුණක්දැයි කිසිවෙක්ටත් කිව නොහැකි හෙයිනි...

සංජය මෙයට දායක වී ඇත්තේ නම් ඔහුට මෙතරම් සැහැල්ලුවෙන් අයෝමාට මුහුණ දිය නොහැකි බව ඇයගේ හැඟුම විය. තේජානි ශාන්තාගේ බාරයට පත් කොට ඔවුන් ඒවා විසිත්ත ශාලාවේ වී සාකච්ඡා කළේද බොහෝ සෙමිනි...

ඔවුන්ගේ කටහඬවල්වලට ඔවුන්ම බිය වූවා සේය...

ඔවුන් එලෙස නිදි වරද්දී එතැනින් පිටව ගිය සංජයද බොහෝ දේ සිතුවේය...

සැබැවින්ම ආරතී අතුරුදන් වී ඇත... අතුරුදන් වී ඇත්තේ තමා සමුවීමට යන බවද කියමිනි. සියල්ලටම වඩා ඇය එවින්නේ තමාටය... දැන් ඇයව හොයන්නේ කෙසේද...? ඇය බැංකුවට ගිය බව නම් සොයා ගන්නට පිළිවන... එහෙත් ඇය නැයි වාහනයක් හෝ ඇය එතන සිටියා යැයි කියන්නට වුවද කාහට හෝ මතකයක් තිබේදැයි සිතන්නේ කෙසේද...?

මේ සියල්ල ගැටළුවක් වුවද ඔහු ඇයව සෙවීමේ භාරදූර කාර්යයට අත ගැසීමට සිතුවේ ඇයව සොයා ගැනීමටත් වඩා දැන් ඇයව මෙලෙස තමාගෙන් වෙන් කරලීමට තරම් අවශ්‍ය වී ඇත්තේ තමාගේ විවාහාපේක්ෂිත තරුණියටද නැතහොත් වෙනත් තමාගේ තරඟකාරයෙකුටදැයි දැනගැනීමෙන් තමාගේ ඉදිරි ජීවිතයේ බොහෝ ගැටළු මග හරවා ගත හැකි බව සිතමිනි.

මේ සියල්ලම සොයා ගැනීමට තමාට නොහැකිය...

"ජයන්ත මං ගිය ගමන්ම ගමනක් යනවා... අපි එහෙට ගිහිල්ලා මාව එහෙන් දාලා මේ වාහනේ අරගෙන අපේ ගෙදර යන්න..." සංජය කිවේ මගක් දුර ගිය පසුය...

ජයන්ත හිස සැලුවේය... ඔහුට වෙනත් දෙයක් කියන්නට අවශ්‍ය නැත... ඔහු සංජයගේ මෙම ගමන් බිමන් ගැන දන්නේය...

බොහෝ විට රහසිගත ගමන් යන සංජය යන්නේම ජයන්තගේ නිවසේ දී ඇඳුම් පැළඳුම් මාරු කරගෙනය... වාහනය වත්තට ඇතු යලිත් එද්දී එහි සංජය නොව වෙනකෙක් හෝ ඉන්නා බව දන්නේ නැත... සංජය යන්නේ යතුරු පැදියකිනි... ජයන්ත සංජයගේ වාහනය සංජයගේ නිවසේ දමා ඔහුගේ යතුරු පැදියෙන් එන්නේය... නැතහොත් වාහනයකින් එන්නේය... සංජය වාහනයෙන්දැයි නැද්දැයි සොයන්නට කිසිවෙක්ම සිතන්නේ නැත. ඒ ස්ථාන දෙකේදීම සංජය බොහෝ විට බහින්නේ ගැරේජය තුළින්ම හෙයින්ම නොව ඔහු නිවෙස් තුළට යන්නේද වාහනයෙන්ම හෙයිනි. ඔහු එම නිවෙස් දෙකේම ගැරේජ සාදා ගෙන තිබුණේ එලෙසය...

යන ගමන කුමක්දැයි ජයන්ත අසන්නට සිතුවේ නැත... අවශ්‍ය නම් ඔහුට කියනු ඇත... සංජය තනිවම ගියද ඔහු යන ගමන් බිමන් ගැන සොයාගන්නට කාහටවත් නොහැකි බව නම් ඔහු දැන සිටියේය... සංජයට යතුරු පැදියක් පදවන්නට හෝ පිළිවන් බවක් කවරෙක් වත් නොදන්නා හෙයිනි... ඔහු ඒ සඳහාම වෙනත් නමක් දමා රියැදුරු බලපත්‍රයක්ද ලබාගෙන තිබුණේය...

යතුරු පැදියෙන් තරමක දුරක් ගමන් කළ සංජය එක් අතුරු මගක නවතා දෙමහල් නිවසක් දෙස බැලුවේය... ඉන්පසු යතුරු පැදියේ කොණක තිබූ ඔර්ලෝසුවකින් වේලාව බැලුවේය...

වේලාව මධ්‍යම රාත්‍රිය බව දැක්වූවද... දෙමහල් නිවසේ වෙසෙන්නන් තවමත් නිදි නැති බව නම් ඔහු දැනගත්තේ උඩුමහලේ යම්තමට දැල්වූ ආලෝකයෙනි... ඔහු සොයා ආ තැනැත්තා අවදිව සිටින බවට වෙනත් [illegible] අවශ්‍ය නැත... එහෙත් එම නිවසට නොදන්වා නම් මේ අවේලාවේ යා නොහැකිය...

ඔහු දුරකථනය ගෙන අංක කිහිපයක් ඔබා එය සවනට තබා ගත්තේය... එදෙසින් එය නාද වෙද්දී සංජයට තරමක සැනසුමක් දැණුනේය...



kathapothak.blogspot.com

# 17 ඉරිදා

**දිනයේ** සැහෙන වේලාවක් වෙහෙස මහන්සි වී සිටි අරෝෂ බොහෝ සැනසිල්ලේ ඔහුගේ ප්‍රියතම විනෝදාංශයේ එනම් රහස් පරීක්ෂක ඉංග්‍රීසි සිනමා පටයක් බලමින් සිටියේ..., මහ හඬින් හඬ නැඟූ දුරකථනය දෙස බැලුවේ තරමක කරදරකාරී සිතකිනි... මෙවන් වේලාවක මෙලෙස කරදරකාරී ලෙස හඬ නගන දුරකථනය ගැන ඔහුගේ සිතේ තිබුණේ කහටක් වුවද, මෙම දුරකථන පණිවිඩය සමහරවිට තමාට බොහෝ වැදගත් වන්නක් වූයේ නම් සිතෙද්දී ඒ කහට සෙමින් පහ කර හරිමින්ම කුඩා තිරය නිශ්චල ගැන්වූයේ දුරකථනය පණ ගන්වා එම නම්වරය දෙස බැලුවේය... ඔහුට තරමක පුදුමයක් දැණුනේ එස්පී දෙක යැයි එහි සටහන් වෙද්දීය...

සංජය පලන්සූරිය...

ආරෝෂගේ දුරකථනයේ බොහෝ දෙනාගේ නම් එක්වී තිබුණේ කෙටි සත් ලෙසිනි... සංජයගේ දුරකථන නම්බර දෙකක්ම එහි තිබිණි...

මෙම දුරකථනයට ඔහුගෙන් පණිවිඩයක් ආවේ මේ අවුරුද්දක කාලයකට පමණ පසු බව සිතෙද්දී අරෝෂට මෙය නම් බොහෝ බාරදූර කාර්යයක් තමාට බාරදීමට මිතුරා සූදානම් වීමක් ලෙස සිතුණේය...

අරෝෂ හා සංජය අතර මෙතෙක්ම එතරම් හද මිතුරුදමක් නම් තිබුණේම නැත... එහෙත් ඔහු හා සංජය අතර මිතුරුදමක් නැත්තේ

යැයි කිව හැකි වූයේද නැත... ඔහු පාසලේ දී පමණක් නොව
පිටරටවලදීද ඉඳහිට එක්ව කටයුතු කළ දඩබ්බරයන් හෙයිනි.

අරෝෂට කවදත් අඹ යහළුවන් යැයි යහළුවන් කොට්ඨාශයක් සිටියේම නැත... එහෙත් අතලොස්සක මිතුරන් සංඛ්‍යාවක් ඔහු වටාද සිටියේය... සංජයද සැබැවින්ම වැටුණේ ඒ ගණයටය...

එහෙත් අරෝෂ සංජයගේ වත්පොහොසත්කම් හෝ බල පුළුවන්කාරකම් නිසා ඔහුගේ මිතුරෙක් වන්නට සිතුවේ නැත... ඔහුට ඒවා බලපෑවේද නැත... ඔහුට ඒ තරම් බලයක් හෝ පොහොසත් කමක් නැතිව වුවද යම් යම් අවස්ථාවලදී වෙනත් අයට වඩා සංජය දමනය කරගත හැකි කිසියම් කරුණු කාරණා තිබිණ...

මෙවර සංජය විදේශගතවී සිට ආවායින් පසු අරෝෂට මුහුණ ගැසුණේම නැත... අරෝෂ දිවයිනට ආවේ සංජය විදේශගතවී සිටියදීය...

තමා විවේකයට යළිත් දිවයිනට පැමිණ සිටින බව සංජය දැනගන්නට ඇත. එලෙස දැනගත්තද මෙලෙස කථා කරන්නේ නම් කිසියම් අවශ්‍යතාවයක් නිසාම බව ඔහු සිතුවේය.

ඔවුන් දෙදෙන පාසලේදීද ගියේ දෙපැත්තක කේන්ද්‍රවලටය... අරෝෂ කුඩා කාලයේ සිටම දඩබ්බර දඟකාර චරිතයක් විය... ඔහු තරම් පාසල හෙල්ලූ වෙනත් සිසුවෙක් ගැන දැනට වුවද නොදන්නා බව ගුරුවරු කිහිප දෙනෙක්ම සංජයට පසුවද කීහ. අරෝෂ ගහ ගන්නට මරුවෙක් විය... ඔහු සියලුම සටන් ක්‍රම හරි ලෙසම හදාළේය... ජවන හා පිවිය ඔහුගේ ජීවිතය වී තිබුණේය... ඔහු හා දුවන්නට කිසිවෙකුටත් නොහැකි තරම් විය...

මේ සියල්ලම කරද්දී වුවද ඔහුට ඉගෙන ගැනීමේ දක්ෂතාවයද අපූරුවට පිහිටා තිබිණ... එක්වරක් කියවූ පසු ඕනෑම දෙයක් ඔහුට මතකයේ තිබිණ...

පාසලින් නික්මී දෙදෙනම උගත්කම ගැනීමේ අදහසින් විදේශගත වූ අතර, අරෝෂ සංජයට වඩා හාත්පසින්ම වෙනස් පැත්තක් ඉගෙන ගත්තේය... සංජය බොහෝ ආශාවෙන් කළේ දේශපාලනය හා ආර්ථික විද්‍යාවය... අරෝෂ කිසි කෙනෙක්ම නොයන පැත්තකට ගියේය...

ඔහු අපරාධ පරීක්ෂණ සඳහා වූ සියල්ල ඉගෙන ගත්තේය...



පාසල් කාලයේදී බොහෝ තැන්පත් වූ සංජය පසුව් පසුව දඩබ්බර තත්ත්වයකට එද්දී එකල මුළු පාසලම හෙල්ලූ දඟකාරයා සියලුම දඩබ්බර දඟකාර සෙල්ලම් අතැර දමා බොහෝ තැන්පත් ලෙසින් ඔහුගේ ක්ෂේත්‍රයේ බොහෝ ඉහළට නැග්ගේය...

ගැහැනු ළමෝ අතර අතිශයින් ජනප්‍රිය චරිතයක් ලෙස ප්‍රසිද්ධව සිටි අරෝෂට ඒ හේතුවෙන්මදෝ හරි හමන් පෙම්වතියක සොයා ගත නොහැකි වූ අතර, ඔහු දූන් නම් කාන්තා පාර්ශ්වය ගැන එතරම් සැලකිමක්ද නොකළේය...

ඉඳහිට හමුවන මිතුරන් දෙතුන් දෙනා ඒ ගැන විහිළු තහළු කරගත් නමුදු අරෝෂ ඒ පැත්තට නම් වැඩි බරවීමක් තිබුණේම නැත...

එහෙත් එකල ගැහැනු ළමුන්ගේ ඇසුර නොපැතූ බොහෝ තැන්පත් ලෙසින් සිටි සංජය නම් දැන් ඒ කලාවෙන් පරිපූර්ණ වී තිබෙන බව අරෝෂ දැන සිටියේය... ඒ ඔහුගෙන්ද සංජය දෙතුන් වරක්ම උදව් ගත් බැවිනි... සංජයට අවශ්‍ය කරන තැනැත්තෙක්ගේ හෝ තැනැත්තියකගේ කරුණු සොයා ගැනීමට ඔහු බොහෝ විට ආවේ ආරෝෂ වෙතය... ඒ ඔහු දිවයිනේ සිටි කාලයේදීය...

වසරක්ම මෙන් මුණ නොගැසුණද, සංජය එන්නේ කිසියම් කරදරයකින් බේරෙන්නට තමාගේ උදව්ව පැතීමට බව අරෝෂ දන්නේය... එය එසේ මෙසේ කරදරයක් නොවන බව ඔහුට සිතුණේය... කුඩා කුඩා දේවල් සඳහා සංජයට තමාගේ උදව්වක් අවශ්‍ය නැත... ඔහුට හොඳින් හෝ නරකින් සියල්ල කරගන්නට මිනිස් බලය ඇත... මුදල් බලය ඇත... එහෙත් දන්නා තරමින් සංජය කිසි කෙනෙකුට මරණීය දඬුවමක් දෙන්නේ නැත... එවැන්නක් දිය යුත්තෙක් සිටින්නේ නම්... ඔහු ඒවාට කරුණු කාරණා සොයා දෙනවා මිසක වෙනත් යමකට යන්නේ නැත... ඔහුගේ පොතේ මිනිසුන් මැරවීම යන්න කවදත් තිබුණේම නැති දඬුවමක් බව නම් අරෝෂ සහසුද්දෙන්ම දැන සිටියේය... එහෙත් ඔහුට කෙණහිල්ලක් කළ හොත් ඔහු කෙණහිල්ල කළ තැනැත්තා නිකම්ම අතළරින්නේද නැත... ඔහු අවම වශයෙන් ඒ තැනැත්තාට කොනිති ගැසීමක් හෝ කළේය... තැන්පත් සිසු වියේදීද ඒ ගතිය නම් ඔහුගේ ඉස්මතුව තිබිණ...

එහෙයින් ඒ කාලයේදීද සංජය ගැන පාසලේ තිබුණේ තරමක බියකි...

සංජය එතරමම නරක මිතුරෙක්ද නොවේ...

ඔහුට බොහෝ කරදර ආවේ තරුණියන්ගේ කල්ක්‍රියාවන්ගෙන් බව අරෝෂ දන්නේය...

එහෙයින්ම ඔහුගේ මුහුණට සංජයගේ දුරකථන නමවරය දකිද්දී සිනහගියේ ඔහු එම අංකය තවමත් පාවිච්චි කිරීම ගැන නොව, තමාගේ අංකය ඔහුගේ දුරකථනයේ තිබීම ගැනය...

★★★

දෙවරක් තුන්වරක් නාද වූන් ඉක්බිති තමා ගත් දුරකථන අංකයේ දුරකථනය කවරෙක් හෝ පණපොවා ගත් බව සංජයට වැටහිණ... මේ තමාට කථා කරන්නට අවශ්‍ය තැනැත්තාමදැයි සංජයට කිව නොහැකිය... ඔහු මෙම අංකයට වරක් කථා කළේ මීට වසරකටත් පෙරදී බැවිනි.

"හෙලෝ..." එදෙසින් නැඟුණු කටහඬින් වුවද සංජයට නම් ඒ අරෝෂමදැයි සිතාගත නොහැකි විය...

"මිස්ට අරෝෂ..."

"ඔව් මිස්ට සංජය... මේ මිස්ට අරෝෂ තමයි කථා කරන්නෙ..." අරෝෂ කීවේ විහිළු ස්වරයකිනි.

සංජයගේ සිතට දැණුනේ දැඩි සැනසීමකි...

එහෙත් තවමත් අරෝෂ සිටින්නේ මෙතනමදැයි සිතන්නට නම් සංජයට නොහැකිය...

"මොකද මේ දෙගොඩ හරි යාමෙ...?" අරෝෂ අනික් අතටම ඇසුවේ සංජයට කුමක් හෝ කරදරයක් බව එවර නම් හොඳින්ම සිතාගත් හෙයිනි...

"මං ඉන්නේ අරෝෂ විසල්පාය ගේට්ටුව ළඟ... උඹ තවම මෙහේ නේද ඉන්නේ...?" සංජය ඇසුවේය.

"ගේට්ටුව ළඟ...?" එවර පුදුමයෙන්ම ඇසූ අරෝෂ නැගිට ජනේලය ළඟට ගියේය... සෙමින් ජනෙල් තිරය මඳක් පසෙකට කළේය... සැබෑවකි... යතුරු පැදියක් ගේට්ටුවට තරමක් එහායින් නවත්වා තිබිණ...



මෙය නම් කුමක්හෝ බරපතල කරුණක් බව ඔහුට සිතිණ... මිතුරා පැමිණ ඇත්තේ තනිවමය... ජනෙල් තිරය දෙස බලාගෙන සිටි සංජය අත එසෙව්වේය...

"මචං... අර කකුල් හතරෙ මුරකාරයාත් ඉන්නවද...?"

"ඉන්නවා ඉන්නවා... හිටපං පොඩ්ඩක්..." කියූ අරෝෂ එවර දුරකථනය වැසුවේ පසෙක තිබූ වෙනත් දුරකථනයක් ගත්තේය... එහි තිබුණ එකම බොත්තම එබුවේය... එවැනි කිහිපයක්ම මෙම නිවසේ තිබෙන්නේ අරෝෂට සිටින තැනක සිට පහළට කථා කළ යුතු විට කථා කරන්නටය...

"මහත්තයා..." එම යන්ත්‍රයෙන් ආවේ පහළ සේවකයාගේ හඬය...

"ලියෝ අන්කල්... රෙඩව ලිහලා දාලාද තියෙන්නේ...?" අරෝෂ ඇසුවේ යන්ත්‍රයෙනි.

"ඔව්..."

"රෙඩ් කූඩුවට දාලා පොඩි ගේට් එක අරින්න... ඇරලා වහලා... බයික් එකක මහත්තයෙක් ඉන්නවා ඉස්සරහ... ගේට් එක අරින කොට එයි එතනට... ඒ මහත්තයා ගැරේජ් එක ඇතුලෙන් එවන්න..."

පොඩි ගේට් එක යැයි අරෝෂ කියන්නේ ඔහුගේ උඩුමහලට එන තරප්පු පෙළිය දෙසින්ම තිබෙන ගේට්ටුවය...

එලෙස බොහෝ අය එන්නේ කුමන හෝ රහසිගතව කර කියාගන්නට දෙයක් ඇති නිසා බව දන්නා ලියෝ හැකි ඉක්මණින්ම මිදුලට බැස්සේ ඔහු දෙසට දුව ආ බලු තඩියා කූඩුවට දැම්මේය... ඉන්පසු ගේට්ටුව දෙසට දිව ගියේය... මෙලෙස එන අය අරෝෂගේ මිතුරන් බවද ඔහු දන්නේය.

"ගැරේජ් එක ඇතුලෙන් යන්න මහත්තයා..." ලියෝ කීවේ ගේට්ටුවට ඉබ්බාද දමා වැසූ ඉක්බිති එතනම නතරවූ සංජය දෙස බලමිනි... "කෙළින්ම යන්න..." ඔහු පෙන්නුවේය...

මෙලෙස යන එන්නන් බොහෝ විට මහත්තයාගේ දැන ඇඳුනුම් ඇත්තවුන් බව ලියෝ අත්දැකීමෙන් දන්නේය... නැතහොත් මහත්තයාට වෙනත් තැනක කාර්යාලයයක් ඇත...

සංජය පුරුදු කාරයකු මෙන් යතුරුපැදිය ගැරේජයට ගෙන ගියේය... ගැරේජය යැයි කීවාට එහි නවතා තබන්නේ අරෝෂගේ කිසිම වාහනයක් නොවන බව ඔහු දන්නේය... ඒ අරෝෂ සමුවීමට එන අමුත්තන් සඳහාය...

මෙම නිවසේ කිසිවක් කවදාවත් වෙනස් නොවන බව සංජයට සිතුණේ යතුරු පැදිය නවත්වද්දීමය.

ඔහු යතුරු පැදියෙන් බසිද්දී එම ගැරේජයට යාබදව නිවසේ දොර විවර වූයේ අරෝෂ අතිනි.

"මචං... මට හිතාගන්න බෑ උඹලා වගේ වැඩ තියෙන මිනිස්සු මේ විදියට මාව මුණ ගැහෙන්න රෑ රාත්‍රියක එනවා කියලා කිව්වම..."

"රෑ දවල් කියලා බලන්නේ නෑ අපි..." ජැකට්ටුව යතුරු පැදියේ එල්ලා හිස් වැසුමද හිසින් ගලවමින් සී සංජය එය යතුරු පැදිය මත තබා දෙඅතින්ම හිස කෙස් පිරිමැද්දේය.

මිතුරා තවමත් වෙනස් වී නොමැති බව අරෝෂට සිතිණ... ඔහු කවදත් ඔහුගේ පෙනුම ගැන සැලකිලිමත් වූයෙකි.

"වෙන්න ඇති... රෑ දවල් කියලා නොබලා කොහොමටත් උඹ ඉතින් මෙහෙම ගස් බඩගාන්නෙ උඹේම මොකක් හරි මරාලෙකට මිසක් මේ අපි නිසා කියලා මට නං හිතන්න බෑ..."

සංජය සිනැහුණේය... මිතුරාට කිසිවක් සඟවන්නට නොහැකිය...

"උඩටම යමු මචං..." මිතුරාට කියූ අරෝෂ ඔහුට පෙර පඩිපෙළ නැග්ගේය...

සංජයද පඩිපෙළ නැග්ගේ සිතාගත නොහැකි හැඟීම වලින් තෙරපෙන හදවතකින්ද යුතුවය... අරෝෂට මේ මොහොතේදී මෙම ප්‍රශ්නය බාර දුනහොත් තමාට එයින් මදක් බැහැරව සැනසිල්ලේ සිටිය හැකිය... සංජය ඔහුගේ අඹ යහළුවෙක් නොවුණද මෙවැනි කරුණක් අරබයා ඔහුගේ සමාගමය බොහෝ වටිනා බව සංජය දන්නේය...

"වාඩිවෙයං මචං ඉතින්..." කියමින්ම අරෝෂ එවර බලමින් සිටි සිනමා පටය නවත්වාම දැමුවේය... එය සමග මිතුරාගේ ප්‍රශ්නයක් තිබේ නම් කතා කරගත නොහැකිය... ඔහු එවර දැමුවේ සංගීත හඩ



පටයකි... එය බොහෝ ලයාන්විත හින්දි ගී බව නම් සංජයට තේරිණ... අරෝෂ ඉන්දියාවේද ඔහුගේ රැකියාවට අදාල කිසියම් පාඨමාලාවක් කළ බවත් එහිදී හින්දි වංග පමණක් නොව තෙළිඟු දෙමළ වැනි භාෂා කිහිපයක්ද හදාරා ඇති බවත් සංජයට මතක් විය...

"උඹ වැඩක් කර කරද හිටියේ...?" සංජය ඇසුවේ අරෝෂ සිනමා පටය නවත්වා දමනු නොදුටු හෙයිනි.

"නැහැ... මට මේ දවස්වල වැඩි වැඩක් නෑ... ෆිල්ම් එකක් බල බල හිටියේ..."

වැඩි වැඩක් නැත්තේ නම්... සංජයට සතුටක් දැණින...

"උඹ ඉතින් කට දෙපැත්තට ගිනා උනාට... මට වැඩක් නැත්තෙත් නෑ... ඒත් ඒක නිදහසේ කරන්න පුළුවන් වැඩක්..." අරෝෂ කීවේය... "උඹේ වැඩේ මේ කෙල්ලෙක්ගෙ ප්‍රශ්නයක් වෙන්න ඇති නේ...?"

සංජයට ගිය සිනහව නවතාගන්නට ඔහුට හැකි වූයේ නැත... මොන තරම් කැලඹිලි පසුතැවිලි මැදද ඔහුට සිනහවෙන්නට නම් පුළුවන් කම තිබිණ...

"අනික මේ හලාවත පැත්ත ගැනද මං ලව්වා හොයවගන්න ඕන..." මිතුරාගේ සිනහව මැදම අරෝෂ ඇසුවේය.

"හලාවත...?" සංජය මදක් පුදුමයෙන් මෙන් ඇසුවේය.

"ඔව්... ආරංචියි ඒ පැත්තේ... හලාවත පැත්තේ මුතු කැටයක් උඹේ ගෙලට වැටෙන්න ළඟයි කියලා... කෙල්ල වැරැද්දක් නෑ... අනික් එකිට එතකොට මොකද වෙන්නේ...?"

අනික් එකී යනුවෙන් අසන්නට ඇත්තේ ආරති ගැන බව නම් සංජයට සිතුණේය... තමා හා කතා බහ නොකළාට අරෝෂ සැබැවින්ම සියලු දේ ගැන ඇස ගසාගෙන සිටින්නෙකි.

"මොන එකී...?"

"උඹ මහ පුදුම විදියට පුදුම වෙනවනේ... දැන් හලාවත පැත්ත ගැන ඇහුවම පුදුමයක් පෙන්නුවා... දැන් මේක ගැන ඇහුවම පුදුමයක් පෙන්නුවා... මට පුදුම උඹ මේ දෙන්නා ගැනම දන්නෙ නැද්ද කියලා හිතුණම..."

"මචං කොහොමද උඹ දැනගත්තෙ...?"

"මං ඇවිල්ලා මාසයයි මචං... මට ආරංචි උනා... ආවම මං "මං ඇවිල්ලා ලස්සණ කෙල්ලෙක් එක්ක උඹ අවිස්සාවෙල්ල හොයලා බලනවනේ.. ලස්සණ කෙල්ලෙක් එක්ක උඹ අවිස්සාවෙල්ල පැත්තෙ ගැවසෙනවා කියලා ආරංචියක් ආවා... කෙල්ල නිතරම වගේ වාහනේ දාගෙන එහෙ මෙහෙ ගියා කියලා..."

"නිතරම නං ගියේ නෑ අරෝෂ... ඒත් ඉතින් නැත්තෙත් නෑ..."

"උඹට දැන් මොකද ඕන වෙලා තියෙන්නේ...? ඒකෙන් ගැලවෙන්න බැරි ද...?"

සංජයගේ මුහුණට තද බැරෑරුම බවක් නැගෙද්දී අරෝෂට තරමක් සැකයක් සිතිණ... බොහෝ දේ ආරංචි වුවද ඔහු ඒවා හගිස්සවන්නට යන්නේ නැත... මිතුරාට විවාහය පිළිබඳ ප්‍රශ්නයේදී ඇයගෙන් හෝ ඇයගේ කිසිවෙක්ගෙන් කරදරයක් වත් වන්නේද...? එසේත් නැත්නම් හලාවත පැත්ත අත් හැරගත යුතු කිසිවක් ඔහු සොයන්නට යන්නේද...? මිතුරා ගැන කිව නොහැකිය... මිතුරාගේ පෙම්බරිය ගැන හෝ විවාහපේක්ෂිකාව ගැන ඔහු හොයවන්නට නම් ගියේ නැත... ඒවා ඔහුට අවශ්‍ය නැති කාරණා හෙයිනි.

"එහෙම නැත්නං... හලාවත පැත්ත හිස් කරන්න ඕන තමන් වත් තියෙනවද...?"

"දෙකම නෙවෙයි..." සංජය කීවේය.

"එහෙනං උඹ හදන්නෙ දෙපැත්තම කන්නද...? හලාවත කෙනා ගෙදර තියාගෙන..."

"උඹ මට කියන්න දෙනවද...?" සංජය එවර ගෙරෙව්වේය...

"කියපං කියපං.. මොනවද බොන්නේ... මං උඹට දෙන්නං ඕන නං කූල් ඩ්‍රින්ක් එකක්.. මේ වෙලාවට අනික්වා ගන්න බෑ... මං ඒවා ගන්නෙ අඩුවෙන් කියලා උඹ දන්නවනේ...?"

සංජය හිස සැලුවේය... අරෝෂ නම් පුදුම තැනැත්තෙකි.. ඔහු මත්පැන් හෝ දුම්වැටි පානය කරන්නේ නැත... එහෙත් එලෙස කරන්නන් අතර ඔහු හැසිරෙන්නේ ඒවායේ කෙළ පැමිණියෙකු ලෙසිනි..

"කූල් එකක් බොමු... ඒක නං කමක් නෑ මචං... මෙක ටිකක් බාරදූර වැඩක්.." සංජය කියද්දී එම ස්වරයෙන්ම එය නම් බොහෝ



බැරෑරුම බව අරෝෂට සිතුණේය... ඔහු නැගිට්ටේ ඔහුගේ පැන්ට්‍රිය දෙසට ගියේය... අරෝෂට ආහාර පිළියෙළ කරන්නේ පහළ මාලයේ සිටින ලියෝ අන්කල්ගේ බිරිඳ වන නමුදු වෙනත් කුඩා යමක් සාදා ගැනීමට අරෝෂ මුළුතැන් ගෙයක් සාදා ගෙන තිබුණේය... අරෝෂට බොහෝ හොඳින් ආහාර වුවද පිළියෙළ කිරීමට හැකිය... එය මතක්වෙද්දී සංජයට සිනහවක්ද නැගුණේය...

සිසිල් බීම වීදුරු දෙකක් සහිත බන්දේසිය ගෙන ආ අරෝෂ එය ස්ටූලය මත තැබුවේය...

"ගනිං... මදි නං කියපං... තව තියෙනවා..." කියමින්ම ඔහු වාඩි වුණේය. සංජය වීදුරුව ගෙන මදක් බීවේය... රසය... ඔහු තවත් උගුරක් ගත්තේ එවර මිතුරා දෙස බැලුවේය.

"මචං... උඹ කිව්වා හරි... මට ගෙදරින් තියෙනවා යෝජනාවක්..."

"මේනකා ගුණවර්ධන..."

"මේනකා තමයි..." සංජය කීවේය.

"ඒ අතරෙ උඹ අර සුදු කෙල්ලත් එක්ක..."

"මට දැනගන්න ඕන වෙලා තියෙන්නේ ඒ කෙල්ල ගැන..."

"මං ඒ කෙල්ල ගැන නං දන්නෙ නෑ..."

"උඹ මේනකා ගැන දන්නෙ...?"

"මේනකාගේ කසින් කෙනෙක් ඉන්නවා මගේ යාළුවෙක් අඳුනන..."

ඉන් එහාට කිසිවක් අරෝෂගෙන් දැනගත නොහැකිය... සංජය එවර බීම වීදුරුව නිදහසේ හිස් කළේය... අරෝෂ වෙනත් කිසිවක්ම නොකියා මිතුරා දෙස බලා සිටියේය... සංජයට නම් මෙවර බේරාගත නොහැකි තදබල පැණයක් බව ඔහුගේ සවැනි ඉන්ද්‍රියට වැ- -ුණේය.

සංජය අරෝෂ දෙස බැලුවේද තරමක ගැඹුරු සුසුමක් හෙළමිනි.

"මං යාළුවෙලා හිටිය කෙල්ල මිසින්..."

අරෝෂ දෑස් කුඩා කළේය...

"උඹ කිව්ව සුදු කෙල්ල..." සංජය කීවේ කුතුහලයෙන් ඔහු දෙස බැලූ අරෝෂටය.

අරෝෂ කෙලින් වුණේය... මෙය නම් බරපතලය... මෙය මෙනකාගේ පැත්තෙන් සිදුවූ යමක් වෙන්නටද හැකිය... මෙනකා නොව ඒ පැත්තේ බොහෝ භයානක අයියා කාරයෙක් සිටින බව අරෝෂ දන්නා හෙයිනි.

"කෙල්ල මිසින් කිව්වේ...?"

"හිතාගන්න බෑ මචං... ඇත්තටම මොනව වෙලාද කියලා හිතාගන්න බෑ... දැන් මට තියෙන ලොකුම ප්‍රශ්නෙ... මේක ටිකක් තදින් ගියොත්... අහුවෙන්නේ මං..."

"ඒ කෙල්ල උඹ එක්ක විතරද...?"

"ඔව්... ඒක මට වෙඩි ෂුවර්..."

අරෝෂ එවර ඔහුගේ බීම වීදුරුව ගෙන අසුන පසුපසට වුණේය... සංජය මෙලෙස කියන්නේ නම්...

"මෙ කෙල්ල කොහෙ කෙල්ලෙක්ද...? ජොබ් එකක් කරනවද...?"

සංජය සුසුමක් හෙළා ඔහුගේ අතේ ගෙන ආ බෑගයෙන් කුඩා ඡායාරූපයක් ගත්තේය... එය ආරතීගේ ඡායාරූපයකි... එය ඉන්පසු අරෝෂ දෙසට දික්කළේය... බීම වීදුරුව තොල ගාමින්ම අසුනේ ඉදිරියට වී එය ගත් අරෝෂ එය දෙස බලමින්ම යළිත් අසුනේ පසුපසට වුණේය...

"ඔය තමයි කෙල්ල..." කියූ සංජය අසුනේ හරි බරි ගැසුණේය...

අරෝෂ ඡායාරූපය දෙස හොඳින් බැලුවේය... ඇස්වහක් කටවහක් නැත... කෙල්ල නම් නියම රූමතියකි... මෙනකා මෙතරම් රූමත් නැති බව ඔහු සිතුවේය... ඔහු මෙනකා දන්නා හෙයිනි.

"ඇස්වහක් කටවහක් නෑ... කෙල්ල නං ලස්සණයි..." අරෝෂ ඔහුගේ සිතට නැගුණ සැබෑ සිතිවිල්ලම කීවේ මිතුරාට ඇසක්ද ගසමිනි. "එතකොට කෙල්ල ජොබ් එකක් කරනවද...?"

"ඔව්... '......' ඒකේ සින්ගර් කෙනෙක්..."

"සින්ගර් කෙනෙක්...?" අරෝෂ ඇසුවේ ඔහුව ඇසුණා වැරදුණේදැයි සිතමිනි. එවන් කෙල්ලෙක් ගැන සිතන්නට නම් සංජයට කොහෙත්ම නොහැකිය... සැබැවින්ම සංජයගේ මව් පියන් එලෙස ඒවාට කැමැති වන තැනැත්තන්යැයි සිනීමට අරෝෂ මැලි විය.



"ඔව්... උඹට තේරෙනවනේ... කෙල්ල කොච්චර ලස්සණ උනත්... එතන පරහක් තියෙනවා..."

"එහෙනං උඹ මේක කරන්න ඇත්තෙත්..."

"විහිළුවක් තිබුණේ නෑ අරෝෂ... ඇත්තටම මං කෙල්ල දැකපු පළවෙනි දවසෙම ෆුල් හොල්මන් උනා... හරිම ලස්සණයි... උඹ එතන ගැන දන්නවා ඇති... සමහර කෙල්ලො ඉන්නවා එතන වෙන කෙල්ලො වගේ නෙවෙයි... උන් කරන්නේ හොඳ ජොබ් එකක්... වෙන වෙන දේවල් කරන්නෙ නෑ..."

"මං දන්නවා... ඒකේ ඕනර් අයෝමා ෆර්නැන්ඩු නේ...?"

"ඔව්..."

අරෝෂ එය ගැන හොඳටම දන්නේය. එහෙත් ඔහුට එහි කුලියකටත් දායක වන්නට නම් සිදුවී තිබුණේම නැත... දායක නොවුවද එහි ඇතුළත පිළිවෙත ගැන ඔහු තරමක් දැන සිටියේය...

"ඉතින්... මේ කෙල්ල කොහොමද උඹට එකතු උනේ...?"

සංජයගේ සිත ආරතී දුටු පළමුදා දෙසට ගියේය... ඔහුගේ සිතට එක්වරම දැඩි පසුතැවිල්ලක් හා වේදනාවක් දැණින... මෙනකා ගැන නොසිතා... ඇය තමා හා රැගෙන ගියේ නම්... ඇය අම්පාරේ ගොස් නැති බවද කීවාය... ඔහුට දරුණුම දුකක් දැණුනේ එම කතාව මතකයට එද්දීය.

...අනේ සංජු මට නං ඉතින් ඕවා දකින්න වෙන්නේ තවත් අවුරුදු ගණනාවකින් අපි මේ ජොබ් එකෙන් අයින් උනායින් පස්සේ...

...එහෙනං මේ සැරේ නෙවෙයි ආරූ... අනික් සැරේ යං... යාලත් ගිහිල්ලා... මං තව ලේඩිස්ලා දෙන්නෙක් තුන්දෙනෙක් හොයා ගන්නත් ඕන...

...ජානි එක්කගෙන එනැකි නේ... එදා ඇය කීවාද ඔහුට මතකය.

...ආරූ... මං එහෙම කැමැති නෑ... ඔහු කීවේය... ඇය එයට වෙනත් යමක් කීවේ නැත... ඇයට ඔහුගේ බොහෝ දේවල්වලට දායක වෙන්නට නොහැකි වූයේ ඇය සැබැවින්ම ජේජානි නැමැත්තිය ගැන බොහෝ කල්පනා කළ හෙයිනි... ඇය ජේජානිටත් වඩා ඒ නැඟණිය ගැන සිතුවාය... බොතේජු යුවළ ගැන සිතුවාය... මියගිය

ගැන සිතුවාය... ඇයට මිතුරන්වත් නැදැයින්වත් සිටියේ ඒ අය පමණකි. එහෙයින් ඔහුට එහෙත් සංජයට ඒ අය හා පැහිමක් ගත නොහැකිය... ඇය යන තැනකට වුවද ආරති රැගෙන යන්නට නොහැකි විය... පුද්ගලික එලෙස ඔවුන් වෙනුවෙන් වෙන් වී නොසිටියේ නම්... ලේකම්වරියක සේ ගෙන ඇයව ගෙන යන්නට ඔහුට හැකියාවත් ඔනෑකමත් තිබිණ...

අරෝෂ නිවි සැනසිල්ලේ මිතුරා දෙස බලාගෙන සිටියේය... ඔහුගේ සිත කුමක් හෝ සිතනවා වැනිය... එය සමහරවිට පසුතැවිල්ලක සේයාවක් විය හැකි බව ඔහුට සිතිණ.

"එකතු උනෙත් මං අහම්බෙන් හෝටලේට ගියා දවසක්... වෙන එකෙක් මග අරින්න ඔන කම තිබුණා... ඒකට ගියේ... නිකමට... එදා තමයි මං මේ කෙල්ල දැක්කේ..."

"කෙල්ල සින්ගර් කෙනෙක් කිව්වනේ... එහෙනං... ඉන්නෙ ඒකේ හොස්ටල් එකේ වෙන්න ඇති..." අරෝෂ කීවේය.

"උඹ දැන් මේ හෝටලේ ගැන දන්නෙ නෑ කිව්වා..."

"දන්නෙ නෑ කිව්වට නොදන්නෙමත් නෑ... මං ටිකක් ඒ වගේ ස්ථාන ගැන පැපරාසි ඇහැක් දාලා බලලා තියෙනවා..."

"ඒ කෙල්ල ඇත්තටම ලස්සණයි... මං හිතන්නේ මගේ හිතට කවදාවත් ඒ වගේ දෙයක් හිතිලාම තිබුණේ නෑ... කෙල්ලො කියන්නේ ඉතින් මට..."

"කියපං..." අරෝෂ කීවේය...

සංජය එවර ඔහු හා ආරති අතර තිබුණු සම්බන්ධය ගැන සැකෙවින් අරෝෂට විස්තරයක් ගෙන ආවේය. අරෝෂ මිතුරා කියන්නක් අසා සිටියා මිස කිසිදු පැණයක් නැගුවේ නැත...

"එදා මං අම්පාරේ ඉන්දෙද්දි මට කෝල් එක ආවෙ ආරුගෙන්... මං එතකොට කිව්වා මං බදාදා එනකොට එයාට අවිස්සාවේල්ලෙ ඉන්න කියලා... මං එන්නං සැපු කිව්වා... එච්චරයි... වෙන කියන්න දෙයක් හම්බ උනේ නෑ... මං හිතන්නේ එයා හිටියේ පාර අද්දරම වගේ වෙන්න ඇති... මොකක් හරි හෝන් එකක සද්දෙකුත් ඇහුණා..."

"උඹ අම්පාරේ කියලා කෙල්ලට කිව්වේ නැද්ද...?"



"ඒ වෙලාවෙ කිව්වේ නෑ... ඒත් ඊට ඉස්සෙල්ලා සතියෙ දවසක මං කියලා තිබුණා අම්පාරේ යන්න වෙයි කියලා..."

"උඹ කියන්නෙ... එතකොට කෙල්ල බදාදා එන්නං කියලද කිව්වෙ...?"

"එතන තමයි ප්‍රශ්නෙ... මං ඇත්තටම ඇහුවෙ... එහෙනං ඔයා අවිස්සාවේල්ලට එනවද...? බදාදාට..." ඔහු ඇයගෙන් අවසන් වරට ඇසූ පැණ දෙකම කීවේය... "මං බදාදා කිව්වෙ අන්තිමට..." සංජය කීවේ එතනදී ඇයට දිනය වැරදෙන්නට ඇත යන සැකය ඔහුගේ සිතේ රැව්දුන් හෙයිනි...

"බදාදා කියන එක කෙල්ලට ඇහුණෙ නැද්ද...?" අරෝෂ ඇහුවේ ඔහුටම මෙනි... "සමහරවිට එහෙම වෙන්න පුළුවන්... එහෙනං එදාම..." ඔහු සංජය දෙස බැලුවේය... "එයා තනියම එනවද අවිස්සාවේල්ලේ උඹ ගත්තු ගෙදරට..."

"ආව වෙලාවල් තිබුණා... ඒත් ඒ අපි දන්න කැබ් එකකින් එන්නෙ..."

"උඹ ඒ කැබ් එකෙන් ඇහුවෙ නැද්ද... වැරදිලාවත් ඒ කැබ් එක ගෙන්නගෙන ආව වද්ද කියලා...?"

"නැහැ... එදා ඒ කැබ් එක සර්විස් එකට දාලා තිබුණළු... ඒ වෙලාවෙ කොහොමටත් ඒක තිබිලා නෑ... ඒක වැඩට දාලා තියෙන්නේ ඉන්පස්සෙන්දා..."

"මේක ගැන මේනකාලත් දන්නවා ඇති... නේද...?"

"මට කෙල්ලො දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා කියලා නං මේනකා දන්නවා... මගෙන් ඒත් කවදක්වත් අහලා නං නෑ..."

"උඹ ඒකට කැමැති වෙන්න ද හිටියෙ...?"

"මං කිව්වෙ... ආරු... ඒ කියන්නේ ආරති ඇත්තටම මං මේනකා මැරි කරනවට උනත් අකැමැති උන කෙල්ලෙක් නෙමෙයි... එයා එයාගේ තත්ත්වෙ දැනගෙන හිටියා..."

"උඹ වැරදියි මචං... ඇත්තටම එහෙම කෙල්ලෙක් ඉන්දගන්නෙ මොකටද...? පව් නැද්ද මචං... අපිටත් අම්මලා හිටියනේ... උඹට තවමත් ඉන්නවා... නංගිලාත් ඉන්නවා..."

"මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ නේ අරෝෂ... ඒක පැත්තකින් බැලුවොත් තාත්තා කිසි දෙයක්ම මට නොදෙන්න ඩිසිෂන් එකක් ගනියි... එතකොට මට වෙන්නේ මොකද...?"

"හොයපන්කො අපි හොයනවා වගේ සල්ලි තනියම..." අරෝෂ විහිළුවෙන් කීවද එය මිතුරාට සැහෙන ප්‍රශ්නයක් වන බව නම් සිතුවේය... "හරි හරි කියපං ඉතින් ඉතුරු ටිකත්... දැන් ඉතින් උඹ මෙච්චර නැහෙන්නේ මොකටද...? කෙල්ල එහෙම උඹට කිව්ව නං සමහරවිට අවිස්සාවෙල්ලෙ වෙන්නත් බැරි නෑ..."

"එහේ නෑ අරෝෂ... අදට නැති වෙලා දවස් හයක්... ගිය සඳුදා නේ... තාමත් එහේ ගිහිල්ලා නෑ... මං දැන් පැය දෙකකට විතර ඉස්සෙල්ලත් චෙක් කළා..."

"මෙක සමහරවිට උඹෙන් මොකක් හරි කප්පමක් ගන්න කරා වගේ දෙයක් වෙන්න බැරිද...?"

"එහෙනං තාමත් මට මොකක්වත් ආරංචියක් නාවේ...?"

"ඔව්... ඒක ගැන හිතුවම ටිකක්... ඒත් කිඩ්නැප් කරානං... මුං හිතනවද දන්නෙ නෑ නේ ටිකක් දවසක් ගිහිල්ලා උඹෙන් කඩා වඩා ගන්න..."

"මට නං හිතන්න අමාරුයි අරෝෂ..."

"කරුණු කීපයක් තියෙනවා... එකක් කප්පම ගන්න... නැත්තං මොනවා මොනවා හරි කරලා බ්ලැක්මෙල් කරන්න... නැත්තං මේ උඹේ ප්‍රොපෝසල් එකට... නැත්තං උඹේ වැඩ වලට මුක්කුවකට... ගොඩක් දේවල් තියෙනවා අපිට හිතාගන්න..."

"මට හිතාගන්නත් බැරි ඒක නිසා... මං උඹ ළඟට ආවෙත් ඒක නිසා..." සංජය එවර කීවේ අරෝෂගේ සිනහවක් නංවමිනි... එහෙත් අරෝෂගේ සිනහව එලෙසම වියැකිණ... මෙය නම් සැබැවින්ම බාරදූර කාර්යයක් බව ඔහුට සිතිණ... එක් ඉලක්කයක් නැත... ඉලක්ක කිහිපයක් හරහා ඔහු ඇයව සෙවිය යුතුය... මැරුවේ නම් මෙ වෙද්දී මිනිය හෝ හමුවී තිබිය යුතුය... එය මිතුරාට කියන්නට නම් ඔහු තරමක් පසු බැවේය... කාලය සලකද්දී මෙවන් කෙල්ලෙක් මෙලෙස සතියක් හොඳ සිහියෙන් තියාගන්නට නම්... ඇය අවිස්සාවෙල්ලේ යද්දී අනතුරකට පත්වුණාවත්ද...?



"හොස්පිටල්ස් වලින් හෙව්වෙවද...? සමහරවිට ඇක්සිඩන්ට් එකක් වගේ වෙලා නං..."

"නැහැ... ඒක තමයි මං උඹව හොයාගෙන ආවෙ... මෙකට හිත යොදාගෙන මට වැඩ කරන්න අමාරුයි... මං හෙට ආයෙ ට්‍රින්කොමලි යන්න ඕන... මට ඇත්තටම මෙක ඔළුවෙ තියාගෙන කිසිම වැඩක් කරගන්නත් බෑ..."

"උඹ දැන් මෙනකා බඳිනවා කියන එක ෂුවර් නං... මෙ කෙල්ල උඹ ස්පෙයාර් වීල් එකක් විදියට නං තියාගන්න යන්නෙ... මෙකි නැති උනා කියලා උඹට ප්‍රශ්නයක් නෑ නේ... ඒ කෙල්ලගෙ කවුරුවත් නැත්තං කවුද ඉතින් ඒ කෙල්ල ගැන හොයවන්නෙ...?"

"අයෝමා..."

"මං හිතන්නෙ නෑ මේ වගේ කෙල්ලෙක් ගැන එයා එච්චර ඉන්ටරෙස්ට් එකක් අරගෙන කාලෙ නාස්ති කරයි කියලා... කෙල්ලො ඕන තරං ඉන්නවා ඒ වගේ තැන ගන්න බලාගෙන..."

"මෙකි ස්පෙෂල් කෙල්ලෙක් මචං... ඒකියි ඒකිගෙ රූම් මේට් ජේජානි කියන කෙල්ලයි... උන් දෙන්නම පුදුම විදියට මුළු හෝල් එකම හොල්මන් කරවනවා..."

"උඹ එතකොට මේ ජේජානි කියන කෙල්ල කන්ටැක්ට් කරලා බැලුවෙ නැද්ද....?"

"ඒක මං දැන් කියන්න යන්නෙ... ආරූ නැතිවෙලා දවස් දෙකකට පස්සෙ මගේ ෆෝන් එකට ඒකි ගෙන් කෝල් එකක් ආවා... හරියටම බැලුවොත් බදාදා... මං ගත්තා කෝල් එක... ඒකි මට චාර්ජ් කළා ආරූ හංගාගෙන ඉන්නවා කියලා..."

"සැකේ සාධාරණයිනෙ මචං... උඹ තමයි උන් දන්න එකම මිනිහා... උඹමත් කියන හැටියට..."

"මට පිස්සුවක් නෑ නේ මචං ඒකි හංගගෙන ඉන්න..."

"ඒ උඹ නේ කියන්නේ... ඇයි උඹ අනික් පැත්තෙන් හිතන්නේ නැත්තේ...? උඹ මේ එකියෙක් බඳින්න යනවා කියලා රටේම ප්‍රචලිත වෙලා තියෙනවා... මේ කෙල්ල එක්කත් යනවා කියලා කෙල්ලගේ පැත්තෙන් කවුරුත් දන්නවා..."

"මං එහෙම ආරුට කරන්න හිතාගෙන හිටියේ නෑ අරෝෂ... මෙතන වැරැද්ද තියෙන්නේ අනික් අය බලන විදිහ... මං ආරුට කියලා තිබුණා... හිමින් සීරුවෙ ප්‍රශ්න ඔක්කෝම ක්ලියර් කරගෙන රට පනිමු කියලා..."

"උඹෙ ඔක්කෝම මෙහේ තියෙන ඒවා දාලා..."

"එහෙමත් නෙවෙයි... දෙපැත්තම සේප් එකේ කරගන්න තිබුණා..."

අරෝෂ කටකොණකට සිනාසුණේය...

"ඒ කියන්නෙ උඹ ඔය දෙන්නගෙන් කාට හරි බොරුවක් කරන්න එපැයි... දෙපැත්ත සේප් කරගන්නවා කියලා කියන්නේ එක පැත්තකට ඇත්ත... අනික් පැත්තට බොරුව කියන එක..."

"අපි දෙන්නා ගොඩක් දේවල් කථා කරගෙන හිටියා අරෝෂ... ඒ කෙල්ලොන්ට යන එන තැනක් නෑ... මං එයාට හැම දෙයක්ම දෙන්න නේ ලැහැස්ති වෙලා හිටියේ..."

"උඹට මෙනකාලගෙ පැත්ත සස්පිෂස්ද...?"

"ඒකත් කියන්න බෑ අරෝෂ... සමහරවිට... මං කරන්න යන දේවල් ගැන නොදන්න අය මං ගැන වැරදියට හිතාගෙන... මේ කෙල්ලව හැංගුවා වෙන්නත් පුළුවන්..."

"වෙන්නත්... ඒ කියන්නේ තවත් අල් තයන්නක් තියෙනවා..."

"ඔව්... ඒක එන්නෙ ආරුගෙ යාළුවාගෙන්... තේජානි කියන කෙල්ලගෙන්..."

"උඹට අර චාර්ජ් ෂීට් එක දික්කරපු... ඒ කෙල්ල කවුද එනකොට හරියටම... එයත් සින්ගර් කෙනෙක්ද...?"

"ඔව් රූම් මේට්... ආරු ඇවිල්ලා අවුරුද්දකට විතර පස්සෙ ඇවිල්ලා තියෙන්නේ... නංගි කෙනෙක් ඉන්නවා... ඒ නංගි නවත්තලා තියෙන්නෙත් ආරු හිටිය ගෙදර..."

"ඒ කියන්නේ අර බොතේජු කියන කට්ටියගෙ...?"

සංජය හිස සැලුවේය...

"එතකොට ඒ කෙල්ලද උඹට කථා කරේත්...?"

"ඔව්..."



"සාධාරණයිනේ... කාමරේ එකට ඉන්න එකෙක් නැති කොට මචං අපි උනත් ගිය තැනකින් නේ කෝල් කරලා අහන්නෙ..."

"ඒක නෙවෙයි ප්‍රශ්නෙ... ඒකි කෙලින්ම මටයි චාර්ජ් ෂීට් එක දීලා තිබුණේ අද උදේ..." සංජය වෙලාව බැලුවේය... දැන් නම් ඊයේය... ඔහුගේ මුහුණට සිනහවක් නැඟුණේ දිනයේ පළහිලව්ව නිසා බව අරෝෂට සිතුණේය...

"සෙනසුරාදා උදේ ඒ කියන්නේ..." අරෝෂ කීවේය.

"ඔව් මචං... උදේ එහෙ මොකක් හරි තිබිලා තියෙනවා ඉන්ක්වයරි එකක්... මේ කෙල්ලගෙ මිසින් එක ගැන..."

"ඒකත් සාධාරණයිනේ මචං... උඹත් එක්ක සෙට් වෙලා හිටියා කියලා ඒ වගේ තැනක කෙල්ලෙක් ගැන උනත් නොසොයා නොබලා ඉන්න එකක් නැනේ ඒ මිනිස්සු..."

"මං නැහැ කිව්වේ නැහැනේ මචං... මෙනකාලගෙ පැත්ත ගැන ටිකක් තියෙනවා වගේම ඒකත් මං හිතුවා..."

"ඉතින්..."

"ඉන්ක්වයරි එක කරලා තියෙන්නෙ ජයරත්න අන්කල්..."

"දේදුනු ගේ තාත්තා..."

සංජය හිස සැලුවේය...

"එතනදී මේ කෙල්ල මං ගැන කියලා තියෙනවා... ආරතී කියන යාළුවා මාත් එක්ක සම්බන්ධයක් තියෙනවා... මේ දවසෙ මං එක්ක ගියා කියලා..."

"මාර ගති කෙල්ලෙක් වෙන්න ඕන..." අරෝෂ කීවේ සැබැවින්ම සංජය කවුද යනු දැන දැනම එලෙස කියන්නට නම් ඇයට හොඳ ආත්ම ශක්තියක් ඇත්තියක විය යුතු බව සිතමිනි.

"අන්කල් මට කථාකළා..." කියූ සංජය එවර අද දිනය ඇතුළත සිදුවූ සියලුම සිද්ධීන්ද අරෝෂට කීවේය... ඉඳහිට ඇණයක් දෙකක් නැගුවද අරෝෂ ඒවා හොඳින් සිතේ ධාරණය කරගත්තේය...

"මං ඉන්පස්සෙ ගියා ඒකි හම්බවෙන්න..." කියූ ඔහු එවර බෑගය තුලින් ගත්තේ සංයුක්ත තැටියකි... ඔහු එය අරෝෂට දිගු කළේය...

"මෙක මේ අද ඒ ගොල්ලන්ගෙ අයිටම් එකේ කොපියක්... එක තැනම තියලා මං හිතන්නේ වීඩියෝ කරන්නෙ... උඹට දුන් කෙල්ලව පෙන්නන්න එපැයි... මං කෙල්ලත් එක්ක කරපු කථාවත් මං ටේප් කරගත්තා... ඒකත් ඇති ඔකෙම දාලා... වොයිස් කට් එකක්..."

"බලමු එහෙනං... මට ඉස්සෙල්ලම පටන් ගන්න වෙන්නෙ මේ කෙල්ලගෙන් නේ..." කියාගෙන ගිය අරෝෂ නැගිට පසෙක තිබූ අතේ ගෙන යා හැකි පරිගණකය ස්ථූලය වෙත ගෙන ආවේ සංයුක්ත තැටිය එයට ඇතුල් කළේය...

"ඉස්සෙල්ලම ඇත්තේ ආරුගෙ සෝන්ග් එකක්... මං ඒකත් ගත්තා... උඹට කෙල්ලො දෙන්නම පෙන්නන්න ඕන නිසා..."

"රයිට්..." කියූ අරෝෂ එය තරමක් හඬ වැඩි කළේය... දුන් තිරයට ආවේ ආරතීගේ ගීයකි... අරෝෂට හූ ගැව්ණ... සැබැවින්ම කෙල්ල බොහෝ රූමතියකි... එහි තේජානි සිටියේ නැත... එය විනාඩි පහක් හයක් වෙද්දී අවසන් විය... මිතුරා එහි දමන්නට ඇත්තේ කොටසක් බව අරෝෂ සිතාගත්තේය.

දෙවනුව ආවේ මේ දිනයේ වූ ගීතයය... එහි තේජානි වේග රිද්මයේ ඉංග්‍රිසි ගීයක් ගයමින් සිටියාය...

අරෝෂ ඇයගේ රුව මවාගැන්මට කටහඬ අනුව උත්සාහ කළේය... එහි නම් ඇයගේ රුවක් තබා ඇයවත් හරි අන්දමින් දසුනට ගත නොහැකිය... ඇයගේ මුහුණේ එතරම්ම පාට ගොඩක් ගා තිබිණ.

"මොකද මචං මේ කෙල්ලගේ මූහුණත් හරිහමන් කොහේවත් පේන්න නෑ නේ..."

"ඒ කෙල්ල හැමදාම ඔය විදියටම ෆේස් කලරින් එකක් දාගෙන මචං එන්නෙ... සමහර විට නිකං මූණ අපායට හෙණ ගහපු එකෙක් ගෙද වගේ දන්නෙ නෑ නේ..."

එයට කුමක් හෝ කියන්නට ගිය අරෝෂ එක්වරම නිහඬවූ තිරය දෙස බැලුවේය.

"මොකක් හරි..."

"බලපං... නැවතුණේ නෑ... මං ඇතුල්වෙනකොටම මෙකී සින්දුව නැවැත්තුවා... එතකොට ඔක්කෝම නැවතුණා... ඒක එහෙමම රෙකෝර්ඩ් වෙලා ඇත්තේ..."



අරෝෂගේ මුහුණේ සිනහවක් නැග්ගේ එවර හින්දි ගීතය පටන් ගනිද්දීය...

එහෙත් ඔහු කියන්නට ගිය දෙය නොකියා නවතා ගත්තේ ගීතය ගයන්නිය එය ගැයූ ආකාරය ගැන ඔහුගේ හදවතටම තට්ටුවක් දුන් හෙයිනි... ඇය නම් උපතින්ම දක්ෂකම ලත් තැනැත්තියක බව ඔහු සිතුවේ සැබැවින්ම දෙවනුව යළි ඇයගේ වේග රිද්මයේ ගීතය ගනිද්දීය...

එම ගීතය හා රංගනය නිමවෙන්නා හාම මිතුරාගේත් ඇයගේත් සංවාදයේ හඬ පටය මතුවී තිබිණ... ඇය පිළිතුරු දුන් ලීලාව බලද්දී ඇය නම් කිසිසේත්ම බලයට හිස නොනමන්නියක බව ඔහු සිතුවේය... ඇයගේ ගීතයේදී ඇය හිස නමා අත්පොළසන් හඬ පිළිගත් ආකාරයත් ඔහුගේ සිතට ඇය ගැන පහන් හැඟීමක් ඇති කර තිබිණ.

රූමත් නොවූවද ඇය නම් දක්ෂතාවයකින් පිරිපුන් ළඳක් බව ඔහුට නොසිතාම නොහැකි විය.

"දැක්කද මචං... අර වියර් එකට ඒකිගෙ රෙස්පොන්ස් එක..."

"මොකක්ද ඇත්තටම ඒ වියර් එක...?" අරෝෂ ඇසුවේය... වේදිකාව මිස අනෙක් පැත්ත එහි ඡායාරූප ගත වී නොතිබුණ හෙයිනි.

"කවුද එකෙක් නැගිටලාම දුන්නා නේ ක්ලැප් පාරක්... අනික් එව්වොත් ඒ වගේම නැගිට්ටා..."

"උඹත් නැගිට්ටද...?" අරෝෂ ඇසුවේ කටකොණකට සිනහසෙමිනි... මිතුරා එලෙස හෝ නැගිට්ටේ නම්... කෙල්ල රජයක් දිනුවා හා සමානය...

"නැගිට්ටා මචං... මට හිතාගන්න බැරි උනා මොකටද කියලා නං..." සංජය ඇත්තම කීවේය.

"උඹ නැගිට්ට එක හොඳයි... නැත්තං ඉතින් වටපිටාවේ එවුන් දැනගනී උඹ දක්ෂකමකට වත් ගරු කරන එකෙක් නෙවෙයි කියලා... ඒකි ගත්ත ඒ සින්දු දෙක ඒ විදියට ගන්න බැරිවෙයි කාටවත්ම... ඒක හින්දා ඒක ගැන දන්න කෙනෙක් වෙන්න ඕන නැගිටලා ක්ලැප් කරන්න ඇත්තේ..."

"ඒක නං වෙන්න ඇති... ඉන්ඩියන් කාරයෙක් තමයි ඉස්සෙල්ලම නැගිට්ටිනවා දැක්කේ..."

"උඹට හිතනැකිද ඒ සින්දුව මොකක්ද කියලා...?"

"මොන සින්දුවද...?"

"හින්දි සින්දුව...?"

"ඒ හින්දිද...? මට නං තේරුණේ නෑ මචං මෙලෝ දෙයක්..."

"ඒ හින්දිද...? මට නං තේරුණේ නෑ ප්‍රීතම කියන එකේ තේරුම..."

"උඹ දන්නවද නිර්දයී ප්‍රීතම කියන එකේ තේරුම..."

සංජය පළමු වරට එම ගීතය ගැන සිතන්නට පටන් ගත්තේය... සංජය පළමු වරට එම ගීතය ගැන සිතන්නට පටන් ගත්තේ තමා දුටු පසුය... කුතුහලයෙන්ම ඔහු ඇය එය කියන්නට ගත්තේ තමා දුටු පසුය... කුතුහලයෙන්ම ඔහු මිතුරා දෙස බැලුවේය.

"දයා විරහිත පෙම්වත.... මේ උඹ අර කෙල්ලට ඉස්සෙල්ලා බැල්මක්වත් දාපු එකියෙක්ද...?"

සංජය තරමක් පුදුමයෙන් බලා සිටියද දෙවන වර ඔහුගේ නෙතට කෝපයක් ආවේය...

"ඒකි ඒක මට එහෙනං කියලා තියෙන්නේ... අරූන් ඔක්කොම මං දිහා බැලුවා තමයි කන්න වගේ... ඒත් ඉතින්..." කෝපයෙන්ම කියාගෙන ගිය සංජය මේ මොහොතේ ඇය සිටියේ නම් ගෙල වුවද සිරකර මරන්නට තරම් කෝපයක් ගත්තේය... "දන්නවනං මං මේකිගෙ බෙල්ල මිරිකනවා..." ඔහු මිතුරාට කීවේද ඒ කෝපයෙහි...

අරෝෂ මිතුරාගේ කෝපය කෙසේවත් ගණන් ගත්තේ නැත... ඔහුට නම් මෙය සිතාගන්නට නොහැකි විහිළුවකි... ඔහුට ඇයව දන්ම දකගැනීමට තරම් සිත්විය... මේ කෙල්ල නම් දමනය කරගැනීමට ලෙහෙසි පහසු කෙල්ලෙක් නොවන බව ඔහු සිතුවේ සංජය වැන්නෙකුට මෙලෙස කරන්නට තරම් වූයේ නම්... සිතෙද්දීය.

★★★

එවර අරෝෂ කියාගෙන ගියේ ඇය ගැයූ කොටසේ තේරුමය... සංජය පුදුමයෙන් බලාගෙන සිටියේය... "උඹ මේ විකාර කරන්නේ හොඳ මොළේ තියෙන කෙල්ලෙක් එක්ක..." අරෝෂ කීවේද ජයරත්නගේම කථාවය... සංජය කෝපය නිවා ගන්නට දැගළුවේය.

"අන්කලුත් ඒකම කිව්වා මචං..."

"මොකක්ද...?"

"ඒ කෙල්ලො මේ නැටුවට දඟළුවට මොළේ නැති කෙල්ලො කියලා හිතන්න එපා කියලා..."

"අන්කල් හරි මචං..."



"මට ඒ වෙලාවෙ නං හිතුවෙම නෑ ඒකි මේ වගේ මට සින්දුවක් කියයි කියලා... උන් ප්‍රැක්ටිස් කරන ඒවාතේ කියන්නේ... මං දනගෙන හිටියනං ඒකිට..." සංජයට නම් දැන් ඇත්තේ සබකෝලය බව අරෝෂට සිතිණ...

"උඹ ටිකක් මනස සන්සුන් කරගනිං ඉස්සෙල්ලා... මේ කෙල්ල එක්ක උඹ මුකුළු කරන්න ගිහිල්ලා නෑ නේ..."

"නෑ මචං නෑ..." එවර සංජය කීවේ කෝපය තරමක් මෙල්ල කරගන්නට තැත දරමිනි.

"උඹ එතකොට කෙල්ල දකලාම නැද්ද...? මූනුත් ලස්සණ කෙල්ලො වෙන්න ඕන..."

"මට අර කෙල්ල හොයලා දීපං... ඒ ඇති..."

"මං උදේ ඉඳන් වැඩට බහින්නං... මට ඉතුරු ඩීටේල්ස් ටිකත් දීපන් කෙල්ලගෙ..."

සංජය ආරතීගේ නම හා ඔහු දන්නා සියලුම කරුණු එවර කියද්දී අරෝෂ ඒවා පරිගණක ගත කළේය...

"අනික මේක තමයි වැදගත්ම දේ මට කියන්න තියෙන..."

අරෝෂ මිතුරා දෙස බැලුවේ තරමක කුතුහලයකිනි...

"මං දන්න තරමින් අරෝෂ... ආරූ නැති උනොත් මේ කෙල්ලට තමයි ආරූගේ ඔක්කොම වගේ ලියලා තියෙන්නේ ලක්ෂ හත අටක් විගේ..."

"මේ පන්දාහට මිනී මරණ රටේ ලක්ෂ හත අටක් නං..." කියාගෙන ගිය අරෝෂට එය වැටහුණේ එවෙලෙහිදීය... "උඹ කියන්නේ මේ ආරතී කියන කෙල්ල මේ තේජානි කියන කෙල්ලටද ඔක්කොම ලැබෙන්න ලියලා තියෙන්නේ... මැරුණොත්..."

"ඔව්... මං එක්කම ගිහින් දැම්මෙ... ප්‍රයිවට් බෑන්ක් එකක ෆික්ස්ඩ් කරා සල්ලි වගයක්... නොමිනි දැම්මේ තේජානිගේ නම..."

"ඒක නං සංජය ටිකක් සැක කටයුතුයි... මේ කෙල්ලට පුළුවන් නේ එහෙනං මේ ආරතීව නැති කරලා එයාගේ දේවල් ගන්න..."

"මටත් හිතුණා... ඒත් මචං එක දෙයක් මට හිතුණා... ආරතීට ආව කාඩ් ගැන එහෙනං මට කිව්වෙ ඇයි මේකි... ඒවා නොකියාම

මං මේ වැඩේ කෙරෙව්වා කියලාම කියාගෙන ඉන්න තිබුණනේ... ඒ මොකද අරෝෂ... මට ඕන ආරතී හොයාගන්න මිසක් අනික් අයව කම්බස් කරන්න නෙවෙයි..."

"චිකක් ප්‍රශ්නයක් වගේ තමයි... කොහොමටත් මං වැඩට බහින්නං... මචං ඇත්තටම මේ ආරතී උඹට අගේ පෙන්නන්න කාටවත් නොකියාම කොහේ හරි හැංගිලා ඉන්නවද දන්නෙ නෑ..."

"ඒක නං ඉතින් කියන්න බෑ..."

"මං බලන්නං උදේ ඉඳන්ම..." දෙවනවරටද අරෝෂ බොහෝ ස්ථිර අයුරින් කීවේය... අරෝෂගේ සිතට ආවේ එයය... කාහටවත් නොදන්වා ඇයට තනිවම එවැනි පියවරක් ගත හැකිය... මේ පරාසයේ කෙල්ලන් බිය නැත... ඇය කොහේ හෝ කුඩා නිවාඩු නිකේතනයක දැන් සතුටින් ඉන්නවා වෙන්නටත් පිළිවන... එහෙත් එක් දෙයක් ඇත... ඇය එලෙස සිටින්නී නම් මෙම හෝටලයේ කවරෙක් හෝ සමග සබඳතාවයක් තබා ගත යුතුය... ඒ සමහරවිට මේ තේජානි කියන කෙල්ල සමග හෝ වෙනත් කවරෙක් සමග හෝ විය හැකිය...

ඔහු මිතුරා දෙස බැලුවේය.

"කවුද මේ තේජානි කියන කෙල්ල ඇරෙන්න ආරතී කියන කෙල්ල හෝටලේ වැඩිය යාළුවෙලා ඉන්නේ... උඹට කියලා ඇති නේ...?"

"මයන්ත... මයන්තයි තේජානියි තමයි එයා ළඟින්ම ඉන්නෙ... මයන්තගේ ආදරකාරයගේ ත්‍රී වීලර් එකේ තමයි ඒ ගොල්ල ගොඩක් වෙලාවට එහෙ මෙහේ ගියේ..."

"එහෙ මෙහෙ කිව්වේ...?"

"බොතේජුලගේ ගෙදර... අනික ඒ මැන් ගිහිල්ලා ආරතීලගේ ගෙදරිනුත් හොයලා බැලුවලු..."

"ගෙදරින්... උඹ කියන්නේ මේ වැඩෙන් පස්සෙ..."

"ඔව්... ගොඩක් ඉස්සරත් හොයවලා තියෙන්නේ... මැන් තමයි ගිහින් තියෙන්නෙ... ඒ කියන්නේ මේ මයන්ත කියන කෙනා... එයා තමයි එතකොට ගිහිල්ලා තියෙන්නේ... මං කිව්වේ උඹට... කෙල්ල මැරිලා කියලා දානයක් දීපු බව දැනගෙන තියෙන්නේ එහෙම... ඒකි මට ඒක කියද්දි ඇත්තටම එදා ඇඬුවා..."



"අපේ මිනිස්සුන්ගෙ ගොං කං..." අරෝෂ කීවේ සැබැවින්ම කෝපයෙනි... "තමන්ගේ දුවව විශ්වාස කරන්නේ නෑ... වෙන උච්චොගෙ පුත්තු විශ්වාස කරනවා..."

"මේ සැරේ ගිහින් තියෙන්නේ මැන්ගෙ තාත්තාලු... මං ඒක ගැන එච්චරම විස්තර හොයන්න ගියේ නෑ... අන්කල්ට අද උදේ තේ කියලා තියෙන්නෙ... ඒක ගැනවත් හොයවන්න වෙලාවක් ආවෙත් නෑ... අන්කල් උනත් හෙට උදේ ඉඳන් තේ වැඩක් පටන් ගන්නවා නං පටන්ගන්නෙ..."

"එහෙමනං මචං මෙතනත් පොඩි කොස්සක් පේනවා... දෙකැරෙම ගිහිල්ලා තියෙන්නේ තේජානි දන්න කියන දෙන්නෙක්... ආරතී වගේ හිටපු දෙන්නෙක්..." අරෝෂ කල්පනා කාරීව කීවේය... මෙලෙසින් නම් ඔවුන් දෙදෙන සමහරවිට ආරතී ඉන්නා තැන දන්නවා වෙන්නටද පිළිවන...

"මං දැන් කවදද මෙහේ එන්න ඕන...?"

"අනිද්දා විතර කමක් නෑ... උඹ ට්‍රින්කොමලි යනවනං බැරිවෙයි නේ... එහෙම නං ආව දවසක... හැබැයි පුතෝ මට කෝල් එකක් දාලා වරෙන්... මං ඉතින් මොන දේකට කොයි වෙලාවෙ එළියට යනවද කියලා කියන්න බැනේ..."

"මං ජයරත්න අන්කල්ට කියන්නද අරෝෂට මගේ පැත්තෙන් වැඩේ බාර දුන්නා කියලා..."

"කවුද ඒ පැත්තෙන් බාර දීලා කියලා කිව්වේ...?"

"අන්කල් මට කිව්වේ... අයෝමාම තමයි ඒක අන්කල්ට බාර දීලා තියෙන්නෙ.. මෙච්චර දවස් ආරු මටත් කථා නොකර ඉන්න එක ගැන දැන් නං මචං..."

"බලමු බලමු... නොබලා කිසි දෙයක් කරන්න බෑ නේ... කිව්වට නං..." කියූ අරෝෂ මදක් කල්පනා කළේය... "එපා මචං... මට නිදහසක් නැතිවේවි එතකොට... මං හිතන විදියට කිසි දෙයක් හොයාගන්න වෙන්නේ නෑ එහෙම උනොත්..."

"උඹට මගේ සම්පූර්ණ නිදහස දෙනවා... මට කියපං දෙන්න ඕන ගාණ... දැන් ටිකක් තියෙනවා... උඹ චෙක් බාර ගන්නෙ නෑ නේ... ඉතුරු තිබුණොත් මං වෙන දවසක ගේන්නං......"

අරෝෂ කාඩ් පතක් ගෙන ගණනක් ලියා මිතුරා අතට දුන්නේය... මිතුරන් යැයි තරමක් අඩු කළා විනා ඔහු කවදාවත් නිකං කාසි වලට වැඩ කළේ නැත...

සංජය අත කමිසය තුළට යවා එයින් මුදල් තොගයක් ගත්තේය... ඔහු මිතුරා ඉල්ලන ගණන ගැන අනුමාන කරගෙන සිටියේය...

"ඉල්ලපු ගාණටත් ටිකක් වැඩියෙන් ඇති... ඒක මං අයින් කරන්නේ නෑ... තියාගනිං..."

"ඔකේ මචං... මං හවස ඉඳන් වැඩේට බැහැලා ඇති..."

"හවස...?"

"ඔව්... මං පටන් ගන්න යන්නෙ මේ තේජානි කියන කෙල්ලගෙන්... අනික මයන්ඩ..."

"කමක් නෑ... උඹ මගෙන් කියලා කවුරුත් දැනගන්න එපා නෑ නේ..."

"මං යන්නෙ නෝර්මල් කස්ටමර් කෙනෙක් වගේ... මට කෝල් කරන්න එපා... මට උඹට කථා කරන්න ඕන උණොත් මං උඹට රින් කට් එකක් දෙන්නං... දෙන්නෙ වෙන ෆෝන් එකකින්... ඒකේ අගට ඇත්තේ නමේ තුනක්... මට ගනින් කවුරුත් නැති තැනකදී හෙමින් සිරුවෙ... අනික ගත්තු ගමන් උඹ ඒ නම්බර් එක ඩිලීට් කරලා දාන්න ඕන..."

සංජය හිස සැලුවේය...

"මට නං දුන් ටිකක් ඇත්තටම බයත් හිතෙනවා අරෝෂ... මෙක ගැන නං හෙදට හොයවන්න වෙයි... මේ කෙල්ල ඉන්න තැනකින් ඒකිට කථා කරලවත් කියන්න බැරි තැනකද දන්නෙ නෑ නේ ඉන්නේ... මගෙ කවුරු හරි තරහකාරයෙක් ළඟ නං..."

"ඒකත් වෙන්න පුළුවන්... මේ කෙල්ල සමහරවිට ස්ව කැමැත්තෙන් වහං වෙලා ඉන්නවනං... ඒකත් වෙන්න පුළුවන්..."

"ආරතී නං ඒ වගේ කෙල්ලෙක් නෙවෙයි මචං..." සංජය කීවේ නැගිටිමිනි... "ඒ කෙල්ල එහෙම දේවල් කරන්න පුළුවන් කෙල්ලෙක් කියලා මං නං හිතන්නෙ නෑ... මට සැක තියෙන්නෙම



මේ තේජානි කියන කෙල්ල ගැන... ඒත් එක වෙලාවකට මට හිතෙනවා ඒ කෙල්ල කියන්නෙත් ඇත්තක්ද කියලත්..."

"ඒ කියන්නේ මේ ආරතී ගැන දන්නෙ නෑ කියන එකද...?"

"ඔව්... ඒ මොකද අන්තිමෙදීම ඇහුවා නේ කෙල්ල අඬන සද්දෙත්..."

"කෙල්ලොන්ගෙ කඳුළු ගැන හිත හිත නං මේ වගේ වැඩ වලට එකතු වෙන්න බෑ සංජය... මං බලන්නං... ඒකයි මං කිව්වේ ඉස්සෙල්ලා පටන් ගන්න වෙන්නේ එතනින් කියලා..."

"එහෙනං මචං මං යනවා... කොහොමටත් අන්කල්ලත් හෙට ඉඳන් වැඩට බහියි මං හිතන්නෙ..."

"මං ඒක ප්‍රශ්නයක් කරගන්නෙ නෑ... ඒත් ඒක දැනගත්ත එක හොඳයි..." අරෝෂ කීවේ පහළට බසින අතරමය...

සංජය පිටත්වී ගිය පසු ලියෝ අන්කල් දුවගොස් ගේට්ටුව ඉසා යළි බල්ලා මුදා හැර නිවසට එද්දී අරෝෂ ගැරේජයේ දොරටුව අගුල් දමා උඩට නැග්ගේය.

සංජය නිදි යහනට යද්දීද ඔහුගේ සිතේ තිබුණේ තේජානි නම් යුවතිය ගැනය... ඔහුට ඒ ගීතය එතරම් ඒ මොහොතේදී වෙනසක් නොවූයේ කෙසේද...? සමහරවිට තමා හින්දි සින්දු ගැන වැඩියමක් නොසිතන නිසාම විය හැකිය... තේජානිට භාෂා කිහිපයකින්ම හොඳින් ගී ගැයීමට හැකි බව ආරතී තමාට කියා නොතිබුණේද...? ඇයට යම් තරමකට හින්දි භාෂාව තේරෙන බව හැසිරවිය හැකි බව... ආරතීට මෙන්ම එලෙස තේරුම් ගත හැකි බව... ඒ මොහොතේදී තමාට එය ගැන නොසිතුණේ ඇයි...? ඇය තමාට හීන් සීරුවේ පහරක් ගසා ඇත... ඇයට යළිත් වරක් ගොස් මුහුණ ගැසී බණින්නට තරම් ඔහුට සිත්වී තිබිණ... ඔහුට එදා උදයේ ඔහුගේ නියමිත වේලාවට අවදිවීමටද නොහැකි වූ තරම්...

සංජය නිවසින් නික්ම ගිය පසුද අරෝෂ යහනට ගියේ නැත... ඔහු මිතුරා ගෙන ආ සියල්ල යළි යළි බලමින් සියල්ල ගැන කෙටි වාර්තාවක් පිළියෙල කරගත්තේය... පළමුවම කළ යුත්තේ රෝහල්වලින් විමසීමය... අනතුරක් වූයේ නම් ඒ අවිස්සාවේල්ල හා කොළඹ අතරම පමණක් නොවිය හැකිය... කෙසේ වුවත් ඒවා ගැන සොයා ගැනීමට ඔහුට හතර දිග්භාගයේම බොහෝ අය ඇත...

විදේශයක සේවය කළද ඔහු මෙහිද පුද්ගලික රහස් පරීක්ෂක සේවාවකට සම්බන්ධවී සිටි හෙයිනි...

ඒ සියල්ලන්ගේම දුරකථන අංක හා නමද සොයා එම වාර්තාවටම ඇතුළත් කළ ඔහු නිදාගන්නට යද්දී නම හතරටද ළඟාවී තිබිණ... කෙසේ වුවත් ඔහුගේ සිතේද නිදි යහනට යද්දී රැව් දුන්නේ තේජානි නැමැත්තියගේ ගී හඬය... එහෙත් සංජය මෙන් ඔහු එයට කෝප ගත්තේ නැත... ඔහු සිතුවේ ඇය දක්ෂ ගායිකාවක බව පමණකි, ඔහු ඇයව හඳුනාගන්නට සිතුවේද ඒ දක්ෂකම ඔස්සේය.

★★★

තමාගේ ගී ගායනය ගැන අගය කළ තැනැත්තෙක් තමා ගැන සෙවීමට අදිටනක් කරගෙන තිබෙන බවද නොදනී තේජානි නම් ඒ මොහොතේ නිදමින් සිටියාය... එහෙත් එම නින්දට හේතුව වූයේ ඇය නොනිදා හඬමින් සිටි හෙයින් ගත් නිදි බෙහෙත් පෙත්තේ ආනුභාවයය.

තේජානිට එදා නිදි බෙහෙත් පෙත්තෙන් නින්ද ගිය නමුදු ඒ ඉරිදා ඇය අවදිවූයේ තරමක කෙඩෙත්තු ගතියකිනි... ඇයට එදා රැයේ නම් සිහිනයක් හෝ නොපෙණුන තරම්... දැන් නම් ඇයට මිතුරිය ගැන ඇතිවී තිබුණේ බියකි...

ඇය අවදි නොවීම ඊයේ රැයේ ඇය හා සංජය අතර වූ කථා බහ මතක් කරමින් සිටියාය... සියල්ලම නිමවී ඇත... මිතුරිය ගැන සොයන්නට දැන් තැනක් නැත... එහෙත් ඇයට තරමක් සැනසිල්ලක් දැනින... ඒ සංජය නැමැත්තාට සියල්ල කියාගත හැකිවූ නිසාවෙනි...

ආරති නැතිවී ඇත... ඇය සදාටම ඔවුන්ගෙන් ඈත්වූණාවත්දැයි ඇයට දැන් සිතෙමින් තිබිණ... සංජය නැමැත්තා ඇය ගැන නොදන්නේ නම්... ඔහුද ඇයව සොයන්නට උත්සාහ ගන්නා බව කීවේය... කෙසේ වුවත් සංජය මිතුරිය ගැන සොයන බව ඇයට තරමක් විශ්වාස කළ හැකිය... ඔහුට මේ කවරෙක්ටත් වඩා හොඳින් එය ඉටු කළ හැකිය...

ඒ මොහොතේදී ඇයට නොවැටහුණ නමුදු සංජය නැමැත්තා සැබැවින්ම මිතුරියට කැමැත්තේදැයි ඇය සිතන්නට ගත්තේ දැන්ය... එයට ආදරය යැයි නමක් දැමිය හැකිද නොහැකිදැයි ඇයට සිතිය



නොහැකිය... එහෙත් ඔහු කී සමහරක් වැකි ඇයගේ සිතේ පතුළේම මෙන් ලියැවී තිබෙන බව ඇයට දැන් සිතිණ...

...ආරූ කියන්නේ මට විශේෂයි... ඒකත් ඔයා දැනගත්තනං හොඳයි... අත පිහදාගත්තු රෙදි කෑල්ලක් වගේ එයාව පැත්තකට දාන්න නං මං කොහෙත්ම හිතාගෙන නෑ...

දෙවන වර ඔහු යමක් කීවා නම් කීවේ කෝපයෙන් වුවද... එය එයිටද වඩා හොඳින් ඇයගේ සිතේ තැන්පත්ව තිබෙන බව ඇයට සිතිණ...

...ආරතී මගේ ළඟ හිටියත් මං දැන් තමුසෙට කියන්නෙ නෑ... ඒ කෙල්ල අයිති මට...

එහි තිබුණේ බොහෝ ස්ථිර ස්වරයක් බව ඇයට දැන් ඒ සංවාදය යළිත් සිහි කරද්දීම සිතිණ...

කෙසේ වුවත් ආරතී අදත් නැත... ඇයගේ නෙතට ආ කඳුළ නෙත් දෙකෙන් මුහුණේ දෙපැත්තෙන් වැගිරී කොට්ටය තෙත් කරන්නට විය...

ශාන්තා ඇතුල්වූයේ ඒ මොහොතේදීය...

"මිස්... ඇයි මිස් මේ...?" ඇය බිය වූයේ තේජානිට කිසියම් අසනීපයක් හෝ නැතහොත්... ඇයගේ සියොළඟම සිහිතල විය... ඊයේ තැනැත්තා තේජානි මිස්ට කිසියම් බලපෑමක් කළා වත්ද...?

තේජානි නැගිට යහනත වාඩිවී දෙනෙත් පිස දැමුවාය...

"අදත් රතී මිස් නෑ..." ඇය කීවේ කඩින් කඩය...

"මිස් දැන් ඉතින් මිස් කල්පනාවෙන් ඉන්න... කොයි වෙලාවක හරි කාගෙන් හරි ආරංචියක් එන්න ඉඩ තියෙනවා... දැන් අර ජයරත්න කියන මහත්තයාට වැඩේ බාර දීලාලු නේ... තව දවස් දෙකක් බලලා සමහරවිට පොලිසියට කියාවි..."

"මට හිතෙනවා ශාන්තා ගිහිල්ලා පොලිසියට කියන්න..."

"එපා මිස්... ඒක මිස්ට කරදරයක් වේවි..." ශාන්තා කීවාය... ඇයද ඊයේ සියල්ලම කථා බහ කරද්දී ඔවුන් අසළටම වී සියල්ල අසා සිටියාය... මෙය සමහරවිට ආරතීට පමණක් නොව අනික් අයටද කිසියම් අනතුරු ඇඟවීමක් විය හැකි යැයි යන මතයද ශෙනාලිගෙන් පිටවිණ...

මෙය මෙලෙස කළේ අයෝමා හා තරගයකට බැස සිටින කිසියම් පිරිසක්දැයි යන මතයක්ද එදින කවරෙක්ගෙන් හෝ කියැවුණු බැවිනි... ආරතී මෙම හෝටලයේ දක්ෂතම මෙන්ම රූමත්ම ගී ගයන්නිය බවට හා අතරත් රාවයක් තිබිණ... ඉන්පසු සිටින්නේ තේජානිය... තේජානිට වඩා ආරතී ඇයගේ රූමත්බව නිසා බොහෝ දෙනාගේ සිත් කුල්මත් කෙරුවාය...

තේජානි පොලිසියට ගියහොත් ඇයටද බලපෑම් කරන්නට මේ අනුව ආරතී සඟවා ගෙන සිටින අයට හැකිය...

"දැන් මිස්ට තියෙන්නේ ටිකක් රෙස්ට් කරන්න... අද මිස් යන්නෙ නෑ නේ..."

"මං යනවා ශාන්තා... මට මෙහෙම ඉන්න ගියාම රතීව මතක්වෙනවා වැඩියි... අරහෙම උනාම ටිකක් ඒක හිතින් යනවා..."

නැතැයි ශාන්තාට කිව නොහැකිය... ඇය හිස සැලුවාය...

"මං එහෙනං මිස්ට තේ එකක් අරගෙන එන්නං... මිස් දැන් මූණ කට ටිකක් හෝදගෙන එන්න... එහෙම උනාම මිස්ට සනීපයක් දැනේවි..." ශාන්තා කීවේ සැබැවින්ම දුකෙනි... මේ තරුණියගේ තිබෙන්නේ බොහෝ දුර්ලභ දක්ෂකම් මෙන්ම දුර්ලභ ගතිගුණය... මෙතෙක්ම එලෙස කවරෙක්වත් නැති වුවායැයි කියා මෙහි දී නම හඬන්නට කෙනෙක් සිටියේම නැත... බොහෝ විට බොහෝ දෙනා ඔවුනොවුන්ගේ වැඩක් පලක් බලාගත්තාම පමණකි... එය වෙනස් වුණේ තේජානි මෙහි පැමිණියායින් පසුවය... බොහෝ අය එක්කරලන්නට මැය සමත්වූවාය... කරදර අමතක කර විහිළුවෙන් තහළුවෙන් දිවි ගෙවන්නට ඇයගෙන් ලද සහයෝගය අති මහත්ය...

ඇය හා ආරතී මිස් අතර ඇත්තේද සොහොයුරු පෙමක් වැන්නක් විය හැකියැයි ශාන්තා බොහෝ වර සිතුවාය...

බොහෝ දේ මේ සතියට වෙනස් වී ඇත... තේජානි පමණක් නොව අනික් තරුණියෝද දැන් දැන් මෙම ආරතී මිස්ගේ අතුරුදන් වීම නිසා බියවී ඇත... පිරිමි නේවාසිකාගාරයෙන් මෙලෙස ආරක්ෂාවක් සපයන්නට යැයි කිසි දිනෙක මැඩම් කියා නැත...

අද හවස් වෙද්දී මෙම හෝටලේ ආරක්ෂක සේවාවෙන් ඉවත්වී ගිය පැරණි ආරක්ෂක නිළදරුවා යළිත් කැඳවන්නට පමණක් නොව ඔහුට මෙහි නවාතැන් ගෙන රැකියාව බාර ගන්නටද දන්වා ඇත...



මුළු සටනේ නේවාසිකාගාර දෙකට ආරක්ෂකයින් දමන්නටද පියවරක් ගෙන ඇත...

සේකර නැමැත්තාට මින්පසු අයත් වන්නේ හෝටල් සංකීර්ණයේ කොටසට අයත් නේවාසිකාගාර පමණකි...

සිතාගත නොහැකිය...

ශාන්තා තේ කෝප්පය ගෙන එද්දී තේජානි වෙනත් ඇඳුමක් ඇඟලාගෙන පුහුණුවීම් වලට යන්නට සූදානම්ව සිටියාය...

"මිස්ට අද නිවාඩුවක් ගන්න කියලා මෙනාලි මිස් නං කිව්වෙ..." ඇය කීවේ තේ කෝප්පය තේජානි අතට දෙමිනි...

"මට බෑ ශාන්තා මෙහෙට වෙලා තනියම ඉන්න... අනික මට මේවා අමතක වෙන්න නං වැඩ කරන්න ඕන... ඊයේ මං නිදාගත්තේ කොහොමද කියලා වත් මට මතක නෑ..."

"මිස්ට බෙහෙත් දීලා නිදි කෙරෙව්වෙ..."

විය හැකිය... තේජානි සිතුවාය... නැතහොත් ඇයට මෙවන් සනීපයක් දැනෙන්නට නොතිබිණ.

"ඒක නේ... දිගටම නිදි පෙති ගත්තත් බැරි වෙයි නේ ශාන්තා..."

ආරතී මිස් ගැන තේජානි හා කථා නොකරන්නට ශාන්තා සිතුවාය... නැතහොත් ඇයට නම් ඊයේ සිදුවූ සිද්ධිය හරි විදියටම දැන ගැනීමේ කුතුහලයක් නම් තිබිණ... තේජානි මිස් පසුව නම් ඒ ගැන විස්තරයක් සහිතව තමාටද කියනු ඇත... මේ මොහොතේ ඇයගේ පුහුණුවීම් වලට යෑම නවතාලන්නට ශාන්තාට නොහැකිය... එය තාගේත් රැකියාව වන හෙයිනි.

තේජානි එනු දකිද්දී මයන්තට සැනසුමක් දැණින... ඇය මෙලෙස කෙළින් සිටින්නී නම... ආරතී කෙසේ හෝ සොයා ගත හැකිය... ගොළුබෙලි ගමනින් ඇදුණු යමක් එක්වරම සීඝ්‍රගාමී තත්ත්වයකට පත්වී ඇත්තේ තේජානි බිය සැක නැතිව සංජය නැමැත්තා හා කථා කළ නිසා බව නම් සියල්ලෝම පිළිගනිමින් සිටියහ...

එලෙස නැත්තේ නම් ආරතී ගැන පමණක් නොව මෙහි සිටින කිසිවෙක් ගැන වුවද මෙතරම් ආරක්ෂාවක් සැපයීමට අයිතිකාර

මණ්ඩලය කෙදිනකවත් නොසිතනු ඇත... සියල්ලටමත් වඩා සේකර නැමැත්තා ගැන කිසිවෙකුගේවත් දුන් පැහැදීමක් නොතිබිණ... පරණ නැනැත්තා නේවාසිකාගාරවල ආරක්ෂක නිළදරුවන් බාරව එන බව දන්වා තිබීම සියල්ලන්ගේම සිත්වලට සැනසීමක් ලඟා කර දී තිබිණ...

"ජානි... කොහොමද දූන්..." පුහුණුවීම කරමින් සිටි අයගේ හරි වැරදි බලමින් සිටි ෂෙහාලි තේජානි දකිද්දී මුව පුරා සිනහසී ඇසුවාය... මෙ තරුණිය බොහෝ බිය නැති තරුණියක බව ඇය දන්නට කවුරුත් බිය වෙද්දී ඇය තනිවම ඔහුට මුහුණ දුන්නාය... පසක් කොට ගත්තේ ඊයේ රැයේය... සංජය නැමැත්තාට මුහුණ ඔහු අයෝමා හා කථා කළේ ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙසිනි... හෝටලයෙන් ආරතී ගැන සෙවීමට යන වියදමින් අඩක් ඔහු දරීමට සූදානම් වූ අතර, ජයරත්නට එය බාරදීම ගැනද සතුටුදායක පිළිතුරක් දී තිබිණ...

ඔහු සම්පූර්ණයෙන්ම මුදලක් යොදවා ඇය ගැන සොයවන්නට වෙනත් යමෙකුට පවරනලද බව නම් මෙතෙක්ම කිසිවෙක් දැන සිටියේ නැත...

ඔහු ඔහුගේ සැක හා සියලු විස්තර ජයරත්නට සපයන බවද දන්වා තිබිණ... තේජානි නැමැත්තිය ගැන ඔහු කථා නොකළ නමුදු, සමහරවිට ආරතී ගේ අතුරුදන් වීම ආකාරයෙන්ම තවත් තරුණියන් එයින් අතුරුදන් වන්නට ගත හොත් ඒවායින් මෙම ස්ථානයට ඇතිවෙන නරක නාමය ගැන සලකා එතනටම කිසියම් ආරක්ෂක නිළදරුවෙක් පත්කරන්නටද ඔහු කීවේය... එලෙස ඔහු ඒවා කියන්නට හේතු වූ කරුණු ගැනද ඔහු අයෝමාට විස්තර කළේය... ඒවා අසන්නට ෂෙහාලිට නම් සිහියක් තිබුණේම නැත... ඇය තරමක් දේවල් සිහියට ගත්තද ඇයගේ සිතේ තිබුණේ හඬමින් දොඩමින් මිතුරියන්ට වාරුවී වාහනයට නැගී තේජානි ගැනය...

කෙසේ වුවත් අද හවස සිට මෙහි ආරක්ෂක පද්ධතියක් ක්‍රියාත්මක වෙනු ඇත... ඇයගේ සිතට තද සැනසිල්ලක් ඇවිත් තිබුණේ ඇයද ඉන්නේ එම නේවාසිකාගාරයේම වෙනත් කොටසක හෙයිනි...

"නින්දක් ගියානේ මිස්... ඉතින් දූන් හොඳයි..." තරමක් සිනහසී කියමින්ම තේජානි ඒ දෙසට ආවාය... මිතුරියෝ ගී ගයමින් රඟමින් සිටියද තේජානි හා සිනහසෙන්නටත් අත් ඔසවා ආචාර කරන්නටත් සමත් වූහ...



"අද ඔයා නිවාඩු ගන්න ජානි..."

"නෑ මිස්... අදත් මං එන්නං... ඉස්සරහට සමහරවිට අපිට ටිකක් නිවාඩු ගන්න උනොත්..." ඇය කීවේ සමහරවිට ආරතීට දරුවෙක් කුස පිළිසිඳ ගෙන ඇත්තේ නම් ටික දිනක් ඇය හා ගැවසීමට ඇයගේ සිතේ අදහසක් තිබුණ බැවිනි...

"එහෙනං... මොකක්ද නම්බර් එක කියලා බලන්න... අළුත් එකක් ගන්නවද නැත්තං..."

"පරණ එකක්ම ගමු මිස්... මට අළුත් ඒවා නං දන් පාඩං කරන්න බෑ..." තේජානි කීවාය... ඇයගේ සිතට තවමත් හරි නැත...

ෂෙහාලි එයට එපා කීවේ නැත...

තේජානි ගී තැටි තිබෙන තැනට ගියාය... එක් එක් තැටිය පෙරළුවාය... වෙනදා ඇය ඉංග්‍රීසි ගීත හෝ වෙනයම් ගීතයක් තෝරද්දී ඇය ළඟටම වී ඇයගේ කෝපය අවුස්සන්නට සැරසෙන්නී ආරතීය... තමාට තරමක් තදින් තරහ යන බව දන්නා නිසා ඇය එලෙස කරන්නේ ඇයද ගීතයක් තෝරමිනි... දෙදෙනා ගැයිය යුතු වන්නේ එක්විටමය...

එය මතක් වෙද්දී තේජානිගේ දෑසින් යළිත් කඳුළු වැටිණ... ඇය ඒවා සෙමින් පිසලා ගත්තද, කිහිප දෙනෙක්ම... මයන්ත ඇතුළු කිහිප දෙනෙක්ම එය දුටු බව ඇය නුදුටුවාය...

මයන්තට දුකක් දැණින... ඇයට මිතුරිය මතක් වන්නට ඇත්තේ කිමදැයි සිතෙද්දීය... සිනහසෙමින් කොඳුරමින් ඉදිහිට තේජානි නම් ආරතීට රවමින්, ගීත තෝරාගෙන නිමවූ පසු දෙදෙනම එන්නේ මයන්ත වෙතය... ආරතීට ලෙහෙසියෙන් තේන්ති යන්නේ නැත... ලෙහෙසියෙන් නොව කොහෙත්ම තේන්ති යන්නේ නැත... තේජානිට යන කෝපය මුහුදේ රැල්ලක් මෙනි... මේ එන්නේය... මේ යන්නේය... එක තැනක නැවතීමක් ඇත්තේම නැත...

ආරතීට වඩා තේජානි අනෙක් අය සමග කුළුපග වූවාය... කුළුපග වූවා පමණක් නොව තනියම මෙන් සිටි ආරතීද ඒ දෙසට ඇද ගත්තාය... තමා පැමිණියේ තේජානිට වඩා මාස හයකට පමණ පෙරය... එහෙත් ඔහු ආරතී හා මිතුරු වූණේ තේජානිගේ පැමිණීමත් සමගය... ආරතී බොහෝ හොඳ මිතුරියක බව පෙන්නුම් කළේ තේජානි විසිනි... නැතහොත් ඇය එහි හැඳින්වෙමින් තිබුණේ මහ ආඩම්බරකාර

අහංකාර තැනැත්තියක ලෙසිනි... ඒ ඇයගේ රූමත් කම හා දක්ෂකම නිසාත් අන් අයට වඩා ඇයගේ ඉංග්‍රීසි භාෂාවේ දස්කම නිසාත් බව සියල්ලෝම සිතාගෙන සිටියද... නැත... ඒ සියල්ල තේජානි ආපසු වෙනස් විය... ආරතී හොඳම හොඳ මිතුරියක බව ඔප්පු කළා පමණක් නොව පියාගේ ත්‍රිරෝද රථයේ ණය මුදලක් එක්වෙද්දී එය එක්වරම ගෙවන්නට ඔහු අතට මුදල්ද දුන්නාය... එහි දූන් තිබෙන්නේ කුඩා ප්‍රමාණයක් වුවද ඒ මොහොතේ ඔහුට එය සැබැවින්ම ආශිර්වාදයක් මෙන් වූයේ පියා වත්තේ නිවාසයේ වහල සාදා ගන්නටද මුදලක් යට කර තිබූ බැවිනි...

ආරතී ගැන සොයා ගැනීමට දූන් අයෝමා මැඩමද ඉදිරිපත් වී තිබෙන බව අද උදයේම පැවසුවේ ෂෙනාලිය... එය නම් සතුටුදායකය... ඉහළින් එය ගැන කටයුතු කරන්නේ නම් උපරිමයෙන් ඔවුන්ටද සහයෝගයක් දිය හැකිය...

එදින වෙනදා මෙන් නොව තේජානි තේ පානයට පෙර එතනට ඇවිත් සිටි හෙයින් ඇයට ගීතය තෝරා ගෙන මදක් කල් ගෙවන්නටද සිදුවී තිබිණ...

ඇය එහෙයින්ම පසෙක වාඩිවී අනෙක් මිතුරියන්ගේ රංගනයන් බලාගෙන සිටියාය... මෙතැන ආරතී සිටියේ නම් කෙතරම් සතුටක් ලැබෙන්නට තිබිණද...? ඇයගේ සිත ඇය සාදා ගන්නට දඟලුවේ කඳුළු සලමින් ඇයට ගීතය ගැයිය නොහැකි බව සිතෙද්දීය...

හදවතේ හිස් තැනක් තිබුණද වෙනදා මෙන්ම ගීතයට පණ දෙන්නට ඇය සමත්වූවාය... එය නම් ඇයගේ අති දක්ෂකමක් බව සියල්ලටම නොසිතාම නොහැකිය... බොහෝ අය කුඩා අසනීපයකට වුවද බිය වෙති... කුමක් හෝ කරදරයක් නම් සියල්ල නවතා දමා පැත්තකට වී සුසුම් හෙළති... ඒ අතින් බලද්දී තේජානි නම් බොහෝ ඉදිරියෙන් සිටිනා කෙල්ලක බව මයන්ත නම් නිගමනය කරගෙන සිටියේය...

"ජානි ගියේ නැද්ද නංගිගෙ රිහේසල්ස් බලන්න..." අසමින්ම ඇයටත් රෝල්ස් පිඟාන දිගු කරමින්ම මයන්ත ඇය වාඩිවී සිටි කුඩා කණ්ඩියේ පැත්තකින් වාඩිවුණේය...

"නෑ මයන්ත.. මං කෝල් කරලා කිව්වා මට එන්න වෙන්නේ නෑ කියලා... ගියාම ආන්ටිලා රතී ගැන අහන්න ගන්නවා... මට



තියාගන්න දෙයක් නැති වෙයි... මේ වෙලාවෙ මට කරන්න පුළුවන් එකම දේ මට වැඩ වැඩියි කියලා නංගාගේ හිත හදන එක විතරයි..."

මයන්ත සුසුමක් හෙළුවේය... ඇය කියන්නේද සත්‍යයකි... බොතේජු යුවළ බොහෝ විට ආරතී ගැන ආදරයෙන් කථා බහ කරන තැනැත්තවුන් දෙදෙනෙකි...

"ඊයේ ඇත්තටම මොනවද මැන් කිව්වේ...?" මයන්ත ඇසුවේ සෙමිනි... ඒවා අනික් අයට නෑසෙන්නට කිව යුතුයැයි ඔහු නොසිතුවේ වුවද, ඔහු හා ඇය අතර වූ කිසියම් සට්ටනයක් වී නම් එය ඇයට කිව හැක්කේ තමාටම පමණක් බව ඔහු සිතූ හෙයිනි.

"මොකවත් නෑ මයන්ත... ඒත් මැන් කිව්ව දෙක තුනක් මගේ හිතේ තදට වැදුණා..."

"කියනං..." මයන්ත කීවේය... උඹේ හිතත් දූන්... යැයි මේ මොහොතේ නම් විහිළුවක් කරන්නට නොහැකි බව මයන්ත සිතාගත්තේය...

තේජානි එවර ඊයේ ඒ හෝරාවේදී ඇයත් ඔහුත් අතරවූ සියල්ලම පැවසුවාය...

"මට ඇත්තටම වැදුණේ ආරූ අයිති මට කියලා කියනකොට..."

"ඒකත් ඇත්ත නේ ජානි... ගොඩක් වෙලාවට මැන් හිතාගෙන ඇත්තේ රතියා එයාගේ වස්තුවක් කියලා වෙන්න ඇති..."

"එහෙම නං එයා හොයවන්නම එපැයි..."

"අනේ මන්දා ජානියෝ... මේක නං මටත් හිතාගන්න බැරි දෙයක්... මේ යක්ෂ කෙල්ල කොහෙන් හරි කාට හරි කෝල් එකක් දෙන්න එපැයි..."

"ඒක හිතෙන කොට මට නං හිතෙන්නෙම රතියා කවුරු හරි කිඩ් නැප් කරලා කියලා..."

"එහෙනං ඉතින් මේ වෙද්දී අපට පණිවිඩේ එන්න ඕන... නැත්නං අරූට එන්න ඕන..."

"මට නං හිතන්න බෑ කොහොමටත්..." තේජානි කෙඳිරුවාය... "ඒත් මං කැමැතියි එහෙම එයා කිඩ් නැප් කරලා කියලා හිතන්න... එතකොට රතියා එයි නේ කවදා හරි..."

තමාටද දූන් සිතාගත නොහැක්කේ එය බව මයන්න කියන්නට නොගියේය... ආරතී බොහෝ රූමත් යුවතියකි...

ඇයව පන්නාගත් කවරෙක් හෝ ඇය ඉදිරියේ තබාගෙන සිල් නොගන්නා බව ඔහු දන්නේය... යමක් වැරදී ඇය...

ඔහුගේ සිරුරම හිරිගඩු පිපුණද එය කියන්නට නොගියේය...

★★★

අරෝෂ ඒ අතර වැඩට බැස සිටියේය... හවස්වෙද්දීම ඔහුට ආරංචි ලැබෙන්නට ගත්තේ ආරතී නැමැත්තියක් රෝහල්වල නැති බවය... ඇය වෙනත් නමකින් රෝහලකට ඇතුල් කළාදැයි සිතන්නටත් නොහැකිය... කෙසේ වුවත් ඔහු අනතුරු ගැනද සොයන්නට උත්සාහ කළේය... එවන් රූමතියක් අනතුරකට ලක්වූවා නම් වටපිටාවට වුවද හොඳින්ම මතකයේ තිබිය යුතුය...

එයට නව දවසක් ගත වෙන බව ඒවා සොයන්නට බාර දුන් තැනැත්තන් කියා සිටියහ...

අරෝෂ තත්පරයක්වත් අපතේ යවන්නට සිතන තැනැත්තෙක් නොවේ... උදයේ ඔහුට තවත් වැඩක් තිබිණ... ඒවා නිම කළ ඔහු හවස හෝටලයට යන්නට සිතුවේය...

ඔහු ගියේ රංගනයන් ආරම්භ කිරීමට පෙරය... ඔහු හෝටලයේ ආදි කාලයක සේවය කළ ඔහු හඳුනන සේවකයෙක් ගැනද සොයා ගත්තේය... අරෝෂ හෝටලයට ඇතුල් වෙන්නට සිතුවේ ඒ සේවකයාගේ නමේ පිහිටෙනි... නැතහොත් එහි ඇතුළත විස්තර දැන ගත නොහැකි වනු ඇත...

සේවකයා දැන් සේවයේ නොමැති බව කීවද ඔහු සේවකයා දැන් ඉන්නා තැන ගැන ආදිය විස්තර ඇසුවේය... ඒ විස්තර වල ආනුභාවයෙන් දැන් එහි සේවය කරන පැරණි සේවකයාගේ ඥාති පුතෙක් ගැන දැනගන්නට ලැබුණේය... ඒ තැනැත්තා එතනට එවන බව කීවෙ එහි සිටි තවත් සේවකයෙකි... ඔහු එන තෙක් හෝටලයේ විශේෂාංගද බලමින් කුමක් හෝ කන්න බොන්නට යන බව එතන සිටින තැනැත්තාට දැන්වූ අරෝෂ... ඉන්පසු රංගන කොටසට ගොස් වාඩිවුණේය...



අර කුඩා තිරයේ දුටුවාට වඩා හාත්පසින්ම වෙනස් අන්දමින් දකිද්දී වුවද, කහපාට ඇඳුමක් ඇඳ ගී ගයන්නිය තේජානි නැමැත්තිය බව ඔහු වටහාගත්තේය... ඇයගේ නෙත් පමණක් පෙනෙන්නට තබා එදිනද ඇයගේ දැස් හරහා ඇය පටියක් බැඳගෙන සිටියාය. ඇය පැහැපත් තරුණියක බව පමණක් ඔහු සිතුවේය... රත්රන් කුඩු වලින් වසවත් නොවූ කොටසේ ඇයගේ සම පැහැපත්ය... එහෙත් වරින් වර වෙනස් වෙන වර්ණවත් විදුලි පහන් එළියට ඇයගේ වර්ණය සෙවීම නම් බොහෝ අපහසු කාර්යයක් විය... ඒ වර්ණය වුවද ඔහු දුටුවේ වරක් දෙකක් පියවි තත්ත්වයේ විදුලි පහන් එළිද අතරින් පතර දැල්වුණු බැවිනි...

කීවාක් මෙන් ඇය නම් අති දක්ෂ ගායිකාවකි...

බොහෝ අයගේ දෙසවන් ඇයගේ ගායනයන්ට යොමුවූ බව පමණක් නොව එයට එක්වූ රංගන දායකත්වයද උසස් මට්ටමක තිබෙන බව ඔහු තීරණය කරගත්තේය... ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් වුවද ශිල්පත්වයක් පෙන්නුම් කර තිබිණ...

ගීතය මගක් යද්දී පැරණි සේවකයාගේ ඥාති පුතා ඔහු වෙත ආවේය...

අරෝෂ ඒ පැරණි සේවකයා දැන් ඉන්නා තැන විස්තර හා තවත් දේවල් ගැන බොහෝ දේ ඇසුවේ පිළිසඳරකට එක්වීමට පෙරය... ඒ අතරම ඔහු ගීතයේ රසයද වින්දනය කළේය... ගීගයන්නිය ගැනද සිතුවේය...

ඉන්පසු ඔහු සෙමින් සෙමින් සේවකයාගෙන් මේ කණ්ඩායම ගැන විමසුවේය... ඔහු එම ගයන්නියගේ ගීත ගැන බොහෝ පාරට්ටු කළේය... සේවකයා ඒ ගැන කෙසේවත් සැක හිතුවේ නැත... මෙතනට එන කවුරුත් තේජානි මිස්ගේත් ආරතී මිස්ගේත් කටහඬවල් ගැන කථා කරන බැවිනි...

නවය පසුවෙද්දී තේජානිගේ ගායනයන් නිමවෙන බව අරෝෂ දැනගත්තේ එලෙසය... ඇය ඉන්පසු වේදිකාවට එන්නේ නැත... ඒ සියල්ලම අසන අතරම ඔහුගේ සවණ දැන් යොමුවී තිබුණේ ඇය ගැයූ හිසියම් වෙනත් භාෂාවක ගීතයක් ගැනය...

ඇයව මෙහිදී මුණ ගැසෙන්නට හැකිදැයි ඔහු මෙම සේවකයාගෙන් දැනගත යුතුය ඔහුට සිතුණේ ඒ ගීතය ගැයෙන

තමාටද දූන් සිතාගත නොහැක්කේ එය බව මයන්ත කියන්නට නොගියේය... ආරතී බොහෝ රූමත් යුවතියකි...

ඇයව පන්නාගත් කවරෙක් හෝ ඇය ඉදිරියේ තබාගෙන සිල් නොගන්නා බව ඔහු දන්නේය... යමක් වැරදී ඇය...

ඔහුගේ සිරුරම හිරිගඩු පිපුණද එය කියන්නට නොගියේය...

★★★

අරෝෂ ඒ අතර වැඩට බැස සිටියේය... හවස්වෙද්දීම ඔහුට ආරංචි ලැබෙන්නට ගත්තේ ආරතී නැමැත්තියක් රෝහල්වල නැති බවය... ඇය වෙනත් නමකින් රෝහලකට ඇතුල් කළාදැයි සිතන්නටත් නොහැකිය... කෙසේ වුවත් ඔහු අනතුරු ගැනද සොයන්නට උත්සාහ කළේය... එවන් රූමතියක් අනතුරකට ලක්වූවා නම් වටපිටාවට වුවද හොඳින්ම මතකයේ තිබිය යුතුය...

එයට තව දවසක් ගත වෙන බව ඒවා සොයන්නට භාර දුන් තැනැත්තන් කියා සිටියහ...

අරෝෂ තත්පරයක්වත් අපතේ යවන්නට සිතන තැනැත්තෙක් නොවේ... උදයේ ඔහුට තවත් වැඩක් තිබිණ... ඒවා නිම කළ ඔහු හවස හෝටලයට යන්නට සිතුවේය...

ඔහු ගියේ රංගනයන් ආරම්භ කිරීමට පෙරය... ඔහු හෝටලයේ ආදි කාලයක සේවය කළ ඔහු හඳුනන සේවකයෙක් ගැනද සොයා ගත්තේය... අරෝෂ හෝටලයට ඇතුල් වෙන්නට සිතුවේ ඒ සේවකයාගේ නමේ පිහිටෙනි... නැතහොත් එහි ඇතුළත විස්තර දැන ගත නොහැකි වනු ඇත...

සේවකයා දැන් සේවයේ නොමැති බව කීවද ඔහු සේවකයා දැන් ඉන්නා තැන ගැන ආදිය විස්තර ඇසුවේය... ඒ විස්තර වල ආනුභාවයෙන් දැන් එහි සේවය කරන පැරණි සේවකයාගේ ඥාති පුතෙක් ගැන දැනගන්නට ලැබුණේය... ඒ තැනැත්තා එතනට එවන බව කීවේ එහි සිටි තවත් සේවකයෙකි... ඔහු එන තෙක් හෝටලයේ විශේෂාංගද බලමින් කුමක් හෝ කන්න බොන්නට යන බව එතන සිටින තැනැත්තාට දැන්වූ අරෝෂ... ඉන්පසු රංගන කොටසට ගොස් වාඩිවුණේය...





අර කුඩා තිරයේ දුටුවාට වඩා හාත්පසින්ම වෙනස් අන්දමින් දකිද්දී වුවද, කහපාට ඇඳුමක් ඇඳ ගී ගයන්නිය තේජානි නැමැත්තිය බව ඔහු වටහාගත්තේය... ඇයගේ නෙත් පමණක් පෙනෙන්නට තබා එදිනද ඇයගේ දැස් හරහා ඇය පටියක් බැඳගෙන සිටියාය. ඇය පැහැපත් තරුණියක බව පමණක් ඔහු සිතුවේය... රන්රන් කුඩු වලින් එළවත් නොවූ කොටසේ ඇයගේ සම පැහැපත්ය... එහෙත් වරින් වර වෙනස් වෙන වර්ණවත් විදුලි පහන් එළියට ඇයගේ වර්ණය සෙවීම නම් බොහෝ අපහසු කාර්යයක් විය... ඒ වර්ණය වුවද ඔහු දුටුවේ වරක් දෙකක් පියවි තත්ත්වයේ විදුලි පහන් එළිද අතරින් පතර දල්වුණු බැවිනි...

කීවාක් මෙන් ඇය නම් අති දක්ෂ ගායිකාවකි...

බොහෝ අයගේ දෙසවන් ඇයගේ ගායනයන්ට යොමුවූ බව පමණක් නොව එයට එක්වූ රංගන දායකත්වයද උසස් මට්ටමක තිබෙන බව ඔහු තීරණය කරගත්තේය... ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් වුවද ශ්‍රේෂ්ඨත්වයක් පෙන්නුම් කර තිබිණ...

ගීතය මගක් යද්දී පැරණි සේවකයාගේ ඥාති පුතා ඔහු වෙත ආවේය...

අරෝෂ ඒ පැරණි සේවකයා දැන් ඉන්නා තැන විස්තර හා තවත් දේවල් ගැන බොහෝ දේ ඇසුවේ පිළිසඳරකට එක්වීමට පෙරය... ඒ අතරම ඔහු ගීතයේ රසයද වින්දනය කළේය... ගීගයන්නිය ගැනද සිතුවේය...

ඉන්පසු ඔහු සෙමින් සෙමින් සේවකයාගෙන් මේ කණ්ඩායම ගැන විමසුවේය... ඔහු එම ගයන්නියගේ ගීත ගැන බොහෝ පාරට්ටු කළේය... සේවකයා ඒ ගැන කෙසේවත් සැක හිතුවේ නැත... මෙතනට එන කවුරුත් තේජානි මිස්ගේත් ආරතී මිස්ගේත් කටහඬවල් ගැන කථා කරන බැවිනි...

නවය පසුවෙද්දී තේජානිගේ ගායනයන් නිමවෙන බව අරෝෂ දැනගත්තේ එලෙසය... ඇය ඉන්පසු වේදිකාවට එන්නේ නැත... ඒ සියල්ලම අසන අතරම ඔහුගේ සවණ දැන් යොමුවී තිබුණේ ඇය ගැයූ කිසියම් වෙනත් භාෂාවක ගීතයක් ගැනය...

ඇයව මෙහිදී මුණ ගැසෙන්නට හැකිදැයි ඔහු මෙම සේවකයාගෙන් දැනගත යුතුය ඔහුට සිතුණේ ඒ ගීතය ගැයෙන

අකරමය... වෙනත් අන්දමකින් මුණ ගැසෙන්නට සිතනවාට වඩා එය පහසුය... මෙලෙස මේ කෙල්ලගේ රුවක් වත් සිතාගත නොහැකිය... ඔහු සිතාගෙන සිටියේ කෙල්ල දැක ගත්තාට පසු ඇය යන එන තැන් ගැන සෙවීමටය... එහෙත් මේ පාට කුඩු තවරා දැස්ද බැඳ සිටින ඇයගේ රුව ගැන කෙසේවත් හැඟීමක් ගන්නට ඔහුට නොහැකිවීම නිසාම දැන් මේ තමා වෙත ඇති යතුර පාවිච්චි කළ යුතු බව ඔහු සිතාගත්තේය... සමහරවිට එය නියම දොර හැර දීමටත් පිළිවන...

"මට පුළුවන්ද මේ ගර්ල්ව ටිකක් කන්ටැක්ට් කරගන්න..." ඔහු එම සේවකයාගෙන් ඇසුවේ එහෙයිනි...

සේවකයා තරමක් විමසිලිමත් වුණේය... ආරතී නැමැත්තිය මුණ ගැසුණු සංජය නිසා දැන් ආරතී නැතිව් ඇත... ඔහුට බියක්ද දැණින. එහෙත් මේ තැනැත්තා මේ ගීත හොඳින් ශ්‍රවණයට ගත් බවද ඔහු ඒ වෙද්දී දැනගනිමින් සිටියේය... මාමාගේ විස්තර අසන අතරම ඔහු වේදිකාවේ රඟන්නියන් දෙසද දෑස් යොමු කරමින් එහි රසය වින්ද බව ඔහුට පෙණුන හෙයිනි... ඒ ගයන්නිය අගයමින් තමාට කථා කළ බවද සත්‍යයකි... එහෙත් එක්වරම එලෙස එම කණ්ඩායමේ ගායිකාවක මුණ ගැස්වීමට නම් නොහැකි බව සේවකයා දන්නේය... ඔහු මඳක් පසුබැවේ එහෙයිනි.

"බය වෙන්න එපා... මං කල්පනා කළේ මේ සින්දුවෙ භාෂාව ගැන... මට ඒකයි වැඩියෙම ඒ ගැනු ළමයා එක්ක කථා කරන්න ඕන..." අරෝෂ කීවේය... "ඒ ගර්ල්ට ඇත්තටම හොඳට සින්දු කියන්න පුළුවන් කෙනෙක් නේ..."

"ඔව් සර්... මෙහෙ දෙන්නෙක් හිටියා... මේ මිසුයි... තවත් ආරතී කියලා මිස් කෙනෙකුයි..."

"ආරතී... නම නිකං අහලා පුරුදු වගේ... එතකොට අද එයා මෙතන සින්දු කිව්වෙ නැද්ද...?"

"නෑ සර්... දැන් ටික දවසක ඉඳලා ආරතී මිස් නෑ..."

"සනීප නැති වෙලාද...?" අරෝෂ නිකමට ඇසුවේය... දන්නා බව කියන්නට නම් අරෝෂ කවදාවත් නොසිතන්නේය.

සේවකයා එයට කිසිවක්ම කියන්නට නොසිතුවේය...

"මං සර්ට මේකේ ඕගන් ගහන එක්කෙනා අඳුන්නලා දෙන්නං... එයාත් එක්ක සෙට් වෙලා අර ගර්ල්ව කථා කරගන්නැකි..."



සේවකයා එය අමතක කරවමින් මෙන් කීවේ වසන්ත බොහෝ විට මෙලෙස එන අය හඳුනාගන්නට බොහෝ කැමැත්තක් දක්වන බව දන්නා හෙයිනි...

"කමක් නෑ... ඒ ගර්ල් ගෙන් මට පොඩ්ඩක් ඒ සින්දුව ගැනයි දැනගන්න ඕන..." අරෝෂ කීවේය... "ඒ ගර්ල්ට කාඩ් එකක් යවන්න බැරිද...?"

"බෑ සර්... ඒවා ගන්නෙ නෑ... ඒ කට්ටිය වෙනම කට්ටියක්..."

"ෂා... ඇත්තටම එහෙම කාඩ් එකක් යවන්න තිබුණනං තමයි හොඳ... කමක් නෑ... මට එහෙනං අර මේ ඕගන් මැන්ව අඳුන්නලා දෙන්නකෝ... මං ඉස්සර නං ගොඩක් මෙහෙ ඇවිල්ලා තියෙනවා... මං හොයපු කාරියවසම් එක්ක... ඒ කාලෙත් මට මතකයි ලස්සණට සින්දු කියන්න පුළුවන් ගර්ල්ස්ලා දෙතුන් දෙනෙක් හිටියා..."

"අවුරුදු පහක් හයක් විතර යනකොට ගොඩක් අය අස් වෙලා යනවනෙ සර්... අළුත් අය එනවා..."

"මේ ගර්ල් ඇවිල්ලා ගොඩක් දවස්ද...?"

"අවුරුද්දක් පහුවෙලා ඇති... දෙකක් නං උනේ නෑ තාම..."

"එතකොට අර අනික් සින්දු කියන කෙනා... ඔයා කිව්වෙ එයාත් මේ වගේමද...?"

"එයා ගොඩක් ලස්සණයි... එයා ඇවිල්ලා අවුරුදු දෙකට වඩා වැඩියි..."

එසේනම් තේජානිට ඇයගේ සියලුම දේවල් ලියා දෙන්නට නම් ඔවුන් දෙදෙන අතර මෙම වසරක් තුළ ඇතිවී තිබෙන මෙම සම්බන්ධතාවය කුමක්ද...? අරෝෂට තරමක පිළිකුලක්ද දැණින... එහෙත් සංජය එසේනම් ඒවා සොයාගන්නා බව ඔහු දන්නේය... නැත... මේ මිතුරුකමක්ම විය හැකිය...

"මෙකේ මියුසිෂන්ස්ලා නං ඇත්තටම හොඳයි... මෙච්චර ලස්සණ නෑ මං වෙන තැන්වල අහලා තියෙනවා සින්දු කියනවා... ස්පෙෂලි මේ හොටෙල්ස් වල... ඇඳුං නැතිව ගෑනු ළමයි නටනවා මිසක්... මේ වගේ ඒවා නං මං දැකලම නෑ..." අරෝෂ සැබැවින්ම කීවේ ඔහුගේ අදහසමය... බොහෝ තැන්වල සින් අද්දවා ගන්නේ තෙන් අද්දවාගෙනය... එයට ඔවුන් උපක්‍රමයක් කරගන්නේ නැගෑනු

ළමුන්ගේ අඩ නිරුවතය... මෙහි එවැන්නක් දකින්නට නැත... ශෝකාකාරී ගීයක් වුවද ඔවුන් ගායනය කළේ අසන්නන්ට හෝ රංගනය ඉදිරිපත් කළේ බලන්නන්ට අපහසුවක් නොවන අයුරිනි... පවුලේ අයට එකතුවී වුවද රංගනයන් දකිමින් ගීත අසමින් කුඩා ආහාරයක් ගත හැකිය... එහෙත් දහයෙන් එකොළහෙන් පසු නම් මෙහි මෙම රංගන දායකත්වය තිබේදැයි ඔහු දන්නේ නැත...

"මෙකෙත් කැරොකෙ වගේ තියෙනවා සර්... මේ කැල්ලෙ නෑ... ඉඳහිට මෙකේ තියෙනවා කැබරේ... වගේ... ඒත් ඉතින් මෙතනට එන්නෙ ගොඩක් අය හොඳ ලස්සණට සින්දු අහන්න... නිදහසේ ඩිනර් එක ගන්න ඒවගේ දේවලට තේ..."

අරෝෂ හිස සැලුවේය... එය නම් ඔහුට සිතිණ... මෙය හෝටල් සමූහයකින් එක් ස්ථානයක් පමණක් බව ඔහු දැන සිටියේය...

"ඒ ඕගන් මැන්ගෙ නම මොකක්ද...?" අරෝෂ ඇසුවේ පහළට බසින අතරමය...

"වසන්ත... මං එයාව හොඳට අඳුනනවා... එයා කැමැතියි ඇත්තටම සර්ලා වගේ අය අඳුනගන්න..."

අරෝෂගේ සිතට ආ සිනහව ඔහු පිට කළේ නැත... ඔහුට නීතිඥ පට්ටම තිබුණද එයින් ගන්නා එකම වැඩය වූයේ කවුරු හෝ හඳුනාගැනීමට එම පට්ටම යොදා ගැනීමය...

"වෙන දෙයක් කියන්න එපා... කියන්න මට ඒ සින්දුව ගැනයි දැනගන්න ඕන කියලා... නැත්තං මෑන් බයවෙයි... මොකද මට හිතුණා ඒ ගර්ල්ව ගන්න මගේ යාළුවෙක්ගෙ සින්දුවකට ඩුවට් එකකට... ඒවා කියන්න යන්න එපා..." අරෝෂ කීවේ සේවකයා අතින් කුමක් හෝ වැරැදි දෙයක් කියවුණහොත් යන්නෙනි. "අනික... ඔයා කියන්න ඔයාගෙ මාමාව මං හොඳට අඳුනනවා කියලා... ඒකත් වැදගත්... නැත්තං මේ වගේ අය කැමැති නැති වෙයි තේ ටීම් එකේ ප්‍රශ්න එනවට..."

"ආ... අන්න... මෑන් යයිද දන්නෙ නෑ..." පහළට බැසි සේවකයා කීවේ වාහනයක් පිටවන්නට යන බව දකිද්දීය... පළමුවම යන්නේ කෙල්ලන් ටිකය... තවමත් වසන්ත නම් පහළ කුඩා කැල්ලේ ඇති බව සේවකයා සිතුවේ ෂෙනාලි මිස් එළියට පැමිණ යළි යද්දීය... "සර් ඉන්න... මං ටක් ගාලා මෑන්ව කන්ටැක්ට් කරගෙන එන්නං..." කියූ සේවකයා ඉගිලුණේය...



තමාට එතනම ඉන්නට කියා සේවකයා දුව යද්දී අරෝෂ නැවතුණේය... අර තරුණියගේ වෙස් වලාව නැතිව ඇය දකින්නට හැක්කේ නම්... මෙතන සිටින සියලුම කෙල්ලෝ නම් අති සුන්දර රූමතියන් බව ඔහු දැන් සිතමින් සිටියේය... ඔවුන්ගේ ඉදිරි ජීවිතය ගත වෙන්නේ කෙසේදැයි සිතන්නට නම් ඔහුට නොහැකිය... ආරතී වුවද...

මෙ වෙත්දී ඇය වෙනත් කෙනෙක්ගේ පහස ලබමින් සතුටින් සිටිනවාද විය හැකිය... කෙතරම් තීවද සංජය යනු තමාට ළඟා කර ගන්නට නොහැකි වස්තුවක් යැයි සිතෙද්දී ඇය, ඇයට අත දෙන්නට සිතූ කවරෙක් හෝ සමග ගියේ දැයි අරෝෂ දැන් සිතමින්ද සිටියේය...

තවත් මොහොතකින් ඔහු දුටුවේ වේදිකාවේදී මැජික් කාරයෙක් මෙන් ඇඳුම් පැළඳුම් කරගෙන ඔගනය වැයූ තැනැත්තා ඔහුගේ හිස් වැසුම පමණක් නැතිව, මෙතනින් දිව ගිය සේවකයා සමග එන අන්දමය...

"මේ තමයි වසන්ත..." සේවකයා අරෝෂට කියද්දී අරෝෂ වසන්තගේ මුහුණ දෙස බැලුවේය... ඔහුගේ මුහුණට හොඳින්ම විදුලි පහන් එළිය වැටී තිබිණ... ලාබාල තැනැත්තෙක් බව අරෝෂට සිතිණ... වැඩිම වුවහොත් විසි පහක්...

"මං අරෝෂ... අරෝෂ සෙනෙවිරත්න..." අරෝෂ සේවකයාට හඳුන්වා දීමට නොදී අත දිගු කළේය... වසන්තද තමා දෙස හොඳින්ම නිරීක්ෂණාත්මක බැල්මක් යොමු කළ බව ඔහුට සිතිණ... මේ තරුණයා හෝටල් තුළ ඇති පැපරාසි සංගමයේ සාමාජිකයෙක් විය හැකිය... අරෝෂගේ නිගමනය අඩක් නිවැරදි විය... ඔහු හෝටලය තුළ නොව පිටතින් සිටින තැනැත්තෙකුට පැපරාසියෙක් බව අරෝෂ ඒ මොහොතේදී දැනගත්තේ නැත...

වසන්තටද මේ තැනැත්තා අවශ්‍ය වූයේ ඉඳහිට ඔහුගේ පැපරාසි වැඩකට ඔහුගෙන් සේවාවක් ලබාගත හැකි බව සිතමිනි... එහෙයින්ම සේවකයා තැනැත්තා ගැන කී විගසින්ම ඔහු තැනැත්තා සමුවීමට අදහස් කරගත්තේය...

ඒ තැනැත්තා කැමැත්තේ තේජානිගේ ගීත වලට නම් ඇය මුණ ගැස්වීම අපහසු කරුණක් නොවේ... එහෙත් ඒ වෙනුවෙන් කාරණයකට නම්... ඒවා අසා බලා දැන ගත යුතුය... ආරතී නැතිවූ මොහොතේ තේජානි නම් සොහොයුරියද නැති කර ගැනීමට ඔහු

අකැමැති වූ හෙයිනි... එහෙත් කිසියම් ආකාරයකින් බලත හොත්... නීතිඥයෙක් වැනි තැනැත්තෙක් ඔවුන් හා එක්ව සිටින්නේ නම්... ආරතීගේ නැතිවීම තුළ වුවද ඔවුන්ට කිසියම් බලයක් තිබෙන බව ඔහු සිතුවේය...

අරෝෂ වසන්තට කුඩා ඇරයුමක් කළේ ඔහු හා පිළිසඳරකට එක්වීමටය...

"ඇයි මිස්ට සෙනෙවිරත්න මේ වගේ මට කථා කරන්නේ...?" වසන්ත ඒ මොහොතේදී ඇසුවේ නම් තරමක සැකයකින් යුතුවය.

"හේතුවක් නැතුව මං වගේ කෙනෙක් වසන්ත වගේ කෙනෙකුට මෙහෙම කථා කරන්නෙ නැහැනේ... හේතුව මං කියන්නං පොඩි රිෆ්‍රෙෂ්මන්ට් එකක් පොඩි චැට් එකක් එහෙම දාන ගමන්... පොඩි රිෆ්‍රෙෂ්මන්ට් එකක් ගන්න ගමන්..." අරෝෂ වසන්තගේ සැකය නැති නොවනසේ එහෙත් කුතුහලය නිසාම එයට එක්වන්නට සිතන්නට ඉඩදී තිබේය...

සංජය වැන්නෙකුට මුහුණ දිය හැක්කේ අරෝෂ වැනි තැනැත්තෙකුට බව ඒ වෙද්දී වසන්තද සේවකයා කළ සුළු විස්තරයෙන් දැන ගත්තේය... සේවකයා අරෝෂ අඳුනගත්තේ මේ මොහොතේ වුවද, හුරුබුහුටි අන්දමින් අරෝෂගේ හැඳුනුම් කම ගැන විස්තරයක් දුන්නේය.

කෙසේ වූවද වසන්ත නම් එලෙස කුඩා සාදයක් සඳහා තනිවම එවැන්නෙක් සමුවීමට යන්නට තරමක් මැලි වූයේය... එහෙයින්ම ඔහු අළුත් මිතුරෙක් හඳුනාගන්නට එන්නට යැයි මයන්තටද ඇරයුමක් කළේය... ලලිත නම් නිදාගන්නට යන්නට අවශ්‍ය යැයි කිවූ බැවිනි... ඔහු ලලිතට ඔවුන් හා කාලය ගත කරනවාට වඩා දේවල් තිබිණ... ඔහු බොහෝ විට පෙම්වතිය නැතහොත් පැනේ මිතුරියන් සමග කථා බහ කරන්නේ මෙලෙස හෝටලයෙන් නික්ම ආ පසුය...

එහෙයින්ම මයන්තද අරෝෂ සමුවීමට ඒමට කැමැත්ත පළකළේය... වෙනත් ඇඳුමකින් සැරසී එන්නට පමණක් ඔවුන් කාල වේලාවක් ලබා ගත්හ... ඒ කාල වේලාව ගැන අරෝෂ නම් අබැටක පමණකුදු තැකීමක් කළේ නැත... ඒ කාලය අපතේ නොයවා ඔවුන්ගෙන් බොහෝ දේ දැන ගැනීමේ අභිලාෂය ඔහුගේ සිතේ පැළපදියම් වී තිබුණේය... එහෙයින්ම වසන්ත හා මයන්ත යන දෙදෙනාම ඔහු වෙත එද්දී ඔහුට සැහෙන සතුටක්ද දැනිණ... ඔහුට මෙම හෝටලය ගැන කිසියම් විස්තරයක් අවශ්‍ය වෙද්දී එක් තැනැත්තෙක් නොව තැනැත්තන් දෙදෙනෙක්ම ඔහුට මුණ ගැසුණ හෙයිනි...



මේ මයන්ත බව දැනගනිද්දී අරෝෂට සිතුණේ ඔහුගේ කාලය අපතේ යැවීමෙන් පාඩුවක් නොවූ බවය... ඔහුටද අවශ්‍ය වී තිබුණේ මයන්ත නැමැත්තාද ළං කර ගැනීමටය... තේජානි නැමැත්තිය මෙන්ම ආරතීද බොහෝ ළඟින් ඇසුරු කරන්නේ මයන්ත බව සංජයගෙන් ඔහු දැන සිටි හෙයිනි... එහෙයින්ම වසන්ත පැමිණ මයන්ත නැමැති තැනැත්තා හඳුන්වා දෙද්දී අරෝෂ බෙහෙවින් සතුටු වුණේය...

ඔවුන් සෑහෙන වේලාවක් බොහෝ දේ ගැන සාකච්ඡා කළහ... අතරින් පතර මෙම සේවාව පිළිබඳව කථා කරමින්, ඔවුන් අරෝෂ තරමක් දැනුවත් කළ බව නොදත්තද මිතුරා මයන්තටත් සිතට අල්ලා තිබුණේය...

ඔහු ඔවුන්ට වඩා තරමක් වැඩිමහල්ය... සැබැවින්ම නම් කාත් කවුරුත් නැති ලොවක එවැනි අයියෙක් සිටින්නේ නම් මයන්තට රහසින් සිතුණු තරම්... වසන්තට වඩා අරෝෂට එහෙයින්ම ළං වුණේ මයන්තය...

කථා බහ කරද්දී අරෝෂගේ සිත මයන්ත ගැන පැහැදීමක් ඇති වෙද්දී මයන්තගේ සිතේ එවන් දෙගුණයක පැහැදීමක් තමා ගැන ඇතිවූ බව නම් අරෝෂට සිතාගන්නට නොහැකි විය...

අන්තිමේදීම ඔවුන් ආවේ ගීත අතරටය... මයන්තට එයට වඩා දෙයක් නැත... වසන්ත හැකියාව නිසාම ගිටාර් වාදනය කළද ඔහුගේ සිතේ එතරම් මෙම රැකියාව ගැන කැමැත්තක් තිබුණේම නැත... ඔහු බොහෝ ආශා කළේ පැපරාසි වැඩටය... ඔහු මෙහි සේවයේ යෙදී සිටින්නේද ඔහුගේ මිතුරාට සහය වීමට සිතමිනි... රැකියාවක් යනු බොහෝ දේවල්වලින් ඔහු ගලවා ගන්නා මඟකි... සියල්ලටමත් වඩා එම රැකියාවට තමා අවශ්‍ය වන්නේ රැයේදීය...

නොදැනුවත්වම මෙන් වසන්තගේ එම හැකියාවද අරෝෂ තේරුම් ගනිමින් සිටියේය... යම් යම් පිළිතුරු වලදී වසන්තගේ එම හැකියාවේ යම් යම් දැඳ එළි දක්වුණු බැවිනි...

මයන්තට නම් සංගීතය හැරෙන්නට වෙනත් පිස්සුවක් ඇත්තේම නැත... කොළුකම නිසාම වසන්තගේ එවැනි වැඩට සහයෝගයක් දුන්නද, ඔහුට මේ රැකියාව ඉහටත් උඩින් සිතට අල්ලා තිබිණ... එහෙයින්ම අරෝෂගේ ඒ පැත්තෙන් කියවුණු කරුණු කාරණා ඔහුගේ සිතේ තදින්ම තැන්පත් විය...

අරෝෂගේ කිසියම් පැණයකට පිළිතුරක් වශයෙන් ඔහු තේජානි ගැන සඳහනක් කළේ එවැනි වේලාවකදීය...

"අපෙත් ඉන්නවානේ ඒ වගේ හොඳට වෙන භාෂා වලින් කියන්න පුළුවන් එක්කෙනෙක්..." මයන්ත කීවේ අරෝෂගේ සිතට ආ සතුට මුහුණින් පළ නොවුණද, කුතුහලයක් වැන්නක් බොහෝ අපහසුවෙන් මුහුණට නගා ගනිද්දීමය...

"අද ඒ සින්දු කිව ගර්ල්ද...?" අරෝෂ නිවි සැනසිල්ලේ ඇසුවේය... "මට තේරුණා මොකක් හරි වෙන භාෂාවක් වගේ කියලා..."

"ඒක කොරියන් සින්දුවක්... ඔයාට අහන්න තිබුණේ ඒකේ ඔරිජිනල් එක... මං හොයාගෙන ආවෙ ඒක... ආයේ නෑ... ජානිට නියමෙට පුළුවන් ඒ වගේ කියන්න..." මයන්ත කීවේ බොහෝ උනන්දුවකිනි... ඔහුට අවශ්‍ය වූයේ මෙම කණ්ඩායමේ බොහෝ දක්ෂයින් සිටින බව කියන්නටය...

මයන්තගේ කොළකම අරෝෂ වටහාගෙන තිබුණෙන් ඔහු සිනැහුණා මිසක වෙනත් යමක් කියන්නට ගියේ නැත... වසන්ත එහෙත් බිය වුණේය... ආරතී නැතිවුවා මදිවාට... මොහු තේජානි මුණ ගැසීමට සිතුවහොත්...

ඔහු ඇවිත් තිබෙන්නේද එහෙයින්ම බව දැනගත්තේ නම් වසන්ත එයටද වඩා බියවෙනු ඇත...

සේවකයා අරෝෂගේ සිතැඟි පරිදි එය ගැන නම් කීවේ නැත... මේ මොහොතේ එලෙස කීවේ නම් වසන්ත කිසිවිටෙකත් අරෝෂ නැමැත්තා සමුවීමට නොඑන බව සේවකයා දැන සිටියේය... ඔහුට අරෝෂට සලකන්නටද අවශ්‍ය භාවයක් ආවේ... එම පැරණි සේවකයා ඔහුගේ මාමා කෙනෙක් හෙයිනි... මාමාගේ නම කියාගෙන ආ තැනැත්තාට මේ කුඩා සහයෝගය නොදී සිටින්නට ඔහු අකැමැති විය... එය දන්නා හෙයින් අරෝෂද වසන්ත හා මයන්ත සමග කථා කළේ බොහෝ ප්‍රවේශමිනි... තේජානි හෝ ආරතී තබා අයෝමා වුවද ඔහු හඳුනන්නේයැයි කීමට ඔහු නොසිතුවේය...

"මාත් ටික කාලයක් ඉගෙන ගත්තා... වෙස්ටර්න් ඊස්ටර්න් දෙකම... හින්දි නං මට හොඳට පුළුවන් එක්ක... ඒත් ඉතින් කාලයක් යනකොට... අපි වෙන ෆීල්ඩ් වලට යනකොට... අමතක වෙලා යනවා... ඒත් අද අර ගර්ල් සින්දු කියද්දි මටත් මතක් උනා අපි ඒ කාලෙ විකාර කරපු හැටි..."



"ඒ කොහොමද...?" වසන්ත ඇසුවේ මදක් සැක සහිත අයුරිනි...

"නෑ... මට මතකයි... ඔය වගේම ඇඳලා... මායි තවත් යාළුවො දෙන්නෙකුයි... අපි දෙන්නෙක් කොල්ලන්ට හිටියේ... එකෙක් කෙල්ලෙක්ට හිටියේ... ඔය විදියටම මාස්ක්ස් දාලා... අපි කිව්වා සින්දු... භාෂා දහයකින් විතර... ජාති වලට හරියන විදියට එක එකා අන්දවලා හිටියෙ..."

"භාෂා දහයකින්...?" මයන්ත ඇස් උඩ ගින්දා ඇසුවේය...

"ඔව්... ඒත් ඉතින් අපිට තියා භාෂාව දන්න එවුන්ටවත් ඒවා තේරෙන්න නැති වෙයි..."

"ඒ කොහොමද...?" වසන්තට ඇසුණේ මයන්තට නම් එය තුමන්දැයි සිතෙද්දීය...

"චීන විදියට එව්වො එනකොට... චීන් චෙන් චැන් කිය කිය හැප්වා... ජපන් එකා එනකොට ජපන් කිව්වා... වචන දෙක තුනක් දම්මා... අන්තිමට සයොනාරා කිව්වා... අපේ වැදි සින්දුවකුත් කිව්වා... හින්දිත් කිව්වා... ඒවා වචන හරි... තේරුං නං තියෙන්න නෑ... ගොඩක් හුරුවේ හින්දි ෆිල්ම්වල නම්... දෙමළ වචන ටිකක් නං අපේ එකෙක් ලියලා දුන්නා... කොරියන් වලිනුත් සින්දුවක් කිව්වා... ඒත් ඉතින් අහලා කරලා නෙවෙයි..." අරෝෂ කීවේ වසන්තගේද සිනහව නංවමිනි...

"හැබැයි එකක් තිබුණා... අපි තුන්දෙනාම තාලෙට සින්දු ටික කිව්වා..." අරෝෂ කීවේ නම් සැබැවින්ම සිදුවූ සිද්ධියකි... ගීත ගායනය තරමක් දුරට ඔහු හැදෑරුවේද ඉන් පසු බව ඔහුට මතකය...

ඔහු අන්තිමේදීම ඒ ගී ගායනය කළ ගායිකාව තමාට හඳුන්වා දීමට නොහැකිදැයි ඇසුවේ... ඔහුගේ මිතුරෙකුගේ ගීතයකට ඇයගේ කටහඬ දායකත්වය ලැබෙන්නේ නම් ඉතා මනායැයි කියමිනි...

"මෙහෙන් ඒ වගේ ඒවාට යන්න දෙන එකක් නෑ..." වසන්ත නම් කීවේය.

"කවුද එහෙම කියන්නේ... මේ ගර්ල්ගෙ නම නොදා... මොකක් හරි වෙන නමකින් යන්න බැරියැයි..." අරෝෂ කීවේය... "දැන් ගොඩක් අය කරන්නෙත් එහෙම නේ..."

"අහලා බලන්න වෙයි..." වසන්ත කීවද... මයන්ත නම් එයට තේජානි කැමැති කරවා ගැනීමට සිතුවේය...

"ජානි කැමැතිවෙයි... මං කැමැති කරව ගන්නං..."

"ඒ ළමයගෙ නම මොකක්ද... ජානි කියන්නේ ජනිතා වගේ නමක්ද...?" අරෝෂ ඇසුවේය...

"නම නං තේජානි... අපි කියන්නේ එහෙම..." මයන්ත පිළිතුර දුන්නේය...

"ඒ ගර්ල්ගේ කටහඬ නං ආයින් කියන්න දෙයක් නෑ... ඇත්තටම හරිම ලස්සණයි..." අරෝෂ කීවේය... "අපරාදේ මේ වගේ තැනක කොටු වෙලා ඉන්න එක..."

වසන්ත මෙන්ම මයන්තද මේ අළුත් මිතුරාගෙන් සමුගත්තේ බොහෝ සුහද ශීලීවය... අරෝෂ මේ දිනවල නිවාඩු නිසා හෙට දිනයේ නැතහොත් ඉන්පසු දිනයක අහවල් එන්නටද පොරොන්දු වුණේය... ඔවුන්ට තවත් දිනකින් පමණ නිවාඩුවක් ගත හැකි බව දැන සිටි මයන්ත එයට එකහෙළාම සතුටු වුණේය... තේජානිට වුවද මෙවැන්නෙක් හා මිතුරුවී සිටීමෙන් වන අවැඩක් නැත... ඔහු සිතුවේ එලෙසිනි...

එක දිගටම මෙන් පුහුණුවීම හා විශේෂාංග ඉදිරිපත් කිරීම නිසාම පමණක් නොව මිතුරියගේ අතුරුදන්වීමෙන් සිත තැවුලට පත් කරගෙන සිටින තේජානි ගැන මයන්තගේ සිතේ තිබුණේ සැහෙන දුකකි...

එහෙයින්ම ඔහු ඇයට නොදන්වා හෝ මෙම මිතුරා ඇයට මුණ ගැස්වීමට රහසින් සිතාගත්තේය... එය ඔහු වසන්තටද කීවේ නැත... එහෙත් මෙම මිතුරා යළි පැමිණෙන්නේ සති ගණනකින් පසුවද නැතහොත් දින කිහිපයකින් පමණදැයි ඔහුට සිතාගත නොහැකි විය... කෙසේ වුවත් තේජානි කැමැති කරවා ගෙන ඔහුට දුරකථන පණිවිඩයක් දෙන්නට මයන්ත සිතට ගත්තද, අරෝෂ නම් එලෙස සති ගණන් ඒ හමුව පසු කරන්නට සිතාගෙන සිටියේ නැත...

ඔහු හෙට දිනය නොව අඟහරුවාදාට ගොස් මයන්ත සමුවී තේජානි මුණ ගැසීමට සිතාගත්තේය... ඔහුට රෝහල් මෙන්ම වෙනත් කිහිප තැනක්ද විමසීමටත්, අවශ්‍ය වුවහොත් තේජානිගේ කටහඬ පරීක්ෂණයක් සඳහා තැනක් සූදානම් කරගැනීමටත් අවශ්‍ය ව තිබිණ...



# 18 සඳුදා

"ජානි... මොන දේ උනත් අපිටත් කවුරු හරිම මේ වගේ කෙනෙක් ඉන්නව නං..." මයන්ත කීවේ ඉන්පසු දිනයේ පුහුණුවීම් වලදී ලත් අවකාශයකිනි... තේජානි පුහුණුවීම් වලට ආවද එදින විශේෂාංගවලට එකතු නොවීමට තීරණයක් ගෙන සිටියාය... ඇයට තරමක විවේකයක් අවශ්‍ය බව ඇයටම සිතෙමින් තිබිණ... එහෙයින්ම ඇය ඇයගේ ගීතය පුහුණුවක් කළේ දෙසැරයක් පමණකි.

ඇය ගීතය නිමවා වාඩිවී සිටි තැනට පැමිණි මයන්ත ඊයේ සිදුවූ සියල්ල කියන්නට ගත්තේය... එදින ඔහුටද විවේකයක් ලැබී තිබිණ... ලලන සිටියේ නැත... වසන්ත නම් ඔගනයේ කිසියම් ගීතයක් වයමින් සිටි අතර... අනික් අය කැසට් පටියක ගීතයකට නැටුම් පුහුණුවෙමින් සිටියහ...

නිදහසේ සිටි ඒ මොහොතේදී ඉන් පෙරදා රැයේ වසන්ත මාර්ගයෙන් ඔහු හා මිතුරුවූ ඒ මිතුරා පිළිබඳව තේජානි හා කීමට ඔහු ඒ අවකාශය ප්‍රයෝජනයට ගත්තේය.

"මට නං හිතන්න අමාරුයි මයන්ත... ඒ වගේ මනුස්සයෙක් අපිට උදව් කරයි කියලා... අපි මේ නෝබොඩිලානේ... ඒ මිනිහා ගැන දැනගෙන සංජය එයාට කියක් හරි දුන්න ගමන්... ඔක්කෝම කුණු බේරුවල බොක්කට කිව්ව වගේ..."

"එහෙම නෑ කියලා මගේ හිත කියනවා ජානි අක්කෙ..." වසන්තය මයන්ත කීවේය... "අපි අඳුනන්නෙ මෙතන අයම විතරයි...

නං ටිකක් හරි දන්නවා... ඒත් ළං කිසි දේකට උදව් කරන්නෙ නෑ නේ..." දෙවනුව ඔහු කීවේ තරමක තෝක්කඩු හඬකිනි...

"එහෙම උදව්වක් කරන්න බෑ මයන්ත... එයා කරන ෆීල්ඩ් එක මහ අමුතු ෆීල්ඩ් එකක් නේ... ගහලා ගියොත් එයාගේ බෙල්ල ඉස්සෙල්ලම කැපිලා යයි..."

මයන්ත සුසුමක් හෙලුවේය...

"කමක් නෑ... අපි ගිහින් මේ මනුස්සයා මුණ ගැහෙමු... එයා හරි කැමැති උනේ ඔයාගේ කටහඬට... මෙතන තැක් ගැහෙනවට වඩා කොහොමටත් හොඳයි නේ ජානි එහෙම වෙන නමකින් හරි ඔයාට ඉස්සරහට යන්න තියෙනවනං..."

"මට එච්චර දේවල් ඕන නෑ මයන්ත... නංගාව ටිකක්..."

"නංගි ගැන විතරක් නෙවෙයි ජානි... තමන් ගැනත් හිතන්න ඕන... ඔයා මෙතනින් ගියාම කොහේද නවතින්නේ...?"

"ඇයි මට ඉන්නෙ මල්ලි කෙනෙකුත්..." තේජානි කීවේ විහිළු ස්වරයකිනි...

"ඒක හින්දා තමයි මං අක්කට කියන්නේ... අපිට ඒ වගේ අයියෙක් වත් ඉන්නවනං හොඳයි කියලා..."

"හොයාගන්න තියෙන්නේ අරකිගෙ සංජු වගේ එකෙක්..." තමාටම මෙන් කියාගත් තේජානි මයන්ත දෙස බැලුවාය... "කොහොමද දූන් මේ අයියා ඔයා අඳුනගත්තෙ...?"

"මං කිව්වෙ... වසන්තට තමයි මෙයාව අඳුන්නලා දුන්නේ... කොහොම හරි වසන්තට අඳුන්නලා දුන්න බූවාගේ මාමාගේ යාළු බුවෙක්ළු මේ..."

තේජානි සිනහසෙන්නට ගත්තාය...

"මොකද...?"

"මාමාගේ යාළු බුවෙක් නං හලෝ... අයියෙක් වෙන්න බෑ..."

"අයියා තමයි... එයාට හොඳටම වැඩි උනොත් තිහක් විතර ඇති..."

"මට නං දූන් කවුරු එක්කවත් කථා කරන්න හිතෙන්නෙ නෑ මයන්ත..." එවර තේජානිගේ ස්වරයේ වූයේ දුකකි... "මට



මතක්වෙන්නෙම රති... දූන් නං ඉතින් කොහෙන් හරි මේ කෙල්ලට කථා කරන්න වෙලාව ගිහිල්ලා..."

"මටත් කියන්න තියෙන්නේ එච්චරයි ජානියො... මට නං හිතාගන්න බෑ... ඒත් අද කවුරු හරි කිව්වා... වැරදිලාවත් එයා ගිහිල්ලා තියෙන්නේ එයාගේ කැමැත්තෙන්ම නං..."

"එහෙම කරන්නේ නෑ රති... මොකටද එහෙම එයාගේ කැමැත්තෙන් යන්නේ...?"

"එහෙම හිතලත් බෑ... එක අතකට නොහිතත් බෑ... මැන්ව ටිකක් බය කරන්න හිතුව නං... කෙල්ල එහෙම එකක් උනත් කරන්න ඉඩ තියෙනවා..."

"අපිට වත් නොකියා..."

"එහෙම එකක් කරන්න හිතුවනං අපිට කිය කිය කරයිද හලෝ... ඒක ෆුල් ආතල් ෆිල්ම් එකක් වෙන්නේ අපිත් හොල්මන් වෙන තරමට නේ..."

"ඔව් ඔව්... කාටත් ඉස්සෙල්ලා සංජු පච් කිය කිය ඒකි මාවනේ හොල්මන් කළේ... පිස්සු..." තරමක් අමනාප හඬකින් කියාගෙන ගිය තේජානි නැගිට්ටේ ෂෙනාලි හිස දමා ඔවුන් දෙස බැලූ බැවිනි.

ඒ සිදුවූ සිද්ධීන් ගැන සිතෙද්දී, ආරතී නිසා බොහෝ සේ සිත කද්දල් කරගත්තේ තේජානි බැවින් මයන්ත වෙනත් යමක් කියන්නට ගියේද නැත... ඇය කෝප ගන්නා සාධාරණය... ආරතී මිතුරිය ලෙසින් ඇයට හෝ කිසිවක්ම නොකියා මෙලෙස ගියා ගැන මයන්තටද කෝපයක් සිතුණේ තරමක් දුර ඒ ගැන සිතද්දීය...

සැබැවින්ම ආරතී මෙලොවින් තුරන් වූයේ නම් මේ වෙද්දී ඇයගේ මිනිය හෝ සමුවී තිබිය යුතුය... එවැන්නක් නොවුණු හෙයින් දූන් ඔහුද දෙතුන් දෙනෙක් ඒ ගැන පළකළ අදහස් ගැනද සිතද්දී මේ නම් ආරතී හොඳින්ම දූන දූන කොහේ හෝ සැඟවී සිටිනවා විය හැකිය යන සිතිවිල්ලෙහි එල්බ ගත්තේය.

"අද ජානි ඔයා සින්ග් කරනවද...?" රුක්මි ඇසුවේ තේජානි එදෙසට ළඟා වෙද්දීය.

"නෑ රුක්මි... මට අද හිතුණා ටිකක් රෙස්ට් කරන්න..." තේජානි කියද්දී රුක්මි බැලුවේ ෂෙනාලි දෙසය... ෂෙනාලි හිස සැලුවාය...

තේජානි දූන් එක දිගට දින පහක් සේවාව දී ඇත... බොහෝ විට ඔවුන් මෙලෙස එක් දිගටම කවුරුවත් සේවාවේ යොදවන්නේ නැත... එහෙත් තේජානි පසුගිය සතිය තුළ විඳි මානසික ඝට්ටනය ගැන දන්නා හෙයින් ෂෙනාලි ඇයට බැහැයි එපැයි කියන්නට නම් නොසිතුවාය... දූන් ඇයගේම කැමැත්තෙන් තරමක විවේකයක් ගන්නට සිතන්නේ නම්...

"අද වන් මැන් ද මිස් එන්නෙ...?" රුක්මි ඇසුවේ එවිටය...

"නීලන් එනවා කිව්වා... රුක්මිටයි සමාධිටයි පුළුවන් නේ අද එහෙනං සෝන්ග්ස් ටික කරන්න..." ඇය ඇසුවේ පසෙකින් සිටි සමාධි දෙසද බලමිනි.

රුක්මි හා සමාධි දෙදෙනම හිස් සැලූහ...

"නීලන්ගේ කවර් අජ්ස් දන්නවානේද...?" ෂෙනාලිගේ පැණයටද ඔවුන් හිස් සැලූහ.

"එහෙනං මිස් අද අපිත් ඕන වෙන එකක් නෑ නේ..." ඇසුවේ මේ සියල්ලම අසා සිටි මයන්තය.

"මයන්තටත් ඒ කියන්නෙ රෙස්ට් එකක් ඕන වෙලාද...?" ෂෙනාලි ඇසුවේ සිනහසෙමිනි... මයන්ත තේජානි හෝ ආරතී නැති විටෙක කණ්ඩායමට එකතු වීමට මද අකැමැත්තක් තිබෙන බව ඇය වටහාගෙන සිටියාය...

වෙනදා නම් ඇය එලෙස මයන්තට මග හරින්නට දෙන්නේ නැත... එහෙත් අද ඇයට එලෙස කරන්නට නොසිතිණ...

තේජානි තනි නොකරන්නට යැයි අයෝමා කියූ හෙයින්ම තේජානි මයන්ත ඇසුරේ සිටීම ගැන ඇය කැමැති වූවාය...

"මං මිස් එහෙනං මයන්තත් එක්කම ගිහිල්ලා නංගිව බලලා එන්නං..." තේජානි කීවාය... ආරතී කොහේ හෝ ගියායැයි බොතේජු යුවළ ඇසුවහොත් කිව යුතුය...

"යනවනං මෙහේ වෑන් එකේ යන්න... මනම්පේරි වෑන් එකට දාලා තියෙන්නේ..." ෂෙනාලි කීවේ මයන්තටය...

තේජානි එයට නම් කැමැත්තක් නොදැක්වූවාය... එවන් වාහනයක යද්දී නැගණියට එය සටහන් වුවහොත්... ඇයගේ කුඩා



සිතට යම් යම් අදහස් එක්වීම ගැන තේජානි කිසිසේත්ම කැමැති නොවූවාය.

"නෑ මිස්... මං අපේ තාත්තාගේ වීල් එක ගෙන්න ගන්නං..." මයන්ත කීවේ ඇයගේ සිත මුහුණින් පළවූ හෙයිනි... අරෝෂ නැමැත්තා මුහුණ ගැසීමට හැකියාවක් ඇත්තේ නම් ඔහු එවර සිතමින් සිටියේය.

"අද වසන්තලා මොකද කරන්නෙ...?" මයන්ත ඇසුවේ එවර වසන්ත දෙස බලමිනි.

"මං අද හොඳට නිදාගන්න යනවා..." වසන්ත කීවේය...

"යං තං නිවාඩුවක් හම්බඋනාම මූං බලන්නේ නිදාගන්න..." මයන්ත කීවේ සමුදිටය...

"ඔයා මං දන්නෙ නෑ... මාත් එහෙමයි..." සමුදි කීවාය...

"අපි යං ජානි ටිකක් රටේ තොටේ පාට වත් බලලා එන්න..."

"රටේ තොටේ පාට බැලුවට කමක් නෑ... ඉක්මණට එන්න... රූමෙන්න ඉස්සෙල්ලා..." කීවේ රුක්මිය...

"මං තාත්තාට කියන්නං එන්න කියලා..." කියාගෙන මයන්ත ඔහුගේ නේවාසිකාගාරය දෙසට හැරුණේ ජංගම දුරකථනය පණගන්වමිනි... එදෙසට හැරුණද එදෙසින් කථා කරන තුරු තේජානි මෙන්ම ඔහුද මදක් නැවතී සිටියේය...

මයන්ත හා පියා කළ කථාව තේජානිට ඇසුණේ නැත... එහෙත් මයන්තගේ පියාට මේ මොහොතේ කිසියම් ගමනක් යෙදී තිබෙන්නේදැයි සැක සිතුණු හෙයින් ඇය මදක් ඉවත්ව ඒ දෙස බලාගෙන සිටියාය... විනාඩි දෙක තුනකට පසු මයන්ත ඇය දෙස බැලුවේය...

"තාත්තාට තව විනාඩි හතළිස් පහක් දෙන්නළු... එහෙනං... පැය භාගෙකින් විතර මං ඔයාට කථා කරන්නං... ඔයා ලැහැස්ති වෙනවද...?"

හිස සැලූ තේජානි එවර නේවාසිකාගාරය දෙසට ගියාය...

තවත් විනාඩි හතළිහකට පමණ පසු තේජානි ආවේ මුරකුටිය දෙසටය... මයන්තද එදෙසට ආවේය... පැරණි නිළදරුවා ඔවුන්ට සිනහසුණේය...

දෙදෙනම සිට ගත්තේ වාහනය එද්දී පෙනෙන තැනකය...

"හලෝ මේ... අපි දෙන්නා අද යන්නේ අර මැත් හම්බවෙන්න..." මයන්ත කීවේ තරමක් සෙමිනි.

"මොන මැත්ද...?" තේජානි ඇසුවේ සැබැවින්ම පුදුමයෙනි... ඇයට අයියා අමතක විය...

"අර බූවා... අයියා..."

"පිස්සුද මයන්ත ඔයාට...? දැන් අපි නංගි බලන්න යන්න එපැයි..."

"නංගි බලන්නත් යමු... ඉස්සෙල්ලා ඔයා මැත්ව හම්බ වෙන්න කෝ... ඉන් පස්සේ බැරියැයි... මැත් එක්ක ටිකක් කථා කරලා බලමු... ඊටපස්සෙ නේ අපි කරන දෙයක් කරන්න හිතන්නේ..."

"ඔයා දැන් මේ මීට වෙන එක දාගෙනමද මට ඇඳ පැළඳගන්න කිව්වෙ...?"

"නැහැ... ඇත්තටම නෑ ජානියො... මං ඇඳගෙන ඉවරවෙනකොට මැත් මට කථා කළා... එතකොට මං කිව්වා තමයි ඔයත් එක්ක මං මෙහෙම ගමනක් යන්න ඉන්නවා කියලා... මැත් එතකොට අපි දෙන්නට පොඩි ඉන්වයිට් පාරක් දැම්මා... එන්න කිව්වා පුළුවන් නං... එයාගෙ ඔෆිස් එකට..." මයන්ත කීවේ නම් සත්‍යයකි...

ඔහුට කථා කළේ අරෝෂය... අරෝෂ මයන්තට කථාකරන්නට සිතුවේ තමා අමතක වන්නට පෙර මයන්තට නිකමට කථා කළ යුතුයැයි අදහසක් ආ හෙයිනි... එහෙත් මයන්ත තේජානි හා නැගණිය බලන්නට යන්නට සූදානම් බව කියද්දී හැකි නමක් තිබේ නම් තමා සමුවීමට එන්නටයැයි අරෝෂ කීවේ ඔවුන් එන්නේ නම් පිළිවන් තරම් ඉක්මණට ඔහුගේ කාර්යාලයයටද යාමට සිතමිනි...

ඔවුන් මුණ ගැසිය හැකි හොඳම තැන නිවාස සංකීර්ණයේ තිබෙන ඔහුගේ කාර්යාල කාමරය හා බැඳී තිබෙන තමාගේ මහල් නිවාසය බව ඔහු සිතුවේය... කෙටි කාලයකින්ම මෙම තේජානි නැමැත්තිය මුණ ගැසුණේ නම් බොහෝ දේ නිරාකරණය කරගත හැකි බව ඔහු සිතමින්ද සිටියේය...

ඒවා නොදන්නද මයන්තට අවශ්‍ය වූයේ එවැනි මිතුරෙක් තේජානිට හඳුන්වා දීමටය...

"ඔෆිස් එකට...?" තේජානි තරමක් සැකයෙන් මෙන් විමසුවාය.

"ඔව්... ඒක පොඩි එපාර්ට්මන්ට් එකක් ඒ... ඉතින් ඔයා කැමැති නං එක්ක එන්න කිව්වා..."

"මං කැමැති නං..."

"ඔව්... එතන කෙල්ලොත් වැඩ කරනවා කිව්වෙ..."

"දැන් මොකටද අපි ඒ බූවා හම්බවෙන්න යන්නෙ...?"

"ඇයි හලෝ මේ විදියට අමතක කරනවද මේ දැන් කියන දේවල් මේ විදියට... මං කිව්වේ ඔයාගේ සින්දුවක්..."

"මයන්ත මේ... ඔයාත් හරියට අර රෝමේ ගිනි ගනිද්දී වීණා වාදනය කරපු එකා වගෙයි..."

"එහෙම කියන්න එපා ජානි... උගේ නම නීරෝ..."

"ඔව් මං මේ ඔයාගෙන් රෝම ඉතිහාසේ ඉගෙන ගන්න නේ ලැහැස්ති වෙන්නෙ..."

"තරහ ගන්න එපා ජානි... මේක අතට ආව පොට්ට චාන්ස් එකක්... අතාරින්න හිතන්න එපා..."

"මං දන්නෙ නෑ මයන්ත... මේ වෙලා තියෙන දේවල්වල හැටියට මට නං මනුස්සයෙක් එක්ක කථා කරන්නත් බයයි..."

"ඒ මනුස්සයො එක්ක නේ..."

"එතකොට මේකා මොකෙක්ද...? මට කථා කරන්න කියන... රාස්ස පැටියෙක්ද...?"

"නෑ මචං කෙල්ලෙ... බූවෙක් බූවෙක්... බූවා කියන්නේ කවුරු හරි පොරකට නේ... මේකා තරක බූවෙක් නෙවෙයි... හොඳ බූවෙක්... ලස්සණ කඩවසම්... ටිකක් වයස ඇති... වයස මොකටද අපේ වැඩේට... මැත් ඔයාගෙ කටහඬ ඉන්ට්‍රඩියුස් කරලා දෙන්න නං යන්නේ..."

"උඹේ ඔළුව හිල් කරගන්න තිබුණා රතිය හිටියනං..."

"හොඳ වෙලාවට ඒකි කොහේ හරි හැංගි මුත්තමක ගියේ... නැත්තං උඹට ආව මේ චාන්ස් එක ගහලා යන්නත් තිබුණා..."

"පව්..."

"පව්... කාටද... දැන් පව්..."

"රති පව්... කොහේ ඉන්නවද දන්නෙ නෑ..."

"ඇති... සංජු පව් කිය කිය... උඹ එහෙම නේ කිව්වා කිව්වෙ..."

"ඇත්තමයි... ඉන් පස්සෙ නං දැක්කෙම නෑ හීනයක් වත්..."

"දරුවෙක් මල්ලෙක් එක්කම දකියිද දන්නෙ නෑ මින් පස්සෙ..." කී මයන්ත පියාගේ නැවැත්වූ රිය දෙස බැලුවේය...

"ඔයා හිතන්නෙ...?" තේජානි ඇසුවේ ගේට්ටුවෙන් පිටවෙන අතර තුරය...

"නිකං... වෙන දෙයක් නෙවෙයි... සමහරු කථා කරන දේවල්..." කියාගෙනම ඔහු ත්‍රීරෝද රියට නැග්ගේය... ඒවා පියාට ඇසෙන්නට කිව යුතු නැත... එය ස්ථිර ආරංචියක් වූයේ නම් එය වෙනත් වැඩකි...

"කොහොමද දුව...? තවම නෑ නේද රති දුව ගැන ආරංචියක්...?" පියා ඇසුවේ තේජානිගෙනි...

"නෑ නේ අන්කල්..." තේජානි කීවේ කණස්සළු කටහඬකිනි. එයට එහා දෙයක් පියාට අසන්නට නොසිතුණා වැනිය... ඔහු ඇය නගින තෙක් බලා සිටියේය...

"පුතාට කොහේද යන්න ඕන...?" පියා ඇසුවේ මයන්ත වාඩිවෙද්දීමය...

මයන්ත නම් කලේ සුඛෝපභෝගී මහල් නිවාස සංකීර්ණයක නැතකි... තේජානි පුදුමවී බැලුවාය.

"කොහේද ඒ බුවා ඉන්නෙ...?" ඇය සෙමින් ඇසුවද පියාට එය ඇසෙන්නට ඇත...

"කවුද...? මුවා...?" පියාගේ කණ නැසෙනවා නොව ඔහුට තමා කියූ අපුබංසය වටහා ගත නොහැකි වූ බව දන්නා මයන්තට සිනහවක් ගියද....

"මුවා නෙවෙයි තාත්තෙ... බුවා බුවා..." ඔහු එය යළිත් කීවේය.

"කවුද ඒ...?" පියා ඇසුවේය... පියාට මේ කොල්ලන්ගේ වදන් තේරුම ගන්නට නොහැකි බව දන්නා තේජානිගේ මුවේද සිනහවක් විකසිත විය... ආරතී ගැන අසද්දී ඇයගේ මුහුණට නැගී පෙනුම දුන් නැතිවූ බව දකිද්දී මයන්තගේ සිතට සැනසිල්ලක් දැනින...



"එහෙම තමයි අන්කල් මේගොල්ලන්ගෙ කථා... මේ කවුද වසන්තගෙ යාළුවෙක් එ..." තේජානි කීවාය.

පියාගේ සිනහවක් විකසිත වූවා මිස ඔහු යමක් කියන්නට නොගියේය...

"එහේ ගිහිල්ලා ඉවරවෙලා අපි ආයේ අර බොතේජු ආන්ටිලගේ ගෙදරත් යන්න ඕන තාත්තෙ..."

"මට හයර් එකකුත් තියෙනවා... මං එහෙනං පුතාලව බස්සලා යන්නං... ආයේ මට කෝල් කරන්න වැඩ ඉවර උනාම... මං එන්නං... මං නැතුව යන්න එපා වෙන ත්‍රීවීලර් වල..." පියා කීවේ සමහරවිට ආරතී ගැන මතකය ආ හෙයිනැයි තේජානිටද සිතිණ.

"හරි... තාත්තෙ..." මයන්ත කීවේය... "කොහොමද සාලිය ගේ ඉන්ටවීව් එක...?" ඉන්පසු ඔහු ඇසුවේ වත්තේ කාගේ හෝ රැකියාවක් ගැන විය හැකිය... තේජානි සිතුවාය... පියාට හා පුතාට කථා කරන්නට දේවල් එමට තිබෙන බව දන්නා තේජානි වටපිටාව ගැන නෙත් යොමු කළාය...

මයන්ත කොළුකමට දඟලුවාට මේ සාදා ගත් පියාට බොහෝ ගරු කරන බව ආදරය කරන බව තේජානි දැන සිටියාය... වැදූ මව්පිය දෙදෙන නොව සසර පුරා ඔහුගේ මව්පියන් වී සිටින්නට ඇත්තේ සමහරවිට මේ දෙමව්පියන් දෙදෙනාම වන්නට ඇත... ජීවිතය ගැන සිතාගත නොහැකිය... දූන් නැගණිය අම්මා හා තාත්තා ලෙස සලකන්නේ බොතේජු යුවළය... ඔවුන් දෙදෙනාගෙන් කෙදිනකවත් නැගණියට වරදක් සිදුවී නැත... වැරැද්දක් කළ විට අන්කල් නැතිවුවද ආන්ටි නම් පහරක් දෙකක් ගසන බවද තේජානි දැන සිටියාය... ඒ වූවායැයි කියා රසිකා කවදාවත් බොතේජු යුවළ ගැන නරකක් කීවේම නැත... ඇයද ඔවුන්ට ආදරේය... ඔවුන් වෙනත් සසරකදී ඇයගේ දෙමාපියවරුන් වී සිටින්නට ඇත...

මේ ජීවිතයේදී මුහුණ ගැසෙන්නේ සසර පුරා මුහුණ ගැසුණු පුද්ගලයින්ය... ඒ අනුව බලද්දී ආරතීද කෙදිනක හෝ සසරේදී ඇයගේ සොහොයුරියක් හෝ වී සිටින්නට ඇත...

සංජය... සංජය ඇයගේ කවරෙක් හෝ වී සිටින්නටත් ඇත...

ඇයගේ සිරුරම කිලි පෙලුවේය... තමාට නම් එවැන්නෙක් තවමත් මුණ ගැසුණේ නම් නැත... එහෙත් ඇයට අවශ්‍ය වූයේ සංජය වැනි

නැතහොත් දූන් තැනැත්තෙක් නම් නොවේ... ඔවුන්ට වැඩ වැඩිය... නැතහොත් දූන් තැනැත්තෙක් නම් නොවේ... ආරතී ගැන සොයන්නටවත් ඔහුට වේලාවක් නැති තරම් තම... එවැන්නන්ගෙන් ලැබෙන ආරක්ෂාවක් නම් නැත... වන්නේ ඔවුන්ගේ ඔනෑඑපාකම් ඉෂ්ට කරගැනීමට සිරුර දන්දීමට සිදුවීම පමණකි... එය ආදරයැයි ආරතී හැඳින්වූවාට තමාට නම් හැඳින්වීමට නොහැකිය...

ආදරය කරන්නේ නම් මේ වෙලාවේදී ඔහු ඇය සෙවීමට මෙයට වඩා වෙහෙසක් දැරිය යුතුය... ආරතීට සමහරවිට කරදරයක් සිදුවී ඇත්තේද ඔහුගේ බලවත්කම හේතුවෙන්ම නිසාම බව ඇයට නම් කිය හැකිය...

තේජානිට නම් ඔහු වැන්නෙක් අවශ්‍යම නැත... ඇයට ඔහු බොරුකාරයෙක්ම පමණකි... ධනය බලය හා රූමත්කම නිසාම කෙල්ලන් පෙළන්නෙකි... ඔවුන් වැන්නන්ට වඩා මයන්ත වැන්නන් දහසෙන් සම්පතකි... මයන්තගේ හිත ගත් අයියා පිළිබඳව ඇයගේ සිතට සැබැවින්ම දූන් නැඟී තිබුණේ කුතුහලයකි... ඔහු වැනි අයියෙක් සිටියේ නම් මයන්තට සිතුණේ නම්... ඔහුද මයන්ත වැන්නෙක් විය යුතුය... ඇය සිතමින්ද සිටියාය... අවුරුද්දක්ම ගත වුවද ඇයට නම් කවරෙක්වත් එම වේදිකාවේ රංගනයන් දුටු පසු හෝ ගීත ගැයූ පසු කථා කළේම නැත...

එදා නම් ඉන්දියානු ජාතිකයා කියා තිබුණේ ඇය ඉන්දියාවේ හෝටලයේ ගී ගැයීමටද රැගෙන යාමට ඔහු සතුටු බවකි... එයට මෙනාලි හෝ අයෝමා කැමැති වී නැත... කෙසේ වුවත් ඔවුන් තමාට මෙම හෝටලයෙන් කවදාවත් එලෙස ඉදිරියකට යෑමට නම් තැනක් ලබා නොදෙන බව දූන් තේජානි හොඳින්ම දූන සිටියාය... මයන්ත පැවසුවේද එයය... මෙය යන්නේ ලොකු ලොක්කන් හරහා නොවේ... ඇයගේ නම වෙනස් කර කටහඬ ගැනීමටද තැනැත්තා කැමැත්ත පළකර ඇත... කෙසේ වුවත් තමාගේ ජීවිතය හිමි තමාටය... මයන්ත කීවා නිවැරදිය... මෙය පොට්ට චාන්ස් එකකි...

ඇය තිගැස්සී බැලුවේ වාහනය විසල් කාර්යාල සංකීර්ණයක් ඉදිරියේ නතර කරද්දීමය... එය සුපර් මාර්කට් එකක් බඳුය... ඇය ඒ නම අසා තිබුණේ පුවත් පත් වලින් පමණකි... එහි උඩ මහල් නිවාසද තිබෙන බව ඇය දන්නීය...

"මෙකද තැන...?" ඇය ඇසුවේ මයන්තගෙනි... මයන්තට වැරදුණා වත්දැයි ඇයට සිතිණි...



"මෙතන තමයි... මේකේ එක පැත්තක එයාගේ ඔෆිස් එක තියෙන්නේ..."

"මේකට සෑහෙන්න කුලියක් දෙනවා ඇති..." කීවේ මයන්තගේ පියාය...

"ඔව්... ඒත් එයා විතරක් නෙවෙයි... දෙන්නෙක් එකතු වෙලා තිව්වා කරන්නේ..." මයන්ත කීවේ අද උදේ අරෝෂ කී කථාවෙන් කොටසකි... සැබැවින්ම අරෝෂට උවමනා වී තිබුණේ ඔහු සාමාන්‍ය නීතිඥයෙක් බව පමණක් පෙන්වීමටය...

"මං යන්නද පුතා...?" මයන්තගේ පියා ඇසුවේය.

"පොඩ්ඩක් ඉන්න තාත්තා... කොහේට කොහේට යන්න වෙයිද දන්න නෑ... ටිකක් වෙලා ඉන්න මෑන් ගිටියොත් මං කථා කරලා තාත්තාට එන්න වෙලාව කියන්නං..."

"මෑන් ගිටියොත් කියන්නේ දූන් අහලා නෙවෙයිද ආවේ...?" තේජානි ඇසුවේ අමනාප ස්වරයකිනි... මයන්ත තම්...

"අහලා අහලා... ඒත් ඉතින් මේ වගේ බුවාලා ගැන මට කියන්න බෑ නේ අක්කෙ..." කියූ මයන්ත ත්‍රීරෝද රථයෙන් බැසගත්තේය... තේජානිද ඔහු පිටුපසින්ම බැස ගත්තාය.

මයන්ත තේජානි හා සංකීර්ණය දෙසට ගියේය...

"මේකේ ෆර්ස්ට් ෆ්ලෝර් එකේ කිව්වා..." කියමින්ම මයන්ත පියගැට පෙළ දෙසට ගියේය...

"ඒකේ නම අහගත්තද...?"

"ඔව්... රත්න ගෲප්ස්..."

"එතකොට ඒක ලෝ කම්පැනි එකක් නෙවෙයි නේ..."

"ඒකේ තවත් මොනවද කම්පැනිස් වගයක් තියෙනවා කිව්වා... ඒකයි...එ..." කියූ මයන්ත ඇය දෙස බැලුවේය... "ඔයා හොඳයි ලෝ කම්පැනි එකට... දූන් මේ ඇහුව ප්‍රශ්න ගැන දූනගත්ත නං බුවා ඔයාව තියාගන්නවා ඒ කම්පැනි එකේ..."

"මේ මෙතන්දි වැරදිලාවත් එයාට ඔයා බුවා බුවා ගැහුවොත් මටත් යන එන මං නැතිවෙයි..."

"ඔයාට නෙවෙයි එහෙම වෙන්නේ මට... එයාට ඔන කරලා තියෙන්නේ ඔයාගේ කටහඬ මිසක් මාව නෙවෙයි නේ..."

"කමක් නෑ... එහෙනං මං බුවා බලන්නං... ඔයා යන්න..."

"මං යන්නද...?" අසමින් මයන්ත නැවතී පිය ගැට පෙළේ හැරුණේය...

"මෙන්න මෙහේ යං පිස්සු නටන්නෙ නැතුව..." තේජානි මයන්ත අල්ලා අනික් දෙසට හැරෙව්වාය... "දැන් ඔයා ගියාම මේ බුවා කවුද කියලා මං දන්නවද...?"

"දැන් රජෝ ඔන්න ඔයා තමයි බුවා කියන්නෙ... බුවාට ඇහිලා මොනවා හරි කරන්න ආවොත් මං දුවනවා..." කියමින්ම මයන්ත දිග සඳළුතලයට පා තැබුවේය...

"ඉතින් මට ඔයා මේ මෑන් ගේ නම කිව්වය... බුවා කිව්වා මිසක්... නැත්තං අයියා කිව්වා..." කියමින් තේජානිද එයාට පය තිබ්බාය...

"මෙතන වෙන්න ඇති කිව්ව තැන..." මයන්ත ඇයගේ කීමට කිසිවක් නොකියා පසෙක තිබූ කුඩා ලෑලි බෝඩ් එකක් දෙස බැලුවේය... ඉන්පසු තේජානි දෙස බැලුවේය.

දෙදෙනම එම කොරිඩෝවට පා තැබූහ... එක් පැත්තක දොරක මයන්තට කියූ අංකය ගසා තිබිණ... අනික් පැත්තේ අංකයක් නොතිබුණද දොරක් තිබිණ... මයන්ත තේජානිට නවතින්නට අතින් සන් කරමින් දොර විවර කළේය...

එතනම කුඩා මේසයක වාඩිවී සිටි යුවතියක් දොර විවර වන්නාහාම ඒ දෙස බැලුවාය...

"මිස්ට සෙනෙවිරත්න..." මයන්ත ඇසුවේය...

"එපොයින්ට්මන්ට් එකක් තියෙනවද...?"

"ඔව්... මගේ නම මයන්ත..."

"ආ... මට කියලා ගියේ... සර් දැන් කම්පාර්ට්මන්ට් එකේ ඇත්තේ... ඔතන එහා පැත්තේ දොරේ බෙල් එක ගහන්න..." ඇය කීවේ එවර තරමක සිනහමුසු මුහුණකිනි.

දොර වැසූ මයන්ත තේජානි දෙස බැලුවේය...

"මෑන්ගේ කම්පාර්ට්මන්ට් එක මේ පැත්තෙළු..."



"සැහෙන හයිකාර බුවෙක්..." තේජානි කෙඳිරුවාය... මයන්ත දොරේ සීනුව නාද කළේ එයට සිනහසෙන අතරමය...

ඔවුන්ට වැඩි වේලාවක් සිටින්නට සිදුවූයේ නැත... කවරෙක් හෝ දොර විවර කළේය... ඒ අරෝෂ නොවිණ...

ඔහු තරමක වයසක තැනැත්තෙකි... තේජානිට සිනහවක් නැගුණේ ඒ බුවාගේ වයස ගැන සිතෙද්දීය... මයන්ත මොහුට අයියා යැයි අමතන්නේ කිමදැයි ඇයට සිතුණු මුල් කාරණය විය...

එහෙත් ඒ ඔහු නොවන බව ඇයට ක්ෂණයකින්ම සිතුණේ... මයන්ත දකිද්දී ඒ තැනැත්තා කුතුහලයක් මුහුණට නගා ගත් බැවිනි... ඒ මයන්ත කියූ බුවා නම් ඔහුගේ මුහුණේ නැගිය යුත්තේ සිනහවකි...

දැන් ඒ මුහුණේ කුතුහලය ඉවත්වී සිනහවක් නැගී තිබිණ. මයන්තගේ සිනහවට විය යුතුය...

"මිස්ට සෙනෙවිරත්න..."

"මහත්තයා ඉන්නවා... මේ... මිස්ට මයන්තද...?" ඔහු ඇසුවේය... මයන්ත හිස සෙලවූයේය.

"එන්න එන්න... වාඩිවෙලා ඉන්න කිව්වා... මහත්තයා නාන්න ගියා..." වයසක තැනැත්තා කීවේ තේජානිගේ මුහුණට සිනහවක් නංවමිනි...

වෙන තැනකදී නම්... ඒක හොඳයි... ඇය කියනු ඇත...

ඇයගේ සිතිවිලි තේරුම් ගත් නිසා මයන්ත සිනහ කටක් මවමින් ඇය දෙස බැලුවේය...

ඒ අතර වයසක තැනැත්තාද හොඳින්ම බැලුවේ ඇතුළුවූ රූමතිය දෙසය... ඇය අසහාය රූමතියක් නොවතුදු දකිද්දී සැබැවින්ම සිත් පහන් වෙන ගතියක් ඇයගේ රුවේ තිබෙන බව එම තැනැත්තාටද සිතුණේය... මයන්ත නැමැත්තා බොහෝ දඟකාර කමක් ඇති කොල්ලෙක් බව ඔහු නම් එක වචනයෙන්ම දැනගත්තේය... මේ අක්කා හා මල්ලී විය යුතුය... ඔහු අරෝෂගේ පුද්ගලික ජීවිතය ගැන කවදාවත් සොයන්නට නොගිය තැනැත්තෙකි...

රත්න ගෲප් හී සේවයට පැමිණි ඔහු අරෝෂගේ මෙම නිවාසයේ සේවයද සිය කැමැත්තෙන්ම බාරගත්තේ ලියෝ අන්කල් හඳුනන්නෙක් හෙයිනි... ඔහුගේ බිරිඳ නැත... දරුවන් දෙදෙනම

විවාහපත්වී සිටියහ... ඉඳහිට ගමට ගියද ඔහුට නිකම සිටීමට නොහැකිය... එහෙයින්ම ඔහු අරෝෂගේ මෙම නිවාසය බලා ගැනීමේ වගකීමද අතට ගෙන සිටියේය... අරෝෂ මෙම නිවසේ සිටින්නේ සතියකට දින දෙක තුනකි... අනික් සැමදාමත් ඔහු සිටින්නේ ඔහුගේ නිවසේ බව නම් මේ තැනැත්තා දන්නේය... එහෙත් මෙලෙස නිවාස දෙකක ඔහු සිටින්නේ කිමදැයි කියන්නට නම් ඔහු නොදත්තේය... කිසි කෙනෙකුටත් තමාගේ අනික් නිවාසය තිබෙන තැන නොකියන ලෙස නම් ඔහුට අරෝෂ දන්වා තිබිණ...

"වාඩිවෙන්න මං මහත්තයාට කියන්නං... මහත්තයා කිව්වා දූන් එයි කියලා..." කියාගෙන තැනැත්තා පිටුපසට ගියේය...

ඇතුල්වූ ඇය වටපිට බැලුවාය... තරමක් විසල් සාලයකි... එහි තිබුණු ගෘහ භාණ්ඩද සෑහෙන වටිනාකමකින් යුක්ත බව ඇයට සිතිණ... නෙත් දෙක සාලය සිසාරා යැවූ ඇය බැලුවේ මයන්ත දෙසය...

ඔහු ඔහුගේ නිවසක මෙන් වාඩි ගත්තේය...

"වාඩිවෙන්න..." මයන්ත කීවේ තේජානිටය...

"හරියට ඔයාගේ ගෙදර වගේ නේ..." කියාගෙන තේජානිද වාඩි ගත්තාය...

"මේ මගේ අයියා බුවානේ..."

"පිස්සු නටන්න එපා... මේ මිනිස්සු ඔයාට විතරක් නෙවෙයි ගහලා එලවන්නෙ මාවත්..." කියූ ඇය වේලාව බැලුවාය... "අන්කල්ට කියන්න එහෙනං..."

"අමතකම උනා..." කියූ මයන්ත ජංගම දූරකථනය ගෙන සවණට තබා පියාට යන්නටයැයි කීවේය... "අපි මෙක ඉවරවෙලා කථා කරන්නං තාත්තෙ... නැත්තං වෙන එකක හරි..."

"වෙන ඒවයේ යන්න එපා පුතා... මට කථා කරන්න... මගේ හයර් එක පැයෙන් ඉවරයි..." පියා කීවේය...

"කිව්වද අන්කල්ට එන වෙලාව..." තේජානි ඇසුවේ පියාගේ කථාව නිම කොට එන මයන්තගෙනි...

"තාත්තාට කියන්න කිව්වා... තාත්තාට තියෙන්නේ පැයක විතර හයර් එකක් ඔ... අපිට වෙන ඒවායේ යන්න එපා කිව්වෙ... තාත්තා බය ඇති දූන්..."



තේජානි සුසුමක් හෙලා එවර පසෙක තිබූ සඟරාවක් ගත්තාය... එය නළු නිළියන්ගේ සඟරාවකි... මයන්ත කිවාක් මෙන් මොහු නම් පිස්සෙක් විය යුතුය... එහෙයින්ම මයන්තට සිනට අල්ලන්නට ඇත... සමහරවිට මෙම කටහඬ පරීක්ෂණය බොරුවක් වන්නටද පිළිවන... ඇයට මයන්ත ගැන කෝපයක් දැණුනද, දෙවන වර එය නවත්වා ගත්තාය... ආරතීට වූ මෙම අකරතැබ්බයෙන් පසු මයන්ත තමා මෙම රැකියාවේ ඉන්නවාට එතරම් කැමැත්තක් නොදක්වන බව මතක් කර ගනිමිනි... ඔහු මේ සියල්ල කරන්නේ තමා මෙයින් ඉවත්වන්නේ නම් හොඳයැයි සිතාගෙන මෙනි... එහෙත් තමාගේ බැඳුම් කරය ගැන මතක් වෙද්දී ඇයට නම් එම සේවාවෙන් ඉවත්වීම යනු සිහිනයකි...

ඇයට එහි සිටින සමහර නිළියක දකිද්දී ආරතී මතකයට ඒම වලක්වනු නොහැකිය... ආරතී බොහෝ නිළියන්ට වඩා රූමත් බව සියල්ලෝම අවිවාදයෙන්ම පිළිගෙන තිබිණ.

යළිත් වරක් වයසක තැනැත්තා ආවේය... තේජානි හැරී බැලීමට උනන්දුවක් නොදැක්වූයේ සඟරාවේ විහිළු කථාවක් අසුවූ බැවිනි...

"මං යනවා... මහත්තයා එයි... තව ටිකකින්..." කියාගෙන වයසක තැනැත්තා එවර දොරින් පිටවූණේය... මයන්ත එවර නැගිට පසෙක තිබූ වෙනත් සඟරාවක් ගත්තේය... එහි පිටු දෙකකට වඩා පෙරළන්නට ඔහුට නොපිළිවන් විය... අරෝෂ විසිත්ත සාලයට පා තැබුවේය... තේජානිගේ දෑස මෙන්ම සිතද සඟරාවේ ඇලී තිබුණ හෙයින් බුවා එන හඬ ඇසුණේම නැත... මයන්ත නම් ඒ දෙස එක්වරම බැලුවේය... ඔහුට සඟරා කියවන්නට ආශාවක් ඇත්තේම නැත...

★★★

"කොහොමද මයන්ත...?" අරෝෂගේ හඬින් තේජානි සැලුණේ සැබැවින්ම අනපේක්ෂිත අන්දමින් ඇයගේ පිටුපසින්ම එම හඬ නැගුණු හෙයිනි... ඇයට පිටුපස බලන්නට බියක්ද දැණුනු තරම්... කටහඬ ගැන සිතද්දී නම් සංජයගේ තරම් ගැඹුරු හඬක් නොවූවද, අනුන් පාලනය කිරීමට හැකි කටහඬක් බව ඇයට සිතිණ... කිවාක් මෙන් මේ නම් එතරම් වයසක තැනැත්තෙක් විය නොහැකිය... ඇයට ඔහු බලා ගැනීමට ආශාවක් ආවද, හැරී බැලීම එතරම්ම නොයැයි නොසිතුණෙන් ඇයගේ හැඟීම වහා නවතාගත්තාය...

අරෝෂට අවශ්‍ය වූයේ මෙම තරුණිය දැකීමටය... එහෙත් ඇය හැරී නොබැලුවාය... සමහරවිට ඇය එතරම් රූමතියක් නොවන බව සංජයගේ අදහස නිවැරදියැයි ඔහුට ක්ෂණයකට සිතුණේය... එසේ නොවේ නම් ඇය වැන්නියක් තමා හඳුනාගැනීමට පැමිණ ඒ දෙස නොබලා නොසිටින බව ඔහු දත් හෙයිනි.. තේජානි බොහෝ වෙනස් ගති ගුණ ඇති තරුණියක බව දැනගැනීමට තරම් තවමත් ඔහු ඇය ගැන දන්නේ නැත...

"අපිට ඉක්මණට යන්නත් ඕන අරෝෂ..." කියද්දී තේජානි පුදුමයෙන් මෙන් ඉදිරියේ සිටි මයන්ත දෙස බැලුවාය... ඔහුගේ නම අරෝෂය... ඇයට මතක් වූයේ හිස කෙස් සුදුවූ තැනැත්තෙකි... එවැන්නෙකුට මෙවන් නමක්...

"ආව ගමන්ම යනවා කිව්වම... ආව වැඩේ ගැනවත් කථා කරගන්නේ නැතුවද...?" අසමින්ම අරෝෂ තේජානි වාඩිවී සිටි අසුන පැත්තකින් ඉදිරියට ආවේ ඇය දෙස බලමිනි... ඇයද ඒ ලෙස සිටිමින්ම අරෝෂ දෙස බැලුවාය...

සාමාන්‍ය ගණයේ තරුණියක බලන්නට සිටි අරෝෂ ඇයගේ රූමත්කම දකිද්දී බෙහෙවින්ම පුදුමයට පත්වූ අතර, බූවා යැයි කියමින් විහිළු කළද තැනැත්තාගේ කඩවසම්කමත් සිත් ඇදගන්නා පිරිමිකමත් දුටු විගස තේජානි හදවතින්ම සැලුණාය...

ඒ නම් සංජය කෙරෙහි නැගුණු කෝපය හෝ බිය වැන්නකින් නොවන බව ඇයට සහතිකය... එහෙත් මයන්ත කියූ කාරණා වලින් ඇයගේ සිතේ ඇය මවා ගෙන සිටි රූපයට වඩා හාත්පසින්ම වෙනස් රුවක් ඇය ඉදිරියේ දිස්වෙද්දී පළමුව නැගුණු තැති ගැන්ම හා සැලීම පරයා ඇයට දෙවනුව සිතට සිතහවක් නැගී තිබිණ... එහෙත් සිතට නැගී සිනහව මුවට එන්නට පෙරම වියැකී යමින් තිබිණ...

මයන්ත කීවේ සත්‍යයකි... ඔහුගේ වයස නම් කීමට නොහැකිය... සංජයගේ වයස මෙයට වඩා පෙනෙන බව ඇයට සිතිණ... සංජයගේ තිබෙන්නේ බලය හා ධනවත්කම නිසා ඇති ආත්මශක්තියේ බලයේ පිහිටෙන් දක්නට හැකි වයසකි...

එහෙත් මොහු නම්...

ඇයට සිතුණේ මේ කුඩා තත්පරයේදී සිතිවිලි දහසක් සිත



තුළ නිපදී අවසන්වූ බවය... සිතාගත නොහැකි වූ රුව නිසා ඇයට මේ තැනැත්තා හා කරමක් සිනහසෙන්නටද නොහැකි වූ තරමය...

ඒ සිතිවිලිම අරෝෂගේ සිතේද පැණ නැගුණ බව ඇයට හෝ මයන්තට වැටහුණේ නැත... ඇය මෙන් නොසැලුණේ වුවද, අරෝෂ සැබෑවින්ම පුදුමයට පත් වුණේ ඇය ගී ගායනයේදී හා රංගනයේදී මෙම රූමත්කම සඟවා ගන්නට පෙළැඹී තිබීම ගැනය... බොහෝ ගැහැනුන් ඔවුන්ගේ රූමත්කම මෙලෙස සඟවා ගන්නට පෙළැඹෙන්නේ නැත... විශේෂයෙන්ම එවන් රැකියාවකදී...

මයන්තට ඒ දෙදෙනාගේම හැඟීම තේරුණේ නැත... ඔහුට අවශ්‍ය වූයේ තේජානි හඳුන්වා දීමටය... ඇයට වඩාත් සුදුසු රැකියාවකට යොමු කරලීමටය... ඇය තවදුරටත් මෙම රැකියාවේ යෙදී සිටියහොත් තමාට තවත් සොහොයුරියක් නැතිවී යන්නට ඉඩ තිබෙන බව ඔහු සිතමින් සිටියේය... ආරතී ඇයගේ කැමැත්තෙන් සැඟවී සිටියේ වුවද, ඒ සියල්ල සිදුවූයේ මෙම රැකියාව හේතුවෙන් බව ඔහුට අමතක කර ගත නොහැකිය.

ආරතීගේ ජීවිතය සංජය බලාගනු ඇත... ඇයට මෙම හෝටල් රැකියාවේ සිටියද නොසිටියද ඔහුගෙන් පිටිවහලක් ලැබෙනු ඇත... එහෙත් දැන් ආරතී නැති හෙයින් තේජානි මොන ක්‍රමයකින් හෝ රඳවා ගන්නට හෝටල් බලධාරීන් සිතාගෙන සිටින බව දැන් ඔහුට හොරහසක් වී තිබිණ... ඇයගේ දක්ෂකමට එදා ඉන්දියාවෙන් ආ තැනැත්තාද පැසසූ හෙයිනි... ඉන්දියාවේ හෝටලයේ ගීගැයීමට ඇරයුම් කිරීමෙන් ඔහු එය කෙතරම් අගය කළේදැයි කවුරුත් දැන සිටියහ... එහෙත් ඇයව එලෙස යවන්නට හෝ හෝටලයේ බලධාරීන් උනන්දුවක් දක්වූයේ නැත... දැන් තේජානි මෙම හෝටලයට ධන උපයන උල්පතක්ව තිබෙන බව ඔවුන් අතර සාකච්ඡා වූ බව මයන්ත දැන ගත්තේ හොර රහසෙනි...

ඔහුට ඒ මොහොතේදී සැහෙන දුකක් දැනිනි... ඒ පසුතැවිල්ල හා වේදනාව තේජානි මේ තැනැත්තා ඉදිරියට පත් කරන්නට තරම් දැඩිව බලවත්ව තිබූ බව ඔහුට වුවද තේරුණේ නැත...

"එතකොට මයන්ත... මෙයාද අර ඊයේ ඇස් වහගෙන සිත්ද කිව්වෙ...?" අරෝෂ සියලුම සිතිවිලි නවතාගෙන ඇය දෙස බලමින් සිට ගත්තේය...

"මෙයා තමයි... ජානි..." මයන්ත කීවේ සිනැහෙමිනි...

"ජානි කිව්වෙ තේජානි කියන එකට නේද...?" අරෝෂ අසද්දී නම් තේජානිගේ සිනහවක් නැගිණ... ඒයේ මයන්ත තමාගේ නම එතනදී කියෙවූ බව කීවේ නැත...

තේජානිගේ සිනහවද බොහෝ පියකරුය... අරෝෂට වටහ සිතුණේ සංජය මේ තරුණිය මෙලෙස පියවි ස්වරූපයෙන් දකින්නට නැති බවය... එලෙස දුක්කේ නම් සමහරවිට ඔහු මැය හා මිතුරුවීමට තිබිණ... සංජය මැයව දකින්නට ඇත්තේම වෙස්වලාව සමගය... ආරතීද එලෙස බලද්දී නම් රූමතියක බව සත්‍යයකි... එහෙත් මැය විසින් කළා යැයි කියූ කථා දෙස බලද්දී මැය ආරතීට වඩා බුද්ධිමත් බවද ඔහු සිතුවේය...

"අපි ඉතින් මෙයාට කවදත් කථා කළේ නං ජානි කියලා..."

"තේජානි මියුසික් කරලා තියෙනවද...?" අසමින්ම අරෝෂ ඇය ඉදිරියෙන්ම වාඩිවුණේය.... ඇය සිටි පියෙන් තුලක්වත් නොසෙල්වුණාය. එහෙත් හිස සැලුවාය... පිළිතුර ඔව්... බව එයින් කියැවිණ... අරෝෂට මතක් වුණේ සංජයගේ කීමය...

...ඒකි මහ රාජිණි වගේ හිතාගෙන දුක්කද අර මළුව නවපු හැටි...

ඔහු කෝපයෙන් කීවේ සියල්ලෝම ඇයගේ ගී ගායනයේදී නැගිටි වෙලාවේ රූප රාමු තිරයේ දිස්වෙද්දීය... ඒ මොහොත මතක්වූ අරෝෂට සිනහවක් නැගුණද ඔහු එය වෑයමෙන් වළකා ගත්තේය...

"මියුසික් කරලා තියෙනවා කියන්නෙ... ඕලෙවල් ඒ ලෙවල්ද නැත්තං සෞන්දර්යය විශ්ව විද්‍යාලය වගේද... නැත්තං..."

"මං නැවැත්තුවෙ විශාරද එග්සෑම් එකෙන්... ජන සංගීතය ඕලෙවල්වලට කළා..."

අරෝෂට සැබැවින්ම එවර නම් පුදුමයක් දැනිත... එපමණක දුර ගිය තැනැත්තියක් මෙලෙස මෙවන් තැනකට කොටුවී සිටින්නේ... ඔහුට ඇය ගැන වඩාත් දැන ගැනීමටද අවශ්‍යවිය. සියල්ලටමත් වඩා ඇයගේ හඬ... එය මෙලෙස කථා කරද්දීත් ගීතයක් වැනිය.

"පුද්ගලික කරුණු අහනවා කියලා හිතන්න එපා... ඇයි නැවැත්තුවෙ...?"



තේජානි අරෝෂ දෙස බැලුවාය... ඇයට මේ තැනැත්තා ගැන දැඩි විශ්වාසයක් නැගිණ.

"කියන්න පුළුවන් පුද්ගලික කරුණක් නේ ඇහැව්වෙ... නැවැත්තුවෙ අම්මලා නැති උන නිසා..."

"එහෙමද...?" යන ඇසුවේ ඇයගේ එම කථාවෙන් සිතට නැගි [illegible] යනුවය... ඇය බිය සැක නැති තරුණියකි...

"ඔව්... මගේ අම්මයි තාත්තයි දෙන්නම එකට නැති උනා ඇක්සිඩන්ට් එකක් වෙලා..." තේජානි එවර කීවේ බොහෝ පැහැදිලි ස්වරයකිනි.

"සොරි..." අරෝෂ කීවේ මේ සියලු විස්තර පසුව සෙමින් මයන්තගෙන් හෝ නැතහොත් ඇයගෙන්ම අසා ගැනීමට සිතමිනි... කියන්නට පිළිවන් පුද්ගලික කරුණක්... ඇයට කියන්නට බැරි කරුණුත් තිබෙනවා වැනිය... අරෝෂ සිතුවේය... එහෙත් ඒවා මෙලෙස අසන්නට නොහැකිය... පළමුවරට සංජයට වඩා මේ යුවතිය ගැන ඔහුගේ සිතේ තද විශ්වාසයක් ඇති විය...

ඇය එයට කිසිවක් කියන්නට නොගියාය... සොරි... යැයි බොහෝ අයට කණගාටුව ප්‍රකාශ කිරීමට පිළිවන... එහෙත් කිසිවෙකුට හෝ කිසිවකට තමාගේ නැතිවූ දෙමාපිය දෙදෙනාගේ ජීවය යළිත් ලබා දීමට නොහැකිය.

කල්පනාවක නිරතවූ ඇය දෙස ඔහුගේ නෙත් යළිත් යොමු විය. මයන්තගේ දුරකථනය හඬ දුන්නේය... ඔහු එය අතට ගෙන එහි අංකය බැලුවේය... ඉන්පසු තේජානි හා අරෝෂ දෙස බැලුවේය...

"මගේ යාළුවෙක්... මං ඔය දෙන්නට කථා කරන්න දීලා අරහෙට ගිහින් කෝල් එක ගන්නං..." තේජානි එපා කියන්නටද පළමු මයන්ත නැගිට සඳළුතලය දෙසට ගියේය...

අරෝෂ හා තේජානි තනිවිය... දෙදෙනාම මයන්ත සඳළු තලය දෙසට යන තෙක්ම බලාගෙන සිටියෝ ඔහු සඳළු තලයේ මවුත්ට නොපෙනෙන සේ වාඩි ගත්තා වනැයි සිතෙද්දී දෙදෙනාට දෙදෙනා දෙස බැලූහ...

දෙදෙනාටම එක්වරම සිනහවන් නැගිණ... නිහඬතාවය බින්දේ යළිත් අරෝෂ විසිනි.

"අකැමැත්තක් නැත්තං... ඔයාගේ ගැන පොඩ්ඩක් විස්තර කියන්න..."

"පොඩ්ඩක්...?"

"ඔව්... අම්මලා නැතිවෙද්දි ඔයා ඉගෙන ගත්තවද...?"

"නෑ... මං වාසිටි යන්න ඇප්ලිකේෂන් ගෙනැල්ලත් තිබුණේ... ඒත්... මට ඒක හින්දා ඒකට යන්න හම්බ උනෙත් නෑ..."

"ඔයාගේ රිසල්ට්ස් මොනවද...?"

"මට ඇත්තටම ඒ තුනක් තිබුණා... මං කළේ කොමර්ස්... අන්තිමේදී මං නැවතුණේ මෙතන..."

අරෝෂ හිස සැලුවේය... වෙනත් වෙලාවක ඇයගේ විස්තරය හොඳින්ම දැනගත යුතුය... ඔහු සිතාගත්තේය...

"මයන්ත මං ගැන ඔයාට කිව්වද නොකිව්වද කියලා මං දන්නේ නෑ... ඒත් එක දෙයක් තියෙනවා... ඔයා නැවතුණ තැන වැරදි තැනක් නං නෙවෙයි තේජානි... ඔයාගේ දක්ෂකම එතනදි මාත් දැක්ක නේ... ඒත් එතනදි ඔයාට ඉස්සරහට යන්න තියෙන ඉඩකඩ අඩුයි... ඔයාගේ සිංගින් නං එක්සලන්ට් කියලා මට දැණුනා... ඒකයි මං ටිකක් ඔයා ගැන මයන්තගෙන් ඇහුවෙත්..."

"මයන්ත මාව කපලම දැම්මද දන්නෙ නෑ..." තේජානි කීවාය...

අරෝෂට සිනහවක් නැගිණ... ඇයගේ පිළිතුරටම නොව සංජය හා ඇය අතර වාග් මාලාවේදී ඇය මෙතරම් සජීවී පියවි අන්දමින් කථා කළා ඔහුට නොසිතුණ බැවිනි. ඒ මොහොතේදී ඇය සිටින්නට ඇත්තේ එක් මොහොතකදී කෝපයෙනි... අනෙක් මොහොතේදී වේදනාවෙනි...

"අපෝ නෑ... මයන්ත කිව්වේ ඔයාට වගේ වෙන වෙන භාෂාවල් වලින් සින්දු කියන්න කාටවත් බෑ කියලා..."

"සමහරවෙලාවට අනික් අයටත් ඒ දක්ෂකම ඇති... කියන්න බයයි මං හිතන්නේ..." තේජානි කීවාය...

අරෝෂට උවමනා වූයේ ආරතී ගැන දැන ගැනීමටය... ඇය පිළිබඳව දැන ගන්නට නම් තවත් ටිකක් මැයට ළං විය යුතුය...



"එහෙම වෙන්නෙ නෑ තේජානි... කොච්චර කොහොම උනත් දක්ෂකමක් තියෙන කෙනා ගැන අනික් අයට තේරෙනවා... ඔයාගේ සින්දු ගැයීමේ වෙනසයි අනික් අයගේ සින්දු කීමේ වෙනසයි මට එදාම දැණුනා..."

"වෙනදා එන්නෙ වෙන යාළුවෙක්... එයා එදා හිටියේ නෑ... එයාපත් හොඳට සිනදු කියනන පුළුවන්..." තේජානි කීවේ එවර සිහින් සරෙනි...

"වෙන යාළුවෙක් කිව්වේ පිරිමි ළමයෙක්ද...?"

"නෑ... ආරතී කියලා... මගේ රූම් මේට්..."

"එයා මොකද දැන්...?" අරෝෂ නොදන්නා තාලයෙන් විමසුවේය... මෙලෙස යන්නේ නම් ඇයගෙන් විස්තරයක් දැනගැනීම බොහෝ පහසුය... සංජය කියන්නාක් මෙන් මැය ආරතී සඟවා ගෙන කථා කරන්නියක නම් මෙලෙස තමා හා ආරතී ගේ නමවත් නොකියනු ඇත... පළමුවරට අරෝෂට ආරතීගේ ජීවත්වීම ගැන සැකයක් හා තරමක බියක් දැණිත... "අසනීප වෙලාද...?" ඔහු ඇසුවේ තේජානි පළමු පැණයට පිළිතුරක් දෙන්නටද ප්‍රථමය.

"නැහැ..." තේජානිට කියද්දීම දැසට කඳුළක් නැගිණ...

"ඉතින් එහෙමනං මොකද...? එයා එතන ජොබ් එකෙන් අයින් උනාද...?"

තේජානි අරෝෂ දෙස බැලුවාය... ඇයගේ සිතට මයන්තගේ වදන් මතක් විය... මැන්ගෙන් අපිට මේක ගැන හරි උදව්වක් ගනැකිනේ ජානියො... අපිට කියලා කවුද ඉන්නේ පිට තැනක කවුරු හරි කරවා ගන්න පුළුවන් සපෝටරයෙක්...

අරෝෂ බොහෝ උනන්දුවෙන් ඇය දෙස බලාගෙන සිටියේ ඇයගේ වෙනසක් අල්ලා ගැනීමට වුවද එය තේජානිට නම් නොතේරිණ... ඇය සිතුවේ තමා කියන්න ගැන දැඩි උනන්දුවකින් සවන් යොමා සිටින තැනැත්තෙකි... මොහු නීතිඥවරයෙකි... සමහරවිට කිසියම් හෝඩුවාවක් සපයන්නටද හැකියාවක් තිබෙනු විය හැකිය... ඇය ආරතී ගැන කියන්නට සිතුවාය... මයන්ත සමහරවිට තරහනු වෙන්නේද තමා මොහුට සියල්ල කියන්නට පටන් ගන්නා තෙක් විය හැකි බවද ඇයගේ සිත කියමින් තිබුණේය.

"ඒ කිසිම දෙයක් නෙවෙයි මිස්ට අරෝෂ..." ඇය කීවේ සිහින් හඬිනි...

"මගේ නම අරෝෂ... මං ඔයාට මිස් තේජානි කිව්වෙ නැහැනේ... මටත් ඔයා අරෝෂ කියන්න... ඒ ඇති... ෆුල් නේම් එක නම් සෙනෙවිරත්න බණ්ඩාරලාගේ අරෝෂ චානක සෙනෙවිරත්න..." ඔහු කියාගෙන යද්දී සැබැවින්ම තේජානිට සිනහවක් නැගිණ... ඇය සියල්ල මොහුට කියන්නට තීරණය කළාය... ඔහු ඔහුගේ මුළු නමම කීවේ තමාට කිසියම් පහසුවක් කරදීමට බව ඇයට සිතිණ...

"හැබැයි මට කවුරුත් කථා කරන්නේ අරෝෂ කියලා... ඔයා කැමැති නමක් මං ඉස්සරහ භාවිතා කළාට කමක් නෑ... ඒත් මෙතනට වෙන දවසකදි ඇවිල්ලා චානක ඉන්නවද කියලා ඇහුවොත් හතර දිග් භාගෙම බලලා එහෙම එකෙක් මෙහේ නෑ කියලා කියයි... මං එතනම හිටගෙන හිටියත්..."

ඇයගේ සිනහව පුළුල් විය... නෙතේ කඳුලක් දිදුලමින් වුවද ඇයගේ සිනහව සැබැවින්ම පියකරු විය... සංජය වැරදිලාවත් මේ තරුණිය මේ අන්දමින් දුටුවේ නම් ඔහුගේ මිතුරියන් ගොන්නට මැයද එකතු වෙනු ඇත...

"ඉතින් මේ ආරතී කියන ඔයාගේ රූම් මේට් මොකද...? එයා එහෙම නං මැරි කළාද...?" ඇසූ අරෝෂ එක්වරම යමක් මතක්වූ ලීලාවක් පෑවේය... "මට මතකයි එතන මගේ අඳුනන බෝයි කෙනෙක් හිටියා.. මැන් කිව්වා ආරතී කියලා කෙනෙක් හිටියා... එයා සතියක්ම විතර ආවේ නෑ කියලා... මං ඇහුවම එයත් වැඩි විස්තරයක් දෙන්න කැමැති උනේ නෑ වගේ තිබුණා... ඉතින් මං නිකං හිටියා... එහෙනං මේ ඔයා කියන එක්කෙනා ගැන වෙන්න ඇති... කමක් නැත්තං මට කියන්න..." ඔහු කීවේය...

"නෑ... ඒ කිසි දෙයක් නෑ අරෝෂ..." කීවායින් පසු ඇයටම යළුව ඇය ඇමතූ සැහැල්ලු විලාශය ගැන පුදුමයක් දැනින... මයන්තගේ සිත ගන්නට ඇත්තේද මේ සැහැල්ලු බව විය හැකිය... ඉදිරියෙන් කථා කරන්නා සැහැල්ලුවෙන් කථා කරන්නේ නම් අන් අයටද ඔහු හා සැහැල්ලුවෙන් කථා කළ හැකි බව ඇයට සිතිණ... "රතී..." කියූ ඇය එවර ඔහුගේ මුහුණ දෙස හොඳින් බැලුවාය... "සොරි... අපි එයාට කථා කරේම රතී කියලා..."



"තණ්හා රතී රඟා නෙවෙයි නං කවුරු උනත් කමක් නෑ..." යළිත් ඇයගේ සිනහව පුබුදා අරෝෂ කීවේය...

"නෑ නෑ... එතන නං සින්දු කිව්වේ ජානියි රතියි රුක්මියි සමාධියි කියලා හතරදෙනෙක්ම හිටියා... ජානි කිව්වේ නං මට..."

"හොඳ වෙලාවට මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා නොවුණෙ..."

"ඇයි...?" කියන්නට ගත් දෙයද නොකියා තේජානි ඇසුවාය.

"නැත්තං ඉතින් මං ඔයාගේ කථාව අහන්න ඉස්සෙල්ලම රහත් වෙන්න තිබුණා..."

"එහෙම වෙන්නෙ නෑ අරෝෂ... සිදුහත් කුමාරයා ඉස්සෙල්ලම රහත් උනේ නෑ නේ... ජීවිතේ ගැන පිළිකුලක් ආවා එච්චරයි..."

ඇය හොඳ බුද්ධිමතියක බව ජයරත්න අන්කල්ගේ සංජයට කියෙවු තීරණය සියයට සීයයක්ම මෙන් නිවැරදි විය හැකිය... අරෝෂ සිතාගත්තේය...

"මොකක්ද දූන් මේ යාළුවට උනේ... අසනීපයක් වගේ...?" අරෝෂ ඇසුවේය... "උදව්වක් දෙන්න පුළුවන් එකක් නං මං දෙන්නං..." ඔහු එක් කළේය...

තේජානිගේ ඇස් දැල්විණ... ඇයට කිසිවක් කියන්නට පෙර මයන්ත ඇතුල් විය.

"මොකද අරෝෂ අපේ අක්කා කියන්නෙ...?"

"අක්කා...?"

"ඔව්... මෙයා මගේ අක්කා කෙනෙක් නේ... නංගි කෙනෙක් උනානං ඉතින් මේ වගේ මං නං එක්ක එන්නෙත් නෑ..." මයන්ත තේජානි අසලින්ම වාඩි ගත්තේ ඇයගෙන් උරහිසට පහරක්ද තබිනි...

"මට මෙයා කියන්න ගියේ මේ යාළුවෙක් ගැන..." අරෝෂ කීවේ මාතෘකාවට පිට පනින්නට නොදෙමිනි.

මයන්තගේ මුහුණද වෙනස් විය... ඒ වේදනාව හා පසුතැවිල්ලෙන් බව වටහාගන්නට අරෝෂට එතරම් සිතන්නට උවමනා නොවිණ... මේ සියල්ලත් අතරම හොඳ සම්බන්ධතාවයක් තිබෙන

බව අරෝෂ නිගමනය කරගත්තේය. ඇයගේ අතුරුදන් වීම මේ සියල්ලන්ගේම සිත් තුළ බලවත් පසුතැවිල්ලක් හා වේදනාවක් එක් කර තිබෙනු වැනිය...

සංජය වැරදි බව ඔහුට නිකමට සිතිණ... මොවුන් ඇය ගැන දන්නේම නැත... දන්නේ නම් ඇය ගැන මෙලෙස නොකියන බව ඔහුගේ සිත කීවේය... තමා හා එසේනම් මෙලෙස කිසිවක් පවසන්නට මේ දෙදෙනාගෙන් කවරෙක්වත් නොසැරසෙනු ඇත...

"රතී නැති උනේ... සඳුදා අරෝෂ... එයා බැංකු ගියා... ගියා ගියාමයි... ආයේ ආවේ නෑ..." මයන්ත කීවේය.

"මට විස්තරේ කියන්න බලන්න... මාත් ඕගොල්ලන්ට පුළුවන් විදියකට සපෝට් එකක් දෙන්න..." අරෝෂ කීවේය.

කථාව පටන්ගත්තේ මයන්තය... ඔහු පටන් ගත්තේ සිහිනයෙනි... සියල්ලම අසද්දී අරෝෂ දූන් නම් සිතාගත නොහැකි අන්දමින් පැටලී සිටියේය...

මොවුන්ගේ කථාව නම් අරුම පුදුමය... ජයරත්න අන්කල්ට වුවද මෙවා කියැවී නැත... කෙසේ වුවත් සංජය ගැන කියවෙද්දී ඔහු සිතහව නවතාගෙන සිටියේ සැබැවින්ම මේ අරුම පුදුම සිහිනයේ ආනුභාවයෙනි. කෙසේ වුවත් ඔහු අසන තෙක්ම ඔවුන් සංජයගේ නම නම් කීවේ නැත...

ආරතීට පෙම්වතෙක් ඇත... ඇය ගියේ පෙම්වතා සමගිනි... අන්තිමේදී ඔවුන් දෙදෙනම නම කීවේ ඔහු එය ඇසූ පසුය... ඒ තැනැත්තා ප්‍රභූවරයෙක් බවත් බලවන්තයෙක් බවත් ධනවන්තයෙක් බවත් ඔවුහු පැවසූහ... තමාට ඇයව සොයන්නට ඒ ප්‍රභූවරයා ඔහුගේ බලවන්ත කමත් ධනවත් කමත් ප්‍රයෝජනයට ගෙන තිබෙන බව මෙහිදී කියන්නට නම් අරෝෂ නොසිතුවේය... එය සඟවා ගෙන සිටීමටද ඔහුට උවමනාවක් නම් නොවිණ... ඒවා පසු දවසක වෙනත් අන්දමකින් කිව යුතුය... සංජය නැමැත්තාද නිවැරදි බව... ඔහු මොවුන්ට කිව යුතුය... නැතහොත් මිතුරා ගැන ඇති කහට මුළු දිවිය පුරාම මොවුන්ගේ සිත්වල රැව් දෙනු ඇත...

සංජය මෙම ප්‍රශ්නය ගැන සිතන්නේද වෙනස් විදියකින්ම බවද ඔහුට කිව නොහැකිය...



එහෙත් මොවුන් දූන් ඔහු ගැන එලෙස සැක කරන්නේද මේ සිහිනයක් නිසාය... සිහින වලින් බොහෝ දේ සමහරවිට කියැවෙන බව මතක් වූ අරෝෂගේ සිතේ ඇතිවූ හැඟීම ඔහු පිට නොදුන්නේය... ඔහුගේ ඒකමතික තීරණය වූයේ ආරතී නැමැත්තිය මෙලොවින් තුරන් වී ඇති බවය...

එහෙත් නැවතත් මොවුන් සිතන්නේ ඔහුද පළමු සිතුවාසේම... ඇය ඇය විසින්ම හෝ සැඟවී ඇති බවය... තමාගේ සිතළ කීමට ඔහු නොසිතුවේය... සියයට අනූනවයක්ම තමාගේ සැකය ස්ථිර වුවද, තේජානි ජයරත්නට කියූ කියමන ඔහු නොදන්නේ වුවද, ඇය සංජය ගැන සැකයක් තිබුණු අන්දමින්ම..., සියයට එකක් පමණ අනික් පැත්තටත් සිතිය හැකිය... සමහරවිට ඇය කිසිවෙකුටත් නොදන්වා මෙහෙණවරකට හෝ ගියාදැයි යන සැකය දූන් ඔහුගේ සිතේ නැඟුණේය... දූන් ඉතින් මෙහෙණි ආශ්‍රමත් සොයන්නට වෙනු නියතය... ඔහුගේ සෙවීමේ පරාසය දූන් තවත් වැඩි වී ඇත... එහෙත් සංජය හා අනියම් අන්දමින් වුවද බැඳී සිටින්නට කැමැත්තක් දක්වූවායැයි කියන ආරතී නැමැත්තිය එලෙස මෙහෙණි සස්නට යාදැයි යන සැකයෙන්ද ඔහු පෙළුණේය...

අනික් අතට බැලුවහොත් ඇය මේ තේජානි නැමැත්තියට සියල්ලම ලියා සිය දිවි නසාගත්තේ දැයි ඔහුට තවත් සැකයක් නැගිණ... සංජය නොදන්නේ වුවද ඇයට දරුවෙක් කුස පිළිසිඳුනේ නම්... ඇයට මෙම ඊකියාව මින් පසු කළ නොහැකිය... සංජයද විවාහ වෙන්නට සිතුවේ නම්... ඇය එවැනි දරුණු තීරණයක් ගන්නට වුවද නොපැකිලෙන බව ඔහුට සිතිණ... එහෙත් දෙවනුව ඔහුගේ සිත වෙනස් විය... ඇය අනියම් ලෙස හෝ සංජයගේ පෙම්වතිය ලෙස සිටින්නට කැමැත්ත දී තිබුණ බව ඔහු කිවා මතක් වෙද්දීය...

මෙය නම් පැටලුණු නූල් බෝලයකි... නැත... එයද පැටළුම හැරගත හැකිය... මේ දෙකුන් දෙනා හා කථා කරද්දී මෙය විත ගැටළුවකි... එයද විසඳිය නොහැකි බව ඔහුගේ සිත කියා පෑවේය.

කෙසේ වුවත් තේජානි සංජය ගැන නොමනාපයෙන් කථා කරද්දී ඔහු සිනහව නවතාගෙන සිටියේ ආයාසයෙනි... දෙදෙනා එක කුඩුවකට දැම්මොත් ගහ මරා ගන්නා සයිස් එකට දූන් එකිනෙකා හා කෝපයෙන සිටින බව ඔහුට සිතිණ...

එහෙත් සිදුවී තිබෙන්නේ කවුරුත් සිතා සිටිනවාට වඩා හාත්පසින්ම වෙනස් දෙයක් බව අරෝෂගේ සිත කියමින් තිබුණේය. සිතාගත නොහැක්කේ ඒ වෙනස් දෙය කුමක්ද යන්නය...

සමහරවිට ඇය වෙනත් කෙනෙකු හා රට ගියා වන්නටද පිළිවන... මේ දිවයිනේදී එලෙස කා සමග හෝ සිටින්නට ඇයට අවසරයක් නැත... ඒ සංජයගේ බලය ගැන ඇයද දන්නා බැවිනි...

"අරෝෂ හිතන්නේ මොකක්ද...? මං හිතන්නෙම මේ සංජයගේ බොරුවක්... එයා රතී හංගගෙන ඉන්නෙ... එයාගේ ප්‍රශ්නවලින් ගැලවෙන්න..." තේජානි ඇසුවේ අන්තිමේදීම අරෝෂගෙනි...

ඇය ඔහුගේ නම සැහැල්ලුවේ කියවද්දී අරෝෂට තරමක සිනහවක්ද නැගිණ... ඇය අර හඬ පටියේ සංජයට කථා කරේම ගරු නම්බුනාමයක්ද එක්කරමිනි... මිස්ට සංජය...

"එහෙම නං මේ වෙද්දි ඔයාට ආරතීගෙන් කෝල් එකක් එන්නම ඕන තේජානි... සංජය ඒ විදියට හංගගෙන ඉන්නවනං... එයාට මේ විදියට ඇඟිල්ලක් දික්වෙද්දි නවත්ත ගන්න තියෙන්නේ ඔයා විතරක්ම නං එයා ලව්වා ඔයාට රහසෙ හරි කෝල් එකක් දෙවන්න පුළුවන් නේද මෙ විදියට බැලුවොත්..." අරෝෂ කීවේ දූන් මිතුරා වුවද මේ ගැන කියද්දී බෙහෙවින් කලබල වෙන බව සිතමිනි... කෙසේ වූවත් තමා සංජය හඳුනන බව කීම මේ මොහොතේ තමා ගැන මොවුන් තුළ තිබෙන සුහදතාවය නැතිවී යා හැකි මගකි...

කෙසේ වූවත් එය ඇසෙද්දී මයන්ත හා තේජානි එකිනෙකා දෙස බලාගත්හ... එය ඔවුන්ට සැබැවින්ම අළුත් අදහසක් විය...

ඔහු නම් දූන් සියල්ලටමත් වඩා තේජානි නම් යුවතිය ගැන තොරතුරු දැන ගන්නට සිතමින් සිටියේය...

එදා සංජය කියද්දී ඔහුගේ සිතට ආවේ තරමක තපටි කෙල්ලකගේ ඡායාවය... හෝටලයේ ඇයගේ විශේෂාංගය දකීමේදී ඔහුගේ සිතට දැණුනේ ඇයගේ දක්ෂකමය... දූන් ඇය දකිද්දී ඔහුගේ සිතට පමණක් නොව නෙතටද දිස්වූයේ ඇයගේ රූමත් කමය... දූන් ඇයගේ බුද්ධිමත් කමද සිතට වැටෙමින් පවතින්නේය...

"ඔගොල්ල මට දවස් දෙක තුනක් දෙන්න කෝ... මං හොයවන්නං... කාටත් වඩා හොඳට මට හොයවන්න පුළුවන් ඔය



වගේ ඒවා... මං කෙළින්ම මයන්තට කියන්නං කෝ..." කියාගෙන ගිය අරෝෂ මයන්ත දෙස බැලුවේය...

"ඔය දෙන්නා කොහේද ගමනක් යන්න කියලා නේද මගේ කෝල් එක එනකොට ලැහැස්ති උනා කිව්වේ...?" ඔහු ඇසුවේ බොහෝ කුළුපග ලීලාවකිනි...

"ඔව් අරෝෂ... ජානිගේ නංගි බලන්න..."

"මෙයාගේ...? නංගි කියන්නේ...?"

"මගේම නෙවෙයි... ලොකු බාප්පගේ දුව... ඒ දෙන්නයි නංගිගෙ අයියයි තුන්දෙනාම නැති උනා ඒ ඇක්සිඩන්ට් එකෙන්... ඒ නංගි විතරයි මට ඉතුරු උනේ... පොඩි බාප්පාගේ වයිෆ් ටික කාලයක් අපි තියාගෙන හිටියා... ඉන් පස්සෙ එයත් බැන්දා... ගෙවල් විකිණුවා... මං මෙහෙ ආවම... නංගි බොතේජු කියන කට්ටියගේ ගෙදර නවත්තන්න ලැහැස්ති කරලා දුන්නෙත් රතී... එයා කාලයක්ම එහේ ඉඳලා තියෙනවා..."

"කොහේද ඒ ගොල්ල ඉන්නෙ...?" අරෝෂ ඇසුවේය... මයන්ත හා තේජානි මුහුණට මුහුණ බලාගත්හ... යළි අරෝෂ දෙස බැලූහ...

"බය වෙන්න දෙයක් නෑ... මාත් ගමනක් යන්න... ඔය දෙන්නා මං යන පැත්තටම යනවනං මට එක්කගෙන ගියැකි..." ඔහු කීවේ බෝතේජු නිවස පැත්තේ ඇති ස්ථානයක්ද සිතේ සනිටුහන් කරගනිමිනි... සංජයගෙන් ඔහු බොතේජු යුවළගේ ලිපිනය දැනගෙන තිබිණ...

මයන්ත තේජානි දෙස බලද්දී ඇය හිස සැලුවාය... ඇයට අරෝෂට එතන නොකියන්නට හේතුවක් නැත... ඔහු මයන්ත කීවාක් මෙන් බොහෝ හොඳ තැනැත්තෙක් බව ඇය සිතමින් සිටියාය...

මයන්ත නැත කීවේය...

"මං යන්නෙත් ඒ පැත්තෙන්ම තමයි... ඔය කියන පාර තියෙන්නේ මං යන පාර පැත්තෙ... මට මතක හැටියට... මං යන්නේ...

"... ..." ඔහු කීවේ ඔහුගේ ගමනාන්තයය

"ආ... ඒකට තව ටික දුරක් යන්න ඕන..." මයන්ත කීවේ තේජානි තරමක් කුහුලින් ඔහුගේ මුහුණ දෙස බලද්දීය...

මෙ කොල්ලෝ නම් ඔනෑම තැනක් ගැන දන්නා බව සිතෙද්දී තේජානිට සිනහවක්ද නැගිණ.

"මොකද හිනා උනෙ...?" මයන්ත නොමනාප හඬකින් ඇසුවේ අරෝෂටද අසන්නට සිතු පැණයමය...

ඇය එලෙස සැහැල්ලුව සිනහසෙද්දී බොහෝ පියකරුය... සංජය ඇයව මෙලෙස දුක්කේ නම්...

"නෑ... අපිට වඩා ඔගොල්ල ඉතින් දන්නවනෙ හැම තැනක්ම..."

"නැත්තං... අපි කොල්ලො නේ නේද අරෝෂ...?" මයන්ත කොළු හඬින් විමසුවේය...

"හරියට හරි මල්ලි... එහෙනං මං ඇඳගෙන එන්නං... එතකං ඉන්න මොනවා හරි බොන්න තියෙනවද බලමු..." කියමින්ම අරෝෂ පිටුපසට ගියේය...

"බුවා හොඳද...?" මයන්ත ඇසුවෙ සිහින් සරෙනි...

"මං දන්නවා අපි ගුටිත් කනවා... බීම කෙසේ වෙතත්..."

"ඉතින්... ඔයා පැත්තකට වෙන්න කෝ... මං නේ කන තරමක් කෑවොත්..."

"මටත් වදියි නේ ඉතින්... මං එක්ක නේ ඔයා ආවෙ..."

"වැරදියි ජානියො... මං එක්ක ඔයා ආවෙ..."

වෙනත් කිසිවක් පවසන්නට පෙරම අරෝෂ මතුවුණේය... ඉදිරි විදුරුවකින් ඔහු එන සේයාව දුටු හෙයින් තේජානි වෙනත් කිසිවක් නොකියා නවත්වාගත්තාය...

"තේජානිට නං මෙක රස වෙයිද මන්දා... මං නේ හැදුවෙ..." අරෝෂ සිසිල් පළතුරු බීම විදුරු තුන සහිත බන්දේසිය ස්ටූලය උඩින් තිබ්බේය...

"අපෝ... මෙයා මේ රස ගුණ හොයන්නේ නෑ... ගත්තා බිව්වා..." මයන්ත කීවේ විදුරුව ගත්තා අතරමය...

"ඇත්ත නේ අරෝෂ... අපි ජීවත්වෙන්නේ රස ගුණ හොයන්න පුළුවන් තැනක නෙවෙයි... ඕන දේකින් බඩ පුරවා ගන්න බලන



තැනක..." ඇය කීවේ මයන්තට රිදවීමට නොවතුදු ඔහුගේ සිතට රිදිණ... එය වටහාගත්තේ අරෝෂය.

"කොයි කවුරුත් එහෙමයි තේජානි... මට බඩගිනි උනාම වතුර විදුරුවක් බීලා බඩගින්න නිවාගන්න වෙන වෙලාවලුත් තිබුණා... වතුර වල රසක් නෑ... ටිකක් ගුණයක් තියෙනවා..."

"ඒ ගුණේ එහෙනං මේකෙත් ඇති නේ... පළතුරු බීම හදන්නේ වතුරෙන් නේ..." තේජානි විදුරුවක් අතට ගනිමින් කීවාය... "මේගොල්ල මොකද...? කෑම් අරහං නං පිටින් හරි ගිහිල්ල කාල එන්නෙ..." ඇය එවර කීවේ මයන්තටය... මයන්තගේ සිත තැන්පත් විණ... ඇය පළමු වැකිය කීවේ තමාගේ සිත රිදවන්නට නොවන බව සිතුණු හෙයිනි...

බොතේජු නිවසට නොගියද අරෝෂ එය තිබෙන තැන බලාගත්තේය... ඔවුන් බැස ගත්තේ ගුරුපාර කෙලවරය...

ඇතුළට එන්නටයැයි තේජානිගෙන් ඇරයුමක් ආවද ඔහු එය නිහතමානීව ප්‍රතික්ෂේප කළේ මේ ඇයගේ නිවසක් හෝ ඇයගේ නෑදෑයෙකුගේ නිවසක් නොවන නිසා බව පවසමිනි...

"මං එන එක හරි නෑ තේජානි... ඔගොල්ලයි මායි දන්නේ දවස් දෙකයි... එතකොට ඒක ප්‍රශ්නයක් වෙයි ඒ මිනිස්සුන්ට... අපි ආයේ වෙන දවසක එමු... දැනට නිකං මගේ නම එහෙම කියලා තියන්න... හදිසියකදි මට ඕන නං නංගිට හරි පණිවිඩයක් හරි දෙන්න පුළුවන් නේ..." ඔහු කීවේ ඇයගේ වුවනට නැඟුණු තරමක පසුතැවිල්ලක් වැන්නක් දුටු හෙයිනි...

ඔහු කියන්නේ සැබෑවකි... ඒ තමාගේ හෝ කවරෙක්ගේවත් නිවසක් නොවේ... ඇය සිනිවිලි සඟවා ගත්තාය... ඒ ලෙස බලද්දී ඔහුට මයන්තගේ නිවසට නම් යා හැකි වනු ඇත... එය කියන්නට ඇය ඒ මොහොතේදී නොසිතුවාය...

කෙසේ වුවත් අරෝෂගේ නම එහිදී නොකියන්නට ඇය සිතුවාය... නිවසට ගොඩවෙන්නට පළමු ඇය මයන්තටද ඒ බව කීවේ වැරදිලාවත් අරෝෂ ඔවුන්ට මුණ ගැසුණේ ආරතී සොයන්නට ගොස් යැයි කාගෙන් හෝ කියවුණහොත් යන බියක්ද ඇයගේ සිත පෙලූ බැවිනි...

ආරතී වෙනත් මිතුරියන් දෙදෙනෙකු සමග ගමනක් ගිය බව

බොහෝ අපහසුවෙන් කියාගත් තේජානි එදා වැඩිපුර වේලාවක් සිටියේද නැත...

"ඒ පැත්තට සිග්නල් අප්සෙට කියලා අපිට කථා කරෙත් නෑ..." මයන්ත තේජානිගේ සිතේ කරදරයක් ඉවත් කරමින් කීවේය...

ඔවුන්ටද පුහුණුවීම් වල යෙදිය යුතු නිසා හැකි ඉක්මණින්ම යායුතු බැවි බොතේජු යුවළට පැවසූ ඔවුන් හවස තේපානයෙන් පසු යන්නට සූදානම් වූහ...

"අක්කා මිට් එක බලන්න එනවද...?" රසිකා ඇසුවේ යන්නට සැරසුණු අක්කාගෙනි.

"දවස කියන්න පැටියෝ... පුළුවන් නං එන්නං හොඳේ... අක්කාට වැඩ වැටුණොත් බෑ නේ ඒ වගේ එන්න..." ඇය නැගණියට කීවේ ආරතීගේ ප්‍රශ්නය මොන අන්දමකින් විසඳේදැයි යන්න ඇයට සිතාගත නොහැකි වූ හෙයිනි...

ඔවුන් ගෙන්වා ගත්තේ මයන්තගේ පියාගේ ත්‍රිරෝද රථයය...

වාහනයක ඔවුන් දෙදෙන සමග පැමිණි අරෝෂ ඒ මොහොතේදී ඒ දෙදෙන පසුපසින් යතුරු පැදියක එනු දකින්නට නම් ඔවුන් සමත් වූයේ නැත...

අරෝෂට සැබැවින්ම දැන් අවශ්‍ය වූයේ මෙම තරුණිය කුමන අන්දමේ තරුණියකදැයි සොයා ගැනීමය...

ඔවුන් දෙදෙන ත්‍රිරෝද රථයේ නැගී කෙළින්ම ගියේ නේවාසිකාගාරයට බව පමණක් නොව ඒ මයන්තගේ පියාගේ ත්‍රිරෝද රථය බවද දැනගත් පසු අරෝෂගේ සිත තරමක් සැහැල්ලු විය... ආරතී සඟවා ගෙන සිටින්නේ නම් අද දින ඔවුන් ඇය බලන්නට යන්නේදැයි ඔහුගේ සිතේ සැකයක් නැගී බැවිනි...

ඒ සැකය නැතිවීමම නොව ඔහුගේ සිතට දැන් සැනසුමක් දුන්නේ ඇයද සංජය පැවසූ පරිදිම බොහෝ හොඳ යුවතියක බව සිතන්නට හැකි වූ හෙයිනි...

එදා හවස ඔහු සංජයට කථා කරන්නට තීරණයක් ගත්තේය... ආරතී ගැන රෝහල් වල හෝ වෙනත් පොලිස් ස්ථානයක සටහනක් නැති බව දැන් ඔහු හොඳින්ම දැන ගත්තේය...



දැන් සොයන්නට තිබෙන්නේ මෙහෙණි ආශ්‍රමයන්හිය... එය නම බාරදූර කාර්යයකි... මෙතෙක්ම එවැන්නක් ඔහු කර තිබුණේ නැත...

ඔහු සංජයට දුරකථන පණිවිඩයක් දුන්නේය... සංජයට නිවසට එන්නට කිව යුතුය... ඔහු සිතුවේ මෙම සියල්ල ගැන වඩාත් හොඳින් දැන ගැනීමටය... ඔහුට අවශ්‍ය වූයේ සැබැවින්ම එවර සංජය වටා සිටින පිරිස අතුරින් ආරතී ගැන දන්නා නැනැත්තවුන් හෝ නැනැත්තියන් කවුදැයි සොයා ගැනීමටය... ආරතීගේ පුද්ගලික බැංකු සේප්පුවේ තිබෙන දෑ බැලීමටද ඔහු අදහස් කරමින් සිටියේය...

අනෙක් දෙසින් ආරතී ගැන දන්නේ එම නේවාසිකාගාරවල අයත් බොතේජු යුවළ හා මයන්තගේ පියාත් රන්සිරි නැමැති රියැදුරාත් පමණක් බවද ඔහු දැන් දන්නේය... ඒ සියල්ලම කියාවුණේ ඒ දෙසිනි... ඔවුන් දෙදෙන ඔහුට මයන්තගේ පියා මෙන්ම රන්සිරිවද මුහුණ ගස්වන්නට පොරොන්දු වූහ...

එහෙයින් ඒ දෙසින් සැකයක් තබන්නට නම් තවමත් ඔහුට නොහැකිය... සංජයගේ පැත්ත ගැනද දැනගන්නා තෙක් ඔහු සැකයේ වාසිය දෙපැත්තටම තබා ගන්නට අදහස් කළේය... තමාට මෙය බාරදී සංජයම මෙම තරුණියගේ අතුරුදන්වීමට හේතුවක් නොවුණායැයි කිව නොහැක්කේ කෙසේද...? සංජයගේ කටයුතු ගැන වුවද ඔහු ගේ සිතේ ඇත්තේ සැකයකි... මිතුරා වුවද මෙහිදී ඔහු සිතුවේ මැදහත් සිතින් මෙය ගැන සෙවීමටය... තේජානි නම් යුවතිය දුටු සිහින ගැන කියද්දී ඔහු සැබැවින්ම පුදුමයට පත්වූ හෙයිනි... ආරතී මිතුරියට කිසියම් පණිවිඩයක් දෙන්නට උත්සාහ කළා නම්... මිතුරිය නිදොස්ය...

සංජය සිටියේ කොළඹ නොවේ... ඔහු ඉන්පසුදා රැයේ එන බවට දැනුම දුන්නේය...

අරෝෂ සිතුවේ යළිත් තේජානි සමග කථා කිරීමටය...

ඇයගේ දුරකථන අංකය වන්නේ මයන්තගේ දුරකථන අංකයට පසු අංකයක් බව ඔහු දන්නේය... මයන්ත හා තේජානි දෙදෙන එය ගැන විස්තරයක්ද ඔහුට දී තිබුණහ... සංජයද එදා එය ගැන කීවා ඔහුගේ වාර්තාවේ ඇත...

# 19 අඟහරුවාදා

**තේජානි** ඉන්පසුදා අවදි වූයේ නවය පසුවෙද්දීමය... ඇයට බොහෝ සුවදායක නින්දක් ලැබී තිබුණේ ඇයිදැයි කීමට නම් ඇය නොදත්තාය...

ආරතීගෙන් හෝ සංජයගෙන් වත් දුරකථන පණිවිඩයක් නොවිණ... වෙනත් දිනයක නම් ඇය ඇයට සේවා ස්ථානයෙන් දෙනු ලබන දුරකථනය තබන්නේ මේසයේ පසෙකය... ඊයේ රැයේ ඇය ඒ දුරකථන දෙකම ඇයගේ කොට්ටය අසලම තබා ගත්තාය... තවමත් ඇයට තනිවම ඇයගේ හා ආරතීගේ කාමරයට යෑමට නොසිතිණ... ශාන්තා වුවද තේජානි සිටිනවාට අකැමැත්තක් නොදක්වූයේ ඇයගේ තනිකම තේජානිගෙන් නැසෙන නිසාද... නැතහොත් තේජානිගේ කරදරයකදී තවටු දෙකක් නැගීමට ඇති අකැමැත්ත නිසාදැයි කවරෙක්වත් සිතන්නට ගියේද නැත...

දූන් නම් බොහෝ දෙනාගේ සිත් තුළින් ආරතී ගැන අදහස් අත්හැර දමා තිබිණ...

එහෙත් තේජානි නම් මිතුරිය ගැන අදහස අත්හැර දැමුවේම නැත... ඇය එල්බගෙන සිටියේ ඇය සංජය විසින් සඟවා ගෙන ඇත යන මතයේමය...

මොන දේ කථා වුණද දූන් ඔවුන් තේජානි ඉදිරියේ ආරතී ගැන අදහස් පළකරන්නට නම් නොසිතුහ...

තේජානි අද නම් නිදි යහනේදී කල්පනා කළේ ආරතී ගැන නොවේ... ආරතී ගැන සොයන්නට අරෝෂ නැමැත්තා දුන්



පොරොන්දුව ගැනය... ඇයට ඔහු ගැන තරමක විශ්වාසයක් ගොඩ නැගී තිබිණ... ඇය මයන්ත මෙන් අරෝෂ නැමැත්තා එක්වරම විශ්වාස කරන්නට නම් පෙළැඹී සිටියේ නැත... සංජය ගැන දන්නා නිසාම ඇය තරමක් ඔහු ගැන වුවද සැකයක සේයාවක් මවාගෙන තිබුණාය... ඒ මෙලෙස මයන්ත හා ඔහු මිතුරුවූයේ සංජයගේ කිසියම් බලපෑමකින්දැයි යන සැකයෙනි... එය ඇයට සැකයක් පමණක් වූයේ අරෝෂ බෙහෙවින්ම පරිස්සම් සහිත වූ බැවිනි... කෙසේ වුවද ඇය එක් දෙයක් පසක් කරගෙන තිබුණාය... ඔහු තමාට හෝ මයන්තට විරුද්ධව කිසිවක්ම නොකියන හෝ නොකරන බවය...

රැයේදී ඇය ඔහුගෙන් දුරකථන පණිවිඩයක් බලාපොරොත්තු වූයේ මයන්ත ඔහුගේ පමණක් නොව ඇයගේද දුරකථන අංක ඔහුට කියූ බැවිනි.

එහෙත් ඔහු කථා කරේ නැත... තරමක පසුතැවිල්ලක් ආවේ ආරතී ගැන විස්තරයක් ඇයට දැනගැනීමට නොලැබීම ගැන මිස ඔහු කථා නොකළ හෙයින් නම් නොවේ... දෙවනුව ඇයට සිතුණේ අද පැය කිහිපයකට පෙරාතුව තමාගෙන් ගත් විස්තරය අනුව ඇය ගියේ කොහිදැයි ඔහුට සොයා ගත නොහැකි බවය...

සංජය නොදත් යමක්ද ඇය එදා අරෝෂට කියා තිබිණ... එදා ආරතී ගොස් තිබුණේ වෙනත් බැංකුවකට බවය... ඇය ඇයට ලැබුණු චෙක් පත දමා තිබුණේ ඇයගේ නිරතුරුම පඩිය යන බැංකු ගිණුමට නොවේ... එම පොත එදා අමතක වූ හෙයින් ඇය චෙක් පත දමා තිබුණේ ඇය ළඟ ඒ මොහොතේ තිබුණු ඇයගේ වෙනත් බැංකුවක පොතටය... ඇය විශේෂයෙන්ම එය බලන්නට ගියේද එහෙයින්ම බව තේජානි විස්තර සහිතවම කීවාය...

තේජානි නොදන්නා නමුදු සංජය සිතාගෙන සිටියේ ඔහුද ඉදහිට ඇයට මුදලක් දමන බැංකු පොත අයිති බැංකුව ගැනය... ආරතීගේ ලියකියවිලි අඩංගු සේප්පුවද ඇත්තේ නම් ඒ බැංකුවේය...

සිතන්නට සිතන්නට මෙය ගැට ගැහෙනවා විනා ලිහෙන

පොටක් නැත අරෝෂ සිතුවේ එය ගැන මතක් වෙද්දීය...

ඔහු සියල්ලම වාර්තා බලමින් අද දින තැටි ගත කරගත්

සංවාද සියල්ලද යළිත් ඇසුවේය...

තේජානි නම් යුවතියට ඇඟිල්ලක් දිගු කළ නොහැකි බව...

සංජයට මෙන්ම ඇඟිල්ලක් දිගු කළ නොහැකි බව ඔහු ඒ මොහොතේදී තීරණය කරගත්තේය...

ඒවා අසමින් බලමින් සිටි හෙයින් ඔහුට එදා තේජානිට කථා කරන්නට නොලැබිණ...

සංජය හෙට දිනයේ එන බව දැන්වූ හෙයින් ඔහු ඉන්පසුදා උදයම තේජානි හා කථා කරන්නට සිතුවේය...

එහෙයින්ම අවදිවී පුහුණුවට යන්නට සූදානම් වූ තේජානි දුරකථනය හඬ තලද්දී තරමක් තිගැස්සුණාය... ඇය දුන් දුරකථනය හඬ දෙද්දී බලන්නට බොහෝ බිය වෙමින් සිටියාය... එක් අතකින් ඇය බියවූයේ යළිත් සංජය හා කථා කරන්නටය... එය සැබැවින්ම බියක් නොව... තරමක පිළිකුලක් වැන්නක්ද විය... අනික් බිය කිසිසේත්ම ඇයට සිතාගත නොහැකිය... ආරතී ගැන ආරංචියක්... හදට දැනෙන ආරංචියක් එලෙස ඒ දැයි යන බියය...

එහෙත් දුරකථනය අතට නොගෙන නොහැකිය... ඇය දුරකථනය අතට ගත්තේ බියෙන් වුවද එහි නොදන්නා අංකය දකිද්දී එවර ඇතිවූයේ තිගැස්මකි... මෙ ආරතී නම්... ඇය වෙනත් කිසිවක්ම නොසිතා දුරකථනය සවණට තැබුවාය...

"මිස් තේජානි..." එදෙසින් ඇසුණේ කාගේ කටහඬදැයි ඇය තේරුම් ගන්නට උත්සාහ කළේ ඒ නම් සංජය නොවන බව හොඳින්ම වැටහෙද්දීය... සංජයගේ හඬ ගැඹුරුය... මෙම හඬ එතරම් ගැඹුරු නොවුණද ඇයට කිසියම් සමීප බවක් දෙමින් තිබිණ... ඇය එය කාගේදැයි සිතන්නට ගියාය... මේ මයන්ත නම් නොවේ... ඒ නැතත් මෙහි කවරෙක් හෝ මෙයට ගත්තේ නම් මිස් තේජානි යැයි තමා අමතන්නේ නැත... අනික කිසිවෙක්ම මෙයට ගන්නේද නැත... ඔවුන් දන්නේ ආයතනයේ අංකයය... මෙය මයන්තගේ හෝ නැත්නම් අන්කල්ගේ... අරෝෂ නම් ඒ මොහොතේ ඇයට මතකයට ආවේම නැත...

තත්පර ගණනකදී සිතාගත නොහැකි තරම් සිතිවිලි බිහිවුණද ඇය පිළිතුර දුන්නාය...

"කථා කරනවා..." ඇය කීවේ වෙනදා අයුරිනි...

"මං අරෝෂ..." අරෝෂ එක්වරම කීවේ ඇයව අපහසු භාවයකට පත් කරන්නට නොසිතූ හෙයිනි... ඇයගේ මිතුරිය



නැතිවීමෙන් ඇය ලැබූ කැළඹිල්ල කෙතෙක්දැයි ඔහු දැනගත් හෙයිනි... සංජයටද වඩා ඇයට මෙම කාරණය සිතට බලපා තිබෙන බව ඔහු සිතාගත්තේය... ඇයගේ සිත සවිමත්ය... ඇය මෙතෙක්ම අසනීප නොවූයේ එහෙයින්ම විය යුතුය... නැතහොත් ඒ අයුරින්... එලෙස සජීවී අයුරින් සිහිනයක් දුටුවහොත් වෙනත් තැනැත්තියකට නම් තොවිල් පවිල්ද කරන්නට සිදුවිය හැකිය...

"අරෝෂ...?" පුදුමයෙන් මෙන් තේජානිට ඇසිණ... ඔහු එක්වරම කථා කරද්දී ඇයගේ සිත තරමක බියකටද පත්වූ බැවිනි... මිතුරිය ගැන නරක ආරංචියක්දැයි ඇයගේ සිතට දැණුනු හැඟුණු පළමු සිතිවිල්ල විය...

"මතකද මාව...?" අරෝෂ විහිළුවෙන් ඇසුවේ ඇය තමා හඳුනා නොගත් බව සිතූ නිසා නොව ඇයගේ තරමක තිගැස්ම වටහාගත් හෙයිනි... තමාගෙන් ලැබෙන දුරකථන පණිවිඩයකින් ඇයගේ සිතට දැනෙන්නේ පළමුව බියක් විය හැකි බව ඔහුට සිතුණේ ඇය එලෙස පුදුමයෙන් මෙන් අසද්දීය... එහි නොඅඩුවම කුතුහලය පමණක් නොව බියද ගැබ්වී තිබිණ...

"ඔව්... ඔව්... මං හිතුවෙම... රතී ගැන මොනවා හරි දැනගත්තද...?"

"දවසකට නං මේ වගේ හොයවන්න අමාරුයි තේජානි... ඒත්... එක දෙයක් මං දැනගත්තා... එයා හොස්පිටල් එකකවත් නෑ..."

"හොස්පිටල් එකක නෑ කියන්නේ...?"

"ඇක්සිඩන්ට් එකක් වත් වෙලාද කියලා මං හිතුව නිසා හැම එකකින්ම මං බැලුවා... නෑ... ඒ නමින් කවුරුවත් නෑ... ඒත් එක තැනක ඒ වගේ කෙනෙක් ගැන කියළනා... ඒත් වෙන නමක්..."

"ඒ වගේ කෙනෙක් කිව්වෙ...?"

"ඒ වගේ ලස්සණ ගර්ල් කෙනෙක්... කියලා..."

"එච්චර ඉක්මණට...?" තේජානි ඇසුවේ මෙපමණ ඉක්මණින් ඔහු එය කළේ කෙසේදැයි සිතෙද්දීය... මේ වැරදීලාවත් සංජයගෙන් පැමිණි ඔත්තු කරුවෙක් නම් ඔහු සංජය නිසා සමහරවිට එය සොයමින් සිටියාදැයි ඇයට සැකයක් නැගිණ...

"මං හැම තැනම ඉන්න යාළුවොන්ට කියාලා දීපු ෆොටෝ එක ඊමේල් කරා... ගිහින් බලන්න කියලා... එතන හිටිය මගේ යාළුවා

ගිගිල්ලාක් බලලා තමයි නමත් වෙනස් නිසා මට අනික් අතටම කෝල් කරලා කිව්වෙ..."

තේජානිගේ හුස්ම යමතම වැටෙන්නට ගත්තේ එය විය හැකි බව සිතෙද්දීය...

"මට හරි බයක් දැනෙනවා අරෝෂ දැන් නං..." ඇයට කියැවිණ... ඇය මෙවැන්නක් මයන්ත සමග වුවද කීවේ නැත... ඇයට අරෝෂ ගැන සිතෙද්දී සැබැවින්ම දැන් සුරක්ෂිත හැඟුමක් නැගෙමින් තිබිණ... සංජය ගැන වුවද ඇයට බියක් නැතිව දැන් සිතන හැකිය ඇය සිතමින් සිටියාය...

ඇයට වැරදී තිබුණේද නැත... සංජයට වඩා දැන් තේජානි නම් යුවතිය ගැන අරෝෂගේ සිතේ ඇතිවී තිබුණේ තරමක දුකකි... වෙනත් හේතුවක් නිසා නොව සංජයට වඩා ආරතී වටින්නේ ඇයට බව සිතෙද්දීය... සංජයට ආරතී නැතිවුවහොත් තවත් ගැහැනු ළමුන් සොයා ගත හැකිය... ඔහු හා එන්නට ඕනෑතරම් යුවතියන් සිටිති... යුවතියක නැතිවුවද දැන් ඔහුට කමක් නැත... දැන් ඔහුට විවාහපේක්ෂිත තරුණියක්ද ඇත... එහෙත් මෙම තරුණියට ඇත්තේ මෙම සොහොයුරියක් වන් මිතුරියගේ ආධාර උපකාරය පමණකි...

ඇයගේ සිතේ බිය නැති කරන්නට යැයි ආරතී ගැන සුබදායක දෙයක් පවසන්නට අරෝෂ නොසිතුවේය... ඔහුගේ සිතේ වුවද ආරතී නැමැත්තියගේ අතුරුදන් වීම පිළිබඳව ඇත්තේ අසුබ සිතිවිල්ලක් බැවිනි. අතුරුදන්වී මෙපමණ දිනක්ම කිසිම දුරකථන පණිවිඩයක් හෝ නොඑන්නේ නම්... අවම වශයෙන් කප්පම් ඉල්ලන්නට වුවද දැන් නම් කල්වේලා තිබෙන බව ඔහු සිතමින් සිටියේය... එහෙත් ඒවා තේජානි නම් යුවතියට කියන්නට ඔහු නොසිතුවේය...

"බයක් දැණුනා කියලා ඔයාගේ ජීවිතේ නවත්ත ගන්න දෙයක් නෑ තේජානි... ඒත් මතක තියාගන්න වෙයි... ඒ බයම ඔයාටත් එන්න ඉඩ තියෙනවා... ඒකෙනුයි දැන් පරිස්සං වෙන්න ඕන..." අරෝෂ කීවේය... තේජානි වෙව්ළුවාය... එයත් සත්‍යයකි... ඊයේ රැයේ රංගනයට නොගිය කිහිප දෙනා එකතුවී කථා කරද්දීද එවැනි දෙයක් කියවුණා මතකය... මෙ ආරතී රැගෙන ගොස් ඇත්තේ මෙම හෝටලේ අධිකාරිය සමග තරඟ කරන හෝටලයකට අනුබද්ධිත කවරෙක් හෝ නම්... බොහෝ අය සැක කළේ සේකර නැමැත්තාය... මෙතෙක්ම මෙහි සිටින කිසිදු



තරුණියකට බාහිර බලපෑම් එල්ලවී නැත... ආරතී සංජය පෙම්පුවත වැන්නක් දෙකක් මෙයට පෙරද මෙහි සිදුවී තිබිණ... එක්කෙනෙක් විවාහවී දැන් දෙදරු මවක් වී ඇති බව මෙන්ම අනෙක් තරුණිය ඒ පෙමින් ඉවත්වී පිටරට රැකියාවකට අනුයුක්ත වී ඇති බවද සියල්ලෝම දැන සිටියහ...

"අරෝෂ හිතන්නේ... එහෙනං එහෙනං..."

"ඔව්... සමහරවිට මේ හෝටල් කෙරුවාවට තරඟ කාරයෙක් හිටියොත්..." ඔහු කීවේද ඊයේ සියල්ලෝම කථා කළ අදහස්මය...

"අපේ අයත් කථා උනා අරෝෂ..." ඇය කීවාය...

"අපේ අය කිව්වෙ..."

"මෙතන මාත් එක්ක නැවතිලා වැඩ කරන අය..."

"එහෙම තරඟකාරයෝ ගැන ඔයා දන්නවද... නැත්තං ඕගොල්ල අතරෙ කථා උනාද...?" අරෝෂ ඇසුවේය.

"නැහැ... ඒත් ගොඩක් අය කථා කරා මෙතන අළුතින්ම ආව සෙකියුරිටි කෙනා ගැන නං..."

"සෙකියුරිටි...?"

"ඔව්... සේකර කියලා කෙනෙක්... පරණ එක්කෙනා ගියානේ... ඉන් පස්සේ දැන් මාස දෙකක් විතර..."

"එතන පොයින්ට් එකක් තියෙනවා..." අරෝෂට කියැවිණ... ආරතී රූමතියකි... ඔහු ඇයගෙන් වෙනත් ප්‍රයෝජනයක් සඳහා එලෙස පැන්නුවේ නම්... සංජය එසේනම් සේකර සූකරයෙකු කරන්නට පිළිවන... එක් අන්දමකින් බැලුවහොත් ඔහු ඉදිරියේ එදා සිටි සංජය අර බලපුළුවන්කාර කම පැතිරෙව් ඉතිරෙව් සංජය නොවන බව ඔහුටම දැනී තිබුණ බැවිනි...

"ඒත් දැන් අපිට ආයේ අර පරණ එක්කෙනා මෙතනට විතරක් දාලා තියෙනවා... සේකර කියන එක්කෙනාට හෝටලේ බලන්න කියලා... මෙතන තියන හොස්ටල්ස් දෙකට පරණ එක්කෙනා ගෙන්නගත්තා... එදා අර මිස්ට ජයරත්න කියලා කෙනෙක් ඇවිල්ලා කරපු ඉන්ක්වයරි එකෙන් පස්සෙ..."

"කොහොම උනත් කමක් නෑ තේජානි... මං කැමැතියි ඔයා

කවුරු හරිම එක්ක යනවනං එළියට යනකොට... කැමති නං මට කියන්න... මං එන්නං ටිකක් ෆලෝ කරගෙන..." ඔහු සිනහසෙන්නට ඇතැයි ඇයට සිතිණ... ඇය ඒ මොහොතේදී නිවැරදි විය... අරෝෂ එය කීවේ තරමක් සිනහසෙමිනි... එහෙත් එයින් හඬක් නම නොනැගිණ...

"මං එච්චර එළියට යන්නෙ නෑ නේ අරෝෂ... මට දැන් ඉතින් යන්න වෙන්නේ බැංකුවට තමයි... ගොඩක් වෙලාවකට බැංකුවට ගියේම ආරතී... එයාට ඉතින් යන්න එන්න ට්‍රාන්ස්පෝර්ට් හම්බ උනා... සතියකට දවසක්වත් සංජය මීට් වෙන්න ගියා... මගේ සල්ලිත් ගෙනාවෙ එයා..."

"එයාගේ බැන්ක් සේෆ් එකේ යතුරයි නම්බර් එකයි... ඔයාට හොයාගන්න පුළුවන් වෙයිද...?"

"මං අද බලන්නං අරෝෂ... සමහරවිට තියලත් ඇති... මට ආරතීගේ ඩයරියක් වගේ පොතකුත් තිබුණා... ඒකත් ඔයාට දෙන්න පුළුවන්..."

"ගුඩ් අයිඩියා... ඒකේ මොනවාම හරි තියෙන්න පුළුවන්... මට එහෙනං ගෙනැල්ලා දෙන්නකෝ ඒක... කවදද එනකොට ඔයා මාව මීට් වෙන්නේ...?"

"හෙට නං මට වැඩ... අදත් තව ටිකකින් ප්‍රැක්ටිස් වලට යන්න ඕන..."

"මං හෙට එන්නං..."

"ඒ වෙලාවට නං ගේන්න බෑ අරෝෂ... හෙට නං වැඩ ඉවරවෙලා තමයි මට යන්න පුළුවන් වෙන්නේ කාමරේට... එනකොට අරගෙන ඔයාට මං කථා කරන්නං... නැත්තං මයන්තට දෙන්නං..."

අරෝෂට එක්වරම හිස් බවක් දැණින... මයන්තට වඩා ඔහුට අවශ්‍ය වූයේ මෙම තරුණිය හා වදනක් දෙකක් නිදහසේ දෙඩීමටය... එදාද ඇය ආවේ මයන්ත සමගින් නිසාම ඔහුට ඇයගෙන් ඇසිය යුතුව තිබුණු බොහෝදේ අමතක කර දැමමේය...

"මට ඕන කරන්නෙ තේජානි ඇත්තටම ඔයත් එක්ක ටිකක් කථා කරන්න... ආරතී ගැන මට ටිකක් විස්තරයක් දැනගන්න ඕන... ඒක කරන්න පුළුවන් වෙන්නෙ මට ඔයාව තනියම මුණ ගැහුණොත් විතරයි..."

"ඇයි ඒ... තනියම...?"



"ඒ වගේ දෙයකදී තේජානි... දෙන්නා තුන්දෙනා අතරට සාක්කි ගියොත්... ඒවා අවශ්‍ය අනවශ්‍ය හැමෝම අතරට යන්න පුළුවන්... මේකට මොකක් හරි පොටක් හදාගෙන ඒකෙන් බේරෙන්න බලාගෙන කවුරු හරිම ඉන්නවනං... ඒ වගේ කෙනෙක්ට ඒක ගොඩක් වාසියක් වෙන්නත් ඉඩ තියෙනවා..." අරෝෂ කීවේ සත්‍යයක් බව තේජානිට සිතිණ...

මයන්තගෙන් වසන්තට ගියහොත්... බොහෝ විට වසන්තගෙන් වෙනත් අයට යා හැකිය...

"මං දන්න ඔක්කෝම වගේ මයන්තත් දන්නවනේ..."

"ඒකත් හරි... ඒත් මං අහන්න යන ප්‍රශ්න ගැන හිතුවොත්... ඒවා ගැන අනික් අය දැන නොගත්තට කමක් නෑ... ඒවා ආරතීට පුද්ගලික දේවල් වෙන්න පුළුවන්... මට දැනගන්න ඕන වෙලා තියෙන්නේ මේක හෝටලේ ඇතුලෙන් ආව වැඩක්ද කියලා බලන්න... මේක කිඩ් නැප් එකක්... සමහරවිට බ්ලැක්මේල් එකක් වෙන්නත් පුළුවන්..."

"එහෙනං මේ වෙද්දි කොහෙන් හරි කථා කරන්න ඕන නේ..."

"නෑ... සංජයට ඕන ගාණක් ගෙවන්න පුළුවන් එක්කෙනෙක් වගේම... ඕන කෙනෙක්ව අල්ලගන්නත් පුළුවන් කෙනෙක්... මේ දවස්වල මිනිහා සමහරවිට එන කෝල්ස් දෙන අය ගැන ඇහැ ගහගෙන ඉන්නත් පුළුවන්... ඉතින් මිනිහා ගැන දන්න කෙනෙක් කප්පමක් ගන්න කරත් ටිකක් මැන් කූල් ඩවුන්වෙන කං ඉදීවි..." අරෝෂ කීවේ ඔහුගේ සිතට ආ සැබෑම සිතිවිල්ල නොවුණද ඔහුට අවශ්‍ය දෙය සිදුවිය... ඔහුට අවශ්‍ය කළේ තේජානි නැමැත්තියගේ සිත තරමකට සන්සුන් කරලීමය...

නැතැයි කිව නොහැකිය... එහෙත් ඒ අතර ආරතීට යන කල දසාව ගැන වග කියන්නේ කවුද...? තේජානි ඒ අතර සිතුවේ තරමක් සන්සුන් වෙමිනි...

"ඒ වෙද්දි රතීට වෙන්න ඕන ඔක්කෝම වෙලා තියෙයි..." එලෙස සිතෙද්දී ඇයට කියැවිණ...

"තේජානි... වටින්නෙ ජීවිතේ මිසක් ජීවිතේට මොනවා

වෙනවද කියන එක නෙවෙයි... ඒක නිසා ඒ වගේ මයිනස් හිතිවිලි අයින් කරන්න..."

"මට අයින් කරන්න පුළුවන් වෙයි... ඒත් ඒක රතීට අයින් කරන්න පුළුවන් වෙයිද...?" ඇය ඇසුවේ තරමක නොමනාප හඬකිනි...

"ඒක අපිට දැන ගන්න පුළුවන් වෙන්නේ රතී ඉන්න තැන හොයාගත්තයින් පස්සේ නේ... සමහරවිට එයා අපි හිතනවට වඩා බොහොම හොඳ තැනක ඉන්නත් පුළුවන්... ඔයාට නැහැයි කියන්න පුළුවන්ද...?"

නැත...

"ඉතින් එහෙනං මං කොහොමද ඔයාව මීට වෙන්න එන්නෙ..."

"ඒක නං ප්‍රශ්නයක් තමයි තේජානි... ඔයාට මොනවා හරි ගන්න තියෙනවා කියලා එන්න පුළුවන්ද...?"

"මං බලන්නං... මං එන්න වෙලාව හදාගෙන ඔයාට මේ නම්බර් එකට කථා කරන්නද...?"

"මට රින් කට් එකක් දෙන්න... මං ඔයාට ගන්නං..." අරෝෂ කීවේය...

"නැහැ අරෝෂ... මං කතා කරන්නං..." කියූ තේජානිට එක්වරම සිතුණේ සමහරවිට ඔහු හා සිටින්නන්ටද මෙම හමුව රහසක් කරගන්නට ඔහු දඟලන්නේද යන්නය... "ඔයා කැමැති නං..."

"ඇයි එහෙම කිව්වෙ...?" අරෝෂ ඇසුවේ තරමක් කුතුහලයකිනි... ඇය එලෙස ඇසුවේ ඇයිදැයි යන්න නම් ඔහුට වැටහුණේ නැත.

"නැහැ මං හිතුවා... මං කථා කරනකොට කවුරු හරි ළඟ එහෙම හිටියොත්..."

"ඒකත් ඇත්ත..." කියූ අරෝෂට මතක් වුණේ සංජයය... වැරදිලාවත් ඔහු හෝ සිටියහොත්... "කොයිකටත් හොඳයි ඔයා මට රින් කට් එකක් හරි මෙසේජ් එකක් හරි එවන්න... එතකොට මං කථා කරන්නං... කොහොමටත් ඔයා මේ සංජය කියන කෙනාට මුණගැහුණොත් තවත් ප්‍රශ්නයක් වෙයි නේ..."



"කවුරුවත් මං අඳුනගන්න එකක් නෑ අරෝෂ... මාව දැකලා නෑ කවුරුවත්ම... අපේ කට්ටිය ඇරෙන්න..."

අරෝෂට සැහැල්ලුවක් දැණින... ඇය නිතරම මෙන් වෙස්වලාගෙන ගී ගයන බව ඔහුට මතක් වූයේද ඒ මොහොතේය... එය මතක් වෙද්දී ඔහුගේ සිතටද සැහෙන සැහැල්ලුවක් දැනී තිබිණ.

අදම අරෝෂ මුණ ගැසුණේ නම් ආරතීගේ මෙම දිනපොත වැන්න ඔහු අතට දිය හැකි වනු ඇත... ඔහුට නම් එහි තිබෙන යම් යම් දෑ කියවා ගන්නට හැකි බව තේජානි සිතුවාය... අද දිනයටද නිවාඩුවක් ගන්නට නොහැකිය...

විවේක වේලාවේ මඳක් එළියට යන්නට අවසරයක් ගත යුතුය ඇය සිතුවේ පසුවය... හදිසියකට නංගීට ගැනීමට අවශ්‍ය වූ යමක් ගැනීමට මෙන් එම අවසරය ගත යුතුය...

"ඔයාට වෙලාවක් තියෙනවනං... මං අද බලන්නං පැයකට විතර එළියට එන්න..." ඇය කීවේ එය මතක් වෙද්දීය.

අරෝෂ එයට එපැයි කීවේ නැත... ඔහුට වෙලාවක් හදාගන්නට අවශ්‍යතාවයක් නැත... ඔහුට ඕනෑතරම් මෙය වෙනුවෙන් වෙන් කරන්නට කාලය තිබේ...

"ජානි තනියමද යන්නෙ...?" ඇය අවසරය ඉල්වද්දී ෂෙනාලි ඇසුවාය.

"ඔව් මිස්... දැන් මයන්තටත් එන්න බෑ නේ ප්‍රැක්ටිස් එක නතර කරලා... මං පැයකට විතර නේ යන්නෙ..."

"එහෙනං මෙහේ වාහනේ ලෑහැස්ති කරලා දෙන්නද...?"

"මං අන්කල් ගෙන් ඇහුවා නේ මිස්... අන්කල් එන්නං කිව්වා..." තේජානි කීවේ හෝටලයේ වාහනයේ ගියහොත් අරෝෂ දකිද්දී වෙනත් ප්‍රශ්න තොගයක් නැගෙන්නට ඉඩ ඇති බව දන්නා හෙයිනි. මයන්තගේ පියා සමඟ යද්දී කවරෙක්වත් කුමක් වත් කියන්නේද නැත...

"පරිස්සමින් ජානි... කවුරු හරි එක්ක ගියානං තමයි මං කැමැති..."

"බෑ මිස් ෂෙනාලි... අරගෙන ගිහිල්ලා නංගිට ඒක දීලම එන්න ඕන..."

"මොකක්ද ගන්න යන්නේ...?"

"නංගිට කවකටු පෙට්ටියක් ගේන්න කිව්වා... නිල් පාට රෙද්දක් ගේන්න කිව්වා... ඒ දෙකම අරගෙන..." ඇය කීවේ නම් මුසාවක් නොවේ... එහෙත් එය අනික් සතියේ වුවද ලැබුණේ නම් කමක් නැතැයි නංගී කී බව ඇය කියන්නට ගියේ නැත...

"පරිස්සමෙන්... ෆෝන් එක ඕෆ් කරන්න එපා..." ෂෙනාලි දෙවන වරටත් පරිස්සම් වෙන්නට කීවේ නංගී බලන්නට යද්දී නම මෙහේ කවරෙක්වත් රැගෙන යෑමට තේජානි අදි මදි කරන බව දන්නා හෙයිනි.

තෙජානි ශාන්තාගේ කාමරයට ගියා නොවේ පියැඹුවාය... ඉන්පසු දුරකථනය ගෙන අරෝෂට ගත්තාය...

ඇය කථා කළේ තරප්පු පෙළ නගිමිනි...

"කොහේටද අරෝෂ මං එන්නේ...?" ඇය ඇසුවේ මයන්තගෙන් අර ලිපි තුනත් ගන්නට ලැබුණේ නම් හොඳ බවද සිතමිනි... එහෙත් එය අසද්දී තමා මෙලෙස යන බව මයන්තට කිව යුතුය... අරෝෂ එයට කැමැත්තක් නොදක්වූ බව ඇයට දැන්වූ හෙයින් ඇය තරමක් සිතුවාය... මයන්තගේ පියා සමහරවිට මයන්තට තමා ගිය තැන ගැන කියන්නට පිළිවන... කෙසේ වුවත් දූන් අරෝෂගෙන් අසා ඉවරය...

"ඔයා කොහේ යනවා කියලද එන්නෙ...?"

"නංගිට කවකටු පෙට්ටියක් ගන්න තියෙනවා... නිල්පාට..." ඇයට වෙනත් කිසිවක් කියන්නට ලැබුණේ නැත...

"එම සී එකට එන්න... මයන්තගේ තාත්තාත් එක්ක නේ එනවා ඇත්තේ...?"

"ඔයා කොහොමද දන්නෙ...?" අසමින්ම ඇය කාමරයේ දොර විවර කළාය... ඇයට ආරතී නැති කාමරයට අඩියක් තියන්නටද කැමැත්තක් නම් ආවේම නැත... එහෙත් අර පොත ගත යුතුය... එය ඇය තිබ්බේ මේසය මතය... ඇඳුමක් ගන්නට වුවද ඇය ආවේ ශාන්තා සමගිනි... මෙයින් තමා පොතක් ගත් බව ශාන්තාට පෙන්වන්නට ඇය කැමැති වූයේ නැත.

"දන්නෙද...? මයන්තයි ඔයයි දෙන්නම නේ ඔගොල්ල යන ත්‍රීවිලර් ගැන කිව්වෙ..."



ඇයට සිනහවක් නැගිණ...

"හානේ... ඇත්තටම මතක නැති උනා..." ඇය කීවේ ඒ සිනහව මඳක් හඬකින්ද පිටකරමිනි...

"දූන් හිත සුද්ධයි නේ... එහෙනං ඇතුළට ඇවිල්ලා මට කෝල් එකක් දාන්න... අන්කල්ට කියන්න ඔයාගේ වැඩ ඉවරවෙලා කෝල් කරන්නං කියලා... මට ඔයාව ඩ්‍රොප් කරනැකි... ඒත් ඒක මේ වෙලාවෙ නුවණට හුරුයි කියලා මං හිතන්නේ නෑ... ඊළඟට ඉන්නෙ ඔයා නං... ඔයාව ඔතනට ගෙනාව මිනිහා කවුද කියලා හැමෝම මං ගැනත් සැකයක් ගන්න පුළුවන්..." ඔහු කීවේ සැබැවින්ම ඇයගේ සිතම හිරිගඩු නංවමිනි... ඒ පුද්ගලයා අරෝෂමද යන්නත් තේජානිට සිතුණු තරම්... එහෙත් එසේනම් ඇය සිත සාදා ගත්තාය... ඇයට යන්නට වෙන්නේත් ආරතී ගිය තැනටමය... ඇයට එවිට මිතුරිය සමුවිය හැකිය...

, දෙවනුව ඒ අදහස ඉවත් විය... ඔහු එලෙස තැනැත්තෙක් නම් මයන්තට ඔහු සිටින තැන ගැන කියන්නේ නැත... ඔහුගේ මුළු නමම කියන්නේද නැත... අරෝෂ සෙනෙවිරත්න වැඩ කරන්නේ ඒ නීතිඥ සමාගමේ නම්... එහෙත් තමා යන තැනක් නොකියා... දෙවනුව ඇයගේ අදහස් යළි වෙනස් විය... මිතුරිය වෙනුවෙන් තරමක වගකීමකින් යුතුව මෙවන් පියවරක් හෝ ගත යුතු බව ඇයට සිතෙද්දිය.

"එහෙනං... අරෝෂ මට වෙලාව කියන්න බෑ... මං මෙහෙන් පිටත් වෙනකොට ඔයාට රින් කට් එකක් දෙන්නං... ඒ මොකද මට ත්‍රී විලර් එකේදි ඔයා එක්ක කථා කරන්න නං බෑ..." ඇය කීවාය...

"ඔයාත් ඇතුල්වෙච්ච ගමන් මට කථා කරන්න හරි මං අඳුනගත්තට ළඟට එන්න හරි හිතන්න එපා... ඔයා පස්සෙනුත් කවුරු හරි හිටියොත් ඒක ප්‍රශ්නයක් වේවි අපි දෙන්නටම..."

ඇය පළමුවම කළේ අල්මාරිය විවර කරගැනීමය... යතුරු වගයක් එහි කුඩා ලාච්චුවේ පොඩි පෙට්ටියක දමා තිබුණු බව එදා අල්මාරිය විවර කරද්දී තේජානි දුටුවාය... සේප්පුවේ අංකය නම්... එය සමහරවිට මෙම පොතේ තිබෙන්නට පිළිවන... සංජය නම් දන්නවා විය හැකිය... අසන්නේ කෙලෙසද...? එලෙස ඇසුවහොත් ඒ ගෝනුස්සා තමා ගැන වෙනත් දෙයක් සිතා ගනු ඇත...

ඇය යතුරු පෙට්ටියම ගත්තාය... එහි යතුරු පහක්ම තිබිණ...

සමහරවිට දෙකක් නම් සංජයගේ නිවසේ හා කාමරයේ යතුරු විය හැකිය... ඒවා ප්‍රමාණයෙන් විසල් ඒවා හෙයිනි... එහෙත් ඒවා එතන තබන්නට ඇය නොසිතුවාය...

දෙවැනිව ඇයට සිතුණේ එසේනම් එදා ඇය යන්නට ඇත්තේ සංජය එන බව නොදන විය හැකි බවය... සංජය එන්නෙ යැයි කියා තිබුණේ නම් ඇය මෙලෙස යතුරු තබා යන්නට නම් සිතන්නේම නැත... ඇයට එවර දැණුනේ කුතුහලයකි...

ආභරණ පෙට්ටිය ගත යුතුද නැද්දැයි සිතා ගැනීමට ඇය මදක් කල් ගත කළාය... අන්තිමේදී එයද රැගෙන යන්නට තීරණය කළාය... අරෝෂ නීතිඥයෙකි... ඔහුට මේවා ගැන සිතන්නට තමාට වඩා පිළිවන් කමක් තිබෙනු ඇත...

වෙනත් යමක් නොසිතාම ඇය ගතයුතු සියල්ල ගත්තී ඉන්පසු අල්මාරියේ දොර වැසුවාය... මින්පසු... එය තමා අතින් විවර නොකෙරෙන්නටත් පිළිවන...

මේසය මත තවමත් ආරතීගේ පොත තිබිණ... පසෙක තිබුණේ ඔවුන් දෙදෙන එක්ව ගත් පින්තූරයකි... ඒ ආරතීගේ උපන්දිනයකදීය... බොතේජු මහතා එදා ඇයගේ හා නංගිගේද ඡායාරූප කිහිපයක් ගත්තේය... ආරතී මෙය දකිද්දී එය ඩැහැ ගත්තේ එයින් වෙනත් පිටපතක් ඔවුන්ට ගන්නට කියමිනි... රාමුවක් ගෙනැවිත් එය රාමු කර මේසය මත තැබුවේද ඇය විසිනි... ඒ වෙද්දී ඇය හා සංජය අතර මිතුරු කමක් නොතිබිණ...

පොතද රැගත් තේජානි කාමරය සිසාරා බැල්මක් හෙලුවාය... ආරතීගේ යහන දකිද්දී ඇයගේ සිතට දැණුනේ දුඩි දුකකි... ඇය යහන මත වාඩිවී තමාට කොට්ටයෙන් දමා ගසා අවදි කළ දවස් කොපමණක් තිබුණේද...? මෙම කාමරයට ආ දිනයේ සිටම ඇයට ආරතීගෙන් ලැබුණේ නොමඳ සහයෝගයකි... ඒ සියල්ල මතක් වෙද්දී...

නෙතට ආ කඳුළු නවතාගනිමින් ඇය කාමරයේ දොර වැසුවාය...

ඇය දෑසේ කඳුළු නවතාගත්තේ පහළ ශාන්තාගේ නාන කාමරයේදීය...

තමාට මිතුරියක නැතිවී මෙපමණ දුකක් දැනේ නම් පුංචි



අම්මාට බාප්පා නැතිව කෙතරම් දුකක් දැනෙන්නට ඇද්දැයි ඇයට සිතුණේ ඒ මොහොතේදීය... නැගණියගේ දෙමාපියන්ගේ වියොව...

ඇයගේ දෙමාපියන්ගේ වියොව...

ඒවාට වඩා ආරතී නැතිවෙද්දී තමාට දැඩි බියක් දැනෙන බව ඇයට සිතිණ... එදා දෙමාපියන් නැති වූවද තවත් නෑදැයින් වටේ සිටියහ... ඔවුන්ට නොහැකි වූයේ තමාගේත් නැගණියගේත් බර කරට ගැනීමය... දැන් ඇයට සිටින්නේ ආරතීම පමණකි...

ඇයගේ කඳුළු වියැකුණද සිතේ ඇතිවූයේ බොහෝ පසුතැවිල්ලකි... ඒවා පෙර කරුම වන්නට පිළිවන... එහෙත් මේ ආත්මයේදීද ඇයට පිනක් දහමක් කරගන්නට අවස්ථාවක් ආවේම නැත... ජීවිතය රැක ගන්නට මේ රැකියාව හොඳටම ඇත... එහෙත් මෙම රැකියාවෙන් ඇයට පන්සල් යැමටවත් වරමක් ලැබුණේම නැත... යළි විවේකයක් ලැබූ විටක නංගීත් සමග පන්සලකට යා යුතුය ඇය සිතුවාය... ඒ අතින් නැගණිය වාසනාවන්තය... ඇය බොතේජු යුවළ සමග බොහෝ විට පල්ලි යන්නීය... ඔවුන් හා ඒ පල්ලිවලට අනුබද්ධිත දානමාන වලට සහභාගි වන්නීය... ඉදහිට ඇය සමග පන්සලකට වුවද යන්නට තරම් ඔවුහු නොමසුරු වූහ... වඩාත් වැදගත් වන්නේ ආගම නොවේ... ආගම් ඇසුරින් කෙරෙන පින්කමය... ඒවා බුද්ධ ධර්මය, ක්‍රිස්තු ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යැයි වෙනස් වන්නේ නැත... සියල්ලෝම කුමන අන්දමකින් හෝ පින් කරගනිති...

මේ සියල්ල නිමවූ දිනක... ආරතී පැමිණි දිනක ඇය සමග නුවර දළදා මාලිගාවට යායුතුය ඇය සිතෙන් බාරයක් වූයේ තරප්පු පෙළ බසින අතරමය...

මයන්තගේ පියා ඇය එද්දීද එහි ගේට්ටුව ළග මුරකරු සමග කථා කරමින් ත්‍රිරෝද රථය නවත්වා ගෙන සිටියේය...

කවරෙක්වත් ඇය යන්නේ කවුරු හෝ මුහුණ ගැසීමට බව සැක සිතුවේම නැත... එහෙත් ඇය බොහෝ විමසිලිවත් වූවාය... ඇය කිහිප වරක්ම පිටුපස හැරී බැලුවේ හෝටලයේ කවරෙක්වත් ඇයගේ මෙම ත්‍රිරෝද රථය පිටුපසින් එද යන්න ගැනය... ඇයට අරෝෂ තී බොහෝ කරුණු අමතක කරන්නට නොහැකිව තිබුණේ තරමක් දුරට ඒ ගැන සිතෙද්දීය... මෙය හෝටලයේ ප්‍රතිපත්තියට විරුද්ධව ගිය ක්‍රියාවලියක් නම් ඔවුන් දෙවැනිව එන්නේ තමා එයින් ඉවත්

කරලිමටය... මෙ අවුරුද්දේ එයට කවරෙක්වත් නොගන්නා බවද කණින් කොණින් ගිය ආරංචිවලින් ඇය දැන සිටියාය... ඒ ආරතී හා තමා නිසාවෙනි...

අරෝෂ ගැන ඇයගේ සිතේ සැකයක් තබා ගන්නටද නොහැකි වූයේ ඔහු ඇයගේ පැත්තෙන් ඇයට කියූ කරුණු එලෙස මතකයට නගිද්දීමය...

★★★

කියූ ස්ථානයෙන් බැස සුපිරි සාප්පු සංකීර්ණයට ඇතුල් වූ ඇයට දුරකථන පණිවිඩයක් දෙන්නට අවශ්‍ය වූයේ නැත... පණගන්වද්දීම ඇය දුටුවේ අරෝෂ තරමක් දුර සිට ඇය දෙස බලා සිටි අන්දමය... ඇය ඔහු නොදුටු තාලයෙන් එවර ජංගම දුරකථනය යළිත් අත් බෑගයට දමා ගත්තාය... ඇය තමා දුටු බව මෙන්ම ඇය තමා දුටුවද ඒ බව නොහඟවා ඒ කරන ලද ක්‍රියාවෙන්ද ඇය කෙතරම් කල්පනා කාරිව සිතන්නියකදැයි අරෝෂ සිතුවේය...

ඇය සෙමින් ඉදිරියට ආවාය... අරෝෂද සෙමින් ඇය ඉදිරියට ගියේය... ඇය පසුපසින් පන්නන කිසිවෙක් නොආ බව පමණක් ඔහුට සිතිණ... කවරෙක්වත් ඇය දෙස ඕනෑකමකින් බැලුවේම නැත...

ඇයගේ දුරකථනයට පණිවිඩයක් ආවේ අරෝෂගෙන් බව ඇය දුටුවේ ඔහු දුරකථනය ගෙන සවණට තබාගන්නා බව දුටු හෙයිනි...

"අපි එහා පැත්තෙ පඩිපෙළෙන් බැහැලා විජිත යාපා එකට යමු... ඔයාට කවකටු පෙට්ටියක් ගන්න ඕන කිව්වනේ... මං ඉස්සරහින් එන්නං... ඔයා මේ පැත්තෙන් බහින්න..." ඇයට වෙනත් යමක් කියන්නට නොදී දුරකථනය විසන්ධි වුවද ඔහු එය සවණට තබාගෙනම අනික් දෙසකට ගියේය...

ඇය වෙනත් කිසිවක්ම නොකියා ඔහු කියූ ලෙසම විජිත පොත් හල දෙසට පියවර තැබුවාය...

ඔහු එතනට ආවේ ඇය කවකටු පෙට්ටි තෝරද්දීය...

"හලෝ... මෙහේ මොකද...?" ඔහු ඇය වෙත ළඟාවෙමින්ම ඇසුවේය...



ඇයට සිනහවක් ආවද ඇය පිළිතුරු දුන්නාය...

"මෙ නංගට කවකටු පෙට්ටියක් ගන්න..." සේවකයා දෙදෙනා දෙසම බැලුවේ වෙනත් කිසිවක්ම නොකියා තරමක් පැත්තකට වී ඔවුන් දෙදෙනාගේ කථාවට ඉඩ දුන්නේය...

"හම්බ උනාද හොඳ එකක්...?" ඔහු ඇසුවේ ඇය කිහිපයක්ම මෙන් ඉදිරියෙන් තබාගෙන සිටිනු දකිද්දීය...

"මේක හොඳයිද කියලා හිතුණා..." ඇය අත තිබූ පෙට්ටිය පෙන්වා කීවාය... ඔහු එය ගත්තේය... ඇතුළත බැලුවේය... "ඔක්ස්ෆර්ඩ් එකක් ගන්න..." කියූ ඔහු එවර වෙනත් පෙට්ටියක් ගත්තේය... "අපි පොඩි කාලෙත් පාවිච්චි කළේ මේක... දැන් ටිකක් ඉතින් බාල වගේ උනත්... මේවා හොඳයි..." කියූ ඔහු සේවකයා දෙස බැලුවේය... "මට නම්බර් ටෙන් ස්ටේපල්ස් පැකට් එකක් දෙන්න... මේකෙන් එහෙනං අපි දෙන්නාගෙම ඒවා ගන්න..." ඔහු රුපියල් දෙදාහක කොළයක් දිගු කළේය.

"දෙකම එක රිසිට් එකකට දාන්නද සර්...?"

"කමක් නෑ... බිස්ට් දෙන්න රිසිට් එක... මට දෙන්න ඉතුරු සල්ලි ටික..." අරෝෂ කීවේ සේවකයාගේ සිනහවක් නංවමිනි. තේජානිගේද සිනහවක් නැගිණ...

"මං ළඟ සල්ලි තියෙනවා..." ඇය කීවාය... ඔහුගේ නම එතනදී කීමට ඇයට බියක් දැණින...

ඔහු ඇයට ඇසක් ගැසුවේ සේවකයා ඉවත් වෙද්දීය...

"එකක් මට ඒ දෙදාහ මාරු කරගන්න ඕන... අනික ඉතින් මේ පොඩි එකෙකුට මොනවා හරි අරන් දෙන්න තියෙන පින හැබි කරන්න එපා... ඔයාගෙ නංගි උනාට මං දෙන්නෙ පොඩි එකෙකුට නේ..."

"ඒ උනාට ඉතින් මාත් හම්බ කරනවනේ..." ඇය කීවේ ඔහු එය කියෙවූ ස්වරයට සිනහසෙමිනි... ඇයට පින් ගැන ඇයට සිතුණු බව සිතුම මතක් විය... ඇයගේ සිනහව වියැකුණේ යමක් සිතුණු නිසා බව ඔහුට දැණින... ඇයට එය මදිකමක් වූයේදැයි ඔහුගේ සිතට සැකයක් නැගිණ...

"එහෙනං යං මං ඔයා ගානේ තේ කෝප්පයක්වත් බොන්න..." ඔහු සිනහසී කීවේය... "මං හදහුව බීලා මට ඇති වෙලා තියෙන්නේ..."

ඇයගේ සිහින් සිනහවක් නැගිණ.

"ඒත් ඉතින් මට තේ කෝප්පයක්වත් දෙන්න තැනක් නෑ නේ..."

"එහා පැත්තේ තියෙනවා... ගමේ කෑම කඩයක්... මං වෙහිකල් එක පාක් කරෙත් එතන... අපි එතනට ගිහිල්ලා මොනවා හරි කාලා... බීලා... වෙහිකල් එකේම කොහේට හරි නිස්කලංක තැනකට යං... ඔයා පැය කීයකටද නිවාඩුව ඉල්ලා ගත්තේ..."

"පැයකට විතර කියලා... මං අඩු ගාණෙ දෙකට වත් යන්න ඕන එතනට..."

"දැන් එකොළහයි නේ... පැය තුනක් තියෙන්නෙ... ඔයාට තව කොහේටද යන්න ඕන..."

"නිල්පාට රෙදි මීටර් දෙකක් ගන්න ඕන..."

"එහෙනං යනකොට මං ඔයාව ෂොප් එකකින් බස්සවන්නං... එතනට ත්‍රී වීලර් එක ගෙන්න ගන්න... මාත් එනවා ඔයා පස්සෙන්ම... එතනට යන කං... එතකොට මට විශ්වාසයි නේ ඔයා එතනටම ගියා කියලා..." කියූ ඔහු සේවකයා එනු දුටුවෙන් ඒ දෙස බැලුවේය...

"දැන් ඉතින් කියන්න තේජානි ඔක්කෝම විස්තර..." ඔහු කීවේ නිදහසේ වාහනය මුහුද අද්දර තැනකට කළ පසුය... එලෙස වාහනය ගැසූ පසු කවරෙකුටවත් වාහනයේ සිටින තමා නම් නොපෙනෙන බව තේජානිට වැටහී තිබිණ... සැබැවින්ම මොහුගේ ඇකියාව නීතිඥකමදැයි ඇයට සැකයක් නැගෙමින් තිබිණ.

"ඔක්කෝම විස්තර කිව්වෙ...?" ඇය තරමක කුතුහලයකින් ඇසුවාය... ඊයේ දිනයේදී ඒ සියල්ලම මොහුට විස්තර කලා අමතක වෙන්නට තරම් කාලයක් ගියේ නැත...

"මං නොදන්න හරියකුත් මෙකේ ඇති... ඔගොල්ලො කිව්වෙ ඔය තුන්දෙනාම දන්න කරුණු... ඔය දෙන්නා විතරක් දන්න දේවල් ආරතියි ඔයයි... ඒ ටික දැන් මං අහන්නෙ..."

තේජානි ඇයගේ අත් බෑගය විවර කර යතුරු පෙට්ටිය ගත්තාය...

"මෙකේ තමයි ඔක්කෝම යතුරු දාලා තිබුණේ..."



අම්මාට බාප්පා නැතිව කෙතරම් දුකක් දැනෙන්නට ඇද්දැයි ඇයට සිතුණේ ඒ මොහොතේදීය... නැගණියගේ දෙමාපියන්ගේ වියොව...

ඇයගේ දෙමාපියන්ගේ වියොව...

ඒවාට වඩා ආරති නැතිවෙද්දී තමාට දැඩි බියක් දැනෙන බව ඇයට සිතිණ... එදා දෙමාපියන් නැති වූවද තවත් නෑදෑයින් වටේ සිටියහ... ඔවුන්ට නොහැකි වූයේ තමාගේත් නැගණියගේත් බර කරට ගැනීමය... දැන් ඇයට සිටින්නේ ආරතිම පමණකි...

ඇයගේ කඳුළු වියැකුණද සිතේ ඇතිවූයේ බොහෝ පසුතැවිල්ලකි... ඒවා පෙර කරුම වන්නට පිළිවන... එහෙත් මේ ආත්මයේදීද ඇයට පිනක් දහමක් කරගන්නට අවස්ථාවක් ආවේම නැත... ජීවිතය රැක ගන්නට මේ රැකියාව හොඳටම ඇත... එහෙත් මෙම රැකියාවෙන් ඇයට පන්සල් යෑමටවත් වරමක් ලැබුණේම නැත... පළි විවේකයක් ලැබූ විටක තාංගීත් සමග පන්සලකට යා යුතුය ඇය සිතුවාය... ඒ අතින් නැගණිය වාසනාවන්තය... ඇය බොහේපු යුවළ සමග බොහෝ විට පල්ලි යන්නීය... ඔවුන් හා ඒ පල්ලිවලට අනුබද්ධිත දානමාන වලට සහභාගි වන්නීය... ඉදගිව ඇය සමග පන්සලකට වුවද යන්නට තරම් ඔවුනු නොමසුරු වූහ... වඩාත් වැදගත් වන්නේ ආගම නොවේ... ආගම ඇසුරින් කෙරෙන පින්කමය... ඒවා බුද්ධ ධර්මය, ක්‍රිස්තු ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යැයි වෙනස් වන්නේ නැත... සියල්ලෝම කුමන අන්දමකින් හෝ පින් කරගනිති...

මේ සියල්ල නිමවූ දිනක... ආරති පැමිණි දිනක ඇය සමග නුවර දළදා මාලිගාවට යායුතුය ඇය සිතෙන් බාරයක් වූයේ තරප්පු පෙළ බසින අතරමය...

මයන්තගේ පියා ඇය එද්දීද එහි ගේට්ටුව ළඟ මුරකරු සමග කථා කරමින් ත්‍රිරෝද රථය නවත්වා ගෙන සිටියේය...

කවරෙක්වත් ඇය යන්නේ කවුරු හෝ මුහුණ ගැසීමට බව සැක සිතුවේම නැත... එහෙත් ඇය බොහෝ විමසිලිවත් වූණාය... ඇය කිහිප වරක්ම පිටුපස හැරී බැලුවේ හෝටලයේ කවරෙක්වත් ඇයගේ මෙම ත්‍රිරෝද රථය පිටුපසින් ඒද යන්න ගැනය... ඇයට අරෝෂ කී බොහෝ කරුණු අමතක කරන්නට නොහැකිව සිතුණේ තරමක් දුරට ඒ ගැන සිතෙද්දීය... මෙය හෝටලයේ ප්‍රගතියට විරුද්ධව ගිය ක්‍රියාවලියක් නම් ඔවුන් දෙවැනිව එන්නේ තමා එයින් ඉවත්

ඇයගේ සිහින් සිනහවක් නැගිණ.

"ඊත් ඉතින් මට තේ කෝප්පයක්වත් දෙන්න තැනක් නෑ නේ..."

"එහා පැත්තේ තියෙනවා... ගමේ කෑම කඩයක්... මං වෙහිකල් එක පාක් කරෙත් එතන... අපි එතනට ගිහිල්ලා මොනවා හරි කාලා... බීලා... වෙහිකල් එකේම කොහේට හරි නිස්කලංක තැනකට යං... ඔයා පැය කීයකටද නිවාඩුව ඉල්ලා ගත්තේ..."

"පැයකට විතර කියලා... මං අඩු ගාණෙ දෙකට වත් යන්න ඕන එතනට..."

"දැන් එකොළහයි නේ... පැය තුනක් තියෙන්නෙ... ඔයාට නව කොහේටද යන්න ඕන..."

"නිල්පාට රෙදි මීටර් දෙකක් ගන්න ඕන..."

"එහෙනං යනකොට මං ඔයාව ෂොප් එකකින් බස්සවන්නං... එතනට ත්‍රී වීලර් එක ගෙන්න ගන්න... මාත් එනවා ඔයා පස්සෙන්ම... එතනට යන කං... එතකොට මට විශ්වාසයි නේ ඔයා එතනටම ගියා කියලා..." කියූ ඔහු සේවකයා එනු දුටුවෙන් ඒ දෙස බැලුවේය...

"දැන් ඉතින් කියන්න තේජානි ඔක්කෝම විස්තර..." ඔහු කීවේ නිදහසේ වාහනය මුහුද අද්දර තැනකට කළ පසුය... එලෙස වාහනය ගැසූ පසු කවරෙකුටවත් වාහනයේ සිටින තමා නම් නොපෙනෙන බව තේජානිට වැටහී තිබිණ... සැබැවින්ම මොහුගේ රැකියාව නීතිඥකමදැයි ඇයට සැකයක් නැගෙමින් තිබිණ.

"ඔක්කෝම විස්තර කිව්වේ...?" ඇය තරමක කුතුහලයකින් ඇසුවාය... ඊයේ දිනයේදී ඒ සියල්ලම මොහුට විස්තර කලා අමතක වෙන්නට තරම් කාලයක් ගියේ නැත...

"මං නොදන්න හරියකුත් මෙකේ ඇති... ඔගොල්ලො කිව්වේ ඔය තුන්දෙනාම දන්න කරුණු... ඔය දෙන්නා විතරක් දන්න දේවල් ආරතියි ඔයයි... ඒ ටික දැන් මං අහන්නෙ..."

තේජානි ඇයගේ අත් බෑගය විවර කර යතුරු පෙට්ටිය ගත්තාය...

"මෙන්න තමයි ඔක්කෝම යතුරු දාලා තිබුණේ..."



අරෝෂ සෙමින් පෙට්ටිය විවර කළේය... එතුළ බැලුවේය...

"දෙකක් නං කාමරවල... ඔය දෙන්නගේ කාමරේ... යතුරද...?"

"නෑ... ඒක එයා ගෙනියනවා... තියාගන්නෙම එයාගේ හෑන්ඩ් බෑග් එකේ..." කියූ ඇය අරෝෂ දෙස බැලුවාය... ඇය කුමක් හෝ කියන්නට යන්නේදැයි සිතුණු හෙයින් අරෝෂ ඇය දෙස හොඳින් බැලුවේය... "මේක මට හිතුණේ සංජයගේ ගෙදරයි කාමරෙයි හරිද කියලා... එයා ඒ කියන්නේ... ඒ යතුරු දෙක එදා ගෙනියලා නෑ කියන්නෙ... එදා රතී සංජය මිට වෙන්න කියලා හිතාගෙන ඇදලා නෑ... එදා ඇත්තටම කිව්වා වගේ එතනට කථා කරලා තමයි එයාව ගෙනියලා තියෙන්නේ..."

අරෝෂ හිස සැලුවේය... එසේනම් එය කරන්නට ඇත්තේ වෙනත් කවරෙක් හෝ විය යුතුය... සංජය එදා මුළු දවසම මෙන් ප්‍රීතියේ අම්පාරේ බව ඔහු දැනගෙන තිබිණ... සංජය මෙයට ගැලවෙන්නට නොසිතා ඇයට කිසිවක් කළේද...? තමාට මෙම සොයා ගැනීම කරන්නට තිබේ ඔහුගේ එම සම්බන්ධය ගැන දැනගැනීම වළක්වා ලීමටද...?

ඔහු පෙට්ටිය වසා යළි ඇය දෙස බැලුවේය... එවර ඇය ගත්තේ ආභරණ පෙට්ටියය... එයද ඔහු ඇයගෙන් ගත්තේය...

"මේක දීලා තිබුණේ සංජය කියන කෙනා..." ඇය අරෝෂට එය දෙන ගමන්ම කීවාය.

එය අරිද්දී ආරතී දමන විලවුන් සුවඳ වාහනය පුරාම විහිදිණ... තේජානිට කඳුළක් නැගිණ... ඔවුන් දෙදෙන ගත්තේ දේශීයක විලවුන්ය...

ඇයගේ ගෙලේ කැළල වැටුණේ එහි තිබුණු වටිනා ආභරණ කට්ටලය දැකීමේ ගෙනුවෙන් නොවේ... එය ඇයට මතකය... එහෙත් එදා නිදිමතේ පියන ඇතුල්පැත්තේ ලියා තිබූ වැකිය ඇය දුටුවේම නැත...

...වටිනා දායාදයක් තිළිණ කළ මගේ පෙම්බරියට... එහි ලියා තිබුණේ ඉංග්‍රීසියෙනි.

වටිනා දායාදය කුමක්දැයි සිතාගැන්මට තේජානිට අසීරු නොවුණේ එහි දිනයද පහතින් යොදා තිබුණ හෙයිනි...

එය අරෝෂටද සිතා ගැන්මට හැකිවූයේ එය ගැන සංජය ඔහුට දැන්වූ බැවිනි... ඔහු ඇයට මෙලෙස තිළිණයක් නම් දුන් බව කීවේ නැත... ආභරණ කට්ටලයේ වටිනාකම තුන් ලක්ෂයක්වත් විය හැකියැයි ඔහු නම් තීරණයක් ගත්තේය... එහි තිබුණේ සැබෑම දියමන්ති හා මුතු බව වටහාගනිද්දීය...

මැයට නම් ඒවා ගැනද ආශාවක් නැතිවා විය හැකිය... කිව නොහැකිය... ඇයද ගැහැනියකි... ඇය මෙහි වටිනාකම නොදන්නවා වෙන්නටද පිළිවන... එය දැනගෙන ඇය මෙය විවර කළේ නම් සමහරවිට තමාට එය නොදෙන්නටද තිබිණි...

"ඔයා මේක දැක්කද...?" ඔහු ඇසුවේ එය දැනගැනීමට සිතමිනි.

"ඔව් එදා ගෙනාව දවසෙම පෙන්නුවා... ඒක සෑහෙන්න වටිනවා කියලාත් කිව්වා... ලක්ෂයක් විතර වගේ... ඒත් මං එදා මේක ලියලා තියෙනවා නං දැක්කෙ නෑ..."

එසේනම් මැය මෙය තමා අතට දුන්නේ එහි වටිනාකමද දැනගත් පසුය... ඇය තමා විශ්වාස කරන බව පමණක් නොව ඇයගේ සිතේ මේ මුදල් වලට කෑදරකමක් නැති බවද අරෝෂ සිතාගත්තේය... සංජය එතනදීද වැරදිය...

"මේකේ වටිනාකම තුන් ලක්ෂෙ පැනලා ඇති..." අරෝෂ කීවේය...

"මොකක් ලක්ෂ තුනක්...?" ඇය ඇසුවේ දෑස් විසල් කරගනිමිනි. ආරතී කීවේ නම් ලක්ෂයක් පමණ විය හැකි බවය... "රතී නං කිව්වේ ලක්ෂයක් විතර වෙන්න ඇති කියලා... ගාණ ඇහුවම කිව්වෙ නෑ කිව්වා... හිනා වෙලා වෙන වෙලාවක කියන්නං කිව්වළු..." ඇය කීවේ සංජයගේ සිතහව කෙසේ විය හැකිදැයි සිතින්ද සිතමිනි...

"ඔව්... මේ තියෙන්නේ ඔරිජිනල් ඩයමන්ඩ්ස්... පර්ල්ස්..." ඔහු කීවේ ආභරණ පෙට්ටිය ඇයට දිගු කරමිනි...

"රතීවත් දන්නෙ නැතුව ඇති ඒක ගැන... අහන්නත් වෙලාවක් නැතිවෙන්නත් ඇති..." ඇය කීවේ සුසුමක්ද හෙළමින් ආභරණ පෙට්ටිය අතට ගනිමිනි... ඇය එවර යළිත් එය ඇතුළත හොඳින් බැලුවේ එය වසා දමුවේ තවත් දිගු සුසුමක්ද සමගිනි... එදා දෙදෙනම ගණන් ගත්තේ රත්රන් මිළ පමණකි... ඒවා සැබෑ දියමන්ති මුතු බව ඔවුන්



සිතුවේම නැත... ඒ වටිනා මැණික් ගල් විය හැකි බව පමණක් ඔවුන් සිතාගෙන සිටියහ... එහෙත් එපමණ වටිනා මුතු හා දියමන්ති එවැන්නකට දමතැයි දෙදෙනාටම ඒ මොහොතේ නම් සිතුණේ නැත...

"කොච්චර දියමන්ති මුතු උනත් රතී තරං වටින්නෙ නෑ නේ... මේවා නිසා තමයි එයා මේ කරදරේ වැටුණේ... මේවා නොදී තිසං කහට ජලෙන්ටියක් දෙන්න පුළුවන් එකෙක් හිටියනං රතීට මේ වගේ කරදරයක් නොවෙන්න තිබුණා..." ඇය කීවේ එවර අරෝෂගේ සිත හැඩවෙද්දීය.... "මේ ඔක්කෝමටම වඩා මට රතී වටිනවා අරෝෂ... මේවා හම්බ කරන්න පුළුවන් දේවල්... මට මේවා ගැන ආසාවක් නෑ... මට ඔයගේ යාළුවා හොයලා දෙන්න...." ඇය එවර හඬා වැටෙමින් අරෝෂගේ උරහිසට හිස තබා ගත්තාය...

අරෝෂ ඇයගේ උරහිසින් අත යවා ඇයව තෙරපා ගත්තේය... හඬා වැටෙන යුවතියව සැනසීමට ඔහුට හැකියාවක් නැත... ඔහු ඇයගේ හිස අත ගෑවේය.

තේජානිට සෑහෙන සුරක්ෂිත භාවයක් දැණින... මයන්ත හා කථා කරද්දී ලැබෙන සැනැල්ලුවට වඩා දෙයක් එහි තිබෙන බව ඇයට සිතිණ... මෙතෙක්ම ඇය හඬා වැටුණේ ආරතී සමග පමණකි... දූන් ඒ වෙනුවට ඇයට තවත් මිතුරෙක් ඇත...

"අපි හොයාගන්න උත්සාහ කරමු තේජානි..." ඔහු ඇයගේ හිස පිරිමදින අතර කීවේ ඉංග්‍රීසියෙනි.

තවත් මොහොතකට පසු ඇය ඔහුගෙන් ඉවත්වුණාය... යුවතියට අවශ්‍ය වූයේ තමා රවටා ගැනීමට නොවන බවද ඒ අතර අරෝෂ තීරණයක් ගත්තේය... ඔහු මෙලෙස යුවතියන් ගණනාවක්ම ඇසුරු කර ඇත... බොහෝ අය එන්නේ තමා පෙම්වතෙකු කර ගැනීමටය... ඔවුන් ගැන ඔහුගේ සිතේ කැමැත්තක් තිබුණේම නැත...

ඇය නහය වියළවමින් එවර අත් බෑගයෙන් ගත් තුවා තොත දූන්නාය... ඉන්පසු යළිත් පුරුදු ලෙස අසුනේ හරි බරි ගැසුණාය...

ඔහු එය ගත්තේ ඇයගේ මුහුණ දෙස හොඳින්ම බලමිනි... එහි සබකෝලී බවක්ද නොතිබිණ... ඔවුන් සබකෝලීද නැති බව ඔහුට සිතිණ. ඇයගේ සිතේ පසුතැවිල්ල මොනවට මුහුණින් පිළිබිඹු වෙමින් ... න්නේ මිතුරිය ගැනම බව ඔහු නිගමනයක් තිබිණ... ඇය තල් ... ගත්තේය...

ඔහු එවර පොත පෙරළුවේය.

"මොනවද මන්දා ලියලා තියෙන්නෙ... මට නං මෙලෝ හසරක් තේරෙන්නේ නෑ... ෂර්ලොක් හෝම්ස් ළඟට තමයි යන්න වෙන්නේ..." ඇය කීවේ පළමුදා ඇයට ආ හැඟීමය.

අරෝෂට සිනහවක් නැගිණ.

"ඔයා කියවනවද ෂර්ලොක් හෝම්ස්..."

"ඔව්... මං එච්චරම කියවන්න ආසා එක්කෙනෙක් නෙවෙයි... ඒත් ඉතින් පොතක් දෙකක් කියවනවා ඉඳගිටලා හම්බවුණාම... ඒ පොත් නං මං කියවන්න ආසයි... රතී මං ගිහින්දම ඒ පොත් ටිකක් ගෙනාවා... එයා නං හරියට පොත් කියවනවා... මං නෑ..."

"මං ඒකේ අනික් පැත්ත..." අරෝෂ කීවේය... "මං නිවාඩුවක් හම්බ උනොත් කරන්නෙත් පොතක් බලන එක... නැත්තං ෆිල්ම්ස් බලන එක..."

"මාත් ෆිල්ම්ස් නං බලනවා..." ඇය එවර කීවාය... ඇයගේ දුක් වේදනාව සඟවා ගෙන ඇය සාමාන්‍ය අයුරින් කථා කරමින් සිටින බව අරෝෂට නම් වැටහිණ...

සැබැවින්ම එම යුවතිය අනික් තමා දන්නා බොහෝ අයට වඩා වෙනස්ම යුවතියක බව අරෝෂට දැනෙමින් තිබිණ...

"අපි දෙන්නට එහෙනං එක කාරණයක් තියෙනවා කථා කරන්න..." ඔහු කීවේ ඇයගේ මුහුණට තරමක සිනහවක් නංවමිනි.

"මං හිතන්නෙ නෑ... මං බලන්නේ ගොඩක් හින්දි ෆිල්ම්ස්..." ඇය කීවාය... "ඔයා බලන්නෙ ඉන්ග්ලිෂ් ඒවා වෙන්න ඇති නේ..."

"ඒකත් ලත් තැනම ලොප්..." කියූ ඔහු බොහෝ ඕනෑකමින් මෙන් පොත දෙස බලාගත්තේය. ඇයට හොඳ වටහාගැනීමක් ඇත...

"මොනවද ඇත්තටම මේ...?" ඇය එවර ඇසුවේ කුතුහලයකිනි... ඔහු ඒවා කියවන්නට උත්සාහ කරන බවක් ඇයට දැණුනු හෙයිනි...

"මේ ඉන්ග්ලිෂ් ෂෝර්ට් හැන්ඩ්... වැඩි දේවල් නෑ... නැත්තෙත් නෑ... මෙතන මං කියවන්න ඕන නිවි සැනසිල්ලෙ... ඒ මොකද මං



ෂෝර්ට් හැන්ඩ් ටිකක් දන්නවා... ඒත් සමහර ඒවා ඒ හොල්ලන්නෙම වචන හදාගන්න ඒවා තියෙනවනේ..."

"වචන හදාගන්නවා කියන්නෙ...?" තේජානිට දැනගත යුතු විය... ඇයට නම් ඒවා තේරෙන්නේම නැත...

"ෂෝර්ට් හැන්ඩ් කියන්නෙත් භාෂාවක් නේ... සමාන කං තිබුණට... දැන් මං මගේ නමට ලියන කෙටිසන... වෙන එක්කෙනෙක් ලියන කෙටිසනට වඩා වෙනස් වෙන්න පුළුවන්... ඒක තමයි වෙනස... ඉතින් ටිකක් අමාරුයි වෙන එක්කෙනෙක්ගෙ ඒවා කියවන්න... ටිකක් හිතලා මතලා තමයි ඒක හදාගන්න වෙන්නෙ... මේක මං මගේ ජූනියර් කෙනෙක්ට දෙනවා..." ඔහු කීවේය... ඔහුට ඒවා කියවන්නටම කැමැත්තක සිටින බව කිව නොහැකිය... "ඔයා ටයිපිං ෂෝර්ට් හැන්ඩ් කරලා නැද්ද...?"

"නෑ... මං සිංහල ෂෝර්ට් හැන්ඩ් ගැන දැනගෙන හිටියා... මගේ යාළුවෙක් කළා... ඒත් මට නං හිතුණේම නෑ මේවා එහෙම කියලා... ඒවා ලියන්නේ රූල් වල ඉහළ පහළ නේ..."

"මේකත් එහෙම තමයි තේජානී... රූල් නැතිව මෙයා රූල් හිතේ තියාගෙන ලියලා තියෙන්නේ අතික පොඩියට..." කියූ ඔහු පොත වැසුවේය... ඉන්පසු ආභරණ පෙට්ටිය ඇය අතට දුන්නේය... "මේක ඔයා ආයෙ එනතින්ම තියන්න..."

ඇය එය ගත්තාය...

"මං පොතයි මේ යතුරු පෙට්ටියයි ගන්නවා..."

ඇය හිස සැලුවාය... ආරතී නැතිව ආභරණ පෙට්ටියකින් වැඩක් තිබේද...? ඇයට සිතිණ.

"මේක මං අල්මාරියෙන්ම දාලා තියෙනවා... මේක මට නං වැඩක්ම නෑ..." ඇය ආභරණ පෙට්ටිය පෙන්වා කීවේ බොහෝ පසුතැවිල්ලකින් බව ඔහුට සිතිණ...

අරෝෂ ඇයගෙන් ඇය ගැන විස්තර බොහෝ දේවල් ඇසුවේය... ඔහුගේ විස්තරද තරමක් දුරට කියෙව්වේය... ආරතී ගැනද ඔහු බොහෝ විස්තර දැනගත්තේය... එහෙත් සංජයගෙන් ආරතීට ලැබී තිබුණ ලිපි ගැන තේජානි අරෝෂට කීවේ නැත... එය ඇයට කියන්නට සිත දුන්නේද නැත... ඇයගේ සිත තුළ කවරෙක් නැතත්

දැන් විශ්වාසයක් නොතිබිණ... අරෝෂගෙන් ඇය පැතුවේ උදව්වකි... දැන් අවශ්‍ය වන්නේ සංජය ඇයට ආරතී සොයා ගැනීමටය... අර ලිපි අවශ්‍ය වන්නේ සංජය ඇයට කෙණෙහිල්ලක් කළහොත් පමණකි... හරියටම නොදන සංජයට වුවද ඇඟිල්ලක් දිගු කිරීමට කවරෙක්ටවත් නොහැකිය... තවමත් මිතුරිය සිටින්නේ සංජය යටතේද යන්න කවුරුවත් දන්නේම නැත... මිතුරියට දරුවෙක් ලැබෙන්නට සිටින්නේ නම් සංජය එයින් මග හරින්නට සදන්නේ නම් ඒ ලිපි වලින් ප්‍රයෝජන ගත හැකිය...

අනික් අතට ඇය එසේ සිතද්දී අරෝෂද බොහෝ දේවල් සිතමින් සිටියේය... සංජය කියූ පරිදි මැය නම් ආරතී ගැන දන්නේම නැත... ඇයට අවශ්‍ය මිතුරිය කථා නොකළද කොහේ හෝ සිටින්නේදැයි දැන ගැනීමටමය... ඇය කියන්නේම සංජය මිතුරිය සඟවාගෙන ඇති බවය... ඇයට සමහරවිට දරුවෙක් කුස පිළිසිඳගෙන ඇත්නම්... ඇයගේ සිතිවිල්ලද වැරැද්දක් නොවන බව ඔහු සිතුවේය...

කෙසේ වුවත් දැන් ඉතින් මෙය සැහෙන උභතෝකෝටික ප්‍රශ්නයක් වී තිබෙන බව ඔහුට සිතිණ. අද රැයේ සංජය තමා සමුවීමට එනු ඇත... හෙට දිනයේ ආරතීගේ බැංකු සේප්පුවේ ඇත්තේ මොනවාදැයි දැන ගත යුතුය... ඉන්පසු මෙම තරුණියට තමාගේ අනන්‍යතාවය කිව යුතුය... අරෝෂ සිතුවේය... ඒවා පිටින් දැනගතහොත් මැය බොහෝ සේ කලබල වෙන්නට ඉඩ තිබෙන බව සිතමිනි... දැන් ඔහුට අවශ්‍ය වූයේ මෙම තරුණිය තව දුරටත් ඇසුරු කිරීමේ වරම ලබාගැනීමටය...

ඔහු ඇයව සාප්පුවක් ළඟින් බැස්සුවේ එතනට මයන්තගේ පියාට එන්නට කියන්නට යැයි කියමිනි... මයන්තගේ පියාගේ ත්‍රිරෝද රථයට ඇය නැග ගනු පමණක් නොව, ඇය නේවාසිකාගාරය ඉදිරියේ ගේට්ටුව ඉදිරියේම බසින තෙක්ද ඔහු එම රථය පිටුපසින්ම ගියේය... ඔහු ඈතක සිට එදෙසට ඇස ගසාගෙන සිටියා මෙන්ම, මයන්තගේ පියාද ඇය තරමක් දුරටත් යනතුරු ත්‍රිරෝද රථය එතනින් නොගත් බව ඔහු පසක් කරගත්තේය... ඔවුන්ද දැන් මේ තරුණිය බොහෝ සේ ප්‍රවේශම් කරනවා විය හැකිය... ඔහුට සිතිණ... ඒ ගැන නම් ඔහුගේ සිතට දැණුනේ සහනයකි...

සංජය ආවේ මැදියම් රැයේය...

අරෝෂ ඔහු එනතුරු බලාගෙනම සිටියේය... ආරතී ගැන නම්



තවමත් ආරංචියක් නැත... ඔහු සිතමින් සිටියේ දැන් බැංකුවට ගොස් ඒ දෙසින් විමසීමටය... වැරැද්ද වූයේ දැන් ඒ සිදුවීමෙන් සතියකටත් වැඩි කාලයක් ගතවී තිබීම ගැනය...

"මචං... එනි ප්‍රෝග්‍රස්...?" අසමින්ම උඩුමහලට ආ සංජයට අරෝෂගේ මුහුණේ පෙනුමෙන් තරමක පසුතැවිල්ලක් නැගිණ... ඔහුට ඇය නැතිවීමෙන් වූ පාඩුවක් නැති වුවද දැන් ඇය ගැන සිතෙද්දී ඇය පිටියේ නම් යැයි සිතෙමින් තිබිණ... ඇය අවිස්සාවේල්ලට තවමත් පැමිණ නැත...

"කෙල්ල මිසින්... හොස්පිටල්ස් වල නෑ... පොලිස් රෙකෝඩ්ස්වල නෑ..." අරෝෂ සත්‍ය තත්ත්වයම කීවේය.

"උඹ දැන් කොහෙන්ද ඊළඟට පටන්ගන්නේ...?"

"බැංකුවට ගිහින් බලන්න ඕන... එතන අයට මතකද කියලාවත්..."

"බැංකුවෙන් මං ඇහුවා මචං... එතන සෙකියුරිටි මං අඳුනනවා..."

"ඒ බැංකුවට නෙවෙයි ආරතී ගිහිල්ලා තියෙන්නේ.. වෙන එකකට..."

"වෙන එකකට...?" කුතුහලයෙන් යුතුව සංජයට ඇසිණ...

"ඔව්...?"

"උඹ දැනගත්තේ කොහොමද...?"

"තේජානිගෙන්..."

"තේජානිගෙන්...?" එවර නම් සංජයගේ පුදුමය දකිද්දී අරෝෂට සිනහවක්ද නැගිණ.

"තේජානිගෙන්..." ඔහු කීවේ ඒ සිනහවෙන්ම යුතුවය... "ඇයි උඹට විශ්වාස කරන්න බැරිද...?"

"බැරි කමකුත් නෑ... ඒත්... ඒකි කිව්වද...?"

"උඹ තේජානි දකලා තියෙනවද...?" අරෝෂ ඇසුවේ කට කොණක සිනහවකින් යුතුවය...

"දකලා තියෙනවා... ඇයි මං උඹට පෙන්නුවෙ... එච්චර ලස්සණ කෙල්ලෙක් වෙන්න බෑ... ඒක මන් මූණ වහගෙන එන්නෙ හැමදාම... කොහොමටත් කටේ හැටියට නං එච්චි අම්මා කෙනෙක් ගාණයි..."

"ටිකක් කට කාරයි නං තමයි..." කියූ නමුදු අරෝෂ වෙනත් කිසිවක්ම කියන්නට නොසිතුවේය... සංජයට දිරවා ගත නොහැකි අන්දමින් තේජානි යම් යම් පිළිතුරු දෙන්නට ඇත... මිතුරා එලෙස ඔහුට කථා කරන තරුණියන් ගැන පමණක් නොව තරුණයින්ටද අකැමැති බව දන්නා හෙයින් අරෝෂ ඒ මොහොතේදී ඇය ගැන නම් නිහඬ බව රැක්කේය... සංජය කැමැත්තේ ඔහුට ආවඩන මිනිසුන්ටය... එහෙත් ඒ අවලස්සණ කෙල්ල සංජයට පෙන්නීමේ නොතිත් ආශාවක් මෙන්ම එයට කිසියම් බියක්ද අරෝෂගේ සිත් තුළට එක්වෙමින් තිබිණ... කෙදිනක හෝ තේජානි නැමැත්තිය සංජයට පෙන්විය යුතුය... දකින්නටද හැකිය... කෙසේ හෝ එයට අවස්ථාවක් ආවහොත් කෙල්ලගේ රුව පෙන්නීමට අරෝෂ තීරණයක් ගත්තේය...

සංජය යළිත් ඉන් පසු දිනයේ මාතර යන බව කීවේය... ඔහු බැංකුවේ සේප්පු නම්වරය ගෙනැවිත් තිබුණේය... ඔහු අතේ යතුරක් නම් තිබුණේ නැත... යතුර ලැබුණු බව කියන්නටද අරෝෂ ඉක්මණ් නොවීය.

"මං කිව්වා උඹට ඇරලා දෙන්න කියලා... මේක මගේ නමින් නේ තියෙන්නේ... ප්‍රශ්නයක් වෙන්නෙ නෑ... ගොඩක් දේවල් නං තියෙන්න බෑ... මං මැනේජර්ටත් කියලා තියන්නෙ... මැනේජර් වනිගසූරිය කියලා කෙනෙක්..." සංජය කියාගෙන ගියේය... "අනික අරකි ඇවිල්ලා මොන මොනව හරි කියලා ඒක ඇරව ගත්තොත්... මං කිව්වා වෙන කාටවත් ඒකට අත තියන්න දෙන්න එපා කියලා..."

අරෝෂට සිනින සිනහගියද, ඒවා ගැන කිසිවක්ම කියන්නට ගියේ නැත... ආභරණ පෙට්ටිය පවා තිබුණේ ඇයගේ අල්මාරියේ නම්... තේජානි මේවා ගැන සොයන්නට බලන්නට නොයන බව ඔහුට සිතුණේය...

සංජය මුළුමණින්ම සිටින්නේ වැරදි නිගමනයකය...

නිලුපුලී දෙවන පොතට

kathapothak.blogspot.com

# රමණී බුලත්සිංහල

# නීලුපුලී

kathapothak.blogspot.com

ඇත්තක් කියන්නටත් [illegible] ගත්තෙත් [illegible] කලදීමය... [illegible] මවය... [illegible] තෙතමනය ඇය එලෙසම විඳලා ගත්තාය...
මෙහිදී නම [illegible]

සැබෑවින්ම සැබෑවම යෞවන යුවතිය වුවද [illegible]
ඇයගේ [illegible] ඇත... පොහොසත් කම [illegible]
හොඳින් බැලුවහොත් මේ යුවතියද බොහෝ [illegible]
සටාපය හා එක් පොහොසත් කම් නොසලකා [illegible]
රූප ලාවණ්‍යයකින් යෙහෙළවු මුහුණකින් යුතුව... [illegible]
ගන්නට කිවහොත්... සියල්ලොම [illegible]
පැහැදිලිය... රූප ලාවණ්‍යයකින් [illegible]
ලෙසින් [illegible] නම්...

**නිම්සා ප්‍රකාශන**
83/1, කටුවාවල, බොරලැස්ගමුව. 0718668795.

ISBN [illegible]